

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

# ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

**(2015 මැයි මස 15 දින දක්වා සංශෝධිතයි)**

ප්‍රතිශෝධිත මුද්‍රණය 2015

**පාර්ලිමේන්තු මහ ලේකම් කාර්යාලය මගින් ප්‍රකාශිතයි.**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

ප්‍රතිශෝධිත මුද්‍රණය 2015

පාර්ලිමේන්තු මහ ලේකම් කාර්යාලය මගින් ප්‍රකාශිතයි.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක සේවා දෙපාර්තමේන්තුවේ පනත් කෙටුම්පත් කාර්යාංශය විසින් සංස්කරණය කරන ලද මෙම නිල නොවන ප්‍රතිශෝධිත මුද්‍රණය මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහනව වැනි සංශෝධනය දක්වා පාර්ලිමේන්තුව විසින් වරින් වර සංශෝධනය කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නැවත ප්‍රකාශයට පත් කරනු ලැබේ. අදාළ පිටු අග ඇති සටහන් මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කළ ඒ ඒ සංශෝධන දැක්වේ.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

### පටුන


| | | පිටුව |
|---|---|---|
| | පූර්විකාව | xvii |

I වැනි පරිච්ඡේදය

ජනතාව, රජය සහ පරමාධිපත්‍යය

| ව්‍යවස්ථාව | | පිටුව |
|---|---|---|
| 1. | රජය ... ... ... ... ... ... ... ... ... | 1 |
| 2. | ඒකීය රජයක් බව ... ... ... ... ... ... ... | 1 |
| 3. | ජනතාවගේ පරමාධිපත්‍යය ... ... ... ... ... | 1 |
| 4. | පරමාධිපත්‍යය ක්‍රියාත්මක කිරීම ... ... ... ... ... | 1 |
| 5. | ජනරජයට අයත් දේශය ... ... ... ... ... ... | 2 |
| 6. | ජාතික කොඩිය ... ... ... ... ... ... ... | 2 |
| 7. | ජාතික ගීය ... ... ... ... ... ... ... ... | 2 |
| 8. | ජාතික දිනය ... ... ... ... ... ... ... ... | 2 |

II වැනි පරිච්ඡේදය

බුද්ධාගම

| | | |
|---|---|---|
| 9. | බුද්ධාගම ... ... ... ... ... ... ... ... | 3 |

III වැනි පරිච්ඡේදය

මූලික අයිතිවාසිකම්

| | | |
|---|---|---|
| 10 | සිතීමේ නිදහස, හෘදය සාක්ෂියේ නිදහස සහ ආගමික නිදහස | 4 |
| 11. | වධ හිංසාවලින් නිදහස ... ... ... ... ... ... | 4 |
| 12. | සර්ව සාධාරණත්වයේ අයිතිවාසිකම ... ... ... ... | 4 |
| 13. | අත්තනෝමතිකව සිරභාරයට ගැනීමෙන්, රඳවා තබා ගැනීමෙන් සහ දඬුවම් කිරීමෙන් නිදහස සහ අතීතයට බලපාන දණ්ඩන නීති පැනවීම තහනම් කිරීම | 5 |
| 14. | භාෂණයේ, රැස්වීමේ, සමාගමයේ, රැකියාවේ සහ යාම් ඊම් යනාදියේ නිදහස | 6 |
| 14අ. | තොරතුරු වෙත ප්‍රවේශවීමේ අයිතිවාසිකම ... ... ... | 7 |
| 15. | මූලික අයිතිවාසිකම් පිළිබඳ සීමා . ... ... ... ... | 8 |
| 16. | පවත්නා ලිඛිත නීති සහ ලිඛිත නොවූ නීති බලපවත්වන බව | 9 |
| 17. | විධායක ක්‍රියා මගින් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමට ප්‍රතිකර්මය | 10 |

## IV වැනි පරිච්ඡේදය
### භාෂාව


| ව්‍යවස්ථාව | | පිටුව |
|---|---|---|
| 18. | රාජ්‍ය භාෂාව ... ... ... ... ... ... ... | 11 |
| 19. | ජාතික භාෂා . ... ... ... ... ... ... ... | 11 |
| 20. | පාර්ලිමේන්තුවෙහි සහ පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල ජාතික භාෂා භාවිතය | 11 |
| 21. | ඉගැන්වීමේ මාධ්‍ය ... ... ... ... ... ... ... ... | 11 |
| 22. | පරිපාලන භාෂා ... ... ... ... ... ... ... ... | 12 |
| 23. | නීති පැනවීමේ භාෂාව ... ... ... ... ... ... | 14 |
| 24. | අධිකරණයේ භාෂාව. ... ... ... ... ... ... | 15 |
| 25. | මේ පරිච්ඡේදයේ විධිවිධාන සලස්වා ඇති පරිදි භාෂා භාවිතය සඳහා ප්‍රමාණවත් පහසුකම් සැලැස්විය යුතු බව | 16 |
| 25අ. | මේ පරිච්ඡේදයට අනනුකූල වන යම් නීතියක ඇති විධිවිධාන ඉවත් කරන ලද සේ සැලකිය යුතු බව | 16 |


## V වැනි පරිච්ඡේදය
### පුරවැසිභාවය


| | | |
|---|---|---|
| 26. | ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය . ... ... ... ... ... | 17 |


## VI වැනි පරිච්ඡේදය
### රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේ මූලධර්ම සහ මූලික යුතුකම්


| | | |
|---|---|---|
| 27. | රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේ මූලධර්ම ... ... ... | 18 |
| 28. | මූලික යුතුකම් ... ... ... ... ... ... ... | 20 |
| 29. | රාජ්‍ය ප්‍රතිපත්තිය පිළිබඳ මූලධර්ම සහ මූලික යුතුකම් විනිශ්චයට භාජන කළ නොහැකි බව | 20 |


## VII වැනි පරිච්ඡේදය
### විධායකය
### ජනරජයේ ජනාධිපති


| | | |
|---|---|---|
| 30. | ජනරජයේ ජනාධිපතිවරයා ... ... ... ... ... | 21 |
| 31. | ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම හා ධුර කාලය ... | 21 |
| 32. | ධුරය භාර ගැනීම ... ... ... ... ... ... ... ... | 25 |
| 33. | ජනාධිපතිවරයාගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ... ... | 26 |
| 33අ. | ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට වගකිව යුතු බව ... ... | 27 |
| 34. | සමාව දීම ... ... ... ... ... ... ... ... | 27 |
| 35. | ජනාධිපතිවරයාට විරුද්ධව නඩු පැවරිය නොහැකි බව | 28 |
| 36. | වැටුප සහ විශ්‍රාම වැටුප ... ... ... ... ... ... | 29 |
| 37. | අග්‍රාමාත්‍යවරයා විසින් ජනාධිපතිවරයාගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම | 30 |

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව


| ව්‍යවස්ථාව | | පිටුව |
|---|---|---|
| 38. | ජනාධිපතිවරයා විසින් ධුරය හිස් කිරීම .. ... ... ... | 31 |
| 39. | ජනාධිපතිවරයා යථා පරිදි තෝරා පත් කරගෙන නොමැති බවට හෝ ජනාධිපතිවරයා තෝරා පත් කිරීමේ ජන්ද විමසීම නිෂ්ප්‍රභ බවට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කිරීම | 33 |
| 40. | ජනාධිපතිවරයා විසින් ධුරය හිස් කිරීම සහ අනුප්‍රාප්තික ජනාධිපතිවරයා තෝරා පත් කිරීම | 34 |
| 41. | ජනාධිපතිවරයාගේ කාර්ය මණ්ඩලය ... ... ... ... | 35 |

### VIIඅ වැනි පරිච්ඡේදය

### ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව

| | | |
|---|---|---|
| 41අ. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සංයුතිය ... ... ... ... | 37 |
| 41ආ. | සභාව විසින් පත්කිරීම් නිර්දේශ කළ යුතු බව ... ... ... | 39 |
| 41ඇ. | පත්කිරීම් සභාව විසින් අනුමත කළ යුතු බව ... ... ... | 41 |
| 41ඈ. | සභාවේ මහලේකම්වරයා සහ අනෙකුත් නිලධාරීන් ... ... | 42 |
| 41ඉ. | සභාවේ රැස්වීම් ... ... ... ... ... ... ... | 42 |
| 41ඊ. | සභාවේ සාමාජිකයන් තවදුරටත් ධුර දැරීම ... ... ... | 43 |
| 41උ. | සභාවේ බලතල හා කාර්ය.. ... ... ... ... ... | 43 |
| 41ඌ. | සභාවේ වියදම් ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුතු බව | 43 |
| 41එ. | සභාවේ තීරණවල අවසානාත්මක භාවය. ... ... ... | 43 |

### VIII වැනි පරිච්ඡේදය

### විධායකය

### අමාත්‍ය මණ්ඩලය

| | | |
|---|---|---|
| 42. | අග්‍රාමාත්‍යවරයා සහ අමාත්‍ය මණ්ඩලය... ... ... ... | 44 |
| 43. | අමාත්‍යවරයන් සහ ඔවුන්ගේ විෂය සහ කාර්ය.. ... ... | 44 |
| 44. | අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන අමාත්‍යවරයන් | 44 |
| 45. | නියෝජ්‍ය අමාත්‍යවරයන් ... ... ... ... ... ... | 45 |
| 46. | අග්‍රාමාත්‍යවරයාගේ ධුර කාලය සහ අමාත්‍යවරයන්ගේ සහ නියෝජ්‍ය අමාත්‍යවරයන්ගේ සංඛ්‍යාව සහ ධුර කාලය සීමා කිරීම | 45 |
| 47. | පාර්ලිමේන්තුව විසුරුවා හැර ඇති කාලය තුළ අමාත්‍ය මණ්ඩලය | 46 |
| 48. | අමාත්‍ය මණ්ඩලය විසිරීම .. ... ... ... ... ... | 47 |
| 49. | වැඩබලන අමාත්‍යවරයන් හා නියෝජ්‍ය අමාත්‍යවරයන් ... | 48 |
| 50. | අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයා ... ... ... ... | 48 |
| 51. | අග්‍රාමාත්‍යවරයාගේ ලේකම්වරයා... ... ... ... ... | 48 |
| 52. | අමාත්‍යාංශයන්හි ලේකම්වරයන් ... ... ... ... ... | 48 |
| 53. | නිල ප්‍රතිඥාව හෝ දිවුරුම ... ... ... ... ... | 49 |

## IX වැනි පරිච්ඡේදය

### විධායකය

### රාජ්‍ය සේවය


| ව්‍යවස්ථාව | | පිටුව |
|---|---|---|
| 54. | රාජ්‍ය සේවා කොමිෂන් සභාව ... ... ... ... ... | 50 |
| 55. | අමාත්‍ය මණ්ඩලයේ සහ කොමිෂන් සභාවේ බලතල සහ කර්තව්‍ය | 52 |
| 56. | කොමිෂන් සභාවේ කමිටු ... ... ... ... ... ... | 52 |
| 57. | රජයේ නිලධරයකු වෙත බලතල පැවරීම ... ... ... | 53 |
| 58. | අභියාචනය කිරීමේ අයිතිවාසිකම. ... ... ... ... | 53 |
| 59. | පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය. ... ... ... | 54 |
| 60. | බලතල පවරා දී ඇති අවස්ථාවක කොමිෂන් සභාව ඒ බලතල ක්‍රියාවේ නොයෙදිය යුතු බව | 54 |
| 61. | රැස්වීම්වල කාර්ය පටිපාටිය ... ... ... ... ... | 54 |
| 61අ. | නඩු කටයුතුවලින් මුක්තිය . ... ... ... ... ... | 54 |
| 61ආ. | බලාත්මකව පවතින රීති සහ නියෝග ඉතිරි කර තබා ගැනීම | 55 |
| 61ඇ. | කොමිෂන් සභාවේ කටයුතුවලට අයුතු ලෙස මැදිහත් වීම | 55 |
| 61ඈ. | නිල ප්‍රතිඥාව හෝ දිවුරුම ... ... ... ... ... | 55 |
| 61ඉ. | ජනාධිපතිවරයා විසින් කරනු ලබන පත් කිරීම් .. ... ... | 55 |
| 61ඊ. | අර්ථ නිරූපණය ... ... ... ... ... ... ... | 56 |


## X වැනි පරිච්ඡේදය

### ව්‍යවස්ථාදායකය

### පාර්ලිමේන්තුව


| | | |
|---|---|---|
| 62. | පාර්ලිමේන්තුව ... ... ... ... ... ... ... | 57 |
| 63. | නිල ප්‍රතිඥාව හෝ දිවුරුම ... ... ... ... ... | 57 |
| 64. | කථානායකවරයා, නියෝජ්‍ය කථානායකවරයා සහ නියෝජ්‍ය කාරක සභාපතිවරයා | 57 |
| 65. | පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා ... ... ... ... | 58 |
| 66. | අසුන් හිස්වීම. ... ... ... ... ... ... ... | 59 |
| 67. | පාර්ලිමේන්තුවේ සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ වරප්‍රසාද, පරිහාර සහ බලතල | 60 |
| 68. | මන්ත්‍රීවරයන්ට දීමනා ගෙවීම ... ... ... ... ... | 60 |
| 69. | මන්ත්‍රී ධුර හිස්ව තිබුණ ද පාර්ලිමේන්තුවට ක්‍රියා කිරීමට බලය ඇති බව | 60 |

## XI වැනි පරිච්ඡේදය

### ව්‍යවස්ථාදායකය

### කාර්ය පටිපාටිය සහ බලතල


| ව්‍යවස්ථාව | | පිටුව |
|---|---|---|
| 70. | පාර්ලිමේන්තුවේ සභාවාර . ... ... ... ... ... | 61 |
| 71. | රැස්වීම් කල් තැබීම .. ... ... ... ... ... ... | 62 |
| 72. | ඡන්දය දීම ... ... ... ... ... ... ... ... | 62 |
| 73. | ගණපූරණය ... ... ... ... ... ... ... ... | 63 |
| 74 | ස්ථාවර නියෝග ... ... ... ... ... ... ... | 63 |
| 75. | ව්‍යවස්ථාදායක බලය ... ... ... ... ... ... | 63 |
| 76. | ව්‍යවස්ථාදායක බලය පවරාදීම ... ... ... ... ... | 64 |
| 77. | පළකරන ලද පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් නීතිපතිවරයාගේ කාර්ය | 64 |
| 78. | පනත් කෙටුම්පත් පළ කිරීම සහ පනත් කෙටුම්පත් හා යෝජනා සම්මත කිරීම | 65 |
| 79. | කථානායකවරයාගේ සහතිකය ... ... ... ... ... | 65 |
| 80. | පනත් කෙටුම්පතක් නීතිය බවට පත්වීම.. ... ... ... | 66 |
| 81. | මන්ත්‍රීවරයන් නෙරපීම සහ ප්‍රජා අශක්නුතා නියම කිරීම | 67 |


## XII වැනි පරිච්ඡේදය

### ව්‍යවස්ථාදායකය

### ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම


| | | |
|---|---|---|
| 82. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම ප්‍රකාශිතව ම විය යුතු බව | 69 |
| 83. | ඇතැම් පනත් කෙටුම්පත් ජනමත විචාරණයක දී අනුමත කිරීම | 70 |
| 84. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල පනත් කෙටුම්පත් | 70 |


## XIII වැනි පරිච්ඡේදය

### ජනමත විචාරණය


| | | |
|---|---|---|
| 85. | පනත් කෙටුම්පත් ජනමත විචාරණයක් මගින් ජනතාව වෙත ඉදිරිපත් කිරීම | 72 |
| 86. | ජාතික වැදගත්කමකින් යුත් කාරණා ජනමත විචාරණ මගින් ජනතාව වෙත ඉදිරිපත් කිරීම | 72 |
| 87. | කාර්ය විධානය සඳහා පාර්ලිමේන්තුව විධිවිධාන යෙදිය යුතු බව | 72 |


## XIV වැනි පරිච්ඡේදය

### ඡන්ද බලය, ඡන්ද විමසීම හා මැතිවරණ


| | | |
|---|---|---|
| 88 | ඡන්ද හිමියකු වීමේ අයිතිවාසිකම . ... ... ... ... | 74 |
| 89 | ඡන්ද බලය අහිමිවීම ... ... ... ... ... ... | 74 |

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව


| ව්‍යවස්ථාව | | පිටුව |
|---|---|---|
| 90. | පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් තෝරාපත් කරගනු ලැබීමට සුදුසුකම් | 78 |
| 91. | පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් තෝරාපත් කරගනු ලැබීමට නුසුදුසුකම් | 78 |
| 92. | ජනාධිපතිවරයා වශයෙන් තෝරාපත් කර ගැනීමට නුසුදුසුකම් | 82 |
| 93. | ඡන්දය දීම නිදහස්ව, සමානව සහ රහසේ විය යුතු බව | 83 |
| 94. | ජනාධිපතිවරයා තෝරාපත් කර ගැනීම ... ... ... ... | 83 |
| 95. | සීමා නිර්ණය කොමිෂන් සභාව ... ... ... ... ... | 84 |
| 96. | මැතිවරණ කොට්ඨාස ... ... ... ... ... ... | 84 |
| 96අ. | [ ඉවත් කරන ලදී. ] | 85 |
| 97. | මැතිවරණ කොට්ඨාසවල නම් ආදිය ප්‍රකාශයට පත් කිරීම | 85 |
| 98. | සියලු මැතිවරණ කොට්ඨාසවලින් තෝරා පත් කළ යුතු මන්ත්‍රී සංඛ්‍යාව සහ ඒ මැතිවරණ කොට්ඨාස අතර ඒ මන්ත්‍රීවරයන් සංඛ්‍යාව බෙදා වෙන් කළ යුතු ආකාරය | 86 |
| 99. | සමානුපාතික නියෝජනය . ... ... ... ... ... | 87 |
| 99අ. | මහ මැතිවරණයක දී ලැබූ මුළු ඡන්ද සංඛ්‍යාව පදනම් කරගෙන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත් කර ගැනීම | 91 |
| 100. | නුසුදුස්සකුව සිටිය දී පාර්ලිමේන්තුවේ අසුන් ගතහොත් හෝ ඡන්දය දුනහොත් දණ්ඩනය | 92 |
| 101. | මැතිවරණ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව විසින් විධිවිධාන යෙදිය හැකි බව | 93 |
| 102. | මැතිවරණ කාලය තුළ දී රජයේ නිලධරයකු හෝ රාජ්‍ය සංස්ථාවක නිලධරයකු එලෙසින් කාර්යයන්හි නොයෙදිය යුතු බව | 94 |


### XIVඅ වැනි පරිච්ඡේදය

### මැතිවරණ කොමිෂන් සභාව


| | | |
|---|---|---|
| 103. | මැතිවරණ කොමිෂන් සභාවේ සංයුතිය .. ... ... ... | 95 |
| 104. | කොමිෂන් සභාවේ රැස්වීම් ... ... ... ... ... | 96 |
| 104අ. | තීරණවල අවසානාත්මකභාවය සහ නඩු කටයුතු වලින් මුක්තිය | 97 |
| 104ආ. | මැතිවරණ කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය | 97 |
| 104ඇ. | කොමිෂන් සභාව විසින් පොලීසිය යෙදවීම ... ... ... | 99 |
| 104ඈ. | සන්නද්ධ හමුදා යෙදවීම ... ... ... ... ... ... | 100 |
| 104ඉ. | මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා සහ කොමිෂන් සභාවේ වෙනත් නිලධරයන් | 100 |
| 104ඊ. | තේරීම් භාර නිලධරයන් ... ... ... ... ... ... | 102 |
| 104උ. | රජයේ නිලධරයන් ... ... ... ... ... ... | 102 |
| 104උඋ. | විධානවලට අනුකූලවීමට අපොහොසත්වීම වරදක් විය යුතු බව | 102 |
| 104උඌ. | රිට් ආඥා නිකුත් කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණය සතු බලය | 103 |
| 104එ. | අර්ථ නිරූපණය ... ... ... ... ... ... ... | 103 |

## XV වැනි පරිච්ඡේදය

### අධිකරණය


| ව්‍යවස්ථාව | | පිටුව |
|---|---|---|
| 105. | අධිකරණ පිහිටුවීම යනාදිය ... ... ... ... ... | 104 |
| 106. | ප්‍රසිද්ධියේ විභාග පැවැත්වීම ... ... ... ... ... | 105 |
| | **අධිකරණයේ ස්වාධීනත්වය** | |
| 107. | ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන් පත් කිරීම හා ඉවත් කිරීම | 107 |
| 108. | ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන්ගේ වැටුප් | 108 |
| 109. | වැඩබැලීමේ පත්වීම් ... ... ... ... ... ... | 108 |
| 110. | විනිශ්චයකාරවරයන් විසින් වෙනත් කාර්ය හෝ කර්තව්‍ය ඉටු කිරීම | 108 |
| 111. | මහාධිකරණ විනිශ්චයකාරවරයන් පත් කිරීම, ධුරයෙන් ඉවත් කිරීම සහ ඔවුන්ගේ විනය පාලනය | 109 |
| 111අ. | මහාධිකරණ කොමසාරිස්වරයෝ . ... ... ... ... | 109 |
| 111ආ. | මුළු දිවයිනම සඳහා පිස්කල්වරයා ... ... ... ... | 110 |
| 111ඇ. | අධිකරණ කටයුතුවලට අයුතු ලෙස මැදිහත්වීම වරදක් බව | 110 |
| | **XVඅ වැනි පරිච්ඡේදය** | |
| | **අධිකරණ සේවා කොමිෂන් සභාව** | |
| 111ඈ. | අධිකරණ සේවා කොමිෂන් සභාවේ සංයුතිය ... ... ... | 112 |
| 111ඉ. | කොමිෂන් සභාවේ රැස්වීම් ... ... ... ... ... | 112 |
| 111ඊ. | කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ දීමනා ... ... ... | 113 |
| 111උ. | කොමිෂන් සභාවේ ලේකම්වරයා . ... ... ... ... | 113 |
| 111ඌ. | කොමිෂන් සභාවේ බලතල ... ... ... ... ... | 113 |
| 111එ. | අධිකරණ නිලධරයෙකුට හෝ උපලේඛනගත රජයේ නිලධරයෙකුට ඉල්ලා අස්විය හැකි බව | 114 |
| 111ඒ. | නඩු කටයුතු වලින් මුක්ත බව ... ... ... ... ... | 114 |
| 111ඔ. | කොමිෂන් සභාවේ කටයුතු වලට අයුතු ලෙස මැදිහත්වීම වරදක් බව | 114 |
| 111ඕ. | අර්ථ නිරූපණය ... ... ... ... ... ... ... | 115 |
| 112. | [ ඉවත් කරන ලදී ] | 116 |
| 113. | [ ඉවත් කරන ලදී ] | 116 |
| 113අ. | [ ඉවත් කරන ලදී ] | 116 |
| 114. | [ ඉවත් කරන ලදී ] | 116 |
| 115. | [ ඉවත් කරන ලදී ] | 116 |
| 116. | [ 111 ඈ ව්‍යවස්ථාව ලෙස නැවත අංක යොදන ලදී ] | 116 |
| 117. | [ ඉවත් කරන ලදී ] | 116 |

## XVI වැනි පරිච්ඡේදය

### ජ්‍යෙෂ්ඨ අධිකරණ
### ශ්‍රේෂ්ඨාධිකරණය


| ව්‍යවස්ථාව | | පිටුව |
|---|---|---|
| 118. | ශ්‍රේෂ්ඨාධිකරණයේ සාමාන්‍ය අධිකරණ බලය ... ... ... | 117 |
| 119. | ශ්‍රේෂ්ඨාධිකරණයේ සංයුතිය ... ... ... ... ... | 117 |
| 120. | ශ්‍රේෂ්ඨාධිකරණයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණ බලය | 117 |
| 121. | පනත් කෙටුම්පත් පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණ බලය සාමාන්‍යයෙන් ක්‍රියාත්මක කිරීම | 119 |
| 122. | [ ඉවත් කරන ලදී ] | 119 |
| 123. | පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය | 119 |
| 124. | පනත් කෙටුම්පත්වල වලංගුභාවය සහ ව්‍යවස්ථාදායක ක්‍රියාවලිය සම්බන්ධයෙන් ප්‍රශ්න කළ නොහැකි බව | 120 |
| 125. | ආණ්ඩුකම ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණ බලය | 121 |
| 126. | මූලික අයිතිවාසිකම් පිළිබඳ අධිකරණ බලය සහ ඒ බලය ක්‍රියාත්මක කිරීම | 121 |
| 127. | අභියාචන අධිකරණ බලය .. ... ... ... ... ... | 122 |
| 128. | අභියාචනය කිරීමේ අයිතිවාසිකම් . ... ... ... ... | 123 |
| 129. | උපදේශක අධිකරණ බලය ... ... ... ... ... | 124 |
| 130. | ඡන්ද පෙත්සම් සහ ජනමත විචාරණ පෙත්සම් සම්බන්ධ අභියාචන අධිකරණ බලය | 124 |
| 131. | පාර්ලිමේන්තු වරප්‍රසාද කඩකිරීම සම්බන්ධ අධිකරණ බලය | 125 |
| 132. | ශ්‍රේෂ්ඨාධිකරණය පැවැත්වීම ... ... ... ... ... | 125 |
| 133. | තත්කාර්ය විනිශ්චයකාරවරයන් පත් කිරීම ... ... ... | 126 |
| 134. | ශ්‍රේෂ්ඨාධිකරණයේ දී කරුණු කියා සිටීමට ඇති අයිතිවාසිකම | 126 |
| 135. | ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් කාර්යාලය සහ රෙජිස්ට්‍රාර් ධූරය | 126 |
| 136. | ශ්‍රේෂ්ඨාධිකරණයේ රීති ... ... ... ... ... ... | 127 |


### අභියාචනාධිකරණය


| | | |
|---|---|---|
| 137. | අභියාචනාධිකරණය ... ... ... ... ... ... | 129 |
| 138. | අභියාචනාධිකරණයේ අධිකරණ බලය ... ... ... ... | 129 |
| 139. | අභියාචනයේ දී ඇති බලතල ... ... ... ... ... | 129 |
| 140. | හේබියස් කෝපුස් රිට් ආඥා හැර වෙනත් රිට් ආඥා නිකුත් කිරීමේ බලය | 130 |
| 141. | හේබියස් කෝපුස් රිට් ආඥා නිකුත් කිරීමේ බලය ... ... | 130 |
| 142. | සිරකරුවන් ගෙන්වා ගැනීමේ සහ ඉවත් කිරීමේ බලය ... | 131 |

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව


ව්‍යවස්ථාව පිටුව

143. ඉන්ජන්ෂන් තහනම් නිකුත් කිරීමේ බලය ... ... ... 131
144. පාර්ලිමේන්තු ඡන්ද පෙත්සම් ... ... ... ... ... 132
145. වාර්තා සෝදිසි කිරීම ... ... ... ... ... ... 132
146. අභියාචනාධිකරණය පැවැත්වීම ... ... ... ... ... 132
147. අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර් කාර්යාලය සහ රෙජිස්ට්‍රාර් ධුරය 133

XVII වැනි පරිච්ඡේදය

මූල්‍ය

148. රාජ්‍ය මූල්‍ය පිළිබඳ පාලනය පාර්ලිමේන්තුව සතු බව . ... 134
149. ඒකාබද්ධ අරමුදල ... ... ... ... ... ... ... 134
150. ඒකාබද්ධ අරමුදලෙන් මුදල් ඉවත්කර ගැනීම ... ... ... 134
151. අවිනිශ්චිත අවස්ථා අරමුදල ... ... ... ... ... 135
152. රජයේ ආදායමට බලපාන පනත් කෙටුම්පත් පිළිබඳ විශේෂ විධිවිධාන 135
153. විගණකාධිපතිවරයා ... ... ... ... ... ... 135
153අ. විගණන සේවා කොමිෂන් සභාවේ සංයුතිය ... ... ... 136
153ආ. කොමිෂන් සභාවේ රැස්වීම.. ... ... ... ... ... 137
153ඇ. කොමිෂන් සභාවේ බලතල හා කර්තව්‍ය.. ... ... ... 137
153ඈ. කොමිෂන් සභාවේ හෝ ශ්‍රී ලංකා විගණන සේවයේ තීරණයකට බලපෑම් කිරීම හෝ බලපෑම් කිරීමට තැත් කිරීම වරදක් බව 138
153ඉ. නීති කෘත්‍යවලින් මුක්තිය ... ... ... ... ... ... 138
153ඊ. පිරිවැය සහ වියදම්... ... ... ... ... ... ... 139
153උ. පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරියට ඉදිරිපත් කරන ලබන අභියාචන 139
153ඌ. කොමිෂන් සභාව පාර්ලිමේන්තුවට වගකිව යුතු බව ... ... 139
154. විගණකාධිපතිවරයාගේ කාර්ය හා කර්තව්‍ය ... ... ... 139

XVIIඅ වැනි පරිච්ඡේදය

154අ. පළාත් සභා පිහිටුවීම ... ... ... ... ... ... 143
154ආ. ආණ්ඩුකාරවරයා ... ... ... ... ... ... ... 143
154ඇ. ආණ්ඩුකාරවරයා විසින් විධායක බලතල ක්‍රියාත්මක කිරීම 146
154ඈ. පළාත් සභාවේ සාමාජිකත්වය ... ... ... ... ... 146
154ඉ. ධුර කාලය ... ... ... ... ... ... ... ... 147
154ඊ. අමාත්‍ය මණ්ඩලය ... ... ... ... ... ... ... 147
154උ. පළාත් සභා ප්‍රඥප්ති ... ... ... ... ... ... 148
154ඌ. අනුමතය ... ... ... ... ... ... ... ... 150

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව


| ව්‍යවස්ථාව | | පිටුව |
|---|---|---|
| 154එ. | මහජන ආරක්ෂාව ... ... ... ... ... ... ... | 151 |
| 154ඒ. | විධාන අනුව ක්‍රියාකිරීම පැහැර හැරීම ... ... ... ... | 152 |
| 154ඔ. | පරිපාලනය ඇනහිටීම ... ... ... ... ... ... | 152 |
| 154ඕ. | පළාත් සභාවක බලතල පාර්ලිමේන්තුව විසින් ජනාධිපතිවරයාට පැවරීම | 154 |
| 154ක. | මුල්‍ය ස්ථායිභාවය ... ... ... ... ... ... ... | 155 |
| 154ග. | මහාධිකරණය ... ... ... ... ... ... ... | 156 |
| 154ච. | පළාත් සභාවල කර්තව්‍ය, බලතල හා ඒවායේ මන්ත්‍රීවරුන් තෝරාපත්කර ගැනීම ආදිය | 157 |
| 154ජ. | මුදල් කොමිෂන් සභාව ... ... ... ... ... ... | 158 |
| 154ට. | මේ පරිච්ඡේදය යටතේ වූ බලතල ක්‍රියාත්මක නොකිරීමට පළාත් සභාවකට හැකියාව සලසන විශේෂ විධිවිධාන | 159 |
| 154ඩ. | අන්තර් කාලීන පියවර ... ... ... ... ... ... | 159 |


XVIII වැනි පරිච්ඡේදය

**මහජන ආරක්ෂාව**


| | | |
|---|---|---|
| 155. | මහජන ආරක්ෂාව ... ... ... ... ... ... ... | 160 |


XVIIIඅ වැනි පරිච්ඡේදය

**ජාතික පොලිස් කොමිෂන් සභාව**


| | | |
|---|---|---|
| 155අ. | ජාතික පොලිස් කොමිෂන් සභාවේ සංයුතිය ... ... ... | 163 |
| 155ආ. | කොමිෂන් සභාවේ රැස්වීම් ... ... ... ... ... | 164 |
| 155ඇ. | නීති කෘත්‍යවලින් මුක්තිය .. ... ... ... ... ... | 165 |
| 155ඈ. | කොමිෂන් සභාවේ ලේකම්වරයා . ... ... ... ... | 165 |
| 155ඉ. | පිරිවැය සහ වියදම් . ... ... ... ... ... ... | 165 |
| 155ඊ. | කොමිෂන් සභාවේ කටයුතුවලට අයුතු ලෙස මැදිහත් වීම | 166 |
| 155ඊඊ. | [ ඉවත් කරන ලදී ].. ... ... ... ... ... ... | 166 |
| 155ඊඊඊ. | කොමිෂන් සභාව රීති සෑදිය යුතු බව ... ... ... ... | 166 |
| 155උ. | කොමිෂන් සභාවේ බලතල . ... ... ... ... ... | 166 |
| 155ඌ. | කොමිෂන් සභාවේ ඇතැම් බලතල කමිටුවකට පැවරීම ... | 167 |
| 155එ. | කොමිෂන් සභාව විසින් ඇතැම් කාර්ය පැවරීම . ... ... | 168 |
| 155ඒ. | අභියාචන කිරීමේ අයිතිය ... ... ... ... ... ... | 168 |
| 155ඔ. | පරිපාලන අභියාචන විනිශ්චයාධිකාරය වෙත අභියාචනය කිරීම | 169 |
| 155ඕ. | දැනට බලපවත්නා රීති සහ නියෝග ශේෂ කිරීම ... ... | 169 |
| 155ක. | කොමිෂන් සභාව පාර්ලිමේන්තුවට වගකිව යුතු බව ... ... | 169 |

XIX වැනි පරිච්ඡේදය

**පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා**


| ව්‍යවස්ථාව | | පිටුව |
|---|---|---|
| 156. | පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා | 170 |

XIXඅ. වැනි පරිච්ඡේදය

**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීම සඳහා වූ කොමිෂන් සභාව**

| | | |
|---|---|---|
| 156අ. | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීම සඳහා වූ කොමිෂන් සභාව | 172 |

XIXආ. වැනි පරිච්ඡේදය

**ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව**

| | | |
|---|---|---|
| 156ආ. | ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව ... ... ... ... | 173 |
| 156ඇ. | සභාවේ කර්තව්‍ය ... ... ... ... ... ... ... | 173 |
| 156ඈ. | කොමිෂන් සභාවේ බලතල. ... ... ... ... ... | 174 |
| 156ඉ. | සභාවේ රැස්වීම් ... ... ... ... ... ... ... | 175 |
| 156ඊ. | සභාවේ කාර්ය මණ්ඩලය ... ... ... ... ... ... | 176 |
| 156උ. | සභාවේ වියදම් ඒකාබද්ධ අරමුදලට වැයබරක් විය යුතු බව | 176 |
| 156ඌ. | අර්ථ නිරූපනය ... ... ... ... ... ... ... | 176 |

XX වැනි පරිච්ඡේදය

**පොදු විධිවිධාන**

| | | |
|---|---|---|
| 157. | අන්තර් ජාතික ගිවිසුම් හා සම්මුති ... ... ... ... | 177 |
| 157අ. | ශ්‍රී ලංකාවේ දේශ පූර්ණත්වය උල්ලංඝනය කිරීම තහනම් කිරීම | 177 |
| 158. | බලතල පැවරීම ... ... ... ... ... ... ... | 178 |
| 159. | නියෝජ්‍ය කථානායකවරයා කථානායකවරයා වෙනුවට වැඩ බැලීම | 181 |

XXI වැනි පරිච්ඡේදය

**අන්තර්කාලීන විධිවිධාන**

| | | |
|---|---|---|
| 160. | ප්‍රථම ජනාධිපතිවරයා ... ... ... ... ... ... | 182 |
| 161. | ප්‍රථම පාර්ලිමේන්තුව ... ... ... ... ... ... | 182 |
| 162. | ඇතැම් විධිවිධාන අදාළවීම ... ... ... ... ... | 189 |
| 163. | ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ මහාධිකරණවල විනිශ්චයකාරවරයන් ධුර දැරීම නතර විය යුතු බව | 189 |
| 164. | විනිශ්චයකාරවරයන්, රජයේ නිලධරයන් සහ වෙනත් අය ඉදිරියටත් සේවයෙහි තබාගැනීම | 189 |
| 165. | රජයේ නිලධරයන් සහ වෙනත් අය ප්‍රතිඥාව හෝ දිවුරුම් දිය යුතු බව | 190 |
| 166. | ජනරජයේ බලතල, වරප්‍රසාද, පරිහාර හා අයිතිවාසිකම් | 191 |

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව


| ව්‍යවස්ථාව | | පිටුව |
|---|---|---|
| 167. | ජනරජයේ අයිතිවාසිකම්, යුතුකම් හා බැඳීම් ... ... ... | 191 |
| 168. | ඉකුත්ව ගිය කාලය තුළ නීතියෙහි ක්‍රියාකාරිත්වය සහ කලින් කරන ලද ක්‍රියා වැරදි සහ විනිශ්චයට නියමව ඇත්තා වූ නඩු ආදිය | 191 |
| 169. | අධිකරණයට අදාළ විධිවිධාන ... ... ... ... ... | 193 |
| 169අ. | රාජ නීතිඥවරයන්ට සහ ජ්‍යෙෂ්ඨ නීතිඥවරයන්ට අදාළ විධිවිධාන | 199 |


XXII වැනි පරිච්ඡේදය

**අර්ථ නිරූපණය**


| | | |
|---|---|---|
| 170. | අර්ථ නිරූපණය ... ... ... ... ... ... ... | 200 |


XXIII වැනි පරිච්ඡේදය

**පරිච්ජින්න කිරීම**


| | | |
|---|---|---|
| 171. | පරිච්ජින්න කිරීම ... ... ... ... ... ... ... | 204 |


XXIV වැනි පරිච්ඡේදය

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන බව ප්‍රකාශනය කිරීම**


| | | |
|---|---|---|
| 172. | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන බව ප්‍රකාශනය කිරීම | 205 |
| | දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ අන්තර්කාලීන විධිවිධාන | 206 |


**උපලේඛනය**


| | | |
|---|---|---|
| පළමුවැනි උපලේඛනය ... ... ... ... ... ... | | 210 |
| දෙවැනි උපලේඛනය ... ... ... ... ... ... | | 211 |
| තුන්වැනි උපලේඛනය ... ... ... ... ... ... | | 213 |
| හතරවැනි උපලේඛනය ... ... ... ... ... ... | | 215 |
| පස්වැනි උපලේඛනය ... ... ... ... ... ... | | 216 |
| හයවැනි උපලේඛනය ... ... ... ... ... ... | | 217 |
| හත්වැනි උපලේඛනය ... ... ... ... ... ... | | 218 |
| අටවැනි උපලේඛනය ... ... ... ... ... ... | | 219 |
| නවවැනි උපලේඛනය | (I වන ලැයිස්තුව - පළාත් සභා ලැයිස්තුව) | 220 |
| | (II වන ලැයිස්තුව - සංචෘත ලැයිස්තුව) | 240 |
| | (III වන ලැයිස්තුව - සමගාමී ලැයිස්තුව) | 249 |


**පරිශිෂ්ට**


| | |
|---|---|
| පරිශිෂ්ටය I | 227 |
| පරිශිෂ්ටය II | 234 |
| පරිශිෂ්ටය III | 237 |

# සවසති

ශ්‍රී බුද්ධ වර්ෂයෙන් දෙදහස් පන්සිය විසි එක් වැන්නෙහි අධි නිකිණි මස පුර සටවක් නම් තිථිය ලත් දවස හෙවත් වර්ෂ එක්දහස් නවසිය සැත්තෑ හතක් වූ ජූලි මස විසි එක් වන ගුරු දින ශ්‍රී ලංකාවාසී ජනතාව විසින් නිදහසේ ප්‍රකාශ කොට දෙන ලද වරමෙන්, ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයක අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස නව ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් කෙටුම්පත් කිරීමටත්, සම්මත කිරීමටත්, ක්‍රියාත්මක කිරීමටත් එදින තෝරා පත් කර ගන්නා ලද නියෝජිතයන්ට භාර කොට බලය පවරා දෙනු ලැබූ හෙයින් ද නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ස්ථිරසාර ජනරජ මූලධර්ම තහවුරු කරන්නාවූත් ශ්‍රී ලංකාවාසී ජනතාවගේ මතු පරම්පරා වලද ධර්මිෂ්ට නිවහල් සමාජයක් බිහිකිරීමෙහිලා සහ සුරක්ෂිත කිරීමෙහිලා ඒ පරම්පරා විසින් දරන්නාවූ ප්‍රයත්නයේ දී සහාය වීමට පැමිණෙන සකල ලෝකවාසීන්ගේ ද අභිමානය සහ සමෘද්ධිය සහතික කෙරෙන අස්පර්ශනීය උරුමයක් ලෙස නිදහස, සමානාත්මතාව, යුක්තිය මූලික මානව අයිතිවාසිකම් හා අධිකරණයේ ස්වාධිනත්වය සකල ජනතාවට සහතික කරන්නාවූත් ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයක් බවට ශ්‍රී ලංකාව පත් කිරීම සඳහා, ඒ වරම අනුව සහ ඉමහත් බහුතර ඡන්දයෙන් තෝරා පත් කර ගනු ලැබූ එකී නියෝජිතයන් කෙරෙහි තැබූ විශ්වාසය අනුව ගෞරව බහුමානයෙන් අධිෂ්ඨාන කරන ලද හෙයින් ද;

නිදහස් ලෙස තේරී පත් වූ ශ්‍රී ලංකාවාසී ජනතාවගේ නියෝජිතයන් වන අපි ජනතාව කෙරෙහි අපගේ ඇති බැඳීම් නිහතමානයෙන් පිළිගනිමින්, පුද්ගල අභිමානය සහ නිදහස සහතික කෙරෙන ආකාරයෙන් ද සාධාරණ සමාජ, ආර්ථික සහ සංස්කෘතික පදනමක් ඉදි වන ආකාරයෙන් ද රටේ සමගිය පුනර්ස්ථාපනය වන ආකාරයෙන් ද සෙසු ජාතීන් සමග සුහදතාව වර්ධනය වන ආකාරයෙන් ද ස්වකීය අයිතිවාසිකම් සහ වරප්‍රසාද යළි දිනාගෙන ආරක්ෂා කරගැනීම පිණිස ඒ ජනතාව කළ වීරෝදාර සහ අප්‍රතිහත අරගලය කෘතඥතා පූර්වකව සිහිපත් කරමින්, එකී වරම ප්‍රකාර

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ**

**උත්තරීතර නීතිය**

ලෙස මේ

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

මෙයින් සම්මත කොට

**පනවම්හ.**

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

## I වැනි පරිච්ඡේදය

## ව්‍යවස්ථාව

### ජනතාව, රජය සහ පරමාධිපත්‍යය

රජය.

1. ශ්‍රී ලංකාව නිදහස්, ස්වෛරී, ස්වාධීන, ප්‍රජාතාන්තික සමාජවාදී ජනරජයකි. ශ්‍රී ලංකාව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්තික සමාජවාදී ජනරජය යනුවෙන් හඳුන්වනු ලැබේ.

ඒකීය රජයක් බව.

2. ශ්‍රී ලංකා ජනරජය ඒකීය රජයකි.

ජනතාවගේ පරමාධිපත්‍යය.

3. ශ්‍රී ලංකා ජනරජයේ පරමාධිපතය ජනතාව කෙරෙහි පිහිටා ඇත්තේ ය. පරමාධිපත්‍යය අත්හළ නොහැක්කේ ය. පරමාධිපත්‍යයට පාලන බලතල, මූලික අයිතිවාසිකම් සහ ඡන්ද බලය ද ඇතුළත් වන්නේ ය.

පරමාධිපත්‍යය ක්‍රියාත්මක කිරීම.

4. ජනතාවගේ පරමාධිපත්‍යය ක්‍රියාත්මක වීම ද, භුක්ති විඳීම ද, මතු දැක්වෙන ආකාරයෙන් සිදුවන්නේ යː-

(අ) ජනතාවගේ ව්‍යවස්ථාදායක බලය ජනතාව විසින් තෝරා පත්කර ගනු ලබන මන්ත්‍රීවරයන්ගෙන් සමන්විත පාර්ලිමේන්තුව විසින් ද, ජනමත විචාරණයක දී ජනතාව විසින් ද ක්‍රියාත්මක කළ යුත්තේ ය;

(ආ) රටේ ආරක්ෂාව ඇතුළුව ජනතාවගේ විධායක බලය ජනතාව විසින් තෝරා පත්කර ගනු ලබන ජනරජයේ ජනාධිපතිවරයා විසින් ක්‍රියාත්මක කළ යුත්තේ ය;

(ඇ) නීතිය අනුව පාර්ලිමේන්තුව විසින් ම ක්‍රියාත්මක කළ හැකි පාර්ලිමේන්තුවේ සහ එහි මන්ත්‍රීවරයන්ගේ වරප්‍රසාද, පරිහාර හා බලතල සම්බන්ධයෙන් විනා ජනතාවගේ අධිකරණ බලය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඇති කොට පිහිටුවන ලද හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිළිගන්නා ලද නැතහොත් වෙනත් යම් නීතියකින් ඇති කොට පිහිටුවන ලද අධිකරණ, විනිශ්චය අධිකාර සහ ආයතන මගින් පාර්ලිමේන්තුව විසින් ක්‍රියාත්මක කළ යුත්තේ ය;

(ඈ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ප්‍රකාශ කොට පිළිගනු ලබන මූලික අයිතිවාසිකම් සියලු පාලන ආයතන විසින් ගරු කරනු ලැබිය යුත්තේ ය; ආරක්ෂා කරනු ලැබිය යුත්තේ ය; වර්ධනය කරනු ලැබිය යුත්තේ ය. තව ද, ඒ මූලික අයිතිවාසිකම් මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති ආකාරයට සහ ප්‍රමාණයට මිස සංක්ෂිප්ත කිරීම, සීමා කිරීම හෝ අහිමි කිරීම නොකළ යුත්තේ ය;

(ඉ) අටළොස් විය සම්පූර්ණ කර ඇත්තා වූ ද, මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති පරිදි ඡන්දහිමියකු වීමට සුදුසුකම් ලැබ තමාගේ නම ඡන්දහිමි නාමලේඛනයේ

ඇතුළත් කරනු ලැබ සිටින්නා වූ ද, සෑම පුරවැසියකු විසින් ම ජනරජයේ ජනාධිපතිවරයා තෝරා පත් කිරීමේ ඡන්ද විමසීමේ දී ද, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත් කිරීමේ මැතිවරණයේ දී ද, සෑම ජනමත විචාරණයක දී ද ඡන්ද බලය ක්‍රියාත්මක කළ හැකි විය යුතු වන්නේ ය.

**ජනරජයට අයත් දේශය.**

**5.** ශ්‍රී ලංකා ජනරජයට අයත් දේශය පරිපාලන දිස්ත්‍රික්ක [1][විසිපහෙන්ද] ජනරජයේ දේශීය ජල තීරයෙන් ද සමන්විත වන්නේ ය. පරිපාලන දිස්ත්‍රික්ක [1][විසිපහෙහි] නම් [2][පළමුවැනි උපලේඛනයෙහි දැක්වෙන්නේ යඃ

එසේ වුව ද, පාර්ලිමේන්තුව විසින් යෝජනා සම්මතයක් මගින් තීරණය කරනු ලබන පරිදි ඒ පරිපාලන දිස්ත්‍රික්ක, ඒවාට වෙනස් වූ පරිපාලන දිස්ත්‍රික්ක සංයුක්ත වන පරිදි, නැවත බෙදීම හෝ ඒකාබද්ධ කිරීම හෝ කරනු ලැබිය හැක්කේ ය.]

**ජාතික කොඩිය**

**6.** ශ්‍රී ලංකා ජනරජයේ ජාතික කොඩිය, දෙවැනි උපලේඛනයෙහි නිරූපිත සිංහ කොඩිය වන්නේ ය.

**ජාතික ගීය.**

**7.** ශ්‍රී ලංකා ජනරජයේ ජාතික ගීය "ශ්‍රී ලංකා මාතා" ගීය වන්නේ ය. ජාතික ගීයෙහි පදමාලාව සහ සංගීතය තුන්වැනි උපලේඛනයෙහි දැක්වෙන්නේ ය.

**ජාතික දිනය.**

**8.** ශ්‍රී ලංකා ජනරජයේ ජාතික දිනය පෙබරවාරි මස හතරවැනි දිනය වන්නේ ය.

---

1 - හත් වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 2 (අ) වැනි වගන්තිය මගින් "විසිහතරෙන් ද", "විසිහතරෙහි" වෙනුවට ආදේශ කරන ලදී.

2 - හත් වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 2 (ආ) වැනි වගන්තිය මගින් "පළමුවන උපලේඛනයෙහි දැක්වෙන්නේ ය" වෙනුවට ආදේශ කරන ලදී.

## II වැනි පරිච්ඡේදය

### බුද්ධාගම

**9.** ශ්‍රී ලංකා ජනරජය බුද්ධාගමට ප්‍රමුඛස්ථානය පිරිනමන්නේ ය. එහෙයින් 10 වැනි ව්‍යවස්ථාවෙන් සහ 14 වැනි ව්‍යවස්ථාවේ (1) වැනි අනු ව්‍යවස්ථාවේ (ඉ) ඡේදයෙන් සියලු ම ආගම්වලට පිරිනැමෙන අයිතිවාසිකම් ආරක්ෂා කර දෙන අතර බුද්ධ ශාසනය සුරක්ෂිත කොට පෝෂණය කිරීම රජයේ වගකීම විය යුත්තේ ය. බුද්ධාගම

## III වැනි පරිච්ඡේදය

## මූලික අයිතිවාසිකම්

**සිතීමේ නිදහස, හෘදය සාක්ෂියේ නිදහස සහ ආගමික නිදහස.**

**10.** සෑම තැනැත්තකුට ම තමන් අභිමත ආගමක් ඇදහීමේ හෝ වැළඳ ගැනීමේ නිදහස ද, ලබ්ධියක් හෝ විශ්වාසයක් දැරීමේ හෝ පිළිගැනීමේ නිදහස ද ඇතුළුව සිතීමේ නිදහසට, හෘදය සාක්ෂියේ නිදහසට සහ ආගමික නිදහසට හිමිකම් ඇත්තේය.

**වධ හිංසාවලින් නිදහස.**

11. කිසිම තැනැත්තකු වධ හිංසාවලට හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේ ය.

**සර්ව සාධාරණත්වයේ අයිතිවාසිකම.**

12. (1) නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද, නීතියේ රැකවරණය ද, සර්ව සාධාරණ විය යුත්තේ ය.

(2) කිසිම පුරවැසියකු වර්ගය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භේදය, දේශපාලන මතය හෝ උපන් ස්ථානය යන හේතු මත හෝ ඉන් කවර වූ හේතුවක් මත හෝ වෙනස්කමකට හෝ විශේෂයකට හෝ භාජන නොවිය යුත්තේ ය;

එසේ වුවද, රජයේ සේවයේ, අධිකරණ සේවයේ, පළාත් පාලන සේවයේ නැතහොත් යම් රාජ්‍ය සංස්ථාවක සේවයේ යම් සේවා නියුක්තියක හෝ ධුරයක කාර්ය ඉටුකිරීම සඳහා යම් තැනැත්තකු යම් භාෂාවක් පිළිබඳ ප්‍රමාණවත් දැනීමක් ඇතිව සිටීම සාධාරණව අවශ්‍ය වන අවස්ථාවක ඒ සේවා නියුක්තිය හෝ ධුරය සඳහා සුදුසුකමක් වශයෙන් ඒ භාෂාව පිළිබඳ එසේ ප්‍රමාණවත් දැනීමක් සාධාරණ කාලයක් තුළදී ලබාගත යුතු යයි එවැනි තැනැත්තකුට නියම කිරීම නීත්‍යානුකූල වන්නේ ය:

එසේම තව දුරටත්, එවැනි යම් සේවා නියුක්තියක හෝ ධුරයක හෝ කිසිදු කර්තව්‍යයක් යම් භාෂාවක් පිළිබඳ දැනීම ඇත්තේ නම් මිස ඉටු කළ නොහැකිවන අවස්ථාවලදී, ඒ සේවා නියුක්තියට හෝ ධුරයට හෝ ඇතුළත් කර ගැනීමේ සුදුසුකමක් වශයෙන් යම් තැනැත්තකුට ඒ භාෂාව පිළිබඳ ප්‍රමාණවත් දැනීමක් තිබිය යුතු යයි නියම කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

(3) වර්ගය, ආගම, භාෂාව, කුලය හෝ ස්ත්‍රී පුරුෂ භේදය යන හේතු මත හෝ ඉන් කවර වූ හේතුවක් මත හෝ වෙළඳසල්වලට, පොදු භෝජනාගාරවලට, ආපනශාලාවලට, පොදු විනෝද ස්ථානවලට හෝ තම තමාගේ ආගමට අයත් පොදු පූජනීය ස්ථානවලට ඇතුළුවීම සම්බන්ධයෙන් යම් අශක්නුතාවකට, බැඳීමකට, සීමා කිරීමකට නැතහොත් කොන්දේසියකට කිසිම තැනැත්තෙක් යටත් නොවන්නේ ය.

(4) කාන්තාවන්ගේ, ළමයින්ගේ හෝ අබල තැනැත්තන්ගේ ප්‍රගතිය සඳහා නීතියෙන් හෝ අනු නීතිවලින් හෝ විධායක ක්‍රියා මාර්ගයෙන් හෝ විශේෂ විධිවිධාන සැලැස්වීම මේ ව්‍යවස්ථාවෙන් කිසිසේත් අවහිර නොවන්නේ ය.

අත්තනෝමතිකව සිරභාරයට ගැනීමෙන්, රඳවා තබා ගැනීමෙන් සහ දඬුවම් කිරීමෙන් නිදහස සහ අතීතයට බලපාන දණ්ඩන නීති පැනවීම තහනම් කිරීම.

**13.** (1) නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටියට අනුකූලව මිස කිසිම තැනැත්තකු සිරභාරයට ගැනීම නොකළ යුත්තේ ය. යම් තැනැත්තකු සිරභාරයට ගනු ලබන්නේ යම් හේතුවක් මත ද ඒ හේතුව ඒ තැනැත්තාට දැන්විය යුත්තේ ය.

(2) අත් අඩංගුවෙහි තබා ගනු ලැබූ හෝ රඳවා තබා ගනු ලැබූ හෝ අන්‍යාකාරයකින් පෞද්ගලික නිදහස අහිමි කරනු ලැබූ හෝ සෑම තැනැත්තකු ම නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටිය අනුව ආසන්නතම නිසි අධිකරණයේ විනිශ්චයකාරවරයා ඉදිරියට ගෙන යා යුතු අතර, නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටියට අනුකූලව ඒ විනිශ්චයකාරවරයා විසින් කරනු ලැබූ ආඥාව මත සහ ආඥාව ප්‍රකාර මිස, ඒ තැනැත්තා තවදුරටත් අත් අඩංගුවෙහි තබා ගැනීම හෝ රඳවා තබා ගැනීම හෝ ඒ තැනැත්තාගේ පෞද්ගලික නිදහස අහිමි කිරීම හෝ නොකළ යුත්තේ ය.

(3) වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුට විරුද්ධව චෝදනා නගනු ලැබ ඇත්තේ ද, ඒ තැනැත්තාට, නිසි අධිකරණයක් විසින් පවත්වනු ලබන සාධාරණ නඩු විභාගයක දී පෞද්ගලිකව ම හෝ නීතිඥවරයකු මගින් හෝ කරුණු ක්‍රියා සිටීමට හිමිකම් ඇත්තේ ය.

(4) නීතියෙන් නියම කරනු ලැබූ කාර්ය පටිපාටියට අනුකූලව නිසි අධිකරණයක් විසින් කරනු ලැබූ ආඥාවක් අනුව මිස, කිසිම තැනැත්තකු මරණීය දණ්ඩනයට යටත් කිරීම හෝ කිසිම තැනැත්තකු බන්ධනාගාරගත කිරීම හෝ නොකළ යුත්තේ ය. එහෙත් විමර්ශනයක් පවත්වන තෙක් හෝ නඩු විභාගයක් පවත්වන තෙක් හෝ යම් තැනැත්තකු සිරභාරයට ගැනීම, අත්අඩංගුවේ තබා ගැනීම, රඳවා තබා ගැනීම හෝ අන්‍යාකාරයකින් ඒ තැනැත්තාගේ පෞද්ගලික නිදහස අහිමි කිරීම දඬුවමක් නොවන්නේ ය.

(5) වරදකරු යයි ඔප්පු කරනු ලබන තෙක් සෑම තැනැත්තකු ම නිර්දෝෂී යයි පූර්වානුමාන කළ යුත්තේ යඃ

එසේ වුව ද, විශේෂ වූ සිද්ධි ඔප්පු කිරීමේ භාරය, චූදිත තැනැත්තකු වෙත නීතියෙන් පවරනු ලැබිය හැක්කේ ය.

(6) යම් ක්‍රියාවක් කළ හෝ යම් නොකර හැරීමක් සිදු වූ අවස්ථාවේ දී ඒ ක්‍රියාව හෝ නොකර හැරීම වරදක් නොවී නම් ඒ ක්‍රියාව හෝ නොකර හැරීම සම්බන්ධයෙන් කිසිම තැනැත්තකු වරදකට වරදකරුවකු නොවිය යුත්තේ ය.

තව ද, යම් වරදක් සිදු කරනු ලැබූ අවස්ථාවේ දී ඒ වරද සම්බන්ධයෙන් බලපැවැත් වූ දණ්ඩනයට වැඩි කිසිම දණ්ඩනයක් ඒ වරද සම්බන්ධයෙන් නියම නොකළ යුත්තේ ය.

යම් ක්‍රියාවක් කළ හෝ යම් නොකර හැරීමක් සිදු වූ අවස්ථාවේ දී එය ජාතීන්ගේ සම්මතයෙන් පිළිගත් පොදු නෛතික මූලධර්ම අනුව සාපරාධී ක්‍රියාවක් හෝ නොකර හැරීමක් වූ විට, ඒ ක්‍රියාව

හෝ නොකර හැරීම සම්බන්ධයෙන් කවර වූ හෝ තැනැත්තකු නඩු විභාගයට භාජන කොට දඬුවම් කිරීමට මේ ව්‍යවස්ථාවේ ඇතුළත් කිසිවකින් හානියක් නොවන්නේ ය.

යම් වරදක් සඳහා නියම කරනු ලබන අවම දණ්ඩනය ඒ වරද සිදුකළ අවස්ථාවේ දී ඒ වරද සඳහා නියමිතව තිබුණු උපරිම දණ්ඩනය නොඉක්මවන්නේ නම්, ඒ වරද සඳහා එකී අවම දණ්ඩනය පනවන ලෙස නියම කිරීම මේ ව්‍යවස්ථාවේ විධිවිධාන කඩකිරීමක් නොවන්නේ ය.

(7) ආගාමික හා විගාමික පනතේ හෝ 1967 අංක 14 දරන ඉන්දු-ලංකා ගිවිසුම (ක්‍රියාත්මක කිරීමේ) පනතේ හෝ එකී පනත් වෙනුවට ආදේශ කිරීම සඳහා පනවනු ලබන වෙනත් නීතියක හෝ විධිවිධාන යටතේ කරනු ලබන ඉවත් කිරීමේ නියමයක නැතහොත් රටින් පිට කිරීමේ නියමයක හේතුවෙන් යම් තැනැත්තකු සිරභාරයට ගැනීම, අත් අඩංගුවේ තබා ගැනීම, රඳවා තබා ගැනීම හෝ අන්‍යාකාරයකින් ඒ තැනැත්තාගේ පෞද්ගලික නිදහස අහිමි කිරීම මේ ව්‍යවස්ථාවේ විධිවිධාන කඩකිරීමක් නොවන්නේ ය.

**භාෂණයේ, රැස්වීමේ, සමාගමයේ, රැකියාවේ සහ යාම් ඊම් යනාදියේ නිදහස.**

**14.** (1) සෑම පුරවැසියකුට ම -

(අ) භාෂණයේ නිදහසට සහ ප්‍රකාශනය ඇතුළු අදහස් පළ කිරීමේ නිදහසට;

(ආ) සාමකාමීව රැස්වීමේ නිදහසට;

(ඇ) සමාගමයේ නිදහසට;

(ඈ) වෘත්තීය සමිති පිහිටුවීමේ සහ වෘත්තීය සමිතිවලට බැඳීමේ නිදහසට;

(ඉ) එකලාව හෝ අන් අය හා සමග, ප්‍රසිද්ධියේ හෝ පෞද්ගලිකව තම ආගම, ලබ්ධිය හෝ විශ්වාසය ඇදහීමෙන්, පිළිපැදීමෙන්, ප්‍රගුණ කිරීමෙන් සහ ඉගැන්වීමෙන් ප්‍රකාශ කිරීමේ නිදහසට;

(ඊ) එකලාව හෝ අන් අය හා සමග හෝ ස්වකීය සංස්කෘතිය භුක්ති විඳීමේ හා වැඩි දියුණු කිරීමේ නිදහසට සහ ස්වකීය භාෂාව භාවිත කිරීමේ නිදහසට;

(උ) එකලාව හෝ අන් අය හා සමග යම් නීත්‍යානුකූල රැකියාවක, වෘත්තියක, කර්මාන්තයක, වෙළඳ ව්‍යාපාරයක හෝ ව්‍යවසායක නියුක්ත වීමේ නිදහසට;

(ඌ) ශ්‍රී ලංකාව තුළ යාම් ඊම් නිදහසට සහ අභිමත ස්ථානයක වාසය කිරීමේ නිදහසට; සහ

(ඒ) ශ්‍රී ලංකාවට පෙරළා පැමිණීමේ නිදහසට

හිමිකම ඇත්තේ ය.

(2) වෙනත් යම් කිසි රටක පුරවැසියකු ව නොසිටිය දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වන තෙක් ශ්‍රී ලංකාවෙහි ස්ථිරව

සහ නීත්‍යානුකූලව පදිංචිව සිටියා වූ සහ එසේ දිගට ම පදිංචිව සිටින්නා වූ තැනැත්තකුට ද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භවීමේ සිට අවුරුදු දහයක කාලයක් තුළ මේ ව්‍යවස්ථාවේ (1) වැනි අනු ව්‍යවස්ථාවෙන් ප්‍රකාශ කොට පිළිගනු ලැබ ඇති අයිතිවාසිකම්වලට හිමිකම ඇත්තේ ය.

**තොරතුරු වෙත ප්‍රවේශ වීමේ අයිතිවාසිකම.**

[3] **14අ.** (1) සෑම පුරවැසියකුට ම -

(අ) රජය, අමාත්‍යාංශයක් හෝ යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් හෝ යම් නීතියක් මගින් හෝ යටතේ පිහිටුවනු ලැබූ හෝ ඇති කරනු ලැබූ යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් සතුව පවත්නා වූ;

(ආ) යම් පළාත් අමාත්‍ය මණ්ඩලයක අමාත්‍යවරයකුගේ යම් අමාත්‍යාංශයක් හෝ යම් දෙපාර්තමේන්තුවක් හෝ පළාත් සභා ප්‍රඥප්තියක් මගින් පිහිටුවනු ලැබූ හෝ ඇති කරනු ලැබූ යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් හෝ සතුව පවත්නා වූ;

(ඇ) යම් පළාත් පාලන ආයතනයක් සතුව පවත්නාව; සහ

(ඈ) මේ අනු ව්‍යවස්ථාවේ (අ), (ආ) හෝ (ඇ) ඡේදවල සඳහන් ආයතනවලට අදාළව වෙනත් යම් තැනැත්තකු සතුව පවත්නා වූ,

සහ පුරවැසියකුගේ අයිතියක් ක්‍රියාත්මක කිරීම සඳහා හෝ ආරක්ෂා කිරිම සඳහා අවශ්‍ය වූ යම් තොරතුරක් වෙත නීතියෙන් සලසා ඇති පරිදි ප්‍රවේශ වීමේ අයිතිවාසිකම ඇත්තේ ය.

(2) ජාතික ආරක්ෂාව, භෞමික අඛණ්ඩතාව හෝ මහජන ආරක්ෂාව තහවුරු කිරීම පිණිස ද, විෂමාචාර හෝ අපරාධ වැළැක්වීම පිණිස ද, සෞඛ්‍යය හෝ සදාචාරය ආරක්‍ෂා කිරීම පිණිස ද, අන් අයගේ කීර්තිය හෝ අයිතිවාසිකම් ආරක්‍ෂා කිරීම පිණිස ද, පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම පිණිස ද, අධිකරණයට අපහාස කිරීම වැළැක්වීම පිණිස ද, පාර්ලිමේන්තු වරප්‍රසාද ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ද විශ්වාසය මත දැනුම් දෙන ලද තොරතුරු හෙළිදරව් කිරීම වැළැක්වීම පිණිස ද හෝ අධිකරණයේ අධිකාරී බලය හා අපක්‍ෂපාතීත්වය පවත්වාගෙන යාම පිණිසද, ප්‍රජාතන්ත්‍රවාදී සමාජයකට අවශ්‍ය වන්නා වූ නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම් හැර වෙනත් කවර හෝ සීමාකිරීමක් මේ ව්‍යවස්ථාවෙන් ප්‍රකාශ කොට පිළිගෙන ඇති අයිතිවාසිකම මත නොපැනවිය යුත්තේ ය.

(3) මේ ව්‍යවස්ථාවේ 'පුරවැසියා' යන්නට, යම් ව්‍යවස්ථාපිත වූ හෝ ව්‍යවස්ථාපිත නොවූ මණ්ඩලයක සාමාජිකයන්ගෙන් හතරෙන් තුනකට නොඅඩු සංඛ්‍යාවක් පුරවැසියන් වන්නේ නම්, එවැනි මණ්ඩලයක් ඇතුළත් වේ.

---

3 - දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 2 වගන්තිය මගින් ඇතුළත් කරන ලදී.

**මූලික අයිතිවාසිකම් පිළිබඳ සීමා.**

**15.** (1) 13 වැනි ව්‍යවස්ථාවේ (5) වැනි සහ (6) වැනි අනුව්‍යවස්ථාවලින් ප්‍රකාශ කොට පිළිගෙන ඇති මූලික අයිතිවාසිකම් භුක්ති විඳිය හැක්කේ ද, ක්‍රියාත්මක විය හැක්කේ ද, රාජ්‍ය ආරක්ෂාව තහවුරු කිරිම පිණිස නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම්වලට පමණක් යටත්ව ය. මෙම අනුව්‍යවස්ථාවේ කාර්ය සඳහා 'නීතිය' යන්නට මහජන ආරක්ෂාව පිළිබඳව තත් කාලයේ අදාළ වන නීතිය යටතේ සාදන ලද නියෝග ද ඇතුළත් වන්නේ ය.

(2) 14 වැනි ව්‍යවස්ථාවේ (1) වැනි අනුව්‍යවස්ථාවේ (අ) ඡේදයෙන් ප්‍රකාශ කොට පිළිගෙන ඇති මූලික අයිතිවාසිකම භුක්ති විඳිය හැක්කේ ද, ක්‍රියාත්මක විය හැක්කේ ද, වාර්ගික හා ආගමික සහයෝගිතාව තහවුරු කිරීම සඳහා හෝ පාර්ලිමේන්තු වරප්‍රසාද, අධිකරණයට අපහාස කිරීම, අපහාසය හෝ වරදකට පෙළඹවීම හා සම්බන්ධව නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම්වලට යටත්ව ය.

(3) 14 වැනි ව්‍යවස්ථාවේ (1) වැනි අනුව්‍යවස්ථාවේ (ආ) ඡේදයෙන් ප්‍රකාශ කොට පිළිගෙන ඇති මූලික අයිතිවාසිකම භුක්ති විඳිය හැක්කේ ද, ක්‍රියාත්මක විය හැක්කේ ද, වාර්ගික හා ආගමික සහයෝගිතාව තහවුරු කිරීම සඳහා නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම්වලට යටත්ව ය.

(4) 14 වැනි ව්‍යවස්ථාවේ (1) වැනි අනුව්‍යවස්ථාවේ (ඇ) ඡේදයෙන් ප්‍රකාශ කොට පිළිගෙන ඇති මූලික අයිතිවාසිකම භුක්ති විඳිය හැක්කේ ද, ක්‍රියාත්මක විය හැක්කේ ද, වාර්ගික හා ආගමික සහයෝගිතාව තහවුරු කිරීම සඳහා හෝ ජාතික ආර්ථිකය ආරක්ෂා කිරීම සඳහා නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම්වලට යටත්ව ය.

(5) 14 වැනි ව්‍යවස්ථාවේ (1) වැනි අනුව්‍යවස්ථාවේ (උ) ඡේදයෙන් ප්‍රකාශ කොට පිළිගෙන ඇති මූලික අයිතිවාසිකම් භුක්ති විඳිය හැක්කේ ද, ක්‍රියාත්මක විය හැක්කේ ද, ජාතික ආර්ථිකය ආරක්ෂා කිරීම සඳහා හෝ -

(අ) යම් වෘත්තියක යෙදී සිටීමට හෝ යම් රැකියාවක්, කර්මාන්තයක්, වෙළඳ ව්‍යාපාරයක් හෝ ව්‍යවසායක් පවත්වාගෙන යාමට අවශ්‍ය වෘත්තීය, කාර්මික, අධ්‍යාපනික, මූල්‍ය සහ වෙනත් සුදුසුකම් සම්බන්ධයෙන් සහ එම මූලික අයිතිවාසිකමට හිමිකම් ලබන තැනැත්තන්ට බලපත්‍ර දීම සහ ඒ තැනැත්තන් විෂයයෙහි විනය පාලනය සම්බන්ධයෙන්; සහ

(ආ) රජය විසින් හෝ රාජ්‍ය නියෝජිත ආයතනයක් විසින් හෝ රාජ්‍ය සංස්ථාවක් විසින් හෝ යම් කර්මාන්තයක්, වෙළඳ ව්‍යාපාරයක්, කාර්මික ව්‍යාපාරයක්, සේවාවක්

හෝ ව්‍යවසායක් පුරවැසි සහභාගිත්වය නොමැතිව හෝ පුරවැසි කොටසක සහභාගීත්වය ඇතිව හෝ අන්‍යාකාරයකින් හෝ පවත්වාගෙන යාම සම්බන්ධයෙන්, නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම්වලට යටත්ව ය.

(6) 14 වැනි ව්‍යවස්ථාවේ (1) වැනි අනුව්‍යවස්ථාවේ (උ) ඡේදයෙන් ප්‍රකාශ කොට පිළිගෙන ඇති මූලික අයිතිවාසිකම භුක්ති විඳිය හැක්කේ ද, ක්‍රියාත්මක විය හැක්කේ ද, ජාතික ආර්ථිකය ආරක්ෂා කිරිම සඳහා නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම්වලට යටත්ව ය.

(7) 12 වැනි ව්‍යවස්ථාවෙන්, 13 වැනි ව්‍යවස්ථාවේ (1) වැනි හා (2) වැනි අනුව්‍යවස්ථාවලින් සහ 14 වැනි ව්‍යවස්ථාවෙන් ප්‍රකාශ කොට පිළිගෙන ඇති සියලුම මූලික අයිතිවාසිකම් භුක්ති විඳිය හැක්කේ ද, ක්‍රියාත්මක විය හැක්කේ ද, රාජ්‍ය ආරක්ෂාව ද, රටේ යථා පැවැත්ම ද, තහවුරු කිරීම පිණිසත්, මහජන සෞඛ්‍යය හෝ සදාචාරය ආරක්ෂා කිරීම පිණිසත්, අන්‍යයන්ගේ අයිතිවාසිකම් හා නන් වැදෑරුම් නිදහස නිසි පරිදි පිළිගන්නා බවට සහ ඊට නිසි පරිදි ගරු කරන බවට වගබලා ගැනීම පිණිසත්, ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පොදු සුභසාධනය සඳහා යුක්ති සහගතව අවශ්‍ය දෑ සපුරාලීම පිණිසත්, නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම්වලට යටත්ව ය. මෙම අනුව්‍යවස්ථාවේ කාර්ය සඳහා 'නීතිය' යන්නට මහජන ආරක්ෂාව පිළිබඳව තත්කාලයේ අදාළ වන නීතිය යටතේ සාදන ලද නියෝග ද ඇතුළත් වන්නේ ය.

(8) 12 වැනි ව්‍යවස්ථාවේ (1) වැනි අනුව්‍යවස්ථාවෙන්, 13 වැනි ව්‍යවස්ථාවෙන් සහ 14 වැනි ව්‍යවස්ථාවෙන් ප්‍රකාශ කොට පිළිගෙන ඇති මූලික අයිතිවාසිකම්, සන්නද්ධ හමුදාවන්හි සාමාජිකයන්ට, පොලිස් හමුදාවේ සාමාජිකයන්ට සහ රටේ යථා පැවැත්ම භාරව සිටින වෙනත් හමුදාවල සාමාජිකයන්ට අදාළ වීමේ දී එම අයිතිවාසිකම් භුක්ති විඳිය හැක්කේ ද, ක්‍රියාත්මක විය හැක්කේ ද, ඔවුන්ගේ කාර්යයන් යථා පරිදි ඉටු කරවා ගැනීම සහ ඔවුන් අතර විනය පවත්වා ගැනීම පිණිස නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම්වලට යටත්ව ය.

**පවත්නා ලිඛිත නීති සහ ලිඛිත නොවූ නීති බලපවත්වන බව.**

**16.** (1) පවත්නා ලිඛිත නීති සහ ලිඛිත නොවූ නීති අතුරෙන් යම්කිසි ලිඛිත නීතියක් හෝ ලිඛිත නොවූ නීතියක් මේ පරිච්ඡේදයේ මෙයට ඉහතින් ඇති විධිවිධානවලට අනුකූල නොවුව ද, එකී සියලු පවත්නා ලිඛිත නීති සහ ලිඛිත නොවූ නීති බලාත්මකව ක්‍රියාත්මක වන්නේ ය.

(2) කවර වූ හෝ පවත්නා ලිඛිත නීතියකින් දඬුවමක් ලෙස පිළිගනු ලැබූ කවර වූ හෝ ආකාරයක දඬුවමකට කවර වූ හෝ තැනැත්තකු නිසි අධිකරණයක ආඥාව පිට යටත් කිරීම මේ පරිච්ඡේදයේ විධිවිධාන කඩකිරීමක් නොවන්නේ ය.

**විධායක ක්‍රියා මගින් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමට ප්‍රතිකර්මය.**

**17.** මේ පරිච්ඡේදයේ විධිවිධාන යටතේ යම් තැනැත්තකුට හිමි වන යම් මූලික අයිතිවාසිකමක් යම් විධායක හෝ පරිපාලනමය ක්‍රියාවක් මගින් උල්ලංඝනය කර තිබීම හෝ උල්ලංඝනය කිරීමට අත්‍යාසන්නව තිබීම හෝ සම්බන්ධයෙන් 126 වැනි ව්‍යවස්ථාවේ විධිවිධාන සලසා ඇති පරිදි ශ්‍රේෂ්ඨාධිකරණයට ඉල්ලීමක් කිරීමට ඒ තැනැත්තාට හිමිකම් ඇත්තේ ය.

## IV වැනි පරිච්ඡේදය

### භාෂාව

**18.** [4] [(1)] ශ්‍රී ලංකාවේ රාජ්‍ය භාෂාව සිංහල භාෂාව වන්නේ ය. — රාජ්‍ය භාෂාව.

[5] [(2) දෙමළ භාෂාව ද රාජ්‍ය භාෂාවක් වන්නේ ය.

(3) ඉංග්‍රීසි භාෂාව සන්ධාන භාෂාව වන්නේ ය.

(4) මේ පරිච්ඡේදයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් නීති මගින් විධිවිධාන සැලැස්විය යුතු ය.]

**19.** සිංහල භාෂාව සහ දෙමළ භාෂාව ශ්‍රී ලංකාවේ ජාතික භාෂා වන්නේ ය. — ජාතික භාෂා

**20.** පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුට හෝ [6][පළාත් සභාවක මන්ත්‍රීවරයකුට හෝ පළාත් පාලන ආයතනයක සභිකයකුට] පිළිවෙළින් පාර්ලිමේන්තුවේ හෝ [7][ඒ පළාත් සභාවේ හෝ පළාත් පාලන ආයතනයේ] හෝ ජාතික භාෂා දෙකෙන් කවර භාෂාවකින් වුව ද තමාගේ කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීමට හිමිකම ඇත්තේය. — පාර්ලිමේන්තුවෙහි, පළාත් සභාවල සහ පළාත් පාලන ආයතනවල ජාතික භාෂා භාවිතය.

**21.** (1) යම් තැනැත්තකුට ජාතික භාෂා දෙකෙන් කවර මාධ්‍යයකින් වුව ද අධ්‍යාපනය ලැබීමට හිමිකම ඇත්තේය; — ඉගැන්වීමේ මාධ්‍යය

එසේ වුව ද, ජාතික භාෂාවක් නොවන භාෂාවක් ඉගැන්වීමේ භාෂා මාධ්‍යය වන උසස් අධ්‍යාපන ආයතනයකට මෙම අනුව්‍යවස්ථාවේ විධිවිධාන අදාළ නොවන්නේ ය.

(2) රජය විසින් කෙළින් ම හෝ අන්‍යාකාරයකින් හෝ මුදල් සපයනු ලබන යම් විශ්වවිද්‍යාලයක යම් පාඨමාලාවක් සඳහා නැතහොත් යම් අංශයක හෝ පීඨයක ඉගැන්වීමේ මාධ්‍යය එක් ජාතික භාෂාවක් වන අවස්ථාවක එම විශ්වවිද්‍යාලයට ඇතුළත් වීමට කලින් අනෙක් ජාතික භාෂා මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබා ඇති ශිෂ්‍යයන් වෙනුවෙන් එකී අනෙක් ජාතික භාෂාව ද එකී පාඨමාලාව සඳහා නැතහොත් එකී අංශයෙහි හෝ පීඨයෙහි ඉගැන්වීමේ මාධ්‍යයක් කළ යුත්තේ ය.

එසේ වුව ද, එකී විශ්ව විද්‍යාලයේ වෙනත් යම් මණ්ඩපයක හෝ ශාඛාවක හෝ ඒ හා සමාන වෙනත් යම් විශ්වවිද්‍යාලයක යම් මණ්ඩපයක හෝ ශාඛාවක හෝ ඒ හා සමාන පාඨමාලාවක් සඳහා නැතහොත් ඒ හා සමාන අංශයක හෝ පීඨයක ඉගැන්වීමේ මාධ්‍යය ඉහත කී අනෙක් ජාතික භාෂාව වන්නේ නම් මෙම අනුව්‍යවස්ථාවේ මෙයට ඉහතින් වූ විධිවිධාන අනුව ක්‍රියා කිරීමට බැඳීමක් නොවන්නේ ය.

---

4- දහතුන් වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 2(අ) වැනි වගන්තිය මගින් (1) වැනි අනුව්‍යවස්ථාව ලෙස යළි අංක කරන ලදී.

5 - දහතුන් වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 2 (ආ) වැනි වගන්තිය මගින් එකතු කරන ලදී.

6 - දහසය වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 2(1) වැනි වගන්තිය මගින් "පළාත් පාලන ආයතනයක සභිකයකුට" වෙනුවට ආදේශ කරන ලදී.

7 - දහසය වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 2(2) වැනි වගන්තිය මගින් "ඒ පළාත් පාලන ආයතනයේ" වෙනුවට ආදේශ කරන ලදී.

(3) මෙම ව්‍යවස්ථාවෙහි "විශ්වවිද්‍යාලය", යන්නට කවර වූ හෝ උසස් අධ්‍යාපන ආයතනයක් ඇතුළත් වේ.

**පරිපාලන භාෂා.**

[8] [**22.** (1) සිංහල සහ දෙමළ භාෂා ශ්‍රී ලංකාව මුළුල්ලේ ම පරිපාලන භාෂා විය යුත්තේ ය. රජයේ ආයතන විසින් පොදු වාර්තා තබා ගැනීම සඳහා සහ සියලු කටයුතු ඉටු කිරීම සඳහා දෙමළ භාෂාව භාවිතා කරන උතුරු සහ නැගෙනහිර පළාත් හැර, ශ්‍රී ලංකාවේ සියලු ම පළාත්වල පරිපාලන භාෂාව සිංහල විය යුතු අතර, ඒ පළාත්වල රජයේ ආයතන විසින් පොදු වාර්තා තබා ගැනීම සඳහා සහ සියලු කටයුතු ඉටු කිරීම සඳහා සිංහල භාෂාව භාවිතා කළ යුතු ය; එසේ වුව ද, උප දිසාපති කොට්ඨාසයක් සංයුක්ත වන යම් ඒකකයක මුළු ජනගහනයට එම ප්‍රදේශයේ සිංහල හෝ දෙමළ භාෂාමය සුළු ජන කොටස දරන අනුපාතය කෙරහි සැලකිල්ල ඇතිව, ජනාධිපතිවරයා විසින්, සිංහල සහ දෙමළ භාෂා දෙක ම හෝ ඒ ප්‍රදේශය පිහිටි පළාතේ පරිපාලන භාෂාව වශයෙන් භාවිතා කරනු ලැබූ භාෂාව නොවන වෙනත් භාෂාවක් හෝ ඒ ප්‍රදේශය සඳහා පරිපාලන භාෂාව වශයෙන් භාවිතා කරනු ලැබීමට විධාන කරනු ලැබිය හැකිය.

(2) තම නිල තත්ත්වයෙන් ක්‍රියා කරන නිලධරයකු නොවන තැනැත්තකුට -

(අ) දෙමළ හෝ ඉංග්‍රීසි භාෂා දෙකෙන් කවර වූ හෝ භාෂාවකින් කවර වූ හෝ නිලධරයකුගෙන් ඒ නිලධරයාගේ නිල තත්ත්වයෙන් ලිපි ගනුදෙනු භාර ගැනීමට, ඒ නිලධරයාට නිල තත්ත්වයෙන් ලිපි ගනුදෙනු යැවීමට සහ ඒ නිලධරයා සමග ඒ තත්ත්වයෙන් කටයුතු කිරීමට හිමිකම ඇත්තේ ය;

(ආ) යම් නිල ලේඛනයක්, වාර්තාවක්, ප්‍රකාශනයක් හෝ වෙනත් ලියවිල්ලක් පරීක්ෂා කිරීමට නැතහොත් එවැනි ලේඛනයකින්, වාර්තාවකින්, ප්‍රකාශනයකින් හෝ වෙනත් ලියවිල්ලකින් පිටපතක් හෝ උධෘතයක් ලබා ගැනීමට ඔහුට ඇති අයිතිවාසිකම නීතියෙන් පිළිගනු ලබන්නේ නම්, අවස්ථාවෝචිත පරිදි එම ලේඛනයෙන්, වාර්තාවෙන්, ප්‍රකාශනයෙන් හෝ වෙනත් ලියවිල්ලෙන් පිටපතක් හෝ උධෘතයක් ලබා ගැනීමට නැතහොත් එම ලේඛනයේ, වාර්තාවේ, ප්‍රකාශනයේ හෝ වෙනත් ලියවිල්ලේ පරිවර්තනයක් දෙමළ හෝ ඉංග්‍රීසි භාෂා දෙකෙන් කවර භාෂාවකින් වුව ද ලබා ගැනීමට හිමිකම් ඇත්තේ ය;

(ඇ) ඒ තැනැත්තාට නිකුත් කරනු ලැබීමේ කාර්යය සඳහා යම් නිලධරයකු විසින් යම් ලියවිල්ලක් ලියා අත්සන් කරනු ලබන අවස්ථාවක ඒ ලියවිල්ල හෝ ඒ ලියවිල්ලේ පරිවර්තනයක් හෝ දෙමළ හෝ ඉංග්‍රීසි භාෂා දෙකෙන් කවර භාෂාවකින් වුව ද ලබා ගැනීමට හිමිකම ඇත්තේ ය.

8 - දහසය වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 3 වැනි වගන්තිය මගින් මුල් 22 වැනි ව්‍යවස්ථාව ඉවත් කොට ඒ වෙනුවට ආදේශ කරන ලදී

(3) පරිපාලන භාෂාව වශයෙන් දෙමළ භාෂාව භාවිතා කරනු ලබන යම් ප්‍රදේශයක, ස්වකීය නිල තත්ත්වයෙන් ක්‍රියා කරන නිලධරයකු නොවන යම් තැනැත්තකු මේ ව්‍යවස්ථාවේ (2) වැනි අනුව්‍යවස්ථාවේ (අ), (ආ) සහ (ඇ) ඡේදවල සඳහන් අයිතිවාසිකම් සහ සේවාවන් සිංහල භාෂාවෙන් හෝ ඉංග්‍රීසි භාෂාවෙන් ක්‍රියාත්මක කරවා ගැනීමට සහ ලබා ගැනීමට හිමිකම් ලැබිය යුත්තේ ය.

(4) ස්වකීය කටයුතු සිංහල භාෂාවෙන් කරන යම් පළාත් සභාවක් හෝ පළාත් පාලන ආයතනයක්, තම නිල තත්ත්වයෙන් ක්‍රියා කරන කවර වූ හෝ නිලධරයකුගෙන් සිංහල භාෂාවෙන් ලිපි ගනුදෙනු භාර ගැනීමට, ඒ නිලධාරයාට නිල තත්ත්වයෙන් ලිපි ගනුදෙනු යැවීමට සහ ඒ නිලධරයා සමග ඒ තත්ත්වයෙන් ලිපි කටයුතු කිරීමට හිමිකම තිබෙන අතර, ස්වකීය කටයුතු දෙමළ භාෂාවෙන් කරන යම් පළාත් සභාවක් හෝ පළාත් පාලන ආයතනයක් තම නිල තත්ත්වයෙන් ක්‍රියා කරන කවර වූ හෝ නිලධරයකුගෙන් දෙමළ භාෂාවෙන් ලිපි ගනුදෙනු භාර ගැනීමට, ඒ නිලධරයාට නිල තත්ත්වයෙන් ලිපි ගනුදෙනු යැවීමට සහ ඒ නිලධරයා සමග ඒ තත්ත්වයෙන් කටයුතු කිරීමට හිමිකම ඇත්තේ යඃ

එසේ වුව ද, පරිපාලන භාෂාව වශයෙන් වෙනස් භාෂාවක් භාවිත කරනු ලබන යම් ප්‍රදේශයක කටයුතු කරන වෙනත් යම් පළාත් සභාවකින් හෝ පළාත් පාලන ආයතනයකින්, රජයේ ආයතනයකින් හෝ යම් නිලධරයකුගෙන් ලිපි ගනුදෙනු ලබන හෝ ඒවා හෝ එම නිලධරයා සමග වැඩ කටයුතු කරන යම් පළාත් සභාවකින්, පළාත් පාලන ආයතනයකින්, රජයේ ආයතනයකින් හෝ යම් නිලධරයකුගෙ න් ඉංග්‍රීසි භාෂාවෙන් ලිපි ගනුදෙනු ලබා ගැනීමට, නිවේදන හුවමාරු කර ගැනීමට සහ වැඩ කටයුතු කිරීමට හිමිකම ලැබිය යුතු ය.

(5) රජයේ සේවයට, අධිකරණ සේවයට, පළාත්බද රජයේ සේවයට, පළාත් පාලන සේවයට හෝ රජයේ යම් ආයතනයකට තැනැත්තන් ඇතුළත් කර ගැනීම සඳහා පැවැත්වෙන යම් විභාගයක දී සිංහල හෝ දෙමළ හෝ තමන් තෝරා ගන්නා භාෂාවක හෝ මාධ්‍යයකින් වුව ද පරීක්ෂා කරනු ලැබීමට යම් තැනැත්තකුට හිමිකම් ඇත්තේ ය. තව ද, තම ධුරයේ කාර්ය ඉටු කිරීම සඳහා සිංහල හෝ දෙමළ පිළිබඳ ප්‍රමාණවත් දැනීමක් ඒ තැනැත්තාට තිබීම සාධාරණව අවශ්‍ය වන අවස්ථාවන්හි, එවැනි යම් සේවයකට හෝ රජයේ යම් ආයතනයකට හෝ ඇතුළත් කර ගනු ලැබීමෙන් පසු සාධාරණ කාලයක් ඇතුළත එසේ අවස්ථාචෝචිත පරිදි සිංහල හෝ දෙමළ භාෂාව පිළිබඳ ප්‍රමාණවත් දැනීමක් ඔහු විසින් ලබා ගත යුතු යයි නියම කිරීමේ කොන්දේසියට එකී හිමිකම යටත් වන්නේ ය ඃ

එසේ වුව ද යම් තැනැත්තකු බඳවා ගනු ලබන ධුරයෙහි කිසිදු කර්තව්‍යයක් සිංහල හෝ දෙමළ භාෂාව පිළිබඳ ප්‍රමාණවත් දැනීමක් ඇත්තේ නම් මිස ඉටු කළ නොහැකි වන අවස්ථාවල දී, එවැනි යම් සේවයකට හෝ රජයේ යම් ආයතනයකට ඇතුළත් කර

ගැනීමේ කොන්දේසියක් වශයෙන් සිංහල හෝ දෙමළ භාෂාව පිළිබඳ ප්‍රමාණවත් දැනීමක් යම් තැනැත්තකුට තිබිය යුතු යයි නියම කරනු ලැබිය හැක්කේ ය.

(6) මෙම ව්‍යවස්ථාවෙහි -

''නිලධරයා'' යන්නෙන් ජනාධිපතිවරයා, යම් අමාත්‍යවරයෙක්, නියෝජ්‍ය අමාත්‍යවරයෙක්, ආණ්ඩුකාරවරයෙක්, ප්‍රධාන අමාත්‍යවරයෙක්, පළාත් අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයෙක් හෝ රජයේ ආයතනයක හෝ පළාත් පාලන ආයතනයක හෝ පළාත් සභාවක යම් නිලධරයෙක් අදහස් වේ.

''රජයේ ආයතනය'' යන්නෙන්, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් හෝ ආයතනයක්, රාජ්‍ය සංස්ථාවක් හෝ ව්‍යවස්ථාපිත ආයතනයක් අදහස් වේ.]

**නීති පැනවීමේ භාෂාව.**

[9] [**23.** (1) සියලු ම නීති සහ අනු නීති පැනවීම නැතහොත් සෑදීම ද, එකී සියලු ම නීති සහ අනු නීති පළ කිරීම ද, ඉංග්‍රීසි භාෂාවෙන් වූ පරිවර්තනයක් ද ඇතිව සිංහල සහ දෙමළ භාෂා දෙකෙන් ම විය යුත්තේ ය ඃ

එසේ වුව ද, ඒ ඒ භාෂාවෙන් වූ පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, බලපැවැත්විය යුත්තේ කවර පාඨය ද යන්න පාර්ලිමේන්තුව විසින් යම් නීතියක් පනවන අවස්ථාවේ දී තීරණය කළ යුතු ය ඃ

එසේ ම තවදුරටත්, අනෙකුත් සියලු ලිඛිත නීති සහ අනුනීති සම්බන්ධයෙන් වන විට පාඨ අතර අනනුකූලතාවක් ඇති වුවහොත් ඒ ලිඛිත නීති හෝ අනුනීති පනවන ලද්දේ හෝ සම්මත කරන ලද්දේ හෝ සාදන ලද්දේ හෝ යම් භාෂාවකින් ද, ඒ භාෂාවෙන් වූ පාඨය බලපැවැත්විය යුතු ය.

(2) පළාත් සභාවක් විසින් හෝ පළාත් පාලන ආයතනයක් විසින් හෝ සාදනු ලබන හෝ නිකුත් කරනු ලබන නියම, ප්‍රකාශන, රීති, අතුරු ව්‍යවස්ථා, නියෝග සහ නිවේදන හැර යම් ලිඛිත නීතියක් යටතේ සාදනු ලබන හෝ නිකුත් කරනු ලබන සියලු ම නියම, ප්‍රකාශන, රීති, අතුරු ව්‍යවස්ථා, නියෝග සහ නිවේදන ද, ගැසට් පත්‍රය ද, ඉංග්‍රීසි පරිවර්තනයක් ද ඇතිව සිංහල සහ දෙමළ භාෂාවලින් පළ කරනු ලැබිය යුත්තේ ය.

(3) යම් ලිඛිත නීතියක් යටතේ, යම් පළාත් සභාවක් විසින් හෝ පළාත් පාලන ආයතනයක් විසින් හෝ සාදනු ලබන හෝ නිකුත් කරනු ලබන සියලු ම නියම, ප්‍රකාශන, රීති, අතුරු ව්‍යවස්ථා, නියෝග සහ නිවේදන ද, එම පළාත් සභාව හෝ පළාත් පාලන ආයතනය

9 - දහසය වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 3 වැනි වගන්තිය මගින් මුල් 23 වැනි ව්‍යවස්ථාව ඉවත් කොට, ඒ වෙනුවට ආදේශ කරන ලදී.

හෝ යම් රජයේ ආයතනයක් විසින් නිකුත් කරනු ලබන හෝ භාවිත කරනු ලබන චක්‍රලේඛ සහ ආකෘති ඇතුළු සියලු ලේඛන ද ඉංග්‍රීසි පරිවර්තනයක් ද ඇතිව එම පළාත් සභාව හෝ පළාත් පාලන ආයතනය හෝ රජයේ ආයතනය ක්‍රියාත්මක වන එක් එක් ප්‍රදේශයේ පරිපාලනයේ දී භාවිත කරනු ලබන භාෂාවෙන් පළ කරනු ලැබිය යුත්තේ ය.

(4) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වීමට පෙරාතුව බලාත්මක වූ සියලු නීති සහ අනු නීති හැකිතාක් ඉක්මනින් සිංහල සහ දෙමළ භාෂාවලින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුත්තේ ය.]

අධිකරණයේ භාෂාව.

[10][**24.** (1) ශ්‍රී ලංකාව මුළුල්ලේ ම අධිකරණවල භාෂා සිංහල සහ දෙමළ භාෂා විය යුතු අතර, දෙමළ භාෂාව පරිපාලන භාෂාව වන යම් ප්‍රදේශයක හැර, ශ්‍රී ලංකාවේ සියලු ම ප්‍රදේශවල පිහිටි අධිකරණවල සිංහල භාෂාව අධිකරණ භාෂාව වශයෙන් භාවිත කළ යුත්තේය. නඩු වාර්තාව සහ නඩු කටයුතු අධිකරණයේ භාෂාවෙන් විය යුතු ය. යම් අධිකරණයකින් අභියාචනයක් ඉදිරිපත් කරන අවස්ථාවක, අභියාචනය විභාග කරනු ලබන අධිකරණයේ භාෂාව, අභියාචනය ඉදිරිපත් කරනු ලැබුවේ යම් අධිකරණයකින් ද, ඒ අධිකරණයේ භාෂාව නොවන වෙනත් භාෂාවක් වන විට, අභියාචනය විභාග කරනු ලබන අධිකරණයේ භාෂාවෙන් ද වාර්තා පිළියෙළ කළ යුතු යː

එසේ වුව ද, යම් අධිකරණයක නඩු වාර්තාව තබා ගැනීම ද, නඩු කටයුතු පවත්වා ගෙන යාම ද අධිකරණයේ භාෂාව නොවන භාෂාවකින් ද විය යුතු යැයි, අධිකරණ විෂයය භාර අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩලයේ එකඟත්වය ඇතිව විධාන කළ හැක්කේය.]

(2) යම්කිසි පාර්ශ්වයක් හෝ අයදුම්කරුවකු විසින් නැතහොත් ඒ පාර්ශ්වය හෝ අයදුම්කරු නියෝජනය කිරීමට නීතියෙන් බලය ලබා ඇති යම්කිසි තැනැත්තකු විසින්, නඩු කටයුතු ආරම්භ කිරීම ද, උත්තරවාද සහ වෙනත් ලේඛන අධිකරණයට ඉදිරිපත් කිරීම ද, අධිකරණ කටයුතුවලට සහභාගි වීම ද, [11][සිංහල භාෂාවෙන් හෝ දෙමළ භාෂාවෙන් හෝ] කරනු ලැබිය හැක්කේ ය.

(3) අධිකරණයක භාවිත වන භාෂාව නොදන්නා යම් කිසි විනිශ්චයකාරවරයකුට, ජූරි සභිකයකුට, යම්කිසි පාර්ශ්වයකට හෝ අයදුම්කරුවකුට නැතහොත් ඒ පාර්ශ්වය හෝ අයදුම්කරු නියෝජනය කිරීමට නීතියෙන් බලය ලබා ඇති යම්කිසි තැනැත්තකුට එම අධිකරණයේ සිදුවන කටයුතු වටහා ගැනීමටත් ඒ කටයුතුවලට සහභාගි වීමටත් හැකිවන සේ රජය විසින් [12][සිංහල භාෂාවෙන් හෝ දෙමළ භාෂාවෙන්] සපයනු ලබන භාෂණ පරිවර්තන සහ පරිවර්තන

---

10 - දහසය වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 4(1) වැනි වගන්තිය මගින් මුල් (1) වැනි අනුව්‍යවස්ථාව ඉවත් කර ඒ වෙනුවට ආදේශ කරන ලදී.

11 - දහසය වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 4(2) වැනි වගන්තියෙන් "ජාතික භාෂා දෙකින් කවර භාෂාවකින් වුවද" වෙනුවට ආදේශ කරන ලදී.

12 - දහසය වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 4(3)(අ) වැනි වගන්තියෙන් " උචිත ජාතික භාෂාවෙන් " වෙනුවට ආදේශ කරන ලදී.

ලබා ගැනීමටත්, නඩු වාර්තාවකින් නීතිය අනුව ලබා ගැනීමට හිමිකම් ඇති කවර වූ හෝ කොටසක් නැතහොත් එහි පරිවර්තනයක් [13][එම භාෂාවෙන්] ලබා ගැනීමටත් හිමිකම ඇත්තේ ය.

(4) අධිකරණ විෂයය භාර අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩලයේ එකඟත්වය ඇතිව සියලු කාර්ය සඳහා නැතහොත් ඔහු විසින් නිශ්චය කොට දක්වන යම් යම් කාර්ය සඳහා නඩු වාර්තාවක හෝ නඩු කටයුත්තක දී නැතහොත් නඩු වාර්තාවක් හෝ නඩු කටයුත්තක් සම්බන්ධයෙන් [14][ඉංග්‍රීසි භාෂාව] යම් අධිකරණයක භාවිත කිරීමට අවසර දෙමින් විධාන නිකුත් කරනු ලැබිය හැක්කේ ය. එවැනි විධාන ක්‍රියාත්මක කිරීමට සෑම විනිශ්චයකාරවරයෙක් ම බැඳී සිටින්නේ ය.

(5) මෙම ව්‍යවස්ථාවෙහි -

"අධිකරණය" යන්නෙන් කාර්මික සහ වෙනත් ආරාවුල් විනිශ්චය කිරීම හා නිරවුල් කිරීම ඇතුළුව යුක්තිය පසිඳලීම සඳහා ඇති කොට පිහිටුවන ලද කවර වූ අධිකරණයක් හෝ විනිශ්චය අධිකාරයක් හෝ අධිකරණ කටයුතු නැතහොත් අර්ධ අධිකරණ කටයුතු ඉටු කරන වෙනත් කවර වූ හෝ විනිශ්චය අධිකාරයක් හෝ ආයතනයක් හෝ ආරවුල් සමථයකට පත් කොට නිරවුල් කිරීම සඳහා ඇති කොට පිහිටුවන ලද කවර වූ හෝ විනිශ්චය අධිකාරයක් හෝ ආයතනයක් අදහස් වේ.

"විනිශ්චයකාරවරයා" යන්නට කවර වූ හෝ අධිකරණයක සභාපතිවරයා ද, මූලාසනාරූඪ නිලධරයා ද, සාමාජිකයෙක් ද ඇතුළත් වෙති.

"වාර්තාව" යන්නට උත්තරවාද, නඩු තීන්දු, ආඥා සහ වෙනත් අධිකරණ හා විධායක කාර්යය ඇතුළත් වේ.

**මේ පරිච්ඡේදයේ විධිවිධාන සලස්වා ඇති පරිදි භාෂා භාවිතය සඳහා ප්‍රමාණවත් පහසුකම් සැලැස්විය යුතු බව.**

**25.** මේ පරිච්ඡේදයෙහි විධිවිධාන සලස්වා ඇති පරිදි භාෂා භාවිතය සඳහා රජය ප්‍රමාණවත් පහසුකම් සැලැස්විය යුත්තේ ය.

**මේ පරිච්ඡේදයට අනනුකූල වන යම් නීතියක ඇති විධිවිධාන ඉවත් කරන ලද සේ සැලකිය යුතු බව.**

[15] [**25 අ.** යම් නීතියක විධිවිධාන සහ මේ පරිච්ඡේදයේ විධිවිධාන අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, මේ පරිච්ඡේදයේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.]

---

13 - දහසය වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 4(3)ආ වැනි වගන්තියෙන් "ජාතික භාෂා දෙකෙන් කවර භාෂාවකින් වුවද" වෙනුවට ආදේශ කරන ලදී.

14 - දහසය වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 4(4) වැනි වගන්තියෙන් "ජාතික භාෂාවෙන් නොවන වෙනත් භාෂාවක්" වෙනුවට ආදේශ කරන ලදී.

15 - දහසය වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 5 වැනි වගන්තිය මගින් ඇතුළත් කරන ලදී.

## V වැනි පරිච්ඡේදය

## පුරවැසිභාවය

**26.** (1) "ශ්‍රී ලංකාවේ පුරවැසියකුගේ තත්ත්වය" යනුවෙන් හඳුන්වනු ලබන එකම පුරවැසි තත්ත්වයක් විය යුත්තේ ය.

**ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය.**

(2) ශ්‍රී ලංකාවේ පුරවැසියකුට, පුරවැසිභාවය හිමි වූයේ පරම්පරාවෙන් වුව ද, පුරවැසිභාවය පිළිබඳ නීතියට අනුකූලව ලියාපදිංචිවීමෙන් වුව ද, ඒ තැනැත්තා සියලු කාර්ය සඳහා "ශ්‍රී ලංකාවේ පුරවැසියෙක්" යනුවෙන් පමණක් විස්තර කරනු ලබන්නේ ය.

(3) පුරවැසි තත්ත්වය අත්කර ගනු ලැබූ ආකාරය, එනම්, පරම්පරාවෙන් ද, නැතහොත් ලියාපදිංචි වීමෙන් ද යනු සලකා කවර වූ හෝ කාර්යයක් සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන් වෙසෙසා නොදැක්විය යුත්තේ ය.

(4) ශ්‍රී ලංකාවේ කිසිම පුරවැසියකුට පුරවැසියකු වශයෙන් ඔහුගේ තත්ත්වය පුරවැසි පනතේ 19 වැනි, 20 වැනි, 21 වැනි සහ 22 වැනි වගන්තිවල විධිවිධාන යටතේ සහ ඒ වගන්තිවල විධිවිධාන ප්‍රකාර මිස අහිමි නො කළ යුත්තේ යඃ

එසේ වුව ද, පුරවැසි පනතේ 11 වැනි, 12 වැනි හෝ 13 වැනි වගන්තිවල විධිවිධාන යටතේ ලියාපදිංචි කරනු ලැබීමෙන් ශ්‍රී ලංකාවේ පුරවැසියකුගේ තත්ත්වයට හිමිකම් ලැබූ තැනැත්තකුට ඒ පනතේ 23 වැනි සහ 24 වැනි වගන්තිවල විධිවිධාන ද අදාළ වන්නේ ය.

(5) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මකවීම ආරම්භ වන තෙක් පරම්පරාවෙන් නැතහොත් පුරවැසිභාවය පිළිබඳ යම් නීතියකට අනුකූලව ලියාපදිංචි වීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියකුව සිටි සෑම තැනැත්තකුට ම, මේ ව්‍යවස්ථාවේ මීට ඉහතින් ඇති විධිවිධානවලින් විධිවිධාන සලසා ඇති පරිදි ශ්‍රී ලංකාවේ පුරවැසියකුගේ තත්ත්වයට සහ ශ්‍රී ලංකා පුරවැසියකුගේ අයිතිවාසිකම්වලට හිමිකම් ලැබෙන්නේ ය.

(6) පුරවැසිභාවය හා සම්බන්ධ සියලු පවත්නා ලිඛිත නීති සහ පුරවැසිභාවය ගැන සඳහන් කරන වෙනත් සියලු පවත්නා ලිඛිත නීති මේ ව්‍යවස්ථාවේ මීට ඉහතින් වූ විධිවිධානවලට යටත්ව තේරුම් ගත යුත්තේ ය.

## VI වැනි පරිච්ඡේදය

### රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේ මූලධර්ම සහ මූලික යුතුකම්

රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේ මූලධර්ම

**27.** (1) මෙහි ඇතුළත් රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේ මූලධර්ම, ධර්මිෂ්ඨ නිවහල් සමාජයක් ඇති කිරීම සඳහා නීති පැනවීමෙහි දී ද, ශ්‍රී ලංකාවෙහි රාජ්‍යානුශාසනයෙහි දී ද, පාර්ලිමේන්තුව, ජනාධිපතිවරයා සහ අමාත්‍ය මණ්ඩලය විසින් ගුරුකොට ගනු ලබන්නේ ය.

(2) මතු දැක්වෙන අරමුණු ද ඇතුළත් ව ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී සමාජයක් ශ්‍රී ලංකාවෙහි ඇති කිරීමට රජය ඇප කැප වී ඇත්තේ ය -

(අ) සියලු තැනැත්තන්ගේ ම මූලික අයිතිවාසිකම් සහ නන් වැදෑරුම් නිදහස සපුරා ලීම ;

(ආ) ජාතික ජන ජීවිතයේ සියලු ආයතන විසින් සමාජ, ආර්ථික හා දේශපාලන සාධාරණත්වය ගුරුකොට ගන්නා සමාජ ක්‍රමයක් හැකිතාක් සාර්ථකව ඇති කර ආරක්ෂා කර දීමෙන් ජනතා සුභ සිද්ධිය වර්ධනය කිරීම ;

(ඇ) ප්‍රමාණවත් ආහාරපාන, ඇඳුම් පැළඳුම් සහ නිවාස පහසුව ද, ජීවන තත්ත්වයෙහි නිරන්තර වර්ධනය ද, විවේකය හා සමාජයීය සහ සංස්කෘතික ඉඩ ප්‍රස්තා නිසි පරිදි ප්‍රයෝජනයට ගැනීම ද ඇතුළුව ප්‍රමාණවත් ජීවන මට්ටමක් සියලු පුරවැසියන් විසින් තමන්ට සහ තම පවුල්වල සාමාජිකයන්ට අත්කර දීම ;

(ඈ) රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ ආර්ථික ක්‍රියාවලියක් තුළින් සහ එකී ආර්ථික ක්‍රියාවලිය, රටේ සමාජ අරමුණු හා පොදු අභිවෘද්ධිය අරභයා මෙහෙයවීම සහ සම්බන්ධීකරණය පිණිස යෝග්‍යවන සැලසුම් සහ පාලනය නීතියෙන් නියම කිරීමෙන් ශීඝ්‍ර ලෙස මුළු රට සංවර්ධනය කිරීම ;

(ඉ) පොදුජන යහපතට ඉවහල්වන පරිදි ප්‍රජාවගේ භෞතික සම්පත් සහ සමාජ ඵලය සියලු පුරවැසියන් අතර සාධාරණ ලෙස බෙදා හැරීම ;

(ඊ) නිෂ්පාදනයේ, බෙදා හැරීමේ සහ හුවමාරු කිරීමේ මාර්ග රජයෙහි, රාජ්‍ය ආයතනයන්හි හෝ වරප්‍රසාද ලත් අතළොස්සක් අතෙහි හෝ ඒකරාශී නොවී සහ මධ්‍යගත නොවී ශ්‍රී ලංකාවේ සකල ජනතාව අතර විසිරී යන ධර්මිෂ්ඨ සමාජ ක්‍රමයක් පිහිටුවීම ;

(උ) ජනතාවගේ සදාචාරයෙහිත්, සංස්කෘතියෙහිත්, තත්ත්වය වැඩි දියුණු කිරීම සහ පෞරුෂත්වයෙහි පූර්ණ වර්ධනය තහවුරු කිරීම ; සහ

(ඌ) නූගත්කම සහමුලින් ම තුරන් කිරීම සහ සියලු

තැනැත්තන්ට අධ්‍යාපනයේ සෑම අවස්ථාවක දී ම සර්ව සාධාරණ හා සමාන ඉඩ ප්‍රස්තා ලබා ගැනීමේ අයිතිය සහතික කිරීම.

(3) ශ්‍රී ලංකාවේ ස්වාධීනත්වය, ස්වෛරීභාවය, එක්සත් බව හා දේශ පූර්ණත්වය ද රජය විසින් ආරක්ෂා කළ යුත්තේ ය.

(4) පරිපාලනය විමධ්‍යගත කිරීමෙන් සහ මහජන කටයුතුවලට සහ පාලන කටයුතුවලට සෑම අවස්ථාවක ම ජනතාව සහභාගි කරවා ගැනීමෙන් ආණ්ඩුවේ ප්‍රජාතන්ත්‍රවාදී පදනම සහ ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් ද රජය විසින් තහවුරු කොට පුළුල් කළ යුත්තේ ය.

(5) වාර්ගික, ආගමික, විවිධ භාෂා භාවිත කරන සහ වෙනත් ජන කොට්ඨාස ඇතුළු ශ්‍රී ලංකා වාසී සකල ජනතාව අතර සහයෝගය සහ අන්‍යොන්‍ය විශ්වාසය වඩාලීමෙන් ජාතියේ සමගිය තහවුරු කිරීම ද, විශේෂ සැලකිලි සහ වෙනස්කම් තුරන් කිරීම සඳහා ඉගැන්වීම, අධ්‍යාපනය දීම සහ ප්‍රවෘත්ති සැපයීම යන ක්ෂේත්‍රවල ඵලදායී පියවර ගැනීම ද රජය විසින් කළ යුත්තේ ය.

(6) කිසිම පුරවැසියකු, වර්ගය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භේදය, දේශපාලන මතය හෝ රැකියාව හේතුවෙන් යම් කිසි අශක්නුතාවකට පත් නොවන පරිදි පුරවැසියන්ට දියුණු වීමට සම ප්‍රස්තාවන් සැලසීමට රජය වගබලා ගත යුත්තේ ය.

(7) ආර්ථික සහ සාමාජයික වරප්‍රසාද හා විෂමතා ද, මිනිසා විසින් හෝ රජය විසින් හෝ මිනිස් ශ්‍රමය අයථා පරිදි උපයෝගී කර ගැන්ම ද, රජය විසින් තුරන් කළ යුත්තේ ය.

(8) ආර්ථික ක්‍රමය ක්‍රියාත්මක වීමේ දී ධනය සහ නිෂ්පාදන මාර්ග පොදු ජනතාවට හානිකර වන සේ ඒකරාශි නොවන බවට රජය වගබලා ගත යුත්තේ ය.

(9) සමාජ සුරක්ෂිතභාවය හා සුබසාධනය ඇති කිරීමට රජය වගබලා ගත යුත්තේ ය.

(10) ජනතාවගේ භාෂා සහ සංස්කෘතීන් වර්ධනය කිරීමට රජය සහාය විය යුත්තේ ය.

(11) ආගමක් අදහන කවරකු හට වුව ද, ස්වකීය ආගමික ප්‍රතිපත්ති සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය ආර්ථික හා සමාජ පරිසරය රජය විසින් ඇති කළ යුත්තේ ය.

(12) පවුල, සමාජයේ මූලික ඒකකය වශයෙන් රජය විසින් පිළිගෙන ආරක්ෂා කළ යුත්තේ ය.

(13) ළමයින් සහ යෞවනයන් කායික වශයෙන්, මානසික වශයෙන් සදාචාරාත්මක වශයෙන්, ආගමික වශයෙන් හා සාමාජයික වශයෙන් පූර්ණ වර්ධනයට පත්වන බවට වගබලා ගැනීමටත්, ඔවුන්

ආත්මාර්ථය පිණිස යොදා ගනු ලැබීමෙන් සහ වෙනස්කම්වලට පාත්‍ර කරනු ලැබීමෙන් ආරක්ෂා කර ගැනීමටත් හැකිවන පරිදි ඔවුන්ගේ ශුභ සිද්ධිය රජය විසින් විශේෂ පරිශ්‍රමයකින් යුතුව වර්ධනය කළ යුත්තේ ය.

(14) ජනතාවගේ යහපත තකා රජය විසින් පරිසරය ආරක්ෂා කොට සුරක්ෂිත කොට වැඩි දියුණු කළ යුත්තේ ය.

(15) ජාත්‍යන්තර සාමය, සුරක්ෂිතභාවය හා සහයෝගීතාව වර්ධනය කිරීම ද, ජාතීන් අතර කටයුතුවල දී ජාත්‍යන්තර නීතිය සහ ගිවිස ගත් බැඳීම් කෙරෙහි ගෞරවය ඇති කිරීමට උත්සාහ කිරීම ද, ධර්මිෂ්ඨ හා සාධාරණ ජාත්‍යන්තර ආර්ථික හා සමාජ ක්‍රමයක් ඇති කිරීමට උත්සාහ කිරීම ද රජය විසින් කළ යුත්තේ ය.

**මූලික යුතුකම්**

**28.** අයිතිවාසිකම් සහ නන් වැදෑරුම් නිදහස ක්‍රියාත්මකවීමත්, භුක්ති විඳීමත් යුතුකම් හා බැඳීම් ඉටු කිරීමෙන් වෙන්ව පැවතිය නොහැක්කේ ය. එහෙයින්-

(අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ නීතිය ආරක්ෂා කොට අනුගමනය කිරීම ද,

(ආ) ජාතික අභිවෘද්ධිය වර්ධනය කිරීම හා ජාතික සමගිය පෝෂණය කිරීම ද,

(ඇ) තමන් විසින් තෝරා ගනු ලැබූ රැකියාවෙහි හෘදය සාක්ෂියට එකඟව නොපිරිහෙලා වැඩ කිරීම ද,

(ඈ) පොදු දේපළ සුරක්ෂිත කොට ආරක්ෂා කිරීම ද, පොදු දේපළ අයථා පරිදි ප්‍රයෝජනයට ගැනීමට සහ නාස්ති කිරීමට එරෙහිව ක්‍රියා කිරීම ද,

(ඉ) සෙසු අයගේ අයිතිවාසිකම් සහ නන් වැදෑරුම් නිදහස ගරු කිරීම ද,

(ඊ) ස්වභාව ධර්මය සහ ස්වාභාවික සම්පත් රැක ගැනීම ද,

ශ්‍රී ලංකාවාසී සෑම තැනැත්තකුගේම යුතුකම වන්නේ ය.

**රාජ්‍ය ප්‍රතිපත්තිය පිළිබඳ මූලධර්ම සහ මූලික යුතුකම් විනිශ්චයට භාජන කළ නොහැකි බව.**

**29.** මේ පරිච්ඡේදයේ විධිවිධාන හේතුකොටගෙන නීතියෙන් කිසිම අයිතිවාසිකමක් නොපැවරෙන්නේ ය. නීතියෙන් කිසිම බැඳීමක් ඇති නොවන්නේ ය. තව ද, මේ පරිච්ඡේදයේ විධිවිධාන අධිකරණයක් හෝ විනිශ්චය අධිකාරයක් මගින් ක්‍රියාත්මක කරවා ගත නොහැක්කේ ය. එම විධිවිධානවලට අනනුකූලවීම පිළිබඳ කිසිම ප්‍රශ්නයක් කවර වූ හෝ අධිකරණයකට හෝ විනිශ්චය අධිකාරයකට ඉදිරිපත් කළ නොහැක්කේ ය.

## VII වැනි පරිච්ඡේදය

## විධායකය

### ජනරජයේ ජනාධිපතිවරයා

ජනරජයේ ජනාධිපතිවරයා.

[16][**30.** (1) ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපතිවරයෙක් වන්නේ ය. ජනාධිපතිවරයා රජයේ ප්‍රධානයා ද විධායකයේ ප්‍රධානයා ද ආණ්ඩුවේ ප්‍රධානයා ද සන්නද්ධ සේවාවන්හි සේනාධිනායකවරයා ද වන්නේ ය.

(2) ජනරජයේ ජනාධිපතිවරයා ජනතාව විසින් තෝරා පත් කර ගනු ලැබිය යුතු අතර පස් අවුරුදු කාලයක් ධූරය දරන්නේ ය.]

ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම හා ධූර කාලය.

31. (1) ජනාධිපති ධූරයට තෝරා පත් කර ගනු ලැබීම සඳහා සුදුසුකම් ලබා ඇති කවර වූ හෝ පුරවැසියකුගේ නම -

(අ) පිළිගත් දේශපාලන පක්ෂයක් විසින්; හෝ

(ආ) ඔහු ව්‍යවස්ථාදායකයෙහි තෝරා පත් කළ මන්ත්‍රීවරයෙක්ව සිටී නම් නැතහොත් එසේ මන්ත්‍රීවරයෙක්ව සිටියේ නම්, වෙනත් යම් දේශපාලන පක්ෂයක් විසින් හෝ යම්කිසි ඡන්ද හිමි නාම ලේඛනයක නම ඇතුළත් ඡන්ද හිමියකු විසින්; හෝ

ජනාධිපති ධූරය සඳහා යෝජනා කරනු ලැබිය හැක්කේ ය.

[17][(2) ජනතාව විසින් ජනාධිපති ධූරයට දෙවරක් තෝරා පත් කර ගනු ලැබූ තැනැත්තකු ජනතාව විසින් නැවත එකී ධූරය සඳහා තෝරා පත් කර ගනු ලැබීමට සුදුස්සකු නොවන්නේ ය.]

(3) ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ ඡන්ද විමසීම, ධූරය දරන ජනාධිපතිවරයාගේ ධුර කාලය ඉකුත් වීමට පෙර මාසයකට අඩු නොවන සහ මාස දෙකකට වැඩි නොවන කාලසීමාවක් තුළ පැවැත්විය යුත්තේ ය.

[18][(3අ) (අ) (i) මේ පරිච්ඡේදයේ ඉහතින් වූ විධිවිධානවලට පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, ජනාධිපතිවරයා විසින් ප්‍රකාශනයක් මගින් වැඩිදුර කාලයක් සඳහා තමා තෝරා පත් කර ගැනීමෙන් ධූරය දැරීම පිණිස වරමක් ලබා ගැනීම සඳහා ජනතාව වෙත ආයාචනය කිරීමේ] [19][තම අභිලාෂය තම ප්‍රථම ධූර කාලය ආරම්භ වී අවුරුදු හතරක් ඉකුත්වීමෙන් පසු යම් අවස්ථාවක ජනාධිපතිවරයා විසින් ප්‍රකාශ කරනු ලැබිය හැක්කේ ය]; [20]

---

16 - දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් මුල් 30 වගන්තිය ඉවත්කොට නව 30 වගන්තිය ආදේශ කරන ලදී.

17 - දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ඇතුළත් කරන ලදී.

18 - තුන් වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 2 (1) වැනි වගන්තිය මගින් ඇතුළත් කරන ලදී.

19 - දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 4(2) වගන්තිය මගින් කලින් තිබූ වචන වෙනුවට, මෙම වචන ඇතුළත් කරන ලදී.

20 - දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 4(2) වගන්තිය මගින් 3(අ)(i) ඡේදයේ අතුරු විධානය ඉවත් කරන ලදී.

(ii) (i) වැනි අනුඡේදය යටතේ ප්‍රකාශනයක් කරනු ලැබූ විට එය ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම සඳහා ඡන්ද විමසීමක් පැවැත්වීමට මැතිවරණ කොමසාරිස්වරයා වෙත කෙරෙන නියමයක් වන්නේ ය.

(ආ) (අ) ඡේදයේ සඳහන් ප්‍රකාශනයෙහි දිනයෙන් පසු සහ ඒ ප්‍රකාශනය ප්‍රකාර පවත්වනු ලබන ඡන්ද විමසීමේ ඡන්දය ගැනීම අවසන්වීමට පෙර යම් අවස්ථාවක දී එවකට ධුරය දරන ජනාධිපතිවරයා මිය ගියහොත් ජනාධිපතිවරයා මිය ගිය දිනයෙහි සිට ඒ ප්‍රකාශනය ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ ප්‍රකාශනය ප්‍රකාර පැවැත්වීමට නියමිත ඡන්ද විමසීම අවලංගු කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුත්තේ ය. ඒ මිය යාම නිසා ජනාධිපති ධුරයෙහි ඇති වූ පුරප්පාඩුව 40 වැනි ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව පුරවනු ලැබිය යුත්තේ ය.

(ඇ) (i) මේ අනුව්‍යවස්ථාව යටතේ පවත්වනු ලබන ඡන්ද විමසීමක ඡන්දය ගැනීම අවසන් වීම හා ඒ ඡන්ද විමසීමේ ප්‍රතිඵල ප්‍රකාශ කිරීම හා අතර කාලය තුළ යම් අවස්ථාවක දී ඒ ඡන්ද විමසීමේ අපේක්ෂකයකු මිය ගියහොත් මැතිවරණ කොමසාරිස්වරයා විසින් ඒ අපේක්ෂකයා මිය යාම ගැන නොතකා ඡන්ද ගණන් කොට ඒ ඡන්ද විමසීමේ ප්‍රතිඵල ප්‍රකාශ කළ යුත්තේ ය.

(ii) ජනාධිපතිවරයා ලෙස තේරී පත් වූ බවට ප්‍රකාශ කරනු ලැබීමට හිමිකම් ඇති තැනැත්තා ඒ ඡන්ද විමසීමේ ප්‍රතිඵල ප්‍රකාශ කරනු ලබන අවස්ථාවේ මියගොස් ඇතහොත්, මැතිවරණ කොමසාරිස්වරයා විසින් ඒ ඡන්ද විමසීමේ ප්‍රතිඵල ප්‍රකාශ නොකළ යුතු අතර, ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම සඳහා අලුත් ඡන්ද විමසීමක් පවත්වනු ලැබිය යුත්තේ ය.

(iii) (i) වැනි අනුඡේදයෙහි සඳහන් මිය යාමේ හේතුවෙන් ජනාධිපති ධුරයෙහි පුරප්පාඩුවක් පවත්නා විට ඒ පුරප්පාඩුව ඇති වීම හා නව ජනාධිපතිවරයා ධුරය භාර ගැනීම හා අතර කාලය තුළ අග්‍රාමාත්‍යවරයා ජනාධිපති ධුරයෙහි වැඩ බැලිය යුතු අතර අමාත්‍ය මණ්ඩලයේ වෙනත් අමාත්‍යවරයකු අග්‍රාමාත්‍ය ධුරයෙහි වැඩ බැලීමට ඔහු විසින් පත් කරනු ලැබිය යුත්තේ යඃ

එසේ වුව ද, අග්‍රාමාත්‍ය ධුරය ඒ අවස්ථාව වන විට හිස්ව පවතී නම් හෝ අග්‍රාමාත්‍යවරයාට ජනාධිපති ධුරයේ වැඩ බැලීමට නොහැකි නම්, කථානායකවරයා ජනාධිපති ධුරයෙහි වැඩ බැලිය යුත්තේ ය.

(ඈ) මේ අනුව්‍යවස්ථාව යටතේ පවත්වන ලද ඡන්ද විමසීමක දී ජනාධිපතිවරයා ලෙස තේරී පත්ව ඇතැයි ප්‍රකාශ කරනු ලැබූ තැනැත්තා -

(i) එවකට ධුරය දරන ජනාධිපතිවරයා නම්, ඒ ඡන්ද විමසීම පවත්වනු ලබන්නේ යම් වර්ෂයක, යම් දිනයක දී ද ඔහුගේ ප්‍රථම ධුර කාලය ආරම්භ වූ දිනයට අනුරූප වන ඒ වර්ෂයේ (ඒ ඡන්ද විමසීමෙන් පසුව එළෙඹන දිනයක් වන) දිනය හෝ ඊළඟට එළඹෙන වර්ෂයේ ඊට අනුරූප වන දිනය යන මෙයින් කලින් එළඹෙන දිනයෙන් ආරම්භ වන [21][අවුරුදු පහක කාලයක්] ධුරය දැරිය යුත්තේ ය.

(ii) එවකට ධුරය දරන ජනාධිපතිවරයා නොවේ නම්, ඒ ඡන්ද විමසීමේ ප්‍රතිඵල ප්‍රකාශයට පත් කරනු ලැබූ දිනයෙන් ආරම්භ වන [21][අවුරුදු පහක කාලයක්] ධුරය දැරිය යුත්තේ ය.

(ඉ) 40 වැනි ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ ජනාධිපති ධුරයට අනුප්‍රාප්ත වන තැනැත්තකුට, මේ අනුව්‍යවස්ථාවේ (අ) ඡේදය මගින් ජනාධිපතිවරයකු වෙත පවරා ඇති අයිතිය ක්‍රියාත්මක කිරීමේ හිමිකම් නොමැත්තේ ය.

(ඊ) මේ අනුව්‍යවස්ථාවේ කාර්ය සඳහා, 160 වැනි ව්‍යවස්ථාවේ සඳහන් ප්‍රථම ජනාධිපතිවරයාගේ ප්‍රථම ධුර කාලය 1978 පෙබරවාරි මස 4 වන දින ආරම්භ වූ ලෙස සැලකිය යුතු ය.]

[22][(4) ජනාධිපතිවරයකු තෝරා පත් කර ගැනීම සඳහා ඡන්ද විමසීමක් පවත්වනු ලබන අවස්ථාවක, ඒ ඡන්ද විමසීමේ දී ජනාධිපතිවරයා ලෙස තෝරා පත් කර ගනු ලැබූ තැනැත්තාගේ ධුර කාලය එවකට ධුරය දරන ජනාධිපතිවරයාගේ ධුර කාලය අවසාන වූ විට, ආරම්භ විය යුත්තේ ය :

එසේ වුව ද, 40 වන ව්‍යවස්ථාවෙහි පටහැනිව කුමක් සඳහන්ව ඇත ද -

(අ) ජනාධිපතිවරයකු තෝරා පත් කර ගැනීම සඳහා වූ ඡන්ද විමසීමක දී ජනාධිපතිවරයා වශයෙන් තේරී පත් වූ ලෙස ප්‍රකාශ කරනු ලැබූ යම් තැනැත්තකු, ඔහු තේරී පත් වී ඇති ලෙස ප්‍රකාශ කරනු ලැබීමෙන් පසු සහ ඔහු මිය නොගියේ නම් ඔහුගේ ධුර කාලය ආරම්භ විය හැකිව තිබුණු දිනයට පෙර යම් අවස්ථාවක මිය ගිය හොත්, ජනාධිපතිවරයකු තෝරා පත් කර ගැනීම සඳහා මැතිවරණ කොමසාරිස්වරයා විසින් අලුත් ඡන්ද විමසීමක් පවත්වනු ලැබිය යුත්තේ ය. එසේ අලුත් ඡන්ද විමසීමක් සඳහා නියම කරන ලද දිනය, ඒ පළමු සඳහන් දිනයට පසු එළඹෙන දිනයක් නම්, ඒ ඡන්ද විමසීමේ දී තේරී පත්ව ඇතැයි ප්‍රකාශ කරනු ලබන තැනැත්තාගේ ධුර කාලය, මේ ව්‍යවස්ථාවේ ඉහතින් වූ විධිවිධානවල කුමක්

21 - දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 4(2)(ආ) වගන්තිය මගින් “අවුරුදු හයක කාලයක්” යන්න වෙනුවට ඇතුළත් කරන ලදී.

22 - තුන් වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 2(2) වැනි වගන්තිය මගින් මුල් (4) වැනි අනුව්‍යවස්ථාව ඉවත් කොට අදේශ කරන ලදී.

සඳහන්ව ඇත ද, ඒ පළමු සඳහන් දිනයෙහි ආරම්භ වූ ලෙස සලකනු ලැබිය යුත්තේ ය. 38 (1) (ඈ) ව්‍යවස්ථාවෙහි කාර්ය සඳහා පමණක්, අලුත් ජනාධිපතිවරයාගේ ධුර කාලය ආරම්භ වන දිනය, ඔහු තේරී පත්වූ දිනය විය යුත්තේ ය.

(ආ) ජනාධිපතිවරයකු තෝරා පත් කර ගැනීම සඳහා වූ ඡන්ද විමසීමක දී එවකට ධුරය දරන ජනාධිපතිවරයා අපේක්ෂකයකු නොවන්නා වූ හෝ නැවත තේරී පත් නොවන්නා වූ හෝ අවස්ථාවක, ඔහුගේ ධුර කාලය, ඒ ඡන්ද විමසීමේ ප්‍රතිඵල ප්‍රකාශ කරනු ලැබූ දිනයේ දී අවසන් වූවාක් සේ සැලකිය යුත්තේ ය. ඒ ඡන්ද විමසීමේ දී ජනාධිපතිවරයා ලෙස තෝරා පත් කර ගන්නා ලද තැනැත්තා අප්‍රමාදව එහෙත් ඒ දිනයේ සිට සති දෙකක් ඉකුත් වීමට පෙර ධුරය භාර ගත යුත්තේ ය:

එසේ වුව ද, ජනාධිපතිවරයා වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශ කරනු ලැබූ තැනැත්තා ධුරයේ කටයුතු භාර ගන්නා තෙක්, එවකට ධුරය දරන ජනාධිපතිවරයා, 30 වැනි ව්‍යවස්ථාවේ පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, ජනාධිපති ධුරයේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කළ යුත්තේ ය; ඉටුකළ යුත්තේ ය. ජනාධිපතිවරයා වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශ කරනු ලැබූ තැනැත්තා ධුරය භාර නොගැනීමේ හේතුවෙන් ජනාධිපති ධුරය හිස් වුවහොත් අග්‍රාමාත්‍යවරයා හෝ ඒ අවස්ථාවේ දී අග්‍රාමාත්‍ය ධුරය හිස්ව පවතී නම් නැතහොත් අග්‍රාමාත්‍යවරයාට ජනාධිපති ධුරයේ වැඩ බැලීමට නොහැකි නම් කථානායකවරයා 40 වැනි ව්‍යවස්ථාව අනුව ජනාධිපති ධුරයේ වැඩ බැලීම ආරම්භ කරන තෙක්, එවකට ධුරය දරන ජනාධිපතිවරයා, ජනාධිපති ධුරයේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කළ යුත්තේ ය; ඉටු කළ යුත්තේ ය.

(ඇ) (අ) ඡේදයෙහි සඳහන් මිය යාමේ හේතුවෙන් ජනාධිපති ධුරයෙහි පුරප්පාඩුවක් පවතින අවස්ථාවක, ඒ පුරප්පාඩුව ඇති වීම හා අලුත් ජනාධිපතිවරයා ධුරය භාර ගැනීම හා අතර කාලය තුළ අග්‍රාමාත්‍යවරයා විසින් ජනාධිපති ධුරයෙහි වැඩ බැලිය යුතු අතර, අමාත්‍ය මණ්ඩලයේ වෙනත් අමාත්‍යවරයකු අග්‍රාමාත්‍යවරයා ලෙස වැඩ බැලීමට ඔහු විසින් පත් කරනු ලැබිය යුත්තේ ය:

එසේ වුව ද, අග්‍රාමාත්‍ය ධුරය ඒ අවස්ථාව වන විට හිස්ව පවතී නම් හෝ අග්‍රාමාත්‍යවරයාට ජනාධිපති ධුරයේ වැඩ බැලීමට නොහැකි නම්, කථානායකවරයා ජනාධිපති ධුරයෙහි වැඩ බැලිය යුත්තේ ය.]

(5) ජනාධිපතිවරයා තෝරා පත් කිරීමේ ඡන්ද විමසීම මැතිවරණ කොමසාරිස්වරයා විසින් පවත්වනු ලැබිය යුත්තේ ය. ඒ ඡන්ද විමසීම සඳහා අපේක්ෂකයන්ගේ නාමයෝජනා කළ යුතු දිනය ද, ඒ ඡන්ද විමසීම පැවැත්විය යුතු දිනය ද, මැතිවරණ කොමසාරිස්වරයා විසින් නියම කළ යුත්තේ ය.

(6) (අ) ජනාධිපතිවරයා තෝරා පත් කිරීමේ ඡන්ද විමසීම සඳහා අපේක්ෂකයන්ගේ නාම යෝජනා කිරීම සම්බන්ධයෙන්;

(ආ) ජනාධිපතිවරයා තෝරා පත් කිරීමේ ඡන්ද විමසීම සඳහා භාවිත කළ යුතු ඡන්ද හිමි නාම ලේඛනය සහ එම ඡන්ද විමසීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සම්බන්ධයෙන්;

(ඇ) ඒ ඡන්ද විමසීම හා සම්බන්ධ වැරදි නියම කර දැක්වීම සහ එම වැරදි සඳහා වූ දඬුවම් සම්බන්ධයෙන්;

(ඈ) ඒ ඡන්ද විමසීම නිෂ්ප්‍රභ කිරීමට අවශ්‍ය හේතු සහ නිෂ්ප්‍රභ කරන ආකාරය සම්බන්ධයෙන් හා යම්කිසි හබ කළ ඡන්ද විමසීමක් නිශ්චය කිරීමට අවශ්‍ය හේතු සහ නිශ්චය කරන ආකාරය සම්බන්ධයෙන්; සහ

(ඉ) ඉහත කී කරුණු සඳහා අවශ්‍ය වන්නා වූ හෝ ආනුෂංගික වන්නා වූ සියලු කාරණා සම්බන්ධයෙන්,

පාර්ලිමේන්තුව විසින් නීතියෙන් විධිවිධාන සැලැස්විය යුත්තේ ය.

ධුරය භාර ගැනීම.

32. (1) ජනාධිපති ධුරයට තෝරා පත් කර ගනු ලබන තැනැත්තා හෝ අනුප්‍රාප්ත වන තැනැත්තා ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍ර විනිශ්චයකාරවරයා ඉදිරිපිට හෝ ඒ අධිකරණයේ වෙනත් යම් විනිශ්චයකාරවරයකු ඉදිරිපිට ශ්‍රී ලංකාවේ දී හතරවන උපලේඛනයේ දැක්වෙන ප්‍රතිඥාව දී ඊට අත්සන් තැබීමෙන් හෝ දිවුරුම දී ඊට අත්සන් තැබීමෙන් හෝ ධුරය භාර ගත යුත්තේ ය.

(2) එසේ ධුරය භාර ගත් විට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඇති කරන ලද හෝ පිළිගන්නා ලද වෙන යම් ධුරයක් දැරීම ජනාධිපතිවරයා විසින් අවසාන කළ යුතු අතර, ඔහු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වේ නම් පාර්ලිමේන්තුවේ සිය අසුනෙන් ඉවත් විය යුත්තේ ය. ජනාධිපතිවරයා වෙනත් කවර වූ හෝ ලාභදායී ධුරයක් හෝ තනතුරක් නොදැරිය යුත්තේ ය.

[23][(3) ජනාධිපතිවරයා ස්වකීය ධුරයෙහි බලය ප්‍රකාර මාස තුනකට එක් වරක් පාර්ලිමේන්තුවට සහභාගි විය යුත්තේ ය. මේ කර්තව්‍යය ඉටුකිරීමේ දී ඡන්දය පාවිච්චි කිරීමට ඇති හිමිකම හැර පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු සතු සියලු වරප්‍රසාද, පරිහාර සහ බලතලවලට ජනාධිපතිවරයා හිමිකම් ලබන අතර, පාර්ලිමේන්තුව හෝ

23 - දහඅට වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 3(1) වැනි වගන්තිය මගින් (3) වැනි අනුව්‍යවස්ථාව ඉවත් කොට ඒ වෙනුවට ආදේශ කරන ලදී.

එහි මන්ත්‍රීවරුන් හෝ සතු යම් වරප්‍රසාද කඩකිරීමක් සම්බන්ධයෙන් වගකිව යුතු නොවන්නේ ය.]

[24][ (4) ස්වකීය ධුරයෙහි බලය ප්‍රකාර පාර්ලිමේන්තුව ඇමතීමට ද, පාර්ලිමේන්තුවට සංදේශ යැවීමට ද, ජනාධිපතිවරයාට අයිතිය තිබිය යුත්තේ ය.]

**ජනාධිපතිවරයාගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය.**

[25][33. (1) ජනාධිපතිවරයාගේ කාර්යය විය යුත්තේ :-

(අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුගමනය කරන බවට ද, ආරක්ෂා කරන බවට ද වගබලා ගැනීම;

(ආ) ජාතික ප්‍රතිසන්ධානය හා ඒකාබද්ධතාවය ප්‍රවර්ධනය කිරීම;

(ඇ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සහ VIIඅ ව්‍යවස්ථාවේ සඳහන් ආයතනවල නිසි ක්‍රියාකාරීත්වය පහසුකරලීම; සහ

(ඈ) මැතිවරණ කොමිෂන් සභාවේ උපදෙස් මත, නිදහස් හා සාධාරණ ඡන්ද විමසීම් සහ ජනමත විචාරණ පැවැත්වීම සඳහා උචිත වාතාවරණ නිර්මාණය කිරීම තහවුරු කිරීම,

වන්නේ ය.

(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හෝ වෙනත් ලිඛිත නීතියකින් හෝ ප්‍රකාශිතවම ජනාධිපතිවරයා වෙත පවරා හෝ නියම කර ඇත්තා වූ බලතලවලට සහ කාර්යයන්ට අමතරව, ජනාධිපතිවරයාට -

(අ) පාර්ලිමේන්තුවේ එක් එක් සැසිවාරය ආරම්භයේ, පාර්ලිමේන්තුවේ දී ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශය කිරීමට බලය ඇත්තේ ය;

(ආ) පාර්ලිමේන්තුවේ මංගල රැස්වීම්වල මුලසුන දැරීමට බලය ඇත්තේ ය;

(ඇ) පාර්ලිමේන්තුව කැඳවීමට, වාර අවසන් කිරීමට සහ විසුරුවා හැරීමට බලය ඇත්තේ ය;

(ඈ) තානාපතිවරයන්, මහකොමසාරිස්වරයන්, පූර්ණාධිකාරී රාජ්‍ය දූතයන් හා වෙනත් තානාපති නියෝජිතයන් පත් කිරීමට හා ඔවුන්ට බලතල පැවරීමට ද, ඔවුන් පිළිගැනීමට ද බලය ඇත්තේ ය;

(ඉ) නීතිඥ වෘත්තියෙහි විශිෂ්ඨත්වයට පත්ව ඇත්තා වූද, පැවැත්මෙහි හා වෘත්තිය කටයුතු පිළිබඳ අවංකභාවයෙහි

---

24 - දහඅට වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 3(2) වැනි වගන්තිය මගින් ඇතුළත් කරන ලදී.

25 - දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 5 වැනි වගන්තිය මගින් තිබුණු 33 වන ව්‍යවස්ථාව ඉවත් කොට ඒ වෙනුවට නව ව්‍යවස්ථාවක් ආදේශ කරන ලදී.

උත්කෘෂ්ඨ තත්වයක් පවත්වාගෙන ඇත්තාවූ ද නීතිඥවරයන්, ජනාධිපති නීතිඥවරයන් වශයෙන් පත් කිරීමට බලය ඇත්තේ ය. මේ ඡේදය යටතේ පත් කරනු ලබන සෑම ජනාධිපති නීතිඥවරයකුටම ඒ දක්වා රාජ නීතිඥවරයන් විසින් භුක්ති විඳින ලද සියලු වරප්‍රසාදවලට හිමිකම ඇත්තේ ය;

(ඊ) ජනරජයේ රාජ්‍ය මුද්‍රාව භාරයේ තබා ගැනීමට ද අග්‍රාමාත්‍යවරයා ද අමාත්‍ය මණ්ඩලයේ අනෙකුත් අමාත්‍යවරයන් ද ශ්‍රේෂ්ඨාධිකරණයේ අග්‍ර විනිශ්චයකාරවරයා සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ අනෙකුත් විනිශ්චයකාරවරයන් ද අභියාචනාධිකරණයේ සභාපතිවරයා සහ අභියාචනාධිකරණයේ අනෙකුත් විනිශ්චයකාරවරයන්ද පත් කිරීමේ අධිකාර පත්‍රවල සහ ජනරජයට අයත් වූ ද ප්‍රදානය කිරීමට හා පවරා දීමට ජනාධිපතිවරයාට නීතියෙන් නියමව ඇත්තා වූ නැතහොත් බලය පැවරී ඇත්තා වූ ද ඉඩකඩම් හා අනෙකුත් නිශ්චල දේපළ ප්‍රදානය කිරීමේ දී හෝ පවරා දීමේ දී, ඒ සම්බන්ධ ප්‍රදාන පත්‍රවල හා පැවරුම් පත්‍රවල රාජ්‍ය මුද්‍රාව තබා, අත්සන් කිරීමට ද රාජ්‍ය මුද්‍රාව තැබිය යුතු වෙනත් සෑම ලේඛනයකම රාජ්‍ය මුද්‍රාව තබා අත්සන් කිරීමට ද බලය ඇත්තේ ය;

(උ) යුද්ධය ප්‍රකාශ කිරීමට හා සාමය ප්‍රකාශ කිරීමට බලය ඇත්තේ ය; සහ

(ඌ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක හෝ විධිවිධානවලට පටහැනි නොවන්නාවූ ද ජාත්‍යන්තර නීතිය, චාරිත්‍ර වාරිත්‍ර හෝ භාවිතය අනුව ඉටු කිරීමට ජනාධිපතිවරයාට බලය ලැබී ඇත්තා වූ හෝ නියමිතව ඇත්තා වූ ද සියලු ක්‍රියා හා දේ කිරීමට බලය ඇත්තේ ය.]

**ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට වගකිව යුතු බව.**

[26] [33අ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ද මහජන ආරක්‍ෂාව සම්බන්ධයෙන් තත් කාලයේ බලපවත්නා නීතිය ඇතුළු යම් ලිඛිත නීතියක් යටතේ ද ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය යථා පරිදි ක්‍රියාත්මක කිරීම සහ යථා පරිදි ඉටුකිරීම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට වගකිව යුත්තේ ය.]

**සමාව දීම.**

34. (1) ශ්‍රී ලංකා ජනරජයේ කවර වූ හෝ අධිකරණයක දී වරදකරු කරන ලද කවර වූ හෝ වරදකරුවකුට -

(අ) සම්පූර්ණ සමාවක් හෝ නීත්‍යනුකූල කොන්දේසි සහිත සමාවක් හෝ දීමට;

(ආ) නියම කරන ලද යම් දඬුවමක් ක්‍රියාත්මක කිරීම කාලසීමාවක් නොමැතිව හෝ සුදුසු යයි ජනාධිපතිවරයා කල්පනා කරන කාලසීමාවක් ඇතිව හෝ කල් තැබීමට;

26 - දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 6 වැනි වගන්තිය මගින් නව 33අ. වන ව්‍යවස්ථාව ඇතුළත් කරන ලදී.

(ඇ) ඒ වරදකරුට නියම කරන ලද දඬුවමක් වෙනුවට ලිහිල් දඬුවමක් නියම කිරීමට; හෝ

(ඈ) නියම කරන ලද දඬුවමක් මුළුමනින් ම නිෂ්ප්‍රභ කිරීමට හෝ ඉන් කොටසක් අඩු කිරීමට ද, එකී වරදකරු කළ වරද හේතුකොට ගෙන ඔහුගෙන් ජනරජයට අය විය යුත්තා වූ යම්කිසි දණ්ඩනයක් මුළුමනින් ම නිෂ්ප්‍රභ කිරීමට හෝ ඉන් කොටසක් අඩු කිරීමට ද, එකී වරදකරු කිරීම හේතුකොටගෙන ඔහුට අයත් වස්තුවක් රාජ්‍ය සන්තක විය යුත්තේ නම්, එසේ රාජ්‍ය සන්තක විය යුත්තා වූ වස්තුවෙන් කොටසක් පමණක් රජයට ගැන්වීමට හෝ ඒ වස්තුව රාජ්‍ය සන්තක කිරීම මුළුමනින්ම අත්හිටුවීමට,

ජනාධිපතිවරයාට බලය ඇත්තේ ය:

එසේ වුව ද, එසේ වූ යම් වරදකරුවකුට අධිකරණයකින් මරණ දඬුවම නියම වූ විටක ජනාධිපතිවරයා විසින් ඒ නඩුව විභාග කළ විනිශ්චයකාරවරයාගෙන් වාර්තාවක් ලබා ගැනීමට සැලැස්විය යුත්තේ ය. එම වාර්තාව ජනාධිපතිවරයා වෙත ලැබුණු විට, ඒ පිළිබඳව නීතිපතිවරයාගේ උපදෙස් දීමෙන් පසුව නීතිපතිවරයාගේ ඒ උපදෙස් සමග එය අධිකරණ විෂය භාර අමාත්‍යවරයා වෙත යැවිය යුතු බව නියම කොට ජනාධිපතිවරයා විසින් එය නීතිපතිවරයා වෙත යැවිය යුත්තේ ය. ඉන්පසු ඒ අමාත්‍යවරයා විසින් සිය නිර්දේශ ද සමග එම වාර්තාව ජනාධිපතිවරයා වෙත එවිය යුත්තේ ය.

(2) ජනාධිපතිවරයා විසින්, 89 වැනි ව්‍යවස්ථාවේ (ඈ), (ඉ), (ඊ), (උ) හෝ (ඌ) ඡේදයේ හෝ 91 වැනි ව්‍යවස්ථාවේ (1) වැනි අනුව්‍යවස්ථාවේ (උ) ඡේදයෙහි හෝ දැක්වෙන නුසුදුසුකමකට පාත්‍රව සිටින්නා වූ හෝ පාත්‍ර වන්නා වූ හෝ යම්කිසි තැනැත්තකු සම්බන්ධයෙන් -

(අ) සම්පූර්ණ සමාවක් හෝ නීත්‍යනුකූල කොන්දේසි සහිත සමාවක් හෝ දිය හැක්කේ ය; නැතහොත්

(ආ) එම නුසුදුසුකමේ කාලසීමාව අඩු කළ හැක්කේ ය.

(3) ශ්‍රී ලංකා ජනරජයේ අධිකරණයක් ඉදිරියට පමුණුවා දඬුවම් දිය හැකි වරදක් සිදු කරනු ලැබූ විටක, එකී වරද කළ ප්‍රධාන වරදකරු හෝ ප්‍රධාන වරදකරුවන් කීප දෙනෙක් වෙත් නම් ඔවුන් අතුරෙන් කවරකු හෝ වරදකරු කිරීමට තුඩු දෙන තොරතුරක් සපයන්නා වූ අපරාධ සහායකයකුට සමාවක් දීමට ජනාධිපතිවරයාට බලය ඇත්තේ ය.

**ජනාධිපතිවරයාට විරුද්ධව නඩු පැවරිය නොහැකි බව.**

[27] [35. (1) යම් තැනැත්තකු ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපතිවරයා ලෙස ධූරය දරන අවස්ථාවක දී, ඔහු විසින් පෞද්ගලික තත්ත්වයෙහි ලා හෝ නිල තත්ත්වයෙහි ලා කරන ලද හෝ නොකර හරින ලද කිසිවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව කිසිම සිවිල් හෝ අපරාධ

27 - දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 7 වැනි වගන්තිය මගින් මුල් 35 වැනි ව්‍යවස්ථාව ඉවත් කොට ඒ වෙනුවට නව ව්‍යවස්ථාවක් ආදේශ කරන ලදී.

නඩු කටයුත්තක් පැවරීම හෝ පවත්වාගෙන යාම හෝ නොකළ යුත්තේ ය :

එසේ වුව ද, ජනාධිපතිවරයා විසින් ඔහුගේ නිල තත්වයෙහි ලා කරන ලද හෝ නොකර හරින ලද කිසිවක් සම්බන්ධයෙන් නීතිපතිවරයාට විරුද්ධව 126 වන ව්‍යවස්ථාව යටතේ ඉල්ලීමක් කිරීමට යම් තැනැත්තකුට ඇති අයිතිය සීමා කරන ලෙස මේ අනුව්‍යවස්ථාවේ කිසිවක්, කියවා තේරුම් නොගත යුත්තේ යඃ

එසේම තවදුරටත්, ජනාධිපතිවරයා විසින් 33(2)(උ) ව්‍යවස්ථාව යටතේ බලතල ක්‍රියාත්මක කිරීම මත ප්‍රඥාපනය කිරීමට, ශ්‍රේෂ්ඨාධිකරණයට අධිකරණ බලය නොතිබිය යුත්තේ ය.

(2) කවර වූ හෝ තැනැත්තකුට විරුද්ධව, කවර හෝ විස්තරයක නඩුවක් පැවරිය හැකි කාලය සීමාකරමින් නීතියෙන් විධිවිධාන සකසා ඇති විට, ඒ තැනැත්තා යම් කිසි කාලයක් ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපති ධූරය දරා ඇත්නම් එකී නඩුව පැවරිය හැකි කාල සීමාව ලෙස නීතියෙන් නියමව ඇති කාලය නිශ්චය කිරීමේ දී ඒ තැනැත්තා ජනාධිපති ධූරය දැරූ කාලය නොගැනිය යුත්තේ ය.

(3) මේ ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාවේ විධිවිධානවලින් පැවරී ඇති මුක්තිය, 129 වන ව්‍යවස්ථාවේ (2) වන අනු ව්‍යවස්ථාව යටතේ හෝ ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම හා සම්බන්ධව හෝ ජනමත විචාරණයක වලංගු භාවය හා සම්බන්ධව 130 වන ව්‍යවස්ථාවේ (අ) ඡේදය යටතේ ශ්‍රේෂ්ඨාධිකරණයේ පැවැත්වෙන නඩු කටයුතුවලට හෝ අදාළ නොවන්නේ ය.]

**36.** (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වී මාසයක් ඇතුළත පාර්ලිමේන්තුව විසින් ජනාධිපති ධූරය දරන තැනැත්තාගේ වැටුප්, දීමනා හා විශ්‍රාම වැටුප් හිමිකම යෝජනා සම්මතයෙන් නිශ්චය කළ යුත්තේ ය. එම විශ්‍රාම වැටුප, යම් පූර්ව සේවයක් හේතුකොටගෙන ඒ තැනැත්තාට හිමිකම ඇති වෙනත් යම් විශ්‍රාම වැටුපකට අතිරේකව වන්නේ ය. වැටුප සහ විශ්‍රාම වැටුප.

(2) යම් තැනැත්තකු විසින් ජනාධිපති ධූරය භාර ගනු ලැබූ විට පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලබන පරිදි වූ වැටුප් සහ දීමනා ලැබීමට ද ඉන් පසුව, එසේ නිශ්චය කරනු ලබන විශ්‍රාම වැටුප් ලැබීමට ද ඒ තැනැත්තා හිමිකම් ලබන්නේ ය. පසුව මෙම ව්‍යවස්ථාවට කරනු ලැබූ සංශෝධනයක්, මෙම ව්‍යවස්ථාව පරිච්ඡින්න කිරීමක් නැතහොත් ප්‍රතියෝජනය කිරීමක් සහ මෙම ව්‍යවස්ථාවට අනනුකූල වන පසුව පනවනු ලැබූ යම් නීතියක් හෝ ඒ නීතියක යම් විධිවිධානයක් අතීතයට බල නොපාන්නේ ය.

(3) ජනාධිපතිවරයාගේ වැටුප, දීමනා සහ විශ්‍රාම වැටුප, ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන්නේ ය.

(4) ජනාධිපති ධුරය දරන තැනැත්තන්ගේ වැටුප්, දීමනා හෝ විශ්‍රාම වැටුප් හිමිකම පාර්ලිමේන්තුව විසින් යෝජනා සම්මතයෙන් වැඩි කළ හැක්කේ ය.

එහෙත් එම වැටුප්, දීමනා හෝ විශ්‍රාම වැටුප් හිමිකම් අඩු නො කළ යුත්තේ ය.

**අග්‍රාමාත්‍යවරයා විසින් ජනාධිපතිවරයාගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම.**

**37.** (1) රෝගාතුර වීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ ස්වකීය ධුරයට අයත් බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට සහ ඉටු කිරීමට තමාට නොහැකි වේ යයි ජනාධිපතිවරයාගේ මතය වේ නම්, එම කාල සීමා තුළ ජනාධිපති ධුරයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා ජනාධිපතිවරයා විසින් අග්‍රාමාත්‍යවරයා පත් කළ හැක්කේ ය. තව ද එම කාල සීමාව තුළ අග්‍රාමාත්‍ය ධුරයේ වැඩ බැලීම පිණිස ජනාධිපතිවරයා විසින් අමාත්‍ය මණ්ඩලයේ වෙනත් අමාත්‍යවරයකු පත් කළ හැක්කේ ය :

එසේ වුවද, අග්‍රාමාත්‍ය ධුරය ඒ අවස්ථාව වන විට හිස්ව පවතී නම් හෝ අග්‍රාමාත්‍යවරයාට ජනාධිපති ධුරයේ වැඩ බැලීමට නොහැකි නම් ඒ කාල සීමාව තුළ ජනාධිපති ධුරයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා ජනාධිපතිවරයා විසින් කථානායකවරයා පත් කළ හැක්කේ ය.

(2) ජනාධිපතිවරයාට ස්වකීය ධුරයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට සහ ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වී ඇති බව සහ මේ ව්‍යවස්ථාවේ (1) වැනි අනුව්‍යවස්ථාව අනුව පත් කිරීමක් සිදු කිරීමට නොහැකි බව කථානායකවරයා විමසීමෙන් පසුව අග්‍ර විනිශ්චයකාරවරයාගේ මතය වේ නම් ඔහු, ඔහුගේ මතය කථානායකවරයා වෙත ලියවිල්ලකින් දැනුම් දිය යුත්තේ ය. එවිට අග්‍රාමාත්‍යවරයා එම කාල සීමාව තුළ ජනාධිපති ධුරයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කළ යුත්තේ ය; ඉටු කළ යුත්තේ ය. තව ද, මෙම ව්‍යවස්ථාවේ (1) වැනි අනුව්‍යවස්ථාවේ විධිවිධාන සලස්වා ඇති පරිදි පත් කිරීමක් කරනු නොලැබ තිබුණ ද එම කාල සීමාව තුළ අග්‍රාමාත්‍ය ධුරයේ වැඩ බැලීම පිණිස ඔහු විසින් අමාත්‍ය මණ්ඩලයේ වෙනත් අමාත්‍යවරයකු පත් කළ යුත්තේ ය :

එසේ වුව ද, අග්‍රාමාත්‍ය ධුරය ඒ අවස්ථාව වන විට හිස්ව පවතී නම් හෝ අග්‍රාමාත්‍යවරයාට ජනාධිපති ධුරයේ වැඩ බැලීමට නොහැකි නම්, කථානායකවරයා ඒ කාලසීමාව තුළ ජනාධිපති ධුරයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කළ යුත්තේ ය; ඉටු කළ යුත්තේ ය.

(3) 32 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනුව්‍යවස්ථාවේ විධිවිධාන හැර ජනාධිපතිවරයා පිළිබඳ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන, එසේ ජනාධිපති ධුරයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කරන සහ ඉටු කරන තැනැත්තාට ද අදාළ කළ හැකි තාක් දුරට, අදාළ වන්නේ ය.

(4) පාර්ලිමේන්තුව විසුරුවා හැර ඇති යම් කාලසීමාවක් තුළ දී, මේ ව්‍යවස්ථාවේ ද, 38 වැනි ව්‍යවස්ථාවේ (1) වැනි අනුව්‍යවස්ථාවේ (ආ) ඡේදයෙහි ද, 40 වැනි ව්‍යවස්ථාවේ (1) වැනි අනුව්‍යවස්ථාවේ ද, "කථානායකවරයා" යන්නට පාර්ලිමේන්තුව විසුරුවා හරින තෙක් කථානායක ධුරය දැරූ තැනැත්තා ඇතුළත් වේ.

**ජනාධිපතිවරයා විසින් ධුරය හිස් කිරීම.**

38. (1) (අ) ජනාධිපතිවරයා මිය ගියහොත් එවිට ද;

(ආ) කථානායකවරයා වෙත තමාගේ අත්සනින් යවනු ලබන ලිපියකින් ජනාධිපතිවරයා තම ධුරයෙන් අස් වුවහොත් එවිට ද;

(ඇ) ජනාධිපතිවරයා ශ්‍රී ලංකාවේ පුරවැසියකුව සිටීම නතර වුවහොත් එවිට ද;

(ඈ) ජනාධිපතිවරයා වශයෙන් තෝරා පත් කර ගනු ලැබූ තැනැත්තා ස්වකීය ධුර කාලය ආරම්භ වූ දින සිට [28][සති දෙකක්] ඇතුළත ධුරයේ කාර්ය භාර ගැනීම හිතාමතා ම පැහැර හැරියහොත් එවිට ද;

(ඉ) මීළඟ අනුව්‍යවස්ථාවේ විධිවිධාන සලසා ඇති පරිදි ජනාධිපතිවරයා ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් එවිට ද;

(ඊ) ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම නිෂ්ප්‍රභ බව ශ්‍රේෂ්ඨාධිකරණය විසින්, 130 වැනි ව්‍යවස්ථාවේ (අ) ඡේදය යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා තීරණය කරනු ලැබුවහොත් හා වෙනත් යම්කිසි තැනැත්තකු ජනාධිපතිවරයා වශයෙන් යථා පරිදි තෝරා පත් කර ගන්නා ලදැයි තීරණය නොකළහොත් එවිට ද,

ජනාධිපති ධුරය හිස් වන්නේ ය.

(2) (අ) ජනාධිපතිවරයාට මානසික හෝ ශාරීරික අබලතාව හේතුවෙන් ඔහුගේ ධුරයේ කාර්ය ඉටු කිරීමට නියත වශයෙන් නොහැකි බවට චෝදනා කරන්නා වූ හෝ -

(i) චේතනාන්විතව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමේ වරද;

(ii) රාජ්‍යද්‍රෝහි වීමේ වරද;

(iii) අල්ලස සම්බන්ධ වරද;

(iv) ස්වකීය ධුරයේ බලතල අයුතු අන්දමින් පාවිච්චි කිරීම හා සම්බන්ධ විෂමචාරය හෝ දූෂණය හා සම්බන්ධ වරද; හෝ

(v) යම් නීතියක් යටතේ චරිත දූෂණය හා සම්බන්ධ වරදක් වන වරදක්,

---

28 - තුන් වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 3 වැනි වගන්තිය මගින් "මාසයක්" යන්න ඉවත් කර ඒ වෙනුවට ආදේශ කරන ලදී.

කර ඇති බවට චෝදනා කරන්නා වූ ද, එම චෝදනාවෙහි හෝ චෝදනාවල හෝ සම්පූර්ණ විස්තර දැක්වෙන්නා වූ ද, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඒ පිළිබඳව පරීක්ෂා කොට බලා වාර්තා කරන ලෙස ඉල්ලා සිටින්නා වූ ද, යෝජනා සම්මතයක් ඉදිරිපත් කිරීමට තමා අදහස් කරන බවට පාර්ලිමේන්තුවේ කවර වූ හෝ මන්ත්‍රීවරයකු විසින් කථානායකවරයා වෙත යවන ලිපියකින් දැන්වීමක් කළ හැක්කේ ය.

(ආ) එවැනි කිසිම යෝජනා සම්මතයක් පිළිබඳ දැන්වීමක්, එය (අ) ඡේදයේ විධිවිධානවලට අනුකූල වේ නම් මිස සහ -

(i) එම යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම පාර්ලිමේන්තුවේ මුළු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවක් විසින් අත්සන් කොට ඇත්නම් මිස; හෝ

(ii) එම යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම පාර්ලිමේන්තුවේ මුළු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවෙන් දෙකෙන් එකකට නොඅඩු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවක් විසින් අත්සන් කොට ඇත්නම් සහ එම චෝදනාව හෝ චෝදනා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පරීක්ෂා කොට වාර්තා කිරීමට තරම් වන බවට කථානායකවරයා සෑහීමට පත් වේ නම් මිස,

කථානායකවරයා විසින් භාර ගැනීම හෝ පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම හෝ නොකළ යුත්තේ ය.

(ඇ) එවැනි යෝජනා සම්මතයක් පාර්ලිමේන්තුවේ (නොපැමිණි මන්ත්‍රීවරයන් ද ඇතුළුව) මුළු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවකගේ ඡන්දයෙන් සම්මත කරනු ලැබූ අවස්ථාවක, එම යෝජනා සම්මතයෙහි ඇතුළත් චෝදනාව හෝ චෝදනා පිළිබඳව පරීක්ෂා කොට වාර්තා කිරීම සඳහා එය කථානායකවරයා විසින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත යොමු කළ යුත්තේ ය.

(ඈ) ශ්‍රේෂ්ඨාධිකරණය විසින් යථා පරිදි පරීක්ෂණයක් කිරීමෙන් පසු ස්වකීය තීරණ හා ඊට හේතු ද දැක්වෙන වාර්තාවක් පාර්ලිමේන්තුවට සැපයිය යුත්තේ ය. එම පරීක්ෂණයේ දී ජනාධිපතිවරයාට පෞද්ගලිකව ම හෝ නීතිඥවරයකු මගින් හෝ පෙනී සිටීමට ද කරුණු කියා සිටීමට ද අයිතිය ඇත්තේ ය.

(ඉ) අවස්ථාවෝචිත පරිදි, මානසික හෝ ශාරීරික අබලතාව හේතුවෙන් ජනාධිපතිවරයාට ඔහුගේ ධුරයේ කාර්ය ඉටු කිරීමට නියත වශයෙන් නොහැකි බව හෝ එම යෝජනා සම්මතයෙහි චෝදිත කවර වූ හෝ වරදක් ජනාධිපතිවරයා විසින් කර ඇති බව හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය වන බව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලැබූ අවස්ථාවක, (නොපැමිණි මන්ත්‍රීවරයන් ද ඇතුළුව) මුළු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවෙන් තුනෙන්

දෙකකට නොඅඩු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවක් පක්ෂව ඡන්දය දී සම්මත කරන යෝජනා සම්මතයක් මගින් පාර්ලිමේන්තුව විසින් ජනාධිපතිවරයා ධුරයෙන් ඉවත් කළ හැක්කේ ය.

**ජනාධිපතිවරයා යථා පරිදි තෝරා පත් කර ගෙන නොමැති බවට හෝ ජනාධිපතිවරයා තෝරා පත් කිරීමේ ඡන්ද විමසීම නිෂ්ප්‍රභ බවට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කිරීම.**

**39.** (1) ශ්‍රේෂ්ඨාධිකරණය විසින් 130 වැනි ව්‍යවස්ථාව යටතේ ස්වකීය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමෙහි ලා -

(අ) ජනාධිපතිවරයා තෝරා පත් කිරීම නිෂ්ප්‍රභ බව තීරණය කළ සහ වෙනත් යම්කිසි තැනැත්තකු යථා පරිදි තෝරා පත් කර ගන්නා ලදැයි තීරණය නොකළ අවස්ථාවක ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම සඳහා ඡන්ද විමසීමක්, ඒ තීරණය කරනු ලැබූ දින සිට මාස තුනක් ඉකුත්වීමට පෙර පැවැත්විය යුත්තේ ය; නැතහොත්

(ආ) වෙනත් යම් තැනැත්තකු ජනාධිපතිවරයා ලෙස යථා පරිදි තෝරා පත් කර ගන්නා ලද බව තීරණය කළ අවස්ථාවක, ඒ තීරණය කරනු ලැබූ දින සිට මාසයක් ඇතුළත ඒ වෙනත් තැනැත්තා ජනාධිපති ධුරය භාර ගත යුත්තේ ය.

38 වැනි ව්‍යවස්ථාවේ (1) වැනි අනුව්‍යවස්ථාවේ (ඇ) ඡේදයේ කාර්යය සඳහා නව ජනාධිපතිවරයාගේ ධුර කාලය ආරම්භ වන දිනය අවස්ථාවෝචිත පරිදි, ඔහු තෝරා පත් කර ගනු ලැබූ දිනය හෝ තීරණයේ දිනය හෝ වන්නේ ය.

(2) මේ ව්‍යවස්ථාවේ (1) වැනි අනුව්‍යවස්ථාවේ සඳහන් වන පරිදි වූ යම් තීරණයක් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කරනු ලැබූ විට ජනාධිපති ධුරයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කරමින් සහ ඉටු කරමින් සිටි තැනැත්තා ඒ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම අප්‍රමාදව නතර කළ යුත්තේ ය. එකී තීරණයේ දිනයත් නව ජනාධිපතිවරයා ධුරය භාර ගැනීමත් අතර කාලය තුළ අග්‍රාමාත්‍යවරයා ජනාධිපති ධුරයේ වැඩ බැලිය යුතු අතර, අමාත්‍ය මණ්ඩලයේ වෙනත් අමාත්‍යවරයකු අග්‍රාමාත්‍ය ධුරයේ වැඩ බැලීම සඳහා පත් කළ යුත්තේ යඃ

එසේ වුව ද, ඒ අවස්ථාව වන විට අග්‍රාමාත්‍ය ධුරය හිස්ව පවතී නම් හෝ අග්‍රාමාත්‍යවරයාට ජනාධිපති ධුරයේ වැඩ බැලීමට නොහැකි නම් කථානායකවරයා ජනාධිපති ධුරයේ වැඩ බැලිය යුත්තේ ය.

(3) 31 වැනි ව්‍යවස්ථාවේ (4) වැනි අනුව්‍යස්ථාවේ කවර විධිවිධානයක් තිබුණ ද, 30 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනුව්‍යවස්ථාවේ කාර්යය සඳහා, නව ජනාධිපතිවරයාගේ ධුර කාලය, යම් තැනැත්තකු තෝරා පත් කර ගනු ලැබීම නිෂ්ප්‍රභ හෝ අනිසි බවට තීරණය කරනු ලැබුවේ ද, එම තීරණය නොකරන ලද නම් ඒ තැනැත්තාගේ ධුර කාලය ආරම්භ විය හැකිව තිබුණු දිනයේ දී, ආරම්භ වූවාක් සේ සැලකෙන්නේ ය.

(4) ජනාධිපති ධුරයේ බලතල, කාර්ය හා කර්තව්‍ය යම් තැනැත්තකු විසින් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම, ජනාධිපතිවරයා වශයෙන් ඒ තැනැත්තා තෝරා පත් කර ගැනීම නිෂ්ප්‍රභ බව හෝ අනිසි බව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පසු අවස්ථාවක දී තීරණය කරනු ලැබූ පමණින් නිර්බල නොවිය යුත්තේ ය.

(5) 40 වැනි ව්‍යවස්ථාවේ පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, මේ ව්‍යවස්ථාවේ විධිවිධාන අදාළ වන්නේ ය.

**ජනාධිපතිවරයා විසින් ධුරය හිස් කිරීම සහ අනුප්‍රාප්තික ජනාධිපතිවරයා තෝරා පත් කිරීම.**

**40.** (1) (අ) ජනාධිපතිවරයාගේ ධුර කාලය ඉකුත් වීමට පෙර ජනාධිපති ධුරය හිස් වුවහොත්, පාර්ලිමේන්තුව විසින් එහි මන්ත්‍රීවරයන් අතුරෙන් ජනාධිපති ධුරයට තෝරා පත් කර ගනු ලැබීමට සුදුසුකම් ඇති යම් මන්ත්‍රීවරයකු ජනාධිපතිවරයා ලෙස තෝරා පත් කර ගනු ලැබිය යුත්තේ ය.

ජනාධිපති ධුරයට එසේ අනුප්‍රාප්ත වන යම් තැනැත්තකු, ධුරය හිස් කරන ජනාධිපතිවරයාගේ ධුර කාලයෙන් ඉතිරි කාලය තුළ පමණක් ධුරය දැරිය යුත්තේ ය.

(ආ) එසේ ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම, පුරප්පාඩුව ඇති වූ දිනයෙන් පසු හැකිතාක් ඉක්මනින් කළ යුත්තේ ය. එම තෝරා පත් කර ගැනීම කිසිම අවස්ථාවක දී එදින සිට මාසයකට වඩා පසු නොවිය යුත්තේ ය. එම තෝරා පත් කර ගැනීම පාර්ලිමේන්තුව විසින් නීතියෙන් විධිවිධාන සලස්වනු ලැබිය හැකි යම් කාර්ය පටිපාටියකට අනුකූලව රහස් ඡන්දයෙන් හා දෙන ලද ඡන්ද සංඛ්‍යාවෙන් ඒකාන්ත බහුතර ඡන්දයකින් විය යුත්තේ යඃ

එසේ වුව ද, පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබීමෙන් පසුව එවැනි පුරප්පාඩුවක් ඇති වුවහොත්, නව පාර්ලිමේන්තුව විසින්, ඒ පාර්ලිමේන්තුවේ පළමු රැස්වීමේ දින සිට එක් මාසයක් ඇතුළත ජනාධිපතිවරයා තෝරා පත් කර ගත යුත්තේ ය.

(ඇ) ධුරය එසේ හිස් වීමත්, නව ජනාධිපතිවරයා ධුරයේ කාර්ය භාර ගැනීමත් අතර කාලය තුළ අග්‍රාමාත්‍යවරයා ජනාධිපති ධුරයේ වැඩ බැලිය යුත්තේ ය. අග්‍රාමාත්‍ය ධුරයේ වැඩ බැලීම සඳහා ඔහු විසින් අමාත්‍ය මණ්ඩලයේ වෙනත් අමාත්‍යවරයකු පත් කළ යුත්තේ ය.

එසේ වුව ද, ඒ අවස්ථාව වන විට අග්‍රාමාත්‍ය ධුරය හිස්ව පවතී නම් හෝ අග්‍රාමාත්‍යවරයාට ජනාධිපති ධුරයේ වැඩ බැලීමට නොහැකි නම්, කථානායකවරයා ජනාධිපති ධුරයේ වැඩ බැලිය යුත්තේ ය.

(2) (32 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනුව්‍යවස්ථාවේ විධිවිධාන හැර) ජනාධිපතිවරයාට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන, අදාළ කළ හැකිතාක් දුරට, වැඩබලන ජනාධිපතිවරයකුට ද අදාළ වන්නේ ය.

(3) පාර්ලිමේන්තුව විසින් ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම සඳහා වූ කාර්ය පටිපාටිය පිළිබඳ සියලු කරුණු සඳහා ද, ඊට අවශ්‍ය

හා ආනුෂංගික වෙනත් සියලු කරුණු සඳහා ද, පාර්ලිමේන්තුව විසින් නීතියෙන් විධිවිධාන සැලැස්විය යුත්තේ ය.

ජනාධිපතිවරයාගේ කාර්ය මණ්ඩලය.

41. (1) ජනාධිපති ධුරයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේලා සහ ඉටු කිරීමේලා තමාට සහාය දීම පිණිස තම මතය අනුව, අවශ්‍ය වන ලේකම්වරයන් පත් කිරීමට ද, අමාත්‍ය මණ්ඩලයේ අදහස් විමසා, වෙනත් නිලධරයන් සහ කාර්ය මණ්ඩලය පත් කිරීමට ද, ඔවුන්ගේ සේවා නියමයන් සහ කොන්දේසි නිශ්චය කිරීමට ද, ජනාධිපතිවරයාට බලය ඇත්තේ ය.

(2) ඒ ලේකම්වරයන්ගේ, නිලධරයන්ගේ සහ කාර්ය මණ්ඩලයේ වැටුප් ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන්නේ ය.

(3) ඒ ලේකම්වරයන්, නිලධරයන් සහ කාර්ය මණ්ඩලය සේවයෙන් පහ කිරීමේ සහ ඔවුන්ගේ විනය පාලනය කිරීමේ බලය ජනාධිපතිවරයා සතු විය යුතු වීම හැර ඒ ලේකම්වරයන්, නිලධරයන් සහ කාර්ය මණ්ඩලය රජයේ නිලධරයන් ලෙස සැලකිය යුත්තේ ය. එකී නිලධරයන් සහ කාර්ය මණ්ඩලය සේවයෙන් පහ කිරීම සහ ඔවුන්ගේ විනය පාලනය කිරීම පිළිබඳ බලතල ජනාධිපතිවරයා විසින් එවැනි යම් ලේකම්වරයකුට පවරනු ලැබිය හැක්කේ ය.

(4) නව ජනාධිපතිවරයකු ජනාධිපති ධුරය භාර ගත් විට ඒ සෑම ලේකම්වරයකු ම, නිලධරයකු ම සහ කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකු ම ධුර දැරීම අවසාන වන්නේ ය.

(5) එවැනි යම් ලේකම්වරයකු, නිලධරයකු හෝ කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු විසින් ධුර දැරීම එසේ අවසාන වන අවස්ථාවක අමාත්‍ය මණ්ඩලය විසින් ඒ ලේකම්වරයා, නිලධරයා හෝ කාර්ය මණ්ඩලයේ සාමාජිකයා රජයේ සේවයේ යම් තනතුරකට පත් කළ හැක්කේ යඃ

එසේ වුව ද, ලේකම්වරයකු, නිලධරයකු හෝ කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත් කරනු ලබන තෙක් රජයේ සේවයේ හෝ පළාත් පාලන සේවයේ හෝ රාජ්‍ය සංස්ථාවක සේවයේ හෝ නියුක්තව සිටි එවැනි යම් ලේකම්වරයකුට, නිලධරයකුට හෝ කාර්ය මණ්ඩලයේ සාමාජිකයකුට,

නව ජනාධිපතිවරයකු විසින් ධුරය භාර ගනු ලැබූ විට තමා එම සේවයෙහි දැරූ තනතුරට, ජ්‍යෙෂ්ඨතාව අහිමිවීමකින් තොරව ආපසු පැමිණීමට හිමිකම් ඇත්තේ ය.

(6) මේ ව්‍යවස්ථාවේ (5) වැනි අනුව්‍යවස්ථාවේ, අතුරු අනුව්‍යවස්ථාව, ඒ අතුරු අනුව්‍යවස්ථාවේ සඳහන් යම් තැනැත්තකුට පහත සඳහන් අවස්ථාවලදී, එනම් -

(අ) විනය හේතු මත සේවයෙන් පහ කිරීම හැර වෙනත් ආකාරයකින් ජනාධිපතිවරයා විසින් ඒ තැනැත්තාගේ සේවය අවසාන කළ විට; හෝ

(ආ) ඒ තැනැත්තා ඉල්ලා අස් වන දිනයේ දී ඒ තැනැත්තාට විරුද්ධව විනය පිළිබඳ කටයුත්තක් විභාගයට භාජනව ඇත්නම් හෝ විභාගයට ගැනීමට අදහස් කර ඇත්නම් මිස, ඒ තැනැත්තා ඉල්ලා අස් වූ විට,

අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ වන්නේ ය.

(7) ජනාධිපතිවරයාගේ ලේකම් ධුරය හෝ යම්කිසි අමාත්‍යාංශයක ලේකම් ධුරය හෝ ජනාධිපතිවරයාගේ කාර්ය මණ්ඩලයෙහි යම්කිසි ධුරයක් හෝ ඒ ධුර එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ නොකඩවා දරා ඇති කවර වූ හෝ තැනැත්තෙක් යම් ධුරයක් අවසන් වරට දැරුවේ ද, ඒ ධුරය ඒ තැනැත්තා විසින් නොකඩවා දරන ලද සේ, මේ ව්‍යවස්ථාවේ (5) වැනි අනුව්‍යවස්ථාවේ සහ (6) වැනි අනුව්‍යවස්ථාවේ කාර්ය සඳහා සැලකිය යුත්තේ ය.

## [29] [VIIඅ වැනි පරිච්ඡේදය

## ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සංයුතිය.**

**41අ.** (1) පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත වන, (මේ පරිච්ඡේදයේ "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවක් තිබිය යුත්තේ ය :-

(අ) අග්‍රාමාත්‍යවරයා;

(ආ) කථානායකවරයා;

(ඇ) පාර්ලිමේන්තුවේ විරුද්ධ පක්ෂයේ නායකවරයා;

(ඈ) ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු එක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්;

(ඉ) අග්‍රාමාත්‍යවරයා සහ විරුද්ධ පක්ෂයේ නායකවරයා යන දෙදෙනාගේ ම නාමයෝජනා කිරීම මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු වූ ද, දෙදෙනෙක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් විය යුතු වූ ද, තැනැත්තන් පස් දෙනෙක්; සහ

(ඊ) අග්‍රාමාත්‍යවරයා සහ විරුද්ධ පක්ෂයේ නායකවරයා අයත් දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම් හෝ නොවන පාර්ලිමේන්තුවේ නියෝජනය ඇති අනෙකුත් දේශපාලන පක්ෂවල සහ ස්වාධීන කණ්ඩායම්වල පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ බහුතරයේ එකඟත්වය මත නාම යෝජනා කොට ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන එක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්.

(2) කථානායකවරයා සභාවේ සභාපතිවරයා විය යුත්තේ ය.

(3) මේ ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාවේ (ඉ) ඡේදය හෝ (ඊ) ඡේදය යටතේ වන පත්කිරීම් සඳහා වූ නාම යෝජනා, ඒ නාම යෝජනා කිරීමේ අවශ්‍යතාවය පැන නගින කවර හෝ අවස්ථාවන්හිදී සිදු කිරීමට වගබලා ගැනීම කථානායකවරයාගේ කාර්යය වන්නේ ය.

(4) මේ ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාවේ (ඉ) ඡේදයේ සඳහන් තැනැත්තන් පස් දෙනා නම් කිරීමේ දී අග්‍රාමාත්‍යවරයා සහ විරුද්ධ පක්ෂයේ නායකවරයා විසින් වෘත්තීය සහ සමාජීය විවිධත්වය ඇතුළුව ශ්‍රී ලාංකීය සමාජයේ බහුත්ත්ව ලක්ෂණය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙන් පිළිබිඹු වන බව සහතික වීම පිණිස, පාර්ලිමේන්තුවේ නියෝජනය වන දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම්වල නායකයන් විමසිය යුත්තේ ය.

(5) මේ ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාවේ (ඉ) ඡේදය යටතේ

---

29 - දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 8 වැනි වගන්තිය මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මුල් VIIඅ. පරිච්ඡේදය ඉවත් කර ඒ වෙනුවට ඇතුළත් කරන ලදී.

පත් කරනු ලබන්නා වූ ද, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් නොවන්නා වූ ද තැනැත්තන් විශිෂ්ටත්වයෙන් හා අවංක භාවයෙන් යුත්, පොදු වෘත්තීය ජීවිතයේ දී කීර්තිය ලත්, කිසිදු දේශපාලන පක්ෂයක සාමාජිකයන් නොවන තැනැත්තන් විය යුතු අතර ඔවුන් නම් කරනු ලැබීම පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලැබිය යුත්තේ ය.

(6) මේ ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාවේ (ඉ) සහ (ඊ) ඡේද යටතේ කරන ලද නාම යෝජනා නිශ්චිතව දක්වමින් ලිඛිත දැනුම් දීමක් ජනාධිපතිවරයා වෙත ලැබී දින දහ හතරක් ඇතුළත ජනාධිපතිවරයා විසින් ඒ අවශ්‍ය පත්කිරීම් කරනු ලැබිය යුත්තේ ය. එකී දින දහහතරක කාල පරිච්ඡේදය ඇතුළත අවශ්‍ය පත්කිරීම් කිරීමට ජනාධිපතිවරයා අපොහොසත් වන විටෙක, නාම යෝජිත තැනැත්තන්, එකී කාල පරිච්ඡේදය අවසන් වූ දින සිට බල පවත්වන පරිදි සභාවේ සාමාජිකයන් ලෙස පත්කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(7) (අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 64 වන ව්‍යවස්ථාවේ (2) වන අනු ව්‍යවස්ථාවේ කවර විධිවිධානයක් තිබුණ ද, පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබූ විටක, ඉහත කී ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු කථානායකවරයා වශයෙන් තෝරා පත් කර ගන්නා තෙක්, ඒ දක්වා සිටි කථානායකවරයා සභාවේ සාමාජිකයකු ලෙස තවදුරටත් ධූරය දැරිය යුත්තේ ය.

(ආ) පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබුව ද, අග්‍රාමාත්‍යවරයා, විරුද්ධ පක්ෂයේ නායකවරයා සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජිකයන් වන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් එකී විසුරුවා හැරීමට පසුව පවත්වනු ලබන මහමැතිවරණයට ඉක්බිතිව අවස්ථාවෝචිත පරිදි අග්‍රාමාත්‍යවරයා ලෙස පත්කරනු ලබන තෙක් හෝ පාර්ලිමේන්තුවේ විරුද්ධ පක්ෂයේ නායකයා ලෙස පිළිගනු ලබන තෙක් හෝ යම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවක් (1) වන අනු ව්‍යවස්ථාවේ (ඈ), (ඉ) හෝ (ඊ) ඡේද යටතේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජිකයන් ලෙස පත් කරනු ලබන තෙක්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජිකයන් ලෙස තවදුරටත් ධූර දැරිය යුත්තාහ.

(8) මේ ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාවේ (ඈ) ඡේදය, (ඉ) ඡේදය සහ (ඊ) ඡේදය යටතේ පත්කරන ලද සභාවේ සෑම සාමාජිකයකු ම විසින්, ජනාධිපතිවරයා අමතා යවන ලිපියක් මගින් ඔහුගේ ධූරයෙන් කලින් ඉල්ලා අස්වුවහොත් හෝ ඔහුට තම ධූරයේ කටයුතු තවදුරටත් කරගෙන යාමට නොහැකි ශාරීරික හෝ මානසික අශක්නුතාවයකට පත්ව ඇති බවට අග්‍රාමාත්‍යවරයා සහ විරුද්ධ පක්ෂයේ නායකවරයා යන දෙදෙනාම මතයක් ඇතිකර ගන්නා අවස්ථාවක ඒ මත ජනාධිපතිවරයා විසින් ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ චරිත දූෂණ වරදක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් විසින් ඔහු වරදකරු කරනු ලැබුවහොත් හෝ ඔහු විෂයෙහි ප්‍රජා අශක්නුතා නියම කිරීමේ යෝජනා සම්මතයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 81 වන ව්‍යවස්ථාවට

අනුකූලව සම්මත කරනු ලැබ ඇත්නම් හෝ 41ඉ ව්‍යවස්ථාවේ (7) වන අනු ව්‍යවස්ථාව යටතේ ඔහු සිය ධූරය හැර ගියාක් සේ සලකනු ලබන්නේ නම් හෝ මිස, එවැනි සාමාජිකයකු වශයෙන් ඔහු පත් කරනු ලැබූ දින සිට අවුරුදු තුනක කාලයක් ධූරය දැරිය යුත්තේ ය.

(9) මේ ව්‍යවස්ථාවේ (1) අනු ව්‍යවස්ථාවේ (ඈ) ඡේදය, (ඉ) ඡේදය හෝ (ඊ) ඡේදය යටතේ පත්කරන ලද සාමාජිකයන් අතර පුරප්පාඩුවක් ඇති වූ විටක, එම පුරප්පාඩුව ඇතිවීමේ දින සිට දින දහ හතරක් ඇතුළත, ඉහත සඳහන් ඡේදයන්හි විධිවිධාන සැලකිල්ලට ගනිමින්, ජනාධිපතිවරයා විසින් ඒ සාමාජිකයා වෙනුවට අනුප්‍රාප්ත වීම පිණිස වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය යුත්තේ ය. එසේ පත් කරනු ලැබූ යම් තැනැත්තෙක්, ඔහු අනුප්‍රාප්ත වන්නේ යම් සාමාජිකයකු වෙනුවට ද ඒ සාමාජිකයාගේ ධූර කාලයෙන් නොගෙවී ඉතිරිව තිබෙන කොටස සඳහා ධූරය දැරිය යුත්තේ ය.

(10) මේ ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාවේ (ඈ) ඡේදය, (ඉ) ඡේදය හෝ (ඊ) ඡේදය යටතේ පත් කරන ලද සාමාජිකයකු, එම ඡේද යටතේ නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙක් නොවන්නේ ය.

(11) මේ ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාවේ (ඈ) ඡේදය, (ඉ) ඡේදය සහ (ඊ) ඡේදය යටතේ ජනාධිපතිවරයා විසින් කරනු ලබන පත්වීම් කථානායකවරයාට දැනුම් දිය යුත්තේ ය.

**සභාව විසින් පත්කිරීම් නිර්දේශ කළ යුතු බව.**

41ආ. (1) මේ ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් යම් කොමිෂන් සභාවක සභාපතිවරයා ලෙස හෝ සාමාජිකයකු ලෙස හෝ ජනාධිපතිවරයා විසින් තැනැත්තකු පත් කිරීම සභාවේ නිර්දේශය මත හැර, නොකරනු ලැබිය යුත්තේ ය.

(2) මේ ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාවේ විධිවිධාන, එකී යම් කොමිෂන් සභාවක සභාපතිවරයා ලෙස හෝ සාමාජිකයකු ලෙස වැඩබැලීම සඳහා පත් කරනු ලැබූ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද අදාළ විය යුත්තේ ය.

(3) මේ ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් කොමිෂන් සභාවල සභාපතිවරුන් ලෙස හෝ සාමාජිකයන් ලෙස පත් කිරීම සඳහා අවස්ථාව එළඹෙන කවර හෝ විටක එසේ පත් කරනු ලැබිය යුතු නිසි සහ යෝග්‍ය තැනැත්තන් ජනාධිපතිවරයා වෙත නිර්දේශ කිරීම සභාවේ කාර්යයක් වන අතර ඒ නිර්දේශවලින් ලිංගික වර්ගීකරණය ඇතුළුව ශ්‍රී ලාංකීය සමාජයේ බහුත්ත්ව ස්වභාවය පිළිබිඹු වන බව වගබලා ගැනීමට ප්‍රයත්න දරනු ලැබිය යුත්තේ ය. ඒ කොමිෂන් සභාවල සභාපතිවරුන් සම්බන්ධයෙන් වන විට, පත් කිරීම සඳහා සභාව විසින් තැනැත්තන් තිදෙනෙකු නිර්දේශ කරනු ලැබිය යුතු අතර, නිර්දේශ කරනු ලැබූ තැනැත්තන්ගෙන් එක් අයෙකු ජනාධිපතිවරයා විසින් සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුත්තේ ය.

(4) පත් කිරීම් සඳහා සභාවේ නිර්දේශය ලැබුණු දින සිට දින දහහතරක් ඇතුළත ජනාධිපතිවරයා විසින්, මේ ව්‍යවස්ථාවේ

උපලේඛනයේ නිශ්චිතව සඳහන් කොමිෂන් සභාවල සභාපතිවරුන් සහ සාමාජිකයන් පත් කරනු ලැබිය යුත්තේ ය.

එකී දින දහහතරක කාල පරිච්ඡේදය තුළ අවශ්‍ය පත් කිරීම් කිරීමට ජනාධිපතිවරයා අපොහොසත්වූ විටක, එකී කාල පරිච්ඡේදය අවසන් වන දින සිට බලපැවැත්වෙන පරිදි :-

(අ) කොමිෂන් සභාවක සාමාජිකන් ලෙස පත්කරනු ලැබිය යුතු බවට (3) වන අනුව්‍යවස්ථාව යටතේ නිර්දේශ කරනු ලැබූ තැනැත්තන් කොමිෂන් සභාවේ සාමාජිකයන් ලෙස පත්කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුත්තේ ය; සහ

(ආ) කොමිෂන් සභාවක සභාපතිවරයා ලෙස පත්කරනු ලැබිය යුතු බවට (3) වන අනුව්‍යවස්ථාව යටතේ නිර්දේශ කරනු ලැබූ නම් සඳහන් ලැයිස්තුවේ පළමුව නම දැක්වෙන තැනැත්තා අදාළ කොමිෂන් සභාවේ සභාපතිවරයා වශයෙන් පත්කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුත්තේ ය.

(5) මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාව යටතේ පත් කරනු ලබන යම් තැනැත්තකු හෝ කොමිෂන් සභාවක සභාපතිවරයාගේ හෝ සාමාජිකයකුගේ වැඩ බැලීම සඳහා පත්කරනු ලබන තැනැත්තකු, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ යම් ලිඛිත නීතියක හෝ විධිවිධානවල සලසා තිබෙන පරිදි හැර ඉවත් කරනු නොලැබිය යුත්තේ ය. එවැනි විධිවිධානයක් නොමැති අවස්ථාවක දී ඒ තැනැත්තා සභාවේ පූර්ව අනුමතය ඇතිව පමණක් ජනාධිපතිවරයා විසින් ඉවත් කරනු ලැබිය යුත්තේ ය.

(6) මැතිවරණ කොමිෂන් සභාව හැර මේ ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් අන් සියලු කොමිෂන් සභා පාර්ලිමේන්තුවට වගකිව යුත්තේ ය. පිළිතුරු දීමට බැඳී සිටිය යුත්තේ ය.

### උපලේඛනය

(අ) මැතිවරණ කොමිෂන් සභාව;

(ආ) රාජ්‍ය සේවා කොමිෂන් සභාව;

(ඇ) ජාතික පොලිස් කොමිෂන් සභාව;

(ඈ) විගණන සේවා කොමිෂන් සභාව;

(ඉ) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව;

(ඊ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාව;

(උ) මුදල් කොමිෂන් සභාව;

(ඌ) සීමා නිර්ණය කොමිෂන් සභාව;

(එ) ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව.

**පත්කිරීම්, සභාව විසින් අනුමත කළ යුතු බව.**

**41ඇ.** (1) ජනාධිපතිවරයා විසින් සභාවට කරන ලද නිර්දේශයක් මත, සභාව විසින් අනුමත කර ඇත්නම් මිස, මේ ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් කිසිම ධූරයකට ජනාධිපතිවරයා විසින් කිසිදු තැනැත්තකු පත් කරනු නොලැබිය යුත්තේ ය.

(2) මේ ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාවේ විධිවිධාන, මේ ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් යම් ධූරයක දින දහහතරකට වැඩි කාලයක් වැඩ බැලීම සඳහා පත් කරනු ලබන යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද අදාළ විය යුත්තේ ය:

එසේම තව ද; දින දහහතරක් නොඉක්මවන අනුක්‍රමික කාලසීමා සඳහා එවැනි කවර හෝ ධූරයක වැඩ බැලීමට යම් තැනැත්තකු පත් කිරීම ජනාධිපතිවරයා විසින් කරන ලද නිර්දේශ මත සභාව විසින් අනුමත කරනු ලැබ ඇත්නම් මිස, නොකළ යුත්තේ ය.

(3) මේ ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් කවර හෝ ධූරයකට පත් කරනු ලැබූ කිසිදු තැනැත්තකු හෝ ඒ ධූරයකට පත් කරන ලද තැනැත්තකු වෙනුවෙන් වැඩ බැලීම සඳහා පත් කරනු ලැබූ කිසිදු තැනැත්තකු, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ යම් ලිඛිත නීතියකින් හෝ විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, එකී ධූරයෙන් ඉවත් කරනු නොලැබිය යුත්තේ ය.

(4) ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන් සහ අභියාචනාධිකරණයේ සභාපතිවරයා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන් පත් කිරීම හා සම්බන්ධ කර්තව්‍ය ඉටු කිරීමේ දී, සභාව විසින් අග්‍ර විනිශ්චයකාරවරයාගේ අදහස් ලබාගත යුතු ය.

## උපලේඛනය

### I වන කොටස

(අ) අග්‍රවිනිශ්චයකාරවරයා සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන්;

(ආ) අභියාචනාධිකරණයේ සභාපතිවරයා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන්;

(ඇ) අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයා හැර අනෙකුත් සාමාජිකයන්.

### II කොටස

(අ) නීතිපතිවරයා;

(ආ) විගණකාධිපතිවරයා;

(ඇ) පොලිස්පතිවරයා;

(ඈ) පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා (ඔම්බුඩ්ස්මන්);

(ඉ) පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා.

**සභාවේ මහ ලේකම්වරයා සහ අනෙකුත් නිලධරයන්.**

**41ඇ.** (1) සභාවට මහ ලේකම්වරයකු සිටිය යුත්තේ ය. මහ ලේකම්වරයා සභාව විසින් අවුරුදු පහක කාලයක් සඳහා පත් කරනු ලැබිය යුත්තේ ය. මහ ලේකම්වරයා ඔහුගේ ධුර කාලය අවසන් වීමෙන් පසු නැවත පත්කරනු ලැබීමට සුදුසු විය යුත්තේ ය.

(2) එහි කාර්ය ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි සභාව විසින් සලකනු ලබන යම් නිලධරයන්, සභාව විසින් නිශ්චය කරනු ලැබිය යුතු නියමයන් සහ කොන්දේසි මත සභාව විසින් පත් කරනු ලැබිය හැක්කේ ය.

**සභාවේ රැස්වීම.**

**41ඉ.** (1) සභාව විසින් සෑම මාසයකම යටත් පිරිසෙයින් දෙවාරයක් ද, එය වෙත මේ පරිච්ඡේදයේ විධිවිධාන මගින් හෝ වෙනත් යම් නීතියක් මගින් හෝ පවරා ඇති කාර්ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි තාක් වාර ගණනක් ද රැස්විය යුතු අතර සභාවේ සභාපතිවරයාගේ විධානය මත සභාවේ මහ ලේකම්වරයා විසින් ඒ රැස්වීම් කැඳවනු ලැබිය යුත්තේ ය.

(2) සභාපතිවරයා, සභාවේ සියලු රැස්වීම්වල මූලාසනය දැරිය යුත්තේය. සභාවේ යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති අවස්ථාවක දී අග්‍රමාත්‍යවරයා ද අග්‍රාමාත්‍යවරයා පැමිණ නොමැති අවස්ථාවක දී විරුද්ධ පක්ෂයේ නායකවරයා විසින් ද සභාවේ රැස්වීම්වල මූලාසනය දැරිය යුත්තේ ය.

(3) සභාවේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් පස් දෙනකුගෙන් සමන්විත විය යුත්තේ ය.

(4) සභාව විසින් කරනු ලැබිය යුතු සෑම නිර්දේශයක් හෝ අනුමත කිරීමක් ද ගනු ලබන සෑම තීරණයක් ද ඒකමතිකව තීරණය කිරීමට සභාව විසින් උත්සාහ දරනු ලැබිය යුත්තේ ය. ඒකමතික තීරණයක් නොමැති අවස්ථාවක දී සභාවේ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් පස් දෙනකුට නොඅඩු සංඛ්‍යාවක් විසින් සනාථ කළහොත් මිස, සභාව විසින් කරන ලද යම් නිර්දේශයක් හෝ අනුමත කිරීමක් හෝ ගනු ලැබූ යම් තීරණයක් හෝ බලසහිත නොවිය යුත්තේ ය.

(5) සභාපතිවරයාට හෝ රැස්වීමේ මූලාසනය දරන වෙනත් සාමාජිකයාට මුල් ඡන්දයක් නොමැති නමුත් සභාවේ යම් රැස්වීමක දී තීරණය කරනු ලැබිය යුතු යම් ප්‍රශ්නයක් සඳහා සම සමව ඡන්දය ලැබුණු අවස්ථාවකදී සභාපතිවරයාට හෝ රැස්වීමේ මූලාසනය දරන වෙනත් සාමාජිකයාට තීරක ඡන්දයක් තිබිය යුත්තේ ය.

(6) 41ආ හෝ 41ඇ ව්‍යවස්ථා යටතේ යම් පත්කිරීමක් සඳහා යෝග්‍ය තැනැත්තන් නිර්දේශ කිරීමේ දී හෝ අනුමත කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය ද ඇතුළුව සභාවේ රැස්වීම් සහ ඒ රැස්වීම්වලදී කටයුතු කරන ආකාරය සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සභාව විසින් තීරණය කරනු ලැබිය යුත්තේ ය.

(7) 41අ ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාවේ (ඈ), (ඉ) හෝ (ඊ) ඡේද යටතේ පත් කරනු ලැබූ සභාවේ යම් සාමාජිකයකු සභාවේ පූර්ව අවසරය ලබා නොගෙන සභාවේ අනුක්‍රමික රැස්වීම් තුනකට නොපැමිණ සිටි අවස්ථාවක දී ඒ සාමාජිකයා ඒ තෙවන රැස්වීමේ දින සිට බලාත්මක වන පරිදි ධූරය අත්හරිනු ලැබුවාක් සේ සැලකිය යුත්තේ ය.

(8) සභාව පූර්ණ වශයෙන් සංස්ථාපිත නොවුවද, සභාවේ සාමාජිකත්වයේ පුරප්පාඩුවක් තිබුන ද ඒ බව නොතකා ක්‍රියාකිරීමට සභාවට බලය ඇති අතර සභාව පූර්ණ වශයෙන් සංස්ථාපිත නොවීමේ හේතුව හෝ සභාවේ සාමාජිකත්වයේ පුරප්පාඩුවක් තිබීමේ හේතුව හෝ නිසාම පමණක් සභාවේ යම් ක්‍රියාවක්, කෘත්‍යයක් හෝ තීරණයක් අවලංගු නොවන්නේය. අවලංගු වන ලෙස නොසැලකිය යුත්තේ ය.

සභාවේ සාමාජිකයන් තවදුරටත් ධූර දැරීම.

**41ඊ.** සභාවේ සාමාජිකයන්ගේ හෝ 41ආ ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් යම් කොමිෂන් සභාවක සාමාජිකයන්ගේ හෝ ධූර කාල ඉකුත්වීම නොතකා අවස්ථාවෝචිත පරිදි සභාවේ හෝ ඒ වෙනත් කොමිෂන් සභාවල හෝ අලුත් සාමාජිකයන් ධූර භාරගන්නා තෙක් ඒ දක්වා සිටි සභාවේ හෝ ඒ වෙනත් කොමිෂන් සභාවල සාමාජිකයෝ තවදුරටත් ධූර දැරිය යුත්තාහ.

සභාවේ බලතල හා කාර්ය.

**41උ.** (1) සභාව විසින් සෑම මාස තුනකට වරක් ඊට පෙරාතුව වූ මාස තුන තුළ එහි කටයුතු පිළිබඳව වාර්තාවක් ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුත්තේ ය.

(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හෝ වෙනත් යම් ලිඛිත නීතියකින් පනවනු ලැබිය හැකි පරිදි වූ හෝ පවරනු ලැබිය හැකි පරිදි වූ වෙනත් කාර්ය සහ කර්තව්‍ය සභාව විසින් ක්‍රියාත්මක කිරීම ද ඉටු කිරීමද කරනු ලැබිය යුත්තේ ය.

(3) ස්වකීය කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීමට අදාළව රීති සෑදීමට සභාවට බලය ඇත්තේ ය. එකී සියළු රීති ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර එකී පළ කිරීමෙන් මාස තුනක් ඇතුළත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුත්තේ ය.

සභාවේ වියදම් ඒකාබද්ධ අරමුදලට වැයබරක් විය යුතු බව.

**41ඌ.** සභාව විසින් දරනු ලබන වියදම් ඒකාබද්ධ අරමුදලට වැයබරක් විය යුත්තේ ය.

සභාවේ තීරණවල අවසානාත්මක භාවය.

**41එ.** 126 වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව, සභාව විසින් එළඹෙන ලද යම් තීරණයක් හෝ කරන ලද යම් අනුමත කිරීමක් හෝ නිර්දේශයක් භාර ගැනීමට, විභාග කිරීමට ඒ පිළිබඳ තීරණයක් දීමට හෝ කවර වූ හේතුවක් මත හෝ කවර වූ හෝ අන්‍යාකාරයකින් ප්‍රශ්න කිරීමට, කිසිදු අධිකරණයකට බලය හෝ අධිකරණ බලය නොමැති විය යුත්තේ ය. එකී තීරණය, අනුමතය හෝ නිර්දේශය සියලු කාර්ය සඳහා අවසානාත්මක හා තීරණාත්මක විය යුත්තේ ය. ]

## [30] [ VIII වැනි පරිච්ඡේදය

### විධායකය

### අමාත්‍ය මණ්ඩලය

**අග්‍රාමාත්‍යවරයා සහ අමාත්‍ය මණ්ඩලය.**

**42.** (1) ජනරජයේ ආණ්ඩුවේ පාලනය මෙහෙයවීම සහ ඒ පාලනය පිළිබඳ විධානය භාර අමාත්‍ය මණ්ඩලයක් වන්නේ ය.

(2) අමාත්‍ය මණ්ඩලය පාර්ලිමේන්තුවට සාමූහිකව වගකීමට සහ පිළිතුරු බැඳීමට බැඳී සිටින්නේ ය.

(3) ජනාධිපතිවරයා අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයෙක් ද අමාත්‍ය මණ්ඩලයේ ප්‍රධානයා ද වන්නේ ය.

(4) ජනාධිපතිවරයාගේ මතය අනුව පාර්ලිමේන්තුවේ විශ්වාසය උපරිම වශයෙන් ඇති පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා ජනාධිපතිවරයා විසින් අග්‍රාමාත්‍යවරයා ලෙස පත් කරනු ලැබිය යුත්තේ ය.

**අමාත්‍යවරයන් සහ ඔවුන්ගේ විෂය සහ කාර්ය.**

**43.** (1) අග්‍රාමාත්‍යවරයාගේ අදහස් විමසීම අවශ්‍යයැයි ජනාධිපතිවරයා සලකන අවස්ථාවන්හි අග්‍රාමාත්‍යවරයාගේ අදහස් ද විමසා, ජනාධිපතිවරයා විසින් අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන්ගේ සංඛ්‍යාව ද අමාත්‍යාංශ සංඛ්‍යාව ද ඒ අමාත්‍යවරයන්ට පවරන විෂය සහ කාර්ය ද නිශ්චය කළ යුත්තේ ය.

(2) ජනාධිපතිවරයා විසින් එසේ නිශ්චය කරනු ලබන අමාත්‍යාංශ භාරව කටයුතු කිරීම සඳහා අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් මත, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් අතුරෙන් අමාත්‍යවරයන් පත් කළ යුත්තේ ය.

(3) ජනාධිපතිවරයා විසින් කවර අවස්ථාවක දී වුව ද, අමාත්‍ය මණ්ඩලය වෙත පවරන ලද විෂය සහ කාර්ය වෙනස් කිරීම සහ අමාත්‍ය මණ්ඩලයේ සංයුතිය වෙනස් කිරීම ද කරනු ලැබිය හැක්කේ ය. අමාත්‍ය මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට සහ පාර්ලිමේන්තුව වෙත අමාත්‍ය මණ්ඩලය දරන වගකීමේ අඛණ්ඩ පැවැත්මට එවැනි වෙනස් කිරීමක් බල නොපාන්නේ ය.

**අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන අමාත්‍යවරයන්.**

**44.** (1) ජනාධිපතිවරයා විසින් අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් මත, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයන් අතුරෙන් අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන අමාත්‍යවරයන් පත් කරනු ලැබිය හැක්කේ ය.

(2) අග්‍රාමාත්‍යවරයාගේ අදහස් විමසීම අවශ්‍යයැයි ජනාධිපතිවරයා සලකන අවස්ථාවන්හි අග්‍රාමාත්‍යවරයාගේ අදහස් ද විමසා, ජනාධිපතිවරයා විසින්, මේ ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාව යටතේ පත් කරනු ලබන අමාත්‍යවරයන්ට පැවරිය යුතු විෂය සහ කාර්ය ද ඔවුන්ට යම් අමාත්‍යාංශ භාර කරන්නේ නම් ඒ අමාත්‍යාංශ ද නිශ්චය කරනු ලැබිය හැක්කේ ය.

---

30 - දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 9 වැනි වගන්තිය මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මුල් VIII පරිච්ඡේදය ඉවත් කර ඒ වෙනුවට ඇතුළත් කරන ලදී.

(3) ජනාධිපතිවරයා විසින්, මේ ව්‍යවස්ථාවේ (2)වන අනු ව්‍යවස්ථාව යටතේ කරන යම් භාර කිරීමක් කවර වූ හෝ විටක වෙනස් කරනු ලැබිය හැක්කේ ය.

(4) (1) වන අනු ව්‍යවස්ථාව යටතේ පත්කරනු ලබන සෑම අමාත්‍යවරයෙක්ම අමාත්‍ය මණ්ඩලයට සහ පාර්ලිමේන්තුවට වගකීමට බැඳී සිටින්නේ ය.

(5) අමාත්‍ය මණ්ඩලයේ කවර වූ හෝ අමාත්‍යවරයකු විසින් ඔහු වෙත පැවරී ඇති යම් විෂයයකට හෝ කාර්යයකට අදාළ යම් බලතල කිසිවක් හෝ කාර්යයක් හෝ යම් කිසි ලිඛිත නීතියකින් ඔහුට පැවරී ඇත්තා වූ හෝ නියම වී ඇත්තා වූ යම් බලතල කිසිවක් හෝ කාර්යයක් ගැසට් පත්‍රයේ පළකරනු ලබන නිවේදනයක් මගින් අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයකු නොවන අමාත්‍යවරයකුට පවරා දිය හැකි අතර අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයාට එකී බලතල කිසිවක් හෝ කාර්යයක් පවරන්නා වූ හෝ නියම කරන්නා වූ ලිඛිත නීතියේ පටහැනිව කුමක් සඳහන් වුව ද මේ අනු ව්‍යවස්ථාව යටතේ එකී වෙනත් අමාත්‍යවරයා වෙත පවරා දෙනු ලැබූ යම් බලතල කිසිවක් හෝ කාර්යයක් ඔහු විසින් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

**45.** (1) ජනාධිපතිවරයා විසින්, අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් මත, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන්ට ඔවුන්ගේ කාර්ය ඉටු කිරීමෙහි ලා සහාය වීම පිණිස පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයන් අතුරෙන් නියෝජ්‍ය අමාත්‍යවරයන් පත් කරනු ලැබිය හැක්කේ ය. නියෝජ්‍ය අමාත්‍යවරයන්.

(2) අමාත්‍ය මණ්ඩලයේ කවර හෝ අමාත්‍යවරයකු විසින්, ඔහු වෙත පවරා ඇති යම් විෂයයකට හෝ කාර්යයකට අදාළ යම් බලයක් හෝ කාර්යයක් හෝ යම් කිසි ලිඛිත නීතියකින් ඔහු වෙත පැවරී ඇත්තාවූ හෝ නියම කරනු ලැබ ඇත්තා වූ බලතල කිසිවක් හෝ කාර්යයක්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින් තම නියෝජ්‍ය අමාත්‍යවරයාට පවරා දිය හැකි අතර එකී අමාත්‍යවරයාට එකී බලය හෝ කාර්යය පවරන්නා වූ හෝ නියම කරන්නා වූ ලිඛිත නීතියේ පටහැනිව කුමක් සඳහන් වී තිබුන ද එකී නියෝජ්‍ය අමාත්‍යවරයා විසින්, එසේ පවරා දෙනු ලැබූ යම් බලයක් හෝ කාර්යයක් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

**46.**(1) (අ) අමාත්‍ය මණ්ඩලයේ මුළු අමාත්‍යවරයන් සංඛ්‍යාව තිහ නොඉක්මවිය යුතු ය; අග්‍රාමාත්‍යවරයාගේ ධුර කාලය සහ අමාත්‍යවරයන්ගේ සහ නියෝජ්‍ය අමාත්‍යවරයන්ගේ සංඛ්‍යාව සහ ධුර කාලය සීමා කිරීම.

(ආ) අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන අමාත්‍යවරයන්ගේ සහ නියෝජ්‍ය අමාත්‍යවරයන්ගේ සංඛ්‍යාවේ එකතුව හතළිහ නොඉක්මවිය යුතු ය.

(2) අග්‍රාමාත්‍යවරයා -

(අ) ස්වකීය අත්සන යටතේ ජනාධිපතිවරයා වෙත

යවන ලිපියක් මගින් ස්වකීය ධූරයෙන් ඉල්ලා අස්වුවහොත්; හෝ

(ආ) තවදුරටත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු නොවුවහොත්; හෝ

මිස, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ යම් තාක් කල් අමාත්‍ය මණ්ඩලය පවත්නේ ද ඒ තාක් කල් ස්වකීය ධූරය දරන්නේ ය.

(3) අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයෙක්, අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයකු නොවන අමාත්‍යවරයෙක් හෝ නියෝජ්‍ය අමාත්‍යවරයෙක් -

(අ) අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් මත ජනාධිපතිවරයාගේ අත්සන යටතේ යවනු ලබන ලිපියක් මගින්, ඉවත් කරනු ලැබුවහොත්; හෝ

(ආ) ස්වකීය අත්සන යටතේ ජනාධිපතිවරයා වෙත යොමු කරනු ලබන ලිපියක් මගින් ස්වකීය ධූරයෙන් ඉල්ලා අස්වුවහොත්; හෝ

(ඇ) තවදුරටත් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු නොවුවහොත් හෝ,

මිස, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ යම් තාක් කල් අමාත්‍ය මණ්ඩලය පවතින්නේ ද ඒතාක් කල් ස්වකීය ධූරය දරන්නේ ය.

(4) (1) වන අනු ව්‍යවස්ථාවේ කුමක් සඳහන් වුවද, පාර්ලිමේන්තුවේ වැඩිම ආසන සංඛ්‍යාවක් ලබාගන්නා පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම හෝ විසින් ජාතික ආණ්ඩුවක් පිහිටුවන අවස්ථාවේ දී අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන් සංඛ්‍යාව ද අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන අමාත්‍යවරයන් සංඛ්‍යාව ද නියෝජ්‍ය අමාත්‍යවරයන් සංඛ්‍යාව ද පාර්ලිමේන්තුව විසින් තීරණය කළ යුත්තේ ය.

(5) (4) වන අනු ව්‍යවස්ථාවේ කාර්යය සඳහා ජාතික ආණ්ඩුවක් යනු, පාර්ලිමේන්තුවේ වැඩිම ආසන සංඛ්‍යාව ලබාගන්නා පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම සහ පාර්ලිමේන්තුවේ අනෙකුත් පිළිගත් දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම් එකතුව පිහිටුවනු ලබන ආණ්ඩුවක් වන්නේ ය.

**පාර්ලිමේන්තුව විසුරුවා ඇති කාලය තුළ අමාත්‍ය මණ්ඩලය.**

**47.** (1) පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලබන තෙක් ක්‍රියාකළ අමාත්‍ය මණ්ඩලය පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබුව ද, දිගටම ක්‍රියා කළ යුතු අතර මහ මැතිවරණය අවසාන වූ විට, එසේ ක්‍රියා කිරීම නතර කළ යුත්තේ ය. ඒ අනුව අග්‍රාමාත්‍යවරයා ද අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයෝ ද 46 වන ව්‍යවස්ථාවේ (2) වන අනු ව්‍යවස්ථාවේ (අ) ඡේදයේ සහ (3) වන අනු ව්‍යවස්ථාවේ (අ) ඡේදයේ හෝ (ආ) ඡේදයේ විධිවිධාන සලසා ඇති පරිදි ධූර දැරීම නතර වුවහොත් මිස, දිගටම

ක්‍රියා කළ යුතු අතර එසේ ධුර දැරීමේ දී ඔවුන් විසින් මැතිවරණ කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන නිර්නායකයන් පිළිපදිමින් මැතිවරණයට අයුතු ලෙස බලපෑමක් නොවන පරිද්දෙන් ක්‍රියා කළ යුත්තේ ය.

(2) පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබීමත් මහ මැතිවරණය අවසාන වීමත් අතර කාලය තුළ අග්‍රාමාත්‍යවරයා මිය ගියේ වුව ද, ධූරයෙන් ඉවත් කරනු ලැබුවේ වුව ද, අස්වූයේ වුව ද, අමාත්‍ය මණ්ඩලය, අමාත්‍ය මණ්ඩලයේ අනෙකුත් අමාත්‍යවරයන්ගෙන් සමන්විතව මහ මැතිවරණය අවසාන වන තෙක් ක්‍රියා කළ යුත්තේ ය. තව ද අග්‍රාමාත්‍යවරයාගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සඳහා සහ ඉටු කිරීම සඳහා ජනාධිපතිවරයා විසින් එකී අමාත්‍යවරයන් අතුරෙන් යම් අමාත්‍යවරයකු පත්කරනු ලැබිය හැක්කේ ය.

(3) පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබීමත් මහ මැතිවරණය අවසාන වීමත් අතර කාලය තුළ අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකු මිය ගිය විට හෝ ධූරයෙන් ඉවත් කරනු ලැබූ විට හෝ ඉල්ලා අස්වූ විට ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය භාරව කටයුතු කිරීම හෝ ඒ අමාත්‍යවරයාගේ බලතල, කාර්ය සහ කවර වූ හෝ අමාත්‍යවරයකු ජනාධිපතිවරයා විසින් අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් මත පත් කරනු ලැබිය හැක්කේ ය.

**අමාත්‍ය මණ්ඩලය විසිරීම.**

48. (1) පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබීමත් මහ මැතිවරණය අවසාන වීමත් අතර කාලය තුළ හැර, ධූරයෙන් ඉවත් කරනු ලැබීමෙන් හෝ ඉල්ලා අස්වීමෙන් හෝ අන්‍යාකාරයකින් හෝ අග්‍රාමාත්‍යවරයා ධූරය දැරීම නතර වූ විට, 70 වන ව්‍යවස්ථාව යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කරමින් ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව විසුරුවා හැර ඇතොත් මිස, අමාත්‍ය මණ්ඩලය විසිරෙන්නේය. එසේ වූ විට ජනාධිපතිවරයා විසින් 42 වන, 43 වන, 44 වන සහ 45 වන ව්‍යවස්ථා අනුව අග්‍රාමාත්‍යවරයකු ද, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන් ද, අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන අමාත්‍යවරයන් ද, නියෝජ්‍ය අමාත්‍යවරයන්ද පත් කළ යුත්තේ ය ඃ

එසේ වුව ද, ඉහත කී පරිදි අග්‍රාමාත්‍යවරයා ධූරය දැරීම නතර වීමෙන් පසුව පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබුවහොත්, අමාත්‍ය මණ්ඩලය, අමාත්‍ය මණ්ඩලයේ අනෙකුත් අමාත්‍යවරයන්ගෙන් සමන්විතව මහ මැතිවරණය අවසාන වන තෙක් ක්‍රියා කළ යුත්තේ ය. තව ද අග්‍රාමාත්‍යවරයාගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සඳහා සහ ඉටු කිරීම සඳහා ජනාධිපතිවරයා විසින් එකී අමාත්‍යවරයන් අතුරෙන් යම් අමාත්‍යවරයකු පත් කරනු ලැබිය හැක්කේ ය. තවද 47 වන ව්‍යවස්ථාවේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව මේ සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

(2) පාර්ලිමේන්තුව විසින් ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශය හෝ විසර්ජන පනත් කෙටුම්පත හෝ ප්‍රතික්ෂේප කළ හොත් එවිට ද ආණ්ඩුව කෙරෙහි විශ්වාස භංග යෝජනාවක් සම්මත කළ හොත් එවිට ද අමාත්‍ය මණ්ඩලය විසිරෙන්නේ ය. එසේ වූ විට 70 වන ව්‍යවස්ථාව යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කරමින් ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබුවහොත් මිස, ජනාධිපතිවරයා විසින් 42 වන, 43 වන, 44 වන සහ 45 වන ව්‍යවස්ථා අනුව අග්‍රාමාත්‍යවරයෙක් ද, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන් ද, අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන අමාත්‍යවරයන් ද, නියෝජ්‍ය අමාත්‍යවරයන් ද පත් කළ යුත්තේ ය.

වැඩබලන අමාත්‍යවරයන් සහ නියෝජ්‍ය අමාත්‍යවරයන්.

**49.** අමාත්‍ය මණ්ඩලයේ යම් කිසි අමාත්‍යවරයකුට හෝ අමාත්‍ය මණ්ඩලයේ සාමාජියකු නොවන අමාත්‍යවරයකුට හෝ නියෝජ්‍ය අමාත්‍යවරයකුට හෝ ඔහුගේ ධූරයේ කාර්ය ඉටුකිරීමට නොහැකි වුවහොත් එවිට එකී අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයාගේ හෝ අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයකු නොවන අමාත්‍යවරයාගේ හෝ නියෝජ්‍ය අමාත්‍යවරයාගේ ධූරයේ වැඩ බැලීම සඳහා ජනාධිපතිවරයා විසින් අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් මත පාර්ලිමේන්තුවේ කවර වූ හෝ මන්ත්‍රීවරයකු පත් කිරීම කළ හැකි වන්නේ ය.

අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයා.

**50.** (1) අමාත්‍ය මණ්ඩලයට ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු ලේකම්වරයෙක් වන්නේය.

(2) ජනාධිපතිවරයාගේ විධානයන්ට යටත්ව අමාත්‍ය මණ්ඩලයේ කාර්යාලය භාරව කටයුතු කිරීමත් ජනාධිපතිවරයා විසින් හෝ අමාත්‍ය මණ්ඩලය විසින් හෝ ඔහුට පවරනු ලබන්නා වූ වෙනත් යම් කර්තව්‍ය හෝ කාර්ය ඉටුකිරීමත්, කිරීමත් ලේකම්වරයා විසින් කරනු ලැබිය යුත්තේ ය.

අග්‍රාමාත්‍යවරයාගේ ලේකම්වරයා.

**51.** (1) අග්‍රාමාත්‍යවරයාට, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු ලේකම්වරයෙක් වන්නේ ය.

(2) අග්‍රාමාත්‍යවරයාගේ කාර්යාලය භාරව කටයුතු කිරීමත් අග්‍රාමාත්‍යවරයාගේ විධානයන්ට යටත්ව ඔහුගේ ධූරයේ කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීම හා කිරීමත් ලේකම්වරයා විසින් කළ යුත්තේ ය.

අමාත්‍යාංශයන්හි ලේකම්වරයන්.

**52.** (1) අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකුගේ සෑම අමාත්‍යාංශයක් ම සඳහා ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු ලේකම්වරයෙක් වන්නේ ය.

(2) අමාත්‍යාංශයක ලේකම්වරයා ඔහුගේ අමාත්‍යවරයා භාරයේ ඇති ආණ්ඩුවේ දෙපාර්තමේන්තු ද වෙනත් ආයතන ද අමාත්‍යවරයාගේ විධානයට හා පාලනයට යටත්ව මෙහෙය වන්නේ ය.

(3) අමාත්‍යාංශයක ලේකම්වරයා ධූරය දැරීම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ අමාත්‍ය මණ්ඩලය විසිර ගිය විට හෝ ඒ අමාත්‍යාංශයේ පැවැත්ම නතරවීමේ ප්‍රතිඵලය ඇති තීරණයක්

43 වන ව්‍යවස්ථාව හෝ 44 වන ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයා විසින් කරනු ලැබූ විටක හෝ නතර විය යුත්තේ ය.

(4) මේ ව්‍යවස්ථාවේ කාර්ය සඳහා ජනාධිපතිවරයාගේ ලේකම්වරයාගේ ධූරය, අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයාගේ ධූරය, විගණකාධිපතිවරයාගේ ධූරය, පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයාගේ (ඔම්බුඩ්ස්මන්) ධූරය, පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ ධූරය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව සහ 41ආ ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් කොමිෂන් සභා ආණ්ඩුවේ දෙපාර්තමේන්තු ලෙස නොසැලකිය යුත්තේ ය.

**නිල ප්‍රතිඥාව සහ දිවුරුම.**

53. මේ පරිච්ඡේදයේ දැක්වෙන යම් කිසි ධූරයකට පත් කරනු ලැබූ සෑම තැනැත්තකුම ඔහු හතරවන උපලේඛනයේ සහ හත්වන උපලේඛනයේ දැක්වෙන ප්‍රතිඥාව දී ඊට අත්සන් තබන්නේ නම් මිස හෝ දිවුරුම් දී ඊට අත්සන් තබන්නේ නම් මිස ස්වකීය ධූරයට අයත් කාර්යන්හි නොයෙදිය යුත්තේ ය. ]

## [31] [IX වැනි පරිච්ඡේදය

### විධායකය

### රාජ්‍ය සේවය

රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

**54.** [32][ (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් නව දෙනෙකුගෙන් සමන්විත (මේ පරිච්ඡේදයෙහි "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) රාජ්‍ය සේවා කොමිෂන් සභාවක් විය යුත්තේ ය. ඒ සාමාජිකයන් අතුරෙන් සාමාජිකයන් තිදෙනකුට නොඅඩු සංඛ්‍යාවක් රජයේ නිලධරයන් වශයෙන් අවුරුදු පහළොවකට වැඩි පළපුරුද්දක් ඇති තැනැත්තන් විය යුත්තාහ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් එක් සාමාජිකයකු එහි සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුත්තේ ය.]

(2) යම් තැනැත්තෙක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම් හෝ ඒ මන්ත්‍රීවරයකු හෝ සභිකයකු බවට පත් වුවහොත් හෝ ඒ තැනැත්තා කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස පත් කිරීම හෝ එසේ සාමාජිකයකු ලෙස තවදුරටත් කටයුතු කරගෙන යාම හෝ නොකළ යුත්තේ ය.

(3) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස පත්කර ගනු ලැබීමට පෙරාතුවම රාජ්‍ය සේවයේ රජයේ නිලධරයකු වූ හෝ අධිකරණ නිලධරයකුව සිටි සෑම තැනැත්තෙක්ම එම ධුරය දැරීම ඉහත කී පත්වීම බලාත්මක වූ විට නතර වන අතර රාජ්‍ය නිලධරයකු හෝ අධිකරණ නිලධරයකු ලෙස තවදුරටත් පත් කරනු ලැබීමට ඒ තැනැත්තා සුදුස්සෙක් නොවන්නේ ය:

එසේ වුව ද, එවැනි යම් තැනැත්තෙක් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයකුව සිටීම නතර වන තෙක් හෝ අවස්ථාවෝචිත පරිදි ඔහු රාජ්‍ය නිලධරයකුව හෝ අධිකරණ නිලධරයකුව සිටියේ නම් ඒ සේවයෙන් ඔහු විශ්‍රාම ගත යුතු වයසට එළඹීම ඒ තැනැත්තා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකත්වය දරද්දී සිදු වුවහොත් හෝ ඒ තැනැත්තාගේ ඒ සේවය වෙනුවෙන් ප්‍රදානය කරනු ලැබිය යුතු විශ්‍රාම වැටුප්, පාරිතෝෂික දීමනා හෝ වෙනත් දීමනාවකට අදාළ විධිවිධානයක කාර්ය සඳහා අවස්ථාවෝචිත පරිදි, ඒ තැනැත්තා රාජ්‍ය නිලධරයකු හෝ අධිකරණ නිලධරයකු ලෙස ද, රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් හිමි ධුරයක් දරන්නකු ලෙස ද, සලකනු ලැබිය යුත්තේ ය.

[33] [(4) කොමිෂන් සභාවේ සාමාජිකයකු මේ ව්‍යවස්ථාවේ (2) වන අනු ව්‍යවස්ථාව යටතේ නුසුදුසුවීමකට පාත්‍ර වුවහොත් හෝ

---

31 - දහහත් වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 4 වැනි වගන්තිය මගින් මුල් IX වැනි පරිච්ඡේදය ඉවත් කොට ඒ වෙනුවට ආදේශ කරන ලදී.

32 - දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 10(1) වැනි වගන්තිය මගින් මුල් සංශෝධිත 54(1) වැනි අනුව්‍යවස්ථාව ඉවත් කොට ඒ වෙනුවට ආදේශ කරන ලදී.

33 - දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 10(2) වැනි වගන්තිය මගින් මුල් 54(4) වැනි අනුව්‍යවස්ථාව ඉවත් කොට ඒ වෙනුවට ආදේශ කරන ලදී.

ජනාධිපතිවරයා අමතා යවන ලියවිල්ලක් මගින්, නියමිත දිනට පෙරාතුව ධූරයෙන් ඉල්ලා අස් වුවහොත් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතය ඇතිව ජනාධිපතිවරයා විසින් ධූරයෙන් ඉවත් කරනු ලැබුව හොත් හෝ චරිත දූෂණ වරදක් සම්බන්ධව අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබුවහොත් හෝ ඔහු ප්‍රජා අශක්නුතාවන්ට යටත් කළ යුතු බවට යෝජනා සම්මතයක් 81 වන ව්‍යවස්ථාව යටතේ සම්මත කොට ඇත්නම් හෝ මේ ව්‍යවස්ථාවේ (6) වන අනු ව්‍යවස්ථාව යටතේ ධූරය හැරයන ලද සේ සලකනු ලැබුවහොත් හෝ මිස, ඔහු පත්කරනු ලැබූ දින සිට අවුරුදු තුනක කාලයක් ධූර දැරිය යුත්තේ ය.]

(5) කොමිෂන් සභාවේ සාමාජිකයකු ඒ කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු වන නමුත් සාමාජිකයකු වශයෙන් ඔහුගේ ධූර කාලය ඉකුත් වීමෙන් පසුව රජයේ නිලධරයකු ලෙස හෝ අධිකරණ නිලධරයකු ලෙස නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙක් නොවන්නේ ය. කිසිම සාමාජිකයකු ධූර කාල සීමා දෙකකට වඩා කොමිෂන් සභාවේ ධූරය දැරීමට සුදුස්සෙක් නොවන්නේ ය.

(6) කොමිෂන් සභාවේ පූර්ව අවසරය ලබා නොගෙන කොමිෂන් සභාවේ අනුකමික රැස්වීම් තුනකට පැමිණ නොසිටින සාමාජිකයකු ඒ තුන්වන රැස්වීමේ දින සිට බලපවත්වන පරිදි ධූරය අත්හැර යනු ලැබුවාක් සේ සැලකිය යුතු අතර ඉන් පසුව කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙක් නොවන්නේ ය.

[34] [ (7) ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාවේ සාමාජිකයකුට මාස දෙකක් නොඉක්මවන කාලයකට කොමිෂන් සභාවට අදාළ කාර්යවලින් නිවාඩු දෙනු ලැබිය හැකි අතර, කොමිෂන් සභාවේ සාමාජිකයකු වීමට සුදුසුකම් ඇති තැනැත්තකු, ඒ නිවාඩු කාලය සඳහා තාවකාලික සාමාජිකයකු වශයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත පත්කරනු ලැබිය යුත්තේ ය.]

(8) කොමිෂන් සභාවේ සාමාජිකයකුට පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමික ගෙවිය යුත්තේ ය. කොමිෂන් සභාවේ සාමාජිකයකුට ගෙවන පාරිශ්‍රමික ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන්නේ ය. ඒ පාරිශ්‍රමික ඒ සාමාජිකයාගේ ධූර කාලය තුළ අඩු නොකළ යුත්තේ ය.

(9) කොමිෂන් සභාවේ යම් සාමාජික ධූරයක් හිස්ව තිබුණ ද, ඒ නොතකා ක්‍රියා කිරීමට කොමිෂන් සභාවට බලය ඇත්තේ ය. තව ද, එවැනි යම් පුරප්පාඩුවක් හෝ යම් සාමාජිකයකු පත් කිරීමෙහි ලා යම් දෝෂයක් හෝ තිබූ පමණින්, කොමිෂන් සභාවේ යම් කියාවක් හෝ කටයුත්තක් හෝ තීරණයක් නිර්බල නොවන්නේ ය; නිර්බල වන්නාක් සේ නොසැලකිය යුත්තේ ය.

---

34 - දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 10(3) වැනි වගන්තිය මගින් කලින් තිබූ 54(7) වැනි අනුව්‍යවස්ථාව ඉවත් කොට ඒ වෙනුවට ආදේශ කරන ලදී.

(10) කොමිෂන් සභාවට ලේකම්වරයකු සිටිය යුතු අතර ඒ ලේකම්වරයා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය යුත්තේ ය.

(11) කොමිෂන් සභාවේ සාමාජිකයකු දණ්ඩ නීති සංග්‍රහයේ IX වැනි පරිච්ඡේදයේ කාර්ය සඳහා රජයේ සේවකයකු ලෙස සලකනු ලැබිය යුත්තේ ය.

**අමාත්‍ය මණ්ඩලයේ සහ කොමිෂන් සභාවේ බලතල සහ කර්තව්‍ය.**

[35] [**55.** (1) අමාත්‍ය මණ්ඩලය විසින්, රජයේ නිලධරයන් පත්කිරීම, උසස් කිරීම, මාරු කිරීම, ඔවුන් විෂයයෙහි විනය පාලනය සහ ඔවුන් සේවයෙන් පහ කිරීම ඇතුළු, රජයේ නිලධරයන්ට අදාළ සියලු ප්‍රතිපත්තිමය කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්විය යුත්තේ ය.

(2) සියලු දෙපාර්තමේන්තු ප්‍රධානීන් පත්කිරීම, උසස් කිරීම, මාරු කිරීම, ඔවුන් විෂයයෙහි විනය පාලනය සහ ඔවුන් සේවයෙන් පහකිරීම අමාත්‍ය මණ්ඩලය වෙත පැවරෙන්නේ ය.

(3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව, රජයේ නිලධරයන් පත්කිරීම, උසස් කිරීම, මාරු කිරීම, ඔවුන් විෂයයෙහි විනය පාලනය සහ ඔවුන් සේවයෙන් පහ කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පැවරෙන්නේ ය.

(4) නීතියෙන් පිහිටුවන ලද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවල බලතල සහ කර්තව්‍ය කොමිෂන් සභාව විසින් හීන කරනු නොලැබිය යුත්තේ ය.

(5) කොමිෂන් සභාවේ බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවලට අනුකූලව කොමිෂන් සභාව පාර්ලිමේන්තුවට වගකිව යුතු සහ උත්තර දිය යුතු අතර, එක් එක් ලිත් වර්ෂයේ දී සිදු කරන ලද ස්වකීය කටයුතු පිළිබඳ වාර්තාවක් ඒ වර්ෂය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුත්තේ ය.]

**කොමිෂන් සභාවේ කමිටු.**

**56.**(1) [36][කොමිෂන් සභාව විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන] රාජ්‍ය සේවයේ යම් නිලධර ගණවලට අයත් නිලධරයන් පත් කිරීමේ, උසස් කිරීමේ, ස්ථාන මාරු කිරීමේ, ඔවුන් විෂයයෙහි විනය පාලනය කිරීමේ සහ සේවයෙන් පහ කිරීමේ බලතල කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන කොමිෂන් සභාවේ සාමාජිකයන් නොවන තැනැත්තන් තිදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් වෙත කොමිෂන් සභාව විසින් පවරනු ලැබිය හැක්කේ ය.

(2) එවැනි යම් කමිටුවක් පත් කිරීම, කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමට සැලැස්විය යුත්තේ ය.

---

35 - දහඅට වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 8 වැනි වගන්තිය මගින් මුල් 55 වැනි ව්‍යවස්ථාව වෙනුවට ආදේශ කරන ලදී.

36 - දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 11 වැනි වගන්තිය "අමාත්‍ය මණ්ඩලය විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන" යන වචන වෙනුවට ආදේශ කරන ලදී.

(3) එවැනි කමිටුවක රැස්වීම්වල කාර්ය පටිපාටිය සහ රැස්වීමක් සඳහා ගණපූරණය, කොමිෂන් සභාව විසින් තත්කාර්යය සඳහා සාදනු ලබන රීතිවලින් නිශ්චය කරනු ලබන පරිදි විය යුත්තේ ය. කොමිෂන් සභාව විසින් ඒ රීති, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමට සැලැස්විය යුත්තේ ය.

(4) ඒ එක් එක් කමිටුවකට ලේකම්වරයකු සිටිය යුතු අතර ඒ ලේකම්වරයා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය යුත්තේ ය.

**රජයේ නිලධරයකු වෙත බලතල පැවරීම.**

**57.**(1) [37] [ කොමිෂන් සභාව විසින් නිශ්චිතව නියම කරන ] යම් ගණයක රජයේ නිලධරයන් පත් කිරීමේ, උසස් කිරීමේ, ස්ථාන මාරු කිරීමේ, ඔවුන් විෂයයෙහි විනය පාලනය කිරීමේ සහ සේවයෙන් පහ කිරීමේ බලතල කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි යම් කොන්දේසි හා කාර්ය පටිපාටිවලට යටත්ව කොමිෂන් සභාව විසින් රාජ්‍ය නිලධරයකුට පවරා දෙනු ලැබිය හැක්කේ ය.

(2) එවැනි යම් පවරා දීමක්, තත් කාර්යය සඳහා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන කොන්දේසි හා කාර්ය පටිපාටි ද ඇතුළුව, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමට කොමිෂන් සභාව විසින් කටයුතු සලස්වනු ලැබිය යුත්තේ ය.

**අභියාචනය කිරීමේ අයිතිවාසිකම.**

**58.** (1) 56 වැනි ව්‍යවස්ථාව හෝ 57 වැනි ව්‍යවස්ථාව යටතේ, යම් කමිටුවක් හෝ නිලධරයකු හෝ විසින් තමා සම්බන්ධයෙන් කරන ලද උසස් කිරීමේ හෝ ස්ථාන මාරු කිරීමේ හෝ සේවයෙන් පහ කිරීමේ යම් නියමයකින් හෝ විනය කාරණයකට සම්බන්ධ වෙනත් යම් නියමයකින් අතෘප්තියට පත් යම් රජයේ නිලධරයකු විසින්, එම නියමයන්ට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කිරීමට, අභියාචනයක් විභාග කිරීම සහ තීරණය කිරීමට අදාළ වූ කාර්ය පටිපාටිය සහ අභියාචනයක් විභාග කර නිම කිරීමට නියමිත කාලය සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් කලින් කල සාදනු ලබන රීතිවලට අනුකූලව කොමිෂන් සභාව වෙත අභියාචනය කළ හැක්කේ ය.

(2) එවැනි අභියාචනයක් කරනු ලැබූ විට, ඒ අභියාචනය කර ඇත්තේ යම් නියමයකට විරුද්ධව ද, ඒ නියමය සුදුසු යැයි කොමිෂන් සභාවට පෙනී යන පරිදි වෙනස් කිරීමේ, මඳ වශයෙන් වෙනස් කිරීමේ, ප්‍රත්‍යාදිෂ්ඨ කිරීමේ හෝ ස්ථිර කිරීමේ හෝ ඒ සම්බන්ධයෙන් විධාන දීමේ හෝ වැඩිදුර හෝ වෙනත් පරීක්ෂණයක් පවත්වන ලෙස නියම කිරීමේ බලය කොමිෂන් සභාවට ඇත්තේ ය.

(3) මේ ව්‍යවස්ථාවේ (1) වැනි ඡේදය යටතේ කොමිෂන් සභාව විසින් සාදන ලද රීති කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමට සලස්වනු ලැබිය යුත්තේ ය.

---

37 - දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 12 වැනි වගන්තිය මගින් "අමාත්‍ය මණ්ඩලය විසින් නිශ්චිතව නියම කරන" යන වචන වෙනුවට ආදේශ කරන ලදී.

පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය.

**59.** (1) අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරියක් වන්නේ ය.

(2) කොමිෂන් සභාව විසින් කරන ලද යම් නියමයක් හෝ තීරණයක් වෙනස් කිරීමට, සුළු වශයෙන් වෙනස් කිරීමට හෝ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීමට පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරියට බලය ඇත්තේ ය.

(3) අභියාචනයක් ඉදිරිපත් කළ හැකි කාල සීමාව ද ඇතුළුව ඒ විනිශ්චය අධිකාරිවල සංයුතිය, බලතල සහ කාර්ය පටිපාටි සම්බන්ධයෙන් නීතියෙන් විධිවිධාන සලස්වනු ලැබිය යුත්තේ ය.

බලතල පවරා දී ඇති අවස්ථාවක කොමිෂන් සභාව ඒ බලතල ක්‍රියාවේ නොයෙදිය යුතු බව.

**60.** අවස්ථාවෝචිත පරිදි 56 වැනි ව්‍යවස්ථාව හෝ 57 වැනි ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද කමිටුවකට හෝ රජයේ නිලධරයකුට කොමිෂන් සභාවේ යම් බලතල පවරා දෙනු ලැබූ විට, එසේ කොමිෂන් සභාවේ බලතල පවරා දීම වලංගුව පවතින තාක් කල් ඒ බලතල පවරා දෙන ලද්දේ රාජ්‍ය සේවයේ යම් නිලධර ගණවලට අයත් නිලධරයන් සම්බන්ධයෙන් ද, ඒ නිලධර ගණවලට අයත් නිලධරයන් සම්බන්ධව 58 වැනි ව්‍යවස්ථාවේ (1) වැනි හා (2) වැනි ඡේදවල විධිවිධානවලට යටත්ව, කොමිෂන් සභාව විසින් ඒ කර්තව්‍ය හෝ කාර්ය කිරීම හෝ ඉටු කිරීම නොකළ යුත්තේ ය.

රැස්වීම්වල කාර්ය පටිපාටිය.

**61.** (1) කොමිෂන් සභාවේ රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් පස් දෙනකු විය යුත්තේ ය.

(2) කොමිෂන් සභාවේ සියලු තීරණ අදාළ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් ගනු ලැබිය යුත්තේ ය. ඡන්දය සම සමව ලැබුණු අවස්ථාවක දී මුලසුන දරන සාමාජිකයාට තීරණ ඡන්දයක් ඇත්තේ ය.

(3) කොමිෂන් සභාවේ සභාපතිවරයා කොමිෂන් සභාවේ සියලු රැස්වීම්වල මූලාසනය දැරිය යුත්තේ ය. ඔහු පැමිණ නොමැති විටක, රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් විසින් ඔවුන් අතුරෙන් තෝරා පත් කර ගන්නා සාමාජිකයකු ඒ රැස්වීමේ මුලසුන දැරිය යුත්තේ ය.

නඩු කටයුතුවලින් මුක්තිය.

**61අ.** [38] [59 වැනි ව්‍යවස්ථාවේ සහ 126 වැනි ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව] කමිටුවක් විසින් හෝ යම් රජයේ නිලධරයකු විසින් මේ පරිච්ඡේදය යටතේ හෝ වෙනත් යම් රීතියක් යටතේ ඒ කොමිෂන් සභාව වෙත පැවරී ඇති හෝ පැනවී ඇති, නැතහොත් කමිටුව වෙත හෝ රාජ්‍ය නිලධරයා වෙත පවරා දී ඇති, යම් බලයක් හෝ කාර්යයක් ප්‍රකාර කරන ලද යම් නියමයක් හෝ තීරණයක් විභාග කිරීමට හෝ තීන්දුවක් දීමට හෝ කවර වූ හෝ ආකාරයකින් ඒ පිළිබඳ ප්‍රශ්න කිරීමට කිසිම අධිකරණයකට හෝ විනිශ්චය අධිකාරියකට බලය හෝ අධිකරණ බලය නොමැත්තේ ය.

38 - දහහතර වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 13 වැනි වගන්තියේ "126 වැනි ව්‍යවස්ථාවේ (1) වැනි, (2) වැනි, (3) වැනි, (4) වැනි සහ (5) වැනි ඡේදයන්හි විධිවිධානවලට යටත්ව" යන වචන වෙනුවට ආදේශ කරන ලදී.

**61ආ.** කොමිෂන් සභාව විසින් අන්‍යාකාරයකින් විධිවිධාන සලස්වනු ලබන තෙක්, මේ පරිච්ඡේදය ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ දී රාජ්‍ය සේවයට අදාළව බලාත්මකව පැවති සියලු රීති, නියෝග හා කාර්ය පටිපාටි, මේ පරිච්ඡේදය යටතේ රාජ්‍ය සේවයට සම්බන්ධව සාදනු ලැබූ හෝ විධිවිධාන සලස්වනු ලැබූ රීති, නියෝග හා කාර්ය පටිපාටි වූවාක් සේ අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, බලාත්මකව පවතින ලෙස සැලකිය යුත්තේ ය.

**බලාත්මකව පවතින රීති සහ නියෝග ඉතිරි කර තබා ගැනීම.**

**61ඇ.** (1) කොමිෂන් සභාවේ හෝ කොමිෂන් සභාව විසින් මේ පරිච්ඡේදය යටතේ යම් බලයක් පවරා දෙනු ලැබූ කොමිෂන් සභාවේ යම් කමිටුවක හෝ රජයේ නිලධරයකුගේ හෝ යම් තීරණයක් කෙරෙහි, තමාගේ නීත්‍යානුකූල රාජකාරි කටයුතුවල දී හැර, කෙළින්ම හෝ අන්‍යාකාරයකින්, තමන් විසින්ම හෝ වෙනත් යම් තැනැත්තකු මගින් හෝ වෙනත් යම් තැනැත්තකු සමග හෝ කවර හෝ ආකාරයකින් බලපෑමක් කරන්නා වූ හෝ බලපෑමක් කිරීමට තැත් කරන්නා වූ හෝ අයුතු ලෙස මැදිහත් වන්නා වූ හෝ කොමිෂන් සභාවේ හෝ කමිටුවක සාමාජිකයකුට එලෙස බලපෑමක් කරන්නා වූ සෑම තැනැත්තෙක් ම වරදකට වරදකරු වන අතර වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු හතක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් වන්නේ ය.

**කොමිෂන් සභාවේ කටයුතුවලට අයුතු ලෙස මැදිහත් වීම.**

(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද සෑම මහාධිකරණයකටම, මේ ව්‍යවස්ථාවේ (1) වැනි ඡේදයේ සඳහන් යම් කාරණයක් විභාග කොට විනිශ්චය කිරීමට අධිකරණ බලය ඇත්තේ ය.

**61ඈ.** මේ පරිච්ඡේදයේ සඳහන් කවර හෝ ධුරයකට පත් කරනු ලැබූ තැනැත්තකු, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හතර වන උපලේඛනයේ දැක්වෙන ප්‍රතිඥාව දී ඊට අත්සන් තබන තෙක් හෝ දිවුරුම දී ඊට අත්සන් තබන තෙක් හෝ ස්වකීය ධුරයට අයත් කාර්යයන්හි නොයෙදිය යුත්තේ ය.

**නිල ප්‍රතිඥාව හෝ දිවුරුම.**

[39] [ 61ඉ. (1) ජනාධිපතිවරයා විසින් -

(අ) යුද හමුදාපතිවරයා, නාවුක හමුදාපතිවරයා සහ ගුවන් හමුදාපතිවරයා පත් කිරීම ද

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතය ඇතිව නීතිපතිවරයා සහ පොලිස්පතිවරයා පත් කිරීම ද,

කළ යුත්තේ ය.

**ජනාධිපතිවරයා විසින් කරනු ලබන පත්කිරීම්.**

(2) නීතිපතිවරයාගේ සහ පොලිස්පතිවරයාගේ ධූර දරන්නන් වයස අවුරුදු හැට පිරීමේ දී ස්වකීය ධූරහැර යා යුත්තාහ.

---

39 - දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 14 වැනි වගන්තිය මගින් මුල් 61ඉ. සහ 61ඊ. ව්‍යවස්ථා ඉවත් කොට ඒ වෙනුවට ආදේශ කරන ලදී.

අර්ථ නිරූපණය.

**61ඊ.** මේ පරිච්ඡේදයේ කාර්ය සඳහා "රජයේ නිලධරයා" යන්නට යුද හමුදා, නාවුක හමුදා හෝ ගුවන් හමුදා සාමාජිකයකු හෝ මැතිවරණ කොමිෂන් සභාව විසින් පත් කරන ලද මැතිවරණ කොමිෂන් සභාවේ නිලධරයකු හෝ ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් පත් කරන ලද පොලිස් නිලධරයකු හෝ අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත්කරන ලද උපලේඛනගත රජයේ නිලධරයකු හෝ විගණන සේවා කොමිෂන් සභාව විසින් පත් කරන ලද ශ්‍රී ලංකා විගණන සේවයේ සාමාජිකයකු හෝ ඇතුළත් නොවන්නේ ය. ]

## X වැනි පරිච්ඡේදය

### ව්‍යවස්ථාදායකය

### පාර්ලිමේන්තුව

පාර්ලිමේන්තුව.

**62.** [40][ (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව තෝරා පත්කර ගනු ලබන මන්ත්‍රීවරයන් දෙසිය විසිපස් දෙනකුගෙන් සමන්විත පාර්ලිමේන්තුවක් වන්නේ ය. ]

[41] [ (2) සෑම පාර්ලිමේන්තුවක්ම පළමුවරට රැස්වීමට නියමිත දින පටන් පස් අවුරුද්දකට නොවැඩි කාලයක් පවත්නේය. එහෙත් නියමිත කාල සීමාව ඉකුත්වීමට පෙර පාර්ලිමේන්තුව විසුරුවා හැරිය හැක්කේ ය. එකී පස් අවුරුදු කාලය ඉකුත්ව ගිය විට ම පාර්ලිමේන්තුව විසිර ගියාක් සේ සැලකෙන්නේ ය. ]

නිල ප්‍රතිඥාව හෝ දිවුරුම.

**63.** කථානායකවරයා තෝරා පත් කර ගැනීම පිණිස මිස පාර්ලිමේන්තුව ඉදිරියේ දී මතු දැක්වෙන ප්‍රතිඥාව දී එයට අත්සන් තබන තෙක් හෝ මතු දැක්වෙන දිවුරුම දී එයට අත්සන් තබන තෙක් හෝ කිසිම මන්ත්‍රීවරයකු විසින් පාර්ලිමේන්තුවේ අසුන් ගැනීම හෝ පාර්ලිමේන්තුවේ දී ඡන්දය දීම හෝ නොකළ යුත්තේ යː-

> ".............. වන මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කොට අනුගමනය කරන බවට/ගෞරව බහුමානයෙන් යුක්තව ප්‍රතිඥා දෙමි/දිවුරුම් දෙමි."

කථානායකවරයා, නියෝජ්‍ය කථානායකවරයා සහ නියෝජ්‍ය කාරක සභාපතිවරයා.

**64.** (1) මහ මැතිවරණයකට පසුව පළමුවරට පවත්වනු ලබන පාර්ලිමේන්තු රැස්වීමේ දී කථානායකය, මින්මතු නියෝජ්‍ය කථානායක වශයෙන් හඳුන්වනු ලබන නියෝජ්‍ය කථානායක සහ කාරක සභාපතිය, නියෝජ්‍ය කාරක සභාපතිය යන මේ තුන් පදවියට පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයන් තුන්දෙනකු තෝරා පත් කළ යුත්තේ ය.

(2) පාර්ලිමේන්තුවේ කථානායකය, නියෝජ්‍ය කථානායකය, නියෝජ්‍ය කාරක සභාපතිය යන මේ පදවි අතුරෙන් කවර වූ හෝ පදවියක් දරන්නා වූ මන්ත්‍රීවරයෙක් වේ ද, ඒ මන්ත්‍රීවරයා, ජනාධිපතිවරයා වෙත ස්වකීය අත්සන යටතේ වූ ලිපියක් මගින් සිය පදවියෙන් කලින් අස්වුවහොත් මිස එසේ නැතහොත් පාර්ලිමේන්තුවේ තවදුරටත් මන්ත්‍රීවරයකු නොවුවහොත් මිස, පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබූ විටක සිය පදවියෙන් ඉවත් වන්නේ ය.

(3) පාර්ලිමේන්තුව විසුරුවා හැරීම හේතුකොටගෙන විනා අන්‍යාකාරයකින් කථානායකය, නියෝජ්‍ය කථානායකය, නියෝජ්‍ය කාරක සභාපතිය යන මේ පදවි අතුරෙන් කවර වූ හෝ පදවියක් හිස් වූ සෑම අවස්ථාවක ම ඒ පදවිය හිස් වූ පසු පළමුවරට පවත්වනු

---

40 - දහහතර වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 3 වැනි වගන්තිය මගින් මුල් 62(1) වැනි අනු ව්‍යවස්ථාව වෙනුවට ආදේශ කරන ලදී.

41 - දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 15 වැනි වගන්තිය මගින් මුල් 62(2) වැනි අනු ව්‍යවස්ථාව වෙනුවට ආදේශ කරන ලදී.

ලබන රැස්වීමේ දී පාර්ලිමේන්තුව විසින් එසේ හිස් වූ පදවියට වෙනත් මන්ත්‍රීවරයකු තෝරා පත්කර ගත යුත්තේ ය.

(4) පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබූ පසු 70 වැනි ව්‍යවස්ථාවේ (7) වැනි අනු ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තුව නැවත රැස් කරනු ලැබුවහොත් මේ ව්‍යවස්ථාවේ (2) වැනි අනු ව්‍යවස්ථාවේ සඳහන් සෑම මන්ත්‍රීවරයකු ම ඒ අනු ව්‍යවස්ථාවේ කුමක් සඳහන් වුව ද, පාර්ලිමේන්තුවේ සභා වාරය පවත්නා තුරු තමන් කලින් දරා සිටි පදවිය නැවතත් දැරිය යුත්තේ ය.

(5) කථානායකවරයා පාර්ලිමේන්තුවේ මූලසුන දරන්නේ ය. කථානායකවරයා නොපැමිණි විටක නියෝජ්‍ය කථානායකවරයා ද, ඔවුන් දෙදනා ම නොපැමිණි විටක නියෝජ්‍ය කාරක සභාපතිවරයා ද පාර්ලිමේන්තුවේ මූලසුන දරන්නේ ය. ඔවුන් අතුරෙන් කිසිවකුත් නොපැමිණි විටක ඒ රැස්වීමේ මූලසුන දරනු පිණිස පාර්ලිමේන්තුව විසින් තෝරා ගනු ලබන මන්ත්‍රීවරයකු රැස්වීමේ මූලසුන දැරිය යුත්තේ ය.

**පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා.**

[42] [ **65.** (1)පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයෙක් වන්නේය. මහ ලේකම්වරයා ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව පත්කරනු ලබන්නේය. මහ ලේකම්වරයා යථා පැවැත්මෙන් සිටිනා තාක් ස්වකීය ධූරය දරන්නේ ය. ]

(2) මහ ලේකම්වරයාගේ වැටුප පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබිය යුත්තේ ය. එසේ නිශ්චය කරන ලද වැටුප ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන්නේ ය. ඔහුගේ ධූර කාලය තුළ එකී වැටුප අඩු නොකළ යුත්තේ ය.

(3) මහ ලේකම්වරයාගේ කාර්ය මණ්ඩලය කථානායකවරයාගේ අනුමතය ඇතිව මහ ලේකම්වරයා විසින් පත් කරනු ලබන්නේ ය.

(4) මහ ලේකම්වරයාගේ කාර්ය මණ්ඩලයේ වැටුප් ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන්නේ ය.

(5) මහ ලේකම්වරයා -

(අ) මිය ගියහොත් එවිට; හෝ

(ආ) ජනාධිපතිවරයා වෙත යවන ලිපියක් මගින් ඉල්ලා අස් වුවහොත් එවිට; හෝ

(ඇ) පාර්ලිමේන්තුව විසින් නීතියෙන් අන්‍යාකාර විධිවිධාන සැලැස්වුවහොත් මිස, වයස අවුරුදු හැට සම්පූර්ණ කළ විට; හෝ

(ඈ) රෝගාතුර වීම නිසා හෝ ශාරීරික නැතහොත් මානසික දුර්වලතාවක් නිසා හෝ ජනාධිපතිවරයා විසින් ඉවත් කරනු ලැබුවහොත් එවිට; හෝ

42 - දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 16(1) වැනි වගන්තිය මගින් මුල් 65(1) වැනි අනු ව්‍යවස්ථාව වෙනුවට ආදේශ කරන ලදී.

(ඉ) පාර්ලිමේන්තුව විසින් සම්මත කොට ඉදිරිපත් කරන යෝජනාවක් අනුව ජනාධිපතිවරයා විසින් ඉවත් කරනු ලැබුවහොත් එවිට; හෝ

මහ ලේකම් ධුරය හිස් වන්නේ ය.

43[ (6) මහ ලේකම්වරයාට සිය ධුරයේ කටයුතු ඉටු කිරීමට නොහැකි වූ විට මහ ලේකම්වරයා වෙනුවෙන් වැඩ බැලීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව තැනැත්තකු පත් කිරීමට ජනාධිපතිවරයාට බලය තිබිය යුත්තේ ය. ]

**66.** (අ) මන්ත්‍රීවරයකු මියගිය හොත් එවිට; හෝ — අසුන් හිස්වීම.

(ආ) මන්ත්‍රීවරයකු තම අත්සන යටතේ පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා වෙත යවන ලිපියක් මඟින් තම අසුනෙන් ඉල්ලා අස්වීමෙන්; හෝ

(ඇ) මහජනතාව විසින් හෝ පාර්ලිමේන්තුව විසින් හෝ ජනාධිපති ධුරයට තෝරා පත් කර ගැනීමේ හේතුවෙන් මන්ත්‍රීවරයකු විසින් ජනාධිපති ධුරය භාර ගැනීමෙන්; හෝ

(ඈ) මන්ත්‍රීවරයකු 89 වැනි ව්‍යවස්ථාවේ හෝ 91 වැනි ව්‍යවස්ථාවේ සඳහන් යම් ආකාරයකින් නුසුදුස්සකු වීමෙන්; හෝ

(ඉ) මන්ත්‍රීවරයකු රජයේ සේවයට පත්වීමෙන් නැතහොත් රාජ්‍ය සංස්ථාවක සේවකයකු බවට පත්වීමෙන් නැත්නම් රජයේ සේවයක නියුක්තව සිටිය දී නැතහොත් රාජ්‍ය සංස්ථාවක සේවකයකුව සිටිය දී පාර්ලිමේන්තුවට තෝරා පත් කර ගනු ලැබූ නමුත් පාර්ලිමේන්තුවේ අසුන් ගැනීමට පෙර රජයේ සේවයෙන් හෝ රාජ්‍ය සංස්ථා සේවයේ සේවක තනතුරින් බැහැර නොවීමෙන්; හෝ

(ඊ) මන්ත්‍රීවරයකු පාර්ලිමේන්තුවේ අවසරය කලින් නොලබා නොකඩවා මාස තුනක් පාර්ලිමේන්තුවේ රැස්වීම්වලට නොපැමිණීමෙන්; හෝ

(උ) යම්කිසි තැනැත්තකු මන්ත්‍රීවරයකු වශයෙන් තෝරා පත් කර ගැනීම තත්කාලයේ බලපවත්නා නීතිය යටතේ නිශ්ප්‍රභ කරනු ලැබීමෙන්; හෝ

(ඌ) පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබීමෙන්; හෝ

(එ) 81 වැනි ව්‍යවස්ථාව අනුව ඔහු නෙරපීම සඳහා වූ යෝජනාවක් සම්මත වුවහොත් එවිට;

හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුගේ අසුන හිස් වන්නේ ය.

---

43 - දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 16(2) වැනි වගන්තිය මගින් මුල් 65(6) වැනි අනු ව්‍යවස්ථාව වෙනුවට ආදේශ කරන ලදී.

පාර්ලිමේන්තුවේ සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ වරප්‍රසාද, පරිහාර සහ බලතල

**67.** පාර්ලිමේන්තුවේ සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ වරප්‍රසාද, පරිහාර සහ බලතල පාර්ලිමේන්තුව විසින් නීතියෙන් නිශ්චය කොට විධිමත් කළ හැකි අතර, එසේ නිශ්චය කොට විධිමත් කරන තෙක් පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතෙහි විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

මන්ත්‍රීවරයන්ට දීමනා ගෙවීම.

**68.** (1) අමාත්‍යවරයන්ට, නියෝජ්‍ය අමාත්‍යවරයන්ට සහ කථානායකවරයා, නියෝජ්‍ය කථානායකවරයා සහ නියෝජ්‍ය කාරක සභාපතිවරයා ඇතුළු මන්ත්‍රීවරයන්ට පාර්ලිමේන්තුව විසින් නීතියෙන් හෝ යෝජනා සම්මතයෙන් නියම කරනු ලබන පාරිශ්‍රමික හෝ දීමනා ගෙවිය යුත්තේ ය. ඒ පාරිශ්‍රමික හෝ දීමනා ලැබීම හේතුකොට ගෙන පාර්ලිමේන්තුවේ අසුන් ගැනීමට හෝ පාර්ලිමේන්තුවේ දී ඡන්දය දීමට ඒවා ලබන්නා නුසුදුස්සෙක් නොවන්නේ ය.

(2) පාර්ලිමේන්තුව එසේ විධිවිධාන සලස්වන තුරු අමාත්‍යවරයන්ට, නියෝජ්‍ය අමාත්‍යවරයන්ට සහ කථානායකවරයා, නියෝජ්‍ය කථානායකවරයා සහ නියෝජ්‍ය කාරක සභාපතිවරයා ඇතුළු මන්ත්‍රීවරයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමිකය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වන තෙක් අමාත්‍යවරයන්ට, නියෝජ්‍ය අමාත්‍යවරයන්ට සහ ජාතික රාජ්‍ය සභාවේ කථානායකවරයා, නියෝජ්‍ය කථානායකවරයා සහ නියෝජ්‍ය කාරක සභාපතිවරයා ඇතුළු මන්ත්‍රීවරයන්ට ගෙවනු ලැබූ පාරිශ්‍රමිකය ම වන්නේ ය.

මන්ත්‍රී ධුර හිස්ව තිබුණ ද පාර්ලිමේන්තුවට ක්‍රියා කිරීමට බලය ඇති බව.

**69.** පාර්ලිමේන්තුවේ මන්ත්‍රී ධුරයක් හිස්ව තිබුණ ද පාර්ලිමේන්තුවට ක්‍රියා කිරීමට බලය ඇත්තේ ය. පාර්ලිමේන්තුවේ අසුන් ගැනීමට හෝ පාර්ලිමේන්තුවේ දී ඡන්දය දීමට හෝ වෙනත් අයුරකින් එහි කටයුතුවලට සහභාගිවීමට හෝ හිමිකමක් නොමැති යම්කිසි තැනැත්තකු පාර්ලිමේන්තුවේ අසුන් ගත් බවක් හෝ පාර්ලිමේන්තුවේ යම්කිසි රැස්වීමක දී ඡන්දය දුන් බවක් හෝ වෙනත් අයුරකින් පාර්ලිමේන්තුවේ කටයුතුවලට සහභාගි වූ බවක් හෝ පසුව දැන ගන්නට ලැබුණ ද ඒ රැස්වීමේ දී සිදු වූ සියලු කටයුතු බල සහිත වන්නේ ය.

## XI වැනි පරිච්ඡේදය

### ව්‍යවස්ථාදායකය

### කාර්ය පටිපාටිය සහ බලතල

**70.** 44 [ (1) ජනාධිපතිවරයා විසින් ප්‍රකාශයක් මගින් පාර්ලිමේන්තුව කැඳවීම, පාර්ලිමේන්තුවේ වාරාවසාන කිරීම සහ පාර්ලිමේන්තුව විසුරුවා හැරීම කළ හැක්කේ යː

පාර්ලිමේන්තුවේ සභාවාර

එසේ වුවද, පාර්ලිමේන්තුව විසින් එහි නොපැමිණි මන්ත්‍රීවරයන් ද ඇතුලුව මුළු මන්ත්‍රීවරයන්ගේ සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු සංඛ්‍යාවකගේ යෝජනා සම්මතයක් මගින් පාර්ලිමේන්තුව විසුරුවා හරින ලෙස ජනාධිපතිවරයාගෙන් ඉල්ලීමක් කරනු ලබන්නේ නම් මිස, පාර්ලිමේන්තුවේ ප්‍රථම රැස්වීම සඳහා නියම කරගනු ලැබූ දිනයෙන් අවුරුදු හතරක් සහ මාස හයක කාලයක් අවසන් වන තෙක් ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව විසුරුවා හැරීම නොකල යුත්තේ ය. ]

(2) පාර්ලිමේන්තුව සෑම වසරකට වරක්වත් කැඳවිය යුත්තේ ය.

(3) පාර්ලිමේන්තුවේ වාරය අවසන් කරන්නා වූ ප්‍රකාශනයෙන් ඊළඟ වාරය පටන් ගැනීම සඳහා දිනයක් නියම කළ යුත්තේ ය. ඒ දිනය ප්‍රකාශනයේ දින සිට මාස දෙකක් නොඉක්මවන දිනයක් විය යුත්තේ යː

එසේ වුව ද, පාර්ලිමේන්තුවේ වාරයක් අවසන් කොට ඇති කවර වූ හෝ අවස්ථාවක -

(i) ප්‍රකාශනයක් මගින්, ඒ ප්‍රකාශනයේ දින සිට තුන් දවසකට 'කලින් දිනයක්' නොවිය යුතු නියමිත කලින් දිනයක රැස්වන ලෙස පාර්ලිමේන්තුව කැඳවීමට; හෝ

(ii) මේ ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව, ප්‍රකාශනයක් මගින් පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට; හෝ

ජනාධිපතිවරයාට බලය ඇත්තේ ය.

(4) යථා පරිදි පාර්ලිමේන්තුව ඉදිරියට ගෙන එනු ලැබ, පාර්ලිමේන්තුවේ වාරය අවසාන කරන අවස්ථාව වන විට කටයුතු නිම කරනු ලැබ නොමැති යම් කාරණා ඇත්තේ ද, ඒ සියලු කාරණා පිළිබඳව පාර්ලිමේන්තුවේ ඊළඟ සභා වාරයේ දී ඉතිරි පියවර ගැනීමට පාර්ලිමේන්තුවට බලය ඇත්තේ ය.

(5) (අ) පාර්ලිමේන්තුව විසුරුවා හරින ප්‍රකාශනයෙහි, අභිනව පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරයන් තෝරාපත් කර ගන්නා දිනය හෝ දින නියම කොට තිබිය යුත්තේ ය. එසේ ම, එකී ප්‍රකාශනය නිකුත් කළ දින

44 - දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 17 වැනි වගන්තිය මගින් මුල් 70(1) වැනි අනු ව්‍යවස්ථාව වෙනුවට ආදේශ කරන ලදී.

සිට මාස තුනක් ගත වන්නට පෙර දිනයකට අභිනව පාර්ලිමේන්තුවේ පළමුවන රැස්වීම ඒ ප්‍රකාශනයෙන් ම කැඳවිය යුත්තේ ය.

(ආ) 62 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනු ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබූ විට ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තේරීම සඳහා ප්‍රකාශනයක් මගින් නොපමාව දිනයක් හෝ දින නියම කොට අභිනව පාර්ලිමේන්තුව, ඒ ප්‍රකාශනයේ දින සිට තුන් මාසයකට පසු දිනයක් නොවන දිනයක රැස්වන ලෙස කැඳවිය යුත්තේ ය.

(ඇ) (අ) ඡේදයේ හෝ (ආ) ඡේදයේ විධිවිධාන යටතේ ප්‍රකාශනයක් මගින් අභිනව පාර්ලිමේන්තුවේ ප්‍රථම රැස්වීම සඳහා නියම කරන ලද දිනය ඉන් පසුව කරන ප්‍රකාශනයක් මගින් වෙනස් කරනු ලැබිය හැක්කේ ය. එහෙත් පසුව කරන ප්‍රකාශනය මගින් නියම කරන දිනය මුල් ප්‍රකාශනයේ දින සිට මාස තුනකට පසු දිනයක් නොවන දිනයක් විය යුත්තේ ය.

(6) ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ ඡන්ද විමසීම පාර්ලිමේන්තුව විසුරුවා හරින ලද දිනයත්, මේ ව්‍යවස්ථාවේ (5) වැනි අනු ව්‍යවස්ථාව අනුව පාර්ලිමේන්තුව රැස්විය යුත්තේ යම් දිනයකට පෙර ද ඒ දිනයත් අතර දිනයක දී පැවැත්වීමට නියමිතව ඇති අවස්ථාවක, ඒ අනුව්‍යවස්ථාවේ කවර විධානයක් තිබුණ ද, පාර්ලිමේන්තුව විසුරුවා හරින ලද දිනයේ සිට සිව් මසකට පසු දිනයක් නොවන දිනයක රැස්වන ලෙස අභිනව පාර්ලිමේන්තුව කැඳවිය යුත්තේ ය.

(7) පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබීමෙන් පසුව කවර අවස්ථාවක වුව ද පාර්ලිමේන්තුව නියමිත දිනයට කලින් රැස්වීම අවශ්‍යවන ස්වභාවයක හදිසි තත්ත්වයක් උද්ගත වී ඇති බවට ජනාධිපතිවරයා සෑහීමකට පත් වුවහොත් විසුරුවා හැර ඇති පාර්ලිමේන්තුව ප්‍රකාශනයක් මගින්, ඒ ප්‍රකාශනයේ දින සිට තුන් දවසකට කලින් දිනයක් නොවිය යුතු දිනයක දී රැස්වන ලෙස කැඳවීමට ජනාධිපතිවරයාට බලය ඇත්තේ ය. එසේ කැඳවනු ලැබූ පාර්ලිමේන්තුව හදිසි අවස්ථාව අවසන් වීම හෝ මහ මැතිවරණය අවසන් වීම යන මෙයින් කලින් එළඹෙන අවස්ථාවේ දී විසිරෙන්නේ ය.

රැස්වීම් කල් තැබීම.

**71.** පාර්ලිමේන්තුවේ වාරය අවසාන කරන තුරු හෝ පාර්ලිමේන්තුව විසුරුවා හරින තුරු යෝජනා සම්මතයෙන් හෝ ස්ථාවර නියෝගය අනුව හෝ පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලබන පරිදි කලින් කල පාර්ලිමේන්තුවේ රැස්වීම් කල් තබනු ලැබිය හැක්කේ ය.

ඡන්දය දීම.

**72.** (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අන්‍යාකාර විධිවිධාන සලස්වා ඇති අවස්ථාවන්හි හැර පාර්ලිමේන්තුවේ තීරණයට ඉදිරිපත් කරනු ලබන සෑම ප්‍රශ්නයක් ම රැස්වීමට පැමිණ ඡන්දය දෙන්නා වූ මන්ත්‍රීවරයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කළ යුත්තේ ය.

(2) පළමුකොට ඡන්ද විමසීමේ දී, රැස්වීමේ මුලසුන දරන තැනැත්තා ඡන්දය නොදිය යුතු නමුත් යම්කිසි ඡන්ද විමසීමක දී පක්ෂ ඡන්ද සංඛ්‍යාව හා විපක්ෂ ඡන්ද සංඛ්‍යාව සම වුවහොත් මුලසුන දරන තැනැත්තාට තීරණ ඡන්දයක් හිමි වන්නේ ය. ඔහු එම තීරණ ඡන්දය දිය යුත්තේ ය.

**73.** පාර්ලිමේන්තුවේ රැස්වීමක් පැවැත්වෙන විට කවර වූ හෝ වේලාවක සභා ගර්භය තුළ සිටින මන්ත්‍රීවරයන්ගේ සංඛ්‍යාව විස්සකට අඩු බව මුලසුන දරන තැනැත්තාට දන්වනු ලැබුවහොත් මුලසුන දරන තැනැත්තා ඡන්ද විමසීමක් නොමැතිව, පාර්ලිමේන්තුවේ යම්කිසි ස්ථාවර නියෝගයක් වෙතොත් ඊට ද යටත්ව ඒ රැස්වීම කල් තැබිය යුත්තේ ය. ගණපූරණය.

**74.** (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට යටත් ව - ස්ථාවර නියෝග.

(i) කථානායකවරයා, නියෝජ්‍ය කථානායකවරයා හා නියෝජ්‍ය කාරක සභාපතිවරයා තෝරා පත් කිරීම හා ධුරයෙන් ඉවත් වීම පිළිබඳව ද;

(ii) පාර්ලිමේන්තුවේ කටයුතු කිරීමේ පිළිවෙළ විධිමත් කිරීම සඳහා ද, පාර්ලිමේන්තුවේ රැස්වීම්වල දී විනය ආරක්ෂා කිරීම සඳහා ද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් නියම කොට ඇත්තා වූ හෝ බලය දී ඇත්තා වූ හෝ වෙනත් කාරණා සඳහා ද, යෝජනා සම්මතයෙන් හෝ ස්ථාවර නියෝග මගින් හෝ විධිවිධාන සැලැස්වීමට පාර්ලිමේන්තුවට බලය ඇත්තේ ය.

(2) පාර්ලිමේන්තුව නීතියෙන් හෝ යෝජනා සම්මතයෙන් හෝ අන්‍යාකාර විධිවිධාන සලස්වන තුරු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වන තෙක් බලපැවැත් වූ ජාතික රාජ්‍ය සභාවේ ස්ථාවර නියෝග, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග වශයෙන් බලපවත්වන්නේ ය.

**75.** අතීතයට ද බලපාන්නා වූ නීති සහ ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවේ කවර හෝ විධිවිධානයක් පරිච්ඡින්න කරන්නා වූ හෝ සංශෝධනය කරන්නා වූ හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට යම් විධිවිධානයක් එකතු කරන්නා වූ හෝ නීති ඇතුළුව නීති පැනවීමේ බලය පාර්ලිමේන්තුවට ඇත්තේ ය: ව්‍යවස්ථාදායක බලය.

එසේ වුව ද -

(අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ එහි යම් කොටසක හෝ ක්‍රියාකාරිත්වය අත්හිටුවන්නා වූ නීතියක් පැනවීම; හෝ

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පරිච්ඡින්න කරන්නා වූ නීතියෙන් ම ඒ වෙනුවට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පනවනු

ලබන්නේ නම් මිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මුළුමනින් ම පරිච්ඡින්න කරන්නා වූ නීතියක් පැනවීම; හෝ

පාර්ලිමේන්තුව විසින් නොකළ යුත්තේ ය.

ව්‍යවස්ථාදායක බලය පවරාදීම.

**76.** (1) පාර්ලිමේන්තුව විසින් පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක බලය අත් නොහළ යුත්තේ ය. කිසිම ආකාරයකින් අන්සතු නො කළ යුත්තේ ය. කවර වූ හෝ ව්‍යවස්ථාදායක බලයක් ඇති කිසිම අධිකාරයක් පාර්ලිමේන්තුව විසින් නොපිහිටුවිය යුත්තේ ය.

(2) පාර්ලිමේන්තුව විසින්, මහජන ආරක්ෂාවට අදාළ යම්කිසි නීතියකට අනුකූලව හදිසි අවස්ථා නියෝග සෑදීමේ බලය ජනාධිපතිවරයාට පැවරෙන විධිවිධාන, ඒ නීතියට ඇතුළත් කිරීම, මේ ව්‍යවස්ථාවේ (1) වැනි අනු ව්‍යවස්ථාවේ විධිවිධාන කඩකිරීමක් නොවන්නේ ය.

(3) (අ) යම් නීතියක් හෝ යම් නීතියක කොටසක් හෝ ක්‍රියාත්මක වන හෝ එකී නීතියක් හෝ එකී නීතියක කොටසක් ක්‍රියාත්මක වීම නතර වන දිනය හෝ නියම කිරීම;

(ආ) යම් නීතියක් හෝ යම් නීතියක කොටසක් හෝ නියමයක් මගින් යම්කිසි ප්‍රදේශයකට හෝ ජන කොට්ඨාසයකට හෝ සීමා කොට ක්‍රියාත්මක කරවීම; සහ

(ඇ) නියමයකින් හෝ ක්‍රියාවකින් හෝ නෛතික පුද්ගලයකු ඇති කිරීම,

යන කාර්ය ඇතුළුව නියමිත කාර්ය සඳහා අනුනීති සෑදීම පිණිස යම්කිසි තැනැත්තකුට හෝ යම්කිසි අධිකාරයකට හෝ බලය පවරන්නා වූ විධිවිධාන ඇතුළත් යම්කිසි නීතියක් පාර්ලිමේන්තුව විසින් පැනවීම මේ ව්‍යවස්ථාවේ (1) වැනි අනු ව්‍යවස්ථාවේ විධිවිධාන කඩකිරීමක් නොවන්නේ ය.

මේ අනුව්‍යවස්ථාවේ (අ) සහ (ආ) ඡේදවල "නීතිය" යන්නට පවත්නා නීති ද ඇතුළත් වන්නේ ය.

(4) ඉහත සඳහන් පරිදි වූ යම් විධිවිධානයක් ඇතුළත්, පවත්නා නීතියක් වලංගු හා ක්‍රියාත්මක නීතියක් වන්නේ ය.

පළ කරන ලද පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් නීතිපතිවරයාගේ කාර්ය.

**77.** (1) 82 වැනි ව්‍යවස්ථාවේ (1) වැනි අනුව්‍යවස්ථාවේ සහ (2) වැනි අනුව්‍යවස්ථාවේ දැක්වෙන නියමයන් කඩවී ඇත්තේ ද යන වග ද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නියම කොට ඇති විශේෂ බහුතර ඡන්දයෙන් විනා නීත්‍යානුකූලව සම්මත කළ නොහැකි විධිවිධාන ඇතුළත් වී ඇත්තේ ද යන වග ද දැනගැනීම පිණිස සෑම පනත් කෙටුම්පතක් ම පරීක්ෂා කර බැලීම නීතිපතිවරයාගේ කාර්යය වන්නේ ය. මේ ව්‍යවස්ථාව යටතේ තම කාර්ය ඉටු කිරීමේ දී නීතිපතිවරයාට හෝ නීතිපතිවරයාට සහාය වන්නා වූ යම්කිසි නිලධරයෙක් වේ නම් ඔහුට හෝ ඒ කාර්ය ඉටු කිරීමට අවශ්‍ය සියලු පහසුකම් සැලසිය යුත්තේ ය.

(2) යම්කිසි පනත් කෙටුම්පතකින් 82 වැනි ව්‍යවස්ථාවේ (1) වැනි අනු ව්‍යවස්ථාවේ සහ (2) වැනි අනු ව්‍යවස්ථාවේ දැක්වෙන යම්කිසි නියමයක් කඩ වී ඇති බව නීතිපතිවරයාගේ මතය වේ නම්, එසේ නැතහොත් යම්කිසි පනත් කෙටුම්පතක යම්කිසි විධිවිධානයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නියම කොට ඇති විශේෂ බහුතර ඡන්දයෙන් විනා නීත්‍යනුකූලව සම්මත කොට ගත නොහැකි බව නීතිපතිවරයාගේ මතය වේ නම්, එකී මතය නීතිපතිවරයා ජනාධිපතිවරයාට දන්වා යැවිය යුත්තේ ය:

එසේ වුව ද, පනත් කෙටුම්පතකට පාර්ලිමේන්තුවේ දී යෝජනා කරනු ලැබූ සංශෝධනයක් සම්බන්ධයෙන් ස්වකීය මතය ඒ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ අවසාන සම්මතය ලබා ගැනීම සඳහා පිළියෙළ වී ඇති අවස්ථාවේ දී නීතිපතිවරයා විසින් කථානායකවරයා වෙත දන්වා යැවිය යුත්තේ ය.

**පනත් කෙටුම්පත් පළ කිරීම් සහ පනත් කෙටුම්පත් හා යෝජනා සම්මත කිරීම.**

**78.** [45][ (1) සෑම පනත් කෙටුම්පතක් ම පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට යටත් පිරිසෙයින් දවස් දහහතරකට පෙර ගැසට් පත්‍රයේ පළ කළ යුත්තේ ය. ]

(2) පනත් කෙටුම්පතක් හෝ යෝජනා සම්මතයක් පාර්ලිමේන්තුව විසින් සම්මත කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සහ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවලට අනුකූලව සිදු කළ යුත්තේ ය. ස්ථාවර නියෝගවලින් නියම කර ඇති අවස්ථාගත කරුණු යටතේ ද, එසේ නියම කර ඇති ආකාරයට ද කවර වූ හෝ ස්ථාවර නියෝගයක් නැතහොත් ස්ථාවර නියෝග වැඩි ගණනක් පාර්ලිමේන්තුව විසින් අත්හිටුවිය හැක්කේ ය.

**කථානායකවරයාගේ සහතිකය.**

**79.** පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද සෑම පනත් කෙටුම්පතක ම මෙහි පහත දැක්වෙන ආකෘතියෙහි වූ සහතිකයක් කථානායකවරයා විසින් ස්වකීය අත්සන ඇතිව සටහන් කළ යුත්තේය:-

"(පනත් කෙටුම්පතේ ලුහුඬු නාමය මෙහි සඳහන් කරන්න) නමැති මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව විසින් යථා පරිදි සම්මත කරන ලද බව මෙයින් සහතික කරමි."

පනත් කෙටුම්පත සම්මත කරන ලද්දේ යම් බහුතර ඡන්දයකින් ද ඒ බහුතර ඡන්දය ද ඒ සහතිකයෙහි සඳහන් කරනු ලැබිය හැක්කේ ය:

එසේ වුව ද, 82 වැනි ව්‍යවස්ථාවේ හෝ 83 වැනි ව්‍යවස්ථාවේ හෝ 84 වැනි ව්‍යවස්ථාවේ හෝ 123 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනු ව්‍යවස්ථාවේ හෝ විධිවිධාන ප්‍රකාර පනත් කෙටුම්පත සම්මත කිරීම සඳහා විශේෂ බහුතර ඡන්දයක් අවශ්‍ය වන අවස්ථාවක දී ඒ පනත් කෙටුම්පත කථානායකවරයා විසින් සහතික කළ යුත්තේ ඒ පනත් කෙටුම්පත ඒ විශේෂ බහුතර ඡන්දයෙන් සම්මත වී ඇත්නම් පමණකි.

45 - දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 18 වැනි වගන්තිය මගින් මුල් 78(1) වැනි අනු ව්‍යවස්ථාව වෙනුවට ආදේශ කරන ලදී.

එසේ තවදුරටත්, 83 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර පනත් කෙටුම්පත හෝ එහි යම් විධිවිධානයක් ජනමත විචාරණයක දී ජනතාව විසින් අනුමත කිරීම අවශ්‍ය වන අවස්ථාවක, ඒ පනත් කෙටුම්පත හෝ ඒ විධිවිධානය ජනතාව විසින් ජනමත විචාරණයක දී අනුමත කරනු ලබන තෙක් නීතිය බවට පත් නොවිය යුතු බව ද ඒ සහතිකයේ සඳහන් විය යුත්තේ ය.

**පනත් කෙටුම්පතක් නීතිය බවට පත්වීම.**

**80.** (1) පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද පනත් කෙටුම්පතක් මත කථානායකවරයාගේ සහතිකය ඔහුගේ අත්සන ඇතිව සටහන් කරනු ලැබූ විට මේ ව්‍යවස්ථාවේ (2) වැනි අනු ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව එය නීතිය බවට පත් වන්නේ ය.

(2) යම්කිසි පනත් කෙටුම්පතක් හෝ යම්කිසි පනත් කෙටුම්පතක යම්කිසි විධිවිධානයක් හෝ ජනමත විචාරණයක් මගින් ජනතාවගේ අනුමතය සඳහා ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන බව අමාත්‍ය මණ්ඩලය විසින් සහතික කර ඇත්තා වූ අවස්ථාවක හෝ, යම්කිසි පනත් කෙටුම්පතක් හෝ යම්කිසි පනත් කෙටුම්පතක යම්කිසි විධිවිධානයක් හෝ ජනමත විචාරණයක දී ජනතාව විසින් අනුමත කිරීම අවශ්‍ය බව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කර ඇත්තා වූ අවස්ථාවක හෝ යම්කිසි පනත් කෙටුම්පතක් 85 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනුව්‍යවස්ථාව යටතේ ජනමත විචාරණයක් මගින් ජනතාව වෙත ඉදිරිපත් කරන අවස්ථාවක, ඒ පනත් කෙටුම්පත හෝ ඒ විධිවිධානය ජනතාව විසින් ජනමත විචාරණයක දී 85 වැනි ව්‍යවස්ථාවේ (3) වැනි අනුව්‍යවස්ථාවට අනුකූලව අනුමත කර ඇති බව ජනාධිපතිවරයා විසින් සහතික කරනු ලැබූ විට පමණක් ඒ පනත් කෙටුම්පත හෝ ඒ පනත් කෙටුම්පතෙහි එකී විධිවිධානය හෝ නීතිය බවට පත් වන්නේ ය. එසේ අනුමත කරනු ලැබූ සෑම පනත් කෙටුම්පතක ම මෙහි පහත දැක්වෙන ආකෘතියෙහි වූ සහතිකයක්, ජනාධිපතිවරයා විසින් ස්වකීය අත්සන ඇතිව සටහන් කළ යුත්තේ යඃ-

> "මේ පනත් කෙටුම්පත/විධිවිධානය ජනමත විචාරණයක දී [46][ජනතාව විසින් යථා පරිදි අනුමත කරන ලද බව මෙයින් සහතික කරමි."

එවැනි සහතිකයක් ජනාධිපතිවරයා විසින් පනත් කෙටුම්පතක සටහන් කිරීම -

(අ) ඒ පනත් කෙටුම්පත ජනතාව විසින් අනුමත කරන ලද ජනමත විචාරණයේ වලංගුභාවය අභියෝග කරන කිසි පෙත්සමක් ඉදිරිපත් කරනු නොලැබූ අවස්ථාවක, එවැනි ජනමත විචාරණයක වලංගුභාවය අභියෝග කරන පෙත්සමක් ඊට අදාළ නීතිය යටතේ ඉදිරිපත් කළ හැක්කේ යම් කාල සීමාවක් ඇතුළත ද ඒ කාල සීමාව ඉකුත් වීමෙන් පසුව ද ;

46 - දහහතර වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 4 වැනි වගන්තිය මගින් "ජනතාව විසින් යථා පරිදි අනුමත කරන ලද බව මෙයින් සහතික කරමි" යන වචන වෙනුවට මෙම කොටස ආදේශ කරන ලදී.

(ආ) ඒ පනත් කෙටුම්පත ජනතාව විසින් අනුමත කරන ලද්දේ යම් ජනමත විචාරණයක දී ද ඒ ජනමත විචාරණයේ වලංගුභාවය අභියෝග කරන පෙත්සමක් ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක, ඒ ජනමත විචාරණය වලංගු බවට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කරනු ලැබීමෙන් පසුව ද;

මිස, නොකළ යුත්තේ ය.]

ඒ සෑම සහතිකයක් ම අවසානාත්මක හා තීරණාත්මක වන්නේ ය. ඒ සහතිකය පිළිබඳව කවර වූ හෝ අධිකරණයක දී ප්‍රශ්න නොකළ යුත්තේ ය.

(3) අවස්ථාචෝචිත පරිදි ජනාධිපතිවරයා ගේ හෝ කථානායකවරයාගේ සහතිකය පනත් කෙටුම්පතක් මත සටහන් කරනු ලැබූ පසු එම පනත් කෙටුම්පත නීතිය බවට පත් වන අවස්ථාවක ඒ පනතෙහි වලංගුභාවය පිළිබඳව පරීක්ෂා කිරීම, ඒ පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම හෝ කවර වූ හෝ ආකාරයකින් ප්‍රශ්න කිරීම කිසිම අධිකරණයක් හෝ විනිශ්චය අධිකාරයක් හෝ විසින් නොකළ යුත්තේ ය.

**මන්ත්‍රීවරයන් නෙරපීම සහ ප්‍රජා අශක්නුතා නියම කිරීම.**

81. (1) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 7 දරන විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පිහිටුවන ලද හා ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයකු, අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයකු, මහාධිකරණයේ විනිශ්චයකාරවරයකු හෝ දිසා අධිකරණයේ විනිශ්චයකාරවරයකු වන සාමාජිකයකුගෙන් හෝ එසේ වූ සාමාජිකයන්ගෙන් හෝ සමන්විත විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් විසින්, යම් කිසි තැනැත්තකු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වීමට පෙර හෝ පසුව කරන ලද හෝ නොකර හරින ලද යම් ක්‍රියාවක් හේතුකොටගෙන ඒ තැනැත්තා ප්‍රජා අශක්නුතාවන්ට යටත් කළ යුතු යයි නිර්දේශ කරනු ලබන අවස්ථාවක (නොපැමිණි මන්ත්‍රීවරයන් ද ඇතුළුව) පාර්ලිමේන්තුවේ මුළු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවක් පක්ෂව ඡන්දය දෙනු ලැබ සම්මත කරනු ලැබූ යෝජනා සම්මතයක් මගින්-

(අ) ඒ තැනැත්තා විෂයෙහි අවුරුදු හතක් නොඉක්මවන කාලයක් සඳහා ප්‍රජා අශක්නුතාවන් නියම කිරීම; සහ

(ආ) ඒ තැනැත්තා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් නම් ඔහු පාර්ලිමේන්තුවෙන් නෙරපීම ද,

කළ හැක්කේ ය.

විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් සාමාජිකයන් එක් කෙනෙකුට වැඩි ගණනකින් සමන්විත වන අවස්ථාවක ඒ කොමිෂන් සභාව විසින් කරන ලද නිර්දේශයක් සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ සාමාජිකයන් අතර මතභේදයක් වුවහොත් සාමාජිකයන් වැඩි

දෙනෙකුගේ නිර්දේශය කොමිෂන් සභාවේ නිර්දේශය වන්නේ ය; එම නිර්දේශය සියලු කාර්ය සඳහා කොමිෂන් සභාවේ නිර්දේශය ලෙස සැලකිය යුත්තේ ය.

(2) එවැනි කිසිම යෝජනා සම්මතයක් අමාත්‍ය මණ්ඩලයේ අනුමතය ඇතිව අග්‍රාමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරනු ලැබුවහොත් මිස කථානායකවරයා විසින් භාර ගැනීම හෝ පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයෙහි ඇතුළත් කිරීම හෝ නොකළ යුත්තේ ය.

(3) මේ ව්‍යවස්ථාවේ ඉහතින් වූ විධිවිධානවලට අනුකූලව සම්මත කරනු ලැබූ සෑම යෝජනා සම්මතයක් මත ම කථානායකවරයා විසින් මෙහි පහත දැක්වෙන ආකෘතියෙහි වූ සහතිකයක් තම අත්සන ඇතිව සටහන් කළ යුතු යː-

> "මෙම යෝජනා සම්මතය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 81 වැනි ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව පාර්ලිමේන්තුව විසින් යථා පරිදි සම්මත කරන ලද බව මෙයින් සහතික කරමි."

එවැනි සෑම සහතිකයක් ම සියලු කාර්ය සඳහා තීරණාත්මක වන අතර, කිසිම අධිකරණයක දී ඒ පිළිබඳව ප්‍රශ්න නොකළ යුත්තේ ය. තව ද, කවර වූ හෝ ආකාරයක හේතුවක් මත කිසිම අධිකරණයක් හෝ විනිශ්චය අධිකාරයක් විසින් ඒ යෝජනා සම්මතයේ වලංගුභාවය ගැන විභාග කිරීම, මතයක් පළ කිරීම හෝ කවර වූ හෝ ආකාරයකින් ප්‍රශ්න කිරීම හෝ නොකළ යුත්තේ ය.

(4) මේ ව්‍යවස්ථාවේ "දිසා අධිකරණය" යන්නෙන්, පවත්නා නීතියෙන් ඇති කොට පිහිටුවන ලද දිසා අධිකරණයක් අදහස් වන අතර, දිසා අධිකරණය විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතලවලට සහ කර්තව්‍යවලට අනුරූප වූ හෝ සාරානුකූලව සමාන වූ බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් ඇති කරනු ලැබිය හැකි අධිකරණයක් ද ඊට ඇතුළත් වේ.

## XII වැනි පරිච්ඡේදය

### ව්‍යවස්ථාදායකය

### ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම

**82.** (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ යම්කිසි විධිවිධානයක් සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතක් වේ නම් එසේ පරිච්ඡින්න කරනු ලබන්නා වූ හෝ වෙනස් කරනු ලබන්නා වූ හෝ එකතු කරනු ලබන්නා වූ විධිවිධාන ද ආනුෂංගික සංශෝධනයක් වෙතොත් එය ද, පනත් කෙටුම්පතෙහි නිශ්චිත ව ප්‍රකාශිතව ඇත්නම් මිස ද ඒ පනත් කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා වන පනතක් බවට එහි දීර්ඝ නාමයෙහි විස්තර කොට ඇත්නම් මිස ද ඒ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් නොකළ යුත්තේ ය.

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම ප්‍රකාශිතව ම විය යුතු බව.**

(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පරිච්ඡින්න කිරීම සඳහා වූ පනත් කෙටුම්පතක් වේ නම් ඒ පනත් කෙටුම්පතෙහි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනුවට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ප්‍රතියෝජනය කරන විධිවිධාන ඇතුළත් වේ නම් මිසද ඒ පනත් කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පරිච්ඡින්න කොට ඒ වෙනුවට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ප්‍රතියෝජනය කිරීම පිණිස වන පනතක් බවට එහි දීර්ඝ නාමයෙහි විස්තර කොට ඇත්නම් මිස ද ඒ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් නොකළ යුත්තේ ය.

(3) කථානායකවරයාගේ මතය අනුව යම්කිසි පනත් කෙටුම්පතක් මේ ව්‍යවස්ථාවේ (1) වැනි අනුව්‍යවස්ථාවේ හෝ (2) වැනි අනුව්‍යවස්ථාවේ හෝ නියමයන්ට අනුකූලව පිළියෙළ වී නැත්නම් ඒ නියමයන්ට අනුකූල වන පරිදි ඒ පනත් කෙටුම්පත සංශෝධනය කරනු ලැබුවහොත් මිස ඒ පනත් කෙටුම්පත සම්මත කර ගැනීමට අවශ්‍ය පියවර නොගත යුතු යයි ඔහු විසින් විධාන කළ යුත්තේ ය.

(4) මේ ව්‍යවස්ථාවේ ඉහතින් වූ විධිවිධානවලට කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථාවේ (1) වැනි අනුව්‍යවස්ථාවේ හෝ (2) වැනි අනුව්‍යවස්ථාවේ හෝ නියමයන්ට අනුකූල වන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුව විසින් සංශෝධනය කිරීම නීත්‍යනුකූල වන්නේ ය. එසේ වුව ද, එසේ සංශෝධනය කරනු ලැබූ විට පනත් කෙටුම්පත ඒ නියමයන්ට අනුකූල විය යුත්තේ ය.

(5) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ යම්කිසි විධිවිධානයක් සංශෝධනය කිරීම සඳහා වූ හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පරිච්ඡින්න කොට ඒ වෙනුවට වෙනත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ප්‍රතියෝජනය කිරීම සඳහා වූ හෝ යම්කිසි පනත් කෙටුම්පතකට පක්ෂව දෙන ලද ඡන්ද සංඛ්‍යාව (නොපැමිණි මන්ත්‍රීවරයන් ද ඇතුළුව) මුළු මන්ත්‍රී සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට අඩු නොවුවහොත් සහ 80 වැනි ව්‍යවස්ථාවේ හෝ 79 වැනි ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව, අවස්ථාවෝචිත පරිදි ජනාධිපතිවරයා විසින් හෝ කථානායකවරයා විසින් හෝ ස්වකීය

අත්සන ඇතිව සහතිකයක් එහි සටහන් කරනු ලැබූ විට ඒ පනත් කෙටුම්පත නීතිය බවට පත් වන්නේ ය.

(6) යම්කිසි නීතියක යම්කිසි විධිවිධානයක්, මේ ව්‍යවස්ථාවේ ඉහතින් වූ නියමයන්ට අනුකූලව පනවනු ලැබුවහොත් මිස එයින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නැතහොත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ යම්කිසි විධිවිධානයක් සංශෝධනය නොවන්නේ ය ; පරිච්ඡින්න නොවන්නේ ය ; ප්‍රතියෝජනය නොවන්නේ ය. තව ද, එසේ සංශෝධනය වන්නාක් සේ හෝ පරිච්ඡින්න වන්නාක් සේ හෝ ප්‍රතියෝජනය වන්නාක් සේ හෝ නොසැලකිය යුත්තේ ය. තව ද, එසේ අර්ථ නිරූපණය නොකළ යුත්තේ ය ; තේරුම් නොගත යුත්තේ ය.

(7) මේ පරිච්ඡේදයෙහි "සංශෝධනය" යන්නට පරිච්ඡින්න කිරීම, වෙනස් කිරීම සහ එකතු කිරීම ද ඇතුළත් වේ.

**ඇතැම් පනත් කෙටුම්පත් ජනමත විචාරණයක දී අනුමත කිරීම.**

83. 82 වැනි ව්‍යවස්ථාවේ විධිවිධානයන්හි පටහැනිව කුමක් සඳහන්ව ඇත ද -

(අ) 1 වැනි, 2 වැනි, 3 වැනි, 6 වැනි, 7 වැනි, 8 වැනි, 9 වැනි, 10 වැනි සහ 11 වැනි ව්‍යවස්ථාවල හෝ මේ ව්‍යවස්ථාවෙහි හෝ විධිවිධාන සංශෝධනය කිරීම සඳහා වූ හෝ පරිච්ඡින්න කොට ප්‍රතියෝජනය කිරීම සඳහා වූ හෝ ඒ ව්‍යවස්ථාවල යම් විධිවිධානයකට අනනුකූල වන්නා වූ හෝ පනත් කෙටුම්පතකට ; සහ

(ආ) 30 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනුව්‍යවස්ථාවේ නැතහොත් 62 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනුව්‍යවස්ථාවේ විධිවිධාන සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කොට ප්‍රතියෝජනය කිරීම හෝ සඳහා වූ නැතහොත් ඒ විධිවිධානවලට අනනුකූල වන්නා වූ ද, අවස්ථාවෝචිත පරිදි ජනාධිපතිවරයාගේ ධුර කාලය සාවුරුද්දක් ඉක්මවා දීර්ඝ කරන්නා වූ නැතහොත් පාර්ලිමේන්තුව පවත්නා කාලය සාවුරුද්දක් ඉක්මවා දීර්ඝ කරන්නා වූ ද පනත් කෙටුම්පතකට,

පක්ෂව දෙන ලද ඡන්ද සංඛ්‍යාව (නොපැමිණි මන්ත්‍රීවරයන් ද ඇතුළුව) මුළු මන්ත්‍රී සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට අඩු නොවේ නම් ද, ජනමත විචාරණයක දී එය ජනතාව විසින් අනුමත කොට ඇත්නම් ද, 80 වැනි ව්‍යවස්ථාවට අනුකූලව ජනාධිපතිවරයා විසින් එහි සහතිකයක් ස්වකීය අත්සන ඇතිව සටහන් කොට ඇත්නම් ද, ඒ පනත් කෙටුම්පත නීතිය බවට පත් වන්නේ ය.

**ආණ්ඩුක්‍රම ව්‍යස්ථාවට අනනුකූල පනත් කෙටුම්පත්.**

84. (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ යම්කිසි විධිවිධානයක් සංශෝධනය කිරීම සඳහා හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පරිච්ඡින්න කොට ප්‍රතියෝජනය කිරීම සඳහා හෝ නොවන, එහෙත් ආණ්ඩුක්‍රම ව්‍යස්ථාවේ යම්කිසි විධිවිධානයකට අනනුකූල වූ පනත් කෙටුම්පතක්, 82 වැනි ව්‍යවස්ථාවේ (1) වැනි අනු ව්‍යවස්ථාවේ හෝ (2) වැනි

අනු ව්‍යවස්ථාවේ හෝ නියමයන්ට අනුකූලව ක්‍රියා නොකොට පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කළ හැක්කේ ය.

(2) පනත් කෙටුම්පතක් මේ ව්‍යවස්ථාවේ නියමිත විශේෂ බහුතර ඡන්දයෙන් සම්මත කිරීමට අපේක්ෂා කරනු ලබන බව අමාත්‍ය මණ්ඩලය විසින් සහතික කොට ඇත්තා වූ හෝ පනත් කෙටුම්පතක් එකී විශේෂ බහුතර ඡන්දයෙන් සම්මත කළ යුතු බව ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කොට ඇත්තා වූ හෝ අවස්ථාවක ඒ පනත් කෙටුම්පතට පක්ෂව දෙන ලද ඡන්ද සංඛ්‍යාව (නොපැමිණි මන්ත්‍රීවරයන් ද ඇතුළුව) මුළු මන්ත්‍රී සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට අඩු නොවේ නම් සහ 80 වැනි ව්‍යවස්ථාවේ හෝ 79 වැනි ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව, අවස්ථාවෝචිත පරිදි ජනාධිපතිවරයා විසින් හෝ කථානායකවරයා විසින් හෝ එහි සහතිකයක් ස්වකීය අත්සන ඇතිව සටහන් කරනු ලැබූ විට පමණක් ඒ පනත් කෙටුම්පත නීතිය බවට පත් වන්නේ ය.

(3) එවැනි පනත් කෙටුම්පතක් නීතියක් ලෙස පනවනු ලැබූ විට ඒ පනතින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නැතහොත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ යම්කිසි විධිවිධානයක් සංශෝධනය නොවන්නේ ය; පරිච්ඡින්න නොවන්නේ ය; ප්‍රතියෝජනය නොවන්නේ ය.

තව ද, ඒ පනතින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව නැතහොත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ යම්කිසි විධිවිධානයක් සංශෝධනය වන්නාක් සේ හෝ පරිච්ඡින්න වන්නාක් සේ හෝ ප්‍රතියෝජනය වන්නාක් සේ හෝ නොසැලකිය යුත්තේ ය; තව ද, එසේ අර්ථ නිරූපණය නොකළ යුත්තේ ය; තේරුම් නොගත යුත්තේ ය. එවැනි පනතක් පැමිණ ඡන්දය දෙන්නා වූ මන්ත්‍රීවරයන්ගේ බහුතර ඡන්දයෙන්, ඉන්පසුව පරිච්ඡින්න කළ හැක්කේ ය.

## XIII වැනි පරිච්ඡේදය

### ජනමත විචාරණය

**පනත් කෙටුම්පත් ජනමත විචාරණයක් මගින් ජනතාව වෙත ඉදිරිපත් කිරීම.**

**85.** (1) ජනමත විචාරණයක් මගින් ජනතාව වෙත ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන පනත් කෙටුම්පතක් බවට හෝ පනත් කෙටුම්පතක විධිවිධානයක් බවට අමාත්‍ය මණ්ඩලය විසින් සහතික කොට ඇත්තා වූ සෑම පනත් කෙටුම්පතක් ම හෝ පනත් කෙටුම්පතක සෑම විධිවිධානයක් ම ද ජනමතවිචාරණයක දී ජනතාවගේ අනුමැතිය ලැබිය යුතු පනත් කෙටුම්පතක් බවට හෝ පනත් කෙටුම්පතක විධිවිධානයක් බවට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කොට ඇත්තා වූ සෑම පනත් කෙටුම්පතක් ම හෝ පනත් කෙටුම්පතක සෑම විධිවිධානයක්ම ද ඒ පනත් කෙටුම්පතකට පක්ෂව දෙන ලද ඡන්ද සංඛ්‍යාව (නොපැමිණි මන්ත්‍රීවරයන් ද ඇතුළුව) මුළු මන්ත්‍රී සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට අඩු නොවේ නම්, ජනාධිපතිවරයා විසින් ජනමත විචාරණයක් මගින් ජනතාව වෙත ඉදිරිපත් කළ යුත්තේ ය.

[47] [ 86 (2) ඉවත් කරන ලදී. ]

(3) ජනමත විචාරණයක් මගින් ජනතාව වෙත ඉදිරිපත් කරන ලද යම් පනත් කෙටුම්පතක් හෝ යම් පනත් කෙටුම්පතක යම් විධිවිධානයක් හෝ ඒ ජනමත විචාරණයේ දී දෙන ලද වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් ඒකාන්ත බහුතර ඡන්දයකින් අනුමත කරනු ලැබුවහොත්, ඒ පනත් කෙටුම්පත හෝ ඒ විධිවිධානය හෝ ජනතාව විසින් අනුමත කරන ලද සේ සැලකිය යුත්තේ යඃ

එසේ වුව ද, දෙන ලද වලංගු ඡන්ද සංඛ්‍යාවේ මුළු ගණන ඡන්ද හිමි නාමලේඛනයේ ඇතුළත් ඡන්ද හිමියන්ගේ මුළු සංඛ්‍යාවෙන් තුනෙන් දෙකක් නොඉක්මවන අවස්ථාවක දී, ඡන්ද හිමියන්ගේ මුළු සංඛ්‍යාවෙන් තුනෙන් එකකට නොඅඩු සංඛ්‍යාවක ඡන්දයෙන් ඒ පනත් කෙටුම්පත හෝ විධිවිධානය අනුමත කරනු ලැබුවහොත් පමණක් ඒ පනත් කෙටුම්පත හෝ විධිවිධානය ජනතාව විසින් අනුමත කරන ලද සේ සැලකිය යුත්තේ ය.

**ජාතික වැදගත්කමකින් යුත් කාරණා ජනමත විචාරණ මගින් ජනතාව වෙත ඉදිරිපත් කිරීම.**

**86.** ජනාධිපතිවරයාගේ මතය අනුව ජාතික වැදගත්කමකින් යුක්ත යයි ඔහු සලකන්නා වූ යම් කාරණයක් 85 වැනි ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව ජනාධිපතිවරයා විසින් ජනමත විචාරණයක් මගින් ජනතාව වෙත ඉදිරිපත් කළ හැක්කේ ය.

**කාර්ය විධානය සඳහා පාර්ලිමේන්තුව විධිවිධාන යෙදිය යුතු බව.**

**87.** (1) සෑම ජනමත විචාරණයක් ම මැතිවරණ කොමසාරිස්වරයා විසින් පැවැත්විය යුතු අතර ඔහු විසින් එහි ප්‍රතිඵලය ජනාධිපතිවරයා වෙත දැනුම් දිය යුත්තේ ය.

---

47 - දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 19 වැනි වගන්තිය මගින් 85 වන ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාව ඉවත් කරන ලදී.

(2) ජනමත විචාරණ මගින් පනත් කෙටුම්පත් සහ ජාතික වැදගත්කමකින් යුත් කාරණා ජනතාව වෙත ඉදිරිපත් කිරීම සඳහා වූ කාර්ය විධානය පිළිබඳ සහ එවැනි ජනමත විචාරණයක දී භාවිත කළ යුතු ඡන්දහිමි නාමලේඛන පිළිබඳ සියලු කරුණු සඳහා ද, ඒ හා සම්බන්ධ වැරදි නියම කොට දැක්වීම හා ඒ වැරදි සඳහා වූ දඬුවම් නියම කොට දැක්වීම සඳහා ද, ඊට අවශ්‍ය හෝ ආනුෂංගික වෙනත් සියලු කරුණු සඳහා ද, පාර්ලිමේන්තුව විසින් නීති පැනවීමෙන් විධිවිධාන සැලැස්විය යුත්තේ ය.

## XIV වැනි පරිච්ඡේදය

### ඡන්ද බලය, ඡන්ද විමසීම් හා මැතිවරණ

**ඡන්ද හිමියකු වීමේ අයිතිවාසිකම.**

**88.** මතු දැක්වෙන විධිවිධාන අනුව ඡන්ද බලය අහිමි වේ නම් මිස, සෑම තැනැත්තෙක් ම ජනාධිපතිවරයා තෝරා පත් කිරීමේ ඡන්ද විමසීමේ දී සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත් කිරීමේ මැතිවරණයේ දී ඡන්ද හිමියකු වීමට හෝ යම්කිසි ජනමත විචාරණයක දී ඡන්දය දීමට හෝ සුදුස්සෙක් වන්නේ ය:

එසේ වුව ද, එවැනි කිසිම තැනැත්තකුට ඔහුගේ නම උචිත ඡන්දහිමි නාමලේඛනයෙහි ඇතුළත් කර ඇත්නම් මිස ඡන්දය දීමට හිමිකම නොලැබිය යුත්තේ ය.

**ඡන්ද බලය අහිමිවීම.**

**89.** (අ) යම්කිසි තැනැත්තෙක් ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් නොවේ නම්, ඒ තැනැත්තා ජනාධිපතිවරයා තෝරා පත් කිරීමේ ඡන්ද විමසීමක දී හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත් කිරීමේ මැතිවරණයක දී හෝ ඡන්ද හිමියකු වීමට හෝ ජනමත විචාරණයක දී ඡන්දය දීමට හෝ සුදුස්සෙක් නොවන්නේ ය.

(ආ) යම්කිසි තැනැත්තෙක් 101 වැනි ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ නීතියෙන් නිශ්චය කොට ඇති සුදුසුකම් ලැබීමේ දිනයේ දී අටළොස් විය සම්පූර්ණ කර නොමැති නම් ඒ තැනැත්තා ජනාධිපතිවරයා තෝරා පත් කිරීමේ ඡන්ද විමසීමක දී හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත් කිරීමේ මැතිවරණයක දී හෝ ඡන්ද හිමියකු වීමට හෝ ජනමත විචාරණයක දී ඡන්දය දීමට හෝ සුදුසුසෙක් නොවන්නේ ය.

(ඇ) යම්කිසි තැනැත්තෙක් සිහිවිකල තැනැත්තකු ලෙස ශ්‍රී ලංකාවේ බලපවත්නා යම්කිසි නීතියක් යටතේ තීරණය කරනු ලැබ සිටී නම් හෝ විනිශ්චය කරනු ලැබ සිටී නම් හෝ ඒ තැනැත්තා ජනාධිපතිවරයා තෝරා පත් කිරීමේ ඡන්ද විමසීමක දී හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත් කිරීමේ මැතිවරණයක දී හෝ ඡන්ද හිමියකු වීමට හෝ ජනමත විචාරණයක දී ඡන්දය දීමට හෝ සුදුස්සෙක් නො වන්නේ ය.

(ඈ) යම්කිසි තැනැත්තෙක් අවුරුදු දෙකකට නොඅඩු කාලයක් බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කළ හැකි වරදකට කවර වූ හෝ අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබීමෙන් පසුව නියම කරන ලද හය මාසයකට නොඅඩු කාලයකට කවර වූ හෝ ආකාරයක බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් විඳිමින් සිටී නම් නැතහොත් ගත වූ සත් අවුරුදු කාලය තුළ ඒ දඬුවම සම්පූර්ණයෙන් ම විඳ සිටියේ නම් නැතහොත් මරණ දණ්ඩනයට යටත්ව සිටී නම් නැතහොත් එවැනි දණ්ඩන නියමයක් කියාවේ යෙදවීම වෙනුවට හය මාසයකට නොඅඩු කාලයකට බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් විඳිමින් සිටී නම් නැතහොත් ගත වූ සත් අවුරුදු කාලය තුළ ඒ දඬුවම සම්පූර්ණයෙන් විඳ සිටියේ නම් ඒ තැනැත්තා ජනාධිපතිවරයා තෝරා පත් කිරීමේ ඡන්ද විමසීමක දී හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත් කිරීමේ

මැතිවරණයක දී හෝ ඡන්ද හිමියකු වීමට හෝ ජනමත විචාරණයක දී ඡන්දය දීමට හෝ සුදුස්සෙක් නොවන්නේ යඃ

එසේ වුව ද, මේ ඡේදය යටතේ නුසුදුස්සකු වූ කවර වූ හෝ තැනැත්තකුට කොන්දේසි රහිත සමාවක් දෙන ලද්දේ නම්, ඒ සමාව දුන් දිනයේ සිට ඒ නුසුදුසුකම නැති වී යන්නේ ය.

(ඉ) (i) යම්කිසි තැනැත්තකු 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාවේ 52 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය හෝ 53 වැනි වගන්තිය හෝ යටතේ යම්කිසි වරදකට හෝ එකී වගන්ති දෙකින් කවර වගන්තියක් හෝ යටතේ යම්කිසි වරදකට අනුරූප වන්නා වූ ද, ජනමත විචාරණ හෝ ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ ඡන්ද විමසීම හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත් කර ගැනීමේ මැතිවරණ හෝ සම්බන්ධයෙන් තත්කාලයේ බලපවත්නා නීතිය යටතේ වූ ද වරදකට හෝ වරදකරු කරනු ලැබුවහොත් අන්තිම වරට එසේ වරදකරු කරනු ලැබූ දින පටන් සත් වර්ෂයක් ඉකුත් වී නැත්නම් ඒ තැනැත්තා ජනාධිපතිවරයා තෝරා පත් කිරීමේ ඡන්ද විමසීමක දී හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත්රීමේ මැතිවරණයක දී හෝ ඡන්ද හිමියකු වීමට හෝ ජනමත විචාරණයක දී ඡන්දය දීමට හෝ සුදුස්සෙක් නොවන්නේ ය.

(ii) යම් කිසි තැනැත්තකු 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාව යටතේ දූෂණ ක්‍රියාවකට හෝ එකී යම්කිසි දූෂණ කියාවකට අනුරූප වන්නා වූ ද, ජනමත විචාරණ හෝ ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ ඡන්ද විමසීම හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත් කර ගැනීමේ මැතිවරණ හෝ සම්බන්ධයෙන් තත්කාලයේ බලපවත්නා නීතිය යටතේ වූ ද වරදකට හෝ වරදකරු කරනු ලැබුවහොත් අන්තිම වරට එසේ වරදකරු කරනු ලැබූ දින පටන් සත් වර්ෂයක් ඉකුත් වී නැත්නම් ඒ තැනැත්තා ජනාධිපතිවරයා තෝරා පත් කිරීමේ ඡන්ද විමසීමක දී හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත් කිරීමේ මැතිවරණයක දී හෝ ඡන්ද හිමියකු වීමට හෝ ජනමත විචාරණයක දී ඡන්දය දීමට හෝ සුදුස්සෙක් නොවන්නේ ය.

(iii) යම්කිසි තැනැත්තකු 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාව යටතේ හෝ ජනමත විචාරණ හෝ ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීම හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත් කර ගැනීමේ මැතිවරණ හෝ සම්බන්ධයෙන් තත්කාලයේ බලපවත්නා යම්කිසි නීතියක් යටතේ හෝ යම්කිසි දූෂණ ක්‍රියාවකට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වූ පසු විනිශ්චයකාරවරයකු විසින් වරදකරු බව නිගමනය කොට වාර්තා කරනු ලැබුවහොත් අන්තිම වරට එසේ වාර්තා කරනු ලැබූ දින පටන් සත් වර්ෂයක් ඉකුත් වී නැත්නම්, ඒ තැනැත්තා ජනාධිපතිවරයා තෝරා පත් කිරීමේ ඡන්ද විමසීමක දී හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත් කිරීමේ මැතිවරණයක දී හෝ ඡන්ද හිමියකු වීමට හෝ ජනමත විචාරණයක දී ඡන්දය දීමට හෝ සුදුස්සෙක් නොවන්නේ ය.

(iv) යම්කිසි තැනැත්තකු අල්ලස් පනතේ විධිවිධාන යටතේ හෝ මතු පනවනු ලබන්නා වූ ද, අල්ලස් පනතට අනුරූප වන්නා වූ ද, යම්කිසි නීතියක විධිවිධාන යටතේ හෝ අල්ලස් චෝදනාවකට වරදකරු කරනු ලැබුවහොත් හෝ වරදකරු යයි තීරණය කරනු ලැබුවහොත් හෝ අන්තිම වරට එසේ වරදකරු කරනු ලැබූ හෝ වරදකරු යයි තීරණය කරනු ලැබූ දින පටන් සත් වර්ෂයක් ඉකුත් වී නැත්නම් ඒ තැනැත්තා ජනාධිපතිවරයා තෝරා පත් කිරීමේ ඡන්ද විමසීමක දී හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත් කිරීමේ මැතිවරණයක දී හෝ ඡන්ද හිමියකු වීමට හෝ ජනමත විචාරණයක දී ඡන්දය දීමට හෝ සුදුස්සෙක් නොවන්නේ ය.

(ඊ) (i) යම්කිසි තැනැත්තකු පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ 77 වැනි වගන්තියේ පටන් 82 වැනි වගන්තිය තෙක් වූ (ඒ වගන්ති දෙක ම ඇතුළුව) වගන්තිවල විධිවිධාන යටතේ වූ වරදකට හෝ එකී වගන්ති යටතේ යම්කිසි වරදකට අනුරූප වන්නා වූ ද, මතු පනවනු ලබන්නා වූ යම්කිසි නීතියක් යටතේ වූ ද වරදකට හෝ වරදකරු කරනු ලැබුවහොත් එසේ අන්තිම වරට වරදකරු කරනු ලැබූ දින පටන් පස් වර්ෂයක් ඉකුත් වී නැත්නම් ඒ තැනැත්තා ජනාධිපතිවරයා තෝරා පත් කිරීමේ ඡන්ද විමසීමක දී හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත් කිරීමේ මැතිවරණයක දී හෝ ඡන්ද හිමියකු වීමට හෝ ජනමත විචාරණයක දී ඡන්දය දීමට හෝ සුදුස්සෙක් නොවන්නේ ය.

(ii) යම්කිසි තැනැත්තකු මහජන ආයතන (දූෂණ වැළැක්වීමේ) ආඥා පනතේ 2 වැනි සහ 3 වැනි වගන්තිවල විධිවිධාන යටතේ වරදකට හෝ එකී වරදට අනුරූප වන්නා වූ ද, මතු පනවනු ලබන්නා වූ යම්කිසි නීතියක් යටතේ වූ ද වරදකට හෝ වරදකරු කරනු ලැබුවහොත් එසේ අන්තිම වරට වරදකරු කරනු ලැබූ දින පටන් පස් වර්ෂයක් ඉකුත් වී නැත්නම් ඒ තැනැත්තා ජනාධිපතිවරයා තෝරා පත් කිරීමේ ඡන්ද විමසීමක දී හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත් කිරීමේ මැතිවරණයක දී හෝ ඡන්ද හිමියකු වීමට හෝ ජනමත විචාරණයක දී ඡන්දය දීමට හෝ සුදුස්සෙක් නොවන්නේය.

(උ) (i) යම්කිසි තැනැත්තකු 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාව යටතේ නීති විරෝධී ක්‍රියාවකට හෝ ජනමත විචාරණ සම්බන්ධයෙන් නැතහොත් ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ ඡන්ද විමසීම හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත් කර ගැනීමේ මැතිවරණ සම්බන්ධයෙන් තත්කාලයේ බලපවත්නා නීතිය යටතේ වූ ද, ඉහත කී නීති විරෝධී ක්‍රියාවකට අනුරූප වන්නා වූ ද වරදකට හෝ වරදකරු කරනු ලැබුවහොත් එසේ අන්තිම වරට වරදකරු කරනු ලැබූ දින පටන් තුන් වර්ෂයක් ඉකුත් වී නැත්නම් ඒ තැනැත්තා ජනාධිපතිවරයා තෝරා පත් කිරීමේ ඡන්ද විමසීමක දී හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත් කිරීමේ මැතිවරණයක දී හෝ ඡන්ද හිමියකු වීමට හෝ ජනමත විචාරණයක දී ඡන්දය දීමට හෝ සුදුස්සෙක් නොවන්නේ ය.

(ii) යම්කිසි තැනැත්තකු 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාව යටතේ නීති විරෝධී ක්‍රියාවකට හෝ ජනමත විචාරණ සම්බන්ධයෙන් නැතහොත් ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ ඡන්ද විමසීම හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත් කර ගැනීමේ මැතිවරණ හෝ සම්බන්ධයෙන් තත්කාලයේ බලපවත්නා යම්කිසි නීතියක් යටතේ නීති විරෝධී ක්‍රියාවකට හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වූ පසු විනිශ්චයකාරවරයකු විසින් වරදකරු බව නිගමනය කොට වාර්තා කරනු ලැබුවහොත් අන්තිම වරට එසේ වාර්තා කරනු ලැබූ දින පටන් තුන් වර්ෂයක් ඉකුත් වී නැත්නම් ඒ තැනැත්තා ජනාධිපතිවරයා තෝරා පත් කිරීමේ ඡන්ද විමසීමක දී හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත් කිරීමේ මැතිවරණයක දී හෝ ඡන්ද හිමියකු වීමට හෝ ජනමත විචාරණයක දී ඡන්දය දීමට හෝ සුදුස්සෙක් නොවන්නේ ය.

(ඉ) යම්කිසි තැනැත්තකු විෂයෙහි ප්‍රජා අශක්නුතා නියම කිරීම සඳහා වූ යෝජනා සම්මතයක් 81 වැනි ව්‍යවස්ථාව අනුව සම්මත කරනු ලැබ, ඒ යෝජනා සම්මතයෙහි දැක්වෙන ප්‍රජා අශක්නුතා කාලසීමාව අවසන් වී නොමැති නම්, ඒ තැනැත්තා ජනාධිපතිවරයා තෝරා පත්කිරීමේ ඡන්ද විමසීමක දී හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත් කිරීමේ මැතිවරණයක දී හෝ ඡන්ද හිමියකු වීමට හෝ ජනමත විචාරණයක දී ඡන්දය දීමට හෝ සුදුස්සෙක් නොවන්නේ ය.

(එ) (i) යම්කිසි තැනැත්තකු දණ්ඩ නීති සංග්‍රහයේ 188 වැනි වගන්තියේ පටන් 201 වැනි වගන්තිය තෙක් වූ (ඒ වගන්ති දෙක ම ඇතුළුව) වගන්තිවල විධිවිධාන යටතේ වූ යම් වරදකට හෝ එකී වගන්ති යටතේ යම් වරදකට අනුරූප වන්නා වූ ද, මතු පනවනු ලබන්නා වූ නීතියක් යටතේ වූ ද වෙනත් වරදකට හෝ වරදකරු කරනු ලැබුවහොත් එසේ වරදකරු කරනු ලැබූ දින පටන් සත් වර්ෂයක් ඉකුත් වී නැත්නම් ඒ තැනැත්තා ජනාධිපතිවරයා තෝරා පත් කිරීමේ ඡන්ද විමසීමක දී හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත් කිරීමේ මැතිවරණයක දී හෝ ඡන්ද හිමියකු වීමට හෝ ජනමත විචාරණයක දී ඡන්දය දීමට හෝ සුදුස්සෙක් නොවන්නේ ය.

(ii) යම්කිසි තැනැත්තකු 81 වැනි ව්‍යවස්ථාවේ නිශ්චිතව සඳහන් සාමාජිකයාගෙන් හෝ සාමාජිකයන්ගෙන් සමන්විත යම් විශේෂ ජනාධිපති කොමිෂන් සභාවකට පහත සඳහන් හේතුවකින්, එනම් -

(1) ඒ කොමිෂන් සභාව විසින් නිකුත් කිරීමට නීතියෙන් බලය පැවරී ඇති යම් සිතාසියක සඳහන් වේලාවේ දී සහ ස්ථානයේ දී ඒ කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටීම, කොමිෂන් සභාවේ මතය අනුව සාධාරණ වූ හේතුවක් නොමැතිව, පැහැර හැරීමේ හේතුවෙන්; හෝ

(2) ප්‍රතිඥා දීම හෝ දිවුරුම් දීම ප්‍රතික්ෂේප කිරීමේ හෝ ඒ කොමිෂන් සභාව විසින් විභාග කරනු ලැබීමට විධාන කරනු ලැබ ඇති කාරණාවලට අදාළව ඒ තැනැත්තාගෙන්

අසනු ලබන යම් ප්‍රශ්නයකට, කොමිෂන් සභාවේ මතය අනුව සාධාරණ වූ හේතුවක් නොමැතිව, පිළිතුරු දීම ප්‍රතික්ෂේප කිරීමේ හෝ පැහැර හැරීමේ හෝ හේතුවෙන්; හෝ

(3) ඒ කොමිෂන් සභාව විසින් විභාග කරනු ලැබීමට ඇති යම් යම් කාරණා පිළිබඳව සත්‍යය දැන ගැනීම සඳහා ඒ කොමිෂන් සභාවේ මතය අනුව අවශ්‍ය වන්නා වූ ද, ඒ තැනැත්තාගේ සන්තකයෙහි හෝ බලයෙහි තිබෙන්නා වූ ද, යම් ලේඛනයක් හෝ දෙයක්, කොමිෂන් සභාවේ මතය අනුව සාධාරණ වූ හේතුවක් නොමැතිව, ඒ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම හෝ පෙන්වා සිටීම ප්‍රතික්ෂේප කිරීමේ හෝ පැහැර හැරීමේ හේතුවෙන්,

අපහාස කිරීමේ හෝ අගෞරව කිරීමේ හෝ වරදකට වරදකරු කරනු ලැබූ දින පටන් සත් වර්ෂයක් ඉකුත් වී නැත්නම්, ඒ තැනැත්තා ජනාධිපතිවරයා තෝරා පත් කිරීමේ ඡන්ද විමසීමක දී හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත් කිරීමේ මැතිවරණයක දී හෝ ඡන්ද හිමියකු වීමට හෝ ජනමත විචාරණයක දී ඡන්දය දීමට හෝ සුදුස්සෙක් නොවන්නේ ය.

(ඒ) යම්කිසි තැනැත්තකු [48] [අවස්ථාවෝචිත පරිදි 116 වැනි ව්‍යවස්ථාව හෝ IIIඇ ව්‍යවස්ථාව] යටතේ නුසුදුස්සකු වීමේ කාලසීමාව ඉකුත් වී නැත්නම් ඒ තැනැත්තා ජනාධිපතිවරයා තෝරා පත් කිරීමේ ඡන්ද විමසීමක දී හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත් කිරීමේ මැතිවරණයක දී හෝ ඡන්දහිමියකු වීමට හෝ ජනමත විචාරණයක දී ඡන්දය දීමට හෝ සුදුස්සෙක් නොවන්නේ ය.

**පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් තෝරා පත් කරගනු ලැබීමට සුදුසුකම්.**

**90.** 91 වැනි ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ නුසුදුස්සකු වුවහොත් මිස ඡන්ද බලය හිමි සෑම තැනැත්තෙක් ම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබීමට සුදුස්සෙක් වන්නේ ය.

**පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් තෝරා පත් කරගනු ලැබීමට නුසුදුසුකම්.**

**91.** (1) (අ) යම්කිසි තැනැත්තකු 89 වැනි ව්‍යවස්ථාවේ දක්වා ඇති කවර වූ හෝ නුසුදුසුකමකට යටත් වේ නම් නැතහොත් එවැනි නුසුදුසුකමකට භාජන වුවහොත් ඒ තැනැත්තා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබීමට හෝ පාර්ලිමේන්තුවේ අසුන් ගැනීමට සහ පාර්ලිමේන්තුවේ දී ඡන්දය දීමට හෝ සුදුස්සෙක් නොවන්නේ ය.

(ආ) යම්කිසි තැනැත්තෙක් -

(i) මහ මැතිවරණයක දී මැතිවරණ කොට්ඨාස එකකට වැඩි ගණනකට තෝරා පත් කර ගනු ලැබීම පිණිස

---

48 - දහහත් වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 6 වැනි වගන්තිය මගින් “116 වැනි ව්‍යවස්ථාව” යන වචන හා ඉලක්කම් වෙනුවට ආදේශ කරන ලදී.

මන්ත්‍රීධූරාපේක්ෂකයකු වශයෙන් නාමයෝජනා කරනු ලැබ සිටී නම් ;

(ii) යම්කිසි මැතිවරණ කොට්ඨාසයක් සඳහා තෝරා පත් කර ගනු ලැබීම පිණිස පිළිගත් දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම් හෝ එකකට වැඩි ගණනක් විසින් මන්ත්‍රීධූරාපේක්ෂකයකු වශයෙන් නාම යෝජනා කරනු ලැබ සිටී නම් ;

(iii) එක් මැතිවරණ කොට්ඨාසයක් සඳහා මන්ත්‍රීධූරාපේක්ෂකයකු වශයෙන් නාමයෝජනා කරනු ලැබ, ඒ මැතිවරණ කොට්ඨාස සඳහා පැවැත්වෙන මැතිවරණය නිම වීමට පෙර, වෙනත් මැතිවරණ කොට්ඨාසයක් සඳහා තෝරා පත් කර ගනු ලැබීම පිණිස මන්ත්‍රීධූරාපේක්ෂකයකු වශයෙන් නාම යෝජනා කරනු ලැබ සිටී නම්; හෝ

(iv) පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකුව සිටිය දී, 70 වැනි ව්‍යවස්ථාවේ (7) වැනි අනුව්‍යවස්ථාවේ හෝ 155 වැනි ව්‍යවස්ථාවේ (4) වැනි අනුව්‍යවස්ථාවේ (i) වැනි ඡේදයේ දැක්වෙන අවස්ථාගත කරුණු යටතේ හැර, කවර වූ හෝ මැතිවරණ කොට්ඨාසයක් සඳහා තෝරා පත් කර ගනු ලැබීම පිණිස මන්ත්‍රීධූරාපේක්ෂකයකු වශයෙන් නාම යෝජනා කරනු ලැබ සිටී නම්,

ඒ තැනැත්තා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබීමට හෝ පාර්ලිමේන්තුවේ අසුන් ගැනීමට සහ පාර්ලිමේන්තුවේ දී ඡන්දය දීමට හෝ සුදුස්සෙක් නොවන්නේ ය.

(ඈ) යම්කිසි තැනැත්තෙක් ජනරජයේ ජනාධිපතිවරයාව සිටී නම් ඒ තැනැත්තා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබීමට හෝ පාර්ලිමේන්තුවේ අසුන් ගැනීමට සහ පාර්ලිමේන්තුවේ දී ඡන්දය දීමට හෝ සුදුස්සෙක් නොවන්නේ ය.

(ඇ) (i) අධිකරණ නිලධරයෙක්;

(ii) පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා;

(iii) පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා හා ඔහුගේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙක්;

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයෙක් ;

[49][(ivඅ) පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයෙක්; ]

49 - දහහත් වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 7(1) වැනි වගන්තිය මගින් ඇතුළත් කරන ලදී.

[50][(v) 41අ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (ඉ) ඡේදයේ සඳහන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු නොවන ව්‍යවස්ථාදායක සභාවේ සාමාජිකයකු; ]

[50][ (vඅ) 41ආ ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් කොමිෂන් සභාවල සාමාජකයකු; ]

[50][ (vආ) මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා; ]

(vi) විගණකාධිපතිවරයා;

[51][(vii) 1970 නොවැම්බර් මස 18 වැනි දිනට කලින් ඇති කරන ලද ධුරයක් වූ ද, 1970 නොවැම්බර් මස 18 වැනි දින දී, වැටුප් පරිමාණයෙහි ආරම්භක වැටුප, වර්ෂයකට රු. 6,720 ට නොඅඩු වූ නැතහොත් ඉන් පසුව සිදු කරන ලද යම් වැටුප් පරිමාණ ප්‍රතිශෝධනයක් යට තේ එකී ආරම්භක වැටුපට අනුරූප වෙනත් යම් වාර්ෂික වැටුප් ප්‍රමාණයක් වූ ද [52][යම් ධුරයක් දරන්නා වූ, රජයේ නිලධරයෙක් හෝ ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ සාමාජිකයෙක්] ;

(viii) 1970 නොවැම්බර් මස 18 වැනි දිනට පසුව ඇති කරන ලද ධුරයක් වූ ද, ධුරය ඇති කරන දිනයේ දී වැටුප් පරිමාණයෙහි ආරම්භක වැටුප (vii) වන විෂයයෙහි සඳහන් ධුරයකට ඒ දිනයේ දී අදාළ වූ වැටුප් පරිමාණයෙහි ආරම්භක වැටුපට නැතහොත් ඉන් පසුව සිදු කරන ලද යම් වැටුප් පරිමාණ ප්‍රතිශෝධනයක් යටතේ පළමු සඳහන් කළ ආරම්භක වැටුප අනුරූප වෙනත් යම් වාර්ෂික වැටුප් ප්‍රමාණයකට නොඅඩු වූ ද [53][යම් ධුරයක් දරන්නා වූ, රජයේ නිලධරයෙක් හෝ ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ සාමාජිකයෙක්] ; ]

[54][(viiiඅ) 1988 පෙබරවාරි මස 01 වැනි දිනට පසුව ඇති කරන ලද ධුරයක් වූ ද, ධුරය ඇති කරන ලද දිනයේ දී ඒ ධුරයේ වැටුප් පරිමාණයෙහි ආරම්භක වැටුප, පාර්ලිමේන්තුව විසින් යෝජනා සම්මතයක් මගින් තීරණය කරනු ලැබූ වැටුපට නැතහොත් ඉන් පසුව සිදු කරන ලද යම් වැටුප් පරිමාණ ප්‍රතිශෝධනයක් යටතේ එකී ආරම්භක වැටුපට අනුරූප වන වෙනත් යම් වාර්ෂික වැටුප් ප්‍රමාණයකට නොඅඩු වූ ද යම් ධුරයක් දරන්නා වූ, පළාත් රාජ්‍ය සේවයේ නිලධරයෙක් ;]

---

50 - දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 20(1) වැනි වගන්තිය මගින් මුල් (V), (Vඅ) හා (Vඈ) වැනි අනුඡේද වෙනුවට ආදේශ කරන ලදී.

51 - නව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 2 වැනි වගන්තිය මගින් මුල් (vii), (viii), (ix) සහ (x) වැනි විෂයයන් වෙනුවට ආදේශ කරන ලදී.

52 - දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 20(2) වැනි වගන්තිය මගින් "යම් ධුරයක් දරන්නා වූ රජයේ නිලධරයෙක්" යන වචන වෙනුවට ආදේශ කරන ලදී.

53 - දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 20(3) වැනි වගන්තිය මගින් "යම් ධුරයක් දරන්නා වූ රජයේ නිලධරයෙක්" යන වචන වෙනුවට ආදේශ කරන ලදී.

54 - දහහත් වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 7(4) වැනි වගන්තිය මගින් ඇතුළත් කරන ලදී.

(ix) 1970 නොවැම්බර් මස 18 වැනි දිනට කලින් ඇති කරන ලද ධුරයක් වූ ද, 1970 නොවැම්බර් මස 18 වැනි දින දී වැටුප් පරිමාණයෙහි ආරම්භක වැටුප, වර්ෂයකට රු. 7,200ට නො අඩු වූ නැතහොත් ඉන් පසුව සිදු කරන ලද යම් වැටුප් පරිමාණ ප්‍රතිශෝධනයක් යටතේ එකී ආරම්භක වැටුපට අනුරූප වෙනත් යම් වාර්ෂික වැටුප් ප්‍රමාණයක් වූ ද යම් ධුරයක් දරන්නා වූ රාජ්‍ය සංස්ථා නිලධරයෙක් ;

(x) 1970 නොවැම්බර් මස 18 වැනි දිනට පසුව ඇති කරන ලද ධුරයක් වූ ද ධුරය ඇති කරන දිනයේ දී වැටුප් පරිමාණයෙහි ආරම්භක වැටුප (ix) වන විෂයයෙහි සඳහන් ධුරයකට ඒ දිනයේ දී අදාළ වූ වැටුප් පරිමාණයෙහි ආරම්භක වැටුපට නැතහොත් ඉන් පසුව සිදු කරන ලද යම් වැටුප් පරිමාණ ප්‍රතිශෝධනයක් යටතේ පළමු සඳහන් කළ ආරම්භක වැටුපට අනුරූප වෙනත් යම් වාර්ෂික වැටුප් ප්‍රමාණයකට නො අඩු වූ ද යම් ධුරයක් දරන්නා වූ රාජ්‍ය සංස්ථා නිලධරයෙක් ;

(xi) යුද්ධ හමුදාවේ නිත්‍ය බලකායේ සාමාජිකයෙක්, නාවික හමුදාවේ නිත්‍ය බලකායේ සාමාජිකයෙක් හෝ ගුවන් හමුදාවේ නිත්‍ය බලකායේ සාමාජිකයෙක් ; හෝ

(xii) පොලිස් නිලධරයෙක් හෝ පොලිස් කාර්ය ඉටු කරන්නා වූ රජයේ නිලධරයෙක් ;]

[55][(xiii) වෙනත් රටක ද පුරවැසියකු වන ශ්‍රී ලංකාවෙ පුරවැසියකු; ]

යන මේ අය අතුරෙන් කිසිම තැනැත්තෙකු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබීමට හෝ පාර්ලමේන්තුවේ අසුන් ගැනීමට සහ පාර්ලිමේන්තුවේදී ඡන්දය දීමට හෝ සුදුස්සෙක් නොවන්නේය.

(ඉ) රජය විසින් හෝ රාජ්‍ය සංස්ථාවක් විසින් නැතහොත් රජය වෙනුවෙන් හෝ රාජ්‍ය සංස්ථාවක් වෙනුවෙන් එළඹ ඇත්තා වූ යම්කිසි ගිවිසුමකට යම්කිසි තැනැත්තකුගේ යම් ආකාරයක සම්බන්ධතාවක් තිබීම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබීමට හෝ පාර්ලිමේන්තුවේ අසුන් ගැනීමට සහ පාර්ලිමේන්තුවේ දී ඡන්දය දීමට හෝ නුසුදුසුකමක් යයි පාර්ලිමේන්තුව විසින් නීතියෙන් නියම කරනු ලැබේ ද, එවැනි ගිවිසුමකට ඒ ආකාරයේ සම්බන්ධතාවක් ඇති තැනැත්තෙක් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබීමට හෝ පාර්ලිමේන්තුවේ අසුන් ගැනීමට සහ පාර්ලිමේන්තුවේ දී ඡන්දය දීමට හෝ සුදුස්සෙක් නොවන්නේ ය.

55 - දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 20(4) වගන්තිය මගින් ඇතුළත් කරන ලදී.

(ඊ) යම්කිසි තැනැත්තෙක් වස්තු භංගත්වයට පත්වූවකු බවට ප්‍රකාශ කරනු ලැබ නිදහස් නොකරන ලද වස්තු භංගත්වයට පත් වූවෙක් වේ ද, ඒ තැනැත්තා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබීමට හෝ පාර්ලිමේන්තුවේ අසුන් ගැනීමට සහ පාර්ලිමේන්තුවේ දී ඡන්දය දීමට හෝ සුදුස්සෙක් නොවන්නේ ය.

(උ) යම්කිසි තැනැත්තකු ඉහතින් වූ වර්ෂ හත තුළ දී නිසි බලය ඇති අධිකරණයක් විසින් හෝ විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් විසින් හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් නැතහොත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වීමට පෙර ව්‍යවස්ථාදායකයේ මන්ත්‍රීවරයකු වශයෙන් තමන් ගන්නා තීරණය කෙරෙහි බලපෑමක් ඇති කිරීමට දෙන ලද අල්ලසක් හෝ තුටු පඬුරක් හෝ පිළිගත් තැනැත්තකු බවට විනිශ්චය කරනු ලැබ සිටී නම් ඒ තැනැත්තා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබීමට හෝ පාර්ලිමේන්තුවේ අසුන් ගැනීමට හෝ පාර්ලිමේන්තුවේ දී ඡන්දය දීමට හෝ සුදුස්සෙක් නොවන්නේ ය.

(2) වෘත්තීය සමිතියක් විසින් හෝ වෙනත් සංවිධානයක් විසින් හෝ හුදෙක් දිවි පැවැත්ම පිණිස දෙනු ලබන දීමනාවක් හෝ කරනු ලබන වෙනත් ගෙවීමක් හෝ පාර්ලිමේන්තුවේ යම්කිසි මන්ත්‍රීවරයකු විසින් පිළිගනු ලැබුවහොත් ඒ පිළිගැනීම මේ ව්‍යවස්ථාවේ (1) වැනි අනුව්‍යවස්ථාවේ (උ) ඡේදයෙහි කාර්ය සඳහා අල්ලසක් හෝ තුටු පඬුරක් පිළිගැනීමක් වශයෙන් නොසැලකෙන්නේ ය.

**ජනාධිපතිවරයා වශයෙන් තෝරා පත්කර ගැනීමට නුසුදුසුකම්**

**92.** ඡන්ද හිමියකු වීමට සුදුසුකම්ලත් සෑම තැනැත්තෙක් ම, ඒ තැනැත්තා -

(අ) වයස අවුරුදු [56] [තිස්පහ (35)] සම්පූර්ණ කර නොසිටීම;

(ආ) 91 වැනි ව්‍යවස්ථාවේ (1) වැනි අනුව්‍යවස්ථාවේ (ඈ), (ඉ), (ඊ) හෝ (උ) ඡේද යටතේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස තෝරා පත් කර ගැනීමට නුසුදුස්සකු වීම;

[57][(ඇ) ඔහු, ජනතාව විසින් ජනාධිපති ධුරයට දෙවරක් තෝරා පත් කොට ගනු ලැබ තිබීම;]

(ඈ) 38 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනුව්‍යවස්ථාවේ (ඉ) ඡේදයේ විධිවිධාන යටතේ ජනාධිපති ධුරයෙන් ඉවත් කරනු ලැබ සිටීම, යන නුසුදුසුකම්වලින් කවර වූ හෝ නුසුදුසුකමකට යටත්ව සිටී නම් මිස, ජනාධිපතිවරයා වශයෙන් තෝරා පත් කර ගනු ලැබීමට සුදුස්සෙක් වන්නේ ය.

---

56 - දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 21 වැනි වගන්තිය මගින් 'තිහ' යන වචනය වෙනුවට ආදේශ කරන ලදී.

57 - දහඅට වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ඉවත් කරන ලද 92(ඇ) අනුව්‍යවස්ථාව දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 21(2) වැනි වගන්තිය මගින් ඇතුලත් කරන ලදී.

**93.** ජනරජයේ ජනාධිපතිවරයා සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත් කර ගැනීම සඳහා ද, ජනමතවිචාරණවල දී ද, ඡන්දය දීම නිදහස්ව ද, සමානව ද, රහසේ ද, විය යුත්තේ ය.

**ඡන්දය දීම නිදහස්ව, සමානව සහ රහසේ විය යුතු බව**

**94.** (1) ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම පිණිස පවත්වනු ලබන ඡන්ද විමසීමේ දී සෑම ඡන්දදායකයකු විසින් ම යම්කිසි අපේක්ෂකයකුට ස්වකීය ඡන්දය දීමේ දී -

**ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම**

(අ) ඡන්ද විමසීම සඳහා අපේක්ෂකයන් තිදෙනකු ඉදිරිපත්ව ඇති අවස්ථාවක, ඔහුගේ දෙවන මනාපය දැක්විය හැක්කේ ය; තව ද,

(ආ) ඡන්ද විමසීම සඳහා අපේක්ෂකයන් තිදෙනකුට වඩා ඉදිරිපත්ව ඇති අවස්ථාවක ඔහුගේ දෙවන සහ තුන්වන මනාපය දැක්විය හැක්කේ ය.

(2) දෙන ලද වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් දෙකෙන් එකකට වැඩි ඡන්ද සංඛ්‍යාවක් ලැබූ අපේක්ෂකයකු වෙතොත් ඒ අපේක්ෂකයා ජනාධිපතිවරයා වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශ කළ යුත්තේ ය.

(3) මේ ව්‍යවස්ථාවේ (2) වැනි අනුව්‍යවස්ථාව යටතේ අපේක්ෂකයකු තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශ නොකරන ලද අවස්ථාවක වැඩි ම ඡන්ද සංඛ්‍යාව හා දෙවන වැඩි ම ඡන්ද සංඛ්‍යාව ලබාගත් අපේක්ෂකයන් හැර, සෙසු අපේක්ෂකයා හෝ අපේක්ෂකයන් තරගයෙන් ඉවත් කොට -

(අ) එසේ තරගයෙන් ඉවත් කරන ලද අපේක්ෂකයකුට ඡන්දය දුන් එක් එක් ඡන්දදායකයාගේ දෙවන මනාපය ඉතිරි අපේක්ෂකයන් දෙදෙනාගෙන් එක් කෙනකුට දී ඇත්නම් එය ඒ අපේක්ෂකයාට දෙන ලද ඡන්දයක් ලෙස ගණන් ගෙන (2) වැනි අනුව්‍යවස්ථාව යටතේ ඔහුගේ වාසියට ගණන් කරන ලද ඡන්ද සංඛ්‍යාවට එකතු කළ යුත්තේ ය; තව ද,

(ආ) (අ) ඡේදය යටතේ දෙවන මනාපය ගණන් ගනු නොලැබූ ඒ ඡේදයෙහි සඳහන් එක් එක් ඡන්දදායකයාගේ තුන්වන මනාපය ඉතිරි අපේක්ෂකයන් දෙදෙනාගෙන් එක්කෙනකුට දී ඇත්නම් එය ඒ අපේක්ෂකයාට දෙන ලද ඡන්දයක් ලෙස ගණන් ගෙන (අ) ඡේදය හා (2) වැනි අනුව්‍යවස්ථාව යටතේ ඔහුගේ වාසියට ගණන් කරන ලද ඡන්ද සංඛ්‍යාවට එකතු කළ යුත්තේ ය.

එසේ ගණන් කරන ලද ඡන්ද සංඛ්‍යාවෙන් බහුතර ඡන්දය ලබන අපේක්ෂකයා ජනාධිපතිවරයා වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශ කළ යුත්තේ ය.

(4) අපේක්ෂකයන් දෙදනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් විසින් ලබා ගන්නා ලද ඡන්ද සංඛ්‍යා අතර සමානත්වයක් ඇති විට හා ඒ ඡන්ද සංඛ්‍යාවන්ට එක් ඡන්දයක් එකතු කිරීමෙන් -

(අ) මේ ව්‍යවස්ථාව යටතේ තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශ කළ යුත්තේ කවර අපේක්ෂකයකු ද නැතහොත්

(ආ) මේ ව්‍යවස්ථාව යටතේ ඉවත් නොකළ යුත්තේ කවර අපේක්ෂකයකු ද,

යන්න තීරණය වන අවස්ථාවක එම තීරණය කිරීමේ කාර්යය සඳහා එම අතිරේක ඡන්දය දෙනු ලැබූ අපේක්ෂකයා ලෙස සැලකිය යුත්තේ කිනම් අපේක්ෂකයා දැයි තීරණය කිරීම කුසපත් ඇදීමෙන් කළ යුත්තේ ය.

**සීමා නිර්ණය කොමිෂන් සභාව**

**95.** (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වීමෙන් පසුව මාස තුනක් ඇතුළත, මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කිරීම සඳහා සීමා නිර්ණය කොමිෂන් සභාවක් ජනාධිපතිවරයා විසින් පත් කළ යුත්තේ ය. ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන, දේශපාලන කටයුතුවල නිරතව නොසිටින්නා වූ තැනැත්තන් වශයෙන් ජනාධිපතිවරයා සලකන්නා වූ තැනැත්තන් තුන් දෙනකු ගෙන් ඒ කොමිෂන් සභාව සමන්විත විය යුත්තේ ය. ඔවුන් අතුරෙන් එක් තැනැත්තකු ඒ කොමිෂන් සභාවේ සභාපති ධුරයට ජනාධිපතිවරයා විසින් පත් කළ යුත්තේ ය.

(2) සීමා නිර්ණය කොමිෂන් සභාවේ යම්කිසි සාමාජිකයකු මිය ගියහොත් තැන්නම් ඉල්ලා අස් වුවහොත්, එසේත් නැත්නම් යම්කිසි සාමාජිකයකුට ඒ කොමිෂන් සභාවේ සාමාජිකයකු වශයෙන් සිය කර්තව්‍ය යථා පරිදි ඉටු කළ නොහැකි යයි ජනාධිපතිවරයා විශ්වාස කරන්නේ නම් මේ ව්‍යවස්ථාවේ (1) වැනි අනුව්‍යවස්ථාවේ විධිවිධාන අනුව ජනාධිපතිවරයා විසින් ඒ සාමාජිකයා වෙනුවට වෙනත් තැනැත්තකු පත් කළ යුත්තේ ය.

**මැතිවරණ කොට්ඨාස.**

**96.** (1) සීමා නිර්ණය කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකාව විස්සකට අඩු නොවූ ද, [58] [විසිපහකට වැඩි නොවූ ද] මැතිවරණ කොට්ඨාස සංඛ්‍යාවකට බෙදා ඒ එක් එක් කොට්ඨාසයට නමක් ද දිය යුත්තේ ය.

(2) ශ්‍රී ලංකාවේ එක් එක් පළාත මැතිවරණ කොට්ඨාසයක් ලෙස සමන්විත විය හැක්කේ ය. නැතහොත් ඒ එක් එක් පළාත මැතිවරණ කොට්ඨාස දෙකකට හෝ වැඩි සංඛ්‍යාවකට බෙදිය හැක්කේ ය.

58 - හත් වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 3 වැනි වගන්තිය මගින් "විසිහතරකට වැඩි නො වුව ද" යන වචන වෙනුවට ආදේශ කරන ලදී

(3) පළාතක් මැතිවරණ කොට්ඨාස සංඛ්‍යාවකට බෙදනු ලබන අවස්ථාවක දී, හැකිතාක් දුරට ඒ එක් එක් මැතිවරණ කොට්ඨාසය පරිපාලන දිස්ත්‍රික්කයක් හෝ පරිපාලන දිස්ත්‍රික්ක දෙකක හෝ ඊට වැඩි ගණනක එකතුවක් හෝ වන බවට නැතහොත් මැතිවරණ කොට්ඨාස දෙකක හෝ ඊට වැඩි ගණනක එකතුවකින් පරිපාලන දිස්ත්‍රික්කයක් සමන්විත වන බවට වග බලා ගනු පිණිස, සීමා නිර්ණය කොමිෂන් සභාව විසින්, එවකට පවත්නා පරිපාලන දිස්ත්‍රික්ක සැලකිල්ලට ගත යුත්තේ ය.

(4) එක් එක් පළාතේ මැතිවරණ කොට්ඨාසවලට (ඒ ඒ මැතිවරණ කොට්ඨාසයේ ඡන්ද හිමි නාමලේඛනයේ නම් දැක්වෙන ඡන්ද හිමියන්ගේ සංඛ්‍යාව අනුසාරයෙන් තෝරා පත් කිරීමට හිමිකම ඇති මන්ත්‍රීවරයන් සංඛ්‍යාවට අමතරව) එක්ව මන්ත්‍රීවරයන් සිව් දෙනකු තෝරා පත් කිරීමට හිමිකම ඇත්තේ ය. එම හිමිකම සීමා නිර්ණය කොමිෂන් සභාව විසින් එම මැතිවරණ කොට්ඨාස අතර සාධාරණව බෙදිය යුත්තේ ය.

(5) සීමා නිර්ණය කොමිෂන් සභාවේ සාමාජිකයන් අතර මතභේදයක් ඇති වුවහොත් ඒ සාමාජිකයන් අතුරෙන් වැඩි දෙනාගේ මතය බලපැවැත්විය යුතු අතර, එය කොමිෂන් සභාවේ තීරණය වශයෙන් සැලෙකන්නේ ය. සීමා නිර්ණය කොමිෂන් සභාවේ සාමාජිකයන් සියලු දෙනා ම එකිනෙකට වෙනස් මත දරත් නම්, කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ මතය කොමිෂන් සභාවේ තීරණය වශයෙන් සැලෙකන්නේ ය. ඒ තීරණයට එකඟ නොවන සාමාජිකයෙක් වෙයි නම් ඔහු එසේ එකඟ නොවීමට හේතු ද දැක්විය හැක්කේ ය.

(6) සීමා නිර්ණය කොමිෂන් සභාවේ සභාපතිවරයා කොමිෂන් සභාවේ තීරණය ද, ඒ තීරණයට එකඟ නොවන සාමාජිකයකු විසින් හේතු දක්වා ඇතොත් ඒ හේතු ද ජනාධිපතිවරයාට දැන්විය යුත්තේ ය.

**96අ.** [59] [ඉවත් කරන ලදී.]

**මැතිවරණ කොට්ඨාසවල නම් ආදිය ප්‍රකාශයට පත් කිරීම.**

**97.** සීමා නිර්ණය කොමිෂන් සභාව කළ තීරණයට අනුකූලව, මැතිවරණ කොට්ඨාසවල නම් හා සීමාවන් ද, 96 වැනි ව්‍යවස්ථාවේ (4) වැනි අනුව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර ඒ එක් එක් මැතිවරණ කොට්ඨාසය විසින් තෝරා පත් කිරීමට හිමිකම් ඇති මන්ත්‍රීවරුන් සංඛ්‍යාව ද, ජනාධිපතිවරයා විසින් ප්‍රකාශනයක් මගින් ප්‍රසිද්ධ කළ යුත්තේ ය. ඒ ප්‍රකාශනයේ නිශ්චය කොට දක්වා ඇති මැතිවරණ කොට්ඨාස ඒ ප්‍රකාශනයෙන් ඉක්බිතිව එළඹෙන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත් කිරීමේ පළමුවන මහ මැතිවරණයේ දී ක්‍රියාත්මක විය යුත්තේ ය. තව ද, ඉන්පසු ඒ මැතිවරණ කොට්ඨාස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ද, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත්කර

59 - දහහතර වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 5 වැනි වගන්තිය මගින් ඇතුළත් කරනු ලැබ පහළොස් වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 2 වැනි වගන්තිය මගින් ඉවත් කරනු ලැබීය.

ගැනීමේ මැතිවරණය හා සම්බන්ධව තත් කාලයේ බල පවත්නා කවර වූ හෝ නීතියක ද සියලු කාර්ය සඳහා ශ්‍රී ලංකාවේ මැතිවරණ කොට්ඨාස විය යුත්තේ ය.

**සියලු මැතිවරණ කොට්ඨාසවලින් තෝරා පත් කළ යුතු මන්ත්‍රී සංඛ්‍යාව සහ ඒ මැතිවරණ කොට්ඨාස අතර ඒ මන්ත්‍රීවරයන් සංඛ්‍යාව බෙදා වෙන් කළ යුතු ආකාරය.**

**98.** (1) එක්ව ගත් කල සියලු මැතිවරණ කොට්ඨාශවලට මන්ත්‍රීවරයන් එකසිය අනූහය දෙනකු තෝරා පත් කිරීමට හිමිකම් ඇත්තේ ය.

(2) එක් එක් මැතිවරණ කොට්ඨාසයට තෝරා පත් කිරීමට හිමිකම් ඇති මන්ත්‍රීවරයන් සංඛ්‍යාව බෙදා වෙන් කළ යුතු ආකාරය, මන්ත්‍රීවරයන් තිස් හය දෙනකු සම්බන්ධයෙන් වන විට 96 වැනි ව්‍යවස්ථාවේ (4) වැනි අනුව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව නිශ්චය කළ යුත්තේ ය.

(3) ඉතිරි මන්ත්‍රීවරයන් එකසිය හැට දෙනාගෙන් එක් එක් මැතිවරණ කොට්ඨාසයට තෝරා පත් කිරීමට හිමිකම් ඇති මන්ත්‍රීවරයන් සංඛ්‍යාව බෙදා වෙන් කළ යුතු ආකාරය, මේ ව්‍යවස්ථාවේ මින් ඉදිරියට ඇති විධිවිධානවලට අනුකූලව නිශ්චය කළ යුත්තේ ය.

(4) සියලු ම මැතිවරණ කොට්ඨාසවල ඡන්ද හිමි නාමලේඛනවල නම් දැක්වෙන මුළු ඡන්ද හිමි සංඛ්‍යාවේ එකතුව එකසිය හැටෙන් බෙදිය යුත්තේ ය. එසේ බෙදීමෙන් ලැබෙන පූර්ණ සංඛ්‍යාව (ශේෂ වන භාග ගණන් නොගෙන) මෙහි මින් මතු "පරිමිත සංඛ්‍යාව" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

(5) එක් එක් මැතිවරණ කොට්ඨාසෙය් ඡන්ද හිමි නාම ලේඛනයේ නම් ඇතුළත් වන ඡන්ද හිමියන්ගේ මුළු සංඛ්‍යාව පරිමිත සංඛ්‍යාවෙන් බෙදිය යුතු අතර, ඒ මැතිවරණ කොට්ඨාසයේ ඡන්ද හිමියන්ගේ මුළු සංඛ්‍යාව පරිමිත සංඛ්‍යාවෙන් බෙදූ විට ලැබෙන පූර්ණ සංඛ්‍යාවට සමාන මන්ත්‍රීවරයන් සංඛ්‍යාවක් තෝරා පත් කිරීමට ඒ එක් එක් මැතිවරණ කොට්ඨාසයට හිමිකම් ඇත්තේ ය. තව ද, ඒ ඡන්ද හිමියන්ගේ සංඛ්‍යාව එසේ බෙදූ විට ශේෂයක් වේ නම්, ඒ ශේෂය සම්බන්ධයෙන්, අවශ්‍ය නම්, මේ ව්‍යවස්ථාවේ (6) වැනි අනුව්‍යවස්ථාවට අනුකූලව කියා කළ යුත්තේ ය.

(6) පරිමිත සංඛ්‍යාව අනුසාරයෙන් මේ ව්‍යවස්ථාවේ (5) වැනි අනුව්‍යවස්ථාවට අනුකූලව නිශ්චය කරන ලද, මැතිවරණ කොට්ඨාස සියල්ලෙන් ම තෝරා පත් කළ යුතු මුළු මන්ත්‍රීවරයන් සංඛ්‍යාව එකසිය හැටකට අඩු වන අවස්ථාවක ඉතිරි මන්ත්‍රී ධුර සංඛ්‍යාව සඳහා හිමිකම් මැතිවරණ කොට්ඨාස අතර බෙදා වෙන් කිරීම, ඉහත කී ඡන්ද හිමියන්ගේ ශේෂය ද (5) වැනි අනුව්‍යවස්ථාව යටතේ කරන ලද නිශ්චය අනුව යම්කිසි මැතිවරණ කොට්ඨාසයකට එක ද මන්ත්‍රීවරයකුවත් තෝරා පත් කිරීමට හිමිකම් නොලැබෙන අවස්ථාවක ඒ මැතිවරණ කොට්ඨාසයේ ඡන්දහිමි නාම ලේඛනයේ නම් ඇතුළත් වන ඡන්ද හිමියන්ගේ මුළු සංඛ්‍යාව ද පදනම් කොට ගෙන කළ යුතු අතර ඒ පදනම අනුව එසේ වැඩි ම ඡන්ද හිමියන්ගේ ශේෂයක් හෝ වැඩි ම

මුළු ඡන්ද හිමි සංඛ්‍යාවක් හෝ සිටින මැතිවරණ කොට්ඨාසයට එක් වැඩිපුර මන්ත්‍රීවරයකු යනාදී වශයෙන්, තෝරා පත් කර ගත යුතු මුළු මන්ත්‍රීවරයන් සංඛ්‍යාව එකසිය හැටක් වන තුරු, මන්ත්‍රීවරයන් සංඛ්‍යාවක් තෝරා පත් කර ගැනීමට හිමිකම ඇත්තේ ය.

(7) (6) වැනි අනුව්‍යවස්ථාවේ සඳහන් බෙදා වෙන් කිරීමේ දී එවැනි ඡන්ද හිමියන්ගේ ශේෂ දෙකක් හෝ වැඩි ගණනක් හා අතර නැතහොත් ඡන්ද හිමියන්ගේ මුළු සංඛ්‍යා දෙකක් හෝ වැඩි ගණනක් හා අතර නැතහොත් ඒ ඡන්ද හිමියන්ගේ ශේෂයක් හෝ වැඩි ගණනක් හා ඒ ඡන්ද හිමියන්ගේ මුළු සංඛ්‍යාවක් හෝ වැඩි ගණනක් හා අතර සමානත්වයක් පවත්නා බව පෙනී ගිය අවස්ථාවක එක ඡන්ද හිමියකු එකතු කිරීමෙන් ඒ එක් මැතිවරණ කොට්ඨාසයකට එක් අතිරේක මන්ත්‍රීවරයකු තෝරා පත් කිරීමට හිමිකම් ලැබෙන විට, එසේ එක ඡන්ද හිමියකු එකතු කරන ලද ලෙස සැලකිය යුත්තේ කවර මැතිවරණ කොට්ඨාසයකට දැයි කුසපත් ඇදීමෙන් නිශ්චය කළ යුත්තේ ය.

[60][(8) සියලු මැතිවරණ කොට්ඨාස සඳහා ඡන්දහිමි නාමලේඛන සහතික කළ පසු හැකි තාක් ඉක්මනින්, එක් එක් මැතිවරණ කොට්ඨාසයකින් තෝරා පත් කිරීමට 97 වැනි ව්‍යවස්ථාව යටතේ වූ ප්‍රකාශනය ප්‍රකාර සහ මේ ව්‍යවස්ථාව ප්‍රකාර හිමිකම් ලැබෙන මුළු මන්ත්‍රීවරයන් සංඛ්‍යාව ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින් මැතිවරණ කොමසාරිස්වරයා විසින් සහතික කළ යුත්තේ ය.]

(9) මේ ව්‍යවස්ථාවේ කාර්ය සඳහා "ඡන්දහිමි නාමලේඛනය" යන්නෙන් යම් කිසි මැතිවරණයක් පවත්වනු ලබන්නේ තත්කාලයේ බලපවත්නා යම් ඡන්දහිමි නාමලේඛනයක් පදනම් කරගෙන ද, ඒ ඡන්දහිමි නාමලේඛනය අදහස් වේ.

**සමානුපාතික නියෝජනය.**

[61] [**99.** (1) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත් කිරීමේ යම් මැතිවරණයක දී මැතිවරණ කොට්ඨාසයකින් තෝරා පත් කිරීමට හිමිකම් ඇති මන්ත්‍රීවරයන් සංඛ්‍යාව 98 වැනි ව්‍යවස්ථාවේ (8) වැනි අනුව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව පළකරන නියමයෙහි මැතිවරණ කොමසාරිස්වරයා විසින් නිශ්චය කරන සංඛ්‍යාව විය යුත්තේ ය.

(2) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත් කිරීමේ මැතිවරණයක දී සෑම ඡන්ද හිමියකුට ම ඔහුගේ ඡන්දයට අතිරේකව, ඔහු ඡන්දය දෙන්නා වූ පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම විසින් නාම යෝජනා කර ඇති අපේක්ෂකයන් තුන් දෙනකුට නොවැඩි සංඛ්‍යාවකට ඔහුගේ මනාපය පළ කිරීමට හිමිකම ඇත්තේ ය.

(3) යම් පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ මෙහි මින් මතු "ස්වාධීන කණ්ඩායමක්" යනුවෙන් සඳහන් කරනු ලබන ස්වාධීන

60 - දහහතර වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 6 වැනි වගන්තිය මගින් මුල් (8) වැනි අනුව්‍යවස්ථාව ඉවත් කොට අලුත් (8) අනුව්‍යවස්ථාවක් ඇතුළත් කරන ලදුව පහළොස්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 3 වැනි වගන්තිය මගින් එය ඉවත් කරනු ලැබ, ඒ වෙනුවට මෙම අනුව්‍යවස්ථාව ආදේශ කරන ලදී.

61 - දහහතර වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 7 වැනි වගන්තිය මගින් මුල් ව්‍යවස්ථාව ඉවත් කොට, ඒ වෙනුවට ආදේශ කරන ලදී.

අපේක්ෂකයන් වශයෙන් තරග කරන තැනැත්තන් කණ්ඩායමක් හෝ විසින්, යම් මැතිවරණ කොට්ඨාසයක් වෙනුවෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත් කිරීමේ මැතිවරණයක කාර්ය සඳහා ඒ මැතිවරණයේ දී ඒ මැතිවරණ කොට්ඨාසයෙන් තෝරා පත් කර ගත යුතු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවට තුනක් එකතු කළ විට ලැබෙන සංඛ්‍යාවට සමාන අපේක්ෂකයන් සංඛ්‍යාවකගේ නම් දැක්වෙන එක් නාමයෝජනා පත්‍රයක් ඉදිරිපත් කළ හැක්කේ ය.

(4) ඡන්දහිමි නාම ලේඛනයෙහි තමාගේ නම ඇතුළත් එක් එක් ඡන්ද හිමියාට, ඔහුගේ නම එක් මැතිවරණ කොට්ඨාසයකට වඩා වැඩි මැතිවරණ කොට්ඨාස ගණනක ඡන්දහිමි නාම ලේඛනවල ඇතුළත්ව තිබුණ ද එක ඡන්දයකට පමණක් හිමිකම් ඇත්තේ ය.

(5) යම්කිසි මැතිවරණ කොට්ඨාසයක වැඩි ම ඡන්ද සංඛ්‍යාව ලබා ගන්නා පිළිගත් දේශපාලන පක්ෂයට හෝ ස්වාධීන කණ්ඩායමට ඒ පිළිගත් දේශපාලන පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ නාම යෝජනා පත්‍රයේ නම සඳහන් වූ ද, වැඩි ම මනාප ඡන්ද සංඛ්‍යාවක් ලබා ගෙන ඇත්තා වූ ද අපේක්ෂකයා තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරවා ගැනීමට හිමිකම ඇත්තේ ය.

(6) (අ) යම්කිසි මැතිවරණයක දී යම්කිසි මැතිවරණ කොට්ඨාසයක දෙන ලද [62][මුළු ඡන්ද සංඛ්‍යාවෙන් විස්සෙන් එකකට අඩු ඡන්ද සංඛ්‍යාවක්] ලැබූ සෑම පිළිගත් දේශපාලන පක්ෂයක් ම සහ සෑම ස්වාධීන කණ්ඩායමක් ම, ඒ මැතිවරණ කොට්ඨාසය සඳහා ඒ පක්ෂයෙන් හෝ කණ්ඩායමෙන් කවර වූ හෝ අපේක්ෂකයකු තෝරා පත් කරවා ගැනීමට සුදුසුකම නොලබන්නේ ය.

(ආ) සුදුසුකම් නොලැබූ දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම් හෝ වේ නම් ඒ පක්ෂ හෝ කණ්ඩායම් හෝ විසින් ලැබූ ඡන්ද සංඛ්‍යාව, ඒ මැතිවරණ කොට්ඨාස සඳහා වූ මැතිවරණයේ දී දෙන ලද මුළු ඡන්ද සංඛ්‍යාවෙන් අඩු කිරීමෙන් පසු ඉතිරි ඡන්ද සංඛ්‍යාව, මෙහි මින් මතු "අදාළ ඡන්ද සංඛ්‍යාව" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

(7) අදාළ ඡන්ද සංඛ්‍යාව, ඒ මැතිවරණ කොට්ඨාසය සඳහා තෝරා පත් කර ගත යුතු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවට එකක් අඩු සංඛ්‍යාවෙන් බෙදිය යුත්තේ ය. එසේ බෙදීමෙන් ලැබෙන සංඛ්‍යාව පූර්ණ සංඛ්‍යාවක් නම් ඒ සංඛ්‍යාව හෝ ඒ සංඛ්‍යාව පූර්ණ සංඛ්‍යාවක් හා භාගයක් නම් එකී පූර්ණ සංඛ්‍යාවට සහ භාගයට වැඩි ඊළඟ පූර්ණ සංඛ්‍යාව මෙහි මින් මතු "සම්ප්‍රයුක්ත සංඛ්‍යාව" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

(8) මේ ව්‍යවස්ථාවේ (6) වැනි අනුව්‍යවස්ථාව යටතේ සුදුසුකම් නොලැබූ පක්ෂ හෝ කණ්ඩායම් හැර එක් එක් පිළිගත් දේශපාලන පක්ෂය සහ ස්වාධීන කණ්ඩායම ලැබූ ඡන්ද සංඛ්‍යාව, එසේ වැඩි ම

62 - පහළොස් වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 4(1) වැනි වගන්තිය මගින් "මුළු ඡන්ද සංඛ්‍යාවෙන් අටෙන් එකකට අඩු ඡන්ද සංඛ්‍යාවක්," යන වචන වෙනුවට ආදේශ කරන ලදී.

ඡන්ද සංඛ්‍යාව ලැබූ පක්ෂයෙන් හෝ කණ්ඩායමෙන් ආරම්භ කොට, සම්ප්‍රයුක්ත සංඛ්‍යාවෙන් බෙදනු ලැබිය යුත්තේ ය. ඒ පක්ෂය හෝ කණ්ඩායම විසින් නාමයෝජනා කරන ලද එක් එක් අපේක්ෂකයා විසින් ලබා ගත් මනාප ඡන්ද සංඛ්‍යාව අනුව, ඒ පක්ෂය හෝ කණ්ඩායම ලැබූ ඡන්ද සංඛ්‍යාව සම්ප්‍රයුක්ත සංඛ්‍යාවෙන් බෙදීමෙන් ලැබෙන පූර්ණ සංඛ්‍යාවට සමාන (මේ ව්‍යවස්ථාවේ (5) වැනි අනුව්‍යවස්ථාව යටතේ තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරන ලද අපේක්ෂකයා අත්හැර) අපේක්ෂකයන් සංඛ්‍යාවක් (වැඩි ම මනාප ඡන්ද සංඛ්‍යාවක් ලබා ගන්නා අපේක්ෂකයා පළමු වැන්නා ලෙස තෝරා පත් කර ගත් ලෙස ප්‍රකාශ කිරීම ඊළඟ වැඩි ම මනාප ඡන්ද සංඛ්‍යාවක් ලබා ගන්නා අපේක්ෂකයා ඊළඟට තෝරා පත් කර ගත් ලෙස ප්‍රකාශ කිරීම යනාදී වශයෙන්) ඒ එක් එක් පක්ෂයෙන් හෝ කණ්ඩායමෙන් තෝරා පත් කර ගන්නා ලදැයි, තේරීම්භාර නිලධරයා විසින් ප්‍රකාශයට පත් කරනු ලැබිය යුත්තේ ය. එසේ බෙදීමෙන් පසු ශේෂ වන යම් ඡන්ද සංඛ්‍යාවක් වේ නම්, ඒ ඡන්ද සංඛ්‍යාව සම්බන්ධයෙන් අවශ්‍ය වෙතොත් (9) වැනි අනුව්‍යවස්ථාව යටතේ ක්‍රියා කළ යුත්තේ ය.

(9) මේ ව්‍යවස්ථාවේ (8) වැනි අනුව්‍යවස්ථාවේ විධිවිධාන සලසා ඇති පරිදි මන්ත්‍රීවරයන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබීමෙන් පසුව, තවත් එක් මන්ත්‍රීවරයකු හෝ ඊට වැඩි මන්ත්‍රීවරයන් සංඛ්‍යාවක් හෝ තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කිරීමට ඇතිවිට, (8) වැනි අනුව්‍යවස්ථාව යටතේ මන්ත්‍රීවරයන් තෝරා පත් කිරීම ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව, එක් එක් පක්ෂයේ හෝ කණ්ඩායමේ වාසියට ඇති, (8) වැනි අනුව්‍යවස්ථාවේ සඳහන්, ශේෂ වූ ඡන්ද සංඛ්‍යාව අනුසාරයෙන් හා (8) වැනි අනුව්‍යවස්ථාව යටතේ එක ද අපේක්ෂකයකුවත් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබ නොමැති යම් පක්ෂයක් හෝ කණ්ඩායමක් විසින් ලබා ගන්නා ලද ඡන්ද සංඛ්‍යාව අනුසාරයෙන්, තෝරා පත් කර ගත යුතු මුළු මන්ත්‍රීවරයන් සංඛ්‍යාව තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලබන තෙක්, එවැනි වැඩි ම ඡන්ද සංඛ්‍යාවක් ඇති පක්ෂය හෝ කණ්ඩායම විසින් නාමයෝජනා කරන ලද වැඩිම හෝ ඊළඟට වැඩි ම මනාප ඡන්ද සංඛ්‍යාවක් ලබා ගෙන ඇති අපේක්ෂකයා මන්ත්‍රීවරයා ලෙස පත් කරනු ලැබිය යුත්තේ ය. තව ද, තෝරා පත් කළ යුතු මුළු මන්ත්‍රීවරයන් සංඛ්‍යාව තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරන තෙක් ඒ අනුපිළිවෙළින් ප්‍රකාශයට පත් කරගෙන යා යුත්තේ ය.

(10) (අ) එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයක් විසින් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් හෝ ලැබූ මුළු ඡන්ද සංඛ්‍යාව මේ ව්‍යවස්ථාවේ (7) වැනි අනුව්‍යවස්ථාවේ සඳහන් සම්ප්‍රයුක්ත සංඛ්‍යාවට අඩු වන අවස්ථාවක, වැඩි ම ඡන්ද සංඛ්‍යාවක් ලැබූ දේශපාලන පක්ෂයට හෝ කණ්ඩායමට, (මේ ව්‍යවස්ථාවේ (5) වැනි අනුව්‍යවස්ථාව යටතේ තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරන ලද

අපේක්ෂකයා අත් හැර) ඒ දේශපාලන පක්ෂය හෝ කණ්ඩායම විසින් නාමයෝජනා කරන ලද වැඩි ම මනාප ඡන්ද සංඛ්‍යාවක් ලැබූ අපේක්ෂකයා තෝරා පත් කරගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරවා ගැනීමට හිමිකම් ඇති අතර තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කළ යුතු මන්ත්‍රීවරයන් තවත් එක්කෙනකු හෝ වැඩි සංඛ්‍යාවක් තවදුරටත් ඉතිරිව ඇත්නම්, ඊළඟ වැඩි ම ඡන්ද සංඛ්‍යාව ලැබූ දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායමට, ඒ දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම විසින් නාම යෝජනා කරන ලද වැඩි ම මනාප ඡන්ද සංඛ්‍යාව ලැබූ අපේක්ෂකයා තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරවා ගැනීමට හිමිකම් ඇත්තේ ය. මේ ආකාරයෙන් මැතිවරණ කොට්ඨාසයෙන් තෝරා පත් කළ යුතු සියලු ම මන්ත්‍රීවරයන් සංඛ්‍යාව තෝරා පත් කර ගන්නා ලදැයි මේ අනුව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ ප්‍රකාශයට පත් කරන තෙක් එසේ අනුපිළිවෙළින් ප්‍රකාශයට පත් කරෙගන යා යුත්තේ ය.

(ආ) (අ) අනුව්‍යවස්ථාව යටතේ නිශ්චය කරනු ලැබීමෙන් පසුව ද, ඒ මැතිවරණ කොට්ඨාසය සඳහා තවත් එක් මන්ත්‍රීවරයකු හෝ ඊට වැඩි මන්ත්‍රීවරයන් සංඛ්‍යාවක් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කිරීමට ඉතිරිව ඇත්නම්, ඒ මන්ත්‍රීවරයන් තෝරා පත්කර ගැනීම සම්බන්ධයෙන් ද ඒ ඡේදයේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ වන්නේ ය.

(11) පිළිගත් දේශපාලන පක්ෂ දෙකක් හෝ වැඩි ගණනක් නැතහොත් ස්වාධීන කණ්ඩායම් දෙකක් හෝ වැඩි ගණනක් නැතහොත් ඒ පක්ෂ හා කණ්ඩායම් එකක හෝ වැඩි ගණනක සංයුක්තියන් මේ ව්‍යවස්ථාවේ (5) වැනි හෝ (9) වැනි හෝ (10) වැනි අනුව්‍යවස්ථා යටතේ ලැබූ ඡන්ද සංඛ්‍යාවෙහි සමානත්වයක් පවතින්නා වූ ද එක ඡන්දයක් එකතු කිරීමෙන් ඒ එක් පක්ෂයක හෝ කණ්ඩායමක හෝ අපේක්ෂකයා තෝරා පත් කරනු ලැබීමට හිමිකම් ලැබෙන්නා වූ ද අවස්ථාවක, ඒ වැඩිපුර ඡන්දය දෙන ලදැයි සැලකිය යුත්තේ කිනම් පක්ෂයට දැයි නැතහොත් කණ්ඩායමට දැයි කුසපත් ඇදීමෙන් නිශ්චය කළ යුත්තේ ය.

(12) ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද හැර ගණන් කරන ලද ඡන්ද සංඛ්‍යාව ලැබූ ඡන්ද සංඛ්‍යාව ලෙස මේ ව්‍යවස්ථාවේ කාර්ය සඳහා සැලකිය යුත්තේ ය.

(13) (අ) යම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, ඔහු එසේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වූ අවස්ථාවේ දී ඔහුගේ නම ඇතුළත් වූයේ යම් පිළිගත් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක (මෙහි මින්මතු "අදාළ නාමයෝජනා පත්‍රය" යනුවෙන් සඳහන් කරනු ලබන) නාමයෝජනා පත්‍රයේ ද ඒ දේශපාලන පක්ෂයේ හෝ කණ්ඩායමේ හෝ සාමාජිකයකුව සිටීම, ඉල්ලා අස්වීමෙන් හෝ පහ කිරීමෙන් හෝ අන් හේතුවක් නිසා හෝ නතර වූ අවස්ථාවක, ඔහු එසේ සාමාජිකයකුව සිටීම නතර වූ දින සිට එක් මාසයක කාල සීමාවක්

ඉකුත් වූ විට ඔහුගේ අසුන හිස් වන්නේ ය:

එසේ වුව ද, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු පක්ෂයෙන් පහකරනු ලැබූ අවස්ථාවක, ඉහත කී මාසයක කාල සීමාව ඉකුත් වීමට පෙර ඔහු ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ලියවිල්ලකින් වූ පෙත්සමක් මගින් ඉල්ලීමක් කළහොත් සහ ඒ පහ කිරීම වලංගු නොවන බව ඒ ඉල්ලීම මත ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කළහොත් ඔහුගේ අසුන හිස් නොවන්නේ ය. ඒ පෙත්සම ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන් තිදෙනකු විසින් විභාග කළ යුතු අතර, පෙත්සම ඉදිරිපත් කළ තැන් පටන් මාස දෙකක කාල සීමාවක් ඇතුළත ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය දෙනු ලැබිය යුත්තේ ය. ඒ පහ කිරීම වලංගු බව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කරනු ලැබූ අවස්ථාවක, ඒ තීරණයේ දිනයේ සිට ඒ අසුන හිස් වන්නේ ය.

(ආ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුගේ අසුන, 66 වැනි ව්‍යවස්ථාවේ (උ) ඡේදය හැර ඒ ව්‍යවස්ථාවේ විධිවිධාන සලසා ඇති පරිදි හෝ මේ අනුව ව්‍යවස්ථාවේ මීට ඉහතින් වූ විධිවිධාන ප්‍රකාර හෝ හිස් වූ අවස්ථාවක අදාළ පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම විසින් නාමයෝජනා කරන ලද, ඊළඟ වැඩි ම මනාප ඡන්ද සංඛ්‍යාවක් ලැබූ අපේක්ෂකයා ඒ හිස් වූ අසුන සඳහා තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කළ යුත්තේ ය.]

[63][(14). ඉවත් කරන ලදී.]

මහ මැතිවරණයක දී ලැබූ මුළු ඡන්ද සංඛ්‍යාව පදනම් කරගෙන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත්කර ගැනීම.

[64][**99අ.** පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත් කර ගැනීමේ මහ මැතිවරණයක දී 98 වැනි ව්‍යවස්ථාවේ සඳහන් මන්ත්‍රීවරයන් එකසිය අනූහය දෙනා තෝරා පත් කර ගනු ලැබූ ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබීමෙන් පසුව, ඉතිරි මන්ත්‍රී ධුර විසිනවය, ඒ මහ මැතිවරණය තරග කරන එක් එක් පිළිගත් දේශපාලන පක්ෂය සහ ස්වාධීන කණ්ඩායම ඒ මහ මැතිවරණයේ දී ලැබූ ඡන්ද සංඛ්‍යාව, ඒ මහ මැතිවරණයේ දී දෙන ලද මුළු ඡන්ද සංඛ්‍යාවට දරන අනුපාතය ම අනුව, මැතිවරණ කොමසාරිස්වරයා විසින් ඒ පක්ෂ හෝ කණ්ඩායම් අතර වහාම බෙදා වෙන්කර දිය යුත්තේ ය; තව ද, එසේ බෙදා වෙන් කිරීමේ කාර්යය සඳහා 98 වැනි ව්‍යවස්ථාවේ (4) වැනි, (5) වැනි, (6) වැනි සහ (7) වැනි අනුව්‍යවස්ථාවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ වන්නේ ය.

මහා මැතිවරණයක් තරග කරන සෑම පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් ම, ඒ පක්ෂයට හෝ කණ්ඩායමට ඒ බෙදා වෙන් කිරීම අනුව හිමිකම් ලැබෙන මන්ත්‍රී ධුර සංඛ්‍යාවක් වෙතොත්, ඒ සංඛ්‍යාව සඳහා ඒ පක්ෂය හෝ කණ්ඩායම විසින් නම් කරනු ලැබූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් ලෙස තෝරා පත් කර ගනු ලැබීමට සුදුසුකම් ඇත්තා වූ තැනැත්තන් ලැයිස්තුවක්,

63 - පහළොස් වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 4(2) වැනි වගන්තිය මගින් ඉවත් කරන ලදී.

64 - දහහතර වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 8 වැනි වගන්තිය මගින් ඇතුළත් කරන ලදී.

ඒ මහා මැතිවරණය සඳහා නියම කොට ඇති නාමයෝජනා කාල සීමාව ඇතුළත, මැතිවරණ කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ යුත්තේ ය. මේ ව්‍යවස්ථාව යටතේ තමා වෙත ඉදිරිපත් කරන ලද සෑම ලැයිස්තුවක් ම මැතිවරණ කොමසාරිස්වරයා විසින් නාමයෝජනා කාල සීමාව ඉකුත් වූ විට අප්‍රමාදව ගැසට් පත්‍රයේ ද, එක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි ප්‍රවෘත්ති පත්‍රයක ද පළ කිරීමට සැලැස්විය යුත්තේ ය.

පිළිගත් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට, ඉහත සඳහන් බෙදා වෙන් කිරීම යටතේ, මන්ත්‍රී ධුරයකට හිමිකම ඇති අවස්ථාවක, මැතිවරණ කොමසාරිස්වරයා විසින්, දැන්වීමක් මගින්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් ලෙස තෝරා පත් කරනු ලැබීමට සුදුසුකම් ඇති (මේ ව්‍යවස්ථාව යටතේ මැතිවරණ කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කරන ලද ලැයිස්තුවේ හෝ ඒ මැතිවරණයේ දී ඒ යම් මැතිවරණ කොට්ඨාසයක් සඳහා ඒ පක්ෂය හෝ කණ්ඩායම විසින් ඉදිරිපත් කරන ලද යම් නාම යෝජනා පත්‍රයක හෝ නම් ඇතුළත් වන්නේ යම් තැනැත්තන්ගේ ද, ඒ තැනැත්තන් වන) තැනැත්තන් ඒ මන්ත්‍රී ධුර සඳහා ඒ දැන්වීමේ දින සිට සතියක් ඇතුළත නම් කරන ලෙස, ඒ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයාට හෝ ස්වාධීන කණ්ඩායමේ කණ්ඩායම් නායකයාට හෝ නියම කළ යුතු අතර එසේ නම් කරනු ලැබූ තැනැත්තන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් ලෙස තෝරා පත් කර ගන්නා ලද බවට ප්‍රකාශයට පත් කළ යුත්තේය.

[65][ඉහත කී දැන්වීම නිකුත් කිරීමට පළමුව, මැතිවරණ කොමසාරිස්වරයා, 98 වැනි ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තුවට තේරී පත්ව ඇති, ජනවාර්ගික හෝ වෙනත් ආකාරයක වූ ජන කොටසකට අයත් මන්ත්‍රීවරුන් සංඛ්‍යාව ජාතික ජන සංඛ්‍යා අනුපාතයට අනුකූල වන්නේ ද යන වග තීරණය කළ යුතු අතර පාර්ලිමේන්තු මන්ත්‍රී ධුර සඳහා තෝරාපත් කර ගැනීම පිණිස එසේ තැනැත්තන් නම් කිරීමේ දී සියලුම ජන කොටස්වල නියෝජනය ජාතික ජනසංඛ්‍යා අනුපාතයට අනුකූල වන බව හැකි තරම් ප්‍රමාණයකට සුරක්ෂිත කරන ලෙසට එම පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයාගෙන් හෝ එම ස්වාධීන කණ්ඩායමේ කණ්ඩායම් නායකයාගෙන් ඉල්ලා සිටිය යුතු ය.]

මේ ව්‍යවස්ථාවේ කාර්ය සඳහා යම් මහ මැතිවරණයක දී නියම වශයෙන් ම ගණන් කරන ලද ඡන්ද සංඛ්‍යාව, ඒ මහා මැතිවරණයේ දී දෙනු ලැබූ ඡන්ද සංඛ්‍යාව ලෙස සැලකිය යුතු අතර, අවලංගු ඡන්ද ලෙස ප්‍රතික්ෂේප කරන ලද ඡන්ද ඊට ඇතුළත් නොවන්නේ ය.]

**නුසුදුස්සකුව සිටිය දී පාර්ලිමේන්තුවේ අසුන් ගතහොත් හෝ ඡන්දය දුනහොත් දණ්ඩනය.**

**100.** යම් කිසි තැනැත්තකු තමා නුසුදුස්සකු වී ඇති බව හෝ තමාගේ ආසනය හිස් වී ඇති බව හෝ දැන දැනම නැතහොත් ඒ බව දැන ගැනීමට ප්‍රමාණවත් හේතු තිබිය දී -

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් තෝරා පත් කරන ලද අවස්ථාවේ දී එසේ තෝරා පත් කරනු ලැබීමට

65 - පහෙළොස් වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 5 වැනි වගන්තිය මගින් ඇතුළත් කරන ලදී.

සුදුසුකම් නොමැතිව සිටි නමුත් එසේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබ පාර්ලිමේන්තුවේ අසුන් ගතහොත් හෝ පාර්ලිමේන්තුවේ දී ඡන්දය දුනහොත්; හෝ

(ආ) පාර්ලිමේන්තුවේ ස්වකීය ආසනය හිස්වීමෙන් පසුව හෝ පාර්ලිමේන්තුවේ අසුන් ගැනීමට හෝ පාර්ලිමේන්තුවේ දී ඡන්දය දීමට හෝ තමා නුසුදුස්සෙකු වූ පසු පාර්ලිමේන්තුවේ අසුන් ගතහොත් හෝ පාර්ලිමේන්තුවේ දී ඡන්දය දුනහොත්,

ඒ තැනැත්තා එසේ අසුන් ගන්නා වූ හෝ ඡන්දය දෙන්නා වූ හෝ එක් එක් දවස වෙනුවෙන් රුපියල් පන්සියය බැගින් වූ දණ්ඩන මුදලකට යටත් වන්නේ ය. ඒ දණ්ඩන මුදල ජනරජයට අය විය යුතු වූ ණය මුදලක් සේ නීතිපතිවරයා විසින් කොළඹ දිසා අධිකරණයේ නඩුවක් පැවරීමෙන් අය කර ගත යුත්තේ ය.

මැතිවරණ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව විසින් විධිවිධාන යෙදිය හැකි බව

101. (1) (අ) ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීම -

(ආ) යම්කිසි මැතිවරණ කොට්ඨාසයක ඡන්දහිමි නාම ලේඛනයේ යම් තැනැත්තකුගේ නම ඇතුළත් කරනු ලැබීම සඳහා ඒ තැනැත්තා ඒ මැතිවරණ කොට්ඨාසයේ පදිංචිව සිටිය යුතු සුදුසුකම් ලැබීමේ දිනයක් නියම කිරීම සම්බන්ධයෙන්;

(ඇ) ඡන්ද හිමියකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබීම සඳහා සුදුසුකම් ලැබීමට යම් තැනැත්තකු අටළොස් විය සම්පූර්ණ කර තිබිය යුතු සුදුසුකම් ලැබීමේ දිනයක් නියම කිරීම සම්බන්ධයෙන්;

(ඈ) ඡන්දහිමි නාමලේඛන පිළියෙළ කිරීම හා ප්‍රතිශෝධනය කිරීම සම්බන්ධයෙන්;

(ඉ) පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරයන් තෝරා පත් කර ගැනීමේ කාර්ය පටිපාටිය සම්බන්ධයෙන්;

(ඊ) ඒ මැතිවරණ හා සම්බන්ධ වැරදි නීතියෙන් නියම කර දැක්වීම හා ඒ වැරදි සඳහා වූ දඬුවම් සම්බන්ධයෙන්;

(උ) මැතිවරණයක් නිෂ්ප්‍රභ කිරීමට අවශ්‍ය හේතු සහ මැතිවරණයක් නිෂ්ප්‍රභ කරනු ලැබූ අවස්ථාවක අලුතෙන් මැතිවරණ පැවැත්විය යුතු ආකාරය සම්බන්ධයෙන්;

(ඌ) තෝරා පත් කර ගැනීමෙන් හෝ අන්‍යාකාරයකින් පිළිගත් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක නාම යෝජනා පත්‍රයේ නම් සඳහන් අපේක්ෂකයන් සංඛ්‍යාව [66][අවසාන වී ඇති විට හෝ පිළිගත් දේශපාලන පක්ෂයක්

66 - හය වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 2 වැනි වගන්තිය මගින් "අවසාන වී ඇති විට" යන වචන ඉවත් කොට ඒ වෙනුවට ආදේශ කරන ලදී.

හෝ ස්වාධීන කණ්ඩායමක් හෝ 157අ වැනි ව්‍යවස්ථාව යටතේ තහනම් කරනු ලැබ ඇති විට] පුරප්පාඩු පිරවිය යුතු විධිය හා ආකාරය සම්බන්ධයෙන්; සහ

(එ) හබ කළ මැතිවරණ නිශ්චය කළ යුතු ආකාරය සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත් කිරීම හා සම්බන්ධව අවශ්‍ය වන්නා වූ හෝ ආනුෂංගික වන්නා වූ හෝ වෙනත් කරුණු සම්බන්ධයෙන්, නීතියෙන් විධිවිධාන යෙදීමට පාර්ලිමේන්තු වට බලය ඇත්තේ ය:

එසේ වුව ද, එවැනි යම් නීතියකින් 89 වැනි සහ 91 වැනි ව්‍යවස්ථාවල දැක්වෙන නුසුදුසුකම්වලට තවත් නුසුදුසුකම් එකතු නොකළ යුත්තේ ය.

(2) එවැනි කාරණා සඳහා පාර්ලිමේන්තුව විසින් නීතියෙන් විධිවිධාන යොදන තුරු කලින් කල සංශෝධිත 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ්‍ය සභා ආඥාව, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත් ව අදාළ වන්නේ ය.

**මැතිවරණ කාලය තුළ දී රජයේ නිලධරයකු හෝ රාජ්‍ය සංස්ථාවක නිලධරයකු එලෙසින් කාර්යයන්හි නොයෙදිය යුතු බව.**

**102.** යම්කිසි මැතිවරණයක දී රජයේ නිලධරයකු හෝ රාජ්‍ය සංස්ථාවක නිලධරයකු අපේක්ෂකයකු වන විට, අපේක්ෂකයකු වශයෙන් ඔහුගේ නම යෝජනා කරනු ලැබුවේ යම් දිනයක ද, ඒ දිනයේ සිට මැතිවරණය අවසන් වන තෙක් ඔහු නිවාඩු පිට සිටින්නේ යයි සලකනු ලැබිය යුත්තේය. එවැනි රජයේ නිලධරයකු හෝ රාජ්‍ය සංස්ථාවක නිලධරයකු එම කාලය තුළ තම ධුරයේ බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම නොකළ යුත්තේ ය.

[67] [ 103. ඉවත් කරන ලදී.

104. ඉවත් කරන ලදී. ]

67 - දහහත් වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 8 වැනි වගන්තිය මගින් ඉවත් කරන ලදී.

## [68] [XIV අ වැනි පරිච්ඡේදය

## මැතිවරණ කොමිෂන් සභාව

**මැතිවරණ කොමිෂන් සභාවේ සංයුතිය**

**103.** [69][ (1) (මේ පරිච්ඡේදයෙහි "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) මැතිවරණ කොමිෂන් සභාවක් තිබිය යුත්තේ ය. කොමිෂන් සභාව, යම් වෘත්තීන් හි හෝ පරිපාලන හෝ අධ්‍යාපන ක්ෂේත්‍රවල හෝ, විශිෂ්ටතා හිමිකරගෙන සිටින තැනැත්තන් අතුරෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් තුන් දෙනකුගෙන් සමන්විත විය යුත්තේ ය. පත් කරනු ලබන එක් සාමාජිකයකු නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් වරයකු වශයෙන් හෝ ඊට ඉහළ වූ හෝ ධූරයක් උසුලනු ලැබූ මැතිවරණ දෙපාර්තමේන්තුවේ විශ්‍රාම ලත් නිලධරයකු විය යුත්තේ ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ඔවුන් අතුරෙන් එක් සාමාජිකයකු කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුත්තේ ය.]

(2) නිදහස් හා සාධාරණ ඡන්ද විමසීම් සහ ජනමත විචාරණ පැවැත්වීම කොමිෂන් සභාවේ පරමාර්ථය විය යුත්තේ ය.

(3) යම් තැනැත්තකු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු නම් හෝ එවැන්නකු බවට පත් වේ නම් හෝ, අධිකරණ නිලධරයකු හෝ රජයේ නිලධරයකු නම් හෝ එවැන්නකු වශයෙන් පත් කරනු ලැබුවේ නම් හෝ, කවර වුව ද තත්ත්වයකින් රජයේ සේවයේ යෙදී සිටී නම් හෝ රජයේ සේවයට ඇතුළු වේ නම් එවැනි කිසිදු තැනැත්තකු කොමිෂන් සභාවේ සාමාජිකයකු වශයෙන් පත් කිරීම හෝ එසේ සාමාජිකයකු ලෙස තවදුරටත් කටයුතු කරගෙන යාම හෝ නොකළ යුත්තේ ය.

(4) ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරයන් සහ අභියාචනාධි -කරණයේ විනිශ්චයකාරවරයන් ධූරයෙන් ඉවත් කිරීම පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහ වෙනත් නීතිවල විධිවිධාන, මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජිකයන් ධූරයෙන් ඉවත් කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුත්තේ ය.

(5) කොමිෂන් සභාවේ සාමාජිකයකු, කොමිෂන් සභාවේ පූර්ව අවසරය නොමැතිව, කොමිෂන් සභාවේ අනුක්‍රමික රැස්වීම් තුනකට නොපැමිණියහොත් ඔහු පැමිණ නොසිටි ඒ රැස්වීම්වලින් තුන්වන රැස්වීමේ දින සිට ක්‍රියාත්මක වන පරිදි ඔහු ධූරය අතහැර ගියාක් සේ සැලකිය යුත්තේ ය.

(6) කොමිෂන් සභාවේ සාමාජිකයකු මේ ව්‍යවස්ථාවේ (3) වැනි ඡේදය යටතේ යම් නුසුදුසු වීමකට පාත්‍ර වුවහොත් හෝ ජනාධිපතිවරයා

---

68 - දහහත් වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 9 වැනි වගන්තිය මගින් XIVඅ පරිච්ඡේදය (ව්‍යවස්ථාව 103 (1) සිට 104 ඒ දක්වා) ඇතුළත් කරන ලදී.

69 - දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 22(1) වැනි වගන්තිය මගින් මුල් 103(1) අනුව්‍යවස්ථාව ඉවත්කොට ඒ වෙනුවට ආදේශ කරන ලදී.

අමතා යවන ලියවිල්ලක් මගින් ධුරයෙන් ඉල්ලා අස්වුවහොත් හෝ මේ ව්‍යවස්ථාවේ (4) වැනි ඡේදය යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ චරිත දූෂණ වරදක් සම්බන්ධයෙන් අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබුවහොත් හෝ ඔහු ප්‍රජා අශක්නුතාවන්ට යටත් කළ යුතු බවට යෝජනා සම්මතයක් 81 වැනි ව්‍යවස්ථාව යටතේ සම්මත කර ඇත්නම් හෝ මේ ව්‍යවස්ථාවේ (5) වැනි ඡේදය යටතේ ධුරය හැර ගියාක් සේ සලකනු ලබන්නේ නම් හෝ මිස, ඔහු ධුරයට පත් කරනු ලැබූ දින සිට අවුරුදු පහක කාලයක් ධුරය දැරිය යුත්තේ ය.

[70] [ (7) ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාවේ සාමාජිකයකුට කොමිෂන් සභාවට අදාළ ඔහුගේ රාජකාරි කටයුතුවලින් මාස දෙකක් නොඉක්මවන කාලයක් සඳහා තාවකාලිකව නිවාඩු දෙනු ලැබිය හැකි අතර, කොමිෂන් සභාවේ සාමාජිකයකු වීමට සුදුසුකම් ඇති තැනැත්තකු ඒ නිවාඩු කාලසීමාව සඳහා කොමිෂන් සභාවේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබිය හැක්කේ ය. ඒ සෑම පත් කිරීමක් ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත විය යුත්තේ ය. ]

(8) කොමිෂන් සභාවේ සාමාජිකයකුට පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මගින් නිශ්චය කරනු ලබන යම් පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුත්තේ ය. කොමිෂන් සභාවේ සාමාජිකයකුට ගෙවිය යුතු පාරිශ්‍රමික ඒකාබද්ධ අරමුදලට වැයබරක් විය යුතු අතර, ඒ සාමාජිකයාගේ ධුර කාලය තුළ ඒ පාරිශ්‍රමිකය අඩු නොකළ යුත්තේ ය.

(9) දණ්ඩ නීති සංග්‍රහයේ IX වැනි පරිච්ඡේදයේ අර්ථානුකූලව සහ ඒ කාර්යය සඳහා කොමිෂන් සභාවේ සියලු ම සාමාජිකයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුත්තේ ය.

**කොමිෂන් සභාවේ රැස්වීම්**

**104.** (1) කොමිෂන් සභාවේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් තිදෙනකුගෙන් සමන්විත විය යුත්තේ ය.

(2) (අ) කොමිෂන් සභාවේ සභාපතිවරයා කොමිෂන් සභාවේ රැස්වීම්වල මුලසුන දැරිය යුත්තේ ය. සභාපතිවරයා කොමිෂන් සභාවේ යම් රැස්වීමකට පැමිණ නොසිටියහොත් පැමිණ සිටින සාමාජිකයන් විසින් ඔවුන් අතුරෙන් තෝරා පත් කර ගන්නා සාමාජිකයකු විසින් ඒ රැස්වීමේ මුලසුන දැරිය යුත්තේ ය.

(ආ) කොමිෂන් සභාවේ තීරණ, ඒ ඒ තීරණ ගනු ලබන රැස්වීමට පැමිණ ඡන්දය දෙන්නා වූ සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් ගනු ලැබිය යුතු අතර, යම් හෙයකින් සම සමව ඡන්දය ලැබුණු අවස්ථාවක දී ඒ රැස්වීමේ සභාපතිවරයාට තීරණ ඡන්දයක් තිබිය යුත්තේ ය.

(3) කොමිෂන් සභාවේ සාමාජිකත්වයේ යම් පුරප්පාඩුවක් තිබුණ ද, ඒ නොතකා ක්‍රියා කිරීමට කොමිෂන් සභාවට බලය ඇත්තේ

70 - දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 22(2) වැනි වගන්තිය මගින් මුල් 103 (7) වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට ආදේශ කරන ලදී.

ය. එවැනි පුරප්පාඩුවක් තිබූ පමණින් ම හෝ යම් සාමාජිකයකු පත් කිරීමෙහි ලා දෝෂයක් තිබූ පමණින් ම, කොමිෂන් සභාවේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් හෝ තීරණයක් නිර්බල නොවන්නේ ය; නිර්බල වන්නේ යයි නොසැලකිය යුත්තේ ය.

**තීරණවල අවසානාත්මක භාවය සහ නඩු කටයුතුවලින් මුක්ත බව**

**104අ.** 126 වැනි ව්‍යවස්ථාවේ (1) ඡේදය සහ 104උ෴ ව්‍යවස්ථාව සහ 130 වැනි ව්‍යවස්ථාව යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය වෙත පවරා දී ඇති අධිකරණ බලයට සහ 144 වැනි ව්‍යවස්ථාව යටතේ අභියාචනාධිකරණය වෙත පවරා දී ඇති අධිකරණ බලයට හා ඡන්ද පෙත්සම් හෝ ජනමත විචාරණ පිළිබඳ පෙත්සම් අසා තීරණය කිරීම සඳහා යම් නීතියකින් යම් අධිකරණයක් වෙත පවරා දී ඇති අධිකරණ බලයට යටත්ව,-

(අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ කොමිෂන් සභාව විසින් කරන ලද හෝ ගනු ලැබූ හෝ කරන ලදැයි නැතහොත් ගන්නා ලදැයි කියනු ලබන යම් තීරණයක්, විධානයක් හෝ ක්‍රියාවක් සම්බන්ධයෙන් පැමිණිල්ලක් කවර හේතුවක් නිසා වුව ද, කවර ආකාරයකින් වුව ද භාර ගැනීම හෝ ඇසීම හෝ තීරණය කිරීම හෝ ප්‍රශ්න කිරීමට පාත්‍ර කිරීම සඳහා බලය හෝ අධිකරණ බලය කිසිදු අධිකරණයකට නැත්තේ ය. කොමිෂන් සභාවේ තීරණ, විධාන හෝ ක්‍රියා අවසානාත්මක සහ තීරණාත්මක විය යුත්තේ ය; සහ

(ආ) කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු හෝ නිලධරයකු හෝ විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ හෝ අවස්ථාවෝචිත පරිදි යම් ඡන්ද විමසීමක් පැවැත්වීම හෝ ජනමත විචාරණයක් පැවැත්වීම හා සම්බන්ධ යම් නීතියක් යටතේ ස්වකීය කාර්ය ඉටු කිරීමේ දී හෝ තම කර්තව්‍ය සිදු කිරීමේ දී ඔහු විසින් සද්භාවයෙන් කරන ලද හෝ සද්භාවයෙන් කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් හෝ දෙයක් සම්බන්ධයෙන් ඒ සාමාජිකයාට හෝ නිලධරයාට විරුද්ධව කිසිදු සිවිල් නඩුවක් හෝ නඩු කටයුත්තක් නොපවරනු ලැබිය යුත්තේ ය.

**මැතිවරණ කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය**

**104ආ.** (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සහ ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත් කර ගැනීම, පළාත් සභා මන්ත්‍රීවරයන් තෝරා පත් කර ගැනීම, පළාත් පාලන ආයතනවල සභිකයන් තෝරා පත් කර ගැනීම සහ ජනමත විචාරණයක් පැවැත්වීම සම්බන්ධයෙන් තත්කාලයේ බලපවත්නා නීතියක් මගින් -

(අ) කොමිෂන් සභාව; හෝ

(ආ) මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා,

වෙත පවරා දී ඇති හෝ පනවා ඇති හෝ සියලු බලතල, කාර්ය සහ කර්තව්‍ය කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුත්තේ ද ඉටු කරනු ලැබිය යුත්තේ ද සිදු කරනු ලැබිය යුත්තේ ද වන්නේ ය. එවැනි ඡන්ද විමසීම්වල සහ ජනමත විචාරණවල කාර්ය සඳහා ඡන්ද හිමි නාමලේඛන පිළියෙල කිරීම සහ ප්‍රතිශෝධනය කිරීම ද, එම ඡන්ද

විමසීම් පැවැත්වීම ද එකී බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට ඇතුළත් වන නමුත් ඒවාට ම පමණක් සීමා නොවන්නේ ය.

(2) එවැනි ඡන්ද විමසීමක් හෝ ජනමත විචාරණයක් පැවැත්වීමට අදාළ සියලු ම නීති බලාත්මක කිරීම, සුරක්ෂිත කිරීම කොමිෂන් සභාවේ කාර්යය විය යුතු අතර, එසේ ඒ නීති බලාත්මක කිරීම, සුරක්ෂිත කිරීමෙහිලා කොමිෂන් සභාවේ සහයෝගය දැක්වීම ඒ නීති බලාත්මක කිරීම භාරව සිටින සියලුම රජයේ බලධරයන්ගේ කාර්ය විය යුත්තේ ය.

(3) කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තු ස්ථාවර නියෝගවල විධිවිධානවලට අනුකූලව කොමිෂන් සභාව පාර්ලිමේන්තුවට වගකිව යුතු සහ උත්තර දිය යුතු අතර, එක් එක් ලිත් වර්ෂයේ දී සිදු කරන ලද ස්වකීය කටයුතු පිළිබඳ වාර්තාවක් ඒ වර්ෂය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුත්තේ ය.

[71][ (4) (අ) මැතිවරණයක් පවත්වනු ලබන කාල පරිච්ඡේදය තුළ දී, රජයට හෝ යම් රාජ්‍ය සංස්ථාවකට හෝ අයත් යම් නිශ්චල හෝ චංචල දේපළක් -

(i) ඒ ඡන්ද විමසීමේ දී තරග කරන යම් අපේක්ෂකයකු හෝ යම් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් හෝ තෝරා පත්කර ගැනීම, ප්‍රවර්ධනය කිරීමේ හෝ වළක්වාලීමේ කාර්ය සඳහා භාවිත කිරීම;

(ii) ඒ ඡන්ද විමසීමේ දී තරග කරන යම් අපේක්ෂකයකු හෝ යම් දේශපාලන පක්ෂයක් හෝ යම් ස්වාධීන කණ්ඩායමක් හෝ විසින් භාවිත කිරීම,

කොමිෂන් සභාවේ උපදෙස් මත, කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ හෝ මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයාගේ ලිඛිත විධානයක් මඟින්, තහනම් කිරීමේ බලය කොමිෂන් සභාවට ඇත්තේ ය.

(ආ) එවැනි විධානයකට අනුකූලවීම සහ එය ක්‍රියාත්මක කිරීම, තත් කාලයේ ඒ දේපළ භාරව සිටින හෝ ඒ දේපළේ පාලනය දරන හෝ සෑම තැනැත්තකුගේ ම හෝ සෑම නිලධරයකුගේ ම කාර්යය විය යුත්තේ ය.

(5) (අ) ඡන්ද විමසීමක් හෝ ජනමත විචාරණයක් පැවැත්වීම විෂයෙහි ලා නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සහතික කිරීම සඳහා අවශ්‍ය යයි කොමිෂන් සභාව විසින් සලකනු ලබන උපමාන, අවස්ථාවෝචිත පරිදි, කොමිෂන් සභාව විසින් උචිත යයි

71 - දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 23 වැනි වගන්තිය මගින් 104ආ ව්‍යවස්ථාවේ මුල් (4), (4අ) හා (5) අනුව්‍යවස්ථා ඉවත් කොට ඒ වෙනුවට නව (4) හා (5) අනුව්‍යවස්ථා ආදේශ කරන ලදී.

සලකනු ලබන යම් ගුවන් විදුලි හෝ රූපවාහිනී සේවයක් පවත්වා ගෙන යන්නකු හෝ යම් ප්‍රවෘත්ති පත්‍රයක අයිතිකරුවකු හෝ ප්‍රකාශකයකු වෙත කලින් කල නිකුත් කිරීමේ බලය කොමිෂන් සභාවට තිබිය යුත්තේ ය.

(ආ) (අ) ඡේදය යටතේ, අවස්ථාවෝචිත පරිදි ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ සභාපතිවරයා වෙත, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ සභාපතිවරයා වෙත, ස්වාධීන රූපවාහිනී නාලිකාවේ සභාපතිවරයා වෙත සහ වෙනත් සියලු රජයට අයත් හෝ රජයේ පාලනයට යටත් ගුවන් විදුලි හෝ රූපවාහිනී ව්‍යවසායක ප්‍රධාන විධායක නිලධරයා වෙත නිකුත් කරනු ලැබූ උපමාන අනුව ක්‍රියා කිරීම සහතික කෙරෙන සියලු පියවර ගැනීම, ඔවුන්ගේ කාර්යය විය යුත්තේ ය.

(ඇ) (i) කොමිෂන් සභාව විසින්, අදාළ පරිදි, (4) වන අනු ව්‍යවස්ථාවේ (අ) ඡේදයේ සහ (5) වන අනුව්‍යවස්ථාවේ (අ) ඡේදයේ සඳහන් කරනු ලැබ ඇති විධාන සහ උපමාන සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවෙන් පළකරනු ලබන, පුළුල් සංසරණයක් ඇති, යටත් පිරිසෙයින් එක් දිනපතා ප්‍රවෘත්ති පත්‍රයක පළකිරීමට වග බලාගත යුත්තේ ය;

(ii) සෑම විධානයක් ම සහ උපමානයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එකී පළකිරීමේ දිනයේ දී හෝ එකී විධාන සහ උපමානවල නිශ්චිතව සඳහන් කරනු ලබන යම් පසු දිනක දී හෝ ක්‍රියාත්මක විය යුත්තේ ය;

(iii) එකී සෑම විධානයක් ම සහ උපමානයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දිනයෙන් මාස තුනක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුත්තේ ය. එසේ අනුමතය නොලබන යම් විධාන හෝ උපමාන ඒවා යටතේ පූර්වයේ කරන ලද කිසිවකට අගතියක් නොමැතිව එකී අනනුමතයේ දින සිට අවලංගු වූ ලෙස සලකනු ලැබිය යුත්තේ ය. ]

**කොමිෂන් සභාව විසින් පොලිසිය යෙදවීම.**

**104ඇ.** (1) අවස්ථාවෝචිත පරිදි, ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා නියමයක් හෝ ජනමත විචාරණයක් පැවැත්වීමට නියම කරමින් ප්‍රකාශනයක් හෝ කරනු ලැබූ විට, අවස්ථාවෝචිත පරිදි, ඒ ඡන්ද විමසීම හෝ ජනමත විචාරණය හෝ පැවැත්වීම සඳහා කොමිෂන් සභාවට අවශ්‍ය පහසුකම් සහ පොලිස් නිලධරයන් සංඛ්‍යාව කොමිෂන් සභාව විසින් පොලිස්පතිවරයාට දැනුම් දිය යුත්තේ ය.

(2) මේ ව්‍යවස්ථාවේ (1) වැනි ඡේදය යටතේ කරනු ලැබූ දැනුම්දීමක නිශ්චිතව සඳහන් පහසුකම් සහ පොලිස් නිලධරයන්, පොලිස්පතිවරයා විසින් කොමිෂන් සභාවට ලබාදිය යුත්තේ ය.

(3) කොමිෂන් සභාව වෙත සපයන ලද පොලිස් නිලධරයන් සහ පහසුකම්, අවස්ථාවෝචිත පරිදි ඡන්ද විමසීමක් හෝ ජනමත විචාරණයක් පැවැත්වීම නිදහස්ව සහ සාධාරණව ප්‍රවර්ධනය කිරීම

සඳහා සැලසුම්ගත ආකාරයකින් කොමිෂන් සභාව විසින් යොදවා ගනු ලැබිය යුත්තේ ය.

(4) මේ ව්‍යවස්ථාවේ (2) වැනි ඡේදය යටතේ කොමිෂන් සභාව වෙත සපයන ලද සෑම පොලිස් නිලධරයකු ම, ඡන්ද විමසීමක කාලය තුළ දී කොමිෂන් සභාවට වගකිව යුතු අතර කොමිෂන් සභාවේ විධානය සහ පාලනය යටතේ ක්‍රියා කළ යුත්තේ ය.

(5) මේ ව්‍යවස්ථාව යටතේ කොමිෂන් සභාව වෙත සපයන ලද යම් පොලිස් නිලධරයකු විසින් කොමිෂන් සභාවේ විධානයක් ප්‍රකාර කොමිෂන් සභාව යටතේ කර්තව්‍ය ඉටු කිරීමේ දී හෝ සද්භාවයෙන් කරන ලද යම් නීත්‍යානුකූල ක්‍රියාවක් හෝ දෙයක් සම්බන්ධයෙන් ඒ පොලිස් නිලධරයාට විරුද්ධව යම් සිවිල් නඩුවක් හෝ නඩු කටයුත්තක් පවරනු නොලැබිය යුත්තේ ය.

සන්නද්ධ හමුදා යෙදවීම

**104ඈ.** අවස්ථාවෝචිත පරිදි, ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා නියමයක් හෝ ජනමත විචාරණයක් පැවැත්වීමට නියම කෙරෙන ප්‍රකාශනයක් හෝ කරනු ලැබූ විට, අවස්ථාවෝචිත පරිදි, නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් හෝ ජනමත විචාරණයක් හෝ පැවැත්වීමට අහිතකර විය හැකි යම් ක්‍රියා හෝ සිද්ධි වැළැක්වීම හෝ පාලනය කිරීම හෝ සඳහා ජනරජයේ සන්නද්ධ හමුදා යෙදවීම සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් ජනාධිපතිවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා සහ කොමිෂන් සභාවේ වෙනත් නිලධරයන්

**104ඉ.** [72][ (1) මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයෙක් සිටිය යුත්තේ ය. ඒ මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි වූ නියමයන් සහ කොන්දේසි මත කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය යුත්තේ ය. ]

(2) තමා පිළිබඳ යම් කාරණයක් කොමිෂන් සභාව විසින් සලකා බලනු ලබන අවස්ථාවක දී හැර, කොමිෂන් සභාවේ රැස්වීම්වලට පැමිණ සිටීමේ හිමිකම මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයාට ඇත්තේ ය. එම රැස්වීම්වල දී ඡන්දය දීමේ අයිතිය ඔහුට නොමැත්තේ ය.

(3) කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන නියමයන් සහ කොන්දේසි මත කොමිෂන් සභාවට වෙනත් නිලධරයන් කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය හැක්කේ ය.

(4) මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයාගේ සහ කොමිෂන් සභාවේ වෙනත් නිලධරයන්ගේ වැටුප්, කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය යුතු අතර, එම වැටුප් ඒකාබද්ධ අරමුදලට වැයබරක් විය යුත්තේ ය.

---

72 - දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 24 වැනි වගන්තිය මගින් 104ඉ (1) අනුව්‍යවස්ථාව ඉවත් කොට ඒ වෙනුවට ආදේශ කරන ලදී.

(5) මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා විසින් කොමිෂන් සභාවේ තීරණ, කොමිෂන් සභාවේ විධානවලට සහ පාලනයට යටත්ව ක්‍රියාත්මක කරනු ලැබිය යුතු අතර, කොමිෂන් සභාවේ නිලධරයන් විෂයයෙහි අධීක්ෂණය කිරීම ද, කරනු ලැබිය යුත්තේ ය.

(6) කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය කිසිවක් කොමිෂන් සභාව විසින් මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා වෙත හෝ කොමිෂන් සභාවේ වෙනත් යම් නිලධරයකු වෙත හෝ පවරා දෙනු ලැබිය හැකි අතර, කොමිෂන් සභාවේ විධානයට සහ පාලනයට යටත්ව මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා හෝ ඒ වෙනත් නිලධරයා හෝ විසින් ඒ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම ද ඉටු කිරීම ද කරනු ලැබිය යුත්තේ ය.

(7) මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයාගේ ධුරය -

(අ) ඔහු මිය ගිය විට ;

(ආ) කොමිෂන් සභාව අමතා යවනු ලබන ලියවිල්ලක් මගින් ඔහු ධුරයෙන් ඉල්ලා අස් වූ විට ;

(ඇ) ඔහු වයස අවුරුදු හැටපහ සම්පූර්ණ කළ විට ;

(ඈ) රෝගීභාවය හෝ ශාරීරික නැතහොත් මානසික දුර්වලතාව හේතු කොටගෙන කොමිෂන් සභාව විසින් ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබූ විට ; හෝ

(ඉ) ඔප්පු කරනු ලැබූ විෂම පැවැත්ම හෝ අබලතාව හේතු කොටගෙන ඔහු ඉවත් කිරීම සඳහා සංදේශයක් (8) වැනි ඡේදයේ විධිවිධානවලට අනුකූලව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබ කොමිෂන් සභාව විසින් ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබූ විට,

හිස් වන්නේ ය.

(8) (අ) මේ ව්‍යවස්ථාවේ 7 වැනි ඡේදයේ (ඉ) අනුඡේදයේ සඳහන් සංදේශයට පක්ෂව, (නොපැමිණි මන්ත්‍රීවරයන් ද ඇතුළුව) පාර්ලිමේන්තුවේ මුළු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවේ බහුතරය විසින් ඡන්දය දීම අවශ්‍ය වන අතර, එවැනි යෝජනාවක් පිළිබඳ දැන්වීම පාර්ලිමේන්තුවේ මුළු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවෙන් තුනෙන් එකකට නොඅඩු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවක් විසින් අත්සන් කර ඇත්නම් සහ චෝදිත විෂම පැවැත්ම හෝ අබලතාව පිළිබඳ සම්පූර්ණ විස්තර එහි දක්වා ඇත්නම් මිස, එවැනි සංදේශයක් ඉදිරිපත් කිරීම සඳහා වූ කිසිම යෝජනාවක් කථානායකවරයා විසින් භාර ගැනීම හෝ පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම හෝ නොකළ යුත්තේ ය.

(ආ) එවැනි යෝජනාවක් සම්මත කිරීමේ කාර්ය පටිපාටිය ද, චෝදිත විෂම පැවැත්ම හෝ අබලතාව විමර්ශනය කිරීම සහ ඔප්පු

කිරීම ද පෞද්ගලිකව ම හෝ නියෝජිතයන් මගින් හෝ පෙනී සිටීමට සහ කරුණු දක්වා සිටීමට මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා සතු අයිතිය ද ඇතුළුව, එවැනි සංදේශයක් ඉදිරිපත් කිරීමට අදාළ සියලු කාරණා සඳහා පාර්ලිමේන්තුව විසින් නීතියෙන් හෝ ස්ථාවර නියෝග මගින් හෝ විධිවිධාන සැලැස්විය යුත්තේ ය.

**තේරීම් භාර නිලධරයන්.**

**104ඊ.** (1) කොමිෂන් සභාව විසින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මගින්, එක් එක් මැතිවරණ දිස්ත්‍රික්කය සඳහා තේරීම් භාර නිලධරයකු වශයෙන් තැනැත්තකු නමින් හෝ නිලයෙන් හෝ කලින් කල පත් කරනු ලැබිය යුතු අතර, තේරීම් භාර නිලධරයාගේ කාර්යය ඉටු කිරීමේ දී ඔහුට සහාය වීම පිණිස තැනැත්තන් එක්කෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් නමින් හෝ නිලයෙන් හෝ පත් කරනු ලැබිය හැක්කේ ය.

(2) (1) වැනි ඡේදය යටතේ පත් කරනු ලැබූ සෑම නිලධරයකු ම වෙත පවරන ලද කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී, කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන විධානවලට ඔහු යටත් විය යුතු අතර, ඒ සම්බන්ධයෙන් කොමිෂන් සභාවට වගකිව යුතු සහ උත්තර දිය යුතු වන්නේ ය.

**රජයේ නිලධරයන්.**

**104උ.** යම් ඡන්ද විමසීමක දී හෝ ජනමත විචාරණයක දී කාර්ය සහ කර්තව්‍ය ඉටු කරන සියලුම රජයේ නිලධරයන් විසින්, ඒ කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන විධානවලට යටත්ව ක්‍රියා කළ යුතු අතර, ඒ සම්බන්ධයෙන් කොමිෂන් සභාවට වගකිව යුතු සහ උත්තර දිය යුතු වන්නේ ය.

**විධිවිධානවලට අනුකූලවීමට අපොහොසත්වීම වරදක් විය යුතු බව**

[73][ **104ඌ.** (1) කිසිදු සාධාරණ හේතුවක් නොමැතිව -

(අ) යම් ඡන්ද විමසීමක් පැවැත්වීමට හෝ ජනමත විචාරණයක් පැවැත්වීමට අදාළ යම් නීතියක් බලාත්මක කිරීම සහතික කිරීම පිණිස කොමිෂන් සභාව සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට ප්‍රතික්ෂේප කරන හෝ අපොහොසත්වන; හෝ

(ආ) 104ආ ව්‍යවස්ථාවේ පිළිවෙලින් (4) වන අනුව්‍යවස්ථාවේ (අ) ඡේදය හෝ (5) වන අනුව්‍යවස්ථාවේ (අ) ඡේදය යටතේ කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන විධානයන් හෝ උපමාන සමග අනුකූලව කටයුතු කිරීමට, අපොහොසත්වන,

යම් රජයේ නිලධරයකු, රාජ්‍ය සංස්ථාවක හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ රජය වෙත පවරනු ලැබ ඇති යම් වෙළඳ ව්‍යාපාරයක හෝ වෙනත් ව්‍යාපාරයක සේවා නියුක්තිකයකු සහ 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති හෝ ලියාපදිංචි වී ඇති බවට සලකනු ලබන සහ ස්වකීය කොටස්වලින් සියයට පනහක්

73 - දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 25 වැනි වගන්තිය මගින් නව 104 ඌ. අනුව්‍යවස්ථාව ඇතුළත් කරන ලදී.

හෝ ඊට වැඩි ප්‍රතිශතයක් රජය හෝ රාජ්‍ය සමාගමක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ විසින් දරනු ලබන යම් සමාගමක් වරදකට වරදකරුවන අතර, වරදකරු කිරීමේ දී රුපියල් එක් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු තුනක් නොඉක්මවන බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත්විය යුත්තේ ය.

(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත සෑම මහාධිකරණයකටම (1) වන අනු ව්‍යවස්ථාවේ සඳහන් යම් කාරණයක් විභාග කොට තීරණය කිරීමට අධිකරණ බලය තිබිය යුත්තේ ය. ]

**104උ.** (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 140 වැනි ව්‍යවස්ථාව යටතේ අභියාචනාධිකරණය වෙත පවරා ඇති අධිකරණ බලය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් හෝ වෙනත් යම් නීතියක් මගින් හෝ කොමිෂන් සභාව වෙත පවරා ඇති බලතල කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරනු ලැබීමේ දී උද්ගත වන යම් කාරණයකට අදාළව, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුත්තේ ය.

**රිට් ආඥා නිකුත් කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණය සතු බලය**

(2) (1) වැනි ඡේදයේ සඳහන් අධිකරණ බලය අයැද ඉදිරිපත් කරනු ලබන සෑම ඉල්ලීමක් ම, එසේ ඉල්ලීමට අදාළ ක්‍රියාව සිදු කරන ලද දින සිට එක් මාසයක් ඇතුළත දී ඉදිරිපත් කරනු ලැබිය යුත්තේ ය. එවැනි ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබූ දින සිට මාස දෙකක් ඇතුළත දී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඒ ඉල්ලීම විමසා අවසාන වශයෙන් සුදුස්සක් කරනු ලැබිය යුත්තේ ය.

**104ඌ.** මේ පරිච්ඡේදයේ "ඡන්ද විමසීමක් පැවැත්වෙන කාලසීමාව" යන්නෙන්, අවස්ථාවෝචිත පරිදි ජනමත විචාරණයක් හෝ ඡන්ද විමසීමක් හෝ පැවැත්වීම සඳහා ප්‍රකාශනයක් හෝ නියමයක් හෝ කරනු ලැබූ දිනයෙන් ආරම්භව, අවස්ථාවෝචිත පරිදි, ඒ ජනමත විචාරණයේ හෝ ඡන්ද විමසීමේ ඡන්ද ප්‍රතිඵලය ප්‍රකාශයට පත් කරනු ලබන දිනයෙන් අවසන් වන කාලසීමාව අදහස් වන්නේ ය.

**අර්ථ නිරූපනය**

## XV වැනි පරිච්ඡේදය

### අධිකරණය

අධිකරණ පිහිටුවීම යනාදිය

**105.** (1) මෙහි පහත සඳහන් ආයතන, එනම් :-

(අ) ශ්‍රී ලංකා ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණය;

(ආ) ශ්‍රී ලංකා ජනරජයේ අභියාචනාධිකරණය;

(ඇ) ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණය හා පාර්ලිමේන්තුව විසින් කලින් කල නියම කොට පිහිටුවනු ලැබිය හැකි වෙනත් යම් මුල් අවස්ථා අධිකරණ, විනිශ්චය අධිකාර හෝ ආයතන,

යන මේ ආයතන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව, ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන්නා වූ, තහවුරු කරන්නා වූ සහ බලගන්වන්නා වූ යුක්තිය පසිඳලන ආයතන වන්නේ ය.

(2) ශ්‍රේෂ්ඨාධිකරණය හැර යුක්තිය පසිඳලීම සහ කාර්මික හා වෙනත් ආරාවුල් විනිශ්චය කොට නිරවුල් කිරීම සඳහා පවත්නා ලිඛිත නීතියෙන් ඇති කොට පිහිටුවන ලද්දා වූ සියලු අධිකරණ ද, විනිශ්චය අධිකාර හා ආයතන ද පාර්ලිමේන්තුව විසින් ඇති කොට පිහිටුවන ලද අධිකරණ, විනිශ්චය අධිකාර සහ ආයතන ලෙස සැලකිය යුත්තේ ය. ඒ අධිකරණ, විනිශ්චය අධිකාර සහ ආයතන ප්‍රතියෝජනය කිරීම හෝ අහෝසි කිරීම හෝ ඒ අධිකරණවල, විනිශ්චය අධිකාරවල සහ ආයතනවල බලතල, කාර්ය, අධිකරණ බලය සහ කාර්ය පටිපාටිය සංශෝධනය කිරීම හෝ පාර්ලිමේන්තුව විසින් කළ හැක්කේ ය.

(3) ශ්‍රී ලංකා ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණය සහ ශ්‍රී ලංකා ජනරජයේ අභියාචනාධිකරණය යන එක් එක් අධිකරණය ලේඛනෝපගත කිරීමේ ජ්‍යෙෂ්ඨ අධිකරණයක් වන්නේ ය. අධිකරණයේ දී ම නැතහොත් අන් ස්ථානයක දී ඒ අධිකරණයකට අපහාස කිරීම සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය හෝ අභියාචනාධිකරණය සුදුසු යයි සලකන පරිදි බන්ධනාගාරගත කිරීමෙන් හෝ දඩයකින් හෝ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකින් ම හෝ දඬුවම් කිරීමේ බලය ද ඇතුළුව එබඳු අධිකරණයක සියලු බලතල ඒ අධිකරණයන්ට ඇත්තේ ය. අභියාචනාධිකරණයේ බලයට, මේ ව්‍යවස්ථාවේ (1) වැනි අනුව්‍යවස්ථාවේ (ඇ) ඡේදයේ සඳහන් වෙනත් යම් අධිකරණයකට, විනිශ්චය අධිකාරයකට හෝ ආයතනයකට, ඒ අධිකරණය, විනිශ්චය අධිකාරය හෝ ආයතනය ඉදිරියේ දී ම හෝ අන් ස්ථානයක දී හෝ අපහාස කිරීම සම්බන්ධයෙන් දඬුවම් කිරීමේ බලය ද ඇතුළත් වන්නේ යඃ

එසේ වුව ද, එබඳු යම් අධිකරණයකට, විනිශ්චය අධිකාරයකට හෝ ආයතනයකට අපහාස කිරීම සම්බන්ධයෙන් දඬුවම් කිරීමට ඒ අධිකරණයට, විනිශ්චය අධිකාරයට නැතහොත් ආයතනයට කවර වූ හෝ නීතියකින් දැනට පැවරී ඇති හෝ මතුවට පැවරෙන අයිතියට, මේ ව්‍යවස්ථාවේ මීට ඉහතින් වූ විධිවිධානවලින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

(4) භික්ෂූන් වහන්සේලාගේ විනය හා සම්බන්ධ කාරණා හෝ භික්ෂූන් වහන්සේලා අතර ඇති යම් ආරවුලක් හෝ විහාරස්ථානවල හෝ විහාරස්ථානවලට අදාළ සේවාවන් ඉටු කිරීම හා සම්බන්ධ වෙනත් යම් ආරවුලක් හෝ විනිශ්චය කොට සමථයකට පත් කිරීම සඳහා අධිකරණ, විනිශ්චය අධිකාර හෝ ආයතන ඇති කොට පිහිටුවීමට පාර්ලිමේන්තුව විසින් නීතියෙන් විධිවිධාන සැලැස්විය හැක්කේ ය. මේ පරිච්ඡේදයේ හෝ XVI වැනි පරිච්ඡේදයේ හෝ පටහැනිව කවර විධිවිධානයක් තිබුණ ද-

(අ) ජනාධිපතිවරයා විසින් හෝ ඒ නීතියෙන් විධිවිධාන සලස්වනු ලබන වෙනත් යම් තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් විසින් හෝ ඒ අධිකරණවල විනිශ්චය අධිකාරවල හෝ ආයතනවල සාමාජිකයා හෝ සමාජිකයන් පත් කිරීම, මාරු කිරීම, ඉවත් කිරීම සහ ඔවුන්ගේ විනය පාලනය සම්බන්ධයෙන් ද ;

(ආ) එවැනි කාරණා හා ආරවුල්, මේ ව්‍යවස්ථාවේ (1) වැනි අනුව්‍යවස්ථාවේ සඳහන් වෙනත් යම් ආයතනයක අධිකරණ බලයෙන් ඉවත් කිරීම සඳහා ද,

ඒ නීතියෙන් විධිවිධාන සැලැස්විය හැක්කේ ය.

මේ අනුව්‍යස්ථාවේ "භික්ෂූන් වහන්සේ" සහ "විහාරස්ථානය" යන යෙදුම්වල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වන අවස්ථාවේ බෞද්ධ විහාරගම් හා දේවාලගම් ආඥාපනතේ ඒ යෙදුම්වල තිබූ අර්ථය ම ඇත්තේය.

ප්‍රසිද්ධියේ විභාග පැවැත්වීම.

**106.** (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද නැතහොත් පාර්ලිමේන්තුව විසින් නියම කොට පිහිටුවන ලද සෑම අධිකරණයක ම, සෑම විනිශ්චය අධිකාරයක ම හෝ වෙනත් සෑම ආයතනයක ම නඩු විභාග, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව ප්‍රසිද්ධියේ පැවැත්විය යුත්තේ ය. සියලු තැනැත්තන්ට, ඒ නඩු විභාගවලට නිදහසේ පැමිණ සිටීමට හිමිකම් ඇත්තේ ය.

(2) එවැනි යම් අධිකරණයක, විනිශ්චය අධිකාරයක හෝ වෙනත් ආයතනයක විනිශ්චයකාරවරයකු හෝ මූලාසනාරූඪ නිලධරයකු විසින්, යෝග්‍ය යයි තමා සලකන කවර අවස්ථාවක දී වුව ද ස්වකීය අභිමතය පරිදි -

(අ) පවුලේ අන්‍යෝන්‍ය සම්බන්ධතා පිළිබඳ වූ නඩු කටයුතුවල දී; හෝ

(ආ) ලිංගික කාරණා පිළිබඳ වූ නඩු කටයුතුවල දී; හෝ

(ඇ) රාජ්‍ය ආරක්ෂාව හෝ මහජන ආරක්ෂාව තහවුරු කිරීම පිණිස; හෝ

(ඈ) ඒ අධිකරණයේ, විනිශ්චය අධිකාරයේ හෝ වෙනත් ආයතනයේ සීමාව ඇතුළත යථා පැවැත්ම සහ සුරක්ෂිතභාවය තහවුරු කිරීම පිණිස,

ඒ අධිකරණයේ, විනිශ්චය අධිකරණයේ හෝ වෙනත් ආයතනයේ නඩු කටයුතුවලට කෙළින් ම සම්බන්ධතාවක් නොමැති තැනැත්තන් ඉන් බැහැර කළ හැක්කේ ය.

## අධිකරණයේ ස්වාධීනත්වය

ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන් පත්කිරීම හා ඉවත් කිරීම

**107.** [74][ (1) අග්‍රවිනිශ්චයකාරවරයා ද අභියාචනාධිකරණයේ සභාපතිවරයා ද ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ වෙනත් සෑම විනිශ්චයකාරවරයෙක්ද ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව ස්වකීය අත්සන යටතේ වූ අධිකාර පත්‍රයක් මගින් පත්කරනු ලබන්නා හ. ]

(2) ඉහත කී සෑම විනිශ්චයකාරවරයෙක් ම යථා පැවැත්මෙන් සිටින තාක් ධුරය දරන්නේ ය. ඒ යම්කිසි විනිශ්චයකාරවරයකු ඉවත් කිරීම සඳහා ඔප්පු වී ඇති විෂම පැවැත්ම හෝ අබලතාව හෝ පදනම් කොටගෙන (නොපැමිණි මන්ත්‍රීවරයන් ද ඇතුළුව) පාර්ලිමේන්තුවේ මුළු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවෙන් බහුතර සංඛ්‍යාවක් විසින් සම්මත කරන ලද පාර්ලිමේන්තුවේ යෝජනාවක් ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබීමෙන් පසුව ජනාධිපතිවරයා විසින් කරන ලද නියමයකින් හැර ඒ විනිශ්චයකාරවරයකු ඉවත් කළ නොහැක්කේ යඃ

එසේ වුව ද, එවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීම සඳහා වූ යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම පාර්ලිමේන්තුවේ මුළු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවෙන් යටත් පිරිසෙයින් තුනෙන් එකක් විසින් අත්සන් තබා ඇත්නම් හා චෝදිත විෂම පැවැත්ම හෝ අබලතාව පිළිබඳ සම්පූර්ණ විස්තර එහි දක්වා ඇත්නම් මිස කථානායකවරයා විසින් එවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීම සඳහා වූ කිසිම යෝජනා සම්මතයක් භාර ගැනීම හෝ පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම හෝ නොකළ යුත්තේ ය.

(3) ඒ යෝජනා සම්මතය සම්මත කිරීමේ කාර්ය පටිපාටිය ද ඇතුළුව එවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීම සම්බන්ධව වූ ද චෝදිත විෂම පැවැත්ම හෝ අබලතාව විමර්ශනය කිරීම සහ ඔප්පු කිරීම සම්බන්ධව වූ ද විනිශ්චයකාරවරයාට පෞද්ගලිකව ම හෝ නියෝජිතයකු මගින් හෝ පෙනී සිටීමට සහ කරුණු දක්වා සිටීමට ඇති අයිතිය සම්බන්ධ වූ ද සියලු කාරණා සඳහා පාර්ලිමේන්තුව විසින් නීති මගින් හෝ ස්ථාවර නියෝග මගින් හෝ විධිවිධාන සැලැස්විය යුත්තේ ය.

(4) අග්‍ර විනිශ්චයකාරවරයා වශයෙන් හෝ අභියාචනාධිකරණයේ සභාපතිවරයා වශයෙන් හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ නැතහොත් අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයකු වශයෙන් හෝ පත් කරනු ලැබූ නැතහොත් ඒ ධුරයක වැඩ බැලීම සඳහා පත් කරනු ලැබූ සෑම තැනැත්තකු ම ජනාධිපතිවරයා ඉදිරියේ, හතරවන උපලේඛනයේ දැක්වෙන ප්‍රතිඥාව හෝ දිවුරුම හෝ දී ඊට අත්සන් තබන තෙක් ධුරයේ කාර්යයන්හි නොයෙදිය යුත්තේ ය.

(5) ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන් විශ්‍රාම ගත යුතු වයස අවුරුදු හැට පහ වන අතර, අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන් විශ්‍රාම ගත යුතු වයස අවුරුදු හැට තුන වන්නේ ය.

74 - දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 26 වගන්තිය මගින් මුල් 107 (1) අනුව්‍යවස්ථාව ඉවත් කොට ඒ වෙනුවට ආදේශ කරන ලදී

**ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන්ගේ වැටුප්.**

**108.** (1) ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන්ගේ ද අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන්ගේ ද වැටුප් පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලබන්නේ ය. ඒ වැටුප් ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන්නේ ය.

(2) ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයකුට සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයකුට ගෙවිය යුතු වැටුප සහ ඒ යම් විනිශ්චයකාරවරයකුගේ විශ්‍රාම වැටුප් හිමිකම් ඒ විනිශ්චයකාරවරයා පත් කරනු ලැබීමෙන් පසු අඩු නොකළ යුත්තේ ය.

**වැඩ බැලීමේ පත්වීම.**

**109.** [75][ (1) රෝගාතුර වීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ ස්වකීය ධූරයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරිමට සහ ඉටු කිරීමට අග්‍ර විනිශ්චයකාරවරයා හෝ අභියාචනාධිකරණයේ සභාපතිවරයා හෝ තාවකාලිකව අපොහොසත් වේ නම්, එම කාලසීමාව තුළ පිළිවෙළින් අග්‍ර විනිශ්චයකාර ධූරයේ හෝ අභියාචනාධිකරණයේ සභාපති ධූරයේ හෝ වැඩ බැලීම සඳහා ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව ශ්‍රේෂ්ඨාධිකරණයේ නැතහොත් අභියාචනාධිකරණයේ වෙනත් විනිශ්චයකාරවරයකු පත් කළ හැක්කේ ය.

(2) රෝගාතුර වීම නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ ස්වකීය ධූරයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට සහ ඉටු කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණයේ යම් විනිශ්චයකාරවරයකු හෝ අභියාචනාධිකරණයේ යම් විනිශ්චයකාරවරයකු හෝ තාවකාලිකව අපොහොසත් වේ නම්, ඒ කාල සීමාව තුළ පිළිවෙළින් ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයකු වශයෙන් හෝ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයකු වශයෙන් හෝ වැඩ බැලීම සඳහා ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව වෙනත් විනිශ්චයකාරවරයකු පත් කරනු ලැබිය හැක්කේ ය. ]

**විනිශ්චයකාරවරයන් විසින් වෙනත් කාර්ය හෝ කර්තව්‍ය ඉටු කිරීම.**

**110.** (1) ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයකුට හෝ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයකුට වෙනත් ලිඛිත නීතියක් යටතේ වෙනත් උචිත කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් ඉටු කිරීමට ජනරජයේ ජනාධිපතිවරයා විසින් නියම කරනු ලැබිය හැක්කේ ය.

(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් නැතහොත් වෙනත් ලිඛිත නීතියකින් බලය දී ඇති පරිදි හෝ ජනාධිපතිවරයාගේ ලිඛිත කැමැත්ත ඇතිව හෝ මිස, (වැටුප් ගෙවනු ලබන හෝ නොලබන) වෙනත් යම් ධූරයක කටයුතු කිරීම නැතහොත් ලාභ හෝ වේතනයක් ලබන්නා වූ වෙනත් යම් තනතුරක් පිළිගැනීම ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ කිසිම විනිශ්චයකාරවරයකු විසින් නොකළ යුත්තේ ය.

75 - දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 27 වගන්තිය මගින් මුල් 109 වන ව්‍යවස්ථාව ඉවත් කොට ඒ වෙනුවට ආදේශ කරන ලදී.

(3) ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයකු වශයෙන් හෝ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයකු වශයෙන් ස්ථිර ධුරය දැරූ කිසිම තැනැත්තකු, ජනාධිපතිවරයාගේ ලිඛිත කැමැත්ත නොමැතිව කවර වූ හෝ අධිකරණයක, විනිශ්චය අධිකාරයක හෝ ආයතනයක නීතිඥවරයකු වශයෙන් පෙනී සිටීම, උත්තරවාද ඉදිරිපත් කිරීම, ක්‍රියා කිරීම හෝ වෘත්තියෙහි යෙදීම නොකළ යුත්තේ ය.

**මහාධිකරණ විනිශ්චයකාරවරයන් පත් කිරීම, ධුරයෙන් ඉවත් කිරීම සහ ඔවුන්ගේ විනය පාලනය.**

111. [76] [(1) ශ්‍රී ලංකා මහාධිකරණයක් තිබිය යුත්තේ ය. පාර්ලිමේන්තුව විසින් නීතියෙන් පවරනු ලබන හෝ නියම කරනු ලබන අධිකරණ බලය සහ බලතල ඒ අධිකරණය ක්‍රියාත්මක කරන්නේ ය.]

[77] [(2) මහාධිකරණයේ විනිශ්චයකාරවරයන්,

(අ) අධිකරණ සේවා කොමිෂන් සභාවේ නිර්දේශය මත, ජනාධිපතිවරයා විසින් සිය අත්සන යටතේ වූ අධිකාර පත්‍රයක් මගින් පත් කරනු ලැබිය යුතු අතර, නීතිපතිවරයා විමසීමෙන් පසු ඒ නිර්දේශය කරනු ලැබිය යුත්තේ ය;

(ආ) අධිකරණ සේවා කොමිෂන් සභාවේ නිර්දේශය මත, ජනාධිපතිවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි අතර, ජනාධිපතිවරයාගේ විනය පාලනයට ඔවුහු යටත් විය යුත්තා හ.]

(3) මේ ව්‍යවස්ථාවේ (2) වැනි අනුව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව, මහාධිකරණයේ විනිශ්චයකාරවරයන්ගේ විශ්‍රාම ගැනීම හා සම්බන්ධ කාරණා සඳහා පාර්ලිමේන්තුව විසින් නීතියෙන් විධිවිධාන සැලැස්විය හැක්කේ ය.

[78] [(4) මහාධිකරණයේ කවර වුව ද විනිශ්චයකාරවරයකු විසින්, ජනාධිපතිවරයා වෙත යොමු කරනු ලබන තම අත්සන යටතේ වූ ලියවිල්ලක් මගින්, ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැක්කේ ය.]

**මහාධිකරණ කොමසාරිස්වරයෝ**

[79] [111අ. (1) යම් අධිකරණ කලාපයක මහාධිකරණයේ අධිකරණ බලය හා බලතල ක්‍රියාත්මක කරන විනිශ්චයකාරවරයන්ගේ සංඛ්‍යාව තාවකාලිකව වැඩි කිරීම යෝග්‍ය යැයි අධිකරණ විෂයය භාර අමාත්‍යවරයා විසින් ජනාධිපතිවරයාට කරුණු ඉදිරිපත් කර සිටින අවස්ථාවක, [80] [ජනාධිපතිවරයා විසින්, අධිකරණ සේවා කොමිෂන් සභාවේ නිර්දේශය මත, පත් කිරීමේ අධිකාර පත්‍රයක් මගින්] ඒ පත් කිරීමේ අධිකාර පත්‍රයේ නිශ්චිතව දැක්වෙන අධිකරණ කලාපය ඇතුළත මහාධිකරණයේ අධිකරණ බලය හා බලතල ක්‍රියාත්මක කිරීම සඳහා, මහාධිකරණ කොමසාරිස්වරයන් එක් කෙනකු හෝ ඊට වැඩි ගණනක් පත් කරනු ලැබිය හැක්කේ ය.

---

76 - එකොළොස් වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 2 වගන්තිය මගින් මුල් (1) වැනි අනුව්‍යවස්ථාව ඉවත් කොට, ඒ වෙනුවට ආදේශ කරන ලදී.

77 - දහහත් වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 12(1) වැනි වගන්තිය මගින් මුල් (2) වැනි අනුව්‍යවස්ථාව ඉවත් කොට, ඒ වෙනුවට ආදේශ කරන ලදී.

78 - දහහත් වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 12(2) වැනි වගන්තිය මගින් ඇතුළත් කරන ලදී.

79 - හත් වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 4 වැනි වගන්තිය මගින් 111 අ. ව්‍යවස්ථාව ඇතුළත් කරන ලදී.

80 - දහහත් වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 13 වැනි වගන්තිය මගින් "ජනාධිපතිවරයා විසින් පත්කිරීමේ අධිකාර පත්‍රයක් මගින්" යන වචන වෙනුවට ඇතුළත් කරන ලදී.

(2) (1) වැනි අනුව්‍යවස්ථාව යටතේ පත් කරන ලද සෑම මහාධිකරණ කොමසාරිස්වරයකු ම, ඔහුගේ පත්වීමේ අධිකාර පත්‍රයේ දැක්වෙන කාල පරිච්ඡේදය තුළ ධුරය දැරිය යුත්තේ ය. සෑම මහාධිකරණ කොමසාරිස්වරයකු ම, අධිකරණ සේවා කොමිෂන් සභාවේ නිර්දේශ මත, ජනාධිපතිවරයා විසින් ඉවත් කරනු ලැබීමටත් විනය පාලනය කරනු ලැබීමටත් යටත් විය යුත්තේ ය.

(3) (1) වැනි අනුව්‍යවස්ථාව යටතේ පත් කරන ලද සෑම මහාධිකරණ කොමසාරිස්වරයකු ම විසින් ස්වකීය ධුර කාලය තුළ, පාර්ලිමේන්තුව විසින් මහාධිකරණය වෙත පවරනු ලබන හෝ නියම කරනු ලබන අධිකරණ බලය හා බලතල, නීතියට අනුව, ක්‍රියාත්මක කරනු ලැබිය හැකි අතර (ධුර කාලය, සම්බන්ධ අයිතිවාසිකම් හා වරප්‍රසාද හැර) මහාධිකරණ විනිශ්චයකාරවරයකුගේ සියලු අයිතිවාසිකම්, බලතල, වරප්‍රසාද හා භුක්තීන් ඔහුට හිමිවිය යුත්තේ ය. තව ද, මේ කාර්ය සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ වෙනත් ලිඛිත නීතියක "මහාධිකරණ විනිශ්චයකාරවරයකු" සම්බන්ධයෙන් කර ඇති සෑම සඳහනකට ම, පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, "මහාධිකරණ කොමසාරිස්වරයකු" සම්බන්ධයෙන් කරන සඳහනක් ද ඇතුළත් වන ලෙස සැලකිය යුත්තේ ය.]

**මුළු දිවයින ම සඳහා පිස්කල්වරයා.**

[81][111 ආ. පිස්කල්වරයෙක් සිටිය යුත්තේ ය. ඔහු මුළු දිවයින ම සඳහා පිස්කල්වරයා විය යුතු අතර, සියලුම මුල් අවස්ථා අධිකරණවලට අනුයුක්ත කොට ඇති නියෝජ්‍ය පිස්කල්වරයන් විෂයයෙහි අධීක්ෂණය සහ පාලනය ඔහු විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුත්තේ ය.]

**අධිකරණ කටයුතුවලට අයුතු ලෙස මැදිහත් වීම වරදක් බව.**

[82][111 ඇ] (1) අධිකරණ බලතල හෝ කාර්ය නැතහොත් මෙම පරිච්ඡේදය යටතේ වූ කාර්ය නැතහොත් පාර්ලිමේන්තුව විසින් පනවන ලද යම් නීතියක් යටතේ ඒ හා සමාන කාර්ය පැවරී ඇති සෑම විනිශ්චයකාරවරයකු ම, මූලාසනාරූඪ නිලධරයකු ම, රජයේ නිලධරයකු ම හෝ වෙනත් සෑම තැනැත්තකු ම තමන්ට පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී හා කර්තව්‍ය ඉටු කිරීමේ දී තමන්ට විධානයක් කිරීමට හෝ තමන් අධීක්ෂණය කිරීමට හෝ නීතියෙන් හිමිකම් ඇති ජ්‍යෙෂ්ඨ අධිකරණයක, විනිශ්චය අධිකාරයක, ආයතනයක හෝ එසේ ම හිමිකම් ඇති වෙනත් තැනැත්තකුගේ හෝ විධානයකට නැතහොත් බලපෑමකට හැර වෙනත් කිසිම තැනැත්තකුගේ විධානයකට නැතහොත් බලපෑමකට යටත් නොවිය යුත්තේ ය.

(2) කවර වූ හෝ විනිශ්චයකාරවරයකුගේ, මූලාසනාරූඪ නිලධරයකුගේ, රජයේ නිලධරයකුගේ හෝ මේ ව්‍යවස්ථාවේ (1) වැනි අනුව්‍යවස්ථාවේ සඳහන් යම් නිලධරයකුගේ අධිකරණ

81 - දහහත් වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 14 වැනි වගන්තිය මගින් ඇතුළත් කරන ලදී.

82 - දහහත් වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 15 වැනි වගන්තිය මගින් මුල් 116 ව්‍යවස්ථාව 111 ඇ ව්‍යවස්ථාව ලෙස නැවත අංක යොදන ලදී.

බලතල ක්‍රියාත්මක කිරීමේ දී හෝ කර්තව්‍ය ඉටු කිරීමේ දී හෝ ඒ විනිශ්චයකාරවරයා, මූලාසනාරූඪ නිලධරයා, රජයේ නිලධරයා හෝ නිලධරයා කෙරෙහි නීත්‍යනුකූල බලයක් නොමැතිව යම්කිසි බලපෑමක් කරන හෝ බලපෑමක් කිරීමට තැත් කරන සෑම තැනැත්තෙක් ම වරදක් කරන අතර, මහාධිකරණය විසින් ජූරි සභාවක් නොමැතිව පවත්වනු ලබන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට එක් අවුරුද්දක් දක්වා දීර්ඝ විය හැකි කාල සීමාවකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම හා දඩය යන දඬුවම් දෙකට ම හෝ යටත් වන්නේ ය. ඊට අමතරව එසේ වරදකරු කරනු ලැබූ දින සිට ඒ තැනැත්තා, අවුරුදු හතක් නොඉක්මවන කාලයකට, ඡන්ද හිමියකු වීමට ද ජනමත විචාරණයක දී හෝ ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ ඡන්ද විමසීමක දී හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු තෝරා පත් කර ගැනීමේ මැතිවරණයක දී හෝ පළාත් පාලන ආයතනයක සභිකයන් තෝරා පත් කර ගැනීමේ ඡන්ද විමසීමක දී හෝ ඡන්දය දීමට හෝ රජයේ කවර වූ හෝ ධුරයක් දැරීමට නැතහොත් රජයේ නිලධරයකු වශයෙන් සේවයෙහි නියුක්ත කරනු ලැබීමට ද නුසුදුස්සකු කරනු ලැබිය හැක්කේ ය.

## [83] [XV අ වැනි පරිච්ඡේදය

## අධිකරණ සේවා කොමිෂන් සභාව

**අධිකරණ සේවා කොමිෂන් සභාවේ සංයුතිය**

[84][ **111ඇ.** (1) (මේ පරිච්ඡේදයෙහි "කොමිෂන් සභාව"යනුවෙන් සඳහන් කරනු ලබන) අධිකරණ සේවා කොමිෂන් සභාවක් වන්නේ ය. කොමිෂන් සභාව අග්‍රවිනිශ්චයකාරවරයාගෙන් සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන ශ්‍රේෂ්ඨාධිකරණයේ ජ්‍යෙෂ්ඨතම විනිශ්චයකාරවරයන් දෙදෙනාගෙන් සමන්විත විය යුත්තේ ය.

(2) අග්‍රවිනිශ්චයකාරවරයා සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ ජ්‍යෙෂ්ඨතම විනිශ්චයකාරවරයන් දෙදෙනා මුල් අවස්ථා අධිකරණයක විනිශ්චයකාරවරයෙකු ලෙස සේවයේ යෙදී සිටීමේ පළපුරුද්ද නොමැති තැනැත්තන් වන අවස්ථාවක දී කොමිෂන් සභාව, අග්‍රවිනිශ්චයකාරවරයා ගෙන් ද ශ්‍රේෂ්ඨාධිකරණයේ ජ්‍යෙෂ්ඨතම විනිශ්චයකාරවරයාගෙන් ද සහ මුල් අවස්ථා අධිකරණයක විනිශ්චයකාරවරයකු ලෙස පළපුරුද්ද ලද එකී ශ්‍රේෂ්ඨාධිකරණයේ ඊළඟ ජ්‍යෙෂ්ඨතම විනිශ්චයකාරවරයාගෙන් සමන්විත විය යුත්තේ ය.

(3) අග්‍රවිනිශ්චයකාරවරයා කොමිෂන් සභාවේ සභාපතිවරයා විය යුත්තේ ය. ]

**කොමිෂන් සභාවේ රැස්වීම්**

**111ඉ.** (1) කොමිෂන් සභාවේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය කොමිෂන් සභාවේ සාමාජිකයන් දෙදෙනකුගෙන් සමන්විත විය යුත්තේ ය.

(2) කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබූ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයකු ස්වකීය ධුරයෙන් ඉල්ලා අස් වුවහොත් හෝ මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති පරිදි ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයකුව සිටීම නතර වුවහොත් හෝ මිස, ඔහු පත් කරනු ලැබූ දින සිට අවුරුදු තුනක කාලයක් එම ධුරය දැරිය යුතු නමුත් නැවත පත් කරනු ලැබීමට ඔහු සුදුස්සෙක් වන්නේ ය.

(3) කොමිෂන් සභාවේ සියලු තීරණ, රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් විය යුතු අතර, යම් හෙයකින් ඡන්ද සංඛ්‍යාව සම සමව තිබෙන අවස්ථාවක ඒ රැස්වීමේ සභාපතිවරයාට තීරණ ඡන්දයක් තිබිය යුත්තේ ය.

(4) කොමිෂන් සභාවේ සාමාජික ධුරයක් හිස් ව තිබුණ ද කොමිෂන් සභාවට ක්‍රියා කිරීමට බලය ඇත්තේ ය. තව ද, එසේ ධුරය හිස්ව තිබූ පමණින්ම හෝ සාමාජිකයකු පත් කිරීමෙහිලා යම් දෝෂයක් තිබූ

83 - දහහත් වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 16 වැනි වගන්තිය මගින් XVඅ පරිච්ඡේදය (ව්‍යවස්ථා 111 ඇ සිට 111 ඕ දක්වා) ඇතුළත් කරන ලදී,

84 - දහනව වැනි ව්‍යවස්ථා සංශෝධනයේ 28 වැනි වගන්තිය මගින් මුල් 111 ඇ ව්‍යවස්ථාව ඉවත් කොට ඒ වෙනුවට අදේශ කරන ලදී,

පමණින් කොමිෂන් සභාවේ යම් ක්‍රියාවක් නැතහොත් කටයුත්තක් නිර්බල නොවන්නේ ය; නිර්බල වන්නේ යයි නොසැලකිය යුත්තේ ය.

[85][ (5) ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාවේ යම් සාමාජිකයකුට, ඔහුගේ කාර්යයන්ගෙන් නිවාඩු දෙනු ලැබිය හැකි අතර, එසේ නිවාඩු දෙන ලද කාලසීමාව සඳහා කොමිෂන් සභාවේ තාවකාලික සාමාජිකයකු වීමට, කොමිෂන් සභාවේ සාමාජිකත්වය ලැබීම සඳහා සුදුසුකම් ඇති තැනැත්තකු, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය හැක්කේ ය.

(6) ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතය සහිතව කොමිෂන් සභාවේ කවර වූ හෝ සාමාජිකයකු හේතු දක්වා ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැක්කේ ය. ]

**කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ දීමනා**

111ඊ. පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලබන යම් දීමනාවක් කොමිෂන් සභාවේ සාමාජිකයකුට ගෙවනු ලැබිය යුත්තේ ය. ඒ දීමනාව ඒකාබද්ධ අරමුදලට වැයබරක් වන අතර, සාමාජිකයාගේ ධූර කාලය තුළ දී අඩු නොකළ යුත්තේ ය. තව ද, එම දීමනාව ඒ සාමාජිකයාගේ ස්ථිර තනතුරට අයත් වූ හා ඒ තනතුරෙන් ලබන්නා වූ වැටුපට සහ වෙනත් දිමනාවලට අමතරව විය යුත්තේ යඃ

එසේ වුව ද, දීමනා වශයෙන් ගෙවිය යුතු මුදල් ප්‍රමාණය මේ ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ නිශ්චය කරනු ලබන තෙක් මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී කොමිෂන් සභාවේ සාමාජිකයන් විසින් ලබන ලද මුදල් ප්‍රමාණය ඔවුන්ට දීමනා වශයෙන් තවදුරටත් ලැබිය යුත්තේ ය.

**කොමිෂන් සභාවේ ලේකම්වරයා**

111උ. කොමිෂන් සභාවට මුල් අවස්ථා අධිකරණවල ජ්‍යෙෂ්ඨ අධිකරණ නිලධරයන් අතුරෙන් කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය යුතු ලේකම්වරයෙක් සිටිය යුත්තේ ය.

**කොමිෂන් සභාවේ බලතල**

111ඌ. (1) අධිකරණ සේවා කොමිෂන් සභාවට -

(අ) මහාධිකරණ විනිශ්චයකාරවරයන්ගේ ස්ථාන මාරු කිරීමේ බලය;

(ආ) අධිකරණ නිලධරයන් සහ උපලේඛනගත රජයේ නිලධරයන් පත් කිරීමේ, උසස් කිරීමේ, ස්ථාන මාරු කිරීමේ, සේවයෙන් පහ කිරීමේ හා ඔවුන් විෂයෙහි විනය පාලනය ක්‍රියාවේ යෙදීමේ බලය

මෙයින් පැවරෙන්නේ ය.

85 - දහනව වැනි ව්‍යවස්ථා සංශෝධනයේ 29 වැනි වගන්තිය මගින් මුල් 111ඉ (5) හා (6) අනුව්‍යවස්ථා ඉවත් කොට ඒ වෙනුවට ආදේශ කරන ලදී.

(2) කොමිෂන් සභාව විසින් -

(අ) මහාධිකරණයේ විනිශ්චයකාරවරයන් පුහුණු කිරීම සම්බන්ධයෙන් රීති සහ අධිකරණ නිලධරයන් සහ උපලේඛනගත රජයේ නිලධරයන් බඳවා ගැනීම, පුහුණු කිරීම, පත් කිරීම, උසස් කිරීම සහ ස්ථාන මාරු කිරීම සම්බන්ධයෙන් පටිපාටි සාදනු ලැබිය හැක්කේ ය;

(ආ) කොමිෂන් සභාවේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාවේ යෙදීම හා ඉටු කිරීම සඳහා අවශ්‍ය හෝ අවස්ථාවෝචිත කාරණා සඳහා විධිවිධාන සලස්වනු ලැබිය හැක්කේ ය.

(3) යම් මුල් අවස්ථා අධිකරණයක් හෝ මුල් අවස්ථා අධිකරණයක පවත්වාගෙන යනු ලබන වාර්තා, රෙජිස්ටර හෝ වෙනත් ලේඛන පරීක්ෂා කිරීමේ සහ අවශ්‍ය වන යම් පරීක්ෂණයක් පැවැත්වීමේ බලය සහ අධිකාරය, අවස්ථාවෝචිත පරිදි කොමිෂන් සභාවේ සභාපතිවරයාට හෝ කොමිෂන් සභාව විසින් බලය දෙනු ලැබූ, ශ්‍රේෂ්ඨාධිකරණයේ යම් විනිශ්චයකාරවරයකුට හෝ අභියාචනාධිකරණයේ යම් විනිශ්චයකාරවරයකුට හෝ තිබිය යුත්තේ ය.

(4) උපලේඛනගත රජයේ නිලධරයන් සම්බන්ධයෙන් වැටුප් වැඩිවීමක් සහිත මාරුවීමක් නොවන සියලු මාරුවීම් කිරීමේ බලය හෝ නියමයේ නිශ්චිතව සඳහන් අවස්ථාවන්හි දී සහ සීමා කිරීම්වලට යටත්ව, වැඩ බැලීමේ, පත්වීම් කිරීමේ බලය කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයකින් කොමිෂන් සභාවේ ලේකම්වරයාට පවරනු ලැබිය හැක්කේ ය.

අධිකරණ නිලධරයකුට හෝ උපලේඛනගත රජයේ නිලධරයකුට ඉල්ලා අස්විය හැකි බව

**111එ.** යම් අධිකරණ නිලධරයකුට හෝ උපලේඛනගත රජයේ නිලධරයකුට කොමිෂන් සභාවේ සභාපතිවරයා අමතා ස්වකීය අත්සනින් යවනු ලබන ලිපියක් මගින් ධුරයෙන් ඉල්ලා අස්විය හැක්කේ ය.

නඩු කටයුතුවලින් මුක්ත බව

**111ඒ.** කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් හෝ කොමිෂන් සභාවේ සාමාජිකයකු හෝ ලේකම්වරයා හෝ නිලධරයකු විසින් ඒ සභාපතිවරයා, සාමාජිකයා, ලේකම්වරයා හෝ කොමිෂන් සභාවේ නිලධරයා වශයෙන් ස්වකීය කාර්ය හෝ කර්තව්‍ය ඉටු කිරීමෙහි ලා සද්භාවයෙන් කරන ලද යම් නීත්‍යානුකූල ක්‍රියාවක් හේතුකොට ගෙන ඔහුට විරුද්ධව කිසිදු සිවිල් නඩුවක් හෝ නඩු කටයුත්තක් පවරනු නොලැබිය යුත්තේ ය.

කොමිෂන් සභාවේ කටයුතුවලට අයුතු ලෙස මැදිහත් වීම වරදක් බව

**111ඔ.** (1) ස්වකීය නීත්‍යානුකූල කාර්ය ඉටු කිරීමේලා හැර කෙළින්ම හෝ අන්‍යාකාරයකින් තමන් විසින් ම හෝ වෙනත් තැනැත්තකු මාර්ගයෙන් හෝ වෙනත් තැනැත්තකු සමග, කවර හෝ ආකාරයකින් කොමිෂන් සභාව විසින් දෙනු ලබන තීරණයකට හෝ නියමයකට බලපෑමක් කරන හෝ බලපෑමක් කිරීමට තැත් කරන හෝ කොමිෂන් සභාවේ සාමාජිකයකුට ඒ ආකාරයෙන් බලපෑමක් කරන සෑම තැනැත්තෙක් ම වරදක් කරන අතර, වරදකරු කරනු ලැබූ විට

රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු තුනක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඒ තැනැත්තා යටත් වන්නේ යඃ

එසේ වුව ද, යම් අධිකරණ ධුරයක් හෝ උපලේඛනගත රජයේ තනතුරක් ඉල්ලුම් කරන ඉල්ලුම්කරුවකුට හෝ අපේක්ෂකයකුට සහතිකයක් හෝ චරිත සහතිකයක් දීම වරදක් නොවන්නේ ය.

(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද සෑම මහාධිකරණයකට ම මේ ව්‍යවස්ථාවේ (1) වැනි ඡේදයේ සඳහන් කවර හෝ කාරණයක් විභාග කොට තීරණය කිරීමට අධිකරණ බලය ඇත්තේ ය.

111ඕ. (අ) මේ පරිච්ඡේදයෙහි -

අර්ථ නිරූපණය

"පත් කිරීම" යන්නට මේ පරිච්ඡේදයෙහි සඳහන් කවර හෝ ධුරයක වැඩ බැලීම සඳහා වූ පත් කිරීමක් ඇතුළත් වේ ;

"අධිකරණ නිලධරයා" යන්නෙන් යුක්තිය පසිඳලීම සඳහා හෝ යම් කම්කරු හෝ වෙනත් ආරවුලක් විනිශ්චය කිරීම සඳහා හෝ ඇති කොට පිහිටුවන ලද යම් මුල් අවස්ථා අධිකරණයක, විනිශ්චය අධිකාරයක හෝ ආයතනයක, විනිශ්චයකාරවරයා, මුලසුන දරන නිලධරයා හෝ සාමාජිකයකු ලෙස ධුරය දරන යම් තැනැත්තෙක් අදහස් වන නමුත් ඊට ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චකාරවරයකු හෝ අභියාචනාධිකරණ විනිශ්චයකාරවරයකු හෝ මහාධිකරණ විනිශ්චයකාරවරයකු හෝ බේරුම් කිරීමේ කර්තව්‍ය ඉටු කරන තැනැත්තකු හෝ තමාගේ ප්‍රධාන කාර්යය අධිකරණ ස්වභාවයක කාර්යය ඉටු කිරීම නොවන රජයේ නිලධරයකු හෝ ඇතුළත් නොවේ ; සහ

"උපලේඛනගත රජයේ නිලධරයා" යන්නෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා, අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා, මහාධිකරණයේ හෝ යම් මුල් අවස්ථා අධිකරණයක රෙජිස්ට්‍රාර්වරයා, නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්වරයා හෝ සහකාර රෙජිස්ට්‍රාර්වරයා, අභියාචනාධිකරණයේ හෝ මහාධිකරණයේ සහ කවර හෝ මුල් අවස්ථා අධිකරණයක පිස්කල්වරයා හෝ නියෝජ්‍ය පිස්කල්වරයා; හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ, අභියාචනාධිකරණයේ, මහාධිකරණයේ හෝ කවර හෝ මුල් අවස්ථා අධිකරණයක රෙජිස්ට්‍රාර් කාර්යාලයේ සේවයෙහි නියුක්ත කර ඇත්තා වූ සහ පස්වන උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන ගණයකට අයත් හෝ අමාත්‍ය මණ්ඩලයේ අධිකරණ විෂයය භාර අමාත්‍යවරයා විසින් නියමයක් මගින් නිශ්චිතව නියම කරනු ලැබ පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලදුව ගැසට් පත්‍රයේ පළ කරන ලද වෙනත් යම් ගණයකට අයත් යම් රජයේ නිලධරයකු අදහස් වේ.

(ආ) යම් තැනැත්තෙක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අර්ථානුකූලව අධිකරණ නිලධරයකු වන්නේ ද නොවන්නේ ද යන ප්‍රශ්නය නිරාකරණය කිරීම සඳහා භාර ගැනීමට හෝ ඒ ප්‍රශ්නය තීරණය කිරීමට කිසිදු අධිකරණයකට, විනිශ්චයාධිකාරයකට හෝ ආයතනයකට අධිකරණ බලය නොමැති නමුත් ඒ ප්‍රශ්නය කොමිෂන් සභාව විසින් ම අනන්‍යව තීරණය කරනු ලැබිය යුත්තේ ය. ඒ පිළිබඳව කොමිෂන් සභාවේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක වන්නේ ය.

(ඇ) (ආ) අනුඡේදයේ සඳහන් පරිදි වූ යම් තීරණයකට පෙරාතුව ඒ තැනැත්තා විසින් කරන ලද යම් ක්‍රියාවක් හෝ ඒ තැනැත්තා ඉදිරියේ පවරන ලද යම් නඩු කටයුත්තක් ඒ තීරණය කිරීමේ හේතුවෙන් නිර්බල වන්නේ යයි සලකනු නොලැබිය යුත්තේ ය. ]

[86][ 112. ඉවත් කරන ලදී.

113. ඉවත් කරන ලදී.

113අ. ඉවත් කරන ලදී.

114. ඉවත් කරන ලදී.

115. ඉවත් කරන ලදී. ]

[87] [ 116. (111ඇ ව්‍යවස්ථාව ලෙස නැවත අංක යොදන ලදි.) ]

[86] [ 117. ඉවත් කරන ලදී. ]

---

86 - දහහත් වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 7 වැනි වගන්තිය මගින් ඉවත් කරන ලදී.

87 - දහහත් වැනි ව්‍යවවස්ථා සංශෝධනයේ 15 වැනි වගන්තිය මගින් 111ඇ ව්‍යවස්ථාව ලෙස නැවත අංක යොදන ලදී.

## XVI වැනි පරිච්ඡේදය

## ජ්‍යෙෂ්ඨ අධිකරණ

### ශ්‍රේෂ්ඨාධිකරණය

**ශ්‍රේෂ්ඨාධිකරණයේ සාමාන්‍ය අධිකරණ බලය.**

**118.** ශ්‍රී ලංකා ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණය ජනරජයේ උත්තරීතම සහ අවසානාත්මක ලේඛනෝපගත කිරීමේ ජ්‍යෙෂ්ඨ අධිකරණය වන අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව, මෙහි පහත දැක්වෙන ආකාරයේ වූ අධිකරණ බලය ක්‍රියාත්මක කරන්නේ ය. එනම් :-

(අ) පනත් කෙටුම්පත්වල ව්‍යවස්ථානුකූලත්වය සම්බන්ධයෙන් වූ අධිකරණ බලය;

(ආ) මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා වූ අධිකරණ බලය;

(ඇ) අවසාන අභියාචනාධිකරණ බලය;

(ඈ) උපදේශක අධිකරණ බලය;

(ඉ) ඡන්ද පෙත්සම් සම්බන්ධයෙන් වූ අධිකරණ බලය;

(ඊ) පාර්ලිමේන්තුවේ යම් වරප්‍රසාද කඩකිරීමක් සම්බන්ධයෙන් අධිකරණ බලය; සහ

(උ) පාර්ලිමේන්තුව විසින් නීතියෙන් පවරනු ලබන හෝ නියම කරනු ලබන වෙනත් කාරණා සම්බන්ධයෙන් වූ අධිකරණ බලය.

**ශ්‍රේෂ්ඨාධිකරණයේ සංයුතිය.**

**119.** (1) ශ්‍රේෂ්ඨාධිකරණය, අග්‍ර විනිශ්චයකාරවරයාගෙන් ද හය දෙනකුට නොඅඩු සහ දස දෙනකුට නොවැඩි වෙනත් විනිශ්චයකාරවරයන් සංඛ්‍යාවකගෙන් ද සමන්විත වන්නේය. ඒ විනිශ්චයකාරවරයෝ 107 වැනි ව්‍යවස්ථාවේ විධිවිධාන සලසා ඇති පරිදි පත් කරනු ලබන්නාහ.

(2) ශ්‍රේෂ්ඨාධිකරණයේ යම් විනිශ්චයකාර ධූරයක් හිස්ව තිබුණ ද ශ්‍රේෂ්ඨාධිකරණයට ක්‍රියා කිරීමට බලය ඇත්තේ ය. තව ද, එවැනි යම් ධූරයක් හිස්ව තිබූ පමණින් හෝ විනිශ්චයකාරවරයකු පත් කිරීමෙහි ලා යම් දෝෂයක් තිබූ පමණින් හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ යම් ක්‍රියාවක් නැතහොත් නඩු කටයුත්තක් නිර්බල නොවන්නේ ය; නිර්බල වන්නාක් සේ නොසැලකිය යුත්තේ ය.

**ශ්‍රේෂ්ඨාධිකරණයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණ බලය**

**120.** යම් පනත් කෙටුම්පතක් නැතහොත් පනත් කෙටුම්පතක යම් විධිවිධානයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල දැයි යන යම් ප්‍රශ්නයක් පිළිබඳව තීරණයක් ගැනීමේ තනි හා අනන්‍ය අධිකරණ බලය ශ්‍රේෂ්ඨාධිකරණයට ඇත්තේ ය:

එසේ වුව ද -

(අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ යම්කිසි විධිවිධානයක් සංශෝධනය කිරීම සඳහා වූ නැතහොත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පරිච්ඡින්න කොට ඒ වෙනුවට වෙනත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පැනවීම සඳහා වූ පනත් කෙටුම්පතක් ලෙස දීර්ඝ නාමයේ විස්තර කර ඇති පනත් කෙටුම්පතක් සම්බන්ධයෙන් වන විට 83 වැනි ව්‍යවස්ථාවෙහි විධිවිධාන ප්‍රකාර ඒ පනත් කෙටුම්පත ජනතාව විසින් ජනමත විචාරණයක දී අනුමත කිරීම අවශ්‍ය වේ ද යන ප්‍රශ්නය පමණක් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කළ හැක්කේ ය.

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ යම්කිසි විධිවිධානයක් සංශෝධනය කිරීම සඳහා වූ නැතහොත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පරිච්ඡින්න කොට ඒ වෙනුවට වෙනත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පැනවීම සඳහා වූ පනත් කෙටුම්පතක් ලෙස දීර්ඝ නාමයේ විස්තර කර ඇති පනත් කෙටුම්පතක් 83 වැනි ව්‍යවස්ථාවෙන් නියමිත විශේෂ බහුතර ඡන්දයෙන් සම්මත කිරීමට සහ ජනමත විචාරණයක් මගින් ජනතාව වෙත ඉදිරිපත් කිරීමට අදහස් කරන බවට අමාත්‍ය මණ්ඩලය විසින් සහතික කරනු ලැබූ අවස්ථාවක ඒ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට කිසිම අධිකරණ බලයක් නොමැත්තේ ය. ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඒ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් කිසි ම අධිකරණ බලයක් ක්‍රියාත්මක නොකළ යුත්තේ ය.

(ඇ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ යම්කිසි විධිවිධානයක් සංශෝධනය කිරීම සඳහා වූ නැතහොත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පරිච්ඡින්න කොට ඒ වෙනුවට වෙනත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පැනවීම සඳහා වූ පනත් කෙටුම්පතක් ලෙස දීර්ඝ නාමයේ විස්තර කර නොමැති පනත් කෙටුම්පතක් 84 වැනි ව්‍යවස්ථාවෙහි නියමිත විශේෂ බහුතර ඡන්දයෙන් සම්මත කිරීමට අදහස් කරන බවට අමාත්‍ය මණ්ඩලය විසින් සහතික කරනු ලැබූ අවස්ථාවක 83 වැනි ව්‍යවස්ථාවෙහි විධිවිධාන ප්‍රකාර ඒ පනත් කෙටුම්පත ජනතාව විසින් ජනමත විචාරණයක දී අනුමත කිරීම අවශ්‍ය වේ ද නැතහොත් ඒ පනත් කෙටුම්පත 82 වැනි ව්‍යවස්ථාවේ (1) වැනි හා (2) වැනි අනුව්‍යවස්ථා අනුව පිළියෙළ වීම අවශ්‍ය වේ ද යන ප්‍රශ්නය පමණක් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කළ හැක්කේ ය.

(ඈ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ යම්කිසි විධිවිධානයක් සංශෝධනය කිරීම සඳහා වූ නැතහොත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පරිච්ඡින්න කොට ඒ වෙනුවට වෙනත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පැනවීම සඳහා වූ පනත් කෙටුම්පතක විධිවිධානයක් ලෙස දීර්ඝ නාමයේ විස්තර කර නැති පනත් කෙටුම්පතක යම් විධිවිධානයක් 84 වැනි ව්‍යවස්ථාවෙන් නියමිත විශේෂ බහුතර ඡන්දයෙන් සම්මත කිරීමට අදහස් කරන බවට අමාත්‍ය මණ්ඩලය විසින් සහතික කරනු ලැබූ අවස්ථාවක, ඒ පනත් කෙටුම්පතේ වෙනත් යම්කිසි විධිවිධානයක් 84 වැනි ව්‍යවස්ථාවේ

නියමිත බහුතර ඡන්දයෙන් සම්මත කිරීම අවශ්‍ය වේ ද නැතහොත් 83 වැනි ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර, ඒ පනත් කෙටුම්පතේ යම් විධිවිධානයක් ජනමත විචාරණයක් මගින් ජනතාව විසින් අනුමත කිරීම අවශ්‍ය වේ ද නැතහොත් ඒ පනත් කෙටුම්පත 82 වැනි ව්‍යවස්ථාවේ (1) වැනි සහ (2) වැනි අනුව්‍යවස්ථා අනුව පිළියෙළ වීම අවශ්‍ය වේ ද යන ප්‍රශ්නය පමණක් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කළ හැක්කේ ය.

**පනත් කෙටුම්පත් පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණ බලය සාමාන්‍යයෙන් ක්‍රියාත්මක කිරීම.**

**121.** (1) ඉහත කී පරිදි වූ එවැනි යම් ප්‍රශ්නයක් පිළිබඳව සාමාන්‍යයෙන් තීරණය කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණයට ඇති අධිකරණ බලය අග්‍ර විනිශ්චයකාරවරයා අමතා ජනාධිපතිවරයා විසින් යවනු ලබන ලිඛිත යොමු කිරීමක් මගින් නැතහොත් ශ්‍රේෂ්ඨාධිකරණය අමතා කවර වූ හෝ පුරවැසියකු විසින් යවනු ලබන ලිඛිත පෙත්සමක් මගින් ක්‍රියාත්මක කරවා ගත හැක්කේ ය. ඒ යොමු කිරීම හෝ පෙත්සම ඉදිරිපත් කිරීම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කළ තැන් පටන් සතියක් ඇතුළත කළ යුතු වන්නේය. තව ද, ඒ යොමු කිරීමේ නැතහොත් පෙත්සමේ පිටපතක් ඒ අවස්ථාවේ දී ම කථානායකවරයාට භාර දිය යුත්තේ ය. මේ අනුව්‍යවස්ථාවෙහි " පුරවැසියා " යන්නට සාමාජික සංඛ්‍යාවෙන් හතරෙන් තුනකට නොඅඩු සංඛ්‍යාවක් පුරවැසියන් වන්නා වූ සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ මණ්ඩලයක් ඇතුළත් වේ.

(2) ශ්‍රේෂ්ඨාධිකරණයේ අධිකරණ බලය එසේ ක්‍රියාත්මක කරවා ගනු ලැබූ අවස්ථාවක ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය දෙන තෙක් හෝ ඒ යොමු කිරීමේ නැතහොත් පෙත්සමේ දින සිට සති තුනක කාල සීමාවක් ඉකුත් වන තෙක් හෝ යන මෙයින් පළමුවෙන් එළඹෙන දිනය තෙක් ඒ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ දී කිසිම පියවරක් නොගත යුත්තේ ය.

(3) අවස්ථාවෝචිත පරිදි යොමු කිරීමක් කළ තැන් පටන් නැතහොත් පෙත්සමක් ඉදිරිපත් කළ තැන් පටන් සති තුනක් ඇතුළත ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ස්වකීය තීරණය ජනාධිපතිවරයාට සහ කථානායකවරයාට දැනුම් දිය යුත්තේ ය.

[88] [ 122 වන ව්‍යවස්ථාව ඉවත් කරන ලදී. ]

**පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය**

**123.** (1) ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය සමග ඒ තීරණයට එළඹීමට හේතු ද දැක්විය යුතු අතර, පනත් කෙටුම්පත හෝ එහි යම් විධිවිධානයක් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල ද යන වගත් එසේ නම් ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කවර විධිවිධානයකට ද නැතහොත් විධිවිධානවලට ද යන වගත් ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණයෙහි ප්‍රකාශ විය යුත්තේ ය.

88 - දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 30 වැනි වගන්තිය මගින් 122 ව්‍යවස්ථාව ඉවත් කරන ලදී.

(2) පනත් කෙටුම්පත හෝ එහි යම් විධිවිධානයක් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල යයි ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කළ අවස්ථාවක -

(අ) එම පනත් කෙටුම්පත 82 වැනි ව්‍යවස්ථාවේ (1) වැනි සහ (2) වැනි අනුව්‍යවස්ථාවල විධිවිධාන අනුව පිළියෙළ වීම අවශ්‍ය ද යන වග ; හෝ

(ආ) එම පනත් කෙටුම්පත හෝ එහි යම් විධිවිධානයක් හෝ 84 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනුව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ නියමිත විශේෂ බහුතර ඡන්දයෙන් පමණක් සම්මත කළ හැකි ද යන වග ; හෝ

(ඇ) එම පනත් කෙටුම්පත හෝ එහි විධිවිධානයක් හෝ 84 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනුව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ නියමිත විශේෂ බහුතර ඡන්දයෙන් සම්මත කොට 83 වැනි ව්‍යවස්ථාවේ නියමිත ප්‍රකාර ජනතාව විසින් ජනමත විචාරණයක දී අනුමත කළ යුතු ද යන වග,

ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඒ තීරණයෙහි ප්‍රකාශ කළ යුත්තේ ය. තව ද ඒ පනත් කෙටුම්පතෙහි හෝ ඒ විධිවිධානයෙහි හෝ අනනුකූලතාව ඉවත් වන්නේ කවර ස්වභාවයක සංශෝධන මගින් ද යන වග නිශ්චිතව සඳහන් කළ හැක්කේ ය.

[89] [ 123(3) ඉවත් කරන ලදී. ]

(4) යම් පනත් කෙටුම්පතක් හෝ පනත් කෙටුම්පතක විධිවිධාන හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල යයි තීරණය කරනු ලැබ ඇත්තා වූ හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල යයි තීරණය කරන ලද සේ සැලකෙන්නා වූ අවස්ථාවක ඒ පනත් කෙටුම්පත හෝ ඒ විධිවිධාන හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණයේ ප්‍රකාශ කර ඇති ආකාරයට හැර සම්මත නොකළ යුත්තේ යඃ

එසේ වුව ද, ඒ පනත් කෙටුම්පතෙහි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇති අනනුකූලතාව ඉවත් වන සේ සංශෝධනය කරනු ලැබීමෙන් පසුව ඒ පනත් කෙටුම්පත සම්මත කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

**පනත් කෙටුම්පත්වල වලංගුභාවය සහ ව්‍යවස්ථාදායක ක්‍රියාවලිය සම්බන්ධයෙන් ප්‍රශ්න කළ නොහැකි බව**

**124.** යුක්තිය පසිඳලීම සඳහා ඇතිකොට පිහිටුවන ලද කිසිම අධිකරණයකට, විනිශ්චය අධිකාරයකට හෝ වෙනත් කිසිම ආයතනයකට, තැනැත්තකුට හෝ පුද්ගල මණ්ඩලයකට, [90][120 වැනි සහ 121 වැනි ව්‍යවස්ථාවල විධිවිධාන සලසා ඇති පරිදි] හැර, කවර හෝ හේතුවක් නිසා, යම්කිසි පනත් කෙටුම්පතක ව්‍යවස්ථානුකූලභාවය පිළිබඳව හෝ ඒ පනත් කෙටුම්පත ව්‍යවස්ථාදායක ක්‍රියාවලියට අනුකූලවීම පිළිබඳව හෝ විමසීමට හෝ ඒ පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට, බලය හෝ අධිකරණ බලය නොමැත්තේ ය.

---

89 - දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 31 වැනි වගන්තිය මගින් 123(3) අනුව්‍යවස්ථාව ඉවත් කරන ලදී.

90 - දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 32 වැනි වගන්තිය මගින් "120 වැනි සහ 121 වැනි සහ 122 වැනි ව්‍යවස්ථාවල විධිවිධාන සලසා ඇති පරිදි" යන වචන වෙනුවට ආදේශ කරන ලදී.

**125.** (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කිරීම පිළිබඳ යම් ප්‍රශ්නයක් විභාග කොට තීරණය කිරීම සඳහා තනි හා අනන්‍ය අධිකරණ බලය ශ්‍රේෂ්ඨාධිකරණයට ඇත්තේ ය. ඒ අනුව වෙනත් යම් අධිකරණයක හෝ විනිශ්චය අධිකාරයක හෝ යුක්තිය පසිඳලීම සඳහා හෝ අධිකරණ කාර්ය නැතහොත් අර්ධ අධිකරණ කාර්ය ඉටු කිරීම සඳහා හෝ නීතියෙන් බලය පැවරී ඇති වෙනත් යම් ආයතනයක හෝ නඩු කටයුතුවල දී එවැනි යම් ප්‍රශ්නයක් උද්ගත වුවහොත් ඒ ප්‍රශ්නය තීරණය කිරීම සඳහා නොපමාව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත යොමු කළ යුත්තේ ය. ඒ ප්‍රශ්නය සම්බන්ධයෙන් තීරණයක් කරන තෙක් වැඩිදුර නඩු කටයුතු අත්හිටුවන ලෙස ශ්‍රේෂ්ඨාධිකරණය විසින් විධාන කළ හැක්කේ ය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථ නිරූපනය කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණ බලය

(2) යොමු කරනු ලැබූ දින සිට මාස දෙකක් ඇතුළත ශ්‍රේෂ්ඨාධිකරණය විසින් එම ප්‍රශ්නය තීරණය කොට අවස්ථානුකූලව අවශ්‍ය විය හැකි යම් ආනුෂංගික ආඥා ද කළ යුත්තේ ය.

**126.** (1) III වැනි පරිච්ඡේදයෙන් හෝ IV වැනි පරිච්ඡේදයෙන් හෝ ප්‍රකාශ කොට පිළිගන්නා ලද යම් මූලික අයිතිවාසිකමක් නැතහොත් භාෂා අයිතිවාසිකම යම් විධායක හෝ පරිපාලන ක්‍රියාවක් මගින් කඩ කිරීමට අත්‍යාසන්නව පැවතීම හා සම්බන්ධ කවර වූ හෝ ප්‍රශ්නයක් විභාග කොට තීරණය කිරීමේ තනි හා අනන්‍ය අධිකරණ බලය ශ්‍රේෂ්ඨාධිකරණයට ඇත්තේ ය.

මූලික අයිතිවාසිකම් පිළිබඳ අධිකරණ බලය සහ ඒ බලය ක්‍රියාත්මක කිරීම.

(2) තමාට සම්බන්ධ එවැනි යම් මූලික අයිතිවාසිකමක් නැතහොත් භාෂා අයිතිවාසිකම යම් විධායක ක්‍රියාවක් මගින් හෝ පරිපාලන ක්‍රියාවක් මගින් කඩ කොට ඇති බවට හෝ කඩ කිරීමට අත්‍යාසන්නව පවතින බවට යම් තැනැත්තකු විසින් දෝෂාරෝපණයක් කරනු ලබන අවස්ථාවක ඔහු විසින් ම නැතහොත් ඔහු වෙනුවෙන් පෙනී සිටින නීතිඥවරයකුගේ මාර්ගයෙන්, එතැන් පටන් මාසයක් ඇතුළත, එම කඩ කිරීමෙන් සහනයක් හෝ පිහිටක් ලබා දෙන ලෙස ශ්‍රේෂ්ඨාධිකරණයෙන් අයැද සිටින ඉල්ලීමක්, තත්කාලයේ බලපවත්නා අධිකරණ රීතිවලට අනුකූලව ශ්‍රේෂ්ඨාධිකරණය අමතා ඉදිරිපත් කරන ලිඛිත පෙත්සමක් මගින් කළ හැක්කේ ය. එවැනි ඉල්ලීමක් පිළිබඳව ක්‍රියා කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණයෙන් පූර්ව අවසරයක් ලබා ගැනීමෙන් පසුව පමණක් එවැනි ඉල්ලීමක් පිළිබඳව ක්‍රියා කරගෙන යා හැක්කේ ය. එසේ අවසරය ඉල්ලා සිටි විට අවස්ථාවෝචිත පරිදි ඒ අවසරය ප්‍රදානය කිරීම හෝ අවසරය දීම ප්‍රතික්ෂේප කිරීම හෝ විනිශ්චයකාරවරයන් දෙදෙනකුට නොඅඩු සංඛ්‍යාවක් විසින් කළ හැක්කේ ය.

(3) හේබියස් කෝපුස්, සර්ටියොරාරි, තහනම්, ප්‍රොසිඩෙන්ඩෝ, මන්ඩාමුස් හෝ ක්වෝ වොරන්ටෝ ස්වභාවයේ වූ රිට් ආඥා සඳහා කරන ලද ඉල්ලීමක් අභියාචනාධිකරණයෙහි විභාග කිරීමේ දී, ඒ ඉල්ලීමේ පාර්ශ්වකරුවකු විසින්, III වැනි පරිච්ඡේදයේ හෝ IV වැනි පරිච්ඡේදයේ විධිවිධාන කඩකර ඇති බවට හෝ කඩ කිරීමට

අත්‍යාසන්නව ඇති බවට බැලූ බැල්මට පෙනෙන සාක්ෂි ඇති බව ඒ අධිකරණයට පෙනී ගිය අවස්ථාවක ඒ කාරණය තීරණය කිරීම සඳහා ඒ අධිකරණය විසින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත නොපමාව යොමු කළ යුත්තේ ය.

(4) මේ ව්‍යවස්ථාවේ (2) වැනි අනුව්‍යවස්ථාවේ සහ (3) වැනි අනුව්‍යවස්ථාවේ සඳහන් යම් පෙත්සමක් හෝ යොමු කිරීමක් සම්බන්ධයෙන් අවස්ථාගත කරුණු අනුව යුක්ති සහගත යයි හා සාධාරණ යයි ශ්‍රේෂ්ඨාධිකරණය සලකන සහනයක් ප්‍රදානය කිරීමට හෝ විධානයක් දීමට හෝ මූලික අයිතිවාසිකමක් හෝ භාෂා අයිතිවාසිකම කඩ වී නොමැති බව ඒ අධිකරණයේ මතය වේ නම් ඒ කාරණය අභියාචනාධිකරණයට ආපසු යොමු කිරීමට හෝ ශ්‍රේෂ්ඨාධිකරණයට බලය ඇත්තේ ය.

(5) මේ ව්‍යවස්ථාව යටතේ ඉදිරිපත් කරන ලද යම් පෙත්සමක් හෝ කරන ලද යම් යොමු කිරීමක් පිළිබඳව ඒ පෙත්සම ඉදිරිපත් කරනු ලැබූ නැතහොත් යොමු කිරීම කරනු ලැබූ දින සිට මාස දෙකක් ඇතුළත ශ්‍රේෂ්ඨාධිකරණය විසින් විභාග කොට කටයුතු නිම කළ යුත්තේ ය.

අභියාචන අධිකරණ බලය

**127.** (1) අභියාචනාධිකරණය විසින් හෝ යම් මුල් අවස්ථා අධිකරණයක්, විනිශ්චය අධිකාරයක් හෝ වෙනත් ආයතනයක් විසින් හෝ සිද්ධිය පිළිබඳව නැතහොත් නීතිය පිළිබඳව කරනු ලබන සියලු ම වැරදි නිවැරදි කිරීම සඳහා, ශ්‍රේෂ්ඨාධිකරණය, ශ්‍රී ලංකා ජනරජය වෙනුවෙන් සහ ශ්‍රී ලංකා ජනරජය තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට යටත්ව සිවිල් හා අපරාධ අභියාචනා අධිකරණ බලය ඇති අවසාන අධිකරණය වන්නේ ය. තව ද, සෑම අවස්ථාවකම ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු තීන්දු හා ආඥා එවැනි සෑම කාරණයක දී ම අවසානාත්මක හා තීරණාත්මක වන්නේ ය.

(2) අභියාචනාධිකරණයේ යම් ආඥාවකට, නඩු තීන්දුවකට, තීන්දු ප්‍රකාශයකට හෝ දණ්ඩන නියමයකට විරුද්ධව නීතිය අනුව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනයක් කළ හැකි අවස්ථාවක ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ස්වකීය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමෙහි ලා ඒ අභියාචනය සංජානනය කිරීමේ තනි හා අනන්‍ය බලය ශ්‍රේෂ්ඨාධිකරණයට ඇත්තේ ය. එසේ ම, අභියාචනාධිකරණයේ එවැනි යම් ආඥාවක් නඩු තීන්දුවක්, තීන්දු ප්‍රකාශයක් හෝ දණ්ඩන නියමයක් ස්ථිර කිරීම, ප්‍රතිවර්තනය කිරීම හෝ වෙනස් කිරීම ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කළ හැක්කේ ය. තව ද, කවර වූ හෝ මුල් අවස්ථා අධිකරණයකට යුක්ති ධර්මය අනුව අවශ්‍ය විය හැකි පරිදි කවර වූ හෝ විධානයක් නිකුත් කිරීම හෝ අලුතෙන් නඩු විභාගයක් පවත්වන ලෙස ආඥා කිරීම හෝ යම් නඩු කටයුත්තක් තවදුරටත් විභාග කරගෙන යන ලෙස ආඥා කිරීම හෝ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කළ හැක්කේ ය. එසේ ම යුක්තිය ඉටු කිරීම සඳහා අවශ්‍ය වේ නම් අලුත් හෝ අතිරේක සාක්ෂි කැඳවීම හා භාර ගැනීමත් එවැනි

අවස්ථාවක දී ඒ සාක්ෂි අභියාචනාධිකරණය විසින් හෝ යම්කිසි මුල් අවස්ථා අධිකරණයක් විසින් හෝ සටහන් කළ යුතු බව විධාන කිරීමත් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කළ හැක්කේ ය.

අභියාචනය කිරීමේ අයිතිවාසිකම්.

128. (1) නීතිය පිළිබඳ වැදගත් ප්‍රශ්නයක් ඇත්තා වූ යම් සිවිල් කාරණයක් හෝ නඩු කටයුත්තක් සම්බන්ධයෙන් වුව ද අපරාධ කාරණයක් හෝ නඩු කටයුත්තක් සම්බන්ධයෙන් වුව ද අභියාචනාධිකරණයේ යම් අවසාන ආඥාවකට, නඩු තීන්දුවකට, තීන්දු ප්‍රකාශයකට හෝ දණ්ඩන නියමයකට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනයක් කිරීම ඒ කාරණයේ හෝ නඩු කටයුත්තේ යම් අතෘප්ත පාර්ශ්වකරුවකුගේ ඉල්ලීම පිට හෝ අභියාචනාධිකරණය විසින් සිය මෙහෙයවීමෙන් ම හෝ අභියාචනාධිකරණය විසින් අවසර දෙනු ලැබුවහොත්, කළ හැක්කේය.

(2) යම් සිවිල් කාරණයක් හෝ නඩු කටයුත්තක් සම්බන්ධයෙන් වුව ද අපරාධ කාරණයක් හෝ නඩු කටයුත්තක් සම්බන්ධයෙන් වුව ද ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනය කිරීම සඳහා අවසර දීම අභියාචනාධිකරණය විසින් ප්‍රතික්ෂේප කර ඇත්තා වූ අවස්ථාවක හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය අනුව ඒ කාරණය හෝ නඩු කටයුත්ත ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සමාලෝචනය කරනු ලැබීමට යෝග්‍ය බව ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය වන අවස්ථාවක හෝ අභියාචනාධිකරණයේ යම් අවසාන හෝ අතුරු ආඥාවකට, නඩු තීන්දුවකට, තීන්දු ප්‍රකාශයකට හෝ දණ්ඩන නියමයකට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනය කිරීම සඳහා ස්වකීය අභිමතය පරිදි ශ්‍රේෂ්ඨාධිකරණය විසින් විශේෂ අවසරයක් දිය හැක්කේ ය:

එසේ වුව ද, තීරණය කිරීමට ඇති ප්‍රශ්නය ජනතාව සම්බන්ධයෙන් වැදගත් වන හෝ පොදු වැදගත්කමක් ඇති හෝ ප්‍රශ්නයක් බවට ශ්‍රේෂ්ඨාධිකරණය සෑහීමකට පත් වන සෑම කාරණයක දී හෝ නඩු කටයුත්තක දී ම අභියාචනයක් කිරීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අවසර දිය යුත්තේ ය.

(3) අභියාචනාධිකරණය විසින් 139 වැනි, 140 වැනි, 141 වැනි, 142 වැනි හෝ 143 වැනි ව්‍යවස්ථා යටතේ ස්වකීය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමෙහි ලා කරන ලද ආඥාවකට හෝ නඩු තීන්දුවකට විරුද්ධව කරන ලද්දා වූ ද, ජනාධිපතිවරයා හෝ අමාත්‍යවරයකු හෝ නියෝජ්‍ය අමාත්‍යවරයකු හෝ රජයේ නිලධරයකු හෝ ස්වකීය නිල තත්ත්වයෙහි ලා පාර්ශ්වකරුවකු වන්නා වූ ද යම් අභියාචනයක්, එය ඉදිරිපත් කරනු ලැබූ දින සිට මාස දෙකක් ඇතුළත විභාග කොට තීරණය කළ යුත්තේ ය.

(4) පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද වෙනත් යම් නීතියකින් නිශ්චිතව විධිවිධාන සලසා ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත කෙළින් ම අභියාචනයක් එසේ විධිවිධාන සලසා ඇති ආකාරයට කළ හැක්කේ ය.

උපදේශක අධිකරණ බලය

**129.** (1) ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය ලබා ගැනීම අවස්ථාවෝචිත වන ස්වභාවයේ සහ පොදු වැදගත්කමකින් යුත් යම් නීතිය හෝ සිද්ධිය පිළිබඳ ප්‍රශ්නයක් උද්ගත වී ඇති බව නැතහොත් උද්ගත වීමට ඉඩ ඇති බව ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපතිවරයාට කවර අවස්ථාවක දී වුව ද පෙනී ගියහොත් ජනාධිපතිවරයා විසින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඒ ප්‍රශ්නය සලකා බැලීම සඳහා යොමු කළ හැක්කේ ය. එසේ යොමු කරනු ලැබූ විට ඒ යොමු කිරීමේ නිශ්චිතව සඳහන් කාල සීමාව ඇතුළත හෝ ජනාධිපතිවරයා විසින් දීර්ඝ කරන ලද යම් කාලසීමාවක් ඇතුළත හෝ ඒ අධිකරණය යෝග්‍ය යයි සලකන විභාග යක් පැවැත්වීමෙන් අනතුරුව ඒ අධිකරණයේ මතය ජනාධිපතිවරයාට වාර්තා කළ යුත්තේ ය.

(2) 38 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනුව්‍යවස්ථාවේ (අ) ඡේදයේ සඳහන් පරිදි වූ යම් යෝජනා සම්මතයක ඇතුළත් දෝෂාරෝපණ, අවස්ථාවෝචිත පරිදි, සියල්ල ම හෝ ඉන් යමක්, ඒ පිළිබඳ ව පරීක්ෂා කර වාර්තා කිරීම සඳහා කථානායකවරයා විසින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත යොමු කරනු ලැබූ අවස්ථාවක, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් 38 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනුව්‍යවස්ථාවේ (ඇ) ඡේදයට අනුකූලව එම දෝෂාරෝපණය හෝ දෝෂාරෝපණ පිළිබඳව පරීක්ෂා කර ස්වකීය තීරණය ඒ යොමු කිරීමේ දිනයෙහි සිට මාස දෙකක් ඇතුළත කථානායකවරයා වෙත වාර්තා කළ යුත්තේ ය.

(3) ඒ මතය, තීරණය සහ වාර්තාව යටත් පිරිසෙයින් ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන් පස් දෙනකු විසින් සලකා බැලීමෙන් පසුව ප්‍රකාශ කළ යුත්තේ ය. අග්‍රවිනිශ්චයකාරවරයා අන්‍යාකාර විධානයක් කළහොත් මිස අග්‍රවිනිශ්චයකාරවරයා ද ඒ විනිශ්චයකාරවරයන් පස්දෙනාගෙන් කෙනකු විය යුත්තේ ය.

(4) මේ ව්‍යස්ථාවේ (1) වැනි අනුව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ වූ සෑම නඩු කටයුත්තක් ම අධිකරණය විසින් විශේෂ හේතු යටතේ අන්‍යාකාර විධානයක් කළහොත් මිස, අප්‍රසිද්ධියේ පැවැත්විය යුත්තේ ය.

[91] [ඡන්ද පෙත්සම් සහ ජනමත විචාරණ පෙත්සම්] සම්බන්ධ අභියාචන අධිකරණ බලය

**130.** (අ) [92] [ ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම හෝ ජනමත විචාරණයක වලංගුභාවය සම්බන්ධයෙන් වූ ] යම්කිසි නඩු කටයුත්තක් ; සහ

(ආ) මැතිවරණ පෙත්සම් නඩුවක දී අභියාචනාධිකරණය විසින් කරන ලද ආඥාවකට නැතහොත් දෙන ලද නඩු තීන්දුවකට විරුද්ධව ඉදිරිපත් කරන ලද අභියාචනයක්,

නීතියෙන් විධිවිධාන සලසා ඇති පරිදි විභාග කොට තීරණය දීමට හා නීතියෙන් විධිවිධාන සලසා ඇති පරිදි වූ ආඥා කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණයට බලය ඇත්තේ යඃ

---

91 - දහහතර වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 9(3) වගන්තිය මගින් ඒ ව්‍යවස්ථාවේ පැති සටහනෙහි ඇති “ඡන්ද පෙත්සම්” යන වචන වෙනුවට ආදේශ කරන ලදී.

92 - දහහතර වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 9(1) හා (2) වගන්ති මගින් “ ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම සම්බන්ධයෙන් වූ” යන වචන වෙනුවට ආදේශ කරන ලදී.

එසේ වුව ද [92][ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම හෝ ජනමත විචාරණයක වලංගුභාවය සම්බන්ධයෙන් වූ ] නඩු කටයුත්තක් යටත් පිරිසෙයින් ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරයන් පස් දෙනකු විසින් විභාග කොට තීරණය කළ යුත්තේ ය. අග්‍රවිනිශ්චයකාරවරයා අන්‍යාකාර විධානයක් කළහොත් මිස, අග්‍රවිනිශ්චයකාරවරයා ද ඒ විනිශ්චයකාරවරයන් පස් දෙනාගෙන් කෙනකු විය යුත්තේය.

පාර්ලිමේන්තු වරප්‍රසාද කඩ කිරීම සම්බන්ධ අධිකරණ බලය

131. පාර්ලිමේන්තුවේ වරප්‍රසාද කඩ කිරීම සංජානනය කොට ඒ සම්බන්ධයෙන් කවර වූ හෝ තැනැත්තකුට දඬුවම් කිරීමට නීතිය අනුව ශ්‍රේෂ්ඨාධිකරණයට බලය ඇත්තේ ය.

ශ්‍රේෂ්ඨාධිකරණය පැවැත්වීම

132. (1) අග්‍රවිනිශ්චයකාරවරයා අන්‍යාකාර විධාන කළහොත් මිස, ශ්‍රේෂ්ඨාධිකරණයේ වෙන් වෙන් අධිකරණ බලය සාමාන්‍යයෙන් කොළඹ දී ක්‍රියාත්මක කළ යුත්තේ ය.

(2) ශ්‍රේෂ්ඨාධිකරණයේ අධිකරණ බලය, වෙන් වෙන්ව නඩු විභාග කරන ඒ අධිකරණයේ විනිශ්චයකාරවරයන් කිහිපදෙනකු විසින් එකම අවස්ථාවේ දී විවිධ කාරණා සම්බන්ධයෙන් ක්‍රියාත්මක කළ හැක්කේ ය :

එසේ වුව ද, සියලු අවස්ථාවල දී එහි අධිකරණ බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන් තිදෙනකුට නොඅඩු සංඛ්‍යාවක් ශ්‍රේෂ්ඨාධිකරණය වශයෙන් එක් රැස්ව සාමාන්‍යයෙන් ක්‍රියාත්මක කළ යුත්තේ ය.

(3) අග්‍රවිනිශ්චයකාරවරයා විසින් -

(i) සිය මෙහෙයවීමෙන් ම ; හෝ

(ii) යම් කාරණයක් විභාග කරන විනිශ්චයකාරවරයන් දෙදෙනකු හෝ වැඩි සංඛ්‍යාවක් විසින් ඉල්ලා සිටිනු ලැබූ විට ; හෝ

(iii) යම් අභියාචනයක්, නඩු කටයුත්තක් හෝ කාරණයක් හා සම්බන්ධ ප්‍රශ්නය අග්‍රවිනිශ්චයකාරවරයාගේ මතය අනුව ජනතාව සම්බන්ධයෙන් වැදගත් වන හා පොදු වැදගත්කමක් ඇති ප්‍රශ්නයක් වේ නම්, ඒ අභියාචනයේ, නඩු කටයුත්තේ හෝ කාරණයේ පාර්ශ්වකරුවකුගේ ඉල්ලීම පිට ; හෝ

ඒ අභියාචනය, නඩු කටයුත්ත හෝ කාරණය ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන් පස් දෙනකුගෙන් හෝ ඊට වැඩි සංඛ්‍යාවකගෙන් සමන්විත විනිශ්චය පීඨයක් විසින් විභාග කළ යුතු යයි විධාන කළ හැක්කේ ය.

(4) ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු තීන්දුව ඒකමතික තීරණයක් නොවන විට, ඒ තීන්දුව බහුතර සංඛ්‍යාවේ තීරණය විය යුත්තේ ය.

**තත්කාර්ය විනිශ්චයකාරවරයන් පත් කිරීම**

**133.** (1) ශ්‍රේෂ්ඨාධිකරණයේ යම් නඩු විභාගයක් පැවැත්වීම හෝ පවත්වාගෙන යාම සඳහා යම් අවස්ථාවක දී ශ්‍රේෂ්ඨාධිකරණයේ ගණපූරණය සඳහා අවශ්‍ය විනිශ්චයකාරවරයන් සංඛ්‍යාවක් නොමැති වුවහොත්, තත්කාර්ය විනිශ්චයකාරවරයකු ලෙස අවශ්‍ය විය හැකි යම් කාලසීමාවකට ඒ නඩු විභාගය සඳහා අධිකරණයට පැමිණෙන ලෙස ජනාධිපතිවරයාගේ එකඟත්වය කලින් ලබාගෙන අග්‍රවිනිශ්චයකාරවරයා විසින් අභියාචනාධිකරණයේ සභාපතිවරයා -ගෙන් හෝ අභියාචනාධිකරණයේ යම්කිසි විනිශ්චයකාරවරයකුගෙන් හෝ ලියවිල්ලක් මගින් ඉල්ලා සිටිය හැක්කේ ය.

(2) එවැනි ඉල්ලීමක් ලත් විට, තමාගේ පැමිණීම අවශ්‍ය වන වේලාවට සහ කාල සීමාව තුළ තමාගේ ධුරයට අයත් වෙනත් කාර්ය අභිභවා ප්‍රමුඛත්වය දී ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු විභාගය සඳහා පැමිණීම ඒ ඉල්ලීම ලත් විනිශ්චයකාරවරයාගේ කාර්යය වන්නේ ය. තව ද, එසේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු විභාගය සඳහා පැමිණෙන කාලය තුළ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයකුට ඇති සියලු අධිකරණ බලය ද, බලතල ද, වරප්‍රසාද ද, ඔහුට ඇති අතර, ඒ විනිශ්චයකාරවරයකුගේ කාර්ය ඔහු විසින් ඉටු කළ යුත්තේ ය.

**ශ්‍රේෂ්ඨාධිකරණයේ දී කරුණු කියා සිටීමට ඇති අයිතිවාසිකම**

**134.** (1) ශ්‍රේෂ්ඨාධිකරණය විසින් 120 වැනි, [93][121 වැනි, 125 වැනි], 126 වැනි ව්‍යවස්ථා හා 129 වැනි ව්‍යවස්ථාවේ (1) වැනි අනුව්‍යවස්ථාව සහ 131 වැනි ව්‍යවස්ථාව යටතේ ස්වකීය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ සියලු නඩු කටයුතුවල දී නීතිපතිවරයාට දැනුම් දීමක් කළ යුතු අතර, ඒ සෑම නඩු කටයුත්තක දී ම කරුණු කියා සිටීමට නීතිපතිවරයාට අයිතිය ඇත්තේ ය.

(2) ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ස්වකීය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී ඒ යම් නඩු කටයුත්තක කවර වූ හෝ පාර්ශ්වකරුවකුට ඒ නඩු කටයුත්තේ දී පෞද්ගලිකව ම හෝ නීතිඥවරයකු මගින් නියෝජනය කරනු ලැබීමෙන් හෝ කරුණු කියා සිටීමට අයිතිවාසිකම් ඇත්තේ ය.

(3) ශ්‍රේෂ්ඨාධිකරණය විසින් මේ පරිච්ඡේදය යටතේ ස්වකීය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී වෙනත් යම් තැනැත්තකුට හෝ වෙනත් යම් තැනැත්තකුගේ නීත්‍යානුකූල නියෝජිතයාට හෝ අවශ්‍ය යයි අධිකරණයට පෙනී යා හැකි පරිදි කරුණු කියා සිටීමට ස්වකීය අභිමතය පරිදි ඉඩ සැලසිය හැක්කේ ය.

**ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් කාර්යාලය සහ රෙජිස්ට්‍රාර් ධුරය**

**135.** ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් කාර්යාලය, ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා යනුවෙන් පදවි නම් කරනු ලබන නිලධරයකු භාරයේ විය යුත්තේ ය. ඒ රෙජිස්ට්‍රාර්වරයා අග්‍ර විනිශ්චයකාරවරයාගේ අධීක්ෂණයට, විධානයට සහ පාලනයට යටත් වන්නේ ය.

---

93 - දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 33 වැනි වගන්තිය මගින් "121 වැනි, 122 වැනි, 125 වැනි" යන වචන වෙනුවට ආදේශ කරන ලදී.

ශ්‍රේෂ්ඨාධිකරණයේ රීති

**136.** (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහ යම් නීතියක විධිවිධානවලට යටත්ව, අග්‍ර විනිශ්චයකාරවරයා සහ ඔහු විසින් නම් කරනු ලැබූ ශ්‍රේෂ්ඨාධිකරණයේ යම් විනිශ්චයකාරවරයන් තිදෙනකු විසින් -

(අ) ශ්‍රේෂ්ඨාධිකරණය වෙත සහ අභියාචනාධිකරණය වෙත අභියාචන භාර ගනු ලැබිය යුත්තේ යම් නියමයන් යටතේ ද ඒ නියමයන් ඇතුළුව අභියාචන විභාග කිරීම සහ අභියාචනවලට අදාළ වෙනත් කාරණා සම්බන්ධ කාර්ය පටිපාටිය පිළිබඳ රීති සහ ඒ රීතිවලට අනුකූල නොවීමේ හේතුවෙන් ඒ අභියාචන නිෂ්ප්‍රභ කිරීම සඳහා විධිවිධාන පිළිබඳ රීති ;

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හෝ යම් නීතියකින් හෝ ශ්‍රේෂ්ඨාධිකරණය සහ අභියාචනාධිකරණය වෙත පවරනු ලැබූ වෙන් වෙන් අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී ඒ අධිකරණවල කාර්ය පටිපාටිය සම්බන්ධ ව ඒ කාරණා ඉදිරිපත් කිරීම සහ ඒ කාරණා සම්බන්ධයෙන් නඩු පවරනු ලැබිය හැකි හෝ ඒ කාරණා අධිකරණය ඉදිරියට ගෙනෙනු ලැබිය හැකි කාලය සහ ඒ රීතිවලට අනුකූල නොවීමේ හේතුවෙන් ඒ කාරණා නිෂ්ප්‍රභ කිරීම ඇතුළු කටයුතු පිළිබඳ රීති ;

(ඇ) ඇප දීම පිළිබඳ රීති ;

(ඈ) නඩු කටයුතු නැවැත්වීම පිළිබඳ රීති ;

(ඉ) නිස්සාර යයි හෝ පීඩාකාරි යයි හෝ ප්‍රමාද කිරීමේ අදහසින් ගෙන එන ලදැයි යම් අධිකරණයකට පෙනී යන, ඒ අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද යම් අභියාචනයක් නැතහොත් පෙත්සමක් මගින් හෝ අන්‍යාකාරයකින් ඉදිරිපත් කරන ලද වෙනත් යම් කාරණයක් ලඝු ලෙස තීරණය කිරීම සඳහා විධිවිධාන සලසන රීති ;

(ඊ) ශ්‍රේෂ්ඨාධිකරණයෙහි සහ අභියාචනාධිකරණයෙහි අභියාචන හෝ වෙනත් නඩු කටයුතුවල කාර්ය සඳහා වාර්තා පිටපත් පිළියෙළ කිරීම ;

(උ) නීතිඥවරයන් පිළිගැනීම, බඳවා ගැනීම, වෘත්තියෙහි යෙදී සිටීම, අත්හිටුවීම හා ඉවත් කිරීම [94][] හා ඒ නීතිඥවරයන් සඳහා විනය රීති හා ආචාර රීති ;

(ඌ) විනිශ්චයකාරවරයන්ගේ, නීතිඥවරයන්ගේ, අධිකරණයේ නිලධරයන්ගේ සහ ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාව යටතේ හෝ පාර්ලිමේන්තුව විසින් හෝ පවත්නා නීතිය යටතේ හෝ ශ්‍රී ලංකාවේ පිහිටුවනු ලැබූ අධිකරණවලට පැමිණෙන තැනැත්තන්ගේ ඇඳුම ;

94 - අට වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 3 වැනි වගන්තිය මගින් "ජ්‍යෙෂ්ඨ නීතිඥවරයන් පත් කිරීම" යන වචන ඉවත් කරන ලදී.

(එ) ජූරි සභා සඳහා මූල මණ්ඩල පිළියෙළ කළ යුතු ආකාරයත්, ජූරි සභිකයන් කැඳවීමේ, තේරීමේ සහ ඔවුන් පිළිබඳව විරෝධය පෑමේ පිළිවෙළ ;

(ඒ) ඒ අධිකරණවල පිස්කල් නිලධරයන්ගේ සහ වෙනත් විධායක නිලධරයන්ගේ කාර්ය පටිපාටිය සහ ඒ අධිකරණවල, අධිකරණ විධාන සහ ඒවා ක්‍රියාවේ යොදවන ආකාරය ;

(ඔ) ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණවල අනුගම්‍ය බලය ;

(ඕ) ප්‍රදානය කළ හැකි ගාස්තුවල ස්වභාවය සහ ප්‍රමාණය ද, ඒ ගාස්තු තක්සේරු කරන ආකාරය ද, ලේඛනවලට මුද්දර ගැසීම ද ඇතුළුව, ශ්‍රේෂ්ඨාධිකරණයෙහි, අභියාචනාධිකරණයෙහි, මහාධිකරණයෙහි සහ මුල් අවස්ථා අධිකරණවල පරිචය සහ කාර්ය පටිපාටිය හා සම්බන්ධ යම් නීතියකින් හෝ නීතියක් යටතේ විධිවිධාන සලසා නැති සියලු කාරණා,

ඇතුළු අධිකරණයේ පරිචය සහ කාර්ය පටිපාටිය විධිමත් කිරීම සඳහා කලින් කල රීති සෑදිය හැක්කේ ය.

(2) මේ ව්‍යවස්ථාව යටතේ සාදන ලද සෑම රීතියක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කළ දිනයෙහි හෝ ඒ රීතියෙහි නිශ්චිත ව සඳහන් යම් පසු දිනයක සිට හෝ එය ක්‍රියාත්මක වන්නේ ය.

(3) මේ ව්‍යවස්ථාව යටතේ සාදනු ලබන සියලුම අධිකරණ රීති ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මනින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුත්තේ ය. එසේ අනුමත කරනු නොලැබූ යම් රීතියක්, එහි අනනුමතයේ දින සිට, එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට හෝ හානියක් නොමැතිව අවලංගු කරනු ලැබූ ලෙස සැලකිය යුත්තේ ය.

(4) අග්‍ර විනිශ්චයකාරවරයා සහ ඔහු විසින් නම් කරනු ලබන ශ්‍රේෂ්ඨාධිකරණයේ කවර වූ හෝ විනිශ්චයකාරවරයන් තිදෙනකු විසින් එවැනි යම් අධිකරණ රීති සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම කළ හැක්කේ ය. රීතිවල එවැනි යම් සංශෝධනයක්, වෙනස් කිරීමක් හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීමක් මෙයට ඉහතින් ඇති අනුව්‍යවස්ථාවේ අධිකරණ රීති සෑදීම සම්බන්ධයෙන් දක්වා ඇති පරිදි ම සිදු විය යුත්තේ ය.

## අභියාචනාධිකරණය

**137.** අභියාචනාධිකරණය, අභියාචනාධිකරණයේ සභාපතිවරයා -ගෙන් ද 107 වැනි ව්‍යවස්ථාවේ විධිවිධාන සලස්වා ඇති පරිදි පත් කරනු ලැබිය යුතු වෙනත් විනිශ්චයකාරවරයන් හය දෙනකුට නොඅඩු හා එකොළොස් දෙනකුට නොවැඩි සංඛ්‍යාවකින් ද සමන්විත වන්නේ ය. **අභියාචනාධිකරණය**

138. (1) [95] [මහාධිකරණයේ අභියාචන අධිකරණ බලය හෝ මුල් අවස්ථා අධිකරණ බලය හෝ ක්‍රියාත්මක කිරීමෙහි දී ඒ අධිකරණය විසින් හෝ යම්කිසි මුල් අවස්ථා අධිකරණයක්, විනිශ්චය අධිකාරයක් හෝ වෙනත් ආයතනයක් විසින් හෝ] සිද්ධි පිළිබඳව හෝ නීතිය පිළිබඳව හෝ කරන ලද සියලු ම වැරදි නිවැරදි කිරීම සඳහා වූ අභියාචන අධිකරණ බලය ද [96][ඒ මහාධිකරණය විසින් හෝ ඒ මුල් අවස්ථා අධිකරණය, විනිශ්චය අධිකාරය හෝ වෙනත් ආයතනය විසින් හෝ] සංජානනය කරන ලද සියලු නඩු නිමිති, සිවිල් නඩු, නඩු, අපරාධ නඩු, කාරණා සහ දේවල් ඒ පිළිබඳ අභියාචනය හා පරිශෝධනය හා යථා තත්ත්වයට පැමිණවීම මගින් සංජානනය කිරීමේ තනි හා අනන්‍ය බලය ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට හෝ වෙනත් යම් නීතියක විධිවිධානවලට යටත්ව අභියාචනාධිකරණයට ඇත්තේ ය. අභියාචනාධිකරණය විසින් ඒ බලතල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව ක්‍රියාත්මක කළ යුත්තේ ය : **අභියාචනාධිකරණයේ අධිකරණ බලය**

එසේ වුව ද, යම් වරදක හෝ දෝෂයක හෝ අවිධිමත්භාවයක හේතුවෙන් නඩුවෙහි පාර්ශ්වකරුවන්ගේ වැදගත් අයිතිවාසිකම්වලට හානියක් සිදු වී නැද්ද නැතහොත් යුක්තිය ඉටු නොවීමක් සිදු වී නැද්ද එවැනි වරදක්, දෝෂයක් හෝ අවිධිමත්භාවයක් නිසා, යම් මුල් අධිකරණයක නඩු තීන්දුවක්, තීන්දු ප්‍රකාශයක් හෝ ආඥාවක් ප්‍රතිවර්තනය කිරීම නැතහොත් වෙනස් කිරීම නො කළ යුත්තේ ය.

(2) පාර්ලිමේන්තුව විසින් කලින් කල නීතියෙන් පවරනු ලැබිය හැකි හෝ නියම කරනු ලැබිය හැකි පරිදි වූ සියලු බලතල සහ අභියාචන අධිකරණ බලය වශයෙන් හෝ මුල් අධිකරණ බලය වශයෙන් හෝ වන අධිකරණ බලය අභියාචනාධිකරණයට ඇත්තේ ය. අභියාචනාධිකරණය විසින් ඒ සියලු බලතල සහ අධිකරණ බලය ක්‍රියාත්මක කළ යුත්තේ ය.

**139.** (1) අභියාචනාධිකරණය විසින් ස්වකීය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී කවර හෝ ආඥාවක්, නඩු තීන්දුවක්, තීන්දු ප්‍රකාශයක් හෝ දණ්ඩන නියමයක් නීතිය අනුව ස්ථිර කිරීම, ප්‍රතිවර්තනය කිරීම, නිවැරදි කිරීම හෝ සුළු වශයෙන් වෙනස් කිරීම හෝ ඒ මුල් අවස්ථා අධිකරණයට, විනිශ්චය අධිකාරයට හෝ වෙනත් **අභියාචනයේ දී ඇති බලතල**

---

95 - දහතුන් වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 3(අ) වගන්තිය මගින් "යම්කිසි මුල් අවස්ථා අධිකරණයක්, විනිශ්චය අධිකාරයක් හෝ වෙනත් ආයතනයක් විසින්" යන වචන වෙනුවට ආදේශ කරන ලදී.

96 - දහතුන් වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 3(ආ) වගන්තිය මගින් "ඒ මුල් අවස්ථා අධිකරණය, විනිශ්චය අධිකාරය හෝ වෙනත් ආයතනය විසින්" යන වචන වෙනුවට ආදේශ කරන ලදී.

ආයතනයකට විධාන නිකුත් කිරීම හෝ සුදුසු යයි අභියාචනාධිකරණය සලකන නියමයන් මත අලුතෙන් නඩු විභාගයක් නැතහොත් වැඩිදුර නඩු විභාගයක් පවත්වන ලෙස ආඥා කිරීම හෝ කළ හැක්කේ ය.

(2) යම් මුල් නඩුකරයක දී, සිවිල් නඩුවක දී, අපරාධ නඩුවක දී හෝ නඩුවක දී ප්‍රස්තුත කාරණාවලට අදාළව මුල් අවස්ථා අධිකරණය විසින් ගෙන ඇති සාක්ෂිවලට අමතරව හෝ පරිපූරකව යුක්ති ධර්මය අනුව අවශ්‍ය විය හැකි අලුත් සාක්ෂි භාරගැනීම සහ පිළිගැනීම අභියාචනාධිකරණය විසින් වැඩිදුරටත් කළ හැක්කේ ය.

**හේබියස් කෝපුස් රිට් ආඥා හැර වෙනත් රිට් ආඥා නිකුත් කිරීමේ බලය**

**140.** කවර වූ හෝ මුල් අවස්ථා අධිකරණයක හෝ විනිශ්චය අධිකාරයක හෝ වෙනත් ආයතනයක වාර්තා සෝදිසි කිරීමට සහ පරීක්ෂා කිරීමට ද නීතිය අනුව සර්ටියොරාරි, තහනම්, ප්‍රොසිඩෙන්ඩෝ, මන්ඩාමුස් සහ ක්වෝ වොරන්ටෝ යන ස්වභාවයේ වූ රිට් ආඥා යම් මුල් අවස්ථා අධිකරණයක විනිශ්චයකාරවරයාට හෝ විනිශ්චය අධිකාරයකට හෝ වෙනත් ආයතනයකට හෝ වෙනත් තැනැත්තකුට හෝ විරුද්ධව ප්‍රදානය කිරීමට සහ නිකුත් කිරීමට ද සම්පූර්ණ බලය හා අධිකාරය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව අභියාචනාධිකරණයට ඇත්තේ ය.

[97] [එසේ වුව ද, පාර්ලිමේන්තුව විසින් පනවනු ලබන නීතියකින්, ඒ නීතියෙහි දැක්වෙන යම් ගණයකට අයත් කාරණා සම්බන්ධයෙන් මේ ව්‍යවස්ථාවේ ඉහතින් ම වූ විධිවිධානවලින් අභියාචනාධිකරණය වෙත පැවරී ඇති අධිකරණ බලය අභියාචනාධිකරණය විසින් නොව, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ක්‍රියාත්මක කළ යුතු යැයි විධිවිධාන සැලැස්විය හැකි ය.]

**හේබියස් කෝපුස් රිට් ආඥා නිකුත් කිරීමේ බලය**

**141.** අභියාචනාධිකරණය විසින් -

(අ) නීතිය අනුව ක්‍රියා කිරීම සඳහා යම් පුද්ගලයකු ඒ අධිකරණය ඉදිරියට ගෙන එන ලෙස; හෝ

(ආ) රජයේ හෝ පෞද්ගලික හෝ අත්අඩංගුවේ නීති විරෝධීව හෝ අනිසි ලෙස රඳවා තබාගෙන ඇති යම් පුද්ගලයකු ඒ අධිකරණය ඉදිරියට ගෙන එන ලෙස,

හේබියස් කෝපුස් රිට් ආඥා ස්වභාවයේ වූ ආඥා ප්‍රදානය කළ හැක්කේ ය; නිකුත් කළ හැක්කේ ය. තව ද, එසේ අධිකරණය ඉදිරියට ගෙන එන ලද කවර හෝ තැනැත්තකු නිදහස් කරන ලෙස හෝ රිමාන්ඩ් භාරයේ තබන ලෙස නැතහොත් ඔහු සම්බන්ධයෙන් නීතිය අනුව අන්‍යාකාරයකින් ක්‍රියා කරන ලෙස නියම කළ හැක්කේ යː

එසේ වුව ද, අභියාචනාධිකරණය විසින්, එවැනි පුද්ගලයකු වඩාත් ම පහසුවෙන් ඉදිරිපත් කළ හැකි මුල් අවස්ථා අධිකරණය ඉදිරියට ගෙන එන ලෙස නියම කිරීම ද සිදු වී ඇතැයි කියන බන්ධනාගාරගත කිරීමේ හෝ රඳවා තබා ගැනීමේ ක්‍රියා පිළිබඳව

97 - පළමු වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 2 වැනි වගන්තිය මගින් ඇතුළත් කරන ලදී.

පරීක්ෂා කොට වාර්තා කරන ලෙස සහ ඉදිරිපත් කරන ලද පුද්ගලයාගේ අතුරු භාරය සඳහා සුදුසු යයි ඒ අධිකරණයට පෙනී යන විධිවිධාන යොදන ලෙස ඒ මුල් අවස්ථා අධිකරණයේ විනිශ්චයකාරවරයාට විධාන කිරීම ද නීත්‍යනුකූල වන්නේ ය. තව ද, ඒ වාර්තාව ලැබුණු විට, එසේ බන්ධනාගාරගත කර ඇතැයි හෝ රඳවා තබාගෙන ඇතැයි කියනු ලබන්නේ යම් තැනැත්තෙක් ද ඒ තැනැත්තා සම්බන්ධයෙන් නිදහස් කිරීමේ ආඥාවක් කිරීම හෝ ඒ තැනැත්තා රිමාන්ඩ් භාරයේ තැබීම හෝ නීතිය අනුව ඔහු සම්බන්ධයෙන් අන්‍යාකාරයකින් කටයුතු කිරීම අභියාචනාධිකරණය විසින් කළ යුත්තේ ය. අභියාචනාධිකරණය විසින් එසේ ප්‍රකාශ කරන ලද හෝ කරන ලද ආඥාව පිළිපැදීම ද, වහාම ක්‍රියාත්මක කිරීම ද මුල් අවස්ථා අධිකරණය විසින් කළ යුත්තේ යඃ

එසේ ම, තවදුරටත් බාල වයස්කාර ළමයින්ගේ භාරය සහ පාලනය සම්බන්ධ අධිකරණ බලය යම් අධිකරණයක් විසින් ක්‍රියාත්මක කරනු ලැබීම සඳහා නීතියෙන් විධිවිධාන සලසනු ලැබුහොත් එවිට එවැනි යම්කිසි බාලවයස්කාර ළමයකුගේ භාරය පිළිබඳ ආරවුලක් සම්බන්ධයෙන් වඩාත් සුදුසු පරිදි ඒ අධිකරණයට කටයුතු කළ හැකි බවට අභියාචනාධිකරණය සෑහීමට පත් වන්නේ නම්, ඒ බාල වයස්කාර ළමයාගේ භාරය සම්බන්ධයෙන් ඒ අධිකරණය වෙත ඉල්ලීමක් කරන ලෙස පාර්ශ්වකරුවන්ට අභියාචනාධිකරණය විසින් විධාන කළ හැක්කේ ය.

**සිරකරුවන් ගෙන්වා ගැනීමේ සහ ඉවත කිරීමේ බලය.**

142. අභියාචනාධිකරණය විසින් -

(i) යම් බන්ධනාගාරයක රඳවා තබනු ලැබ සිටින සිරකරුවකු යුද්ධාධිකරණයක් ඉදිරිපිටට හෝ ජනරජයේ ජනාධිපතිවරයාගෙන් ලැබුණු යම් අධිකාරයක බලය යටතේ ක්‍රියා කරන යම් කොමසාරිස්වරයකු ඉදිරිපිටට නඩු විභාගය සඳහා හෝ පිළිවෙළින් එකී යුද්ධාධිකරණය නැතහොත් කොමසාරිස්වරයා ඉදිරියෙහි විභාග වෙමින් පවත්නා යම් කාරණා පිළිබඳව විමසනු ලැබීම සඳහා හෝ ඉදිරිපත් කරන ලෙස; හෝ

(ii) බන්ධනාගාරයේ රඳවා තබනු ලැබ සිටින සිරකරුවකු නඩු විභාගයේ කාර්ය සඳහා එක් සිරභාරයකින් වෙනත් සිරභාරයකට ගෙන එන ලෙස

විධාන කළ හැක්කේ ය.

**ඉන්ජන්ෂන් තහනම නිකුත් කිරීමේ බලය.**

**143.** ඉන්ජන්ෂන් තහනමක් ලබා ගැනීම සඳහා ඉල්ලුම් කරන පාර්ශ්වකරුවකු විසින්, යම් මුල් අවස්ථා අධිකරණයක නඩුවක් පැවරීමෙන් ප්‍රතිකර්මයක් යෙදිය නොහැකි අනර්ථයක් වැළැක්වීමට පෙර උද්ගත විය හැකි එවැනි අනර්ථයක් සිදුවීම වැළැක්වීම සඳහා ඉන්ජන්ෂන් තහනම් ප්‍රදානය කිරීමට හා නිකුත් කිරීමට අභියාචනාධිකරණයට බලය ඇත්තේ යඃ

එසේ වුව ද, අභියාචනාධිකරණය වෙත අභියාචනය කිරීමෙන් හෝ අභියාචනාධිකරණය වෙත කරනු ලැබූ අභියාචනයක් පවත්වාගෙන යාමෙන් යම් අධිකරණයක යම් නඩුවක පාර්ශ්වකරුවකු වැළැක්වීම සඳහා හෝ නඩුව, විත්තිය හෝ අභියාචනය පිළිබඳව යම් කරුණක් ඉදිරිපත් කිරීමෙන් යම් අධිකරණයක යම් නඩුවක පාර්ශ්වකරුවකු වැළැක්වීම සඳහා හෝ යම් අධිකරණයක සිවිල් හෝ අපරාධ නඩුවක් පැවරීමෙන් හෝ යම් අධිකරණයක් ඉදිරියෙහි සිවිල් හෝ අපරාධ නඩුවක් පවත්වාගෙන යාමෙන් යම් තැනැත්තකු වැළැක්වීම සඳහා හෝ අභියාචනාධිකරණය විසින් ඉන්ජන්ෂන් තහනමක් ප්‍රදානය කිරීම නිත්‍යානුකූල නොවන්නේ ය. එහෙත් එකම නඩු නිමිත්තක් සඳහා හෝ සම්බන්ධයෙන් හෝ විවිධ අධිකරණ දෙකක වෙන් වෙන්ව නඩු දෙකක් ඔහු විසින් පවරා ඇති අවස්ථාවක, එකී නඩු දෙකෙන් අභියාචනාධිකරණයට සුදුසු යැයි පෙනෙන පරිදි මැදිහත් වීමෙන් එක් නඩුවක් හෝ අනෙක් නඩුව හෝ ඔහු විසින් පවත්වාගෙන යනු ලැබීම වැළැක්වීමට අභියාචනාධිකරණයට බලය ඇත්තේ ය.

**පාර්ලිමේන්තු ඡන්ද පෙත්සම්**

**144.** පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයට තෝරා පත් කර ගැනීම පිළිබඳ ඡන්ද පෙත්සම් සම්බන්ධයෙන් තත් කාලයේ බලපවත්නා යම් නීතියකට අනුකූලව, ඒ ධුරයකට තෝරා පත් කර ගැනීම පිළිබඳ ඡන්ද පෙත්සම් විභාග කිරීමට අභියාචනාධිකරණයට බලය ඇත්තේ ය. ඒ බලය, ඒ අධිකරණය විසින් ක්‍රියාත්මක කළ යුත්තේ ය.

**වාර්තා සෝදිසි කිරීම**

**145.** සිය මෙහෙයවීමෙන් ම හෝ ඉදිරිපත් කරනු ලැබූ ඉල්ලීමක් අනුව හෝ ඕනෑම මුල් අවස්ථා අධිකරණයක වාර්තා ගෙන්වා ගැනීම, සෝදිසි කිරීම හෝ පරීක්ෂා කිරීම ද ස්වකීය පරිශෝධන බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා යුක්ති ධර්මය අනුව අවශ්‍ය විය හැකි ආඥාවක් ඒ පිළිබඳව කිරීම ද අභියාචනාධිකරණය විසින් කළ හැක්කේ ය.

**අභියාචනාධිකරණය පැවැත්වීම**

**146.** (1) අභියාචනාධිකරණය සාමාන්‍යයෙන් කොළඹ දී ස්වකීය අධිකරණ බලය ක්‍රියාත්මක කළ යුත්තේ ය.

එසේ වුව ද, අභියාචනාධිකරණය යම් අධිකරණ කලාපයක හෝ දිස්ත්‍රික්කයක පැවැත්වීම සහ එහි දී ඒ අධිකරණයේ අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම අවස්ථාවෝචිත යයි අග්‍ර විනිශ්චයකාරවරයා සලකන විට එය ස්වකීය විධානයේ නිශ්චය කොට දැක්වෙන යම් අධිකරණ කලාපයක හෝ දිස්ත්‍රික්කයක පවත්වන ලෙස හා එහි අධිකරණ බලය එසේ ක්‍රියාත්මක කරන ලෙස අග්‍ර විනිශ්චයකාවරයා විසින් කලින් කල විධාන කළ හැක්කේ ය.

[98][ (2) අභියාචනාධිකරණයේ අධිකරණ බලය, වෙන් වෙන්ව නඩු විභාග කරන ඒ අධිකරණයේ විනිශ්චයකාරවරයන් විසින්, එකම අවස්ථාවේ දී විවිධ කාරණා සම්බන්ධයෙන් ක්‍රියාත්මක කළ හැක්කේ යː

98 - එකොළොස් වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 6 වැනි වගන්තිය මගින් මුල් (2) වැනි අනුව්‍යවස්ථාව ඉවත් කොට, ඒ වෙනුවට ආදේශ කරන ලදී.

එසේ වුව ද -

(i) (අ) මහාධිකරණය විසින් විශේෂ අධිකරණ විභාගයක දී ප්‍රකාශයට පත් කරන ලද නඩු තීන්දු සහ ආඥා සම්බන්ධයෙන් අභියාචනාධිකරණයේ අධිකරණ බලය, ඒ අධිකරණයේ විනිශ්චයකාරවරයන් යටත් පිරිසෙයින් තිදෙනකු විසින් ක්‍රියාත්මක කළ යුත්තේ ය;

(ආ) මහාධිකරණයේ වෙනත් නඩු තීන්දු හා ආඥා සම්බන්ධයෙන් අභියාචනාධිකරණයේ අධිකරණ බලය, ඒ අධිකරණයේ විනිශ්චයකාරවරයන් යටත් පිරිසෙයින් දෙදෙනකු විසින් ක්‍රියාත්මක කළ යුත්තේ ය ;

(ii) 144 වැනි ව්‍යවස්ථාව යටතේ වූ ස්වකීය බලතල සම්බන්ධව අභියාචනාධිකරණයේ අධිකරණ බලය, අභියාචනාධිකරණයේ සභාපතිවරයා විසින් හෝ සභාපතිවරයා විසින් නම් කරන ලද ඒ අධිකරණයේ යම්කිසි විනිශ්චයකාරවරයන් එක්කෙනකු හෝ වැඩි ගණනක් විසින් හෝ ක්‍රියාත්මක කළ යුත්තේ ය. අභියාචනාධිකරණයේ සභාපතිවරයා එකී විනිශ්චයකාරවරයන්ගෙන් කෙනකු විය හැක්කේ ය;

(iii) අභියාචනාධිකාරණයේ සභාපතිවරයා විසින් පොදු හෝ විශේෂ නියමයන් මගින් අන්‍යාකාරව විධාන කළහොත් මිස, වෙනත් කාරණා සම්බන්ධයෙන් අභියාචනාධිකරණයේ අධිකරණ බලය, ඒ අධිකරණයේ තනි විනිශ්චයකාරවරයකු විසින් ක්‍රියාත්මක කළ යුත්තේ ය.]

(3) විනිශ්චය පීඨයක් සමන්විත කෙරෙන විනිශ්චයකාරවරයන් දෙදෙනකු අතර මතභේදයක් ඇති වූ අවස්ථාවක, විනිශ්චයකාරවරයන් තිදෙනකු රැස්ව ඒ කාරණය සමාලෝචනය කරන තෙක් අධිකරණයේ තීරණය දීම අත්හිටවනු ලැබිය යුත්තේ ය.

(4) අභියාචනාධිකරණයේ නඩු තීන්දුව, ඒකමතික තීරණයක් නොවන විට, ඒ තීන්දුව බහුතර සංඛ්‍යාවෙහි තීරණය විය යුත්තේ ය.

අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර් කාර්යාලය සහ රෙජිස්ට්‍රාර් ධුරය.

**147.** අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර් කාර්යාලය, අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා යනුවෙන් පදවි නම් කරනු ලබන නිලධරයකු භාරයේ විය යුත්තේ ය. ඒ රෙජිස්ට්‍රාර්වරයා අභියාචනාධිකරණයේ සභාපතිවරයාගේ අධීක්ෂණයට, විධානයට සහ පාලනයට යටත් වන්නේ ය.

## XVII වැනි පරිච්ඡේදය

### මුල්‍යය

රාජ්‍ය මුල්‍යය පිළිබඳ පාලනය පාර්ලිමේන්තුව සතු බව.

**148.** රාජ්‍ය මුල්‍ය පිළිබඳ සම්පූර්ණ පාලනය පාර්ලිමේන්තුව සතු වන්නේ ය. පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබූ නීතියක හෝ පවත්නා යම් නීතියක හෝ අධිකාරය අනුව හෝ ඒ යටතේ හෝ මිස කිසිම පළාත් පාලන ආයතනයක් විසින් හෝ වෙනත් පොදු අධිකාරයක් විසින් හෝ කිසිම බද්දක්, වරිපනමක් හෝ වෙනත් යම්කිසි බදු විශේෂයක් නියම කිරීමට බලය නොමැත්තේ ය.

ඒකාබද්ධ අරමුදල

**149.** (1) නියමිත කාර්යය සඳහා නීතියෙන් වෙන් කරනු නොලැබුවා වූ ද, ජනරජය සතු වූ ද, සියලු ම අරමුදල් එක්ව ඒකාබද්ධ අරමුදල නමැති අරමුදලක් වන්නේ ය. සියලු ම අය බදු, තීරු බදු, වරිපනම් හා ගාස්තු යන මාර්ගවලින් ලැබෙන ආදායම් ද, නියමිත කාර්ය සඳහා වෙන් කරනු නොලැබූ ජනරජය සතු සෙසු සියලු ම ආදායම් සහ ලැබීම් ද ඒකාබද්ධ අරමුදලට ගෙවිය යුත්තේ ය.

(2) රාජ්‍ය ණය අරමුදලේ පොලිය ද, නිදන් අරමුදලට ගෙවන මුදල් ද, ඒකාබද්ධ අරමුදල එකතු කිරීම, පාලනය කිරීම සහ භාර ගැනීම යනාදී කටයුතු හා සම්බන්ධ පිරිවැය, ගාස්තු සහ වියදම් ද, පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලබන්නා වූ වෙනත් වියදමක් වේ නම් ඒ වියදම් ද, ඒකාබද්ධ අරමුදලට වැය බැරක් කළ යුත්තේ ය.

ඒකාබද්ධ අරමුදලෙන් මුදල් ඉවත් කර ගැනීම.

**150.** (1) මේ ව්‍යවස්ථාවේ (3) වැනි අනුව්‍යවස්ථාවේ සහ (4) වැනි අනුව්‍යවස්ථාවේ ප්‍රකාශිතව ම විධිවිධාන සලසා ඇති පරිදි හැර මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අත්සන යටතේ වූ බලපත්‍රයක අධිකාරය අනුව මිස ඒකාබද්ධ අරමුදලෙන් කිසිම මුදලක් ඉවත් කර ගත නොහැක්කේ ය.

(2) යම්කිසි මුදලක් ඒකාබද්ධ අරමුදලෙන් ඉවත් කර ගැනීමේ දී ඒ මුදල ඒකාබද්ධ අරමුදලෙන් ඉවත් කර ගන්නා වූ මුදල් වර්ෂය තුළ දී ම රජයේ නියමිත සේවාවක් සඳහා පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබූ යෝජනා සම්මතයකින් හෝ වෙනත් යම්කිසි නීතියකින් හෝ ඒ මුදල වෙන් කොට දී ඇත්නම් මිස, එසේ නැත්නම් වෙනත් ආකාරයකින් ඒ මුදල නීත්‍යානුකූල පරිදි ඒකාබද්ධ අරමුදලට වැය බරක් කරනු ලැබුවහොත් මිස ඉහත කී බලපත්‍රය නිකුත් නොකළ යුත්තේ ය.

(3) යම්කිසි වර්ෂයක විසර්ජන පනත් කෙටුම්පත නීතිය බවට පත්වීමට පෙර ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබූ අවස්ථාවක පාර්ලිමේන්තුව විසින් රජයේ සේවාවන් සඳහා මුදල් වෙන් කර නොමැත්තේ නම් අභිනව පාර්ලිමේන්තුව රැස්වීමට නියමිත දින සිට මාස තුනක් ඉකුත් වන තෙක් රජයේ සේවාවන් සඳහා යම්කිසි මුදලක් අවශ්‍ය වෙතැයි ජනාධිපතිවරයා සලකයි නම් ඒ මුදල ඒකාබද්ධ අරමුදලෙන් නිකුත් කිරීමටත්, වැය කිරීමටත් නියම කිරීමට ජනාධිපතිවරයාට බලය ඇත්තේ ය.

(4) ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව විසුරුවා හැර මහ මැතිවරණයක් සඳහා දිනයක් හෝ දින හෝ නියම කරන අවස්ථාවක, ඒ මැතිවරණය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් ප්‍රතිපාදන සලසා නොමැති නම් ඒ සඳහා අරමුදල් ඒකාබද්ධ අරමුදලෙන් නිකුත් කිරීමටත්, මැතිවරණ කොමසාරිස්වරයා විමසා අවශ්‍ය යැයි සලකන අරමුදල් වැය කිරීමටත් ජනාධිපතිවරයාට බලය ඇත්තේ ය.

**151.** (1) 149 වැනි ව්‍යවස්ථාවේ කවර විධිවිධානයක් ඇතත්, අනපේක්ෂිත හදිසි වියදම් සඳහා මුදල් සැපයීම පිණිස අවිනිශ්චිත අවස්ථා අරමුදලක් නීතියෙන් පිහිටුවීමට පාර්ලිමේන්තුවට බලය ඇත්තේ ය.

**අවිනිශ්චිත අවස්ථා අරමුදල**

(2) (අ) අනපේක්ෂිත හදිසි වියදමක් දැරීම අවශ්‍ය බව ද;

(ආ) එවැනි යම්කිසි වියදමක් සඳහා ප්‍රතිපාදන සලසා නොමැති බව ද;

මුදල් විෂයය භාර අමාත්‍යවරයාට අවබෝධ වුවහොත් ජනාධිපතිවරයාගේ කැමැත්ත ඇතිව අවිනිශ්චිත අවස්ථා අරමුදලෙන් අත්තිකාරම් මුදලක් ගෙවීමෙන් ඒ වියදමට අවශ්‍ය මුදල සැපයීමට නියෝග කිරීමේ බලය මුදල් විෂයය භාර අමාත්‍යවරයාට ඇත්තේ ය.

(3) අත්තිකාරම් වශයෙන් එවැනි මුදලක් දුන් සෑම අවස්ථාවකම ඒ මුදල ආපසු ගෙවීම සඳහා පරිපූරක ඇස්තමේන්තුවක් අප්‍රමාදව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුත්තේ ය.

**152.** ජනරජයේ ඒකාබද්ධ අරමුදලෙන් නැතහොත් ජනරජයේ වෙනත් අරමුදලකින් යම්කිසි මුදලක් ගෙවීමට හෝ එකී අරමුදල්වලට වැය බරක් පැවරීමට හෝ යම්කිසි බද්දක් පැනවීමට හෝ තත් කාලයේ බලපවත්නා යම්කිසි බද්දක් ඉවත් කිරීමට, වැඩි කිරීමට නැතහොත් අඩු කිරීමට හෝ බලය පවරන්නා වූ කිසිම පනත් කෙටුම්පතක් හෝ යෝජනාවක්, අමාත්‍යවරයකු විසින් විනා අන් කිසිවකු විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ නොහැක්කේ ය. තව ද, අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කොට ඇතොත් මිස හෝ අමාත්‍ය මණ්ඩලය විසින් නියම කරනු ලබන යම්කිසි ආකාරයකට අනුමත කොට ඇතොත් මිස, එවැනි පනත් කෙටුම්පතක් හෝ යෝජනාවක් හෝ අමාත්‍යවරයකු විසින් වුව ද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ නොහැක්කේ ය.

**රජයේ ආදායමට බලපාන පනත් කෙටුම්පත් පිළිබඳ විශේෂ විධිවිධාන**

**153.** [99][(1) විගණකාධිපතිවරයෙක් වන්නේය. විගණකාධිපතිවරයා සුදුසුකම් ලත් විගණකවරයකු විය යුතු අතර, ජනාධිපතිවරයා විසින් ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව පත් කරනු ලබන්නේ ය. විගණකාධිපතිවරයා යථා පැවැත්මෙන් සිටින තාක් ස්වකීය ධුරය දරන්නේ ය. ]

**විගණකාධිපතිවරයා**

99 - දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 34(1) වැනි වගන්තිය මගින් මුල් 153(1) අනුව්‍යවස්ථාව ඉවත් කොට, ඒ වෙනුවට ආදේශ කරන ලදී.

(2) විගණකාධිපතිවරයාගේ වැටුප පාර්ලිමේන්තුව විසින් නිශ්චය කළ යුත්තේ ය. එසේ නිශ්චය කරන ලද වැටුප ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන්නේ ය. ඔහුගේ ධුර කාලය තුළ එකී වැටුප අඩු නොකළ යුත්තේ ය.

(3) විගණකාධිපතිවරයා -

(අ) මිය ගියහොත් එවිට ; හෝ

(ආ) ජනාධිපතිවරයා වෙත යවන ලිපියක් මගින් ඉල්ලා අස් වුවහොත් එවිට ; හෝ

(ඇ) වයස අවුරුදු හැට සම්පූර්ණ කළ විට ; හෝ

(ඈ) රෝගාතුර වීම නිසා හෝ ශාරීරික නැතහොත් මානසික දුර්වලතාවක් නිසා හෝ ජනාධිපතිවරයා විසින් ඉවත් කරනු ලැබුවහොත් එවිට ; හෝ

(ඉ) පාර්ලිමේන්තුව විසින් සම්මත කොට ඉදිරිපත් කරන යෝජනාවක් අනුව ජනාධිපතිවරයා විසින් ඉවත් කරනු ලැබුවහොත් එවිට, විගණකාධිපති ධුරය හිස් වන්නේ ය.

[100] [ (4) විගණකාධිපතිවරයාට සිය ධුරයෙහි කාර්ය ඉටු කිරීමට නොහැකි වූ විට විගණකාධිපතිවරයා වෙනුවෙන් වැඩ බැලීම සඳහා තැනැත්තකු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව පත් කිරීමට ජනාධිපතිවරයාට බලය ඇත්තේ ය. ]

**විගණන සේවා කොමිෂන් සභාවේ සංයුතිය.**

[101] [ **153අ.** (1) (මේ පරිච්ඡේදයේ "කොමිෂන් සභාව"යනුවෙන් හඳුන්වනු ලබන) විගණන සේවා කොමිෂන් සභාවක් පැවතිය යුතු අතර එකී කොමිෂන් සභාව එකී සභාවේ සභාපතිවරයා විය යුතු විගණකාධිපතිවරයාගෙන් සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු පහත දැක්වෙන සාමාජිකයන්ගෙන්ද සමන්විත විය යුත්තේ ය :-

(අ) නියෝජ්‍ය විගණකාධිපති හෝ නියෝජ්‍ය විගණකාධිපති වරයාගේ ශ්‍රේණියට ඉහළින් වූ ධුරයක් උසුලන ලද විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විශ්‍රාම ලත් නිලධරයන් දෙදෙනෙකු ;

(ආ) ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ, අභියාචනාධිකරණයේ හෝ මහාධිකරණයේ විශ්‍රාමලත් විනිශ්චයකාරවරයකු; සහ

(ඇ) ශ්‍රී ලංකා පරිපාලන සේවාවේ විශ්‍රාම ලත් 1 වන පන්තියේ නිලධරයකු.

100 - දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 34(2) වැනි වගන්තිය මගින් පැවැති 153(4) අනුව්‍යවස්ථාව ඉවත් කොට, ඒ වෙනුවට ආදේශ කරන ලදී.

101 - දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 35 වැනි වගන්තිය මගින් නව 153අ, 153ආ, 153ඇ, 153ඈ, 153ඉ, 153ඊ, 153උ, 153ඌ යන අනුව්‍යවස්ථා ඇතුළත් කරන ලදී.

(2) (අ) කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස පත් කරන ලද තැනැත්තකු -

(i) ජනාධිපතිවරයා අමතා යවන ලිපියක් මගින් කලින් ඉල්ලා අස්වුවහොත් ;

(ii) මේ පනත විධිවිධාන සලසා ඇති පරිදි ධුරයෙන් ඉවත් කළහොත් ;

(iii) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පළාත් සභා සභිකයකු හෝ පළාත් පාලන ආයතන සභිකයකු හෝ වුවහොත්,

මිස, අවුරුදු තුනක කාලයක් සඳහා ධුර දැරිය යුත්තේ ය.

(ආ) කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස පත්කරනු ලැබූ තැනැත්තකු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත වැඩිදුර ධුර කාලයක් සඳහා පත් කරනු ලැබීමට සුදුස්සකු වන්නේ ය.

(3) ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතය ඇතිව (1) වන අනු ව්‍යවස්ථාව යටතේ කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස පත්කරනු ලැබූ යම් තැනැත්තකු හේතු දක්වා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැක්කේ ය.

(4) කොමිෂන් සභාවේ සභාපතිවරයාට සහ සාමාජිකයන්ට පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලබන දීමනාවක් ගෙවනු ලැබිය හැක්කේ ය. එම දීමනාව ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර සභාපතිවරයාගේ හෝ සාමාජිකයන්ගේ ධුර කාලය තුළ දී එය අඩු කරනු නොලැබිය යුත්තේ ය.

(5) කොමිෂන් සභාවේ සභාපතිවරයා සහ සාමාජිකයන් IX පරිච්ඡේදය වන දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එකී කාර්ය සඳහා රජයේ නිලධරයන් ලෙස සලකනු ලැබිය යුත්තා හ.

(6) කොමිෂන් සභාවට, කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන ලේකම්වරයකු සිටිය යුත්තේ ය.

**153ආ.** (1) කොමිෂන් සභාවේ යම් රැස්වීමක ගණපූරණය එකී සභාවේ සාමාජිකයන් තුන්දෙනෙකුගෙන් සමන්විත වන්නේ ය. **කොමිෂන් සභාවේ රැස්වීම්**

(2) පාර්ලිමේන්තුව විසින්, (1) වන අනුව්‍යවස්ථාවට යටත්ව කොමිෂන් සභාවේ රැස්වීම් සඳහා ද, ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවාවක් ස්ථාපිත කිරීම සඳහා ද ඒ සඳහා සම්බන්ධිත වූ සහ ආනුශංගික වූ වෙනත් කාරණා ද සඳහා විධිවිධාන සැලැස්විය යුත්තේ ය.

**153ඇ.** (1) ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයට අයත් සාමාජිකයන්ගේ පත්කිරීම්, උසස් කිරීම්, මාරුකිරීම්, විනය පාලනය කිරීම් සහ සේවයෙන් පහකිරීමේ බලය කොමිෂන් සභාවට පැවරෙන්නේ ය. **කොමිෂන් සභාවේ බලතල හා කර්තව්‍ය.**

(2) කොමිෂන් සභාව විසින් පහත සඳහන් බලතල, කාර්ය සහ කර්තව්‍ය ද ක්‍රියාත්මක කිරීම, ඉටුකිරීම සහ කිරීම, කළ යුත්තේ ය :-

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයට අයත් සාමාජිකයන්ගේ සේවයට බඳවාගැනීමේ පටිපාටි, ඔවුන්ගේ පත්කිරීම්, මාරුකිරීම්, විනය පාලනය සහ සේවයෙන් පහකිරීම්වලට අදාළ රීති ඒවාට අදාළව අමාත්‍ය මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන ප්‍රතිපත්තිවලට යටත්ව සකස් කිරීම;

(ආ) නීතිය මගින් ස්ථාපිත ජාතික විගණන සේවයේ වාර්ෂික ඇස්තමේන්තුව සකස් කිරීම; සහ

(ඇ) නීතිය මගින් සලකනු ලබන පරිදි වූ වෙනත් බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටුකිරීම හා කිරීම.

(3) (2) වන අනුව්‍යවස්ථාව යටතේ සාදනු ලබන රීති, කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලැබීමට සැලැස්විය යුත්තේ ය.

(4) එවැනි සෑම රීතියක්ම එසේ පළ කරනු ලැබූ දින සිට හෝ එම රීති මගින් නිශ්චිතව දක්වා ඇති යම් පසු දිනයක සිට ක්‍රියාත්මක විය යුත්තේ ය.

(5) එවැනි සෑම රීතියක්ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ දින සිට මාස තුනක කාලයක් ඇතුළත පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා ඉදිරිපත් කළ යුත්තේ ය. එසේ අනුමත කරනු නොලැබූ යම් රීතියක් එම අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සළකනු ලැබිය යුතු අතර එමගින් පෙර කරන ලද කිසිවකට අගතියක් නොවිය යුත්තේ ය.

**කොමිෂන් සභාවේ හෝ ශ්‍රී ලංකා විගණන සේවයේ තීරණයකට බලපෑම් කිරීම හෝ බලපෑම් කිරීමට තැත් කිරීම වරදක් බව**

**153ඈ.** (1) තමාගේ රාජකාරි ක්‍රියාවලියේ දී නොවන අවස්ථාවක දී තමන් විසින් හෝ වෙනත් තැනැත්තකු හෝ මාර්ග යෙන්, කවර වූ හෝ ආකාරයෙන් කොමිෂන් සභාවේ තීරණයකට හෝ එකී සභාවේ යම් සාමාජිකයකුට හෝ ශ්‍රී ලංකා විගණන සේවයේ යම් නිලධරයකුට හෝ බලපෑම්කරන හෝ බලපෑම් කිරීමට තැත් කරන යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන අතර වරදකරු කිරීමේදී රුපියල් එක් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු තුනකට නොවැඩි කාලයක් සඳහා වූ බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.

(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද සෑම මහාධිකරණයකටම (1) වන අනු ව්‍යවස්ථාවේ සඳහන් යම් කාරණයක් විභාග කොට තීරණය කිරීමට අධිකරණ බලය තිබිය යුත්තේ ය.

**නීති කෘත්‍යවලින් මුක්තිය**

**153ඉ.** 126 වන ව්‍යවස්ථාව යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය පිරිනමා ඇති අධිකරණ බලයටසහ 153උ ව්‍යවස්ථාව යටතේ පරිපාලනය අභියාචන විනිශ්චය අධිකාරියට ප්‍රදානය කොට ඇති බලතලවලට යටත්ව,

මේ පරිච්ඡේදය යටතේ හෝ යම් ලිඛිත නීතියක් යටතේ කොමිෂන් සභාව වෙත පවරා දී ඇති යම් කර්තව්‍යයක් ඉටුකිරීමේ දී එකී සභාව විසින් දෙන ලද යම් නියමක් හෝ කරන ලද යම් තීරණයක් ගැන විභාග කිරීමට, ප්‍රකාශ කිරීමට, හෝ කවර වූ හෝ ආකාරයකින් ප්‍රශ්න කිරීමට කිසිදු අධිකරණයකට හෝ විනිශ්චයාධිකරණයකට බලය හෝ අධිකරණ බලය නොතිබිය යුත්තේ ය.

**පිරිවැය සහ වියදම්.**

153ඊ. කොමිෂන් සභාවේ පිරිවැය සහ වියදම් ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුත්තේ ය.

**පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරියට ඉදිරිපත් කරනු ලබන අභියාචන**

153උ. කොමිෂන් සභාව විසින් තමන් සම්බන්ධයෙන් වූ යම් පත් කිරීමකට, උසස් කිරීමකට හෝ ස්ථාන මාරුවකට අදාළව කරන ලද යම් නියමයකින් හෝ විනය පිළිබඳ කාරණයක් මත හෝ සේවයෙන් පහකිරීමක් මත කරන ලද යම් නියමයකින් අතෘප්තියට පත් ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ යම් නිලධරයකු විසින් එයට විරුද්ධව 59 වන ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරියට අභියාචනයක් ඉදිරිපත් කිරීම කළ හැක්කේ ය. කොමිෂන් සභාව විසින් කරන ලද යම් නියමයක් හෝ දෙන ලද යම් තීරණයක් වෙනස් කිරීමට, සුළු වශයෙන් වෙනස් කිරීමට, ප්‍රත්‍යදිෂ්ඨ කිරීමට හෝ ස්ථිර කිරීමට එකී විනිශ්චය අධිකාරියට බලය ඇත්තේ ය.

**කොමිෂන් සභාව පාර්ලිමේන්තුවට වගකිව යුතු බව**

153ඌ. කොමිෂන් සභාව එකී කර්තව්‍ය ඉටුකිරීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තු ස්ථාවර නියෝගවල විධිවිධානවලට අනුකූලව පාර්ලිමේන්තුවට වගකිය යුත්තේ ය. පිළිතුරු දීමට බැඳී සිටිය යුත්තේ ය. එසේම සෑම ලිත් වර්ෂයකදී ම එහි ක්‍රියාකාරකම් පිළිබඳව පාර්ලිමේන්තුවට වාර්තාවක් ඉදිරිපත් කළ යුත්තේ ය. ]

**විගණකාධිපතිවරයාගේ කාර්ය හා කාර්තව්‍ය**

154. [102][ (1) විගණකාධිපතිවරයා විසින් ආණ්ඩුවේ සියලු දෙපාර්තමේන්තු, ජනාධිපතිවරයාගේ ලේකම්වරයාගේ කාර්යාලය, අග්‍රාමාත්‍යවරයාගේ ලේකම්වරයාගේ කාර්යාලය, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන්ගේ කාර්යාල, අධිකරණ සේවා කොමිෂන් සභාව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව, 41ආ ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් කොමිෂන් සභා, පරිපාලනය පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා, පළාත් පාලන ආයතන, රාජ්‍ය සංස්ථා, යම් ලිඛිත නීතියක් යටතේ රජය වෙත පවරනු ලැබ ඇති වෙළඳ ව්‍යාපාර සහ වෙනත් ව්‍යාපාර සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදංචි වී ඇති හෝ ලියාපදිංචි වී ඇති බවට සලකනු ලබන සහ ස්වකීය කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් රජය හෝ රාජ්‍ය සමාගමක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ විසින් දරනු ලබන සමාගම් ද ඒවායේ ගිණුම් ඇතුළුව විගණනය කරනු ලැබිය යුත්තේ ය. ]

102 - දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 36(1) වැනි වගන්තිය මගින් මුල් 154(1) අනුව්‍යවස්ථාව ඉවත් කොට, ඒ වෙනුවට ආදේශ කරන ලදී.

(2) මේ ව්‍යවස්ථාවේ (1) වැනි අනුව්‍යවස්ථාවේ කවර විධිවිධානයක් තිබුණ ද එවැනි යම් [103][ (1) වන අනුව්‍යවස්ථාවේ සඳහන් රාජ්‍ය රාජ්‍ය සංස්ථාවක, වෙළෙඳ ව්‍යාපාරයක, වෙනත් ව්‍යාපාරයක හෝ සමාගමක] ගිණුම් විගණනය කිරීම සඳහා, ඒ [103][(1) වන අනුව්‍යවස්ථාවේ සඳහන් රාජ්‍ය සංස්ථාව, වෙළෙඳ ව්‍යාපාරය, වෙනත් ව්‍යාපාරය හෝ සමාගම] භාර අමාත්‍යවරයා විසින්, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව හා විගණකාධිපතිවරයා විමසා සුදුසුකම් ලත් විගණකවරයකු හෝ විගණකවරයන් පත් කළ හැක්කේ ය. එවැනි පත් කිරීමක් අමාත්‍යවරයා විසින් කරනු ලැබූ විට ඒ විගණකවරයාගේ හෝ විගණකවරයන්ගේ සේවය එම [103][(1) වන අනුව්‍යවස්ථාවේ සඳහන් රාජ්‍ය සංස්ථාව, වෙළෙඳ ව්‍යාපාරය, වෙනත් ව්‍යාපාරය හෝ සමාගම] සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීම සඳහා ප්‍රයෝජනයට ගැනීමට තමා අදහස් කරන බව, විගණකාධිපතිවරයා විසින් ඒ විගණකවරයාට හෝ විගණකවරයන්ට ලියවිල්ලකින් දැන්විය හැකි අතර, එසේ දන්වනු ලැබූ විට ඒ විගණකවරයා හෝ විගණකවරයන් විගණකාධිපතිවරයාගේ මෙහෙයවීම හා පාලනය යටතේ ක්‍රියා කළ යුත්තේ ය.

(3) පාර්ලිමේන්තුව විසින් නීතියෙන් නියම කරනු ලබන්නා වූ කාර්ය සහ කර්තව්‍ය ද විගණකාධිපතිවරයා විසින් ඉටු කළ යුත්තේ ය.

(4) (අ) විගණකාධිපතිවරයා විසින්, තම කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීම සඳහා, තම මෙහෙයවීම හා පාලනය යටතේ කටයුතු කළ යුතු, සුදුසුකම් ලත් විගණකවරයකුගේ හෝ විගණකවරයන්ගේ හෝ සේවය ලබා ගත හැක්කේ ය.

(ආ) විගණනයට අදාළ යම්කිසි තාක්ෂණික, වෘත්තීය හෝ විද්‍යාත්මක ගැටලුවක් පරීක්ෂා කිරීමේ දී -

(i) ගිණුම් විගණනය කරනු ලබන්නේ යම් දෙපාර්තමේන්තුවක, පුද්ගල මණ්ඩලයක හෝ අධිකාරයක ද, ඒ දෙපාර්තමේන්තුවේ, පුද්ගල මණ්ඩලයේ හෝ අධිකාරයේ සේවා නියුක්තයකු නොවන තැනැත්තකුගේ; හෝ

(ii) එකී දෙපාර්තමේන්තුවේ, පුද්ගල මණ්ඩලයේ හෝ අධිකාරයේ කටයුතු කළමනාකරණයෙහි ලා කවර හෝ සම්බන්ධතාවක් ඇති ආයතනයක් නොවන යම්කිසි තාක්ෂණික හෝ වෘත්තීය හෝ විද්‍යාත්මක ආයතනයක,

සහය ලබා ගැනීම අවශ්‍ය බව විගණකාධිපතිවරයාගේ මතය වන්නේ නම්, ඔහු විසින් එපරිද්දෙන් ඒ සේවය ලබා ගත හැක්කේ ය. තව ද, ඒ තැනැත්තා හෝ ආයතනය විගණකාධිපතිවරයාගේ මෙහෙයවීම හා පාලනය යටතේ ක්‍රියා කළ යුත්තේ ය.

---

103 - දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 36(2) වැනි වගන්තිය මගින් පැවැති 154(2) අනුව්‍යවස්ථාවේ " රාජ්‍ය සංස්ථාව, වෙළෙඳ ව්‍යාපාරය හෝ වෙනත් ව්‍යාපාරය" යන වචන යෙදෙන කවර තැනක හෝ ඒ වචන වෙනුවට " රාජ්‍ය සංස්ථාව, වෙළෙඳ ව්‍යාපාරය හෝ වෙනත් ව්‍යාපාරය හෝ සමාගම" යන වචන ආදේශ කරන ලදී.

(5) (අ) විගණකාධිපතිවරයාට හෝ ඔහුගේ අධිකාරය ලත් කවර හෝ තැනැත්තකුට, තම කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී -

(i) සියලු පොත්පත්, වාර්තා, වාර වාර්තා සහ වෙනත් ලියකියවිලි ලබා ගැනීමේ ද ;

(ii) ගබඩාවලට සහ වෙනත් දේපළවලට පිවිසීමේ ද ;

(iii) එකී කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි තොරතුරු ලබා ගැනීමේ ද, කරුණු පැහැදිලි කරවා ගැනීමේ ද,

හිමිකම ඇත්තේය.

(ආ) [104][ යම් රාජ්‍ය සංස්ථාවක හෝ වෙළෙඳ ව්‍යාපාරයක හෝ වෙනත් ව්‍යාපාරයක හෝ (1) වන අනුව්‍යවස්ථාවේ සඳහන් සමාගමක] හෝ ගිණුම් විගණනය කිරීම සඳහා පත් කරන ලද සෑම සුදුසුකම් ලත් විගණකවරයකුටම නැතහොත් ඔහුගේ අධිකාරය ලත් සෑම තැනැත්තකුට ම, ඒ [104][රාජ්‍ය සංස්ථාව හෝ වෙළෙඳ ව්‍යාපාරය හෝ වෙනත් ව්‍යාපාරය හෝ (1) වන අනුව්‍යවස්ථාවේ සඳහන් සමාගම] සම්බන්ධයෙන් අවශ්‍ය විය හැකි පිවිසීමකට, තොරතුරු ලබා ගැනීමකට සහ කරුණු පැහැදිලි කරවා ගැනීමකට එවැනිම හිමිකමක් ඇත්තේ ය.

(6) විගණකාධිපතිවරයා විසින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තමන්ට අයත් කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීම පිළිබඳ වාර්තාවක් එක් එක් මුදල් වර්ෂය අවසාන වීමෙන් පසු මාස දහයක් ඇතුළත දී සහ අවශ්‍ය යයි ඔහු සලකන කවර වූ හෝ අවස්ථාවක පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුත්තේ ය.

(7) මේ ව්‍යවස්ථාවේ (2) වැනි අනුව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ පත් කරන ලද සෑම සුදුසුකම් ලත් විගණකවරයකු ම විසින්, තම වාර්තාව අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, එහි පිටපතක් විගණකාධිපතිවරයා වෙත ද ඉදිරිපත් කළ යුත්තේ ය.

(8) මේ ව්‍යවස්ථාවේ "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන් -

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

104 - දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 36(3) වැනි වගන්තිය මගින් පැවැති 154(5) අනුව්‍යවස්ථාවේ (ආ) ඡේදයේ "යම් රාජ්‍ය සංස්ථාවක හෝ වෙළෙඳ ව්‍යාපාරයක හෝ වෙනත් ව්‍යාපාරයක" යන වචන යෙදෙන කවර තැනක හෝ ඒ වචන වෙනුවට "යම් රාජ්‍ය සංස්ථාවක හෝ වෙළෙඳ ව්‍යාපාරයක හෝ වෙනත් ව්‍යාපාරයක හෝ (1) වන අනුව්‍යවස්ථාවේ සඳහන් සමාගමක" යන වචන ආදේශ කරන ලදී.

(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද, එමෙන්ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද, එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක් හෝ

අදහස් වේ.

[105] [ (9) (8) වන අනු ව්‍යවස්ථාවේ (අ) ඡේදයේ විධිවිධාන, 153 (1) ව්‍යවස්ථාව යටතේ පත්කරනු ලබන විගණකාධිපතිවරයාට අදාළ විය යුත්තේ ය. ]

105 - දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 36(4) වැනි වගන්තිය මගින් අලුත් 154 (9) අනුව්‍යවස්ථාව ඇතුළත් කරන ලදී.

## [106] [XVIIඅ වැනි පරිච්ඡේදය

**154අ.** (1) ජනාධිපතිවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නියම කරන දිනයේ හෝ දිනවල සිට ක්‍රියාත්මක වන පරිදි අටවන උපලේඛනයේ නිශ්චිතව සඳහන් සෑම පළාතක් ම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව, පළාත් සභාවක් මෙයින් පිහිටුවනු ලැබේ. වෙනස් වෙනස් පළාත් සඳහා වෙනස් වෙනස් දිනයන් නියම කරනු ලැබිය හැකිය. **පළාත් සභා පිහිටුවීම**

(2) (1) වන අනුව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද සෑම පළාත් සභාවක් ම, පළාත් සභා ඡන්ද විමසීම්වලට අදාළ නීතියට අනුකූලව, එම සභාවේ මන්ත්‍රීවරුන් තෝරා පත් කරනු ලැබූ විට සංස්ථාපනය විය යුතු ය.

(3) මේ ව්‍යවස්ථාවේ ඉහතින් වූ විධිවිධානයන්හි පටහැනිව කුමක් සඳහන් වූව ද, එකිනෙකට යාබද පළාත් දෙකකට හෝ තුනකට එක් ආණ්ඩුකාරවරයකුගෙන්, එක් ප්‍රධාන අමාත්‍යවරයකුගෙන්, එක් අමාත්‍ය මණ්ඩලයකින් සහ තෝරා පත් කර ගන්නා ලද එක් පළාත් සභාවකින් යුත්, එක් පරිපාලන ඒකකයක් බවට පත්වීමට ද, එකී පළාත් එක් පරිපාලන ඒකකයක් වශයෙන් පරිපාලනය කරනු ලැබීම දිගට ම පවත්වාගෙන යා යුතු ද නැතහොත් ඒ එක් එක් පළාත් වෙන ම ආණ්ඩුකාරවරයෙක්, ප්‍රධාන අමාත්‍යවරයෙක් සහ අමාත්‍ය මණ්ඩලයක් සහිතව ස්වකීයමය වූ පළාත් සභාවක් ඇති වෙන ම පරිපාලන ඒකකයක් වශයෙන් සකස් විය යුතු ද යන්න නිශ්චය කිරීමේ ආකාරය පිළිබඳව ද විධිවිධාන පාර්ලිමේන්තුව විසින් යම් නීතියක් මගින් හෝ නීතියක් යටතේ හෝ සෑදිය හැක්කේ ය.

**154ආ.** (1) 154අ වැනි ව්‍යවස්ථාවට අනුකූලව පළාත් සභාවක් පිහිටුවනු ලැබ ඇති සෑම පළාතක් සඳහා ම ආණ්ඩුකාරවරයකු සිටිය යුතු ය. **ආණ්ඩුකාරවරයා**

(2) ජනාධිපතිවරයා විසින් සිය අත්සන යටතේ වූ අධිකාර පත්‍රයක් මගින් ආණ්ඩුකාරවරයා පත් කරනු ලැබිය යුතු අතර, ජනාධිපතිවරයාගේ ප්‍රසාදය ඇති තාක් කල් 4 (ආ) වැනි ව්‍යවස්ථාවට අනුකූලව ඔහු විසින් ධුරය දැරිය යුත්තේ ය.

(3) ජනාධිපතිවරයා වෙත යවන ලිපියක් මගින් ආණ්ඩුකාරවරයාට සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැක්කේ ය.

(4) (අ) (i) ආණ්ඩුකාරවරයා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන චේතනාන්විතව උල්ලංඝනය කර තිබීම ;

(ii) ආණ්ඩුකාරවරයා ස්වකීය ධුරයේ බලතල අයුතු අන්දමින් පාවිච්චි කිරීම හා සම්බන්ධ විෂමාචාරය හෝ දූෂණය හා සම්බන්ධ වරද සිදු කර තිබීම ;

106 - දහතුන් වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 4 වැනි වගන්තිය මගින් XVII (අ) පරිච්ඡේදය (ව්‍යවස්ථා 154 අ සිට 154 ඞ දක්වා) ඇතුළත් කරන ලදී.

(iii) ආණ්ඩුකාරවරයා අල්ලස සම්බන්ධ වරදක් හෝ චරිත දූෂණය හා සම්බන්ධ වරදක් සිදු කර තිබීම ;

යන හේතු මත ආණ්ඩුකාරවරයා ඉවත් කරන ලෙසට ජනාධිපතිවරයාට උපදෙස් දෙන යෝජනාවක්, එම යෝජනාව ඉදිරිපත් කිරීම සඳහා වූ යෝජනා සම්මතය, (නොපැමිණි මන්ත්‍රීවරයන් ද ඇතුළුව) පළාත් සභාවේ මුළු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු සංඛ්‍යාවක් විසින් සම්මත කරනු ලැබිණි නම්, පළාත් සභාව විසින් (ආ) ඡේදයට යටත්ව ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ හැක්කේ ය.

(ආ) (අ) ඡේදයේ සඳහන් හේතු මත ආණ්ඩුකාරවරයා ඉවත් කරන ලෙසට ජනාධිපතිවරයාට උපදෙස් දෙන යෝජනාවක් ඉදිරිපත් කිරීම සඳහා වූ කිසිම යෝජනා සම්මතයක් ඒ යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම පළාත් සභාවේ පැමිණ සිටින මුළු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවෙන් දෙකෙන් කොටසකට නොඅඩු සංඛ්‍යාවක් විසින් අත්සන් කරනු ලැබ ඇත්නම් මිස, පළාත් සභාවේ සභාපතිවරයා විසින් භාර ගැනීම හෝ ඒ යෝජනා සම්මතය ගැන පළාත් සභාවේ දී සාකච්ඡා කිරීම හෝ නොකළ යුත්තේ ය.

(5) ආණ්ඩුකාරවරයා විසින් ස්වකීය ධුරය භාර ගත් දින සිට අවුරුදු පහක කාලසීමාවක් මේ ව්‍යවස්ථාවේ පූර්වයෙන් වූ විධිවිධානවලට යටත්ව ධුරය දැරිය යුත්තේ ය.

(6) ආණ්ඩුකාරවරයා ලෙස පත් කරනු ලබන සෑම තැනැත්තෙක් ම ජනාධිපතිවරයා ඉදිරිපිට දී හතරවන උපලේඛනයේ දැක්වෙන ප්‍රතිඥාව දී ඊට අත්සන් තැබීමෙන් හෝ දිවුරුම් දී ඊට අත්සන් තැබීමෙන් හෝ ධුරය භාර ගත යුත්තේ ය.

(7) එසේ ධුරය භාර ගත් විට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඇති කරන ලද හෝ පිළිගන්නා ලද වෙනත් යම් ධුරයක් ආණ්ඩුකාරවරයකු විසින් දැරීම අවසාන වන අතර ඔහු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වේ නම් පාර්ලිමේන්තුවේ සිය අසුනින් ඉවත් විය යුත්තේ ය. ආණ්ඩුකාරවරයා විසින් වෙනත් කවර වූ හෝ ලාභදායි ධුරයක් හෝ තනතුරක් නොදැරිය යුත්තේ ය.

(8) (අ) සුදුසු යයි ආණ්ඩුකාරවරයා අදහස් කරන වේලාවක දී සහ ස්ථානයක දී රැස්වීම සඳහා ඔහු විසින් කලින් කල පළාත් සභාව කැඳවිය හැක්කේ ය. එහෙත් එක් සභා වාරයක අවසාන රැස්වීම සහ ඊළඟ සභා වාරයේ ප්‍රථම රැස්වීම සඳහා නියම කරන ලද දිනය අතර කාලය මාස දෙකකට අඩු විය යුත්තේ ය.

(ආ) ආණ්ඩුකාරවරයා විසින් කලින් කල පළාත් සභාවේ වාරාවසානය කළ හැක්කේ ය.

(ඇ) ආණ්ඩුකාරවරයා විසින් පළාත් සභාව විසුරුවා හැරිය හැක්කේ ය.

(ඇ) ආණ්ඩුකාරවරයාගේ මතය අනුව, පළාත් සභාවේ මන්ත්‍රීවරයන් බහුතර සංඛ්‍යාවක සහයෝගය අමාත්‍ය මණ්ඩලයට ඇති තාක් කල් ආණ්ඩුකාරවරයා විසින් මේ අනුව්‍යවස්ථාව යටතේ ඔහුගේ බලතල ප්‍රධාන අමාත්‍යවරයාගේ උපදෙස් වලට අනුකූලව ක්‍රියාත්මක කළ යුත්තේ ය.

(9) 34 වැනි ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයාගේ බලතලවලට හානියක් නොමැතිව, සහ ඔහුගේ විධානයට යටත්ව පළාතක ආණ්ඩුකාරවරයාට ඒ පළාත සඳහා පිහිටුවන ලද පළාත් සභාව විසින් සාදන ලද ප්‍රඥප්තියකට එරෙහිව වූ හෝ පළාත් සභාවට ප්‍රඥප්ති සෑදීමට බලය ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව විසින් සාදන ලද නීතියකට එරෙහිව වූ වරදකට වරදකරු කරනු ලැබූ සෑම තැනැත්තකුට ම සමාවක් දීමේ සහ එවැනි යම් තැනැත්තකුට අධිකරණය විසින් නියම කරන ලද දඬුවමක් ක්‍රියාත්මක කිරීම කල් තැබීමේ හෝ එම දඬුවම ලිහිල් කිරීමේ බලය ඇත්තේ යඃ

එසේ වුව ද, යම් කාරණයක් සම්බන්ධයෙන්, අමාත්‍ය මණ්ඩලයේ උපදෙස්වලට ආණ්ඩුකාරවරයා එකඟ නොවන්නා වූ ද එම කාරණය, ආඥාවක් ලබා ගැනීම සඳහා ජනාධිපතිවරයා වෙත යොමු කිරීම මහජන යහපත පිණිස අවශ්‍ය වන්නේ යැයි ආණ්ඩුකාරවරයා සලකන්නා වූ ද අවස්ථාවක ඔහු විසින් ඒ කාරණය ජනාධිපතිවරයා වෙත යොමු කළ හැක්කේ ය.

(10) (අ) ආණ්ඩුකාරවරයා විසින් පළාත් සභාව අමතනු ලැබිය හැකි අතර එම කාර්යය සඳහා මන්ත්‍රීවරුන්ට පැමිණෙන ලෙස ද නියම කළ හැක්කේ ය.

(ආ) තත් කාලයෙහි සභාවේ සැලකිල්ලට භාජනව පවතින ප්‍රඥප්තියක් සම්බන්ධයෙන් හෝ වෙනත් කාරණයක් සම්බන්ධයෙන් හෝ ආණ්ඩුකාරවරයා විසින් සභාව වෙත පණිවිඩ යැවීම කළ හැකි අතර එවැනි පණිවිඩයක් යවනු ලැබූ විට සැලකිල්ලට ගත යුතු ලෙස එම පණිවිඩයෙන් නියම කර ඇති යම් කාරණයක් සභාව විසින් හැකි තරම් ඉක්මනින් සැලකිල්ලට ගත යුත්තේ ය.

(11) (අ) යම් පළාතක කටයුතු පරිපාලනයට සම්බන්ධ සහ නීති සම්පාදනය සඳහා වූ යෝජනා සම්බන්ධ පළාතේ අමාත්‍ය මණ්ඩලයේ සියලු ම තීරණ, ඒ පළාතේ ආණ්ඩුකාරවරයාට දැනුම් දීම ;

(ආ) යම් පළාතක කටයුතු පරිපාලනයට සහ නීති සම්පාදනය සඳහා වූ යෝජනාවලට අදාළව ආණ්ඩුකාරවරයා විසින් ඉල්ලනු ලබන තොරතුරු ඉදිරිපත් කිරීම ; සහ

(ඇ) අමාත්‍යවරයකු විසින් තීරණයක් ගනු ලැබ ඇත්තා වූ ද, එහෙත් පළාත් අමාත්‍ය මණ්ඩලය විසින් සලකා බලනු ලැබ නොමැත්තා වූ ද, යම් කාරණයක් පළාත් අමාත්‍ය මණ්ඩලය විසින් සලකා බලනු ලැබීම සඳහා ඉදිරිපත් කරන ලෙස ආණ්ඩුකාරවරයා විසින් නියම කරනු ලැබුවහොත්, එසේ ඉදිරිපත් කිරීම

ඒ පළාතේ ප්‍රධාන අමාත්‍යවරයාගේ කාර්යය වන්නේ ය.

(12) ආණ්ඩුකාර ධුරය දරන තැනැත්තන්ගේ වැටුප, දීමනා, විශ්‍රාම ගැනීමේ වයස සහ විශ්‍රාම වැටුප් හිමිකම් සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව විසින් නීතිය මගින් විධිවිධාන සැලැස්විය යුත්තේ ය.

**ආණ්ඩුකාරවරයා විසින් විධායක බලතල ක්‍රියාත්මක කිරීම**

**154**ඈ. පළාත් සභාවක් විසින් ප්‍රඥප්ති සම්පාදනය කරනු ලැබිය හැකි කාරණාවලට ව්‍යාප්ත වන විධායක බලය, එම පළාත් සභාව පිහිටුවනු ලැබූ පළාතේ ආණ්ඩුකාරවරයා විසින් 154ඊ ව්‍යවස්ථාවට අනුකූලව, කෙලින් ම හෝ පළාත් අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන් මාර්ගයෙන් හෝ සිය යටත් නිලධරයන් මාර්ගයෙන් හෝ ක්‍රියාත්මක කළ හැක්කේ ය.

**පළාත් සභාවේ සාමාජිකත්වය**

**154**ඇ. (1) පළාත් සභාවක්, එම පළාත් සභාව පිහිටුවනු ලැබ ඇති පළාතේ වර්ග ප්‍රමාණය සහ ජනගහනය සැලකිල්ලට ගෙන, නීතියෙන් තීරණය කරනු ලබන පරිදි වූ මන්ත්‍රීවරයන් සංඛ්‍යාවකින් සමන්විත විය යුත්තේ ය.

(2) (අ) පළාත් සභාවක් පිහිටුවනු ලැබ ඇති පළාත ඇතුළත සීමාවන් පිහිටා ඇති මැතිවරණ කොට්ඨාස සඳහා තෝරා පත් කර ගනු ලැබ සිටින පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ට එම පළාත් සභාවේ රැස්වීම් කටයුතුවලට සහභාගී වීමේ අයිතිවාසිකම දීමට ඒ සභාව විසින් පළාත් සභාවේ මන්ත්‍රීවරයන්ගේ ධුර කාලය ආරම්භ වන අවස්ථාවේ දී යෝජනා සම්මතයක් මගින් තීරණය කළ හැක්කේ ය.

(ආ) (අ) ඡේදය යටතේ කරන ලද යෝජනා සම්මතයක් බල පවත්නා තාක් කල්, එම පළාත් සභාව පිහිටුවනු ලැබ ඇති පළාත ඇතුළත සීමාවන් පිහිටා ඇති මැතිවරණ කොට්ඨාසයක් සඳහා තෝරා පත් කර ගනු ලැබ සිටින පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුට, එම සභාවේ ධුර කාලය ඇතුළත, එම පළාත් සභාවේ රැස්වීම් කටයුතුවල දී කථා කිරීමට සහ වෙනත් ආකාරයකින් සහභාගී වීමට ද, එම පළාත් සභාවේ යම් කාරක සභාවක සාමාජිකයකු වශයෙන් ඔහු නම් කරනු ලැබූ විටක, ඒ කාරක සභාවේ දී කථා කිරීමට සහ වෙනත් ආකාරයකින් සහභාගි වීමට ද අයිතිවාසිකම ඇත්තේ ය. නමුත් පළාත් සභාවක දී හෝ එහි කාරක සභාවක දී ඡන්දය දීමට හිමිකම් ඇත්තේ (අ) ඡේදය යටතේ වූ යෝජනා සම්මතයෙහි ඒ සඳහා විධිවිධාන සලස්වා ඇත්නම් පමණි.

(ඇ) මේ අනුව්‍යවස්ථාවේ විධිවිධාන ක්‍රියාත්මක වීම පළමුවන පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලබන දිනයෙහි අවසාන වන්නේ ය.

**154ඉ.** පළාත් සභාවක් කලින් විසුරුවා හරිනු ලැබුවහොත් මිස, එම පළාත් සභාවේ පළමු රැස්වීම සඳහා නියම කරන ලද දින සිට අවුරුදු පහක කාලයක් ඒ සභාව පවත්නේ ය. එකී පස් අවුරුදු කාලය ඉකුත්ව ගිය විට ම එම පළාත් සභාව විසිර ගියාක් සේ සැලකෙන්නේ ය. ධුර කාලය

**154ඊ.** (1) යම් පළාතක ආණ්ඩුකාරවරයාට ඔහුගේ කර්තව්‍ය ඉටු කිරීමේ දී සහාය වීම සහ උපදෙස් දීම පිණිස ප්‍රධාන අමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් යුත් වෙනත් අමාත්‍යවරයන් හතර දෙනකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත වූ පළාත් අමාත්‍ය මණ්ඩලයක් තිබිය යුත්තේ ය. ආණ්ඩුකාරවරයා විසින් තම කර්තව්‍ය හෝ ඉන් කිසිවක් තම අභිමතය අනුව ඉටු කළ යුතු බවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් හෝ යටතේ හෝ නියම කරනු ලැබ ඇති තාක් දුරට හැර, ආණ්ඩුකාරවරයා විසින් එම උපදෙස්වලට අනුකූලව තම කර්තව්‍ය ඉටු කළ යුත්තේ ය. අමාත්‍ය මණ්ඩලය

(2) යම් කාරණයක් ආණ්ඩුකාරවරයා විසින් තම අභිමතය අනුව ඉටු කළ යුතු කාරණයක් ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් හෝ යටතේ හෝ නියම කරනු ලැබ තිබේ ද, නැද්ද යන්න සම්බන්ධයෙන් යම් ප්‍රශ්නයක් උද්ගත වුවහොත් ආණ්ඩුකාරවරයා විසින් ඒ සම්බන්ධයෙන් තම අභිමතය අනුව කරනු ලබන තීරණය අවසානාත්මක වන අතර ආණ්ඩුකාරවරයා විසින් කරන ලද යම් ක්‍රියාවක වලංගුභාවය ගැන, ඔහු විසින් තම අභිමතය අනුව ක්‍රියා කළ යුතු ව තිබිණැයි හෝ නොතිබිණැයි යන හේතුව මත, කිසි අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුත්තේ ය. ආණ්ඩුකාරවරයාගේ අභිමතය ක්‍රියාත්මක කිරීම ජනාධිපතිවරයාගේ විධානය මත විය යුත්තේ ය.

(3) අමාත්‍යවරයන් විසින් ආණ්ඩුකාරවරයාට යම් උපදේශයක් දෙන ලද්දේ ද, එසේ නම් ඒ කවර උපදේශයක් වී ද යන්න සම්බන්ධයෙන් කිසිම අධිකරණයක දී විභාග කරනු නොලැබිය යුත්තේ ය.

(4) පළාතක් සඳහා සංස්ථාපිත පළාත් සභාවේ යම්කිසි මන්ත්‍රීවරයකු ඒ පළාත් සභාවේ බහුතර මන්ත්‍රීවරයන්ගේ සහාය ලබා ගැනීමට සමත් වන්නේ යැයි ආණ්ඩුකාරවරයා කල්පනා කෙරේ ද, ආණ්ඩුකාරවරයා විසින් ඒ මන්ත්‍රීවරයා ප්‍රධාන අමාත්‍ය ධුරයට පත් කළ යුත්තේ යඃ

එසේ වුව ද, පළාත් සභාවකට තෝරා පත් කර ගනු ලැබ ඇති මන්ත්‍රීවරුන්ගෙන් දෙකෙන් එකකට වැඩි සංඛ්‍යාවක් එක් දේශපාලන පක්ෂයකට අයත් සාමාජිකයින් වන අවස්ථාවක, ආණ්ඩුකාරවරයා විසින් එම සභාවේ එම දේශපාලන පක්ෂයේ නායකයා ප්‍රධාන අමාත්‍යවරයා වශයෙන් පත් කළ යුත්තේ ය.

(5) ආණ්ඩුකාරවරයා විසින් ප්‍රධාන අමාත්‍යවරයාගේ උපදේශය අනුව, සෙසු අමාත්‍යවරයන් එම පළාත සඳහා සංස්ථාපනය කර ඇති පළාත් සභාවේ මන්ත්‍රීවරයන් අතරින් පත් කළ යුත්තේ ය.

(6) පළාත් අමාත්‍ය මණ්ඩලය පළාත් සභාවට සාමූහිකව වගකීමට සහ උත්තර දීමට බැඳී සිටින්නේ ය.

(7) ප්‍රධාන අමාත්‍ය ධුරයට හෝ පළාත් අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් හෝ පත් කරන ලද තැනැත්තෙක්, හතරවන උපලේඛනයේ දැක්වෙන ප්‍රතිඥාව දී ඊට අත්සන් තබන තෙක් හෝ දිවුරුම් දී ඊට අත්සන් තබන තෙක් හෝ ඔහුගේ ධුරයේ කාර්යය ආරම්භ නොකළ යුත්තේ ය.

පළාත් සභා ප්‍රඥප්ති

**154උ.** (1) සෑම පළාත් සභාවක් ම විසින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව, එම පළාත් සභාව පිහිටුවනු ලැබ ඇති ප්‍රදේශයට අදාළ වන සේ (මෙහි මින්මතු "පළාත් සභා ලැයිස්තුව" යනුවෙන් හඳුන්වනු ලබන) නවවන උපලේඛනයේ I වැනි ලැයිස්තුවේ ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් ප්‍රඥප්ති සෑදිය හැක්කේ ය.

(2) මේ පරිච්ඡේදයේ විධිවිධාන හෝ නවවන උපලේඛනය හෝ සංශෝධනය කිරීම සඳහා හෝ ඉවත් කිරීම සඳහා වන පනත් කෙටුම්පතක්, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසුව සහ පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කරනු ලැබීමට පෙර, ඒ පිළිබඳව, යොමු කිරීමෙහි නිශ්චය කොට දැක්වෙන කාල සීමාවක් ඇතුළත, අදහස් ප්‍රකාශ කිරීම පිණිස, ජනාධිපතිවරයා විසින්, සෑම පළාත් සභාවක් වෙත ම යොමු කරනු ලැබ ඇත්නම් මිස, සහ

(අ) ඒ සෑම සභාවක් ම එම සංශෝධනයට හෝ ඉවත් කිරීමට හෝ එකඟ වන්නා වූ අවස්ථාවක, එම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට පැමිණ ඡන්දය දෙන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ බහුතරයක් විසින් සම්මත කරනු ලැබිණි නම්; හෝ

(ආ) සංශෝධනය හෝ ඉවත් කිරීම හෝ පිළිබඳව එක සභාවක් හෝ සභා වැඩි ගණනක් එකඟ නොවන්නා වූ අවස්ථාවක, එම පනත් කෙටුම්පත 82 වැනි ව්‍යවස්ථාවේ නියම කර ඇති විශේෂ බහුතර ඡන්දයෙන් සම්මත කරනු ලැබිණි නම්,

මිස ඒ පනත් කෙටුම්පත නීතියක් බවට පත් නොවන්නේ ය.

(3) පළාත් සභා ලැයිස්තුවේ දක්වා ඇති යම් කාරණයක් පිළිබඳව වන පනත් කෙටුම්පතක්, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසුව සහ පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කරනු ලැබීමට පෙර, ඒ පිළිබඳව, යොමු කිරීමෙහි නිශ්චය කොට දැක්වෙන කාලසීමාවක් ඇතුළත, අදහස් ප්‍රකාශ කිරීම පිණිස, ජනාධිපතිවරයා විසින්, සෑම පළාත් සභාවක් වෙත ම යොමු කරනු ලැබ ඇත්නම් මිස, සහ

(අ) ඒ සෑම සභාවක් ම එම පනත් කෙටුම්පත සම්මත කිරීමට එකඟ වන්නා වූ අවස්ථාවක, එම පනත් කෙටුම්පත, පාර්ලිමේන්තුවට පැමිණ ඡන්දය දෙන පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයන්ගේ බහුතරයක් විසින් සම්මත කරනු ලැබිණි නම් ; හෝ

(ආ) පනත් කෙටුම්පත සම්මත කිරීමට, එක සභාවක් හෝ සභා වැඩි ගණනක් එකඟ නොවන්නා වූ අවස්ථාවක, එම පනත් කෙටුම්පත 82 වැනි ව්‍යවස්ථාවේ නියම කර ඇති විශේෂ බහුතර ඡන්දයෙන් සම්මත කරනු ලැබිණි නම්,

මිස නීතියක් බවට පත් නොවන්නේ ය:

එසේ වුව ද, එවැනි යොමු කිරීමක් කරන ලදුව සියලුම පළාත් සභා නොව, පළාත් සභා සමහරක් පමණක් එම පනත් කෙටුම්පත සම්මත කිරීමට එකඟ වූ අවස්ථාවක, පාර්ලිමේන්තුවට පැමිණ ඡන්දය දෙන්නා වූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ බහුතර ඡන්දයෙන් එම පනත් කෙටුම්පත සම්මත කරනු ලැබූ විට, එම පනත් කෙටුම්පත, ඊට එකඟ වූ පළාත් සභා පිහිටුවනු ලැබ ඇත්තේ යම් පළාත් සඳහා ද, ඒ පළාත් සම්බන්ධයෙන් පමණක් අදාළ වන නීතියක් බවට පත් වන්නේ ය .

(4) පළාත් සභා ලැයිස්තුවේ දක්වා ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් නීති සාදන ලෙස පළාත් සභා එකක් හෝ ඊට වැඩි ගණනක් විසින් යෝජනා සම්මතයක් මගින් පාර්ලිමේන්තුවෙන් ඉල්ලා සිටින ලද අවස්ථාවක, ඒ පළාත් සභා පිහිටවනු ලැබ ඇත්තේ යම් පළාත් සඳහා ද, ඒ පළාත්වලට පමණක් අදාළ වන සේ පාර්ලිමේන්තුව විසින්, පැමිණ ඡන්දය දෙන්නා වූ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ බහුතර ඡන්දයෙන්, එම කාරණය සම්බන්ධයෙන් නීති සෑදිය හැක්කේ ය.

(5) (අ) එක් එක් කාරණාවේ අවස්ථාගත කරුණු අනුව උචිත යයි පාර්ලිමේන්තුව අදහස් කරන ආකාරයකට සියලුම පළාත් සභා විමසීමෙන් පසුව (මෙහි මින්මතු "සමගාමී ලැයිස්තුව" යනුවෙන් සඳහන් කරනු ලබන) නව වැනි උපලේඛනයේ III වැනි ලැයිස්තුවේ සඳහන් කළ යම් කාරණයක් සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව විසින් නීති පැනවිය හැක්කේ ය.

(ආ) එක් එක් කාරණාවේ අවස්ථාගත කරුණු අනුව උචිත යයි පළාත් සභාව අදහස් කරන ආකාරයට පාර්ලිමේන්තුව විමසීමෙන් පසුව, එම පළාත් සභාව පිහිටුවනු ලැබූ පළාතට අදාළ වන සේ සමගාමී ලැයිස්තුවේ සඳහන් යම් කාරණයක් සම්බන්ධයෙන් පළාත් සභාවක් විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව ප්‍රඥප්ති සෑදිය හැක්කේ ය.

(6) පළාත් සභාවක් විසින් සම්පාදනය කරන ලද යම් ප්‍රඥප්තියක යම් විධිවිධානයක් මේ ව්‍යවස්ථාවේ පෙරාතුව වූ විධිවිධානවලට අනුකූලව සම්පාදනය කරන ලද යම් නීතියක විධිවිධානවලට අනනුකූල වන අවස්ථාවක, එම නීතියේ විධිවිධාන බලපැවැත්විය යුතු අතර, එම ප්‍රඥප්තියේ විධිවිධාන, එම අනනුකූලතාවයේ ප්‍රමාණයට බල රහිත වන්නේ ය.

(7) (මෙහි මින් මතු "සංවෘත ලැයිස්තුව" යනුවෙන් හඳුන්වනු ලබන) නව වැනි උපලේඛනයේ II වැනි ලැයිස්තුවේ දක්වා ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් ප්‍රඥප්ති සෑදීමට පළාත් සභාවකට බලය නොමැත්තේ ය.

(8) පළාත් සභා ලැයිස්තුවේ ඇති යම් කාරණයක් සම්බන්ධ නීතියක් මේ පරිච්ඡේදය බලපැවැත්වීම ආරම්භ වන දිනයෙහි බලාත්මකව තිබෙන සහ පළාතක් සඳහා පිහිටුවන ලද පළාත් සභාවක් විසින් ඊට පසුව නීතියට අනනුකූල බව දීර්ඝ නාමයේ විස්තර කරනු ලැබ ඇති ප්‍රඥප්තියක් එම කාරණය ම සම්බන්ධයෙන් සාදනු ලැබූ අවස්ථාවක, එම ප්‍රඥප්තියට අනුමතය ලැබුණු දින සිට එම ප්‍රඥප්තිය බලපවත්වන තාක් කල් පමණක්, එම පළාත ඇතුළත එම නීතියේ විධිවිධාන ක්‍රියාත්මක වීම අත්හිටවනු ලැබ තිබිය යුතු අතර, ඒ විධිවිධාන අක්‍රීයව පැවතිය යුත්තේ ය.

(9) සමගාමී ලැයිස්තුවේ ඇති යම් කාරණයක් සම්බන්ධ නීතියක් මේ පරිච්ඡේදය බලපැවැත්වීම ආරම්භ වන දිනයෙහි බලාත්මකව තිබෙන සහ පළාතක් සඳහා පිහිටුවන ලද පළාත් සභාවක් විසින් ඊට පසුව එම නීතියට අනනුකූල ප්‍රඥප්තියක් එම කාරණය ම සම්බන්ධයෙන් සම්පාදනය කරනු ලැබූ අවස්ථාවක, යෝජනා සම්මතයක් මගින් පාර්ලිමේන්තුව විසින් පටහැනි තීරණයක් ගනු ලැබුවහොත් මිස, එම ප්‍රඥප්තියට අනුමතය ලැබුණු දින සිට එම ප්‍රඥප්තිය බලපවත්වන තාක් කල් පමණක් එම පළාත් ඇතුළත එම නීතියේ විධිවිධාන අත්හිටුවනු ලැබ තිබිය යුතු අතර ඒ විධිවිධාන අක්‍රීයව පැවතිය යුත්තේ ය.

(10) මේ ව්‍යවස්ථාවේ ඇතුළත් කිසිවක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව යම් කාරණයක් සම්බන්ධයෙන් මුළු ශ්‍රී ලංකාව ම හෝ එහි යම් කොටසක් සඳහා නීති සෑදීමට (මේ පරිච්ඡේදය ඇතුළුව) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පාර්ලිමේන්තුවට පැවරී ඇති බලතල හීන කරන්නාක් සේ කියවා තේරුම් ගැනීම හෝ නොකළ යුත්තේ ය.

(11) මේ ව්‍යවස්ථාවේ (3) වැනි අනුව්‍යවස්ථාවේ කුමක් සඳහන් වී තිබුණ ද පාර්ලිමේන්තුව විසින්, පළාත් සභා ලැයිස්තුවේ දක්වා ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් වෙනත් යම් රටක් හෝ රටවල් සමඟ ඇති කර ගත් යම් ගිවිසුමක්, එකඟවීමක් හෝ සම්මුතියක් හෝ ක්‍රියාත්මක කිරීමේ හෝ ජාත්‍යන්තර සම්මේලනයක දී, සංගමයක දී හෝ වෙනත් මණ්ඩලයක දී එළඹෙන ලද යම් තීරණ ක්‍රියාත්මක කිරීමේ හෝ කාර්යය සඳහා, එම අනුව්‍යවස්ථාවේ දක්වා ඇති කාර්ය පටිපාටිය නොවන වෙනත් ආකාරයකින් නීති සෑදිය හැක්කේ ය.

අනුමතය

**154උෟ.** (1) පළාත් සභාවක් විසින් සාදන ලද යම් ප්‍රඥප්තියකට මෙහි මින් මතු විධිවිධාන සලස්වනු ලබන ආකාරයට අනුමතය ලැබුණ විට, එම ප්‍රඥප්තිය බලාත්මක වන්නේ ය.

(2) පළාත් සභාවක් විසින් සාදන ලද සෑම ප්‍රඥප්තියක් ම එම ප්‍රඥප්තිය සාදන ලද වහාම, අනුමතය සඳහා ආණ්ඩුකාරවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එවිට ආණ්ඩුකාරවරයා විසින් එම ප්‍රඥප්තියට අනුමතය දීම හෝ එම ප්‍රඥප්තිය තමාගේ අනුමතය සඳහා ඉදිරිපත් කරනු ලැබීමෙන් පසු හැකි තරම් ඉක්මනින් එම ප්‍රඥප්තිය හෝ එහි යම් නිශ්චිත විධිවිධානයක් නැවත සලකා බලන ලෙස සභාවෙන් ඉල්ලා සිටින සහ විශේෂයෙන්, පණිවුඩයේ නිර්දේශ කරනු ලබන සංශෝධන ඉදිරිපත් කිරීමේ යෝග්‍යතාව සලකා බලන ලෙස ඉල්ලා සිටින පණිවුඩයක් සමඟ පළාත් සභාව වෙත ආපසු යැවීම හෝ කළ යුත්තේ ය.

(3) ආණ්ඩුකාරවරයා විසින් (2) වැනි අනුව්‍යවස්ථාව යටතේ පළාත් සභාවක් වෙත ප්‍රඥප්තියක් ආපසු එවනු ලැබූ අවස්ථාවක, පළාත් සභාව විසින් ආණ්ඩුකාරවරයාගේ පණිවුඩය කෙරෙහි සැලකිල්ල ඇතිව ප්‍රඥප්තිය නැවත සලකා බැලිය යුතු අතර සංශෝධන සහිතව හෝ රහිතව එම ප්‍රඥප්තිය සම්මත කර, ආණ්ඩුකාරවරයාගේ අනුමතය සඳහා ඔහු වෙත ඉදිරිපත් කළ හැකිය.

(4) ප්‍රඥප්තියක් (2) වැනි අනුව්‍යවස්ථාව යටතේ ආණ්ඩුකාරවරයා වෙත ඉදිරිපත් කරනු ලැබූ විට, ආණ්ඩුකාරවරයා විසින් එයට අනුමතය දීම හෝ එම ප්‍රඥප්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූල නොවන බවට තීරණයක් ලබා ගැනීමට එම ප්‍රඥප්තිය දෙවන වරට සම්මත කරනු ලැබීමෙන් පසු එක් මාසයක් ඇතුළත ජනාධිපතිවරයා විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට යොමු කිරීම සඳහා රඳවා ගැනීම හෝ කළ හැක්කේ ය. එසේ යොමු කිරීමෙන් පසුව, එම ප්‍රඥප්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූල බව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කරන ලද අවස්ථාවක, එම අධිකරණ තීන්දුව තමාට ලැබුණු විට ආණ්ඩුකාරවරයා විසින් එම ප්‍රඥප්තියට අනුමතය දිය යුත්තේ ය. එසේ යොමු කිරීමෙන් පසුව, එම ප්‍රඥප්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනනුකූල යයි ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කරන ලද අවස්ථාවක, ආණ්ඩුකාරවරයා විසින් එම ප්‍රඥප්තියට අනුමතය නොදිය යුත්තේ ය.

**154එ.** (1) අත්‍යවශ්‍ය සැපයුම් සහ සේවා පවත්වාගෙන යාමට තර්ජනයක් එල්ල වී තිබීමේ හෝ යුද්ධයක් හෝ විදේශ ආක්‍රමණයක් හෝ සන්නද්ධ කැරැල්ලක් නිසා ශ්‍රී ලංකාවේ ආරක්ෂාවට තර්ජනයක් එල්ල වී තිබීමේ හේතුව මත මහජන ආරක්ෂක ආඥාපනතේ හෝ මහජන ආරක්ෂාව සම්බන්ධයෙන් තත්කාලයේ බලපවත්නා නීතිවල විධිවිධාන ක්‍රියාත්මක කරන ප්‍රකාශනයක් ඒ ආඥාපනතේ හෝ නීති හෝ යටතේ කරනු ලැබූ විට, යම් ආණ්ඩුකාරවරයකු විසින් ක්‍රියාත්මක කළ යුතු විධායක බලය ක්‍රියාත්මක කළ යුතු වන ආකාරය සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් ඒ ආණ්ඩුකාරවරයාට විධාන නිකුත් කළ හැක්කේ ය. එම විධාන, එම ප්‍රකාශනය කිරීම සඳහා හේතු වශයෙන් එහි දක්වා ඇති හේතුවලට අදාළ විය යුත්තේ ය. මහජන ආරක්ෂාව

**පැහැදිලි කිරීම :-**

අත්‍යවශ්‍ය සැපයුම් සහ සේවා පවත්වාගෙන යාමට තර්ජනයක් එල්ල වී ඇති බව හෝ යුද්ධයක් හෝ විදේශ ආක්‍රමණයක් හෝ සන්නද්ධ කැරැල්ලක් නිසා ශ්‍රී ලංකාවේ හෝ එහි දේශයේ යම් කොටසක ආරක්ෂාවට තර්ජනයක් එල්ල වී ඇති බව ප්‍රකාශ කරමින් මහජන ආරක්ෂක ආඥාපනත යටතේ ප්‍රකාශනයක්, ඒ අන්තරායය අත්‍යාසන්න බවට ජනාධිපතිවරයා සෑහීමට පත් වේ නම් ඒ සේවා සහ සැපයුම් ඇත්ත වශයෙන් ම ඇනහිටීමට හෝ ඒ යුද්ධය හෝ ආක්‍රමණය හෝ කැරැල්ල ඇත්ත වශයෙන් ඇති වීමට පළමුව ජනාධිපතිවරයා විසින් කළ හැක්කේ ය:

එසේ වුව ද, එවැනි යම් ප්‍රකාශනයක් ශ්‍රී ලංකාවේ යම් කොටසක පමණක් ක්‍රියාත්මකව පවතින අවස්ථාවක, මේ ව්‍යවස්ථාව යටතේ විධාන නිකුත් කිරීමට ජනාධිපතිවරයා සතු බලය, අත්‍යවශ්‍ය සැපයුම් හා සේවා පවත්වා ගැනීම හෝ ශ්‍රී ලංකාවේ ආරක්ෂාව ස්ථිර කිරීම සඳහා යෝග්‍ය වේ නම් සහ එසේ යෝග්‍ය වන තාක් දුරට, එම ප්‍රකාශනය ක්‍රියාත්මකව පවතින පළාත නොවන වෙනත් පළාතකට ද ව්‍යාප්ත විය යුත්තේ ය.

(2) මහජන ආරක්ෂක ආඥාපනත හෝ මහජන ආරක්ෂාවට අදාළව තත්කාලයේ හෝ බලපවත්නා නීතිය යටතේ හෝ කරන ලද ප්‍රකාශනයක් සියලුම කාර්ය සඳහා තීරණාත්මක විය යුතු අතර, එය කිසිම අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුත්තේ ය. තව ද, එම ප්‍රකාශනය පිළිබඳව හෝ ප්‍රකාශනය කිරීමේ හේතු පිළිබඳව හෝ එම හේතු පවතින්නේ ද යන්න පිළිබඳව හෝ මේ ව්‍යවස්ථාව යටතේ දෙන ලද යම් විධානයක් පිළිබඳව හෝ කිසිම අධිකරණයක් හෝ විනිශ්චය අධිකාරයක් විසින් විභාග කිරීම, මතයක් ප්‍රකාශ කිරීම හෝ වෙනත් යම් ආකාරයකින් ප්‍රශ්න කිරීම හෝ කරනු නොලැබිය යුත්තේ ය.

**විධාන අනුව ක්‍රියා කිරීම පැහැර හැරීම**

154ඒ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මේ පරිච්ඡේදය යටතේ ආණ්ඩුකාරවරයාට හෝ යම් පළාත් සභාවකට දෙන ලද යම් විධානයකට අනුකූලව කටයුතු කිරීම හෝ ඒවා ක්‍රියාත්මක කිරීම ආණ්ඩුකාරවරයා හෝ ඒ පළාත් සභාව විසින් පැහැර හැර ඇති අවස්ථාවක, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව ඒ පළාතේ පරිපාලනය කරගෙන යා නොහැකි තත්ත්වයක් උද්ගත වී ඇතැයි ජනාධිපතිවරයා විසින් තීරණය කරනු ලැබීම නීත්‍යනුකූල වන්නේ ය.

**පරිපාලනය ඇනහිටීම**

**154ඔ.** (1) යම් පළාතක පරිපාලනය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව කරගෙන යා නොහැකි බවට එම පළාතේ ආණ්ඩුකාරවරයාගෙන් ලැබුණු වාර්තාවක් අනුව හෝ අන්‍යාකාරයකින් හෝ ජනාධිපතිවරයා සෑහීමකට පත්වුවහොත් ජනාධිපතිවරයා විසින් ප්‍රකාශනයක් මගින් -

(අ) පළාතේ පරිපාලනය සතු සියලුම කර්තව්‍ය හෝ ඉන් කිසිවක් හෝ ආණ්ඩුකාරවරයා වෙත හෝ පළාත් සභාව නොවන එම පළාතේ වෙනත් යම් මණ්ඩලයක් හෝ අධිකාරයක් වෙත පැවරී ඇති හෝ ඔහු හෝ එය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි සියලුම බලතල හෝ ඉන් කිසිවක් හෝ තමන් වෙත පවරා ගත හැක්කේ ය ;

(ආ) පළාත් සභාවේ බලතල පාර්ලිමේන්තුව විසින් හෝ එහි බලය යටතේ ක්‍රියාත්මක කළ යුතු බව ප්‍රකාශ කළ හැක්කේ ය ;

(ඇ) ප්‍රකාශනයේ පරමාර්ථ සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය ලෙස හෝ උචිත ලෙස ජනාධිපතිවරයාට පෙනී යන ආකාරයේ ආනුෂංගික විධිවිධාන සැලැස්විය හැක්කේ යඃ

එසේ වුව ද, යම් අධිකරණයකට පැවරී ඇති හෝ යම් අධිකරණයක් විසින් ක්‍රියාත්මක කළ හැකි කිසිම බලයක් ජනාධිපතිවරයා වෙත පවරා ගැනීම පිණිස මේ අනුව්‍යවස්ථාවේ කිසිවකින් බලය නොලැබෙන්නේය.

(2) ඊට පසුව කරනු ලබන ප්‍රකාශනයක් මගින් එවැනි යම් ප්‍රකාශනයක් ප්‍රත්‍යාදිෂ්ට කිරීම හෝ වෙනස් කිරීම හෝ කළ හැක්කේ ය.

(3) මේ ව්‍යවස්ථාව යටතේ වූ සෑම ප්‍රකාශනයක් ම පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එම ප්‍රකාශනය ඊට කලින් වූ ප්‍රකාශනයක් ප්‍රත්‍යාදිෂ්ට කිරීම සඳහා වූ ප්‍රකාශනයක් වන අවස්ථාවක හැර, දින 14ක් වූ කාලසීමාවක් ඉකුත් වීමට පෙර එය පාර්ලිමේන්තුව විසින් යෝජනා සම්මතයක් මගින් අනුමත කරනු ලැබිණි නම් මිස, එහි බලපෑම දින දහහතරක කාලයක් ඉකුත් වූ විට අවසන් වන්නේ යඃ

එසේ වුව ද, (කලින් වූ ප්‍රකාශනයක් ප්‍රත්‍යාදිෂ්ට කිරීම සඳහා වූ ප්‍රකාශනයක් නොවන) එවැනි ප්‍රකාශනයක් පාර්ලිමේන්තුව විසුරුවා හැර තිබෙන අවස්ථාවක කරනු ලැබුවහොත් හෝ මේ අනුව්‍යවස්ථාවේ සඳහන් දින දහහතරක කාලසීමාව ඇතුළත පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබුවහොත් සහ එම කාලසීමාව ඉකුත්වීමට පෙර එම ප්‍රකාශනය සම්බන්ධයෙන් යෝජනා සම්මතයක් පාර්ලිමේන්තුව විසින් සම්මත කර නොමැති නම්, පාර්ලිමේන්තුව ඊළඟට සංස්ථාපනය වී ප්‍රථම වරට රැස්වන දිනයේ සිට දින දහහතරක කාලසීමාවක් ඉකුත් වීමට පෙර එම ප්‍රකාශනය අනුමත කරන යෝජනා සම්මතයක් පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබුවහොත් මිස, එහි බලපෑම පාර්ලිමේන්තුව එසේ රැස් වූ දිනයේ සිට දින දහහතරක් ඉකුත් වූ විට අවසන් වන්නේ ය.

(4) එසේ අනුමත කරන ලද ප්‍රකාශනයක්, එය කලින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබුවහොත් මිස එය නිකුත් කරන ලද දිනයේ සිට මාස දෙකක කාලයක් ඉකුත් වූ විට එහි බලපෑම අවසාන විය යුත්තේ යඃ

එසේ වුව ද, එම ප්‍රකාශනය දිගට ම බලපවත්නා පිණිස අනුමත කරන යෝජනා සම්මතයක් පාර්ලිමේන්තුව විසින් සම්මත කළහොත් සහ එසේ සම්මත කරන සෑම වාරයකදී ම, ප්‍රකාශනය, ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබුවහොත් මිස, එම ප්‍රකාශනයේ බලපෑම මේ අනුව්‍යවස්ථාව යටතේ අවසාන විය යුතු දිනයේ සිට වැඩිදුර මාස දෙකක කාල සීමාවක් දිගට ම බලපැවැත්විය යුතු ය. එහෙත් කිසිම අවස්ථාවක ඒ ප්‍රකාශනය එක් අවුරුද්දකට වැඩි කාලයක් බලාත්මක නොවිය යුත්තේ ය:

එසේ ම තවදුරටත්, එවැනි යම් මාස දෙකක කාල සීමාවක් ඇතුළත පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබූ නමුත් එකී කාල සීමාව ඇතුළත එම ප්‍රකාශනය දිගට ම බලපවත්වන පිණිස යෝජනා සම්මතයක් පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබ නොමැති අවස්ථාවක, පාර්ලිමේන්තුව ඊළඟට සංස්ථාපනය වී ප්‍රථම වරට රැස්වන දිනයේ සිට දින දහහතරක් ඉකුත් වීමට පෙර, ඒ ප්‍රකාශනය දිගට ම බලපවත්වන පිණිස පාර්ලිමේන්තුව විසින් යෝජනා සම්මතයක් සම්මත කරනු ලැබුවහොත් මිස ඒ ප්‍රකාශනයේ බලපෑම එකී දින දහහතරක් වූ කාලසීමාව ඉකුත් වීමේ දී අවසාන වන්නේ ය.

(5) මෙම ව්‍යවස්ථාවේ කුමක් සඳහන්ව තිබුණ ද (1) වැනි අනුව්‍යවස්ථාව යටතේ තමා විසින් ප්‍රකාශනයක් කිරීමෙන් දින දහහතරක් ඇතුළත සහ එම අනුව්‍යවස්ථාවේ සඳහන් කාරණා අතුරින් කිසිවක් සම්බන්ධයෙන් තමා සෑහීමට පත් වීම සඳහා ජනාධිපතිවරයා විසින් එම කාරණා සම්බන්ධයෙන් දින හැටක කාලසීමාවක් ඇතුළත විභාග කර වාර්තා කිරීම සඳහා විශ්‍රාමලත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරයකු පත් කළ හැක්කේ ය. එසේ පත් කරන ලද විනිශ්චයකාරවරයකුට, එම පරීක්ෂණය සම්බන්ධයෙන් පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පත් කරන ලද කොමසාරිස්වරයකු සතු බලතල ඇත්තේ ය. ඒ විනිශ්චයකාරවරයාගේ වාර්තාව ලැබුණු විට, (1) වැනි අනුව්‍යවස්ථාව යටතේ කරන ලද ප්‍රකාශනය ජනාධිපතිවරයා විසින් ප්‍රත්‍යාදිෂ්ට කළ හැක්කේ ය.

(6) මේ ව්‍යවස්ථාව යටතේ කරන ලද ප්‍රකාශනයක් සියලු කාර්ය සඳහා තීරණාත්මක විය යුතු අතර, ඒ ගැන කිසිම අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුත්තේ ය. තව ද, කිසිම අධිකරණයක් හෝ විනිශ්චය අධිකාරයක් විසින් එම ප්‍රකාශනය හෝ එය නිකුත් කිරීමට හේතු පිළිබඳව හෝ විභාග කිරීම හෝ ඒ පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම හෝ වෙනත් යම් ආකාරයකින් ඒ ගැන ප්‍රශ්න කිරීම හෝ නොකළ යුත්තේ ය.

පළාත් සභාවක බලතල පාර්ලිමේන්තුව විසින් ජනාධිපතිවරයාට පැවරීම

**154ඕ.** (1) පළාත් සභාවක බලතල පාර්ලිමේන්තුව විසින් හෝ පාර්ලිමේන්තුවේ බලය යටතේ ක්‍රියාත්මක කළ යුතු බව 154ඹ වැනි ව්‍යවස්ථාවේ (1) වැනි අනුව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද ප්‍රකාශනයකින් ප්‍රකාශයට පත් කර ඇති අවස්ථාවක -

(අ) ප්‍රඥප්ති සම්පාදනය කිරීමට පළාත් සභාවට ඇති බලය පාර්ලිමේන්තුව විසින් ජනාධිපතිවරයාට පැවරීම සහ

එසේ පවරන ලද බලය සුදුසු යයි ජනාධිපතිවරයා අදහස් කරන කොන්දේසිවලට යටත්ව, තත් කාර්යය සඳහා ජනාධිපතිවරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලබන වෙනත් යම් අධිකාරයකට පවරා දීමට පාර්ලිමේන්තුව විසින් ජනාධිපතිවරයාට බලය දීම;

(ආ) පාර්ලිමේන්තුවේ සභා වාර නොපවත්නා කාලයක් තුළ දී පළාතේ පළාත් සභා අරමුදලින් දරනු ලබන වියදම් සඳහා පාර්ලිමේන්තුවේ අනුමතය අපේක්ෂාවෙන් ජනාධිපතිවරයා විසින් ඒ වියදම් සඳහා බලය දීම නීත්‍යනුකූල වන්නේ ය.

(2) 154ඔ වැනි ව්‍යවස්ථාවේ (1) වැනි අනුව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද ප්‍රකාශනයක් බලපවත්වන අතරතුර දී පාර්ලිමේන්තුව විසින් හෝ ජනාධිපතිවරයා විසින් හෝ (1) වැනි අනුව්‍යවස්ථාවේ (අ) ඡේදයේ සඳහන් වෙනත් අධිකාරයක් විසින් සාදන ලද ප්‍රඥප්තියක්, එම පළාත් සභාව විසින් සංශෝධනය කරනු ලබන තුරු හෝ ඉවත් කරනු ලබන තුරු දිගට ම බලපැවැත්විය යුත්තේ ය.

**154ක.** (1) ශ්‍රී ලංකාවේ හෝ එහි දේශයේ යම් කොටසක මූල්‍ය ස්ථායීභාවයට හෝ මූල්‍ය කීර්තියට තර්ජනයක් වන අවස්ථාවක් පැන නැඟී ඇති බවට ජනාධිපතිවරයා සෑහීමකට පත් වුවහොත්, ඔහු විසින් ප්‍රකාශනයක් මගින් ඒ බවට වූ ප්‍රකාශයක් කළ හැක්කේ ය. මූල්‍ය ස්ථායීභාවය

(2) (1) වැනි අනුව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද ප්‍රකාශනයක්-

(අ) ඊට පසුව කරන ලද ප්‍රකාශනයක් මගින් ප්‍රත්‍යාදිෂ්ට කිරීම හෝ වෙනස් කිරීම හෝ කළ හැක්කේ ය ;

(ආ) පාර්ලිමේන්තුව ඉදිරියේ තැබිය යුත්තේ ය ;

(ඇ) මාස දෙකක කාල සීමාවක් ඉකුත් වීමට පෙර පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මගින් අනුමත කරනු ලැබුවහොත් මිස, එකී මාස දෙකක් වූ කාල සීමාව ඉකුත් වීමේ දී බලාත්මක වීම අවසන් වන්නේ යඃ

එසේ වුව ද, ප්‍රකාශනය පාර්ලිමේන්තුව විසුරුවා හැර තිබෙන කාලයක කරනු ලැබුවහොත් හෝ (ඇ) ඡේදයේ සඳහන් මාස දෙකක කාල සීමාව ඇතුළත පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබූ නමුත් එම කාල සීමාව ඉකුත් වීමට පෙර එම ප්‍රකාශනය සම්බන්ධයෙන් යෝජනා සම්මතයක් පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු නොලැබුවහොත් පාර්ලිමේන්තුව ඊළඟට සංස්ථාපනය වී ප්‍රථම වරට රැස්වන දිනයේ සිට දින තිහක් වූ කාල සීමාවක් ඉකුත් වීමට පෙර එම ප්‍රකාශනය අනුමත කරන යෝජනා සම්මතයක් පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබුවහොත් මිස, එකී දවස් තිහක් වූ කාලසීමාව ඉකුත් වූ විට, එකී ප්‍රකාශයේ බලපෑම අවසන් වන්නේ ය.

(3) (1) වැනි අනුව්‍යවස්ථාවේ සඳහන් කර ඇති යම් ප්‍රකාශනයක් ක්‍රියාත්මකව පවතින කාල සීමාව ඇතුළත, විධානවල සඳහන් කරනු ලැබෙන අන්දමේ නිසි මූල්‍ය ප්‍රතිපත්ති අනුගමනය කරන ලෙසට ද තත් කාර්යය සඳහා ප්‍රමාණවත් යයි ජනාධිපතිවරයා විසින් අදහස් කරනු ලබන වෙනත් ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ද යම් පළාතක ආණ්ඩුකාරවරයකුට ජනාධිපතිවරයා විසින් විධාන නිකුත් කළ හැක්කේ ය.

(4) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කුමක් සඳහන්ව තිබුණ ද එවැනි යම් විධානයකට -

(අ) පළාතක කටයුතු සම්බන්ධයෙන් සේවයේ යෙදී සිටින සියලුම තැනැත්තන්ගේ හෝ යම් පන්තියකට අයත් තැනැත්තන්ගේ වැටුප් සහ දීමනා අඩු කිරීමට නියම කෙරෙන විධිවිධානයක් ද ;

(ආ) පළාත් සභා අරමුදලකට හෝ එම අරමුදලෙන් ගෙවීම සඳහා විධිවිධාන සැලැස්වෙන සියලු ප්‍රඥප්ති පළාත් සභාව විසින් සම්මත කරනු ලැබීමෙන් පසුව, ඒ ප්‍රඥප්ති ජනාධිපතිවරයා විසින් සලකා බැලීම සඳහා වෙන් කර තැබිය යුතු බව නියම කෙරෙන විධිවිධානයක් ද,

ඇතුළත් විය හැක්කේ ය.

මහාධිකරණය

**154ග.** (1) මේ පරිච්ඡේදය බලපැවැත්වීම ආරම්භ වන දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි, එක් එක් පළාතට මහාධිකරණයක් තිබිය යුත්තේ ය. ඒ එක් එක් මහාධිකරණය අදාළ පළාතේ මහාධිකරණය ලෙස නම් කරනු ලැබිය යුත්තේ ය.

(2) අග්‍ර විනිශ්චයකාරවරයා විසින් ඒ එක් එක් මහාධිකරණයට අවශ්‍ය විනිශ්චයකාරවරුන් සංඛ්‍යාවක්, ශ්‍රී ලංකාවේ මහාධිකරණයේ විනිශ්චයකාරවරුන් අතුරෙන් නම් කළ යුත්තේ ය. ඒ සෑම විනිශ්චකාරවරයෙකු ම අග්‍ර විනිශ්චයකාරවරයා විසින් මාරු කරනු ලැබිය හැක්කේ ය.

(3) (අ) පළාත් ඇතුළත සිදු කරන වරදවල් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ මහාධිකරණයේ මුල් අපරාධ අධිකරණ බලය නීතියට අනුව ක්‍රියාත්මක කිරීම ;

(ආ) 138 වැනි ව්‍යවස්ථාවේ කුමක් සඳහන්ව තිබුණ ද, යම් නීතියකට යටත්ව, එම පළාත ඇතුළත මහේස්ත්‍රාත් අධිකරණ සහ ප්‍රාථමික අධිකරණ විසින් කරන ලද වරදකරු කිරීම්, දණ්ඩන නියමයන් සහ ආඥාවන් සම්බන්ධයෙන් අභියාචන සහ ප්‍රතිශෝධන අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම ;

(ඇ) පාර්ලිමේන්තුව විසින් නීති මගින් විධිවිධාන සලස්වනු ලබන ආකාරයේ වෙනත් අධිකරණ බලය සහ බලතල ක්‍රියාත්මක කිරීම,

ඒ සෑම මහාධිකරණයක් විසින් ම කළ යුත්තේ ය.

(4) එකී සෑම මහාධිකරණයකට ම, නීතියට අනුව -

(අ) පළාත ඇතුළත නීති විරෝධී ලෙස රඳවා තබාගෙන ඇති යම් තැනැත්තන් සම්බන්ධයෙන් හේබියස් කෝපුස් රිට් ආඥා ස්වභාවයේ වූ ආඥා ; සහ

(ආ) පළාත ඇතුළත -

(i) යම් නීතියක්; හෝ

(ii) එම පළාත සඳහා පිහිටුවන ලද පළාත් සභාව විසින් සාදන ලද ප්‍රඥප්තියක් යටතේ බලතල ක්‍රියාත්මක කරන යම් තැනැන්තකුට විරුද්ධව සර්ටියෝරාරී, තහනම්, ප්‍රොසිඩෙන්ඩෝ, මන්ඩාමුස් සහ ක්වෝ වොරන්ටෝ යන රිට් ආඥාවල ස්වභාවයේ වු ආඥා,

පළාත් සභා ලැයිස්තුවේ දක්වා ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් නිකුත් කිරීමට අධිකරණ බලය ඇත්තේ ය.

(5) පළාත ඇතුළත යම් මුල් අවස්ථා අධිකරණයක පරිපාලනය සම්බන්ධයෙන් පරීක්ෂා කර වාර්තා කිරීමේ බලය අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් යම් මහාධිකරණයකට පැවරිය හැක්කේ ය.

(6) (3) (ආ) හෝ (ඇ) ඡේද හෝ (4) වැනි අනුව්‍යවස්ථාව යටතේ හෝ තම අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ ලා එවැනි යම් අධිකරණයක් විසින් කරන ලද අවසාන ආඥාවකින්, නඩු තීන්දුවකින් හෝ දණ්ඩන නියමයකින් අතෘප්තියට පත් යම් තැනැන්තකු විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහ වෙනත් යම් නීතියක විධිවිධානවලට යටත්ව ඊට විරුද්ධව 138 වැනි ව්‍යවස්ථාවට අනුකූලව අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැක්කේ ය.

**පළාත් සභාවල කර්තව්‍ය, බලතල හා ඒවායේ මන්ත්‍රීවරුන් තෝරා පත් කර ගැනීම ආදිය**

**154ච.** පාර්ලිමේන්තුව විසින්, නීති මගින් -

(අ) පළාත් සභාවල මන්ත්‍රීවරුන් තෝරා පත් කර ගැනීම සහ එම සභාවල සාමාජිකත්වය ලැබීම සඳහා සුදුසුකම්;

(ආ) ඒ සෑම සභාවක් ම විසින් කටයුතු කරගෙන යාමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය ;

(ඇ) පළාත් සභාවල මන්ත්‍රීවරුන්ගේ වැටුප් සහ දීමනා ; සහ

(ඈ) මේ පරිච්ඡේදයේ ප්‍රතිපත්ති සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය වෙනත් යම් කාරණයක් සහ මේ පරිච්ඡේදයේ විධිවිධානවලට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා,

සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්විය යුත්තේ ය.

**මුදල් කොමිෂන් සභාව**

**154ජ.** (1) පහත සඳහන් අයගෙන් සමන්විත මුදල් කොමිෂන් සභාවක් විය යුත්තේ ය :-

(අ) ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා ;

(ආ) භාණ්ඩාගාරයේ ලේකම්වරයා ; සහ

[107][ (ඇ) එක් එක් තැනැත්තා මූල්‍ය, නීති, පරිපාලන, ව්‍යාපාර හෝ ශාස්ත්‍රීය ක්ෂේත්‍රවල කැපී පෙණුනු හෝ උසස් නිලතල දැරූ හෝ තැනැත්තන් විය යුතු වූ ද ප්‍රධාන ජන වර්ග තුන නියෝජනය කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන්නා වූ ද වෙනත් සාමාජිකයන් තිදෙනෙක්.]

(2) කලින් මිය ගියහොත්, ඉල්ලා අස් වුවහොත් හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, කොමිෂන් සභාවේ සෑම සාමාජිකයෙකු ම අවුරුදු තුනක කාලයකට ධුරය දරන්නේ ය.

(3) පළාතේ අවශ්‍යතා සපුරාලීමේ කාර්යය සඳහා ප්‍රමාණවත් අරමුදල්, ආණ්ඩුව විසින් කොමිෂන් සභාවේ නිර්දේශ අනුව සහ කොමිෂන් සභාව විමසා වාර්ෂික අයවැය ලේඛනයෙන් වෙන් කර දිය යුත්තේ ය.

(4) (අ) පළාත් සඳහා ආණ්ඩුව විසින් වාර්ෂිකව ප්‍රදානය කරනු ලබන අරමුදල් පළාත් අතර බෙදා දීමේ දී අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති ; සහ

(ආ) පළාත්වල මුදල් කටයුතු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාවට යොමු කරන ලද වෙනත් යම් කාරණයක්,

සම්බන්ධයෙන් ජනාධිපතිවරයාට නිර්දේශ ඉදිරිපත් කිරීම කොමිෂන් සභාවේ කාර්යය වන්නේ ය.

(5) රට තුළ තුල ප්‍රාදේශීය සංවර්ධනයක් අත් කර ගැනීම අරමුණු කර කොමිෂන් සභාව විසින් ඒ ප්‍රතිපත්ති පිළියෙළ කළ යුතු අතර ඒ අනුව -

(අ) එක් එක් පළාතේ ජන සංඛ්‍යාව ;

(ආ) එක් එක් පළාතේ ඒක පුද්ගල ආදායම ;

(ඇ) විවිධ පළාත් අතර ආර්ථික විෂමතා අනුක්‍රමිකව අඩු කිරීමේ අවශ්‍යතාව ; සහ

(ඈ) එක් එක් පළාතේ ඒක පුද්ගල ආදායම සහ පළාත් අතර වැඩි ම ඒක පුද්ගල ආදායම අතර වෙනස අනුක්‍රමිකව අඩු කිරීමේ අවශ්‍යතාව,

සැලකිල්ලට ගත යුත්තේ ය.

107 -දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 37 වැනි වගන්තිය මගින් 154ජ. ව්‍යවස්ථාවේ (1) (ඇ) ඡේදය ඉවත්කොට ඒ වෙනුවට ආදේශ කරන ලදී.

(6) කොමිෂන් සභාව විසින් ස්වකීය කාර්ය පටිපාටිය තීරණය කරනු ලැබිය යුතු අතර, පාර්ලිමේන්තුව විසින් නීති මගින් කොමිෂන් සභාව වෙත පවරනු ලබන බලතල කොමිෂන් සභාවේ කාර්ය ඉටු කිරීමේ දී කොමිෂන් සභාව සතු වන්නේ ය.

(7) මුල්‍ය කොමිෂන් සභාව විසින් මේ ව්‍යවස්ථාව යටතේ කරනු ලබන සෑම නිර්දේශයක් ම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ජනාධිපතිවරයා විසින් කටයුතු සැලැස්විය යුතු අතර, ඒ නිර්දේශ මත ගනු ලැබූ ක්‍රියා කවරේදැයි පාර්ලිමේන්තුවට දැනුම් දිය යුත්තේ ය.

(8) එවැනි අරමුදල්වල ප්‍රමාණවත්භාවයට හෝ කොමිෂන් සභාව විසින් කරන ලද යම් නිර්දේශයකට හෝ සකස් කරන ලද යම් ප්‍රතිපත්තියකට අදාළ යම් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම හෝ කවර ආකාරයකින් වුව ද එවැන්නක් භාර ගැනීම, තීරණය කිරීම හෝ ඒ පිළිබඳව ආඥාවක් කිරීම කවර වුව ද අධිකරණයක් හෝ විනිශ්චය අධිකාරයක් විසින් නොකළ යුත්තේ ය.

**මේ පරිච්ඡේදය යටත් වූ බලතල ක්‍රියාත්මක නොකිරීමට පළාත් සභාවකට හැකියාව සලසන විශේෂ විධිවිධාන.**

**154ට.** (1) නවවන උපලේඛනයේ පළාත් සභා ලැයිස්තුවේ හෝ සමගාමී ලැයිස්තුවේ දක්වා ඇති යම් කාරණයක් හෝ යම් කාරණයකින් කොටසක් සම්බන්ධයෙන් 154උ ව්‍යවස්ථාව යටතේ වූ ස්වකීය බලතල ක්‍රියාත්මක නොකිරීමට, පළාත් සභාවක් විසින්, යෝජනා සම්මතයක් මගින් තීරණය කළ හැක්කේ ය.

(2) පළාත් සභාවක් විසින් (1) වැනි අනුව්‍යවස්ථාව යටතේ යෝජනා සම්මතයක් සම්මත කර ඇත්තා වූ ද, ඒ යෝජනා සම්මතයේ නියමයන් පාර්ලිමේන්තුව විසින් යෝජනා සම්මතයක් මගින් පිළිගෙන ඇත්තා වූ ද, අවස්ථාවක, 154උ ව්‍යවස්ථාව යටතේ ඒ පළාත් සභාවේ බලතල, ඒ යෝජනා සම්මතයේ නිශ්චය කොට දැක්වෙන කාරණය කෙරෙහි ව්‍යාප්ත නොවන සේ සැලකිය යුතු අතර, ඒ පළාත් සභාව පිහිටුවා ඇත්තේ යම් පළාතක් සඳහා ද, ඒ පළාතට අදාළ වන සේ ඒ කාරණය සම්බන්ධයෙන්, 154උ ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව නොව අන්‍යාකාරයෙන්, පාර්ලිමේන්තුව විසින් නීති සාදනු ලැබිය හැක්කේ ය.

**අන්තර්කාලීන පියවර**

**154ඩ.** මේ පරිච්ඡේදයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම හෝ ඒ සඳහා අවශ්‍ය පරිපාලනමය වෙනස්කම් සඳහා හෝ කිසියම් දුෂ්කරතාවක් ඉවත් කිරීමේ කාර්යය සඳහා හෝ ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින් ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනනුකූල නොවන්නා වූ ද, අවශ්‍ය යැයි හෝ යෝග්‍ය යැයි ඔහුට පෙනී යන්නා වූ ද, යම් ක්‍රියා කිරීම හෝ විධාන දීම හෝ කළ හැක්කේ ය. ]

## XVIII වැනි පරිච්ඡේදය

### මහජන ආරක්ෂාව

මහජන ආරක්ෂාව

**155.** (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වන තෙක් බලපැවැත් වූ සංශෝධිත මහජන ආරක්ෂක ආඥාපනත පාර්ලිමේන්තුව විසින් පනවන ලද පනතක් සේ සැලකෙන්නේ ය.

(2) මහජන ආරක්ෂක ආඥාපනත යටතේ හෝ මහජන ආරක්ෂාව පිළිබඳව තත් කාලයේ බලපවත්නා නීතිය යටතේ හෝ හදිසි අවස්ථා නියෝග සෑදීමේ බලයට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන හැර වෙනත් කවර වූ හෝ නීතියක විධිවිධාන යටපත් කිරීමේ, සංශෝධනය කිරීමේ හෝ අත්හිටුවීමේ නෛතික බලය ඇති නියෝග සෑදීමේ බලය ද ඇතුළත් වන්නේ ය.

(3) යම් නීතියක විධිවිධාන යටපත් කිරීමේ, සංශෝධනය කිරීමේ හෝ ඒ විධිවිධාන ක්‍රියාත්මක වීම අත්හිටුවීමේ නෛතික බලය ඇති හදිසි අවස්ථා නියෝග සෑදීමට ජනාධිපතිවරයාට බලය පවරන මහජන ආරක්ෂාවට අදාළ යම් නීතියක විධිවිධාන, ඒ විධිවිධාන ක්‍රියාත්මක කරමින් ඒ නීතිය යටතේ ප්‍රකාශනයක් කරනු ලැබූ විට මිස, ක්‍රියාත්මක නොවිය යුත්තේ ය.

[108][(3අ) නව වැනි උපලේඛනයේ දක්වා ඇති කවර හෝ කාරණයක් සම්බන්ධයෙන් හෝ පළාත් සභාවක් විසින් සාදන ලද ප්‍රඥප්තියක් අතික්‍රමණය කිරීමේ, සංශෝධනය කිරීමේ හෝ ක්‍රියාත්මක වීම අත්හිටුවීමේ ප්‍රතිඵලය ඇත්තා වූ හෝ හදිසි අවස්ථා නියෝග, මහජන ආරක්ෂක ආඥා පනත යටතේ හෝ මහජන ආරක්ෂාවට අදාළව තත් කාලයේ බලපවත්නා නීතිය යටතේ හෝ සෑදීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මීට ඉහතින් ඇති විධිවිධානවල ඇතුළත් කිසිවකින් තහනම් කරන්නාක් සේ නොසැලකිය යුත්තේ ය.]

(4) එවැනි ප්‍රකාශනයක් කරනු ලැබූ විට ඒ බව, මේ ව්‍යවස්ථාවේ අනෙකුත් විධිවිධානවලට යටත්ව, නොපමාව ම පාර්ලිමේන්තුවට දන්වා යැවිය යුත්තේ ය; තවද ඒ අනුව -

(i) ඒ ප්‍රකාශනය නිකුත් කරනු ලැබුවේ පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබීමෙන් පසුව නම්, ඒ ප්‍රකාශනයෙහි පාර්ලිමේන්තුව රැස්වීම සඳහා කලින් දිනයක් නියම කර ඇතොත් මිස, ඒ ප්‍රකාශනයෙන් අනතුරුව එළඹෙන දස වන දිනයෙහි පාර්ලිමේන්තුව රැස්වීම පිණිස කරන කැඳවීමක් සේ ඒ ප්‍රකාශනය ක්‍රියාත්මක වන්නේ ය. පාර්ලිමේන්තුව රැස්වීම සඳහා ඒ ප්‍රකාශනයෙහි යම් දිනයක් නියම කරනු ලබන්නේ නම් ඒ දිනය එකී ප්‍රකාශනය කළ දින සිට දින තුනක් ඉකුත් වූ පසු එළඹෙන දිනයක් විය යුත්තේ ය. තව ද, එසේ කැඳවනු ලැබූ පාර්ලිමේන්තුව ඒ ප්‍රකාශනයේ

108 - දහතුන් වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 5 වැනි වගන්තිය මගින් ඇතුළත් කරන ලදී.

හෝ වැඩිදුරටත් කරනු ලැබූ යම් ප්‍රකාශනයක හෝ කාලය ඉකුත් වීම හෝ ඒ ප්‍රකාශනය හෝ වැඩිදුර ප්‍රකාශනය ප්‍රත්‍යාදිෂ්ට කිරීම නැතහොත් මහ මැතිවරණය නිමවීම යන අවස්ථා දෙකෙන් කලින් එළඹෙන අවස්ථාව තෙක් පවත්වා ගෙන යා යුත්තේ ය. එකී කාලය ඉකුත් වූ විට හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම කරනු ලැබූ විට හෝ මහ මැතිවරණය නිම වූ විට හෝ එසේ කැඳවනු ලැබූ පාර්ලිමේන්තුව විසිරෙන්නේ ය.

(ii) ඒ ප්‍රකාශනය කරනු ලැබූ දිනයේ දී, එදින සිට දින දහයක් තුළ දී අවසන් නොවන පරිදි රැස්වීම් කල් තැබීමක් නිසා හෝ වාර අවසාන කිරීමක් නිසා හෝ පාර්ලිමේන්තුව විසංයුක්තව තිබුණේ නම්, දින දහයක් තුළ දී පාර්ලිමේන්තු රැස්වීම සඳහා ප්‍රකාශනයක් නිකුත් කරනු ලැබිය යුත්තේ ය.

(5) මහජන ආරක්ෂාවට අදාළ යම් නීතියක් යටතේ ප්‍රකාශනයක් කිරීමෙන් ඒ නීතියේ විධිවිධාන ක්‍රියාත්මක කර ඇති අවස්ථාවක, මේ ව්‍යවස්ථාවේ පසුව එළඹෙන විධිවිධානවලට යටත්ව, ඒ ප්‍රකාශනය කළ දින සිට එක් මාසයක කාලයක් ඒ ප්‍රකාශනය ක්‍රියාත්මකව පැවතිය යුත්තේ ය. එහෙත් ඒ කාලය අවසාන වීමට කලින් ඒ ප්‍රකාශනය ප්‍රත්‍යාදිෂ්ට කිරීමට හෝ ඒ කාලය අවසානයේ දී නැතහොත් ඊට පෙර යම් වැඩිදුර ප්‍රකාශනයක් කිරීමට හෝ එකී ක්‍රියාත්මක වීමෙන් හානියක් නොවන්නේ ය.

(6) මේ ව්‍යවස්ථාවේ (3) වැනි අනුව්‍යවස්ථාවේ සඳහන් මහජන ආරක්ෂාවට අදාළ යම් නීතියක යම් විධිවිධාන, ඒ නීතිය යටතේ ප්‍රකාශනයක් කිරීමෙන් ක්‍රියාත්මක කර ඇති අවස්ථාවක, ඒ ප්‍රකාශනය පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයකින් අනුමත කරනු ලැබ ඇත්නම් මිස, ඒ විධිවිධාන ක්‍රියාත්මක කරනු ලැබූ දින සිට දින දහහතරක කාලයකට පසු, ඒ ප්‍රකාශනය නිර්බල විය යුත්තේ යඃ

එසේ වුව ද -

(අ) ඒ ප්‍රකාශනය කරන දිනයේ දී පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබ තිබේ නම්; හෝ

(ආ) මේ ව්‍යවස්ථාවේ (4) වැනි අනුව්‍යවස්ථාවේ (ii) වැනි අනුඡේදයේ සඳහන් පරිදි එවැනි යම් රැස්වීම් කල් තැබීමක් හෝ වාර අවසාන කිරීමක් හෝ නිසා ඒ දිනයේ දී පාර්ලිමේන්තුව විසංයුක්තව තිබේ නම් ; හෝ

(ඇ) මේ ව්‍යවස්ථාවේ (4) වැනි අනුව්‍යවස්ථාවේ (i) වැනි සහ (ii) වැනි අනුඡේදවලින් විධිවිධාන සලස්වා ඇති පරිදි, කැඳවනු ලැබූ විට පාර්ලිමේන්තුව රැස් නොවේ නම්,

පාර්ලිමේන්තුව ඊළඟට රැස් වී කටයුතු කරන දිනයෙහි ඒ රැස්වීමේ දී ඒ ප්‍රකාශනය යෝජනා සම්මතයක් මගින් පාර්ලිමේන්තුව

විසින් අනුමත කරනු ලැබුවහොත් මිස පාර්ලිමේන්තුව ඊළඟට රැස් වී කටයුතු කරන දිනයෙන් පසු දින දහයක් අවසානයේ දී ඒ ප්‍රකාශනය නිර්බල වන්නේ ය.

(7) මහජන ආරක්ෂාවට අදාළ යම් නීතියක විධිවිධාන ක්‍රියාත්මක කරන ලද දිනයේ සිට දින දහහතරක කාලයක් ඇතුළත දී මේ ව්‍යවස්ථාවේ (6) වැනි අනුව්‍යවස්ථාවෙහි සඳහන් ප්‍රකාශනයක් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ විටක හෝ (6) වන අනුව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව එවැනි ප්‍රකාශනයක් නිර්බල වූ විටක, එසේ ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ නැතහොත් නිර්බල වීමේ දින සිට එළඹෙන දින තිහක් ඇතුළත දී කරනු ලබන කිසිම ප්‍රකාශනයක්, එම ප්‍රකාශනය කිරීම පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මගින් අනුමත කරනු ලබන තෙක්, ක්‍රියාත්මක නොවිය යුත්තේ ය.

[109][ (8) ඉවත් කරන ලදී ]

[109][ (9) ඉවත් කරන ලදී ]

[110][ (8) ] මේ ව්‍යවස්ථාවේ (3) වැනි අනුව්‍යවස්ථාවේ සඳහන් අන්දමේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා වූ යම් ප්‍රකාශනයක් පාර්ලිමේන්තුව විසින් අනුමත නොකරනු ලැබුවේ නම්, එසේ අනුමත කරනු ලැබූ වහාම ඒ ප්‍රකාශනයේ වලංගු භාවය සහ නීතියෙහි ලා එහි යම් බලපෑමක් ඇතහොත් එය නතර විය යුතු නමුත් ඒ ප්‍රකාශනය යටතේ නීත්‍යානුකූලව එවකටත් කර තිබුණු කිසිවකට ඉන් හානියක් නොවන්නේ ය.

[110][ (9) ] කැඳවනු ලැබූ විට පාර්ලිමේන්තුව රැස් නොවීමේ හේතුවෙන් ප්‍රකාශනයක් කිරීම පිළිබඳව පාර්ලිමේන්තුවට දැනුම් දීමට හෝ පාර්ලිමේන්තුවේ අනුමතය ලබා ගැනීමට හෝ නොහැකි වන්නේ නම්, ඒ ප්‍රකාශනයේ වලංගු භාවය හෝ ක්‍රියාත්මක වීම හෝ කෙරෙහි [111][ මේ ව්‍යවස්ථාවේ (6) වැනි හෝ (7) වැනි අනුව්‍යවස්ථාවල ඇතුළත්] කිසිවක් බලනොපාන්නේ යඃ

එසේ වුව ද, එවැනි අවස්ථාවක දී, ඉන් පසු හැකිතාක් ඉක්මනින් පාර්ලිමේන්තුව නැවත කැඳවිය යුත්තේ ය.

---

109 - දසවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 2(1) වගන්තිය මගින් ඉවත් කරන ලදී,

110 - දසවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 2(2) වැනි වගන්තිය මගින් මුල් (10) හා (11) අනුව්‍යවස්ථා (8) හා (9) ලෙස නැවත අංක යොදන ලදී,

111 - දසවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 2(3) වැනි වගන්තිය මගින් "මේ ව්‍යවස්ථාවේ (6) වැනි, (7) වැනි හෝ (9) වැනි අනුව්‍යවස්ථාවල ඇතුළත්" යන වචන හා අංක වෙනුවට ආදේශ ලදී,

## [112] [XVIII අ වැනි පරිච්ඡේදය

### ජාතික පොලිස් කොමිෂන් සභාව

**ජාතික පොලිස් කොමිෂන් සභාවේ සංයුතිය**

**155අ.** [113][ (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් හත් දෙනෙකුගෙන් සමන්විත වන (මේ පරිච්ඡේදයේ "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික පොලිස් කොමිෂන් සභාවක් තිබිය යුත්තේ ය. එකී සාමාජිකයන් අතුරෙන් යටත් පිරිසෙයින් එක් සාමාජිකයෙක් නියෝජ්‍ය පොලිස්පතිවරයකු වශයෙන් හෝ ඊට ඉහළ ධුරයක් දැරූ, විශ්‍රාමලත් පොලිස් නිලධරයකු විය යුත්තේ ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් ස්වකීය නිර්දේශ ඉදිරිපත් කිරීමේ දී රාජ්‍ය සේවා කොමිෂන් සභාව විමසනු ලැබිය හැක්කේ ය. ජනාධිපතිවරයා විසින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත, එකී සාමාජිකයන්ගෙන් එක් සාමාජිකයකු කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස පත්කරනු ලැබිය යුත්තේ ය. ]

(2) යම් තැනැත්තකු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු නම් හෝ එවැන්නකු බවට පත් වුවහොත් හෝ එවැනි තැනැත්තකු කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස පත් කරනු නොලැබිය යුතු අතර සාමාජිකයකු වශයෙන් තවදුරටත් කටයුතු නොකළ යුත්තේ ය.

(3) කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීමට පෙරාතුව ම රජයේ නිලධරයකු හෝ අධිකරණ නිලධරයකු හෝ වශයෙන් රජයේ සේවයේ නියුක්තව සිටි සෑම තැනැත්තකු ම එකී පත් කිරීම බලාත්මක වූ විට, තමා දරමින් සිටි ධුරය අත්හැරිය යුතු අතර, රජයේ නිලධරයකු හෝ අධිකරණ නිලධරයකු හෝ වශයෙන් තවදුරටත් පත් කරනු ලැබීමට ඔහු සුදුස්සෙක් නොවිය යුත්තේ යඃ

එසේ වුව ද, එවැනි යම් තැනැත්තකු කොමිෂන් සභාවේ සාමාජිකයකුව සිටීම නතර වන තෙක් හෝ, අවස්ථාවෝචිත පරිදි, ඔහු රජයේ නිලධරයකු හෝ අධිකරණ නිලධරයකු හෝ වශයෙන් සිටි නම් ඔහු විශ්‍රාම ගත යුතු වන්නා වූ වයසට කොමිෂන් සභාවේ සාමාජිකයකුව සිටිය දී ඔහු එළඹුන හොත් හෝ ඒ සේවයට අදාළ විශ්‍රාම වැටුප්, පාරිශ්‍රමික සහ වෙනත් දීමනා ගෙවීමට සම්බන්ධ යම් විධිවිධානයක කාර්ය සඳහා, ඔහු රජයේ නිලධරයකු හෝ අධිකරණ නිලධරයකු ලෙසත් රජයේ සේවයේ විශ්‍රාම වැටුප් සහිත ධුරයක් දරන ලෙසත් සලකනු ලැබිය යුත්තේ ය.

---

112 - දහහත් වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 20 වැනි වගන්තිය මගින් XVIIIඅ පරිච්ඡේදය (ව්‍යවස්ථාව 155අ සිට 155ක) දක්වා ඇතුළත් කරන ලදී.

113 - දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 38(1) වැනි වගන්තිය මගින් මුල් 155අ. (1) වන අනුව්‍යවස්ථාව ඉවත්කොට ඒ වෙනුවට ආදේශ කරන ලදී.

[114] [(4) කොමිෂන් සභාවේ සෑම සාමාජිකයකු ම, මේ ව්‍යවස්ථාවේ (2) වන අනු ව්‍යවස්ථාව යටතේ යම් නුසුදුසුකමකට පත්වුවහොත් හෝ ජනාධිපතිවරයා අමතා යවන ලිපියක් මගින් තම ධූරයෙන් කලින් ඉල්ලා අස් වුවහොත් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතය ඇතිව ජනාධිපතිවරයා විසින් හේතු දක්වා ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ චරිත දූෂණ වරදක් සම්බන්ධයෙන් අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබුවහොත් හෝ ඔහු විෂයෙහි සිවිල් අශක්නුතා නියම කිරීමේ යෝජනා සම්මතයක් 81 වන ව්‍යවස්ථාවට අනුකූලව සම්මත කරනු ලැබ ඇත්නම් හෝ මේ ව්‍යවස්ථාවේ (6) වන අනුව්‍යවස්ථාව යටතේ ඔහු සිය ධූරය හැර ගියාක් සේ සලකනු ලබන්නේ නම් හෝ මිස, එවැනි සාමාජිකයකු වශයෙන් ඔහු පත්කරනු ලැබූ දින සිට අවුරුදු තුනක කාලයක් ධූරය දැරිය යුත්තේ ය. ]

(5) කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස නැවත පත් කරනු ලැබීමට කොමිෂන් සභාවේ සාමාජිකයකු සුදුස්සකු විය යුතු අතර, සාමාජිකයකු වශයෙන් ඔහුගේ ධුර කාලය අවසන් වීමෙන් පසු රජයේ නිලධරයකු වශයෙන් හෝ අධිකරණ නිලධරයකු වශයෙන් පත් කරනු ලැබීමට ඔහු සුදුස්සෙක් නොවිය යුත්තේ ය. වාර දෙකකට වඩා වැඩි වාර ගණනක් කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස ධූරය දැරීමට කිසිදු සාමාජිකයෙක් සුදුස්සකු නොවිය යුත්තේ ය.

(6) කොමිෂන් සභාවේ පූර්ව අනුමතය ලබා නොගෙන කොමිෂන් සභාවේ අනුක්‍රමික රැස්වීම් තුනකට කොමිෂන් සභාවේ සභාපතිවරයා හෝ සාමාජිකයකු හෝ නොපැමිණි අවස්ථාවක දී ඒ රැස්වීම් අතුරෙන් තුන්වන රැස්වීමේ දින සිට ඔහු සිය ධුරය හැර ගියාක් සේ සලකනු ලැබිය යුතු අතර, කොමිෂන් සභාවේ සභාපතිවරයා හෝ සාමාජිකයකු හෝ වශයෙන් නැවත පත් කරනු ලැබීමට ඔහු සුදුස්සෙක් නොවිය යුත්තේ ය.

(7) පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලබන දීමනා කොමිෂන් සභාවේ සභාපතිවරයාට සහ සාමාජිකයන්ට ගෙවිය යුත්තේ ය. එම දීමනා ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුතු අතර සභාපතිවරයාගේ හෝ සාමාජිකයන්ගේ ධුර කාලය තුළ දී ඒ දීමනා අඩු නොකළ යුත්තේ ය.

(8) දණ්ඩ නීති සංග්‍රහයේ IX වැනි පරිච්ඡේදයේ අර්ථානුකූලව සහ කාර්ය සඳහා කොමිෂන් සභාවේ සභාපතිවරයා සහ සාමාජිකයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුත්තේ ය.

**කොමිෂන් සභාවේ රැස්වීම්**

**155ආ.** (1) කොමිෂන් සභාවේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් හතර දෙනෙකු විය යුත්තේ ය.

(2) කොමිෂන් සභාවේ සියලුම රැස්වීම්වල මුලසුන සභාපතිවරයා විසින් දැරිය යුත්තේ ය. ඔහු පැමිණ නොසිටි විටක දී ඒ රැස්වීමට

114 - දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 38(2) වැනි වගන්තිය මගින් මුල් 155ඇ. (4) වන අනුව්‍යවස්ථාව ඉවත්කොට ඒ වෙනුවට ආදේශ කරන ලදී.

පැමිණ සිටින සාමාජිකයන් විසින් තමන් අතුරෙන් කෙනකු ඒ රැස්වීමේ මුලසුන දැරීමට තෝරාපත් කර ගනු ලැබිය යුත්තේ ය.

(3) කොමිෂන් සභාවේ තීරණ, ඒ තීරණය ගනු ලබන රැස්වීමට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් ගනු ලැබිය යුත්තේ ය. ඡන්දය සම සමව ලැබුණු අවස්ථාවක දී මුලසුන දරන තැනැත්තාට තීරණ ඡන්දයක් තිබිය යුත්තේ ය.

(4) කොමිෂන් සභාවේ සාමාජිකත්වයේ යම් පුරප්පාඩුවක් තිබුණේ වුව ද, ඒ නොතකා ක්‍රියා කිරීමේ බලය කොමිෂන් සභාවට ඇති අතර, එවැනි පුරප්පාඩුවක් තිබීම හෝ සභාපතිවරයා හෝ සාමාජිකයකු හෝ පත් කිරීමේ යම් දෝෂයක් තිබීම හේතු කොට ගෙන පමණක් කොමිෂන් සභාවේ යම් ක්‍රියාවක්, කාර්ය පටිපාටියක් හෝ තීරණයක් නිර්බල නොවන්නේ ය; නිර්බල වන්නේ යැයි නොසැලකිය යුත්තේ ය.

[115][ (5) පොලිස්පතිවරයාට අදාළ යම් කාරණයක් සාකච්ඡා කිරීම සඳහා යෝජිත යම් රැස්වීමක් හැර, කොමිෂන් සභාවේ කවර වූ හෝ රැස්වීමකට පැමිණීමටද සහභාගීවීමට ද පොලිස්පතිවරයාට හිමිකම ඇත්තේ ය. එකී රැස්වීම්වලදී ඡන්දය භාවිතා කිරීමට ඔහුට හිමිකම නොමැත්තේ ය. ]

**155ඇ.** කොමිෂන් සභාව වෙත, එහි යම් කමිටුවක් වෙත හෝ සාමාජිකයකු වෙත මේ පරිච්ඡේදය යටතේ හෝ වෙනත් යම් නීතියක් යටතේ හෝ පවරා ඇති හෝ පනවා ඇති බලතල හෝ කාර්ය කිසිවක් ප්‍රකාර, කොමිෂන් සභාව විසින්, එවැනි යම් කමිටුවක් විසින් හෝ කොමිෂන් සභාවේ නැතහොත් ඒ කමිටුවේ යම් සාමාජිකයකු විසින් කරනු ලැබූ යම් නියමයක් හෝ ගනු ලැබූ යම් තීරණයක් පරීක්ෂා කිරීමට හෝ ඒ සම්බන්ධයෙන් ප්‍රකාශයක් කිරීමට හෝ කවර වුව ද ආකාරයකින් ඒ ගැන ප්‍රශ්න කිරීමට, [116][ 126 වැනි ව්‍යවස්ථාවෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත පවරා දී ඇති බලයට යටත්ව සහ 155ඔ ව්‍යවස්ථා මගින් පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය වෙත ප්‍රදානය කොට ඇති බලතලවලට යටත්ව ], කිසිදු අධිකරණයකට හෝ විනිශ්චයාධිකාරයකට බලය හෝ අධිකරණ බලය නොතිබිය යුත්තේ ය. **නීති කෘත්‍යවලින් මුක්තිය**

**155ඈ.** කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන නියමයන් හා කොන්දේසි මත කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන ලේකම්වරයකු සහ වෙනත් නිලධරයන් කොමිෂන් සභාව සඳහා සිටිය යුත්තේ ය. **කොමිෂන් සභාවේ ලේකම්වරයා**

**155ඉ.** කොමිෂන් සභාවේ පිරිවැය සහ වියදම් ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුත්තේ ය. **පිරිවැය සහ වියදම**

115 - දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 39 වැනි වගන්තිය මගින් නව 155ආ.(5) වන අනුව්‍යවස්ථාව ඇතුළත් කරන ලදී.

116 - දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 40 වැනි වගන්තිය මගින් 155ඇ. වන අනුව්‍යවස්ථාවේ "126 වැනි ව්‍යවස්ථාවේ (1) වැනි ඡේදයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත පවරා දී ඇති අධිකරණ බලයට යටත්ව" යන වචන වෙනුවට ආදේශ කරන ලදී.

**කොමිෂන් සභාවේ කටයුතුවලට අයුතු ලෙස මැදිහත් වීම**

155ඊ. (1) තමන්ගේ නීත්‍යානුකූල කාර්යය ඉටු කිරීමේ දී හැර, [117][ "කොමිෂන් සභාවේ හෝ එහි යම් කමිටුවක හෝ මේ පරිච්ඡේදය යටතේ කොමිෂන් සභාව විසින් එසේ බලය පවරනු ලැබූ යම් පොලිස් නිලධරයකුගේ හෝ යම් තීරණයකට කෙලින්ම හෝ වක්‍රාකාරයෙන් තමා විසින් ම හෝ වෙනත් තැනැත්තකු විසින් හෝ වෙනත් යම් තැනැත්තකු සමග කවර වුව ද ආකාරයකින් බලපෑම් කරන හෝ බලපෑම් කිරීමට තැත් කරන හෝ අයුතු ලෙස මැදිහත්වන හෝ කොමිෂන් සභාවේ හෝ එහි යම් කමිටුවක සාමාජිකයකු වෙත හෝ එසේ බලය පවරන ලද යම් පොලිස් නිලධරයකු වෙත එසේ බලපෑම් කරන හෝ කිරීමට තැත් කරන] සෑම තැනැත්තකු ම වරදකට වරදකරු වන අතර, ඔහු එසේ වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් ලක්ෂයක දඩයකට හෝ අවුරුදු හතක් නොඉක්මවන කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය සහ ඒ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුත්තේ ය.

(2) (1) වන ඡේදයේ සඳහන් යම් කරුණක් අසා තීරණය කිරීමේ අධිකරණ බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහාධිකරණයකට තිබිය යුත්තේ ය.

[118] [ [119][ 155ඊඊ. ව්‍යවස්ථාව ඉවත් කරන ලදී. ]

**කොමිෂන් සභාව විසින් රීති සෑදිය යුතු බව**

**155ඊඊඊ.** කොමිෂන් සභාව විසින් රීති සෑදීම නියමිත වන්නා වූ යම් කාරණා සම්බන්ධයෙන්, කලින් කල රීති සෑදීම කළ යුත්තේ ය. එකී සෑම රීතියක් ම ගැසට් පත්‍රයේ පළ කළ යුත්තේ ය.]

**කොමිෂන් සභාවේ බලතල.**

[120][ 155උ. (1) (අ) පොලිස්පතිවරයා හැර, පොලිස් නිලධරයන් පත් කිරීමේ, උසස් කිරීමේ, මාරු කිරීමේ, ඔවුන් විෂයෙහි විනය පාලනය පවත්වාගෙන යාමේ සහ ඔවුන් සේවයෙන් පහ කිරීමේ බලය කොමිෂන් සභාව වෙත පැවරිය යුත්තේ ය. උසස් කිරීම්, මාරුකිරීම්, විනය පාලනය සහ සේවයෙන් පහ කිරීම් පිළිබඳ කොමිෂන් සභාවේ බලතල පොලිස්පතිවරයා විමසා කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුත්තේ ය.

(ආ) මේ ව්‍යවස්ථාව යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVIIඅ පරිච්ඡේදය යටතේ පළාත් පොලිස් කොමිෂන් සභා පිහිටුවනු ලබන පරිදි සහ පිහිටුවනු ලබන විට ඒ පළාත් පොලිස් කොමිෂන් සභා වෙත පවරනු ලබන බලතල සහ කාර්ය හීන කිරීමක්, කොමිෂන් සභාව විසින් නොකළ යුත්තේ ය.

(2) මහජනයාගෙන් ලැබෙන පැමිණිලි සහ අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් පොලිස් නිලධරයකුට හෝ පොලිස් සේවයට

---

117- දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 41 වැනි වගන්තිය මගින් "කොමිෂන් සභාවේ හෝ එහි යම් කමිටුවක හෝ යම් තීරණයකට" යන වචනවල සිට "එසේ බලපෑම් කරන හෝ කිරීමට තැත්කරන" යන වචන දක්වා වූ සියලු වචන වෙනුවට ආදේශ කරන ලදී.

118- දහඅට වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 27 වැනි වගන්තිය මගින් 155ඊඊ සහ 155 ඊඊඊ ව්‍යවස්ථා ඇතුළත් කරන ලදී.

119- දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 42 වැනි වගන්තිය මගින් තිබුණු 155ඊඊ ව්‍යවස්ථාව ඉවත් කරන ලදී.

120- දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 43 වැනි වගන්තිය මගින් 155ඊඊඊ වන අනුව්‍යවස්ථාවේ අවසානයට නව 155උ. 155ඌ, 155එ, 155ඒ සහ 155ඔ නව ව්‍යවස්ථා ඇතුළත් කරන ලදී.

හෝ විරුද්ධව ඉදිරිපත් කරනු ලබන පැමිණිලි භාර ගැනීමේ හා ඒවා විමර්ශනය කිරීමේ කාර්ය පටිපාටි කොමිෂන් සභාව විසින් පිහිටුවිය යුතු අතර, පාර්ලිමේන්තුව විසින් පනවන ලද යම් නීතියක් මගින් සලසා ඇති පරිදි සහන සැලසිය යුත්තේ ය. කොමිෂන් සභාව විසින් සහන සැලසීමේ දී පොලිස්පතිවරයාට එය විසින් ඒ බව වහාම දැනුම් දිය යුත්තේ ය.

(3) කොමිෂන් සභාව විසින්, පොලිස්පතිවරයා විමසා -

(අ) තත් කාර්යය සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම් ප්‍රතිපත්තියකට යටත්ව පොලිස් නිලධරයන් බඳවා ගැනීම, උසස් කිරීම සහ ස්ථාන මාරුකිරීම පිළිබඳ පටිපාටි සකස් කිරීම;

(ආ) පුහුණුව සහ පොලිස් සේවයේ කාර්යක්ෂමතාව හා ස්වාධීනත්වය වැඩි දියුණු කිරීම;

(ඇ) ජාතික අංශයේ සහ පළාත් අංශයේ භාවිතය සඳහා අවශ්‍ය අවි ආයුධ, වෙඩි ද්‍රව්‍ය සහ වෙනත් උපකරණවල ස්වභාවය සහ වර්ගය; සහ

(ඈ) චර්යා සංග්‍රහ සහ විනය පිළිබඳ පටිපාටි,

ඇතුළුව පොලිස් නිලධරයන් සම්බන්ධයෙන් වූ සියලු කාරණා සඳහා සැලසීම ද නිශ්චය කිරීම ද කරනු ලැබිය යුත්තේ ය.

(4) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවන උපලේඛනයේ 1 වන ලැයිස්තුවේ 1 වන පරිශිෂ්ටය යටතේ කොමිෂන් සභාව වෙත පවරා ඇති සියලු ම බලතල ක්‍රියාත්මක කිරීම හා සියලු කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීම කොමිෂන් සභාව විසින් කරනු ලැබිය යුත්තේ ය.

**කොමිෂන් සභාවේ ඇතැම් බලතල කමිටුවකට පැවරීම.**

**155උ෧.** (1) කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන ශ්‍රේණිවල පොලිස් නිලධරයන් පත්කිරීමේ, උසස් කිරීමේ, ස්ථාන මාරු කිරීමේ සහ ඔවුන් විෂයෙහි විනය පාලනය කිරීමේ සහ ඔවුන් සේවයෙන් පහ කිරීමේ ලා කොමිෂන් සභාව සතු බලතල කොමිෂන් සභාව විසින් නම් කරනු ලැබිය යුතු (කොමිෂන් සභාවේ සාමාජිකයන්ගෙන් සමන්විත නොවන) කමිටුවක් වෙත, කොමිෂන් සභාව විසින් පවරනු ලැබිය හැක්කේ ය.

(2) එවැනි යම් කමිටුවක් පත් කිරීම කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ පළ කරවනු ලැබිය යුත්තේ ය.

(3) (1) වන අනු ව්‍යවස්ථාව යටතේ නම් කරනු ලබන කමිටුවක රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සහ ඒ රැස්වීම්වල ගණපූරණය, කොමිෂන් සභාව විසින් සාදනු ලබන රීතිවලට අනුකූලව විය යුත්තේ ය. කොමිෂන් සභාව විසින් ඒ රීති ගැසට් පත්‍රයේ පළ කරවනු ලැබිය යුත්තේ ය.

**කොමිෂන් සභාව විසින් ඇතැම් කාර්ය පැවරීම.**

**155එ.** (1) යම් ශ්‍රේණියක පොලිස් නිලධරයන් පත් කිරීම, ඔවුන් උසස් කිරීම, ස්ථාන මාරු කිරීම, ඔවුන් විෂයෙහි විනය පාලනය කිරීම සහ සේවයෙන් පහකිරීම සඳහා කොමිෂන් සභාව සතු බලතල, කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන කොන්දේසිවලට සහ කාර්ය පටිපාටියට යටත්ව, පොලිස්පතිවරයා වෙත හෝ පොලිස්පතිවරයා විමසා යම් පොලිස් නිලධරයකු වෙත කොමිෂන් සභාව විසින් පවරනු ලැබිය හැක්කේ ය.

(2) එවැනි යම් බලතල පැවරීමක්, කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ පළ කිරීමට සැලැස්විය යුත්තේ ය.

**අභියාචන කිරීමේ අයිතිය.**

**155ඒ.** (1) කවර හෝ කාණ්ඩයකට අයත් පොලිස් නිලධරයන්ගේ උසස්වීමක් හෝ ස්ථාන මාරුවක් හෝ ඔවුන් සම්බන්ධ යම් විනය කාරණයක් හෝ ඔහු සේවයෙන් පහ කිරීමක් හෝ පිළිබඳව කොමිෂන් සභාවට ඇති බලතල කොමිෂන් සභාව විසින් 155එ ව්‍යවස්ථාව යටතේ යම් පොලිස් නිලධරයකුට පවරා ඇති අවස්ථාවක එකී පොලිස් නිලධරයා විසින් එසේ තමන්ට පවරනු ලැබූ බලතල ක්‍රියාත්මක කිරීමේදී දෙන ලද යම් නියමයකට විරුද්ධව කොමිෂන් සභාවට අභියාචනය කිරීමට පොලිස්පතිවරයාට අයිතිය ඇත්තේ ය.

(2) පොලිස්පතිවරයා හෝ 155ඍ සහ 155එ ව්‍යවස්ථාවල සඳහන් කමිටුවක් හෝ පොලිස් නිලධරයකු හෝ විසින් තමාගේ යම් උසස් කිරීමක්,ස්ථාන මාරුවක් හෝ සේවයෙන් පහකිරීමක් සම්බන්ධයෙන් කරන ලද යම් නියමයකින් අතෘප්තියට පත් පොලිස් නිලධරයකු විසින්, අභියාචනයක් කිරීම සහ අභියාචනයක් විභාග කිරීම සඳහා නියම කරනු ලැබ ඇති පටිපාටි ද කාලය ද විධිමත් කරමින් කොමිෂන් සභාව විසින් කලින් කල සාදනු ලබන රීතිවලට අනුකූලව, එකී නියමයට විරුද්ධව කොමිෂන් සභාවට අභියාචනය කරනු ලැබිය හැක්කේ ය.

(3) (1) වන හෝ (2) වන අනු ව්‍යවස්ථා යටතේ කරන ලද අභියාචනයක් මත දෙන ලද එකී නියම වෙනස් කිරීමේ, සුළු වශයෙන් වෙනස් කිරීමේ, ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ හෝ ස්ථිර කිරීමේ හෝ ඒ සම්බන්ධයෙන් විධාන නිකුත් කිරීමේ හෝ තවදුරටත්වූ හෝ වෙනත් හෝ පරීක්ෂණයක් පැවැත්වීමට නියම කිරීමේ බලය කොමිෂන් සභාවට ඇත්තේ ය.

(4) මේ ව්‍යවස්ථාවේ (2) වන අනු ව්‍යවස්ථාව යටතේ කොමිෂන් සභාව විසින් කලින් කල සාදනු ලබන රීති ගැසට් පත්‍රයේ පළ කරවනු ලැබිය යුත්තේ ය.

(5) අවස්ථාවෝචිත පරිදි මේ පරිච්ඡේදයේ 155ඍ හෝ 155එ ව්‍යවස්ථා යටතේ කමිටුවක් වෙත හෝ පොලිස්පතිවරයා වෙත හෝ පොලිස් නිලධරයකු වෙත බලතල පවරා දෙනු ලැබූ විට කොමිෂන් සභාව විසින් එසේ පවරන ලද බලතල බලාත්මකව පවතිද්දී, ඒ බලතල පැවරීම කරන ලද්දේ යම් ශ්‍රේණියක පොලිස් නිලධරයන්

සම්බන්ධයෙන් ද ඒ ශ්‍රේණියේ පොලිස් නිලධරයන් සම්බන්ධයෙන්, මෙහි ඉහත විධිවිධාන සලස්වා ඇති පරිදි අභියාචනය කිරීමේ අයිතියට යටත්ව, කොමිෂන් සභාව විසින් ඒ බලතල පාවිච්චි කිරීම හෝ ඒ කාර්ය හෝ කර්තව්‍ය ඉටුකිරීම නොකරනු ලැබිය යුත්තේ ය.

**පරිපාලන අභියාචන විනිශ්චයාධිකාරය වෙත අභියාචන කිරීම**

**155ඔ.** තමන්ගේ උසස්වීමක් හෝ ස්ථාන මාරුවක් හෝ තමා සම්බන්ධයෙන් වූ විනය පිළිබඳ කාරණයකදී හෝ සේවයෙන් පහ කිරීමක් සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් කරන ලද නියමයකින් අතෘප්තියට පත් යම් පොලිස් නිලධරයකු විසින් ඊට විරුද්ධ අභියාචනයක්, 59 වන ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද පරිපාලන අභියාචන විනිශ්චයාධිකාරය වෙත ඉදිරිපත් කරනු ලැබිය හැක්කේ ය. කොමිෂන් සභාව විසින් කරන ලද යම් නියමයක් හෝ තීරණයක් වෙනස් කිරීමේ, සුළු වශයෙන් වෙනස් කිරීමේ හෝ ප්‍රත්‍යදිෂ්ට කිරීමේ බලය ඒ විනිශ්චයාධිකාරයට ඇත්තේ ය. ]

**දැනට බලපවත්නා රීති සහ නියෝග ශේෂ කිරීම**

[121][ **155ඕ.** කොමිෂන් සභාව විසින් අන්‍යාකාරයකින් විධිවිධාන සලස්වනු ලබන තෙක්, මේ ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීමේ දිනයේ දී බලාත්මකව පවතින සියලු රීති, නියෝග සහ කාර්ය පටිපාටි ක්‍රියාත්මකව සහ බලාත්මකව පැවතිය යුත්තේ ය. ]

**කොමිෂන් සභාව පාර්ලිමේන්තුවට වගකිව යුතු බව**

**155ක.** බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග මගින් සලස්වා ඇති විධිවිධාන ප්‍රකාර කොමිෂන් සභාව පාර්ලිමේන්තුවට වගකිව යුතු සහ උත්තර දිය යුතු වන අතර, එක් එක් ලිත් වර්ෂයේ කොමිෂන් සභාවේ කටයුතු සම්බන්ධයෙන් වාර්තාවක් ඒ ඒ වර්ෂයේ දී කොමිෂන් සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුත්තේ ය.]

121- දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 44 වැනි වගන්තිය මගින් තිබුණු 155ඕ ව්‍යවස්ථාව වෙනුවට ආදේශ කරන ලදී

## XIX වැනි පරිච්ඡේදය

### පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා

**පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා**

**156.** (1) පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) ධුරය ඇති කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් නීතියෙන් විධිවිධාන සැලැස්විය යුත්තේ ය. රජයේ නිලධරයන් විසින් සහ රාජ්‍ය සහ සංස්ථාවල, පළාත් පාලන ආයතනවල හා එවැනි වෙනත් ආයතනවල නිලධරයන් විසින් සිදු කරනු ලබන මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම සහ වෙනත් අසාධාරණ ක්‍රියා ගැන කරනු ලබන පැමිණිලි හෝ චෝදනා ඒ නීතියේ විධිවිධානවලට අනුකූලව හා යටත්ව පරීක්ෂා කර බලා වාර්තා කිරීමේ කාර්යභාරය පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා වෙත පැවරෙන්නේ ය.

[122][ (2) පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා (ඔම්බුඩ්ස්මන්) ජනාධිපතිවරයා විසින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව පත්කරනු ලැබිය යුත්තේ ය. එම කොමසාරිස්වරයා යථා පැවැත්මෙන් සිටින තාක් ස්වකීය ධූරය දැරිය යුත්තේ ය. ]

(3) පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයාගේ වැටුප පාර්ලිමේන්තුව විසින් නිශ්චය කළ යුත්තේ ය. එසේ නිශ්චය කරන ලද වැටුප ඔහුගේ ධුර කාලය තුළ අඩු නොකළ යුත්තේ ය.

(4) පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා -

(අ) මිය ගියහොත් එවිට ;

(ආ) ජනාධිපතිවරයා වෙත යවන ලිපියක් මගින් ඉල්ලා අස් වුවහොත් එවිට ;

(ඇ) නීතියෙන් නියමිත වයස සම්පූර්ණ කළ විට ;

(ඈ) රෝගාතුරවීම නිසා හෝ ශාරීරික නැතහොත් මානසික දුර්වලතාවක් නිසා හෝ ජනාධිපතිවරයා විසින් ඉවත් කරනු ලැබුවහොත් එවිට ; හෝ

(ඉ) පාර්ලිමේන්තුව විසින් සම්මත කොට ඉදිරිපත් කරන යෝජනාවක් අනුව ජනාධිපතිවරයා විසින් ඉවත් කරනු ලැබුවහොත් එවිට,

පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් ධුරය හිස් වන්නේ ය.

---

122- දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 45(1) වැනි වගන්තිය මගින් මුල් 156 (2) අනුව්‍යවස්ථාව වෙනුවට ආදේශ කරන ලදී

[123][ (5) පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා (ඔම්බුඩ්ස්මන්) ට සිය ධූරයෙහි කාර්ය හා කර්තව්‍ය ඉටුකිරීමට නොහැකි වූ කවර හෝ විටෙක එකී පාර්ලිමේන්තු කොමසාරිස්වරයා වෙනුවෙන් වැඩබැලීමට තැනැත්තකු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව, ජනාධිපතිවරයා විසින් පත්කළ යුත්තේ ය. ]

123- දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 45(2) වැනි වගන්තිය මගින් මුල් 156(5) අනුව්‍යවස්ථාව වෙනුවට ආදේශ කරන ලදී

## [124] [ XIXඅ වැනි පරිච්ඡේදය

## අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීම සඳහා වූ කොමිෂන් සභාව

**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීම සඳහා වූ කොමිෂන් සභාව**

**156අ.** (1) පාර්ලිමේන්තුව විසින්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීම සඳහා කොමිෂන් සභාවක් ස්ථාපිත කිරීම පිණිස නීතිය මගින් සැලැස්විය යුත්තේ ය. එකී නීතිය මගින් -

(අ) ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව කොමිෂන් සභාවේ සාමාජිකයන් පත්කිරීම;

(ආ) අල්ලස් හෝ දූෂණ චෝදනාවක් සම්බන්ධයෙන් තමාගේ ම මෙහෙයවීමෙන් හෝ වෙනත් තැනැත්තකු විසින් කරනු ලබන පැමිණිල්ලක් මත යම් අල්ලස් හෝ දූෂණ චෝදනාවක් පිළිබඳව මූලික පරීක්ෂණයක් පැවැත්වීමට හෝ විමර්ශනයක් කිරීමට විධාන කිරීම සඳහා වූ බලතල සහ අල්ලස් හෝ දූෂණවලට අදාළව, බලපවත්නා නීතිය යටතේ වැරදි සඳහා නඩු පැවරීමට ඇති බලතල ද ඇතුළු කොමිෂන් සභාවේ බලතල; සහ

(ඇ) ශ්‍රී ලංකාව පාර්ශ්වයක් වන, දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය සහ දූෂණය වැළැක්වීමට අදාළ වෙනත් යම් ජාත්‍යන්තර සම්මුති ක්‍රියාත්මක කිරීම පිණිස ගත යුතු පියවර සඳහා, විධිවිධාන සැලැස්විය යුතු ය.

(2) පාර්ලිමේන්තුව විසින් එසේ විධිවිධාන සලස්වන තෙක්, 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව පනත යටතේ පත් කරනු ලැබූ කොමිෂන් සභාව විසින් තම මෙහෙයවීමෙන් ම හෝ එය වෙත කරන ලිඛිත පැමිණිල්ලක් මත යම් අල්ලස් හෝ දූෂණ චෝදනාවක් විභාග කිරීම හෝ විමර්ශනය කිරීම නීත්‍යානුකූල බවට වූ සුළු වෙනස් කිරීමට යටත්ව, එකී පනත අදාළ විය යුත්තේ ය.

---

124- දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 46 වැනි වගන්තිය මගින් නව XIXඅ සහ XIXආ පරිච්ඡේද ඇතුළත් කරන ලදී

## XIXආ පරිච්ඡේදය

## ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව

**156ආ.** (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන්නා වූ ද සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විත වූ ද (මේ පරිච්ඡේදයේ 'සභාව' යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවක් තිබිය යුත්තේ ය. එකී සභාවේ යටත් පිරිසෙයින් සාමාජිකයන් තිදෙනෙකු ප්‍රසම්පාදනය, ගණකාධිකරණය, නීතිය හෝ රාජ්‍ය පරිපාලනය පිළිබඳ පිළිගත් අත්දැකීම් සහිත තැනැත්තන් විය යුතු ය. ජනාධිපතිවරයා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත එක් සාමාජිකයකු කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස පත් කළ යුත්තේ ය. ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව

(2) සභාවේ සෑම සාමාජිකයකු ම විසින් ජනාධිපතිවරයා අමතා යවන ලිපියක් මගින් තම ධූරයෙන් කලින් ඉල්ලා අස්වුවහොත් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතය මත හේතු දක්වා ජනාධිපතිවරයා විසින් ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ චරිත දූෂණ වරදක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් විසින් ඔහු වරදකරු කරනු ලැබුවහොත් හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු හෝ වශයෙන් තේරී පත්වුවහොත් හෝ ඔහු විෂයෙහි ප්‍රජා අශක්නුතා නියම කිරීමේ යෝජනා සම්මතයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 81 වන ව්‍යවස්ථාවට අනුකූලව සම්මත කරනු ලැබුවහොත් හෝ මිස, එවැනි සාමාජිකයකු වශයෙන් ඔහු පත් කරනු ලැබූ දින සිට අවුරුදු තුනක කාලයක් ධූර දැරිය යුත්තේ ය.

(3) කොමිෂන් සභාවේ සභාපතිවරයාට සහ සෑම සාමාජිකයකුට ම, පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මගින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදිවූ දීමනාවක් ගෙවිය යුත්තේ ය. එකී දීමනාව ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුතු අතර එකී සභාපතිවරයාගේ හෝ සාමාජිකයාගේ ධූර කාලය අතරතුර අඩු නොකළ යුත්තේ ය.

**156ඇ.** (1) සියලු රජයේ ආයතන විසින් භාණ්ඩ සහ සේවා, වැඩ, උපදේශක සේවා සහ තොරතුරු පද්ධති ප්‍රසම්පාදනය කරනු ලැබීම සම්බන්ධයෙන් සාධාරණ, යුක්ති සහගත, විනිවිද පෙනෙන සුළු, තරඟකාරී සහ වියදම් සඵලතාවයකින් යුත් පටිපාටි සහ උපමාන සකස් කිරීම කොමිෂන් සභාවේ කර්තව්‍ය වන්නේ ය. කොමිෂන් සභාව විසින් එකී උපමාන ගැසට් පත්‍රයේ පළ කිරීමට සැලසිය යුතු අතර එකී පළ කිරීමෙන් මාස තුනක් ඇතුළත පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා ඉදිරිපත් කිරීමට සැලසිය යුත්තේ ය. සභාවේ කර්තව්‍ය

(2)(1) වන අනු ව්‍යවස්ථාවේ පොදු භාවයට අගතියක් නොමැතිව-

(අ) රජයේ ආයතන විසින් කරනු ලබන භාණ්ඩ සහ සේවා, වැඩ, උපදේශක සේවා සහ තොරතුරු පද්ධති ප්‍රසම්පාදනය, පූර්වයේ අනුමත වූ ක්‍රියාකාරී සැලැස්ම

වලට අනුකූලව පිළියෙල කරන ලද ප්‍රසම්පාදන ක්‍රම මත පදනම්ව ඇත් ද යන්න පිළිබඳව නියාමනය කොට උචිත බලධරයන් වෙත වාර්තා කිරීම;

(ආ) රජයේ ආයතනවලට භාණ්ඩ හා සේවා, වැඩ, උපදේශක සේවා සහ තොරතුරු පද්ධති සැපයීම සඳහා වූ සියලු සුදුසුකම් ලත් ලංසු කරුවන්ට එකී භාණ්ඩ හා සේවා සැපයීම සඳහා වූ ලංසු තැබීමේ ක්‍රියාවලියට සහභාගී වීම පිණිස සමාන අවස්ථා ලබාදී ඇත් ද යන්න පිළිබඳව නියාමනය කොට උචිත බලධරයන් වෙත වාර්තා කිරීම;

(ඇ) රජයේ ආයතනවලට භාණ්ඩ හා සේවා, වැඩ, උපදේශක සේවා සහ තොරතුරු පද්ධති සැපයීම සඳහා කොන්ත්‍රාත්කරුවන් තේරීමේ සහ කොන්ත්‍රාත් ලබා දීමේ ක්‍රියාපටිපාටිය සාධාරණ හා විනිවිද පෙනෙන සුලු වන්නේ ද යන්න පිළිබඳව නියාමනය කොට උචිත බලධරයන් වෙත වාර්තා කිරීම;

(ඈ) රජයේ ආයතන විසින් කරනු ලබන ප්‍රසම්පාදනයන්ට සම්බන්ධිත සැපයුම් කමිටු සහ තාක්ෂණික ඇගයුම් කමිටුවල සාමාජිකයින් යෝග්‍ය පරිදි සුදුසුකම් ලබා ඇත් ද යන්න පිළිබඳව වාර්තා කිරීම; සහ

(ඉ) රජයේ ආයතන විසින්, පිළිගත් පටිපාටිවලින් සහ මෙහෙයුම් නිර්ණායක වලින් බැහැරව කරන ලද ප්‍රසම්පාදන වාර්තා විමර්ෂනය කිරීම සහ එකී ප්‍රසම්පාදන සම්බන්ධයෙන් වගකිවයුතු නිලධරයන් අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා අදාළ බලධාරීන්ට වාර්තා කිරීම, සභාවේ කාර්තව්‍ය වන්නේ ය.

කොමිෂන් සභාවේ බලතල

**156ඈ.** (1) කොමිෂන් සභාව විසින් යම් තැනැත්තකුට, ලිඛිත දැන්වීමක් මගින් -

(අ) ප්‍රශ්න කරනු ලැබීම සඳහා කොමිෂන් සභාව ඉදිරියට පැමිණිය යුතු බවට;

(ආ) එකී දැන්වීමේ නිශ්චිතව දක්වනු ලබන්නාවූ ද එකී තැනැත්තාගේ සන්තකයේ හෝ පාලනයේ තිබෙන්නා වූ ද යම් ලේඛනයක් හෝ දෙයක් සභාවට ඉදිරිපත් කළ යුතු බවට, නියාමනය කරනු ලැබිය හැක්කේ ය.

(2) (අ) (1) වන අනු ව්‍යවස්ථාව යටතේ යවනු ලැබූ දැන්වීමක් මගින් කොමිෂන් සභාව ඉදිරියට පැමිණිය යුතු බවට නියම කරනු ලැබ සාධාරණ හේතුවක් නොමැතිව එකී සභාව ඉදිරියට පැමිණීමට අපොහොසත් වන;

(ආ) එවැනි දැන්වීමකට අනුකූල වෙමින් කොමිෂන් සභාව විසින් ඔහුට ඉදිරිපත් කරනු ලබන යම්

ප්‍රශ්නයකට පිළිතුරු දීම සාධාරණ හේතුවක් නොමැතිව ප්‍රතික්ෂේප කරන; හෝ

(ඇ) (1) වන අනු ව්‍යවස්ථාව යටතේ ඔහුට යවනු ලැබූ දැන්වීමක් මගින් ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබූ යම් ලේඛනයක් හෝ දෙයක්, සාධාරණ හේතුවක් නොමැතිව, ඉදිරිපත් කිරීමට අපොහොසත්වන හෝ ප්‍රතික්ෂේප කරන, සෑම තැනැත්තකුම වරදකට වරදකරු වන අතර වරදකරු කිරීමේ දී රුපියල් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු හතක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුත්තේ ය.

(3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවනු ලැබූ සෑම මහාධිකරණයකටම ඉහත (2) වන අනු ව්‍යවස්ථාවේ සඳහන් යම් කාරණයක් විභාග කොට තීරණය දීමට අධිකරණ බලය ඇත්තේ ය.

සභාවේ රැස්වීම්

**156ඉ.** (1) කොමිෂන් සභාව, එහි කර්තව්‍ය ඉටුකිරීම සඳහා අවශ්‍ය විය හැකි පරිදි කවර හෝ වාරගණනක් රැස්විය යුත්තේ ය.

(2) කොමිෂන් සභාවේ සියලු රැස්වීම්වල මූලාසනය සභාපතිවරයා විසින් දැරිය යුත්තේ ය. කොමිෂන් සභාවේ යම් රැස්වීමක් සඳහා සභාපතිවරයා නොපැමිණි විට දී පැමිණ සිටින සාමාජිකයින් විසින් තමන් අතුරෙන් සාමාජිකයකු එකී රැස්වීම සඳහා තෝරා පත්කර ගත යුත්තේ ය.

(3) කොමිෂන් සභාවේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත වන්නේ ය.

(4) කොමිෂන් සභාවේ තීරණ, එකී තීරණ ගනු ලබන්නේ යම් රැස්වීමකදී ද, එකී රැස්වීමට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් විය යුත්තේ ය. ඡන්ද සමාන වන විටක සභාපතිවරයාට හෝ එකී රැස්වීමේ මූලාසනය දරන සාමාජිකයකුට තීරක ඡන්දයක් ඇත්තේ ය.

(5) මේ ව්‍යවස්ථාවේ ඉහත විධිවිධානවලට යටත්ව කොමිෂන් සභාව විසින් එහි රැස්වීම් සහ එකී රැස්වීම්වල කටයුතු පිළිබඳ පටිපාටි නිශ්චය කරගනු ලැබිය හැක්කේ ය.

(6) කොමිෂන් සභාවේ සාමාජිකත්වයේ යම් පුරප්පාඩුවක් තිබීම නොතකා කටයුතු කිරීමට කොමිෂන් සභාවට බලය ඇති අතර එවැනි පුරප්පාඩුවක් තිබීමේ හේතුව හෝ යම් සාමාජිකයකුගේ පත්වීමේ යම් දෝෂයක් තිබීම හෝ නිසාම පමණක් කොමිෂන් සභාවේ ක්‍රියාවන්, පටිපාටියක් හෝ තීරණයක් බලරහිත නොවිය යුත්තේය. බලරහිත වන ලෙස නොසැලකිය යුත්තේය.

සභාවේ කාර්ය මණ්ඩලය

**156ඊ.** (1) කොමිෂන් සභාව විසින්, එය විසින් නිශ්චය කරගනු ලැබිය හැකි නියම සහ කොන්දේසි මත, එහි කාර්ය නිසි පරිදි ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය යයි සලකනු ලබන පරිදි මහලේකම්වරයකු ද, වෙනත් යම් නිලධරයන් ද කොමිෂන් සභාවට පත්කරගනු ලැබිය යුත්තේ ය.

(2) කොමිෂන් සභාවේ සියලු සාමාජිකයන් සහ නිලධරයන් දණ්ඩ නීති සංග්‍රහයේ IX වන පරිච්ඡේදයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුත්තේය.

(3) කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු හෝ නිලධරයකු හෝ විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ඔහුගේ කාර්ය හෝ කර්තව්‍ය ඉටුකිරීමේ දී හෝ කිරීමේදී සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි උද්දේශිත යම් ක්‍රියාවක් හෝ දෙයක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව කිසිදු සිවිල් හෝ අපරාධ නඩුවක් හෝ නඩු කටයුත්තක් හෝ වෙනත් කෘත්‍යයක් පැවරිය නොහැක්කේ ය.

සභාවේ වියදම් ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුතු බව

**156උ.** කොමිෂන් සභාවේ වියදම් ඒකාබද්ධ අරමුදලට වැයබරක් විය යුත්තේ ය.

අර්ථ නිරූපනය

**156ඌ.** මේ පරිච්ඡේදයේ ‘රජයේ ආයතනය’ යන්නට, අමාත්‍යාංශයක්, රජයේ දෙපාර්තමේන්තුවක්, රාජ්‍ය සංස්ථාවක්, පළාත් පාලන ආයතනයක්, රජයට පවරා ගත් යම් වෙළඳ ව්‍යාපාරයක් හෝ රජයට පවරා ගත් වෙනත් ව්‍යාපාරයක් සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ හෝ ලියාපදිංචි කරනු ලැබූ ලෙස සලකනු ලබන්නාවූ ද රජය හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ විසින් සියයට පනහකට වැඩි කොටස් දරන්නා වූ ද යම් සමාගමක් ද ඇතුළත් වේ. ]

## XX වැනි පරිච්ඡේදය

### පොදු විධිවිධාන

**අන්තර්ජාතික ගිවිසුම් හා සම්මුති**

**157.** ශ්‍රී ලංකාවේ ආණ්ඩුව සහ යම් විදේශ රාජ්‍යයක ආණ්ඩුව අතර, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කර ගත් යම් ගිවිසුමක් හෝ සම්මුතියක් ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යවශ්‍ය වන්නක් බව, (නොපැමිණි මන්ත්‍රීවරයන් ද ඇතුළුව) මුළු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු සංඛ්‍යාවක් විසින් පක්ෂව ඡන්දය දී සම්මත කරනු ලබන යෝජනා සම්මතයක් මගින් පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලැබූ අවස්ථාවක, ඒ ගිවිසුමට හෝ සම්මුතියට ශ්‍රී ලංකාව තුළ නීතියේ බලපෑම ඇති අතර, රාජ්‍ය ආරක්ෂාව තහවුරු කිරීම පිණිස හැර, ඒ ගිවිසුමේ හෝ සම්මුතියේ විධිවිධාන කඩ කෙරෙන කිසිම ලිඛිත නීතියක් පැනවීම හෝ සෑදීම ද විධායක හෝ පරිපාලන ක්‍රියාවක් කිරීම ද නොකළ යුත්තේ ය.

**ශ්‍රී ලංකාවේ දේශ පූර්ණත්වය උල්ලංඝනය කිරීම තහනම් කිරීම**

[125][**157 අ.** (1) ශ්‍රී ලංකාවේ දේශය තුළ වෙන ම රජයක් පිහිටුවීමට, කෙළින් ම හෝ අන්‍යාකාරයකින් ශ්‍රී ලංකාව තුළ දී හෝ ඉන් පිටත දී හෝ ආධාර කිරීම, අනුබල දීම, අනුග්‍රහය දැක්වීම, මුදල් යෙදවීම, ධෛර්ය දීම හෝ දේශනා කිරීම කිසිදු තැනැත්තකු විසින් නොකළ යුතු ය.

(2) ශ්‍රී ලංකාවේ දේශය තුළ වෙන ම රජයක් පිහිටුවීම තම අරමුණුවලින් නැතහොත් පරමාර්ථවලින් එකක් ලෙස කිසිදු දේශපාලන පක්ෂයක් හෝ වෙනත් සංගමයක් හෝ සංවිධානයක් විසින් නොපිළිගනු ලැබිය යුතු ය.

(3) (1) වන අනුව්‍යවස්ථාවේ විධිවිධාන කඩකරමින් ක්‍රියා කරන කවර වුව ද තැනැත්තකු, අධිචෝදනාවක් මත සහ නීතියෙන් නියම කර ඇති කාර්ය පටිපාටියට අනුකූලව පවත්වනු ලබන නඩු විභාග යකින් පසුව අභියාචනාධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට -

(අ) ඒ අධිකරණය විසින් තීරණය කරනු ලබන අවුරුදු හතක් නොඉක්මවන කාලයක් සඳහා ප්‍රජා අශක්නුතාවට ඔහු යටත් වන්නේ ය;

(ආ) ඔහුගේ සහ ඔහුගේ පවුලේ අයගේ ජීවිකා වෘත්තිය පවත්වාගෙන යාම පිණිස අවශ්‍ය යයි ඒ අධිකරණයේ ආඥාවක් මගින් තීරණය කරනු ලබන දේපළ හැර, ඔහුගේ චංචල සහ නිශ්චල දේපළ රාජසන්තක වන්නේ ය;

125- සය වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 3 වැනි වගන්තිය මගින් ඇතුළත් කරන ලදී

(ඇ) ඒ අධිකරණය විසින් තීරණය කරනු ලබන අවුරුදු හතක් නොඉක්මවන කාලයක් සඳහා ප්‍රජා අයිතිවාසිකම්වලට හිමිකම් ඔහුට නොලැබෙන්නේ ය ; තව ද,

(ඈ) ඔහු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වේ නම් හෝ 165 වැනි ව්‍යවස්ථාවේ (1) වැනි අනුව්‍යවස්ථාවේ සඳහන් සේවාවකට අයත් වන හෝ ධුරයක් දරන හෝ තැනැත්තෙක් වේ නම්, ඔහු මන්ත්‍රීවරයකු වීම හෝ එකී සේවයේ සිටීම හෝ එකී ධුරය දැරීම අවසන් වන්නේ ය.

(4) ශ්‍රී ලංකාවේ දේශය තුළ වෙන ම රජයක් පිහිටුවීම, යම් දේශපාලන පක්ෂයක හෝ වෙනත් සංගමයක හෝ සංවිධානයක අරමුණුවලින් නැතහොත් පරමාර්ථවලින් එකක් වේ නම්, ශ්‍රී ලංකාවේ දේශය තුළ වෙන ම රජයක් පිහිටුවීම ඒ දේශපාලන පක්ෂයේ හෝ වෙනත් සංගමයේ හෝ සංවිධානයේ අරමුණුවලින් නැතහොත් පරමාර්ථවලින් එකක්ව ඇති බවට ප්‍රකාශයක් ලබා ගැනීම සඳහා ඉල්ලීමක් යම් තැනැත්තකු විසින්, ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර, ඒ දේශපාලන පක්ෂයේ හෝ වෙනත් සංගමයේ හෝ සංවිධානයේ ලේකම් නැතහොත් වෙනත් නිලධරයා ඒ ඉල්ලීමට වගඋත්තරකරුවකු කරනු ලැබිය යුතු ය.

(5) (4) වන අනුව්‍යවස්ථාව යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය වෙත කරනු ලැබූ ඉල්ලීමක් ප්‍රකාර, යම් දේශපාලන පක්ෂයක් හෝ වෙනත් සංගමයක් හෝ සංවිධානයක් සම්බන්ධයෙන් එකී අනුව්‍යවස්ථාව යටතේ ප්‍රකාශයක් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කරනු ලබන අවස්ථාවක-

(අ) ඒ දේශපාලන පක්ෂය හෝ වෙනත් සංගමය හෝ සංවිධානය තහනම් කරනු ලැබූවක් ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය. තව ද, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වූ, ඒ දේශපාලන පක්ෂයේ හෝ වෙනත් සංගමයේ හෝ සංවිධානයේ හෝ සාමාජිකයකු ඒ ප්‍රකාශයේ දිනයේ සිට බලපවත්වන පරිදි පාර්ලිමේන්තුවේ ඔහුගේ අසුන හිස් කළ ලෙස සලකනු ලැබිය යුතු ය. තව ද එම දේශපාලන පක්ෂය හෝ වෙනත් සංගමය හෝ සංවිධානය විසින් ඉදිරිපත් කරන ලද යම් නාම යෝජනා පත්‍රයක් සියලු කාර්ය සඳහා බලරහිත ලෙස සලකනු ලැබිය යුතු ය;

(ආ) එකී ප්‍රකාශය කරන ලද දිනයෙන් පසු ඒ දේශපාලන පක්ෂයේ හෝ වෙනත් සංගමයේ හෝ සංවිධානයේ ධුරයක් දරන හෝ සාමාජිකයකු වන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, අධිචෝදනාවක් මත සහ නීතියෙන් නියම කර ඇති කාර්ය පටිපාටියකට අනුකූලව පවත්වනු ලබන නඩු විභාගයකින් පසුව අභියාචනාධිකරණය විසින් ඔහු වරදකරු කරනු ලැබූ විට -

(i) ඒ අධිකරණය විසින් තීරණය කරනු ලබන අවුරුදු හතක් නොඉක්මවන කාලයක් සඳහා ප්‍රජා අශක්නුතාවට ඔහු යටත් වන්නේ ය;

(ii) ඔහුගේ සහ ඔහුගේ පවුලේ අයගේ ජීවිකා වෘත්තිය පවත්වාගෙන යාම පිණිස අවශ්‍ය යයි ඒ අධිකරණයේ ආඥාවක් මගින් තීරණය කරනු ලබන දේපළ හැර, ඔහුගේ චංචල සහ නිශ්චල දේපළ රාජසන්තක වන්නේ ය;

(iii) ඒ අධිකරණය විසින් තීරණය කරනු ලබන අවුරුදු හතක් නොඉක්මවන කාලයක් සඳහා ප්‍රජා අයිතිවාසිකම්වලට හිමිකම් ඔහුට නොලැබෙන්නේ ය;

(iv) ඔහු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වේ නම් හෝ 165 වැනි ව්‍යවස්ථාවේ (1) වැනි අනුව්‍යවස්ථාවේ සඳහන් සේවාවකට අයත් වන හෝ ධුරයක් දරන හෝ තැනැත්තෙක් වේ නම්, ඔහු මන්ත්‍රීවරයකු වීම හෝ එකී සේවයේ සිටීම හෝ එකී ධුරය දැරීම අවසන් වන්නේ ය.

(6) (3) වැනි අනුව්‍යවස්ථාව යටතේ හෝ (5) වැනි අනුව්‍යවස්ථාවේ (ආ) ඡේදය යටතේ හෝ නියම කරන ලද යම් දඬුවමක් ක්‍රියාවේ යෙදවීම, ඒ දඬුවමට විරුද්ධව හෝ ඒ දඬුවම නියම කරනු ලැබීමට හේතු වූ වරදකරු කරනු ලැබීමට විරුද්ධව හෝ ඉදිරිපත් කරන ලද යම් අභියාචනයක් විනිශ්චයට භාජනව තිබීමේ හේතුවෙන් නතර කිරීම හෝ අත්හිටුවීම නොකරනු ලැබිය යුතු ය

(7) දිවුරුම් දී අත්සන් තැබීමට හෝ ප්‍රතිඥා දී අත්සන් තැබීමට 32 වැනි ව්‍යවස්ථාවෙන් හෝ 53 වැනි ව්‍යවස්ථාවෙන් හෝ 61 වැනි ව්‍යවස්ථාවෙන් හෝ 107 වැනි ව්‍යවස්ථාවෙන් හෝ 165 වැනි ව්‍යවස්ථාවෙන් හෝ 169 වැනි ව්‍යවස්ථාවේ (12) වැනි අනුව්‍යවස්ථාවෙන් නියම කර තිබුණු නැතහොත් නියම කරනු ලබන සෑම නිලධරයකු හෝ තැනැත්තකු ම ද පළාත් පාලන ආයතනයක, සංවර්ධන සභාවක, ප්‍රාදේශීය මණ්ඩලයක, ග්‍රාමෝදය මණ්ඩලයක හෝ රාජ්‍ය සංස්ථාවක සෑම සාමාජිකයකු හෝ එහි සේවයේ යෙදී සිටින සෑම තැනැත්තකු ම ද සෑම නීතිඥවරයකු ම ද -

(අ) මේ ව්‍යවස්ථාව බලාත්මක වන දිනයෙහි ධුරය දරන නිලධරයෙක් හෝ තැනැත්තෙක් වේ නම්, මේ ව්‍යවස්ථාව බලාත්මක වූ දින සිට මාසයක් ඇතුළත දී, ඒ ව්‍යවස්ථාවෙහි සඳහන් යම් තැනැත්තකු හෝ මණ්ඩලයක් වෙතොත් ඒ තැනැත්තා හෝ මණ්ඩලය ඉදිරියෙහි හත්වන උපලේඛනයෙහි දක්වා ඇති ආකෘතිය අනුව දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් දී අත්සන් කළ යුතු ය;

(ආ) මේ ව්‍යවස්ථාව බලාත්මක වූ දිනයෙන් පසුව ඒ ධුරයට පත් කරනු ලැබූ නිලධරයෙක් හෝ තැනැත්තෙක් වේ නම්, ඔහු ඒ ධුරයට පත්කරනු ලැබූ දින සිට මාසයක් ඇතුළත දී, ඒ ව්‍යවස්ථාවෙහි සඳහන් යම් තැනැත්තකු හෝ මණ්ඩලයක් වෙතොත් ඒ තැනැත්තා හෝ මණ්ඩලය ඉදිරියෙහි හත්වන උපලේඛනයෙහි දක්වා ඇති ආකෘතිය අනුව දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් දී අත්සන් කළ යුතු ය.

මේ අනුව්‍යවස්ථාවෙන් නියම කොට ඇති දිවුරුම දී අත්සන් කිරීම හෝ ප්‍රතිඥාව දී අත්සන් කිරීම යම් තැනැත්තකු හෝ නිලධරයකු විසින් පැහැර හරිනු ලැබුවහොත්, ඔහුට සහ ඔහු සම්බන්ධයෙන් 165 වැනි ව්‍යවස්ථාවේ සහ 169 වැනි ව්‍යවස්ථාවේ (12) වැනි අනුව්‍යවස්ථාවේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

(8) (අ) මේ ව්‍යවස්ථාව බලාත්මක වන දිනයෙහි පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකුව සිටින සෑම තැනැත්තකු ම, හත්වන උපලේඛනයෙහි දැක්වෙන ආකෘතිය අනුව දිවුරුම් දී එයට අත්සන් තැබුවහොත් හෝ ප්‍රතිඥාව දී එයට අත්සන් තැබුවහොත් හෝ මිස, පාර්ලිමේන්තුවේ අසුන් ගැනීමට හෝ පාර්ලිමේන්තුවේ දී ඡන්දය දීමට හෝ හිමිකම නොලැබිය යුතු ය.

(ආ) මේ ව්‍යවස්ථාව බලාත්මක වන දිනයෙහි හෝ ඉන් පසුව පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු වශයෙන් තෝරා පත් කර ගනු ලබන හෝ නාම යෝජනා කරනු ලබන සෑම තැනැත්තකු ම, හත්වන උපලේඛනයෙහි දැක්වෙන ආකෘතිය අනුව දිවුරුම් දී එයට අත්සන් තැබුවහොත් හෝ ප්‍රතිඥාව දී එයට අත්සන් තැබුවහොත් හෝ මිස, පාර්ලිමේන්තුවේ අසුන් ගැනීමට හෝ පාර්ලිමේන්තුවේ දී ඡන්දය දීමට හෝ හිමිකම නොලැබිය යුතු ය.

(9) හත් වැනි උපලේඛනයෙහි දැක්වෙන ආකෘතිය අනුව දිවුරුම දී එයට අත්සන් කර ඇත්තා වූ හෝ ප්‍රතිඥාව දී එයට අත්සන් කර ඇත්තා වූ කිසිම තැනැත්තකුට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, දිවුරුම දී අත්සන් තැබීමට හෝ ප්‍රතිඥාව දී අත්සන් තැබීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ නියමිත වෙනත් යම් දිවුරුමක් දී අත්සන් තැබීමට හෝ ප්‍රතිඥාවක් දී අත්සන් තැබීමට නියම කරනු නොලැබිය යුත්තේ ය.

(10) (7) වැනි අනුව්‍යවස්ථාවේ විධිවිධාන අදාළ විය යුතු වෙනත් පන්තිවල තැනැත්තන් හෝ නිලධරයන් කවරේදැයි පාර්ලිමේන්තුව විසින් යෝජනා සම්මතයක් මගින් තීරණය කරනු ලැබිය හැකි අතර, එසේ කරනු ලැබූ විට, ඒ පන්තියට අයත් නිලධරයන්ට හෝ තැනැත්තන්ට නැතහොත් ඔවුන් සම්බන්ධයෙන් ඒ ඡේදයේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

(11) මේ ව්‍යවස්ථාව යටතේ අභියාචනාධිකරණයේ බලතල සම්බන්ධයෙන් එහි අධිකරණ බලය, 146 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි

අනුව්‍යවස්ථාවේ අතුරු අනුව්‍යවස්ථාවේ (iv) වැනි අනුඡේදයෙන් විධිවිධාන සලස්වා ඇති ආකාරයට ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(12) මේ ව්‍යවස්ථාවේ "ප්‍රජා අයිතිවාසිකම්" යන්නෙන් -

(අ) විදේශ ගමන් බලපත්‍රයක් ලබා ගැනීමේ අයිතිවාසිකම;

(ආ) රජයේ යම් විභාගයකට පෙනී සිටීමේ අයිතිවාසිකම;

(ඇ) යම් නිශ්චල දේපළක් අයිතිව සිටීමේ අයිතිවාසිකම;

(ඈ) යම් ලිඛිත නීතියක් මගින් හෝ යටතේ හෝ වූ බලපත්‍රයක්, ලියාපදිංචි කිරීමක් නැතහොත් වෙනත් බලය දීමක් අවශ්‍ය වන යම් රැකියාවක හෝ වෘත්තියක යෙදීමේ අයිතිවාසිකම

අදහස් වේ. ]

බලතල පැවරීම

**158.** යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් වෙනත් යම් තැනැත්තකුට පැවරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යම් තැනැත්තකුට බලය ලැබී ඇති අවස්ථාවක, එවැනි පැවරීමක් කර තිබුණ ද, ඒ තැනැත්තා විසින් ඒ බලය, කාර්යය හෝ කර්තව්‍යය ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම ද, කවර හෝ වේලාවක ඒ පැවරීම ප්‍රත්‍යාදිෂ්ට කිරීම ද කළ හැක්කේ ය.

මේ ව්‍යවස්ථාවෙහි "තැනැත්තා" යන්නට යම් පුද්ගල මණ්ඩලයක් හෝ යම් අධිකාරියක් ඇතුළත් වේ.

නියෝජ්‍ය කථානායකවරයා, කථානායකවරයා වෙනුවට වැඩ බැලීම

**159.** කථානායකවරයාගේ ධුරයේ කර්තව්‍ය ඉටු කිරීමට කථානායකවරයාට නොහැකි වන අවස්ථාවල දී 31 වැනි ව්‍යවස්ථාවේ (4) වැනි අනුව්‍යවස්ථාවෙන්, 37 වැනි ව්‍යවස්ථාවෙන්, 38 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනුව්‍යවස්ථාවේ (ආ) ඡේදයෙන්, 39 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනුව්‍යවස්ථාවෙන් සහ 40 වැනි ව්‍යවස්ථාවෙන් හැර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ යම් විධිවිධානයකින් කථානායකවරයා වෙත පැවරී ඇති, කථානායකවරයාට නියම කොට ඇති හෝ භාර කොට ඇති බලතල, කාර්ය සහ කර්තව්‍යය නියෝජ්‍ය කථානායකවරයා විසින් ක්‍රියාත්මක කළ හැක්කේ ය; නැතහොත් ඉටු කළ හැක්කේ ය.

## XXI වැනි පරිච්ඡේදය

## අන්තර්කාලීන විධිවිධාන

ප්‍රථම ජනාධිපතිවරයා

**160.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ වෙනත් යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වන තෙක් යම් තැනැත්තෙක් ජනාධිපති ධුරය දැරුවේ ද, ඒ තැනැත්තා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ප්‍රථම ජනාධිපතිවරයා වන්නේ ය. ඒ ජනාධිපතිවරයා ජනරජයේ ජනාධිපතිවරයා වශයෙන් තෝරා පත් කර ගනු ලැබූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුත්තේ ය. ඒ ජනාධිපතිවරයා 1978 පෙබරවාරි මස 4 වැනි දින සිට [126] [31 වැනි ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව සාවුරුද්දක් ධුරය දරන්නේ ය.]

32 වැනි ව්‍යවස්ථාවේ කවර විධිවිධානයක් තිබුණ ද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වූ වහාම ජනාධිපතිවරයා විසින් ධුරය භාර ගන්නා ලදැයි සැලකිය යුතු අතර, එවිට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ හෝ අන්‍යාකාරයකින් හෝ ජනාධිපතිවරයා වෙත භාර වී ඇති, නියම වී ඇති හෝ පැවරී ඇති සියලු බලතල ක්‍රියාත්මක කිරීමට ද, කාර්ය හා කර්තව්‍යය ඉටු කිරීමට ද ඔහුට හිමිකම් ඇත්තේ ය. ඉන් අනතුරුව හැකිතාක් ඉක්මනින් පාර්ලිමේන්තුවේ රැස්වීමක දී ජනාධිපතිවරයා හතරවන උපලේඛනයේ දක්වා ඇති ප්‍රතිඥාව දී ඊට අත්සන් තැබීම හෝ එහි දක්වා ඇති දිවුරුම දී ඊට අත්සන තැබීම හෝ කළ යුත්තේ ය.

ප්‍රථම පාර්ලිමේන්තුව

**161.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පටහැනිව කුමක් සඳහන් ව ඇත ද -

(අ) ප්‍රථම පාර්ලිමේන්තුව මන්ත්‍රීවරයන් එකසිය හැට අට දෙනකුගෙන් සමන්විත විය යුත්තේ ය. තව ද, මේ ව්‍යවස්ථාවේ මීළඟට ඇති විධිවිධානවලට යටත්ව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වන තෙක් ජාතික රාජ්‍ය සභාවේ මන්ත්‍රීවරයන්ව සිටි සියලුම තැනැත්තන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් වශයෙන් තෝරා පත් කරන ලද ලෙස සලකනු ලැබිය යුත්තේ ය;

(ආ) (i) ප්‍රථම පාර්ලිමේන්තුවට තෝරා පත් කර ගන්නා ලදැයි සැලකෙන තැනැත්තකුගේ ජාතික රාජ්‍ය සභාවේ මන්ත්‍රීවරයකු වශයෙන් වූ තෝරා පත් කිරීම තත්කාලයේ බලපවත්නා නීතිය යටතේ නිෂ්ප්‍රභ බව ප්‍රකාශයට පත් කරනු ලැබූව ද වෙනත් තැනැත්තකු යථා පරිදි තෝරා පත් කර ගනු ලැබූ ලෙස හෝ පත් කරනු ලැබූ ලෙස හෝ තීරණය කරනු නොලැබූ ද අවස්ථාවක, ඒ මන්ත්‍රීවරයාගේ අසුන හිස් වන්නේ ය. එවිට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

126- තුන් වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 4 වැනි වගන්තිය මගින් "සාවුරුද්දක් ධුරය දරන්නේය." යන වචන වෙනුවට ආදේශ කරන ලදී

ක්‍රියාත්මක වීම ආරම්භ වන තෙක් පැවති මැතිවරණ කොට්ඨාසය සඳහා මැතිවරණයක්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වන තෙක් ජාතික රාජ්‍ය සභාවට මන්ත්‍රීවරයන් තෝරා පත් කර ගැනීමේ මැතිවරණවලට අදාළ නීතිය අනුව ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වූ දිනයට පෙර දිනයේ ක්‍රියාත්මකව තිබූ ඒ මැතිවරණ කොට්ඨාසයට අදාළ ඡන්ද හිමි නාම ලේඛනය පදනම් කර ගෙන ද පැවැත්විය යුත්තේ ය;

(ii) (i) වැනි අනුඡේදයේ විධිවිධාන සලස්වා ඇති පරිදි පවත්වන ලද මැතිවරණයක් සම්බන්ධ ඡන්ද පෙත්සම්වලට අදාළ නීතිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වීමෙන් පසුව වලංගු වන නීතිය වන අතර, එවැනි මැතිවරණයක් නිෂ්ප්‍රභ බව ප්‍රකාශයට පත් කරනු ලැබූ අවස්ථාවක, (i) වැනි අනුඡේදයේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ වන්නේ ය;

(ඇ) ප්‍රථම පාර්ලිමේන්තුවට තෝරා පත් කර ගනු ලැබූ ලෙස සැලකෙන තැනැත්තකුගේ ජාතික රාජ්‍ය සභාවේ මන්ත්‍රීවරයකු වශයෙන් වූ තේරී පත් වීම නිෂ්ප්‍රභ හා අනිසි බව ප්‍රකාශ කරනු ලැබ වෙනත් තැනැත්තකු නිසි ලෙස තේරී පත් වූ බව හෝ තෝරා පත් කර ගන්නා ලද බව තීරණය කරනු ලැබූ අවස්ථාවක, ඒ වෙනත් තැනැත්තා ප්‍රථම පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු වශයෙන් නිසි පරිදි තෝරා පත් කර ගනු ලැබූ ලෙස සැලකිය යුත්තේ ය;

(ඈ) (i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වන තෙක් ජාතික රාජ්‍ය සභාවේ මන්ත්‍රී ධුරවල පුරප්පාඩුවක් තිබූ අවස්ථාවක හෝ මේ ව්‍යවස්ථාවේ (ආ) ඡේදයේ විධිවිධාන යටතේ හැර වෙනත් ආකාරයකින් ප්‍රථම පාර්ලිමේන්තුවේ මන්ත්‍රී ධුරවල පුරප්පාඩුවක් ඇති වූ අවස්ථාවක, මෙහි (iii) වැනි අනුඡේදයේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට ඒ පුරප්පාඩුව පිරවිය යුත්තේ ය ;

127 [(ii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වන විට හෝ ඉන් පසුව යම් මන්ත්‍රීවරයකු අයත් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ඔහුගේ සාමාජිකත්වය, ප්‍රථම පාර්ලිමේන්තුව පවත්නා කාලය තුළ දී, ඉල්ලා අස්වීම නිසා, පක්ෂයෙන් පහ කිරීම නිසා හෝ වෙනත් හේතුවක් නිසා අවසාන වන අවස්ථාවක,

127- දෙවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 2 වැනි වගන්තිය මගින් මුල් (ii) අනුඡේදය ඉවත් කොට ආදේශ කරන ලදී.

ඒ මන්ත්‍රීවරයාගේ ඒ පක්ෂයේ සාමාජිකත්වය එසේ අවසාන වූ දිනයේ සිට සති දෙකක් ඇතුළත, ඒ දේශපාලන පක්ෂයේ ලේකම්වරයා විසින් ඒ සිද්ධිය ද, එය සිදු වූ දිනය ද පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාට ලියවිල්ලකින් නිවේදනය කළ යුත්තේ ය. ඒ නිවේදනය ලැබුණු විට, මහ ලේකම්වරයා එය කථානායකවරයාට ඉදිරිපත් කළ යුත්තේ ය.

මන්ත්‍රීවරයකු අයත් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ඔහුගේ සාමාජිකත්වය, ඔහු ඒ පක්ෂයෙන් පහ කිරීම නිසා අවසාන වන අවස්ථාවක, ඒ පහ කිරීම වලංගු නොවන බවට වූ තීරණයක් ලබා ගැනීම සඳහා ලියවිල්ලකින් වූ පෙත්සමක් මගින්, ඒ පහ කිරීමේ දිනයේ සිට එක් මාසයක් ඇතුළත ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉල්ලීමක් කිරීමේ හිමිකම ඔහුට ඇත්තේ ය. එවැනි යම් ඉල්ලීමක් කරනු ලැබුවහොත්, ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ ඉල්ලීම පිළිබඳව, පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා වෙත, ලියවිල්ලකින් නොපමාව ම දැනුම් දිය යුත්තේ ය. ඒ සෑම ඉල්ලීමක් ම ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන් තිදෙනකුට නොඅඩු සංඛ්‍යාවක් විසින් විනිශ්චය කර තීරණය කළ යුතු අතර ඒ පහ කිරීම වලංගු වන හෝ නොවන බව ඒ ඉල්ලීම කළ දිනයේ සිට මාස දෙකක් ඇතුළත තීරණය කළ යුත්තේ ය.

මන්ත්‍රීවරයකු අයත් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ඔහුගේ සාමාජිකත්වය අවසාන වූ බව කියැවෙන නිවේදනයක් ඉහත කී ආකාරයට කථානායකවරයාට ලැබුණු විට, කථානායකවරයා විසින්, ඒ මන්ත්‍රීවරයා ඒ දේශපාලන පක්ෂයෙන් ඉල්ලා අස් වූ බව හෝ පහ කරනු ලැබූ බව හෝ ඒ පක්ෂයේ ඔහුගේ සාමාජිකත්වය වෙනත් හේතුවක් නිසා අවසාන වූ බව කියැවෙන්නේ කවර අවස්ථාගත කරුණු යටතේ ද යන වග සහ එසේ වීමට හේතු කවරේ ද යන වග පිළිබඳව විභාග කොට, ඒ පිළිබඳව පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රී වරයන් පස්දෙනකුට නොඅඩු සංඛ්‍යාවකින් සමන්විත විශේෂ කාරක සභාවක් පත් කළ යුත්තේ ය. (ඉන් එක් මන්ත්‍රීවරයකු එකී විශේෂ කාරක සභාවේ සභාපතිවරයා වශයෙන් නම් කරනු ලැබිය යුත්තේ ය.)෴

එසේ වුව ද, මන්ත්‍රීවරයකු අයත් වූ පිළිගත් දේශපාලන පක්ෂයෙන් ඔහු පහ කිරීම නිසා ඒ

පක්ෂයේ ඔහුගේ සාමාජිකත්වය අවසාන වූ බව ඒ නිවේදනයෙන් කියැවෙන අවස්ථාවක, කියනු ලබන ඒ පහ කිරීමේ දිනයේ සිට එක් මාසයක් ඉකුත් වන තුරු ද, ඒ පහ කිරීම වලංගු නොවන බවට වූ තීරණයක් සඳහා ඒ මන්ත්‍රීවරයා ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉල්ලීමක් කර ඇති අවස්ථාවක දී නම්, ඒ පහ කිරීම වලංගු බව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කළහොත් මිස සහ එසේ තීරණය කරන තුරු ද ඉහත කී ආකාරයට විශේෂ කාරක සභාවක් පත් නොකළ යුත්තේ ය.

ඉහත කී පරිදි පත් කරන ලද විශේෂ කාරක සභාවක් ඉදිරියෙහි පැවැත්වෙන කටයුතු සම්බන්ධයෙන් සහ ඒ විශේෂ කාරක සභාවේ වරප්‍රසාද, පරිහාර හා බලතල සම්බන්ධයෙන් ද පාර්ලිමේන්තු (බලතල සහ වරප්‍රසාද) පනතේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු අතර, ඒ සෑම විශේෂ කාරක සභාවක් ම, තැනැත්තන්, ලියකියවිලි සහ වාර්තා ගෙන්වා ගැනීමට පාර්ලිමේන්තුවේ නියමයකින් නිසි පරිදි බලය ලබා ඇති ලෙස, ඒ පනතේ කාර්ය සඳහා සලකනු ලැබිය යුත්තේ ය.

ඉහත කී පරිදි පත් කරන ලද විශේෂ කාරක සභාවක් විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව සලකා බැලීමෙන් පසුව පාර්ලිමේන්තුව විසින් මන්ත්‍රීවරයන් අසූ පස් දෙනෙකුට නොඅඩු සංඛ්‍යාවක් පක්ෂව ඡන්දය දී සම්මත කර ගන්නා යෝජනා සම්මතයක් මගින්, ඒ වාර්තාව අදාළ වන්නේ යම් මන්ත්‍රීවරයකුට ද ඒ මන්ත්‍රීවරයාගේ පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරය අවසාන විය යුතු බව, සම්මත කළ හැකි ය. එසේ සම්මත කරනු ලැබූ සෑම යෝජනා සම්මතයක ම මෙහි පහත දැක්වෙන ආකෘතියෙහි වූ සහතිකයක් කථානායකවරයා විසින් ස්වකීය අත්සන ඇතිව සටහන් කළ යුත්තේ යː -

> "මේ යෝජනා සම්මතය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 161 වැනි ව්‍යවස්ථාවේ (ඈ) ඡේදයේ (ii) වැනි අනුඡේදයේ නියමිත බහුතර ඡන්දයෙන් සම්මත කරන ලදී."

ඒ මන්ත්‍රීවරයාගේ අසුන ඒ සහතිකයේ දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි හිස් වන්නේ ය.

එවැනි සෑම සහතිකයක් ම සියලු කාර්ය සඳහා තීරණාත්මක වන අතර, කිසිම අධිකරණයක දී ඒ පිළිබඳව ප්‍රශ්න නොකළ යුත්තේ ය. තව ද කවර වූ

හෝ ආකාරයක හේතුවක් මත කිසිම අධිකරණයක් හෝ විනිශ්චයාධිකාරයක් විසින් ඒ සහතිකය සටහන් කරනු ලැබ ඇති යෝජනා සම්මතයේ වලංගුභාවය ගැන විභාග කිරීම, මතයක් පළ කිරීම හෝ කවර හෝ ආකාරයකින් ප්‍රශ්න කිරීම නොකළ යුත්තේ ය.]

(iii) (i) වැනි හෝ (ii) වැනි අනුඡේදයේ සඳහන් අන්දමේ පුරප්පාඩුවක් ඇති වී ඇති අවස්ථාවක, පාර්ලිමේන්තුවේ මහලේකම්වරයා විසින් ඒ පුරප්පාඩුව ගැන මැතිවරණ කොමසාරිස්වරයාට නොපමාව දැන්විය යුත්තේ ය. ඒ පුරප්පාඩුව පුරවනු පිණිස එම පක්ෂයේ සාමාජිකයකු නාමයෝජනා කරන ලෙස ඒ මන්ත්‍රීවරයා අයත්ව සිටි දේශපාලන පක්ෂයේ ලේකම්වරයාට, මැතිවරණ කොමසාරිස්වරයා විසින් [128][ඉන්පසු නියම කළ යුත්තේ ය. ඒ දේශපාලන පක්ෂයේ ලේකම්වරයා විසින් මේ ඡේදය යටතේ කරනු ලබන නාමයෝජනාව ඉදිරිපත් කිරීමේ දී, ඒ පුරප්පාඩුව පිරවීම සඳහා නාමයෝජනාව කරනු ලැබූ තැනැත්තා විසින්, අවස්ථාවෝචිත පරිදි, හත්වන උපලේඛනයෙහි දක්වා ඇති ආකෘතිය අනුව දිවුරුම් දී අත්සන් කරන ලද හෝ ප්‍රතිඥා දී අත්සන් කරන ලද දිවුරුමක් හෝ ප්‍රතිඥාවක් සමග ඒ නාමයෝජනාව ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. ඒ නාමයෝජනාව එකී දිවුරුම හෝ ප්‍රතිඥාව සමඟ ලැබුණු පසු] මැතිවරණ කොමසාරිස්වරයා විසින් ඒ තැනැත්තා ඒ පුරප්පාඩුව ඇති වූ මැතිවරණ කොට්ඨාසයේ මන්ත්‍රීවරයා වශයෙන් ප්‍රකාශ කරනු ලැබිය යුත්තේ යඃ

[129][ එසේ වුව ද මේ අනුඡේදයේ මීට ඉහතින් ඇති විධිවිධාන යටතේ ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඒ දේශපාලන පක්ෂයේ සාමාජිකයකු [130][නාමයෝජනා කරන ලෙස නියම කරනු ලැබූ දින සිට දින තිහක් ඇතුළත ඉහත සඳහන් ආකාරයට] එසේ සාමාජිකයකු නාමයෝජනා කිරීම ඒ දේශපාලන පක්ෂයේ ලේකම්වරයා විසින් [131][පැහැර හරිනු ලැබූ අවස්ථාවක හෝ ඒ දේශපාලන පක්ෂය 157අ

---

128- සයවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 4(1) වැනි වගන්තිය මගින් "ඉන්පසු නියම කළ යුත්තේය. ඒ නාම යෝජනාව ලැබුණු පසු" යන වචන වෙනුවට ආදේශ කරන ලදී,

129- පස්වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 2(ආ) වැනි වගන්තිය මගින් ඇතුළත් කරන ලදී,

130- සයවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 4(2)(අ) වැනි වගන්තිය මගින් "නාම යෝජනා කරන ලෙස නියම කරනු ලැබූ දින සිට දින තිහක් ඇතුළත" යන වචන වෙනුවට ආදේශ කරන ලදී,

131- සයවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 4(2)(ආ) වැනි වගන්තිය මගින් "පැහැර හරිනු ලැබූ අවස්ථාවක" යන වචන වෙනුවට ආදේශ කරන ලදී,

වැනි ව්‍යවස්ථාව යටතේ තහනම් කරනු ලැබූ ලෙස සැලකෙන අවස්ථාවක] ඒ විධිවිධාන යටතේ එවැනි යම් පුරප්පාඩුවක් පිරවීම සඳහා දේශපාලන පක්ෂයක සාමාජිකයකු නාමයෝජනා කරන ලෙස මේ අතුරු ඡේදය ක්‍රියාත්මක වීමට පෙරාතුව ඒ දේශපාලන පක්ෂයේ ලේකම්වරයාට නියම කරනු ලැබ, මේ අතුරු ඡේදය ක්‍රියාත්මක වී දින තිහක් ඇතුළත ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඒ දේශපාලන පක්ෂයේ සාමාජිකයකු නාමයෝජනා කිරීම ඒ ලේකම්වරයා විසින් පැහැර හරිනු ලැබූ අවස්ථාවක හෝ මැතිවරණ කොමසාරිස්වරයා විසින් ඒ බව ජනාධිපතිවරයා වෙත නොපමාව දැනුම් දිය යුතු අතර, ඒ පුරප්පාඩුව ඇති වූ මැතිවරණ කොට්ඨාසය සඳහා මැතිවරණයක් පවත්වන ලෙස, ඒ දැනුම් දීම තමා වෙත ලැබී දින තිහක් ඇතුළත ගැසට් පත්‍රයේ පළ කරන නිවේදනයක් මගින් ජනාධිපතිවරයා විසින් මැතිවරණ කොමසාරිස්වරයාට නියම කළ යුත්තේ ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන තෙක් පැවති පරිදි වූ ඒ මැතිවරණ කොට්ඨාසය සඳහා 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජ සභා ආඥාවේ I වැනි කොටසට සහ IV වැනි කොටසේ සිට VI වැනි කොටස තෙක් (ඒ කොටස් දෙකම ඇතුළුව) වූ කොටස්වලට අනුකූලව සහ 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනත යටතේ පිළියෙළ කරන ලද ඡන්ද හිමි නාම ලේඛනයේ ඒ මැතිවරණ කොට්ඨාසයට අනුරූපව ක්‍රියාත්මකව පැවතියා වූ කොටස පදනම් කරගෙන, මැතිවරණ කොමසාරිස්වරයා විසින් එවිට මැතිවරණයක් පැවැත්විය යුත්තේ ය. 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාව ඉවත් කරනු ලැබූව ද, ඒ රාජ සභා ආඥාවේ ඉහත කී කොටස් ඒ මැතිවරණයේ කාර්යය සඳහා ක්‍රියාත්මකව පවත්නා සේ සැලකිය යුතු අතර, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රකාශිතව ම අන්‍යාකාරයකින් විධිවිධාන සලස්වා ඇති පරිදි හැර ඒ කොටස් ඒ මැතිවරණයට අදාළ විය යුත්තේ ය.

ඉහත කී පරිදි අදාළ කර ගන්නා ලද ඒ රාජසභා ආඥාවේ ඉහත කී කොටස් එවැනි මැතිවරණ කොට්ඨාස හා සම්බන්ධ මැතිවරණ පෙත්සම්වලට අදාළ නීතිය විය යුතු අතර, ඒ මැතිවරණය නිෂ්ප්‍රභ බව ප්‍රකාශ කරනු ලැබ වෙනත් තැනැත්තකු නිසි

ලෙස තේරී පත් වූ බව හෝ තෝරා පත් කර ගන්නා ලද බව හෝ තීරණය කරනු නොලැබූ විටක, ඒ පුරප්පාඩුව පිරවීම සඳහා පවත්වන මැතිවරණය, මේ අතුරු ඡේදයේ විධිවිධානවලට අනුකූලව පැවැත්විය යුත්තේ ය.]

[132][(iv) (i) වැනි අනුඡේදයේ හෝ (ii) වැනි අනුඡේදයේ හෝ සඳහන් යම් පුරප්පාඩුවක් පිරවීම සඳහා නාමයෝජනා කරනු ලැබූ හෝ තෝරා පත්කර ගනු ලැබූ මන්ත්‍රී වරයකු, හත්වන උපලේඛනයෙහි සඳහන් ආකෘතිය අනුව දිවුරුමක් දී අත්සන් කළ හෝ ප්‍රතිඥාවක් දී අත්සන් කළ මන්ත්‍රීවරයකුව සිටිමින්, ශ්‍රී ලංකාවේ දේශය තුළ වෙන ම රජයක් පිහිටුවීමට, කෙළින් ම හෝ අන්‍යාකාරයකින්, ශ්‍රී ලංකාව තුළ දී හෝ ඉන් පිටත දී, ආධාර කිරීම, අනුබල දීම, අනුග්‍රහය දැක්වීම, මුදල් යෙදවීම, ධෛර්ය දීම හෝ දේශනා කිරීම කරයි නම්, ඒ මන්ත්‍රීවරයා විසින් ශ්‍රී ලංකාවේ දේශය තුළ වෙන ම රජයක් පිහිටුවීමට, කෙළින්ම හෝ අන්‍යාකාරයකින් ශ්‍රී ලංකාව තුළ දී හෝ ඉන් පිටත දී ආධාර කොට, අනුබල දී, අනුග්‍රහය දක්වා, මුදල් යොදවා, ධෛර්ය දී හෝ දේශනා කොට ඇති බවට ප්‍රකාශයක් ලබා ගැනීම සඳහා අභියාචනාධිකරණය වෙත ඉල්ලීමක් යම් තැනැත්තකු විසින් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

ඒ මන්ත්‍රීවරයා විසින් ශ්‍රී ලංකාවේ දේශය තුළ වෙන ම රජයක් පිහිටු වීමට, කෙළින් ම හෝ අන්‍යාකාරයකින්, ශ්‍රී, ලංකාව තුළ දී හෝ ඉන් පිටත දී ආධාර කොට, අනුබල දී, අනුග්‍රහය දක්වා, මුදල් යොදවා, ධෛර්ය දී හෝ දේශනා කොට ඇති බවට ප්‍රකාශයක්, එකී ඉල්ලීම මත, අභියාචනාධිකරණය විසින් කරනු ලැබුවහොත්, ඒ ප්‍රකාශය කරනු ලැබූ දින සිට බලපැවැත්වෙන සේ ඒ මන්ත්‍රීවරයාගේ අසුන හිස් වූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ ප්‍රකාශයේ දින සිට අවුරුදු හතක කාලයකට පාර්ලිමේන්තුවේ අසුන් ගැනීමට සහ ඡන්දය පාවිච්චි කිරීමට සහ පාර්ලිමේන්තුවට තෝරා පත් කර ගනු ලැබීමට හෝ නාමයෝජනා කරනු ලැබීමට ඔහු නුසුදුස්සෙක් වන්නේ ය. ඒ ප්‍රකාශය හේතු කොට ගෙන පාර්ලිමේන්තු මන්ත්‍රීධුරයේ ඇති වන පුරප්පාඩුව (iii) වැනි අනුඡේදයෙන් විධිවිධාන සලස්වා ඇති ආකාරයට පුරවනු ලැබිය යුතු ය.

132- සයවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 4(3) වැනි වගන්තිය මගින් ඇතුළත් කරන ලදී.

මේ අනුඡේදය යටතේ අභියාචනාධිකරණයේ බලතල සම්බන්ධයෙන් එහි අධිකරණ බලය 146 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනුව්‍යවස්ථාවේ අතුරු අනුව්‍යවස්ථාවේ (සඬ) වැනි අනුඡේදයෙන් විධිවිධාන සලස්වා ඇති ආකාරයට ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.]

[133] [(ඉ) කලින් විසුරුවා හරිනු ලැබුවහොත් මිස, ප්‍රථම පාර්ලිමේන්තුව 1989 අගෝස්තු මස 04 වැනි දිනය තෙක් පවත්නේ ය. ඊට වඩා දීර්ඝ කාලයක් නොපවත්නේ ය. එයින් පසු පාර්ලිමේන්තුව විසිරෙන අතර 70 වැනි ව්‍යවස්ථාවේ (5) වැනි අනුව්‍යවස්ථාවේ (අ) ඡේදයෙහි විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ වන්නේ ය.]

**ඇතැම් විධිවිධාන අදාළ වීම**

**162.** (1) 98 වැනි ව්‍යවස්ථාවේ (8) වැනි සහ (9) වැනි අනුව්‍යවස්ථා හැර ඒ ව්‍යවස්ථාවේ විධිවිධාන ද 99 වැනි ව්‍යවස්ථාවේ විධිවිධාන ද ප්‍රථම පාර්ලිමේන්තුව විසුරුවා හැරීමෙන් අනතුරුව පැවැත්වෙන මහ මැතිවරණය තෙක් ක්‍රියාත්මක නො වන්නේ ය.

(2) ප්‍රථම පාර්ලිමේන්තුව එසේ විසුරුවා හරින අවස්ථාව වන විට 97 වැනි ව්‍යවස්ථාවෙන් නියමිත පරිදි මැතිවරණ කොට්ඨාස පිළිබඳ නිවේදනය ප්‍රකාශයට පත් කොට නොමැති නම් ප්‍රථම පාර්ලිමේන්තුව විසුරුවා හැරීමෙන් අනතුරුව පැවැත්වෙන ප්‍රථම මහ මැතිවරණය සඳහා මැතිවරණ කොට්ඨාස හා 96 වැනි ව්‍යවස්ථාවේ (4) වැනි අනුව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර ඒ එක් එක් මැතිවරණ කොට්ඨාසයෙන් තෝරා පත් කිරීමට හිමිකම් ඇති මන්ත්‍රීවරයන් සංඛ්‍යාව, හයවන උපලේඛනයේ දැක්වෙන පරිදි වන්නේ ය. ඒ අනුව එක් එක් මැතිවරණ කොට්ඨාසය සඳහා ඡන්ද හිමි නාමලේඛන පිළියෙළ කොට සහතික කළ යුත්තේ ය. තව ද, පාර්ලිමේන්තුව විසින් අන්‍යාකාර විධිවිධාන සැලැස්වුවහොත් මිස ඒ නාම ලේඛන, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වන තෙක් බලපැවැත්වූ ඡන්ද හිමි නාමලේඛන පදනම් කොට ගෙන පිළියෙල කරනු ලැබිය යුත්තේ ය.

**ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ මහාධිකරණවල විනිශ්චයකාරවරයන් ධුර දැරීම නතර විය යුතු බව**

**163.** ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනත යටතේ පිහිටුවන ලද ශ්‍රේෂ්ඨාධිකරණයෙහි සහ මහාධිකරණයෙහි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙර දිනයේ දී ධුර දැරූ සියලුම විනිශ්චයකාරවරයන් විසින් ඒ ධුර දැරීම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වූ විට නතර වන්නේ ය.

**විනිශ්චයකාරවරන්, රජයේ නිලධරයන් සහ වෙනත් අය ඉදිරියටත් සේවයේ තබාගැනීම**

**164.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වන තෙක් -

(අ) 105 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනුව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර, පාර්ලිමේන්තුව විසින් ඇති කොට පිහිටුවන ලද

133- හතර වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 2 වැනි වගන්තිය මගින් මුල් (ඉ) ඡේදය ඉවත් කොට, ආදේශ කරන ලදී.

අධිකරණයක් හෝ විනිශ්චය අධිකාරයක් ලෙස සැලකෙන අධිකරණයක හෝ විනිශ්චය අධිකාරයක ධුරයක් දැරුවා වූ ; හෝ

(ආ) ජනරජයේ හෝ යම්කිසි පළාත් පාලන ආයතනයක හෝ රාජ්‍ය සංස්ථාවක හෝ සේවයෙහි නියුක්තව සිටියා වූ; හෝ

(ඇ) යම්කිසි පළාත් පාලන ආයතනයක හෝ රාජ්‍ය සංස්ථාවක හෝ ධුරයක් දැරුවා වූ ; හෝ

(ඈ) යම්කිසි පවත්නා ලිඛිත නීතියක් යටතේ යම් පත්වීමක් දැරුවා වූ හෝ,

සෑම තැනැත්තෙක් ම, 163 වැනි ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව ඒ ඒ සේවාවන්ට හෝ ධුරවලට හෝ පත්වීම්වලට හෝ අදාළ කොන්දේසි හා නියමයන් යටතේ තවදුරටත් ධුරය හෝ පත්වීම දරන්නේ ය.

**රජයේ නිලධරයන් සහ වෙනත් අය ප්‍රතිඥාව හෝ දිවුරුම දිය යුතු බව**

**165.** (1) සෑම රජයේ නිලධරයකු ද අධිකරණ නිලධරයකු ද ස්වකීය ධුරයේ කටයුතු භාර ගැනීමේ දී ප්‍රතිඥා දීමට හෝ දිවුරුම් දීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් නියමිතව ඇති සෙසු සෑම තැනැත්තකු ද පවත්නා නීතිය යටතේ නිල ප්‍රතිඥාවක් හෝ දිවුරුමක් හෝ දීමට නියමිත ධුරයක් දරන සෑම තැනැත්තෙකු ද සෑම පළාත් පාලන ආයතනයක ම සහ සෑම රාජ්‍ය සංස්ථාවකම සේවයෙහි නියුක්ත සෑම තැනැත්තකු ද හතරවන උපලේඛනයෙහි දැක්වෙන ප්‍රතිඥාව නැතහොත් දිවුරුම දී ඊට අත්සන් කළ යුත්තේ ය. එසේ ප්‍රතිඥා දී නැතහොත් දිවුරුම් දී අත්සන් තැබීමට නියමිත රජයේ නිලධරයකු හෝ අධිකරණ නිලධරයකු හෝ තැනැත්තකු හෝ ධුරයක් දරන්නකු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වූ පසු ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අග්‍රාමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් දිනයක හෝ එදිනට පෙර ප්‍රතිඥා දීම නැතහොත් දිවුරුම් දීම හා ඊට අත්සන් තැබීම නොකළහොත් ඒ රජයේ නිලධරයා හෝ අධිකරණ නිලධරයා හෝ තැනැත්තා හෝ ධුරයක් දරන්නා සේවයෙන් හෝ නිලයෙන් හෝ පහ වන්නේ ය.

(2) මේ ව්‍යවස්ථාවේ (1) වැනි අනුව්‍යවස්ථාවේ සඳහන් යම්කිසි රජයේ නිලධරයකුට හෝ අධිකරණ නිලධරයකුට හෝ තැනැත්තකුට හෝ ධුරයක් දරන්නකුට නියමිත කාල සීමාව තුළ ප්‍රතිඥාව නැතහොත් දිවුරුම දිය නොහැකි වුවහොත් එසේ ප්‍රතිඥාව නැතහොත් දිවුරුම දිය නොහැකි වූයේ රෝගාතුර වීම නිසා හෝ වෙනත් යම් නොවැළැක්විය හැකි කාරණයක් නිසා හෝ බව රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයා පිළිගතහොත් හුදෙක් ඒ අමාත්‍යවරයාගේ අභිමතය පරිදි ඒ රජයේ නිලධරයාට හෝ අධිකරණ නිලධරයාට හෝ තැනැත්තාට හෝ ධුරය දරන්නාට හෝ නියමිත දිනට පසුව ප්‍රතිඥාව නැතහොත් දිවුරුම දීම සඳහා අවසර දීමට ඒ අමාත්‍යවරයාට බලය

ඇත්තේ ය. ඒ රජයේ නිලධරයා හෝ අධිකරණ නිලධරයා හෝ තැනැත්තා හෝ ධුරයක් දරන්නා ඒ ප්‍රතිඥාව නැතහොත් දිවුරුම දුන් විට මේ ව්‍යවස්ථාවේ (1) වැනි අනුව්‍යවස්ථාව යටතේ නියම කරනු ලබන්නා වූ කාල සීමාව තුළ ඒ ප්‍රතිඥාව නැතහොත් දිවුරුම දුන්නාක් සේ ඒ රජයේ නිලධරයා හෝ අධිකරණ නිලධරයා හෝ තැනැත්තා හෝ ධුරය දරන්නා ඉදිරියටත් සේවයෙහි නියුක්ත වන්නේ ය; ධුරය දරන්නේ ය.

(3) ජනාධිපතිවරයා විසින් ප්‍රකාශනයක් මගින් -

(අ) මේ ව්‍යවස්ථාවේ (1) වැනි අනුව්‍යවස්ථාවේ විධිවිධානවල බලපෑමෙන් යම්කිසි රජයේ නිලධර ගණයක් බැහැර කළ හැක්කේ ය;

(ආ) පවත්නා නීතිය යටතේ ප්‍රතිඥාව හෝ දිවුරුම ගැනීමට බලය ඇති තැනැත්තන්ට අතිරේකව ඒ ප්‍රතිඥාව හෝ දිවුරුම ගත හැක්කේ කවර තැනැත්තන් හෝ කවර ගණවල තැනැත්තන් හෝ විසින් ද යන වග නියම කළ හැක්කේ ය.

**166.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වන තෙක් ක්‍රියාත්මක කළා වූ ද, කළ හැකි වූ ද බලතල හා වරප්‍රසාද ද පරිහාර හා අයිතිවාසිකම් ද ඇතුළු සියලු බලමහිමය, පාර්ලිමේන්තුව වෙනත් අන්‍යාකාර විධිවිධාන සැලැස්වුවහොත් මිස, ශ්‍රී ලංකා ජනරජයට හිමි වන්නේ ය. ශ්‍රී ලංකා ජනරජය ඒ සියලු බලමහිමය දරා ක්‍රියාත්මක කරන්නේ ය.

**ජනරජයේ බලතල, වරප්‍රසාද, පරිහාර හා අයිතිවාසිකම්**

**167.** කවර වූ හෝ ආකාරයකින් ඇතිව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වන තෙක් ශ්‍රී ලංකාණ්ඩුවට අයත්ව තිබුණා වූ යම්කිසි අයිතිවාසිකමක්, යුතුකමක් හෝ බැඳීමක් හෝ වේ ද ඒ සියලු අයිතිවාසිකම්, යුතුකම් හා බැඳීම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ශ්‍රී ලංකා ජනරජයේ ආණ්ඩුවට පැවරෙන්නේ ය.

**ජනරජයේ අයිතිවාසිකම්, යුතුකම් හා බැඳීම්**

**168.** (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ වෙනත් විධිවිධාන ප්‍රකාශිතවම ඇතොත් හැර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වන තෙක් බලපැවැත්වූ සියලු ම නීති, ලිඛිත නීති හා ලිඛිත නොවූ නීති පාර්ලිමේන්තුව අන්‍යාකාර විධිවිධාන සැලැස්වුවහොත් මිස අවශ්‍ය වෙනස් කිරීම් ඇතිව නොකඩවා බල පැවැත්විය යුත්තේ ය.

**ඉකුත්ව ගිය කාලය තුළ නීතියෙහි ක්‍රියාකාරිත්වය සහ කලින් කරන ලද ක්‍රියා, වැරදි සහ විනිශ්චයට නියමව ඇත්තා වූ නඩු ආදිය.**

(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ වෙනත් විධිවිධාන ඇතොත් මිස පවත්නා නීති, ලිඛිත නීති සහ ලිඛිත නොවූ නීති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන නො වන්නේ ය. එකී නීති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන වශයෙන් කිසිසේත් නොසැලකෙන්නේ ය.

(3) පාර්ලිමේන්තුව අන්‍යාකාර විධිවිධාන සැලැස්වුවහොත් මිස හෝ අන්‍යාකාර විධිවිධාන සලස්වන තෙක් හෝ යම් කිසි පවත්නා නීතියක්, ලිඛිත නීතියක් හෝ ලිඛිත නොවූ නීතියක් හෝ

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ යම්කිසි විධිවිධානයක් හෝ නොකඩවා බල පැවැත්විය යුතු බවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන සලසා ඇති විටක පාර්ලිමේන්තුව විසින් එසේ අන්‍යාකාර විධිවිධාන සලස්වන නීතියක් වෙතොත් එම නීතිය රැස්වීමට පැමිණ ඡන්දය දෙන්නා වූ මන්ත්‍රීවරයන්ගේ බහුතර ඡන්දයෙන් සම්මත කර ගැනීමට පාර්ලිමේන්තුවට බලය ඇත්තේ ය.

(4) පාර්ලිමේන්තුව අන්‍යාකාර විධිවිධාන සැලැස්වුවහොත් මිස හෝ අන්‍යාකාර විධිවිධාන සලස්වන තෙක් හෝ යම්කිසි පවත්නා ලිඛිත නීතියක යම්කිසි විධිවිධානයක් නොකඩවා බලපැවැත්විය යුතු බවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන සලස්වා ඇති විටක, එකී ලිඛිත නීතියට අනුනීති ද ඇතුළත් වන්නේ නම්, පාර්ලිමේන්තුව අන්‍යාකාර විධිවිධාන සැලැස්වුවහොත් මිස හෝ අන්‍යාකාර විධිවිධාන සලස්වන තෙක් හෝ ඒ අනුනීති සෑදීමට ද සෑදූ අනුනීති සංශෝධනය කිරීමට, වෙනස් කිරීමට, පරිච්ඡින්න කිරීමට හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීමට ද යම්කිසි තැනැත්තකුට හෝ ආයතනයකට බලය පවරා ඇත්තේ ද ඒ තැනැත්තාගේ හෝ ඒ ආයතනයෙහි එකී බලය, පාර්ලිමේන්තුව අන්‍යාකාර විධිවිධාන සැලැස්වුවහොත් මිස හෝ අන්‍යාකාර විධිවිධාන සලස්වන තෙක් හෝ එකී ලිඛිත නීතිය නොකඩවා බලපැවැත්විය යුත්තේ ය යන විධිවිධානයෙන්, කිසිසේත් හීන නොවන්නාක් සේ සැලකෙන්නේ ය.

(5) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අන්‍යාකාර විධිවිධාන සලසා ඇතොත් මිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භවීමට පෙර බලපැවැත් වූ යම්කිසි නීතියක ඉකුත්ව ගිය කාලය තුළ වූ ක්‍රියාකාරිත්වය කෙරෙහි හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වීමට පෙර බලපැවැත් වූ යම්කිසි නීතියක් යටතේ යථා පරිදි කරන ලද්දා වූ යම් කිසිවක් වේ නම් එය කෙරෙහි හෝ යම්කිසිවක් විඳින ලද්දේ නම් එය කෙරෙහි හෝ යම්කිසි වරදක් කරන ලද්දේ නම් ඒ වරද කෙරෙහි හෝ යම්කිසි අයිතිවාසිකමක් අත්වූයේ නම් ඒ අයිතිවාසිකම කෙරෙහි හෝ යම්කිසි නිදහසක් ලැබුවේ නම් ඒ නිදහස කෙරෙහි හෝ යම් කිසි බැඳීමකට යටත් වූයේ නම් ඒ බැඳීම කෙරෙහි හෝ යම්කිසි දණ්ඩනයක් වින්දේ නම් ඒ දණ්ඩනය කෙරෙහි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වීමෙන් කවර වූ හෝ ආකාරයක බලපෑමක් ඇති නොවන්නේ ය; බලපෑමක් ඇත්තා සේ ද නොසැලකෙන්නේ ය.

(6) යම්කිසි පවත්නා ලිඛිත නීතියකින් හෝ පවත්නා ලිඛිත නීතියක් යටතේ හෝ පත් කරන ලද්දා වූ හෝ පිහිටුවන ලද්දා වූ හෝ කොමිෂන් සභා විසින් ඉටු කිරීමට හෝ නිම කිරීමට තිබුණා වූ ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වීමට පෙර එසේ ඉටු නොකරන ලද්දා වූ හෝ නිම නොකරන ලද්දා වූ හෝ නඩු කටයුතු ඇතුළු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වීමට පෙර විනිශ්චයට නියම වී තිබුණා වූ හෝ විනිශ්චයට භාජනය වී තිබුණා වූ හෝ සියලුම නඩු හෝ නඩු කටයුතු, කාරණා හෝ දේවල්

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත් ව ද අවශ්‍ය වෙනස් කිරීම් ඇතිව ද ඉදිරියටත් පවත්නා සේ සැලකෙන අතර, ඒ කොමිෂන් සභාවල සියලුම කටයුතු ඇතුළු සියලුම නඩු හෝ නඩු කටයුතු, කාරණා හෝ දේවල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වීමෙන් අනතුරුව ඉදිරියටත් පවත්වා නිම කළ හැක්කේ ය.

**169.** පාර්ලිමේන්තුව විසින් අන්‍යාකාර විධිවිධාන සලස්වන්නේ නම් මිස,- අධිකරණයට අදාළ විධිවිධාන

(1) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනතේ යම් විධිවිධාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනනුකූල වන්නේ ද, ඒ විධිවිධාන ඒ අනනුකූලතාවේ ප්‍රමාණයට පරිච්ඡින්න කරන ලද සේ සැලකිය යුත්තේ ය;

(2) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනතින් පිහිටුවන ලද ශ්‍රේෂ්ඨාධිකරණයේ පැවැත්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වූ විට නතර වන්නේ ය. ඒ අනුව එකී ශ්‍රේනෂ්ඨාධිකරණය පිහිටුවීමට අදාළ ඒ පනතේ විධිවිධාන පරිච්ඡින්න කරන ලද සේ සැලකිය යුත්තේ ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි අන්යාරකාර විධිවිධාන සලස්වා ඇතහොත් මිස, යම් පවත්නා නීතියක ශ්‍රේෂ්ඨාධිකරණය ගැන කර ඇති සෑම සඳහන් කිරීමක් ම, අභියාචනාධිකරණය ගැන කර ඇති සඳහන් කිරීමක් සේ සැලකිය යුත්තේ ය;

(3) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනත යටතේ පිහිටුවන ලද ශ්‍රේෂ්ඨාධිකරණයෙහි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වීමට පෙර දිනයෙහි විභාගයට භාජනව පැවති පරිශෝධන වශයෙන් වූ හෝ අධිකරණයේ තීරණය සඳහා යොමු කළ කාරණා වශයෙන් වූ හෝ යථා තත්ත්වයට පැමිණවීම වශයෙන් වූ හෝ නඩු කටයුතු ද ඇතුළුව සියලු අභියාචනා නඩු කටයුතු අභියාචනාධිකරණයට භාර වන්නේය. ඒ නඩු කටයුතු සංජානනය කිරීමට සහ විභාග කොට තීරණය කිරීමට අධිකරණ බලය අභියාචනාධිකරණයට ඇත්තේ ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වීමට පෙර ඉහත කී ශ්‍රේෂ්ඨාධිකරණය විසින් අභියාචන නඩු කටයුතුවල දී ප්‍රකාශ කරන ලද නඩු තීන්දු හෝ කරන ලද ආඥා අභියාචනාධිකරණය විසින් ප්‍රකාශ කරන ලද හෝ කරන ලද නඩු තීන්දු හෝ ආඥා මෙන් වලංගු හා බල සහිත වන්නේ ය;

(4) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනත යටතේ පිහිටුවන ලද ශ්‍රේෂ්ඨාධිකරණයෙහි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වීමට පෙර

දිනයෙහි විභාගයට භාජනව පැවති, පරමාධිකාර රිට් ආඥා නිකුත් කරවා ගැනීම සඳහා වූ ඉල්ලීම් හා වෙනත් කවර වුව ද සහන සඳහා වූ ඉල්ලීම් වශයෙන් වූ සියලු මුල් නඩු කටයුතු ද, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනත යටතේ පිහිටුවන ලද මහාධිකරණයෙහි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මකවීම ආරම්භ වීමට පෙර දිනයෙහි විභාගයට භාජනව පැවති ඉන්ජන්ෂන් තහනම් සඳහා වූ සියලු ඉල්ලීම් වශයෙන් වූ සියලු මුල් නඩු කටයුතු ද, අභියාචනාධිකරණයට භාර වන්නේ ය. තව ද, ඒ සියලු නඩු කටයුතු සංජානනය කිරීමට, විභාග කිරීමට සහ තීරණය කිරීමට හෝ පවත්වාගෙන යාමට සහ නිම කිරීමට අධිකරණ බලය අභියාචනාධිකරණයට ඇති අතර, එකී යුක්තිය පසිඳලීමේ පනත යටතේ පිහිටුවන ලද ශ්‍රේෂ්ඨාධිකරණය විසින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වීමට පෙර මුල් නඩු කටයුතුවල දී ප්‍රකාශ කරන ලද නඩු තීන්දු සහ කරන ලද ආඥා, අභියාචනාධිකරණය විසින් ප්‍රකාශ කරන ලද්දක් හෝ කරන ලද්දක් මෙන් වලංගු හා බල සහිත වන්නේ ය :

එසේ වුව ද, සිදු කර ඇතැයි කියනු ලබන පාර්ලිමේන්තු වරප්‍රසාද කඩ කිරීමකට අදාළව ශ්‍රේෂ්ඨාධිකරණයෙහි විභාගයට භාජනව පවතින යම් නඩු කටයුත්තක්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඇති කොට පිහිටුවන ලබන ශ්‍රේෂ්ඨාධිකරණයට භාර වන්නේ ය;

(5) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනත යටතේ පිහිටුවන ලද ශ්‍රේෂ්ඨාධිකරණයේ යම් නඩු තීන්දුවකට, ආඥාවකට හෝ තීන්දු ප්‍රකාශයකට විරුද්ධව කිසිම අභියාචනයක්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ඇති කොට, පිහිටුවන ලද ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කළ නොහැක්කේ ය. ඒ නඩු තීන්දුව, ආඥාව හෝ තීන්දු ප්‍රකාශය කරන ලද්දේ යම් නඩුවක දී ද, ඉල්ලීමක දී ද, නැතහොත් වෙනත් නඩු කටයුත්තක දී ද, ඒ නඩුවේ, ඉල්ලීමේ හෝ නඩු කටයුත්තේ පාර්ශ්වකරුවන් අතර, අවස්ථාවෝචිත පරිදි, ඒ නඩු තීන්දුව, ආඥාව හෝ තීන්දු ප්‍රකාශය අවසානාත්මක වන්නේ ය :

එසේ වුව ද, ඒ නඩු තීන්දු, ආඥා සහ තීන්දු ප්‍රකාශ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඇති කොට පිහිටුවන ලද අභියාචනාධිකරණය විසින් ප්‍රකාශ කරන ලද්දක් මෙන් හෝ කරන ලද්දක් මෙන්, ඒ නඩු තීන්දු, ආඥා සහ තීන්දු ප්‍රකාශ සම්පූර්ණයෙන් ම සහ ඵලදායී ලෙස පිළිපදින බවට වග බලා ගනු පිණිස, ඒ තීන්දු ප්‍රකාශ එවකට සටහන් කොට නොමැති නම් තීන්දු ප්‍රකාශ සටහන් කිරීම ද නඩු

ගාස්තු තක්සේරු කිරීම හා අය කර ගැනීම ද ඇතුළුව, අවශ්‍ය සියලු පියවර ගැනීමට අභියාචනාධිකරණයට සහ ඒ අධිකරණයේ සියලු නිලධරයන්ට බලය ඇත්තේ ය. ඒ අධිකරණය විසින් සහ ඒ අධිකරණයේ සියලු නිලධරයන් විසින් ඒ සියලු පියවර ගත යුත්තේ ය;

(6) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනතේ I වන පරිච්ඡේදය යටතේ පිහිටුවන ලද මහාධිකරණවලින්, ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණය යනුවෙන් හඳුන්වනු ලබන්නා වූ ද තත් කාලයෙහි වලංගුව බල පවත්නා නීතියට අනුකූල ව ඒ ඒ කලාපවල අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා ජනරජය මුළුල්ලේ ම අධිකරණ බලය ඇත්තා වූ ද, පාර්ලිමේන්තුව විසින් ඇති කොට පිහිටුවනු ලැබුවා වූ ද එක් අධිකරණයක් සංස්ථාපනය වන ලෙස සියලු කාර්යය සඳහා සැලකිය යුත්තේ ය. තව ද, ඒ අනුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට සහ යම් පවත්නා ලිඛිත නීතියක විධිවිධානවලට යටත් ව, මහාධිකරණවලට අදාළ ව එකී පනතේ ඇතුළත් සියලු විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිත ව, ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණයට අදාළ වන්නේ ය;

(7) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනත යටතේ පිහිටුවන ලද මහාධිකරණවල, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මකවීම ආරම්භවීමට පෙර දිනයේ දී විභාගයට භාජනව පැවැති, ඉන්ජන්ෂන් තහනම් සඳහා වූ ඉල්ලීම් හැර සියලු අපරාධ නඩු කටයුතු, අද්මිරාල්ති නඩු, නඩු කටයුතු හෝ කාරණා ඉහත කී ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණයට භාර වන අතර, ඒවා සංජානනය කිරීමට, විභාග කිරීමට හා තීරණය කිරීමට හෝ පවත්වාගෙන ගොස් නිම කිරීමට අධිකරණ බලය ඒ මහාධිකරණයට ඇත්තේ ය. තව ද, ඉහත කී මහාධිකරණය විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මකවීම ආරම්භ වීමට පෙර ප්‍රකාශ කරන ලද නඩු තීන්දු සහ කරන ලද ආඥා ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණය විසින් ප්‍රකාශ කරනු ලැබුවාක් මෙන් හෝ කරන ලද්දක් මෙන් වලංගු හා බල සහිත වන්නේ ය;

(8) අභියාචනාධිකරණයේ සභාපතිවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි කලාපවල ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණයේ අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම සඳහා යෝග්‍ය යැයි ඔහු සලකන පරිදි කලින් කල, ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණයේ විනිශ්චයකාරවරයන් නම් කරනු ලැබිය යුත්තේ ය. තව ද, මහාධිකරණයේ විභාගයට භාජනව ඇති හෝ මින් මතු මහාධිකරණයෙහි පවරනු ලබන හෝ සියලු නඩු කටයුතු විභාග කොට නිම කිරීම

සම්බන්ධයෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනතේ II වැනි පරිච්ඡේදයේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ වන්නේ ය;

(9) ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණය වෙත මින් මතු ඉදිරිපත් කරනු ලබන සියලු අධිචෝදනා ශ්‍රී ලංකා ජනරජයේ නාමයෙන් විය යුත්තේ ය. තව ද, නීතිපතිවරයා විසින් හෝ ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනතේ 189 වැනි වගන්තිය යටතේ බලය දී ඇති යම් තැනැත්තකු විසින් හෝ ඒ සියලු අධිචෝදනා අත්සන් කළ යුත්තේ ය;

(10) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනත යටතේ ඇති කොට පිහිටුවන ලද මහාධිකරණවල, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වීමට පෙර දිනයේ විභාගයට භාජනව පැවැති, ජාතික රාජ්‍ය සභාවේ මන්ත්‍රී ධුරයකට යම් තැනැත්තකු තෝරා පත් කර ගැනීම සම්බන්ධයෙන් වූ ඡන්ද පෙත්සම් පිළිබඳ සියලු නඩු කටයුතු අභියාචනාධිකරණයට භාර වන්නේ ය. තව ද, ඒ සියලු නඩු කටයුතු සංජානනය කිරීමට, විභාග කිරීමට හා තීරණය කිරීමට හෝ පවත්වාගෙන ගොස් නිම කිරීමට එකී අධිකරණවලට ඇති බලයම අභියාචනාධිකරණයට ඇති අතර, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනත යටතේ ඇතිකොට පිහිටුවන ලද ශ්‍රේෂ්ඨාධිකරණය හෝ මහාධිකරණ හෝ විසින් එවැනි ඡන්ද පෙත්සම් පිළිබඳ නඩු කටයුතුවල දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වීමට පෙර ප්‍රකාශ කරන ලද නඩු තීන්දු සහ කරන ලද ආඥා, අවස්ථාවෝචිත පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඇති කොට පිහිටුවන ලද ශ්‍රේෂ්ඨාධිකරණය සහ අභියාචනාධිකරණය විසින් ප්‍රකාශ කරන ලද නඩු තීන්දු සහ කරන ලද ආඥා පරිද්දෙන් වලංගු හා බල සහිත වන්නේ ය. යම් ඡන්ද පෙත්සමක් විභාග කොට තීරණය කිරීමේ අධිකරණ බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් අභියාචනාධිකරණය වෙත පවරා ඇත්තේ ද ඒ ඡන්ද පෙත්සම විභාග කොට තීරණය කිරීමට අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයකු නම් කිරීමේ බලය අභියාචනාධිකරණයේ සභාපතිවරයාට මෙයින් පවරනු ලබන්නේය;

(11) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනතේ විධිවිධාන යටතේ නීතිඥවරයන් වශයෙන් පිළිගෙන බඳවා ගන්නා ලද හෝ එසේ පිළිගෙන බඳවා ගන්නා ලදැයි සලකනු ලබන හෝ සියලු නීතිඥවරයන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට

යටත් ව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඇතිකොට පිහිටුවන ලද ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයන් වශයෙන් පිළිගෙන බඳවා ගනු ලැබුවාක් මෙන් සැලකිය යුත්තේය;

(12) ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ හෝ මහාධිකරණයේ හෝ විනිශ්චයකාරවරයකු ඉදිරියේ දී නැතහොත් 114 වැනි ව්‍යවස්ථාවේ විස්තර කොට දක්වා ඇති වෙනත් යම් අධිකරණ නිලධරයකු ඉදිරියේ දී, මෙහි හතරවන උපලේඛනයේ දැක්වෙන ප්‍රතිඥාව හෝ දිවුරුම දී අත්සන් කරන තෙක් හෝ කරතහොත් මිස, ගැසට් පත්‍රයේ පළ කරන නියමයකින් අධිකරණ විෂයය භාර අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයෙන් පසු කිසිදු නීතිඥවරයකුට, යම් අධිකරණයක දී විනිශ්චය අධිකාරයක දී හෝ වෙනත් ආයතනයක දී නඩු කටයුත්තක යම් පාර්ශ්වකරුවකු නියෝජනය කිරීමට හෝ පෙනී සිට කරුණු ඉදිරිපත් කිරීමට හෝ හිමිකමක් නැත්තේ ය. එසේ ප්‍රතිඥා දී හෝ දිවුරුම් දී අත්සන් කරනු ලබන ප්‍රතිඥාව හෝ දිවුරුම ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවීම, අවස්ථාවෝචිත පරිදි, ඒ විනිශ්චයකාරවරයාගේ, නැතහොත් අධිකරණ නිලධරයාගේ කාර්යය වන අතර, ඒ රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ ප්‍රතිඥාව හෝ දිවුරුම ඒ අධිකරණයේ නාමලේඛනවල සටහන් කළ යුත්තේ ය. ඒ නීතිඥවරයා විසින් ඒ ප්‍රතිඥාව හෝ දිවුරුම දී අත්සන් කර ඇති බවට එකම සාක්ෂිය එකී සටහන වන්නේ ය;

(13) නීතිපතිවරයා, නීතිඥ වෘත්තිය, රජයේ නීතිඥවරයන් සහ රජයේ අධිනීතිඥවරයන් සම්බන්ධයෙන් ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනතේ ඇති සියලූ විධිවිධාන ක්‍රියාත්මක වන සේ සියලූ කාර්යය සඳහා සැලකිය යුතු අතර, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනතේ 33 සිට 36 දක්වා වූ වගන්තිවල සහ එයට අදාළ සියලූ රීතිවල හා නියෝගවල ශ්‍රේෂ්ඨාධිකරණය පිළිබඳව කර ඇති සෑම සඳහන් කිරීමක් ම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඇති කොට පිහිටුවන ලද ශ්‍රේෂ්ඨාධිකරණය පිළිබඳව කර ඇති සඳහන් කිරීමක් සේ සැලකිය යුත්තේ ය;

(14) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ යම් ලිඛිත නීතියක හෝ විධිවිධාන සලස්වා නොමැති වූ ද යම් අධිකරණයක් විසින් අනුගමනය කළ යුතු වූ ද යම් කාර්ය පටිපාටියක් නැතහොත් පරිචයක් සම්බන්ධයෙන් යම් කාරණයක් හෝ ප්‍රශ්නයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වීමේ ප්‍රතිඵලයක් වශයෙන් උද්ගත වුවහොත්, අසාධාරණයක් සිදු වීම වැළැක්වීම සඳහා හෝ අවස්ථානුගතව යුක්තිය ඉෂ්ඨ කිරීම සඳහා සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XV වැනි

සහ XVI වැනි පරිච්ඡේදවල විධිවිධාන සම්පූර්ණයෙන් ම ද අනුනව ද එල ගැන්වෙන බවට වගබලා ගැනීම සඳහා අවශ්‍ය යැයි අග්‍ර විනිශ්චයකාරවරයා විසින් සලකනු ලබන විධාන කිරීමේ බලය අග්‍ර විනිශ්චයකාරවරයාට ඇත්තේ ය;

(15) (i) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 7 දරන විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 2 වැනි වගන්තියෙහි ශ්‍රේෂ්ඨාධිකරණය ගැන කර ඇති යම් සඳහනක් වෙතොත් එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පිහිටුවන ලද ශ්‍රේෂ්ඨාධිකරණය ගැන වූ සඳහනක් ලෙස සලකනු ලැබිය යුත්තේ ය;

(ii) යම් තැනැත්තකු, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 7 කරන විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පිහිටුවන ලද විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක සාමාජිකයකු ලෙස පත් කරනු ලැබ ඇති අවස්ථාවක, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවල කුමක් සඳහන් ව ඇත ද එම තැනැත්තා තවදුරටත් එසේ සාමාජිකයෙකු ව සිටිය යුත්තේ ය; තව ද, එම තැනැත්තා ඉල්ලා අස් වුවහොත් හෝ කටයුතු කිරීම ප්‍රතික්ෂේප කළහොත් හෝ කටයුතු කිරීමට ඔහුට නොහැකි වුවහොත් හෝ, එවැනි සාමාජිකයකු ලෙස ස්වකීය කාර්යය ඉටු කිරීමෙන් ජනාධිපතිවරයා විසින් ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 7 දරන විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා පනතේ විධිවිධාන අනුව ඔහු මුදා හරිනු ලැබුවහොත් හෝ මිස, එම තැනැත්තා 81 වැනි ව්‍යවස්ථාවේ (1) වැනි අනුව්‍යවස්ථාවේ කාර්යය සඳහා එහි සඳහන් අධිකරණයෙහි විනිශ්චයකාරවරයකු ලෙස සලකනු ලැබිය යුත්තේ ය;

(iii) විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් පිහිටුවන අධිකාර පත්‍රයෙහි, සභාපතිවරයා වශයෙන් නිශ්චිතව සඳහන් යම් තැනැත්තකු මේ අනුව්‍යවස්ථාවේ (ii) වැනි අනුඡේදයෙහි විධිවිධානවලට යටත්ව, එම විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවෙහි සභාපතිවරයා ලෙස තවදුරටත් කටයුතු කළ යුත්තේ ය;

(16) (i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වන තෙක් ක්‍රියාත්මකව පැවැති ජාතික රාජ්‍ය සභාවේ යම් වරප්‍රසාද කඩ කිරීමක් පාර්ලිමේන්තුවේ වරප්‍රසාද කඩ කිරීමක් ලෙස සලකනු ලැබිය යුත්තේ ය. ඒ අනුව පාර්ලිමේන්තුවේ ඒ වරප්‍රසාද කඩ කිරීම

සංජානනය කර, යම් තැනැත්තකුට නීතියට අනුව දඬුවම් කිරීමේ බලය පාර්ලිමේන්තුවට සහ ශ්‍රේෂ්ඨාධිකරණයට ඇත්තේ ය;

(ii) මේ ඡේදයේ (i) වැනි අනුඡේදයෙහි සඳහන් පාර්ලිමේන්තුවේ වරප්‍රසාද කඩ කිරීමක් සංයුක්ත කෙරෙතැයි කියනු ලබන යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සම්බන්ධයෙන් හෝ යම් ක්‍රියාවකට හෝ නොකර හැරීමකට අදාළව හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වීමට පෙර, සංශෝධිත පරිදි වූ පාර්ලිමේන්තු (බලතල සහ වරප්‍රසාද) පනතින් නියමිත බලය පවරා ඇති යම් පියවරක් ගෙන ඇති අවස්ථාවක, ඒ පියවර වලංගු ලෙස ගෙන ඇතැයි සැලකිය යුත්තේ ය; තව ද, පාර්ලිමේන්තුවේ එම වරප්‍රසාද කඩ කිරීම සංයුක්ත වන ක්‍රියාව හෝ නොකර හැරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වීමෙන් පසුව කරනු ලැබ හෝ සිදු වී ඇත්තාක් මෙන්, ඒ කරන ලදැයි කියනු ලබන වරප්‍රසාද කඩ කිරීම සම්බන්ධයෙන් හෝ වරප්‍රසාද කඩ කිරීමට අදාළව හෝ, ඒ පනත යටතේ නියමිත හෝ බලය පවරා ඇති යම් පියවර තවදුරටත් ගැනීම කරනු ලැබිය හැක්කේ ය.

**රාජ නීතිඥවරයන්ට සහ ජ්‍යෙෂ්ඨ නීතිඥවරයන්ට අදාළ විධිවිධාන**

[134][**169අ.** (1) (අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වීමට පෙරාතුව පත් කරන ලද සෑම රාජ නීතිඥවරයෙක් ද,

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වීමෙන් පසුව ජනාධිපතිවරයා විසින් පත් කරන ලද සෑම ජ්‍යෙෂ්ඨ නීතිඥවරයෙක් ද,

මේ ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ පටන් ජනාධිපති නීතිඥවරයා යනුවෙන් ද හඳුන්වනු ලබන අතර එතෙක් රාජ නීතිඥවරයකු විසින් භුක්ති විඳින ලද සියලු වරප්‍රසාද තවදුරටත් භුක්ති විඳින්නාහ.

(2) ජ්‍යෙෂ්ඨ නීතිඥවරයන් පත් කිරීම සම්බන්ධයෙන් 136 වැනි ව්‍යවස්ථාව යටතේ සාදන ලද සෑම රීතියක් ම, මේ ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ පටන් පරිච්ඡින්න කරනු ලැබූ සේ සැලකෙන්නේ ය.

(3) කවර වූ හෝ ලිඛිත නීතියක, "ජ්‍යෙෂ්ඨ නීතිඥවරයකු" පිළිබඳව ඇති සෑම සඳහනකට ම, මේ ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ පටන් "ජනාධිපති නීතිඥවරයකු" පිළිබඳ සඳහනක් ද ඇතුළත් වන්නාක් සේ සැලකෙන්නේ ය.]

134 - අට වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 4 වැනි වගන්තිය මගින් ඇතුළත් කරන ලදී.

## XXII වැනි පරිච්ඡේදය

### අර්ථ නිරූපණය

අර්ථ නිරූපණය

**170.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි -

"අධිකරණ නිලධරයා" යන්නෙන් [135] [111 ඕ ව්‍යවස්ථාවේ හැර] -

(අ) ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයකු ලෙස හෝ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයකු ලෙස හෝ ධුරය දරන කවර වූ හෝ තැනැත්තෙක් අදහස් වේ ;

(ආ) මහාධිකරණ විනිශ්චයකාරවරයකු ලෙස හෝ යුක්තිය පසිඳලීම සඳහා නැතහොත් කාර්මික හෝ වෙනත් ආරාවුල් විනිශ්චය කොට නිරවුල් කිරීම සඳහා ඇති කොට පිහිටුවන ලද වෙනත් කවර වූ හෝ මුල් අවස්ථා අධිකරණයක, විනිශ්චය අධිකාරයක හෝ ආයතනයක විනිශ්චයකාරවරයකු මූලාසනාරූඪ නිලධරයකු හෝ සාමාජිකයකු ලෙස ධුරය දරන කවර වූ හෝ තැනැත්තෙක් අදහස් වේ. එහෙත්, සමථයකට පත් කිරීමේ කාර්යය ඉටු කරන තැනැත්තෙක් හෝ අධිකරණ ස්වභාවයක වූ කටයුතු ඉටු කිරීම තමාගේ ප්‍රධාන කාර්යය හෝ කාර්යය හෝ නොවන රජයේ නිලධරයෙක් ඊට ඇතුළත් නොවේ ;

යම් තැනැත්තකු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අර්ථානුකූලව අධිකරණ නිලධරයකු ද යන ප්‍රශ්නය තීරණය කිරීමට කිසිම අධිකරණයකට, විනිශ්චය අධිකාරයකට හෝ ආයතනයකට අධිකරණ බලය නැත්තේ ය. එවැනි ප්‍රශ්නයක් වේ නම් එය අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් නිශ්චය කළ යුත්තේ ය. ඒ පිළිබඳව අධිකරණ සේවා කොමිෂන් සභාවේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක වන්නේ ය ;

ඒ තීරණයට පෙර එවැනි තැනැත්තකු විසින් කරන ලද කිසියම් ක්‍රියාවක් හෝ එවැනි තැනැත්තකු ඉදිරියේ පවත්වනු ලැබූ නඩු කටයුත්තක් ඒ තීරණය හේතුකොට ගෙන නිර්බල වන්නේ යැයි නොසැලකිය යුත්තේ ය ;

"ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වීම" යන්නෙන්, 172 වැනි ව්‍යවස්ථාව යටතේ කරනු ලබන ප්‍රකාශනයෙන් නියම කරනු ලබන දිනය අදහස් වේ;

"දේශීය ජල තීරය" යන්නට, ශ්‍රී ලංකාවේ දේශීය මුහුදු තීරය හා ඓතිහාසික ජල තීරය ඇතුළත් වේ ;

---

135 - දහහත් වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 22(1) වැනි වගන්තිය මගින් "114 වැනි ව්‍යවස්ථාවේදී හැර" යන වචන සහ ඉලක්කම් වෙනුවට ආදේශ කරන ලදී.

"නීතිය" යන්නෙන්, පාර්ලිමේන්තුවේ පනතක් සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වීමට පෙර කවර අවස්ථාවක වුව ද යම්කිසි ව්‍යවස්ථාදායකයක් විසින් පනවන ලද පනතක් අදහස් වන අතර, රාජසභා ආඥාවක් ද ඊට ඇතුළත් වේ;

"පවත්නා නීතිය" සහ "පවත්නා ලිඛිත නීතිය" යන්නෙන්, පිළිවෙලින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වන තෙක් බලපැවැත් වූ ද,

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ඉදිරියටත් බලපවත්වන්නා වූ ද යම් කිසි නීතියක් සහ ලිඛිත නීතියක් අදහස් වේ ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, මහා නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් අදහස් වන අතර, ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා යම්කිසි නීතියකින් හෝ නීතියක් යටතේ හෝ ඇති කොට පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරයක් ඊට ඇතුළත් වේ ;

"පිළිගත් දේශපාලන පක්ෂය" යන්නෙන්, පාර්ලිමේන්තුව විසින් අන්‍යාකාර විධිවිධාන සලසනු ලැබුවහොත් මිස, 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාව යටතේ පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස සැලකෙන සෑම දේශපාලන පක්ෂයක් ම අදහස් වේ ;

"ප්‍රජා අශක්නුතාව" යන යෙදුමෙහි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වන අවස්ථාවේ ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 7 දරන විශේෂ ජනාධිපති කොමිෂන් සභා පනතේ ඒ යෙදුමේ තිබූ අර්ථය ම ඇත්තේ ය ;

"මහ මැතිවරණය අවසාන වීම" යන්නෙන්, 70 වැනි ව්‍යවස්ථාවේ (5) වැනි අනුව්‍යවස්ථාව යටතේ කරනු ලබන ප්‍රකාශනයේ නිශ්චය කොට දැක්වෙන දිනයේ දී හෝ දිනවල දී ඡන්දය විමසන ලද සියලුම මැතිවරණ කොට්ඨාස සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත් කර ගන්නා ලදැයි ඒ ඒ තේරීම් භාර නිලධරයන් විසින් ප්‍රකාශයට පත් කරනු ලැබීම හෝ ප්‍රකාශයට පත් කරන ලද ප්‍රතිඵල අනුව පාර්ලිමේන්තුවේ මුළු මන්ත්‍රී සංඛ්‍යාවෙන් දෙකෙන් එකකට වැඩි සංඛ්‍යාවක් යම්කිසි පිළිගත් දේශපාලන පක්ෂයකට හෝ ස්වාධීන කණ්ඩායමකට හෝ අයත් මන්ත්‍රීවරයන්ගෙන් සමන්විත වීම යන මේ දෙකින් පළමුව සිදුවන්නේ යමක් ද එය සිදුවන වේලාව අදහස් වේ ;

[136][“රජයේ නිලධරයා” යන්නෙන් අධිකරණ නිලධරයකු හැර ජනරජය යටතේ වැටුප් ලබන ධුරයක් දරන තැනැත්තෙක් අදහස් වේ. එහෙත් ඊට-

(අ) ජනාධිපතිවරයා;

(ආ) අග්‍රාමාත්‍යවරයා;

(ඇ) කථානායකවරයා;

(ඈ) අමාත්‍යවරයෙක්;

(ඉ) නියෝජ්‍ය අමාත්‍යවරයෙක්;

(ඊ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්;

(උ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජිකයෙක්;

(ඌ) අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයෙක්;

(එ) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයෙක්;

(ඒ) මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජිකයෙක්;

(ඔ) ජාතික පොලිස් කොමිෂන් සභාවේ සාමාජිකයෙක්;

(ඕ) විගණන සේවා කොමිෂන් සභාවේ සාමාජිකයෙක්;

(ක) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සාමාජිකයෙක්;

(ග) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාවේ සාමාජිකයෙක්;

(ච) මුදල් කොමිෂන් සභාවේ සාමාජිකයෙක්;

(ජ) සීමා නිර්ණය කොමිෂන් සභාවේ සාමාජිකයෙක්;

(ට) ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ සාමාජිකයෙක්;

(ඩ) පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා;

(ණ) පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙක්;

(ත) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයෙක්;

(ද) රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ සාමාජිකයෙක්; සහ

(න) විගණකාධිපතිවරයා,

ඇතුළත් නොවන්නේ ය.]

“රාජ්‍ය සංස්ථාව” යන්නෙන්, සමාගම් ආඥාපනත යටතේ හැර වෙනත් යම්කිසි ලිඛිත නීතියකින් හෝ ලිඛිත නීතියක් යටතේ හෝ පිහිටුවන ලද්දා වූ හෝ පිහිටුවනු ලබන්නා වූ ද ආණ්ඩුව විසින් ප්‍රදානයක් හෝ ණයක් වශයෙන් නැතහොත් වෙනත් ආකාරයකින්

136 - දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 47 වැනි වගන්තිය මගින් “රජයේ නිලධරයා” යන අර්ථ නිරූපනය වෙනුවට ආදේශ කරන ලදී.

මුළු අරමුදල හෝ මුළු ප්‍රාග්ධනය නැතහොත් අරමුදලෙන් කොටසක් හෝ ප්‍රාග්ධනයෙන් කොටසක් හෝ සපයනු ලබන්නා වූ ද සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් අදහස් වේ ;

"ලිඛිත නීතිය" යන්නෙන්, යම්කිසි නීතියක් සහ අනුනීති අදහස් වන අතර, [137][පළාත් සභාවක් විසින් සාදන ලද ප්‍රඥප්ති හෝ කවර වූ හෝ නීතියක් යටතේ] නියමයන්, ප්‍රකාශන, රීති, අතුරු ව්‍යවස්ථා සහ නියෝග සෑදීමට හෝ නිකුත් කිරීමට හෝ බලය නැතහොත් අධිකාරය ඇති යම්කිසි මණ්ඩලයක් හෝ තැනැත්තකු විසින් සාදන ලද හෝ නිකුත් කරන ලද නියමයන්, ප්‍රකාශන, රීති, අතුරු ව්‍යවස්ථා සහ නියෝග ඊට ඇතුළත් වේ.

137 - දහතුන් වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 6 වැනි වගන්තිය මගින් "කවර වූ හෝ නීතියක් යටතේ" යන වචන වෙනුවට ආදේශ කරන ලදී.

## XXIII වැනි පරිච්ඡේදය

### පරිච්ජින්න කිරීම

**පරිච්ජින්න කිරීම**

**171.** 1972 මැයි මස 22 වන දින සම්මත කොට පනවන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මෙයින් පරිච්ජින්න කරනු ලබන්නේ ය.

## XXIV වැනි පරිච්ඡේදය

### ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන බව ප්‍රකාශනය කිරීම

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන බව ප්‍රකාශනය කිරීම**

**172.** (1) I වැනි පරිච්ඡේදයේ සිට XXIII වැනි පරිච්ඡේදය තෙක් වූ පරිච්ඡේදවල විධිවිධාන ජනාධිපතිවරයා විසින් ප්‍රකාශනයක් මගින් නියම කරන දින සිට ක්‍රියාත්මක විය යුත්තේ ය.

(2) එසේ නියම කරන ලද දිනයේ දී පාර්ලිමේන්තුව රැස්විය යුත්තේ ය. පාර්ලිමේන්තුව එසේ රැස්විය යුත්තේ කවර වේලාවක දැයි ජනාධිපතිවරයා විසින් එම ප්‍රකාශනයෙහි නිශ්චය කොට දැක්විය හැක්කේ ය.

**දෙවො වස්සතු කාලෙන**
**සස්ස සම්පත්ති හොතු ච**
**ඵීතො භවතු ලොකො ච**
**රාජා භවතු ධම්මිකො**
**සිද්ධිරස්තු !**

## * දහනවවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ අනෙකුත් ආනුෂාංගික සංශෝධන

**අන්තර්කාලීන විධිවිධාන**

49. (1) සැක දුරු කිරීම සඳහා පහත සඳහන් ලෙස ප්‍රකාශ කරනු ලැබේ :-

(අ) මේ පනත ක්‍රියාත්මක වනු ලබන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පවතින හත්වන පාර්ලිමේන්තුව, එය කලින් විසුරුවා හරිනු ලැබුවහොත් මිස, 2016 අප්‍රේල් මස 21 වන දින තෙක් දිගටම ක්‍රියා කළ යුතු අතර ඉන්පසු විසිරෙන්නේ ය;

(ආ) 2015 අප්‍රේල් මස 22 වන දිනට පෙර පිළිවෙලින් ජනාධිපති ධුරය සහ අග්‍රාමාත්‍ය ධුරය දරන තැනැත්තන් එම දිනෙන් පසු, මෙම පනත මගින් සංශෝධිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව එම ධුර දැරිය යුතු වන්නේ ය;

(ඇ) මෙම පනත ක්‍රියාත්මක වනු ලබන දිනයට පෙරාතුවම වූ දිනයේ දී-

(i) අග්‍රවිනිශ්චයකාරවරයා ;

(ii) ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන් ;

(iii) අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන් ;

(iv) අභියාචනාධිකරණයේ සභාපතිවරයා ;

(v) අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවයන් ;

(vi) නීතිපතිවරයා ;

(vii) විගණකාධිපතිවරයා ;

(viii) පොලිස්පතිවරයා ;

(ix) පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) වරයා ;

(x) පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා ;

(xi) මහාධිකරණයේ විනිශ්චයකාරවරයකු ; හෝ

(xii) අධිකරණ නිලධරයකු, උපලේඛනගත රජයේ නිලධරයකු, රජයේ නිලධරයකු හෝ පොලිස් නිලධරයකු,

---

* - මෙම කොටසේ අංක 19 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ දක්වා ඇති අංකවලට අනුරූප වේ.

වශයෙන් ධුර දරන සෑම තැනැත්තකු ම තවදුරටත් එම ධුර දරනු ලැබිය යුතු අතර, 41ඇ ව්‍යවස්ථාවේ (3) වන අනු ව්‍යවස්ථාවට යටත්ව එම නියම හා කොන්දේසි යටතේ එම ධුරයේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කරනු ලැබිය යුතු වන්නේ ය.

(2) මෙම පනත ක්‍රියාත්මක වනු ලබන දිනයට පෙරාතුවම වූ දිනයේ දී-

(අ) පාර්ලිමේන්තු සභාවේ ;

(ආ) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ;

(ඇ) ජාතික පොලිස් කොමිෂන් සභාවේ ;

(ඈ) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ;

(ඉ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාවේ ; හෝ

(ඊ) මුදල් කොමිෂන් සභාවේ, සභාපතිවරයා හෝ සාමාජිකයකු හෝ ලෙස ධුර දරන සෑම තැනැත්තකු මේ පනත ක්‍රියාත්මක වන දිනයේ සිට

බලපැවැත්වෙන පරිදි ධුර දැරීම අවසන් කළ යුත්තේ ය ;

එසේ වුවද, මේ පනත ක්‍රියාත්මක වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී ඉහත සඳහන් යම් කොමිෂන් සභාවක සභාපතිවරයා හෝ යම් සාමාජිකයකු හෝ වශයෙන් ධුර දරන සෑම තැනැත්තකුම එකී අදාළ කොමිෂන් සභා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ VIIඅ පරිච්ඡේදයට අනුකූලව ස්ථාපිත කරනු ලබන දිනය තෙක් තම අදාළ ධුරවල බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම දිගටම කරගෙන යනු ලැබිය යුත්තේ ය ;

(3) (අ) මෙම පනත ක්‍රියාත්මක වනු ලබන දිනයට පෙරාතුවම වූ දිනයේ දී මැතිවරණ කොමසාරිස් ධුරය දරනු ලබන තැනැත්තා එම දිනයේ දී ඔහු වෙත පවරා දී තිබූ මැතිවරණ කොමසාරිස්වරයාගේ ධුරයේ සහ මැතිවරණ කොමිෂන් සභාවේ බලතල හා කර්තව්‍ය, 103 වන ව්‍යවස්ථාව ප්‍රකාර මැතිවරණ කොමිෂන් සභාවක් ස්ථාපනය කරනු ලබන තෙක් තවදුරටත් ක්‍රියාත්මක කිරීම හා ඉටුකිරීම සිදු කළ යුතු අතර මැතිවරණ කොමිෂන් සභාව එසේ ස්ථාපනය කරනු ලබන දින සිට සහ ඉන්පසු ඒ තැනැත්තා මැතිවරණ කොමසාරිස් ධුරය දැරීම අවසන් වන්නේ ය ;

(ආ) 103 වන ව්‍යවස්ථාව යටතේ මැතිවරණ කොමිෂන් සභාව ස්ථාපනය කරනු ලබන දිනයට පෙරාතුවම වූ දිනයේ දී මැතිවරණ කොමසාරිස්වරයා විසින් හෝ ඔහුට එරෙහිව හෝ පවරනු ලැබ, විනිශ්චයට භාජනව පවත්නා වූ සියලු

සිවිල් නඩු, නඩු හා වෙනත් නඩු කටයුතු මැතිවරණ කොමිෂන් සභාව ස්ථාපනය කරනු ලැබූ දින සිට බලපැවැත්වෙන පරිදි එකී සභාව විසින් හෝ ඊට එරෙහිව පවරනු ලැබූ සිවිල් නඩු, නඩු සහ වෙනත් නඩු කටයුතු ලෙස සලකනු ලැබිය යුතු අතර මැතිවරණ කොමිෂන් සභාවේ නමින් ඒවා තවදුරටත් පවත්වාගෙන යාම හා අවසන් කිරීම කරනු ලැබිය යුත්තේ ය ;

(ඈ) 103 වන ව්‍යවස්ථාව යටතේ මැතිවරණ කොමිෂන් සභාව ස්ථාපනය කරනු ලබන දිනයට පෙරාතුව යම් ලිඛිත නීතියක් යටතේ මැතිවරණ කොමසාරිස්වරයා විසින් ලබාදෙන ලද යම් තීරණයක් හෝ නියමයක් හෝ නීතිය පිළිබඳ යම් රීති නියමයක් මැතිවරණ කොමිෂන් සභාව ස්ථාපනය කරනු ලැබූ දින සිට බලපැවැත්වෙන පරිදි එකී සභාව විසින් ලබා දෙන ලද තීරණයක් හෝ නියමයක් හෝ නීතිය පිළිබඳ යම් රීති නියමක් ලෙස සලකනු ලැබිය යුත්තේ ය ;

(ඈ) පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහ යම් ලිඛිත නීතියක හෝ යම් කොන්ත්‍රාත්තුවක, ගිවිසුමක හෝ වෙනත් ලේඛනයක "මැතිවරණ කොමසාරිස්වරයා" සහ "මැතිවරණ කොමසාරිස් දෙපාර්තමේන්තුව" යන වචන යෙදී ඇති සෑම තැනකම ඒ සඳහා "මැතිවරණ කොමිෂන් සභාව" යන වචන ආදේශ කරනු ලැබිය යුත්තේ ය.

(4) මෙම පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී රාජ්‍ය සේවා කොමිෂන් සභාව ඉදිරියේ පවත්නා-

(අ) පොලිස් නිලධාරීන්ගේ පත්කිරීම්, උසස් කිරීම්, මාරුකිරීම්, විනය පාලනය සහ සේවයෙන් පහ කිරීම් සම්බන්ධ සියලු කාරණා; සහ

(ආ) පොලිස් නිලධරයන් විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලද සියලු අභියාචනා, එම දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි 155අ ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත පවරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් ඒවා තීරණය කරනු ලැබිය යුත්තේ ය.

(5) මෙම පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී රාජ්‍ය සේවා කොමිෂන් සභාව ඉදිරියේ පවත්නා ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ සාමාජිකයන්ගේ පත්කිරීම්, උසස්වීම්, මාරුකිරීම්, විනය පාලනය සහ සේවයෙන් පහකිරීම් පිළිබඳ සියලු කාරණා සහ එම දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි 153අ ව්‍යවස්ථාව යටතේ

පිහිටුවන ලද විගණන සේවා කොමිෂන් සභාව වෙත පවරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව විගණන සේවා කොමිෂන් සභාව ඒවා සම්බන්ධයෙන් තීරණය කරනු ලැබිය යුත්තේය.

ඇතැම් ව්‍යවස්ථා බලාත්මක භාවයට පත්වන දිනයේ දී ආරම්භවන කාලපරිච්ඡේදයට අදාළවන විශේෂ විධිවිධාන.

50. (මේ පනතේ 15, 28, 29, 30 සහ 31 වන වගන්තිවල විධිවිධාන සහ 46 වන ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාවට අදාළ වන තාක් දුරට වූ 9 වන වගන්තියේ විධිවිධාන හැර) මේ පනත ක්‍රියාත්මක වන දිනයෙන් ආරම්භව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත් කර ගැනීම සඳහා වූ ඊලඟ මහමැතිවරණය පවත්වා අවසන් කරනු ලබන දිනයෙන් අවසන් වන කාලසීමාව තුළ දී -

(අ) ජනාධිපතිවරයා විසින් අග්‍රමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව ඔහු වෙත යම් විෂයයක් හෝ කර්තව්‍යයක් පවරාගත හැකි අතර එවැනිම එකඟත්වය ඇතිව ඔහුගේ භාරයේ තබාගත යුතු අමාත්‍යාංශ තීරණය කරනු ලැබිය හැක්කේ ය.

(ආ) 7 වන පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට පෙරාතුව ම වූ දිනයේ දී ක්‍රියා කළ අමාත්‍ය මණ්ඩලය එහි විසුරුවා හැරීම නොතකා දිගටම ක්‍රියා කළ යුතු අතර මහ මැතිවරණය අවසාන වූ විට එසේ ක්‍රියා කිරීම නතර කළ යුත්තේ ය. ඒ අනුව අග්‍රාමාත්‍යවරයා ද අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයෝ ද වෙනත් අමාත්‍යවරයෝ ද නියෝජ්‍ය අමාත්‍යවරයෝ ද ඔවුන් 46 වන ව්‍යවස්ථාවේ (2) වන අනු ව්‍යවස්ථාවේ (අ) ඡේදයේ හෝ 46 වන ව්‍යවස්ථාවේ (3) වන අනු ව්‍යවස්ථාවේ (අ) හෝ (ආ) ඡේදවල විධිවිධාන සලසා ඇති පරිදි ධුර දැරීම නතර වුවහොත් මිස එසේ මහ මැතිවරණය අවසාන වන තෙක් දිගටම ක්‍රියා කරන්නා හ.

ධුරයේ සිටින ජනාධිපතිවරයා ඇතැම් විෂය හා කර්තව්‍ය භාරව සිටීම.

51. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පටහැනිව කුමක් සඳහන් වුව ද මේ පනත ආරම්භ වන දිනයේ දී ජනාධිපතිවරයා ලෙස ධුර දරන තැනැත්තා එසේ ජනාධිපති ධුරය දරන තාක් කල් රාජ්‍ය ආරක්ෂාව, මහවැලි සංවර්ධනය සහ පරිසරය යන විෂය සහ ඒවායේ කර්තව්‍ය තමන්ගේ භාරය වෙත පවරා ගැනීම ද එකී කාර්යය සඳහා ඔහු වෙත පවරා ගත යුතු අමාත්‍යාංශ තීරණය කරනු ලැබීම ද කළ හැකි අතර ඒ අනුව එකී විෂය හෝ කර්තව්‍ය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාට යම් ලිඛිත නීතියක කරනු ලබන යම් සඳහනක්, ජනාධිපතිවරයාට කරනු ලබන සඳහනක් ලෙස කියවා තේරුම්ගනු ලැබිය යුත්තේ ය.

## පළමු වැනි උපලේඛනය

## 5 වැනි ව්‍යවස්ථාව

## පරිපාලන දිස්ත්‍රික්කවල නම්

1. කොළඹ
2. ගම්පහ
3. කළුතර
4. මහනුවර
5. මාතලේ
6. නුවරඑළිය
7. ගාල්ල
8. මාතර
9. හම්බන්තොට
10. යාපනය

[138][11. කිලිනොච්චිය]


12. මන්නාරම
13. වවුනියාව
14. මුලතිව්
15. මඩකලපුව
16. අම්පාර
17. ත්‍රිකුණාමලය
18. කුරුණෑගල
19. පුත්තලම
20. අනුරාධපුරය
21. පොළොන්නරුව
22. බදුල්ල
23. මොනරාගල
24. රත්නපුරය
25. කෑගල්ල

138- හත්වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 5(ආ) වැනි වගන්තිය මගින් ඇතුළත් කරන ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

## දෙවැනි උපලේඛනය

### 6 වැනි ව්‍යවස්ථාව



ජාතික කොඩිය

# ජාතික ගීයේ පදමාලාව සහ සංගීතය

| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ප්‍රවංශය. | | | | | | | | | | | | | | | |
| ග | - | ග | - | රි | - | නි | රි | ස | - | - | - | - | - | ස | නි |
| ශ්‍රී | - | ලං | - | කා | - | මා | - | තා | - | - | - | - | - | අ | ප |
| ස | රි | ග | රි | ග | ම | ප | ධ | ප | - | - | ස | නි | - | - | ධ |
| ශ්‍රී | - | - | - | - | - | ලං | - | කා | - | - | න | මෝ | - | - | න |
| ප | - | - | ම | ග | - | - | ග | රි | - | නි | රි | ස | - | - | - |
| මෝ | - | - | න | මෝ | - | - | න | මෝ | | මා | - | තා | - | - | - |
| 1 වෙනි පද මාලාව. | | | | | | | | | | | | | | | |
| ප | ස | ස | ස | ස | ස | නි | ස | රි | - | - | රි | රි | ග | රි | ග |
| සු | න් | ද | ර | සි | රි | බ | රි | නී | - | - | සු | රැ | ඳි | අ | ති |
| ම | ප | ප | ප | - | ප | ම/ | ධ | ප | - | - | - | - | - | - | - |
| සෝ | - | බ | මා | - | න | ලං | - | කා | - | - | - | - | - | - | - |
| ස | - | ස | ප | ධ | ධ | ම | ම | ප | - | ග | ග | ම | ම | රි | ග |
| ධා | - | න්‍ය | ධ | න | ය | නෙ | ක | මල් | - | ප | ල | තු | රු | පි | රි |
| ම | ම | ග | - | රි | රි | නි | රි | ස | - | - | - | - | - | + | + |
| ජ | ය | භූ | - | මි | ය | ර | ම්‍යා | - | - | - | - | - | - | + | + |
| ස | ස | රි | රි | ග | ග | ම | ම | ප | ප | ම/ | ධ | ප | - | - | - |
| අ | ප | හ | ට | සැ | ප | සි | රි | සෙ | ත | ස | ද | නා | - | - | - |
| රි | - | ග | ග | ම | - | ප | ම/ | ප | - | - | - | - | - | - | - |
| ජී | - | ව | න | යේ | - | මා | - | තා | - | - | - | - | - | - | - |
| ධ | ධ | නි | නි | ස | ස | රි | රි | නි | - | ස | - | ධ | - | ප | - |
| පි | ළි | ග | නු | මැ | න | අ | ප | භක් | - | ති | - | පූ | - | ජා | |
| ප | ප | - | ම | රි | - | නි | රි | ස | - | - | - | - | - | ස | නි |
| න | මෝ | - | න | මෝ | - | මා | - | තා | - | - | - | - | - | අ | ප |
| ස | රි | ග | රි | ග | ම | ප | ධ | ප | - | - | ස | නි | - | - | ධ |
| ශ්‍රී | - | - | - | - | - | ලං | - | කා | - | - | න | මෝ | - | - | න |
| ප | - | - | ම | ග | - | - | ග | රි | - | නි | රි | ස | - | - | - |
| මෝ | - | - | න | මෝ | - | - | න | මෝ | - | මා | - | තා | - | - | - |
| 2 වෙනි පදමාලාව. | | | | | | | | | | | | | | | |
| ප | ස | ස | - | ස | ස | නි | ස | රි | - | - | - | - | - | - | - |
| ඔ | බ | වේ | | අ | ප | වි | ද්‍යා | - | - | - | - | - | - | - | - |
| රි | රි | ග | ග | ම | ම | ප | ම/ | ප | - | - | - | - | - | - | - |
| ඔ | බ | ම | ය | අ | ප | ස | ත්‍යා | - | - | - | - | - | - | - | - |

| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ප | ප | ස | - | නි | නි | ධ | ප | ධ | - | - | - | - | - | - | - |
| ඔ | බ | වේ | | අ | ප | ශ | ක් | ති | - | - | - | - | - | - | - |
| රි | රි | ග | ග | ම | ම | ප | ම/ | ප | - | - | - | - | - | - | - |
| අ | ප | හ | ද | තු | ළ | භ | ක් | ති | - | - | - | - | - | - | - |
| ප | ස | ස | ස | ස | - | නි | ස | රි | - | - | - | - | - | - | - |
| ඔ | බ | අ | ප | ආ | - | ලෝ | | කේ | - | - | - | - | - | - | - |
| රි | රි | ග | - | ම | ම | ප | ම/ | ප | - | - | - | - | - | - | - |
| අ | ප | ගේ | | අ | නු | ප්‍රා | - | ණේ | - | - | - | - | - | - | - |
| ප | ප | ස | ස | නි | - | ධ | ප | ධ | - | - | - | - | - | - | - |
| ඔ | බ | අ | ප | ජී | - | ව | න | වේ | - | - | - | - | - | - | - |
| රි | රි | ග | - | ම | රි | නි | රි | ස | - | - | - | - | - | - | - |
| අ | ප | මු | ක් | ති | ය | ඔ | බ | වේ | - | - | - | - | - | - | - |
| 3 වෙනි පද මාලාව | | | | | | | | | | | | | | | |
| ප | ස | ස | - | ස | ස | නි | ස | රි | - | - | රි | රි | ග | රි | ග |
| න | ව | ජී | - | ව | න | දෙ | මි | නේ | - | - | නි | ති | න | අ | ප |
| ම | ප | ප | ප | ප | - | ම/ | ධ | ප | - | - | - | - | - | - | - |
| පු | බු | දු | ක | ර | න් | මා | - | තා | - | - | - | - | - | - | - |
| ස | - | ස | ප | ධ | ධ | ම | ම | ප | ප | ග | ග | ම | ම | රි | ග |
| ඥා | - | න | වී | - | ර්ය | ව | ඩ | ව | මි | න | රැ | ගෙ | න | ය | නු |
| ම | ම | ග | ග | රි | - | නි | රි | ස | - | - | - | - | - | + | + |
| මැ | න | ජ | ය | භූ | - | මි | ක | රා | - | - | - | - | - | + | + |
| ස | ස | රි | රි | ග | ග | ම | ම | ප | ප | ම/ | ධ | ප | - | - | - |
| ඒ | ක | ම | ව | ක | ගෙ | ද | රු | කැ | ල | බැ | වි | නා | - | - | - |
| රි | රි | ග | ග | ම | - | ප | ම/ | ප | - | - | - | - | - | - | - |
| ය | මු | ය | මු | වී | - | නො | ප | මා | - | - | - | - | - | - | - |
| ධ | - | නි | නි | ස | - | රි | රි | නි | - | ස | ස | ධ | ධ | ප | - |
| ප්‍රේ | - | ම | ව | ඩා | - | සැ | ම | භේ | - | ද | දු | රැ | ර | දා | - |
| ප | ප | - | ම | රි | - | නි | රි | ස | - | - | - | - | - | ස | නි |
| න | මෝ | - | න | මෝ | - | මා | - | තා | - | - | - | - | - | අ | ප |
| ස | රි | ග | රි | ග | ම | ප | ධ | ප | - | - | ස | නි | - | - | ධ |
| ශ්‍රී | - | - | - | - | - | ලං | | කා | - | - | න | මෝ | - | - | න |
| ප | - | - | ම | ග | - | - | ග | රි | - | නි | රි | ස | - | - | - |
| මෝ | - | - | න | මෝ | - | - | න | මෝ | - | මා | - | තා | - | - | - |

## හතර වැනි උපලේඛනය

## 32 වැනි, 53 වැනි, 61 වැනි, 107 වැනි සහ 165 වැනි ව්‍යවස්ථා

.......................................................................................................................................... .....
........................... වන මම ........................................................................ ධුරයෙහි කාර්ය සහ කර්තව්‍ය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සහ නීතියට අනුකූලව අවංකව ඉටු කරන බවට ද, ශ්‍රී ලංකා ජනරජයට පක්ෂපාත වන බවට ද, මගේ උපරිම ශක්ති ප්‍රමාණයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කොට අනුගමනය කරන බවට ද ගෞරව බහුමානයෙන් යුක්තව ප්‍රකාශ කොට ප්‍රතිඥා දෙමි. / දිවුරුම් දෙමි.

## පස් වැනි උපලේඛනය

## 114(6) වැනි ව්‍යවස්ථාව

ලිපිකරුවෝ

[139][නියෝජ්‍ය පිස්කල් නිලධරයෝ]

භාෂා පරිවර්තකයෝ

ලඝු ලේඛකයෝ

යතුරු ලේඛකයෝ

පොත් බඳින්නෝ

139 -එකොළොස්වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 7 වැනි වගන්තිය මගින් “පිස්කල් නිලධරයෝ” යන වචනය වෙනුවට ආදේශ කරන ලදී.

## හය වැනි උපලේඛනය

### 162 (2) වැනි ව්‍යවස්ථාව

| | |
|---|---|
| කොළඹ නගරය සහ දෙහිවල/ගල්කිස්ස (මහා නගර සභා සීමාව) | මන්ත්‍රීවරයන් 1 |
| කොළඹ දිස්ත්‍රික්කය (කොළඹ නගරය සහ දෙහිවල/ගල්කිස්ස හැර) | මන්ත්‍රීවරයන් 2 |
| කළුතර දිස්ත්‍රික්කය | මන්ත්‍රීවරයන් 1 |
| මහනුවර දිස්ත්‍රික්කය | මන්ත්‍රීවරයන් 2 |
| මාතලේ දිස්ත්‍රික්කය | මන්ත්‍රීවරයන් 1 |
| නුවරඑළිය දිස්ත්‍රික්කය | මන්ත්‍රීවරයන් 1 |
| ගාල්ල දිස්ත්‍රික්කය | මන්ත්‍රීවරයන් 2 |
| මාතර දිස්ත්‍රික්කය | මන්ත්‍රීවරයන් 1 |
| හම්බන්තොට දිස්ත්‍රික්කය | මන්ත්‍රීවරයන් 1 |
| යාපනය දිස්ත්‍රික්කය | මන්ත්‍රීවරයන් 3 |
| මන්නාරම සහ වවුනියා දිස්ත්‍රික්ක | මන්ත්‍රීවරයන් 1 |
| මඩකලපුව දිස්ත්‍රික්කය | මන්ත්‍රීවරයන් 1 |
| ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය | මන්ත්‍රීවරයන් 1 |
| අම්පාර දිස්ත්‍රික්කය | මන්ත්‍රීවරයන් 2 |
| කුරුණෑගල දිස්ත්‍රික්කය | මන්ත්‍රීවරයන් 3 |
| පුත්තලම දිස්ත්‍රික්කය | මන්ත්‍රීවරයන් 1 |
| අනුරාධපුර දිස්ත්‍රික්කය | මන්ත්‍රීවරයන් 3 |
| පොළොන්නරුව දිස්ත්‍රික්කය | මන්ත්‍රීවරයන් 1 |
| බදුල්ල දිස්ත්‍රික්කය | මන්ත්‍රීවරයන් 3 |
| මොනරාගල දිස්ත්‍රික්කය | මන්ත්‍රීවරයන් 1 |
| කෑගල්ල දිස්ත්‍රික්කය | මන්ත්‍රීවරයන් 2 |
| රත්නපුර දිස්ත්‍රික්කය | මන්ත්‍රීවරයන් 2 |

"දිස්ත්‍රික්කය" යන්නෙන්, (392 වැනි අධිකාරය වූ) පරිපාලන දිස්ත්‍රික්ක පනත යටතේ පිහිටුවනු ලැබ 1977 ජූලි මස 21 වැනි දින ඒ යටතේ නිශ්චිතව තිබූ සීමා ඇති පරිපාලන දිස්ත්‍රික්ක අදහස් වේ.

## [140] හත් වැනි උපලේඛනය

### 157 අ (7) වැනි ව්‍යවස්ථාව සහ 161 (ඈ) (iii) වැනි ව්‍යවස්ථාව

..........................................................................................
............... වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කොට අනුගමනය කරන බවට ද, ශ්‍රී ලංකාවේ දේශය තුළ වෙන ම රජයක් පිහිටුවීමට, කෙළින් ම හෝ අන්‍යාකාරයකින්, ශ්‍රී ලංකාව තුළ දී හෝ ඉන් පිටත දී ආධාර දීම, අනුබල දීම, අනුග්‍රහය දැක්වීම, මුදල් යෙදවීම, ධෛර්ය දීම හෝ දේශනා කිරීම නොකරන බවට ද, ගෞරව බහුමානයෙන් යුක්තව ප්‍රකාශ කොට ප්‍රතිඥා දෙමි./ දිවුරුම් දෙමි.

140 -හය වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 5 වැනි වගන්තිය මගින් ඇතුළත් කරන ලදී.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ**
**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

## [141] අට වැනි උපලේඛනය

**154අ ව්‍යවස්ථාව**

**පළාත්**

බස්නාහිර පළාත

වයඹ පළාත

ඌව පළාත

සබරගමුව පළාත

මධ්‍යම පළාත

නැගෙනහිර පළාත

දකුණු පළාත

උතුරු මැද පළාත

උතුරු පළාත

141- දහතුන් වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 7 වැනි වගන්තිය මගින් ඇතුළත් කරන ලදී.

## [142] නව වැනි උපලේඛනය

### I වැනි ලැයිස්තුව

### (පළාත් සභා ලැයිස්තුව)

1. පොලීසිය සහ මහජන සාමය -

ජාතික ආරක්ෂාව සහ ජාතික සුරක්ෂිතභාවය ද, යම් සන්නද්ධ හමුදා හෝ සිවිල් බලයට සහාය පිණිස ශ්‍රී. ලංකාවේ ආණ්ඩුවේ පාලනය යටතේ වූ වෙනත් යම් හමුදා යොදා ගැනීම ද බැහැර කොට සහ කොළඹ නගරය, කෝට්ටේ ශ්‍රී ජයවර්ධනපුර සහ ගැසට් පත්‍රයේ පළ කරන නියමයක් මගින් ජනාධිපතිවරයා විසින් සීමාවන් නිශ්චය කොට නියම කරනු ලබන ඒ නගරවල තදාසන්න ප්‍රදේශයන් අත්හැර, පළමුවන පරිශිෂ්ටයේ දක්වා ඇති ප්‍රමාණයට පළාත ඇතුළත මහජන සාමය පැවැත්වීම සහ පොලිස් බලතල ක්‍රියාත්මක කිරීම.

2. සැලසුම් -

පළාත්වලට අදාළ ආර්ථික සැලසුම් ක්‍රියාත්මක කිරීම.

3. අධ්‍යාපනය සහ අධ්‍යාපන සේවා -

III වන පරිශිෂ්ටයේ දක්වා ඇති ප්‍රමාණයට, අධ්‍යාපනය

4. පළාත් පාලනය -

4:1 පළාත් පාලන ආයතනවල සංයුතිය, ස්වරූපය සහ ව්‍යුහය නීතියෙන් නියම කළ යුතු ය යන ව්‍යතිරේකයට යටත් ව, පළාත් පාලන සහ ග්‍රාම පරිපාලන කාර්යය සඳහා මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා වැනි පළාත් පාලන ආයතන;

4:2 නීතියෙන් පිහිටුවනු ලබන පළාත් පාලන ආයතන (විසුරුවා හැරීමට හේතු පිළිබඳව යම් අර්ධ අධිකරණමය විභාගවලට සහ ඒ සම්බන්ධයෙන් වූ නීතිමය ප්‍රතිකර්මවලට සහ නීතියෙන් විධිවිධාන සලස්වනු ලැබිය හැකි වන පරිදි විගණනයට අදාළ විධිවිධානවලට යටත් ව) විසුරුවා හැරීමේ බලය ද ඇතුළු වන පරිදි ඒ පළාත් පාලන ආයතනවල පරිපාලනය අධීක්ෂණය කිරීම;

4:3 පවත්නා නීතිය යටතේ පළාත් පාලන ආයතනවලට පැවරී ඇති බලතල ඒ ආයතනවලට තිබෙන්නේ ය. මහ නගර සභා ආඥාපනත සහ නගර සභා ආඥාපනත යටතේ මහ නගර සභාවලට සහ නගර සභාවලට පැවරී ඇති බලතල ඒ ආයතනවලට

142- දහතුන් වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 7 වැනි වගන්තිය මගින් ඇතුළත් කරන ලදී.

තිබෙන්නේ ය. පවත්නා නීතිය යටතේ ප්‍රාදේශීය සභාවලට පැවරී ඇති බලතල ප්‍රාදේශීය සභාවලට තිබෙන්නේ ය. පළාත් සභාවක් විසින් පළාත් පාලන ආයතන වෙත අතිරේක බලතල පවරා දීම කළ හැක්කේ ය. එහෙත් එකී සභාවල බලතල අහිමි කිරීම පළාත් සභාවක් විසින් කළ නොහැක්කේ ය;

4:4 පවත්නා නීතිය යටතේ ග්‍රාමෝදය මණ්ඩල වෙත පැවරී ඇති බලතල ග්‍රාමෝදය මණ්ඩලවලට තිබෙන්නේ ය. පළාත් සභාවක් විසින් ග්‍රාමෝදය මණ්ඩලවලට අතිරේක බලතල පවරා දීම කළ හැකි ය.

5. පළාත්වල නිවාස සහ ඉදිකිරීම් -

5:1 ආධාර දෙනු ලබන අත්කම් නිවාස ව්‍යාපෘති, නිවාස ණය සහ ගොඩනැගිලි උපකරණ සැපයීම ඇතුළුව (ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ව්‍යාපෘති නොවන) පළාත්බද නිවාස සංවර්ධන වැඩසටහන් සහ ව්‍යාති ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය, අධීක්ෂණය සහ පසු විපරම් කිරීම;

5:2 කුලී නිවැසියන් ආරක්ෂා කිරීමේ පනත සහ ගෙවල් කුලී පනත, පළාතක් ඇතුළත ක්‍රියාත්මක කිරීම;

5:3 මේ ලැයිස්තුවේ දක්වා ඇති විෂයයන් හා සම්බන්ධ ඉදිකිරීම් කටයුතු.

6. (අ) ජාතික මහාමාර්ග;

(ආ) ජාතික මහාමාර්ගවල ඇති පාලම් සහ තොටුපළවල් හැර, පළාත ඇතුළත ඇති පාරවල්, පාලම් සහ තොටුපළවල්.

7. සමාජසේවා සහ පුනරුත්ථාපනය -

7:1 පරිවාස හා ළමාරක්ෂක සේවා;

7:2 අනාථ තැනැත්තන් සහ පවුල් පුනරුත්ථාපනය ;

7:3 කායික, මානසික සහ සාමාජික වශයෙන් ආබාධිත තැනැත්තන් පුනරුත්ථාපනය කිරීම සහ ඔවුන්ගේ ශුභසාධනය;

7:4 අබල සහ සේවා නියුක්තියක යෙදිය නොහැකි තැනැත්තන්ට සහන සැලසීම.

8. පළාත ඇතුළත මෝටර් වාහන මගින් පාරවල් ඔස්සේ මගීන් ගෙන යාමේ සේවා සහ භාණ්ඩ ගෙන යාම විධිමත් කිරීම සහ පළාත් අතර මාර්ග ඔස්සේ ප්‍රවාහන සේවා සැලසීම.

9. කෘෂිකර්මය සහ ගොවිජන සේවා -

9:1 පළාත්බද කාර්යය සඳහා කෘෂිකාර්මික ව්‍යාපෘතිය, ප්‍රවර්ධනය සහ අධ්‍යාපනය ද (අන්තර් පළාත් වාරිමාර්ග සහ ඉඩම්වල පදිංචි කිරීමේ යෝජනා ක්‍රම, රජයේ ඉඩම් සහ වැවිලි කෘෂිකර්මය හැර) කෘෂිකාර්මික සේවා ද ඇතුළුව, කෘෂිකර්මය;

9:2 සුළු වාරිමාර්ග වැඩ කටයුතු පුනරුත්ථාපනය සහ නඩත්තු කිරීම;

9:3 ජාතික කෘෂිකාර්මික පර්යේෂණ ආයතන ලෙස නාමෝද්දිෂ්ඨ ආයතන හැර කෘෂිකාර්මික පර්යේෂණ.

10. ග්‍රාම සංවර්ධනය

11. සෞඛ්‍යය -

11:1 (ශික්ෂණ රෝහල් සහ විශේෂ කාර්යය සඳහා පිහිටුවනු ලබන රෝහල් හැර) මහජන රෝහල්, ග්‍රාමීය රෝහල්, මාතෘ නිවාස සහ බෙහෙත් ශාලා පිහිටුවා පවත්වාගෙන යාම;

11:2 මහජන සෞඛ්‍ය සේවා, සෞඛ්‍ය අධ්‍යාපනය, පෝෂණය, පවුල් සෞඛ්‍ය ය, මාතෘ දාරක රක්ෂණය, ආහාර සහ ආහාර සෞඛ්‍යාහරක්ෂණය, පාරිසරික සෞඛ්‍යය;

11:3 පළාත සඳහා සෞඛ්‍ය වර්ධන සැලසුම සහ වාර්ෂික සෞඛ්‍ය සැලසුම් පිළියෙළ කොට ක්‍රියාත්මක කිරීම ;

11:4 ඖෂධ ලබා දීම හැර පළාත ඇතුළත ඉහත 1 හි සඳහන් සියලූ ආයතන සඳහා පහසුකම් සැලසීම;

11:5 ඉහත 1 හි සඳහන් ආයතනවලට අනුයුක්ත පිරිස්වලට ශ්‍රී ලංකාව ඇතුළත පශ්චාත් උපාධි අධ්‍යාපනය සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම.

12. දේශීය වෛද්‍ය කටයුතු - ආයුර්වේද, සිද්ධ සහ යුනානි -

12:1 ආයුර්වේද බෙහෙත් ශාලා සහ රෝහල් පිහිටුවීම, එවැනි බෙහෙත් ශාලාවලට හා රෝහල්වලට ආධාර මුදල්;

12:2 ඖෂධ උද්‍යාන පිහිටුවා පවත්වාගෙන යාම.

13. 13.1 පළාත් පාලන ආයතන විසින් පවත්වාගෙන යනු ලබන තානායම්; සහ

13:2 මේ ලැයිස්තුවෙහි යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල කර්තව්‍ය විශේෂයෙන් සඳහන් කොට ඇත්තේ ද ඒ දෙපාර්තමේන්තු විසින් දැනට පාලනය කරනු ලබන සංචාරක බංගලා.

14. බඩු උකස් ගන්නන් -

බැංකු විසින් කරගෙන යනු ලබන බඩු උකස් ගැනීමේ ව්‍යාපාර හැර, බඩු උකස් ගන්නන්.

15. වෙළෙඳ පොළවල්, පොළවල්

16. පළාත් ඇතුළත ආහාර සැපයීම සහ බෙදා හැරීම

17. සමුපකාර -

17:1 සමුපකාර ව්‍යාපාර සහ පළාත ඇතුළත සමුපකාර සමිති සංවිධානය, ලියාපදිංචිය, අධීක්ෂණය හා විගණනය;

17:2 සමුපකාර අධ්‍යාපනය සහ ප්‍රචාරක කටයුතු ද ඇතුළුව, පළාත ඇතුළත සමුපකාර සංවර්ධනය;

17:3 පළාත්බද සමුපකාර සේවා නියුක්තයන්ගේ කොමිෂන් සභාව;

17:4 පළාත ඇතුළත සමුපකාර සමිතිවල සේවා නියුක්තයන් සේවයෙහි නියුක්ත කිරීම, ඔවුන් උසස් කිරීම, විශ්‍රාම ගැන්වීම සහ ඒ සේවා නියුක්තයන් හා සම්බන්ධ වෙනත් කාරණා.

18. ඉඩම් -

ඉඩම්, එනම් (II) වැනි පරිශිෂ්ටයෙහි දක්වා ඇති ප්‍රමාණයට ඉඩම් කෙරෙහි හෝ ඉඩම් විෂයයෙහි ඇති අයිතිවාසිකම්, ඉඩම් භුක්තිය, ඉඩම් විකිණීම හා අන්සතු කිරීම, ඉඩම් පරිහරණය, ඉඩම්වල පදිංචි කරවීම සහ ඉඩම් වැඩි දියුණු කිරීම.

19. වාරිමාර්ග -

පළාත් එකකට වැඩි ගණනක් හරහා ගලා යන ගංගා හා සම්බන්ධ වාරිමාර්ග යෝජනා ක්‍රම හෝ අන්තර් පළාත් වාරිමාර්ග සහ ඉඩම් සංවර්ධන යෝජනා ක්‍රම හැර සියලු වාරිමාර්ග වැඩ හා සම්බන්ධ ක්‍රමසම්පාදනය, ඒවා සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය සහ නඩත්තු කිරීම.

20. සත්ව පාලනය -

පළාත ඇතුළත පශු සම්පත් සංරක්ෂණය කිරීම, රැක ගැනීම සහ වැඩි දියුණු කිරීම හා සත්ව රෝග වැළැක්වීම.

21. සංවර්ධනය සහ ක්‍රම සම්පාදනය හා සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය පිළියෙළ කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට යටත්ව, කෘෂිකාර්මික, කාර්මික, වාණිජ හා වෙළෙඳ ව්‍යවසාය සහ වෙනත් ආදායම් උපදින ව්‍යාපෘති, එවැනි ව්‍යවසාය හා ව්‍යාවපෘති කරගෙන යාමට ආණ්ඩුවට සහ රාජ්‍ය සංස්ථාවලට ඇති බලයට හානියක් නොමැතිව, පළාත ඇතුළත ප්‍රවර්ධනය කිරීමට පිහිටු වීමට හා ඒවායේ නිරත වීමට ඇති බලය (පළාත ඇතුළත විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ කටයුතු ප්‍රවර්ධනය කිරීම සහ පළාත සඳහා කාර්මික සංවර්ධන සැලසුම් සකස් කිරීම, ඒ පිළිබඳ සම්බන්ධීකරණය සහ ඒවා ක්‍රියාත්මක කිරීම ද මෙයට ඇතුළත් වේ.)

22. චරිතශෝධනාගාර, බෝස්ටල් ආයතන සහ ඒ සමාන ස්වභාවයේ වෙනත් ආයතන හා ඒවායේ රඳවාගෙන සිටින තැනැත්තන්, එවැනි ආයතන ප්‍රයෝජනයට ගැනීම සම්බන්ධයෙන් වෙනත් පළාත් සමග වැඩපිළිවෙළ.

23. මත්බීම සන්තකයේ තබා ගැනීම, ප්‍රවාහනය කිරීම, මිල දී ගැනීම හා විකිණීම.

24. පාර්ලිමේන්තුව විසින් පනවන ලද නීතියක් මගින් හෝ නීතියක් යටතේ හෝ ජාතික අනුස්මරණ සුසාන භූමි ලෙස ප්‍රකාශයට පත් කරන ලද ඒවා හැර, භූමදාන සහ භූමදාන බිම්, ආදාහන සහ ආදාහන බිම්.

25:1 පළාත් සභාවක් විසින් පාලනය කරන සහ මුදල් සපයන පුස්තකාල, කෞතුකාගාර සහ වෙනත් ඒ හා සමාන ආයතන ;

25:2 ජාතික වැදගත්කමකින් යුතු යැයි පාර්ලිමේන්තුව විසින් පනවන ලද නීතියක් මගින් හෝ නීතියක් යටතේ හෝ ප්‍රකාශයට පත් කරන ලද ඒවා හැර පෞරාණික සහ ඓතිහාසික ස්මාරක සහ වාර්තා.

26. පාර්ලිමේන්තුව විසින් පනවන ලද යම් නීතියක් මගින් හෝ ඒ යටතේ හෝ අවසර දී ඇති ප්‍රමාණයට පළාත ඇතුළත පතල් හා ඛනිජ සංවර්ධන විධිමත් කිරීම.

27. වෙළෙඳ සංස්ථා, බැංකු, රක්ෂණ සහ මූල්‍ය සංස්ථා හැර පළාතට සීමා වූ අරමුණු ඇති සංස්ථා සංස්ථාගත කිරීම, විධිමත් කිරීම සහ අධිකරණය විසින් ගණන් බේරා වසා දැමීම.

28. සංස්ථාගත කරනු නොලැබූ වෙළෙඳ, සාහිත්‍ය, විද්‍යා, ආගමික සහ වෙනත් සමිති හා සංගම් විධිමත් කිරීම.

29. 29:1 ප්‍රදර්ශනය හා ප්‍රමසිද්ධ රඟ දැක්වීම සඳහා සිනමා චිත්‍රපට අනුමත කිරීම හැර, රැඟුම්හල් සහ රඟ දැක්වීම, සංගීතය, සිනමාහල්, ප්‍රසංග සහ විනෝද කටයුතු ;

29:2 ක්‍රීඩා දිරිගැන්වීම සහ වැඩි දියුණු කිරීම (ජාතික ක්‍රීඩා සංගම් හැර).

30. බලපත්‍ර ගාස්තු සහ බදු නියම කිරීම හැර ඔට්ටු ඇල්ලීම සහ සූදු ක්‍රීඩා.

31. පළාත් ණය.

32. මේ ලැයිස්තුවෙහි සඳහන් කාරණා අතුරින් කවර හෝ කාරණයක් සම්බන්ධයෙන් පඥප්තිවලට විරුද්ධව සිදු කරනු ලබන වැරදි.

33. යම් අධිකරණයක දී ගනු ලබන ගාස්තු හැර, මේ ලැයිස්තුවෙහි සඳහන් කවර හෝ කාරණයක් හා සම්බන්ධ ගාස්තු.

34. (ජාතික විදුලිබල පද්ධතිය පෝෂණය කිරීම සඳහා උත්පාදනය කරනු ලබන ජල විදුලි බලය හා බලය හැර) විදුලිබල ශක්ති උත්පාදනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා පළාත ඇතුළත වැඩ බිම් සහ පහසුකම් සංවර්ධනය කිරීම, සංරක්ෂණ කිරීම සහ පාලනය කිරීම.

35. පාර්ලිමේන්තුව විසින් පනවන ලද යම් නීතියක් මගින් හෝ නීතියක් යටතේ හෝ අවසර දී ඇති ප්‍රමාණයට, මුදල් ණයට ගැනීම.

36. 36:1 පාර්ලිමේන්තුව විසින් පනවන ලද නීතියෙන් නියමිත යම් සීමා ඇතුළත සහ යම් නිදහස් කිරීම්වලට යටත්ව, තොග සහ සිල්ලර විකිණීම සම්බන්ධයෙන් පිරිවැටුම් බදු ;

36:2 ජාතික ලොතරැයි සහ ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් සංවිධානය කරන ලද ලොතරැයි නොවන ලොතරැයි සහ තෑගි තරග බදු සහ ඔට්ටු බදු ;

36:3 බලපත්‍ර බදු, අරක්කු, රා රේන්ද, මැදීම් බලපත්‍ර ගාස්තු, සහ මත්පැන් බලපත්‍ර ගාස්තු ;

36:4 පාර්ලිමේන්තුව විසින් පනවල ලද නීති මගින් නියම කරනු ලැබිය හැකි යම් සීමා ඇතුළත සහ යම් නිදහස් කිරීම්වලට යටත්ව මෝටර් වාහන බලපත්‍ර ගාස්තු;

36:5 ඖෂධ සහ වෙනත් රසායනික ද්‍රව්‍ය සම්බන්ධයෙන් වෙළෙඳ බලපත්‍ර බදු;

36:6 ඉඩම් සහ මෝටර් රථ වැනි දේපළ පැවරීම සම්බන්ධයෙන් මුද්දර ගාස්තු ;

36:7 රේන්ද ගාස්තු එකතු කිරීම;

36:8 අධිකරණ විසින් පනවනු ලබන දඩ ;

36:9 වෛද්‍ය ආඥාපනත යටතේ අය කරනු ලබන ගාස්තු;

36:10 මෝටර් වාහන ගමනාගමන පනත යටතේ අයකරනු ලබන ගාස්තු;

36:11 මෙම ලැයිස්තුවේ සඳහන් යම් කරුණක් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ගාස්තු;

36:12 වන සත්ව සහ වෘක්ෂලතා ආරක්ෂා ආඥාපනත යටතේ ගාස්තු ;

36:13 ඉඩම් සංවර්ධන ආඥාපනත සහ රජයේ ඉඩම් ආඥාපනත යටතේ අන්සතු කරන ලද ඉඩම් සම්බන්ධයෙන් ගාස්තු ;

36:14 අධිකරණයේ දී ඉදිරිපත් කෙරෙන ලේඛන සම්බන්ධයෙන් මුද්දර ගාස්තු ද ඇතුළු අධිකරණ ගාස්තු ;

36:15 පඩි සහ මිම් ආඥාපනත යටතේ නියමිත ගාස්තු ;

36:16 ආදායම් තක්සේරුව සහ එකතු කිරීම ඇතුළු ඉඩම් ආදායම සහ ආදායම් කාර්යය සඳහා ඉඩම් වාර්තා සමීක්ෂණය සහ පවත්වාගෙන යාම ;

36:17 පාර්ලිමේන්තුව විසින් පනවන ලද නීති මගින් අවසර දෙන ලද ප්‍රාමාණයට රජයේ දේපළ ද ඇතුළු ඉඩම් සහ ගොඩනැගිලි සම්බන්ධයෙන් බදු ;

36:18 පාර්ලිමේන්තුව විසින් පනවන ලද නීති මගින් නියමිත යම් සීමා ඇතුළත සහ යම් නිදහස් කිරීම්වලට යටත්ව, ඛනිජ අයිතිවාසිකම් සම්බන්ධයෙන් බදු ;

36:19 මත්ද්‍රව්‍ය සන්තකය, ප්‍රවාහනය, මිලට ගැනීම සහ විකිණීම සම්බන්ධයෙන් බලපත්‍ර ගාස්තු ;

36:20 පාර්ලිමේන්තුව විසින් පනවන ලද යම් නීතියක් මගින් හෝ යටතේ අවසර දෙන ලද ප්‍රමාණයට පළාත්වල කාර්ය සඳහා ආදායම් ලබාගනු පිණිස පළාත ඇතුළත වෙනත් අයබදු ගැනීම.

37. පාර්ලිමේන්තුව විසින් පනවන ලද යම් නීතියක් මගින් හෝ නීතියක් යටතේ අවසර දී ඇති ප්‍රමාණයට, පළාත ඇතුළත පරිසරය ආරක්ෂා කිරීම.

## පරිශිෂ්ටය I

### නීතිය හා යථා පැවැත්ම

1. විමධ්‍යගත කරනු ලබන විෂයය පහත දැක්වෙන ආකාරයට විස්තර කළ යුතුය :-

මේ උපලේඛනයෙහි දක්වා ඇති පරිදි පළාත ඇතුළත මහජන සාමය සහ පොලිස් බලතල ක්‍රියාත්මක කිරීම ; එහෙත් පහත දැක්වෙන විෂයයන් ඇතුළත් නොවිය යුතු යඃ-

(අ) ජාතික ආරක්ෂාව ;

(ආ) ජාතික සුරක්ෂිතභාවය ; සහ

(ඇ) යම් සන්නද්ධ හමුදා හෝ සිවිල් බලතලවලට සහාය පිණිස ශ්‍රී ලංකා ආණ්ඩුවේ පාලනය යටතේ ඇති වෙනත් යම් හමුදා යොදා ගැනීම.

2. පොලිස්පතිවරයා, ශ්‍රී ලංකා පොලිස් හමුදාවේ ප්‍රධානියා විය යුතු ය. ශ්‍රී ලංකා පොලිස් හමුදාව පහත දැක්වෙන අංශවලට බෙදිය යුතු ය :-

(අ) ජාතික අංශය (විශේෂ ඒකක ද ඇතුළුව) ; සහ

(ආ) එක් එක් පළාත සඳහා පළාත්බද අංශයක්.

2:1 ජාතික අංශය, පොලිස්පතිවරයා, නියෝජ්‍ය පොලිස්පතිවරයන්, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයන්, සහකාර පොලිස් අධිකාරිවරයන් සහ ජාතික මට්ටමෙන් බඳවා ගනු ලබන වෙනත් නිල දරන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

2:2 ජාතික අංශයෙන් ද්විතීයනය කරන ලද නියෝජ්‍ය පොලිස්පතිවරයාගෙන් හෝ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයන්ගෙන්, පොලිස් අධිකාරිවරයන්ගෙන් හා සහකාර පොලිස් අධිකාරිවරයන් ගෙන් ද, පළාත් මට්ටමින් බඳවා ගන්නා ලද පළාත්බද සහකාර පොලිස් අධිකාරිවරයන්, ප්‍රධාන පරීක්ෂකවරයන්, පරීක්ෂකවරයන්, උප පරීක්ෂකවරයන්, සැරයන් සහ කොස්තාපල්වරයන් යන තැනැත්තන්ගෙන් ද පළාත්බද අංශය සමන්විත විය යුතු ය. පළාත්බද අංශයේ සාමාජිකයෝ ජාතික අංශයට උසස් කරනු ලැබීමට සුදුස්සෝ වෙති.

3. [143][ජාතික පොලිස් අංශයට බඳවා ගැනීම් සහ පළාත් අංශවල පොලිස් නිලධරයන් ජාතික අංශයට උසස් කිරීම, ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් කළ යුත්තේ ය.]

143- දහතුන් වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 7 වැනි වගන්තිය මගින් ඇතුළත් කරන ලදුව, දහහත් වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 23(1) වැනි වගන්තිය මගින් මුල් 3 වැනි විෂයාංකය වෙනුවට ආදේශ කරන ලදී.

3:1 යම් පළාත්බද අංශයක සේවය කරන යම් පොලිස් නිලධරයකු ජාතික අංශයට උසස් කිරීමට පළමුව, ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් අදාළ පළාත්බද පොලිස් කොමිෂන් සභාවෙන් ඒ නිලධරයා පිළිබඳව රහස්‍ය වාර්තාවක් කැඳවිය යුතු අතර, ඒ නිලධරයා උසස් කළ යුතු ද, නොයුතු ද යන වග නිශ්චය කිරීමේ දී ඒ වාර්තාවේ සඳහන් කාරණා සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

3:2 මෙහි පහත 4:1 වන ඡේදයට යටත්ව, පොලිස්පතිවරයා හැර, ජාතික අංශයේ සාමාජිකයන් උසස් කිරීම, මාරු කිරීම හා ඔවුන්ගේ විනය පාලනය සම්බන්ධයෙන් ද කොමිෂන් සභාව වගකිව යුතු ය.

3:3 පළාත්බද අංශවලට ද්විතීයනය කරනු ලැබූ ද, තමන්ට විරුද්ධව පළාත්බද පොලිස් කොමිෂන් සභාව විසින් විනය ක්‍රියා මාර්ග ගෙන ඇත්තා වූ ද, නිලධරයන් විසින් ඉදිරිපත් කරනු ලබන අභියාචන කොමිෂන් සභාව විසින් විභාග කර නිශ්චය කරනු ලැබිය යුතු ය.

3:4 කොමිෂන් සභාව විසින්, සියලුම අංශවල පොලිස් නිලධරයන් බඳවා ගැනීම සහ උසස් කිරීම සඳහා වූ ප්‍රමිති නියම කළ යුතු අතර, ඒ ප්‍රමිති සියලුම පළාත්බද අංශ සඳහා ඒකාකාර වූ ප්‍රමිති විය යුතු ය.

4. එක් එක් පළාත්බද අංශයට බඳවා ගැනීම පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත පළාත්බද පොලිස් කොමිෂන් සභාවක් විසින් කළ යුතු ය :-

(අ) පළාතේ නියෝජ්‍ය පොලිස්පතිවරයා ;

(ආ) ජනාධිපතිවරයා විමසා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නම් කරන ලද තැනැත්තෙක් ; සහ

(ඇ) පළාතේ ප්‍රධාන අමාත්‍යවරයාගේ නාමිකයෙක්.

4:1 පළාත්බද පොලිස් කොමිෂන් සභාව, පළාත්බද අංශයේ නිලධාරීන්ගේ මාරු කිරීම්, උසස් කිරීම් සහ ඔවුන්ගේ විනය පාලනය සම්බන්ධයෙන් ද, පළාත්බද අංශයට ද්විතීයනය කරන ලද ජාතික අංශයේ නිලධරයන්, ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයාගේ තනතුර තෙක් උසස් කිරීම සම්බන්ධයෙන් ද, නියෝජ්‍ය පොලිස්පතිවරයා හැර පළාත්බද අංශයට ද්විතීයනය කරන ලද නිලධරයන් මාරු කිරීම හා ඔවුන්ගේ විනය පාලනය සම්බන්ධයෙන් ද වගකිව යුතු යඃ

එසේ වුව ද, යම් පළාත්බද අංශයකට ද්විතීයනය කරනු ලැබූ ද, පළාත්බද පොලිස් කොමිෂන් සභාවක් විසින් තමන්ට විරුද්ධව විනයානුකූල ක්‍රියා මාර්ගයක් ගනු ලැබ

ඇත්තා වූ ද, ජාතික අංශයේ යම් නිලධරයකුට, ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත අභියාචනය කිරීමේ අයිතිවාසිකම් ඇති අතර, අභියාචනය සම්බන්ධයෙන් ඒ කොමිෂන් සභාවේ තීරණය අවසානාත්මක විය යුතු ය.

5. ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් හෝ පළාත්බද කොමිෂන් සභාවක් විසින් හෝ ස්වකීය බලතල අතුරින් නියම කරනු ලැබිය හැකි යම් බලතල, නියම කරනු ලැබිය හැකි යම් වෙනත් තැනැත්තකුට හෝ අධිකාරියකට පැවරීමට ජාතික පොලිස් කොමිෂන් සභාවට හෝ පළාත්බද කොමිෂන් සභාවට හෝ හිමිකම් තිබිය යුතු ය.

6. එක් එක් පළාත් සඳහා ඒ ඒ පළාතේ ප්‍රධාන අමාත්‍යවරයාගේ එකඟතාවය ඇතිව පොලිස්පතිවරයා විසින් නියෝජ්‍ය පොලිස්පතිවරයකු පත් කළ යුතු ය. පොලිස්පතිවරයා හා ප්‍රධාන අමාත්‍යවරයා අතර එකඟතාවක් නොමැති අවස්ථාවක ඒ කාරණය [144][ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත යොමු කරනු ලැබිය යුතු අතර] ප්‍රධාන අමාත්‍යවරයාගෙන් නිසි විමසීම් කිරීමෙන් පසුව ජනාධිපතිවරයා විසින් ඒ පත්වීම කරනු ලැබිය යුතු ය.

7. ජාතික අංශයේ සියලුම නිලවල පොලිස් නිලධාරි සේවක සංඛ්‍යාව ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් නියම කළ යුතු ය. එක් එක් පළාත්බද අංශයේ නිලධරයන්ගේ සහ වෙනත් නිලවල සේවක සංඛ්‍යාව-

(අ) පළාතේ වර්ග ප්‍රමාණය ;

(ආ) පළාතේ ජනගහනය ; සහ

(ඇ) එකඟවනු ලබන හෝ නියම කරනු ලැබිය හැකි වෙනත් යම් උපමාන කෙරෙහි සැලකිලිමත්ව පළාත්බද පරිපාලනය විසින් [145][ජාතික පොලිස් කොමිෂන් සභාවේ අනුමතය ඇතිව] නියම කරනු ලැබිය යුතු ය.

මේ මූලධර්ම සියලුම පළාත්බද අංශ කෙරෙහි ඒකාකාරී ලෙස අදාළ විය යුතු ය.

7:1 ජනගහනය, වර්ග ප්‍රමාණය, පොලිස් ස්ථාන සංඛ්‍යාව යනාදිය සහ වෙනත් අදාළ කරුණු කෙරෙහි සැලකිලිමත් ව නිර්ණය කරනු ලබන ප්‍රතිපත්ති මත, පළාත්බද අංශවල සේවක සංඛ්‍යාව නිශ්චය කළ යුතු ය. මේ ප්‍රතිපත්ති සියලු ම පළාත්බද අංශ කෙරෙහි වෙනසක් නොමැතිව අදාළ විය යුතු ය.

7:2 ජාතික සහ පළාත්බද අංශවල විවිධ නිලවල නිලධාරින් භුක්ති විඳින වැටුප් පරිමාණ සහ ධුරයට අදාළ අතිරේක

144- දහතුන් වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 7 වැනි වගන්තිය මගින් ඇතුළත් කරන ලදුව, දහහත් වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 23(2) වැනි වගන්තිය මගින් "ජනාධිපතිවරයා වෙත යොමුකරනු ලැබිය යුතු අතර" යන වචන වෙනුවට ආදේශ කරන ලදී,

145- දහතුන් වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 7 වැනි වගන්තිය මගින් ඇතුළත් කරන ලදුව, දහහත් වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 23(3) වැනි වගන්තිය මගින් "ජනාධිපතිවරයාගේ අනුමතය ඇතිව" යන වචන වෙනුවට ආදේශ කරන ලදී,

ලාභ, පළාත්වල ප්‍රධාන අමාත්‍යවරයන් විමසා ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය. පළාත්බද අංශවල සාමාජිකයන් විසින් භුක්ති විඳිනු ලබන වැටුප් පරිමාණ සහ ධුරයට අදාළ අතිරේක ලාභ සියලුම පළාත්බද අංශ කෙරෙහි ඒකාකාර ලෙස අදාළ විය යුතු ය.

8. ජාතික අංශය සඳහා වූ ගිනි අවි, වෙඩි ද්‍රව්‍ය සහ අනිකුත් උපකරණවල ස්වභාවය, වර්ගය සහ ප්‍රමාණය ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය. සියලුම පළාත්බද අංශ සඳහා වූ ගිනි අවි හා වෙඩි ද්‍රව්‍ය සහ අනිකුත් උපකරණවල ස්වභාවය, වර්ගය හා ප්‍රමාණය පළාත්බද පොලිස් කොමිෂන් සභාව විසින් විමසා ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය යුතු අතර, සියලුම පළාත්බද අංශ සඳහා ඒකාකාර ප්‍රමිති හා ප්‍රතිපත්ති අදාළ විය යුතු ය.

9. ජාතික අංශයට බඳවා ගැනීම පොලිස් කොස්තාපල්, උප පොලිස් පරීක්ෂක සහ සහකාර පොලිස් අධිකාරි නිල සඳහා විය යුතු ය. පළාත්බද අංශයට බඳවා ගැනීම පොලිස් කොස්තාපල්, උප පොලිස් පරීක්ෂක සහ (ඉහත 2.2 ඡේදයේ සඳහන් නිලය වන) පළාත්බද සහකාර පොලිස් අධිකාරී නිල සඳහා විය යුතු ය.

9:1 ජාතික අංශයට බඳවා ගැනීම, ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් ද, පළාත්බද අංශයට බඳවා ගැනීම පළාත්බද පොලිස් කොමිෂන් සභාව විසින් ද, තත්කාර්යය සඳහා නියමිත බඳවා ගැනීමේ ප්‍රමිති හා උපමාන කෙරෙහි සැලකිලිමත්ව කළ යුතු ය. එසේ වුව ද, බඳවා ගත් තැනැත්තකු පත් කරනු ලැබීමේ දී ඔහු සේවය කිරීමට කැමති අංශය පිළිබඳ මනාපය දැක්විය යුතු අතර, හැකි නම් ඔහු සේවය කිරීමට කැමති අංශයට, ඒ අංශයේ කැමැත්ත ඇතිව පත් කරනු ලැබිය යුතු ය.

9:2 ශ්‍රී ලංකා පොලිස් හමුදාවේ සියලු අංශවලට බඳවා ගනු ලබන තැනැත්තන් හා ඒවායේ සාමාජිකයින් පුහුණු කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ආණ්ඩුව වගකිව යුතු ය.

[146][අවශ්‍ය යයි ජාතික පොලිස් කොමිෂන් සභාව සලකනු ලබන අවස්ථාවක, යම් පළාත්බද අංශයක සාමාජිකයන් සඳහා වෛකල්පිත පුහුණුවක් සැපයීම පිණිස ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් විධිවිධාන සලස්වනු ලැබිය හැක්කේ ය.]

10. ජාතික අංශයේ සහ පළාත්බද අංශවල සාමාජිකයන් එකම නිල ඇඳුම් සහ නිල ලාංඡනය පැළඳිය යුතු ය. එසේ වුව ද, එක් එක් අංශයේ සාමාජිකයන්ගේ නිල ඇඳුම්වල ඔහු අයත් වන අංශය පෙන්නුම් කරන විශේෂ උරහිස් ලකුණක් විය යුතු ය.

146- දහතුන් වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 7 වැනි වගන්තිය මගින් ඇතුළත් කරන ලදුව, දහහත් වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 23(4) වැනි වගන්තිය මගින් “අවශ්‍ය යයි ජනාධිපතිවරයා සලකන අවස්ථාවක, යම් පළාත්බද අංශයක සාමාජිකයන් සඳහා වෛකල්පිත පුහුණුවක් සැපයීම පිණිස ජනාධිපතිවරයා විසින් විධිවිධාන යොදනු ලැබිය හැක්කේය” යන වචන වෙනුවට ආදේශ කරන ලදී.

10:1 එක් එක් පළාත සඳහා පළාත්බද අංශයේ සාමාජිකයන් ගෙන් සහ ඊට ද්විතීයනය කරන ලද නිලධරයන්ගෙන් සමන්විත නිල ඇඳුම් සහිත එක් පොලිස් හමුදාවක් විය යුතු ය. ජාතික අංශයේ සාමාජිකයන් සාමාන්‍යයෙන්, සාමාන්‍ය ඇඳුමින් සැරසී සිටිය යුතු ය. එසේ වුව ද, 12:2, 12:3 සහ 12:4 වන ඡේදවල දක්වා ඇති මහජන සාමය පවත්වාගෙන යාම හෝ නැවත ඇති කිරීම හා සම්බන්ධ යම් කාර්ය ඉටු කරන විට ඔවුන්ට නිල ඇඳුම්වලින් සැරසී සිටිය හැකි ය. තව ද, පොලිස්පතිවරයා හා නියම කරනු ලැබිය හැකි වෙනත් යම් නිලධරයන් සාමාන්‍යයෙන් නිල ඇඳුම්වලින් සැරසී සිටිය යුතු ය.

11. යම් පළාතක ජාතික අංශයේ ඒකකවල සහ පළාත්බද අංශවල සේවය කරන සියලුම පොලිස් නිලධරයන් ඒ පළාතේ නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ විධානය හා පාලනය යටතේ කටයුතු කළ යුතු ය.

11:1 පළාතේ මහජන සාමය පවත්වාගෙන යාම සම්බන්ධයෙන් සහ මේ උපලේඛනයේ දක්වා ඇති පරිදි පළාතේ පොලිස් බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පළාතේ නියෝජ්‍ය පොලිස්පතිවරයා එම පළාතේ ප්‍රධාන අමාත්‍යවරයාට වගකිව යුතු අතර, ඔහුගේ පාලනය යටතේ සිටිය යුතු ය.

11:2 ඉහත 11:1 ඡේදයේ විධිවිධාන පහත දැක්වෙන සීමා කිරීම්වලට යටත් විය යුතු ය :-

(අ) පළාතේ හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කරනු ලැබූ විට, පළාත ඇතුළත මහජන සාමය සම්බන්ධව ප්‍රධාන අමාත්‍යවරයාගේ සහ පළාත්බද පරිපාලනයේ බලතල සහ වගකීම් අතුරින් ජනාධිපතිවරයා විසින් නියෝග මගින් සලස්වන විධිවිධානවල නියම කරනු ලැබිය හැකි යම් බලතල සහ වගකීම් ජනාධිපතිවරයා විසින් තමා වෙත පවරා ගනු ලැබිය හැකි ය ;

(ආ) බරපතල අභ්‍යන්තර කැළඹීම් නිසා පළාතක ආරක්ෂාවට හෝ මහජන සාමයට තර්ජනයක් එල්ල වී ඇති බව ජනාධිපතිවරයාගේ මතය වන අවස්ථාවක, ඔහු විසින් හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් නොකර, එහෙත් ඒ පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා විමසීමෙන් සහ මහජන ආරක්ෂක ආඥාපනතේ විධිවිධානවලට යටත්ව, නියමයක් මගින්, මහජන සාමය නැවත ඇති කිරීමේ කාර්යය සඳහා ජාතික අංශයේ යම් ඒකකයක් සිවිල් බලතලවලට ආධාර පිණිස යොදා ගනු ලැබිය හැකි යඃ

එසේ වුව ද, මහජන සාමය නැවත පිහිටුවා ඇති බවට ජනාධිපතිවරයා සෑහීමකට පත් වූ වහාම නැතහොත් නියමයේ දිනයේ සිට දින තිහක් ඉකුත් වූ විට යන මේ අවස්ථා දෙකින් කලින් එළඹෙන අවස්ථාවේ දී, ඒ සෑම නියමයක් ම බලාත්මක වීම නතර විය යුතු ය.

12:1 පළාත ඇතුළත මහජන සාමය ආරක්ෂා කිරීම සහ (උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති වැරදි හැර) සියලු වැරදි වැළැක්වීම, අනාවරණය කර ගැනීම හා ඒ පිළිබඳව විමර්ශනය කිරීම සම්බන්ධයෙන් ද, අපරාධ නඩු විධාන සංග්‍රහය පනත ප්‍රකාර නීතිපතිවරයාගේ බලතලවලට යටත්ව, ඒ වැරදි පිළිබඳව අදාළ අධිකරණවල නඩු පැවරීම සම්බන්ධයෙන් ද පළාත්බද අංශය වගකිව යුතු ය.

උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති සියලු වැරදි වැළැක්වීම, අනාවරණය කර ගැනීම සහ ඒ පිළිබඳව විමර්ශනය කිරීම සම්බන්ධයෙන් ද, අපරාධ නඩු විධාන සංග්‍රහය පනත ප්‍රකාර නීතිපතිවරයාගේ බලතලවලට යටත්ව, ඒ වැරදි පිළිබඳව අදාළ අධිකරණවල නඩු පැවරීම සම්බන්ධයෙන් ද ශ්‍රී ලංකා පොලිස් හමුදාවේ ජාතික අංශය වගකිය යුතු ය.

12:2 පළාතක් ඇතුළත මහජන සාමය ආරක්ෂා කිරීම සඳහා ප්‍රධාන අමාත්‍යවරයා ජාතික අංශයේ සහාය ඉල්ලා සිටින අවස්ථාවක, පොලිස්පතිවරයා විසින් ඒ කාර්යය සඳහා අවශ්‍ය වන පරිදි ජාතික අංශයේ පිරිස් යොදවා ඒ පිරිස් පළාතේ නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ පාලනය යටතට පත් කළ යුතු ය.

12:3 පළාත තුළ හදිසි තත්ත්වයක් ප්‍රකාශ කරනු ලැබූ අවස්ථාවක, ඒ පළාත තුළ මහජන සාමය නැවත ඇති කිරීම සහ පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය යයි පොලිස්පතිවරයා අදහස් කරන ජාතික අංශයේ යම් ඒකක ඔහු විසින් යොදවනු ලැබිය හැකි ය.

12:4 සාමාන්‍යයෙන් පළාත්බද අංශයක් විසින් විමර්ශනය කරනු ලැබිය හැකි යම් වරදක් පහත දැක්වෙන අවස්ථාවල දී අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව විසින් හෝ ජාතික අංශයේ වෙනත් යම් ඒකකයක් විසින් හෝ විමර්ශනය කරනු ලැබිය හැකි ය :-

(අ) අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව හෝ ජාතික අංශයේ වෙනත් යම් ඒකකයක් විසින් හෝ ඒ විමර්ශනය කළ යුතු බවට ප්‍රධාන අමාත්‍යවරයා විසින් ඉල්ලා සිටින අවස්ථාවක ; සහ

(ආ) ඒ වරද පිළිබඳ විමර්ශනයක්, අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව විසින් හෝ ජාතික අංශයේ වෙනත් යම් ඒකකයක් විසින් හෝ මහජන යහපත සඳහා වේ යයි පොලිස්පතිවරයාගේ මතය වන හා ඒ වරද අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව විසින් හෝ ජාතික අංශයේ වෙනත් යම් ඒකකයක් විසින් හෝ විමර්ශනය කළ යුතු බව පොලිස්පතිවරයා විසින් ප්‍රධාන අමාත්‍යවරයා විමසා සහ නීතිපතිවරයාගේ අනුමතය ඇතිව විධාන කරනු ලබන අවස්ථාවක.

13. පළාත්බද අංශයක් සතු වී ඇති සියලූ කර්තව්‍ය ජාතික අංශය විසින් එක් අවුරුදු කාලයක් සඳහා හෝ ඒ පළාතේ පළාත් අංශයක් පිහිටුවනු ලබන තෙක් යන මේ අවස්ථා දෙකින් කලින් එළඹෙන අවස්ථාව තෙක් යම් පළාතක් තුළ ඉටු කරනු ලැබිය යුතු ය.

14. ජාතික අංශයේ සහ පළාත්බද අංශවල සියලූ රාජ්‍ය නිවේදිත නිලධරයන් සිංහල සහ දෙමළ භාෂාවලින් නියමිත ප්‍රවීණත්වය ලබා ගත යුතු බවට නියම කරනු ලැබිය යුතු ය. සහකාර පොලිස් අධිකාරි සහ ඊට ඉහළ නිලවල සියලූම නිලධරයන් ඉංග්‍රීසි භාෂාවෙන් නියමිත ප්‍රවීණත්වය ලබා ගත යුතු බවට නියම කරනු ලැබිය යුතු ය.

ශ්‍රී ලංකා පොලිස් හමුදාවට බඳවා ගනු ලබන සෑම තැනැත්තෙකුට ම ස්වකීය මව් භාෂාව පිළිබඳ ප්‍රවීණත්වයක් තිබිය යුතු ය. ඔහුගේ පළමුවන උසස්වීම සඳහා ඔහුගේ මව් භාෂාව හැර වෙනත් භාෂාවක ප්‍රවීණත්වයක් ඔහු විසින් ලබා ගත යුතු ය. ඔහුගේ ඊළඟ උසස්වීම සඳහා තුන්වන භාෂාව පිළිබඳ දැනීමක් ඔහු විසින් ලබා ගත යුතු ය. මේ කාර්යය සඳහා පිළිගත් භාෂා තුන වන්නේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂාවන් ය.

## උපලේඛනය

## ජාතික පොලීසිය විසින් විමර්ශනය කළ යුතු වරදවල් පිළිබඳ ලැයිස්තුව

1. රජයට විරුද්ධව කරනු ලබන වරදවල්,
2. නාවුක හමුදාවට, යුද හමුදාවට සහ ගුවන් හමුදාවට අදාළව කරනු ලබන වරදවල්,
3. ඡන්ද විමසීම්වලට අදාළව කරනු ලබන වරදවල්,
4. කාසිවලට, මුදල්වලට, නෝට්ටුවලට සහ ආණ්ඩුවේ මුද්දරවලට අදාළව කරනු ලබන යම් වරදක්,
5. ජනාධිපතිවරයාට විරුද්ධව කරනු ලබන යම් වරදක්,
6. රජයේ නිලධරයකුට හෝ අධිකරණ නිලධරයකුට

හෝ කථානායකවරයාට හෝ අග්‍රාමාත්‍යවරයාට හෝ අමාත්‍යවරයකුට හෝ අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයකුට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සාමාජිකයකුට හෝ නියෝජ්‍ය අමාත්‍යවරයකුට හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුට හෝ පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාට හෝ ජනාධිපතිවරයාගේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයකුට හෝ පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයකුට හෝ විරුද්ධව කරනු ලබන යම් වරදක්,

7. රජයට අයත් දේපළවලට හෝ රජය විසින් ප්‍රාග්ධනය සම්පූර්ණයෙන් ම හෝ ප්‍රාග්ධනයෙන් කොටසක් හෝ සපයනු ලැබ ඇති රාජ්‍ය සංස්ථාවකට හෝ සමාගමකට හෝ ආයතනයකට අයත් දේපළවලට අදාළ යම් වරදක්,

8. ජාතික ආරක්ෂාවට හානිකර හෝ අත්‍යවශ්‍ය සේවා පවත්වාගෙන යාමට හානිකර වන යම් වරදක්,

9. සංවෘත ලැයිස්තුවේ ඇතුළත් යම් කාරණයකට අදාළව යම් නීතියක් යටතේ වූ වරදවල් අතුරෙන් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයන් මගින් ජනාධිපතිවරයා විසින් බැහැර කරනු ලබන වරදවල් හැර එකී සෙසු වරදවල්,

10. පළාත් එකකට වැඩි සංඛ්‍යාවක අධිකරණවලට යම් වරදක් සම්බන්ධයෙන් අධිකරණ බලය ඇති විටක, ඒ වරද,

11. ජාත්‍යන්තර වරදවල්.

## පරිශිෂ්ටය II

### ඉඩම් සහ ඉඩම්වල පදිංචි කරවීම

රජයේ ඉඩම් ජනරජය සතුව දිගට ම පැවතිය යුතු අතර, 33(ඈ) ව්‍යවස්ථාව අනුව හා එම කාරණය පාලනය කෙරෙන ලිඛිත නීතියට අනුව එම ඉඩම් බැහැර කළ හැකි ය.

ඉහත කී ආකාරයට යටත්ව ඉඩම් පිළිබඳ විෂයය, පහත දැක්වෙන විශේෂ විධිවිධානවලට යටත්ව, පළාත් සභා විෂයයක් විය යුතු ය.

1. රජයේ ඉඩම් -

1:1 සංවෘත හෝ සමගාමී විෂයයක් සම්බන්ධයෙන් ආණ්ඩුවේ කාර්ය සඳහා අවශ්‍යව රජයේ ඉඩම්, ආණ්ඩුව විසින් එම කාරණය පාලනය කෙරෙන නීතිවලට අනුකූලව ප්‍රයෝජනයට ගනු ලැබිය හැකි ය. එම ඉඩම් එම විෂයය සම්බන්ධයෙන් ප්‍රයෝජනයට ගැනීම පිළිබඳව ආණ්ඩුව විසින් අදාළ පළාත් සභාව විමසිය යුතු ය.

1:2 සෑම පළාත් සභාවකටම, පළාත් සභා විෂයයන් සම්බන්ධයෙන් අවශ්‍ය වී ඇති එම පළාත ඇතුළත ඇති, රජයේ ඉඩම් ආණ්ඩුව විසින් ලබා දිය යුතු ය. පළාත් සභාව විසින් එම රජයේ ඉඩම්, එම කාරණය පාලනය කෙරෙන නීති හා ප්‍රඥප්තිවලට අනුකූලව පරිපාලනය කිරීම, පාලනය කිරීම සහ ප්‍රයෝජනයට ගැනීම කළ යුතු ය.

1:3 පළාතක් ඇතුළත ඇති රජයේ ඉඩම් යම් පුරවැසියකුට හෝ සංවිධානයකට පවරා දීම හෝ නීයාදනය කිරීම, අදාළ පළාත් සභාවේ උපදේශය මත එම කාරණය පාලනය කෙරෙන නීතිවලට අනුකූලව, ජනාධිපතිවරයා විසින් සිදු කළ යුතු ය.

2. අන්තර් පළාත් වාරිමාර්ග කටයුතු සහ ඉඩම් සංවර්ධන ව්‍යාපෘති.

2:1 ඒ ව්‍යාපෘති -

(අ) රජය විසින් පළාත ඇතුළත ආරම්භ කරනු ලැබුවා වූ ද, පළාත් එකකට වැඩි ගණනක් හරහා ගලා යන ගංගාවල ජලය යොදා ගනු ලබන්නා වූ ද, වාරිමාර්ග සහ ඉඩම් සංවර්ධන යෝජනා ක්‍රමවලින් සමන්විත විය යුතු යඃ

එසේ වුව ද, පළාත් සභාවක් විසින් ඒ ගංගාවල ජලය යොදා ගනිමින් ඒ පළාත ඇතුළත වාරිමාර්ග සහ ඉඩම් සංවර්ධන ව්‍යාපෘති ද ආරම්භ කරනු ලැබිය හැකි ය;

(ආ) පළාතෙන් පිටත සිට හරවන ලද ජලය යොදා ගනු ලබන සහ පළාත් ඇතුළත වූ වාරිමාර්ග සහ ඉඩම් සංවර්ධන යෝජනා ක්‍රමවලින් සමන්විත විය යුතු ය;

(ඇ) මහවැලි සංවර්ධන ව්‍යාපෘතිය වැනි, පාලන ප්‍රදේශය පළාත් දෙකකට හෝ වැඩි ගණනකට අයත් වන, සියලු යෝජනා ක්‍රමවලින් සමන්විත විය යුතු ය.

2:2 මේ ව්‍යාපෘති සම්බන්ධයෙන් වගකීම ශ්‍රී ලංකා ආණ්ඩුව සතු විය යුතු ය.

2:3 මේ ව්‍යාපෘති නිසා ඇති වන කෘෂිකාර්මික ඉඩම්වල සහ නිවාසස්ථාන ඉඩම් දැරිය හැකි ප්‍රමාණය පිළිබඳ ප්‍රතිපත්ති සහ උපමාන පළාත් සභා විමසා ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය.

2:4 එම ඉඩම් කොටස් ලබන තැනැත්තන් තෝරා ගැනීම, පිළිවෙළ, ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින්, ඉල්ලුම්කරුවන්ගේ ඉඩම් නොමැතිකමේ ප්‍රමාණය, ඔවුන්ගේ ආදායම් තත්ත්වය, පවුලේ සංඛ්‍යාව, කෘෂිකාර්මික පසුබිම ආදිය

ඇතුළු පදිංචිකරුවන් තෝරා ගැනීමේ උපමාන කෙරෙහි සැලකිලිමත්ව නිශ්චය කරනු ලැබිය යුතු ය. මේ ප්‍රතිපත්ති නියම වශයෙන් අදාළ කර ගැනීම, කොටස් ලබන තැනැත්තන් තෝරා ගැනීම සහ ඒ හා සම්බන්ධ වෙනත් ආනුෂංගික කාරණා පළාත් සභාවල බලතලවලට ඇතුළත් විය යුතු ය.

2:5 ඒ ව්‍යාපෘතිවල ඒ ඉඩම් කොටස් බෙදා දීම ජාතික ජනවාර්ගික අනුපාතය අනුව විය යුතු ය. ඒ අනුපාතවලට අනුකූලව ඉඩම් කොටස් බෙදා දීමේ දී, ඒ ව්‍යාපෘතිය නිසා උන්හිටි තැන් අහිමි වූ සහ ඒ ව්‍යාපෘතිය පිහිටි දිස්ත්‍රික්කයේ ඉඩම් නොමැති තැනැත්තන්ට ද, ඉන් පසුව ඒ පළාතේ ඉඩම් නොමැති තැනැත්තන්ට ද, ප්‍රමුඛතාව දෙනු ලැබිය යුතු ය.

2:6 එවැනි යම් ව්‍යාපෘතියකින් තමන්ට හිමි ඉඩම් කොටස් යම් ජන සමූහයක සාමාජිකයන් විසින් ලබා නොගන්නා හෝ ඔවුන්ට ඒ කොටස් ලබා ගත නොහැකි වන අවස්ථාවක, ඔවුන්ට ඒ හා සමාන ඉඩම් කොටස් ගණනක් වෙනත් අන්තර් පළාත් වාරිමාර්ග හෝ ඉඩම් සංවර්ධන යෝජනා ක්‍රමයකින් ලබා ගැනීමට හිමිකම තිබිය යුතු ය. මේ පාවිච්චි නොකරන ලද ප්‍රමාණය, දෙන ලද කාල රාමුවක් ඇතුළත ප්‍රයෝජනයට ගනු ලැබිය යුතු ය.

2:7 ඉහත කී ප්‍රතිපත්තිවලට අනුකූලව ඒ ව්‍යාපෘතිවල ඉඩම් කොටස් බෙදා දීම හැකිතාක් දුරට ඒ පළාතේ ජන විකාශන රටාව සැලකිය යුතු ප්‍රමාණයකින් වෙනස් නොවන පරිදි ද, මනුෂ්‍ය ජනාවාසවල ප්‍රජාවේ ඒකාග්‍රතාව සහතික කිරීමේ ප්‍රතිපත්තියට අනුකූලව ද සිදු කළ යුතු ය.

2:8 ඒ ව්‍යාපෘතියේ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් කළ යුතු ය.

3. ජාතික ඉඩම් කොමිෂන් සභාව

3:1 ශ්‍රී ලංකා ආණ්ඩුව විසින්, ජාතික ඉඩම් කොමිෂන් සභාවක් පිහිටුවිය යුතු අතර, ඒ කොමිෂන් සභාව රජයේ ඉඩම් පාවිච්චිය හා සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම පිළිබඳව වගකිව යුතු ය. මේ කොමිෂන් සභාවට දිවයිනේ සියලු ම පළාත් සභාවල නියෝජිතයන් ඇතුළත් විය යුතු ය.

3:2 ජාතික ඉඩම් කොමිෂන් සභාවට, ස්වාභාවික සම්පත් කළමනාකරණයට අදාළ සමාජ-ආර්ථික සාධක මෙන් ම භෞතික සාධක ඇගයීම සඳහා අවශ්‍ය, අදාළ සියලු විෂයයන් නියෝජනය වන තාක්ෂණික ලේකම් කාර්යාලයක් තිබිය යුතු ය.

3:3 ඉඩම් පාවිච්චිය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය (දේශපාලනික හෝ ජනවාර්ගික වශයෙන් නොව) කාර්මික සාධක මත පදනම් විය යුතු අතර, කොමිෂන් සභාව විසින් පස, දේශගුණය, වර්ෂාපතනය, පස සේදීයාම, වන ආවරණය, පාරිසරික සාධක, ආර්ථික යෝග්‍යතාව ආදී කරුණු කෙරෙහි සැලකිලිමත් ව ඉඩම් පාවිච්චිය හා සම්බන්ධ පොදු න්‍යාය නියම කළ යුතු ය.

3:4 පළාත් සභා වෙත පැවරුණු බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා, ඒ පළාත් සභා විසින් ජාතික ඉඩම් කොමිෂන් සභාව විසින් සකස් කරන ලද ජාතික ප්‍රතිපත්තිය කෙරෙහි නිසි පරිදි සැලකිලිමත් ව ඒ බලතල ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

## පරිශිෂ්ටය III

### අධ්‍යාපනය

1. නිශ්චිත පාසල් නොවන සියලු ම රජයේ පාසල් සඳහා පහසුකම් සැලසීම (නිශ්චිත පාසල් නම්, ජාතික පාසල්, හමුදාවල සාමාජිකයන් සඳහා වූ විශේෂ පාසල් සහ නිශ්චිතව සංවර්ධන යෝජනා ක්‍රම සඳහා වූ පාසල් වේ.)

2. පහත දැක්වෙන පාසල් අධීක්ෂණය කිරීම හා කළමනාකරණය කිරීම:-

(අ) සියලු ම පෙර පාසල් ; සහ

(ආ) ඉහත දක්වා ඇති නිශ්චිත පාසල් නොවන සියලු ම රජයේ පාසල්.

(ප්‍රමිති පවත්නා බවට වගබලා ගැනීම පිණිස පාසල්වල කළමනාකරණය පරීක්ෂා කිරීමේ හා අධීක්ෂණය කිරීමේ අයිතිය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් රඳවා ගනු ලබන්නේ ය.)

3. සියලු ම අධ්‍යාපන සේවා පිරිස් එනම්, ගුරුවරු, විදුහල්පතිවරු සහ අධ්‍යාපන නිලධරයන් මාරු කිරීම හා ඔවුන්ගේ විනය පාලනය, ජාතික සේවයට අයත් එහෙත් පළාත්බද අධිකාරියට ද්විතීයනය කිරීම මත සේවය කරන නිලධරයන්ට රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනය කිරීමේ අයිතිවාසිකම ඇත්තේ ය. සේවයෙන් පහකිරීමට විරුද්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනා කිරීමේ අයිතිය පළාත්බද සේවාවට අයත් නිලධරයන්ට ඇත්තේ ය.

4. අධ්‍යාපන විද්‍යායතනවලින් සහ විශ්වවිද්‍යාලවලින් දෙන ලද්දා වූ ද, ඉගැන්වීමේ සුදුසුකම් වශයෙන් පිළිගෙන ඇත්තා වූ ද ඩිප්ලෝමා සහ උපාධි ඇති තැනැත්තන් ගුරු සේවයට බඳවා ගැනීම.

5. මේ වර්ගවලට ප්‍රමාණවත් පුද්ගලයන් සංඛ්‍යාවක් බඳවා ගත හැකි වන තෙක් ගුරු සේවයට වෙනත් තැනැත්තන් බඳවා ගැනීම, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන බඳවා ගැනීමේ පරීක්ෂණවල ප්‍රතිඵල අනුව සිදු කරනු ලබන්නේ ය. මේ පරීක්ෂණවල ප්‍රතිඵල අනුව පළාත්බද අධිකාරිවල සහභාගිත්වයෙන් සම්මුඛ පරීක්ෂණ හා තෝරා ගැනීමේ පරීක්ෂණ පවත්වනු ලබන්නේ ය.

6. 1 ඒ, බී, සී වර්ගවල පාසල් හැර අනෙක් සියලූ පාසල්වල විදුහල්පතිවරුන් පත් කිරීම (මෙහිලා අනුගමනය කළ යුතු තෝරා ගැනීමේ උපමාන අධ්‍යාපන අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබේ.)

7. 1 ඒ, බී, සී පාසල්වල විදුහල්පතිවරුන් පත් කිරීම, අධ්‍යාපපන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් හෝ කරනු ලබන්නේ ය.

8. ගුරුවරුන් සහ වෙනත් අධ්‍යාපන සේවා පිරිස් පුහුණු කිරීම, ජාතික අධ්‍යාපන ආයතනයේ විෂය පථයට අයත් වේ. පළාත්බද අධිකාර විසින් ස්වකීය අවශ්‍යතා ජාතික අධ්‍යාපන ආයතනයට දැන්විය යුතු ය.

9. උපදේශක කර්තව්‍ය භාර පළාත්බද අධ්‍යාපන මණ්ඩල පත් කිරීම, අධ්‍යාපන අමාත්‍යවරයාගේ වගකීම වන්නේ ය. එහෙත් මෙය පළාත්බද අධිකාරියේ ප්‍රධාන අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව කරනු ලැබේ.

10. අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නියම කරනු ලබන නියමයන්ට අනුකූලවන පාසල් මණ්ඩල, පළාත්බද අධිකාර විසින් පිහිටුවනු ලැබේ.

11. පාසල් මණ්ඩලවල ක්‍රියාකාරීත්වය පළාත්බද අධිකාර විසින් අධීක්ෂණය කරනු ලැබේ.

12. සැලසුම් (අධ්‍යාපන සංවර්ධන සැලැස්ම සහ වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම) පිළියෙළ කිරීම පළාත්බද අධිකාරියේ වගකීම වේ.

13. වාර්ෂික අධ්‍යාපන සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම.

14. විදුහල්පතිවරුන්, ගුරුවරුන් සහ අධ්‍යාපන නිලධරයන් කළ වැඩ පිළිබඳ ඇගැයීම.

15. ජාතික අධ්‍යාපන ආයතනයේ පූර්ව අනුමතය ලබා ගෙන ඇති සේවාස්ථ පුහුණු කිරීමේ වැඩසටහන් පවත්වාගෙන යාම.

16. විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන ලද ප්‍රාදේශීය විභාග පැවැත්වීම.

17. අවිධිමත් අධ්‍යාපනය පිළිබඳ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

18. පෙර පාසල් ලියාපදිංචි කිරීම සහ ඒවා අධීක්ෂණය කිරීම.

19. ප්‍රාථමික පාසල්වල විෂය මාලාවේ සහ ද්විතියික අධ්‍යාපනය පිළිබඳ තෝරා ගත් විෂයවල ප්‍රාදේශීය වෙනස්කම් ඇති කිරීමට ජාතික අධ්‍යාපන ආයතනයේ අනුමතය ලබා ගැනීම.

20. අධ්‍යාපන ගොඩනැගිලි, පුස්තකාල සහ ක්‍රීඩා භූමි ඉදි කිරීම සහ නඩත්තු කිරීම.

21. ඉගැන්වීමේ ආධාර, දෘශ්‍යාධාර සහ ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ, ලී බඩු සහ වෙනත් උපකරණ සැපයීම සහ බෙදා හැරීම.

22. අමාත්‍යාංශය විසින් සඳහන් කරන නිශ්චිත උපකරණ සමහරක් හැර, විද්‍යා උපකරණ ලබා ගැනීම සහ බෙදා හැරීම.

23. අමාත්‍යාංශයේ අනුමතය ලබා ගැනීමෙන් පසු පාසල් පොත් නිෂ්පාදනය කිරීම සහ බෙදා හැරීම.

24. ජාතික පුස්තකාල සේවා මණ්ඩලය විසින් කරනු ලබන මඟපෙන්වීම්වලට අනුකූලව පාසල් පුස්තකාල සංවිධානය කිරීම හා සංවර්ධනය කිරීම.

## II වැනි ලැයිස්තුව

(සංවෘත ලැයිස්තුව)

### සියලු විෂයයන් සහ කර්තව්‍ය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය

**රාජ්‍ය ආරක්ෂාව සහ ජාතික සුරක්ෂිතභාවය, අභ්‍යන්තර ආරක්ෂාව, නීතිය හා යථා පැවැත්ම සහ I වැනි ලැයිස්තුවේ අංක 1 දරන විෂයෙහි දක්වා ඇති ප්‍රමාණයට හැර අපරාධ වැළැක්වීම හා අනාවරණය කර ගැනීම.**

මෙයට පහත දැක්වෙන විෂයයන් ඇතුළත් වේ:-

(අ) ශ්‍රී ලංකාවේ ආරක්ෂාව සඳහා සූදානම් වීම සහ යුද්ධමය අවස්ථාවක දී යුද්ධය පවත්වාගෙන යාම පිණිස හිතකර වන සියලු ක්‍රියා කිරීම සහ යුද්ධය අවසන් වූ පසුව සඵල ලෙස සේනා විසුරුවා හැරීම පිණිස හිතකර වන සියලු ක්‍රියා කිරීම ඇතුළුව ශ්‍රී ලංකාවේ සහ එහි සෑම කොටසක ම ආරක්ෂාව ;

(ආ) නාවුක, යුද සහ ගුවන් හමුදා, ශ්‍රී ලංකා ආණ්ඩුවේ වෙනත් කවර හෝ සන්නද්ධ හමුදා;

(ඇ) සිවිල් බලයට සහාය වීම පිණිස, ශ්‍රී ලංකා ආණ්ඩුවේ යම් සන්නද්ධ හමුදාවක් හෝ ශ්‍රී ලංකා ආණ්ඩුවේ පාලනයට යටත් වෙනත් යම් හමුදාවක් හෝ ඒ හමුදාවක යම් බලඇණියක් හෝ ඒකකයක් යම් පළාතක යෙදවීම; එසේ යොදවනු ලැබ සිටිය දී ඒ හමුදාවල සාමාජිකයන්ගේ බලතල, ඒ බලතලවල විෂය පථය, වරප්‍රසාද සහ වගකීම්;

(ඈ) පාලන කොට්ඨාසවල සීමා නිර්ණය කිරීම, ඒ කොට්ඨාසවල ප්‍රාදේශීය ස්වයංපාලනය, ඒ පාලන කොට්ඨාස බලමණ්ඩල ඇතුළත ප්‍රදේශවල සංයුතිය සහ බලතල හා (ගෙවල් කුලී පාලනය ද ඇතුළුව) ඒ ප්‍රදේශවල නිවාස ඉඩ පහසුකම් විධිමත් කිරීම;

(ඉ) නාවුක, යුද හා ගුවන් හමුදා කටයුතු;

(ඊ) යුද්ධායුධ, ගිනි අවි, වෙඩි ද්‍රව්‍ය සහ පුපුරණ ද්‍රව්‍ය;

(උ) පරමාණු ශක්තිය සහ එය නිපදවීම සඳහා අවශ්‍ය ඛනිජ සම්පත්;

(ඌ) ආරක්ෂක කාර්ය සඳහා හෝ යුද්ධයෙහි යෙදීම සඳහා හෝ අවශ්‍ය යයි පාර්ලිමේන්තුව විසින් නීතියෙන් ප්‍රකාශයට පත් කරන කර්මාන්ත;

(එ) අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව;

(ඒ) රාජ්‍ය ආරක්ෂාව, විදේශ කටයුතු හෝ ශ්‍රී ලංකාවේ ආරක්ෂාව හා සම්බන්ධ හේතු නිසා නිවාරක රැඳවීමෙහි තබා ගැනීම;

එසේ රඳවා තබා ගැනීමට යටත් තැනැත්තෝ; සහ

(ඔ) යම් පළාතකට අයත් පොලිස් හමුදාවක සාමාජිකයන් සතු බලතල හා ඒ බලතලවල විෂය පථය ඒ පළාතෙන් පිටත යම් ප්‍රදේශයකට ව්‍යාප්ත කිරීම. එහෙත් එසේ ව්‍යාප්ත කිරීම, ඒ ප්‍රදේශය පිහිටා ඇති පළාත් සභාවේ කැමැත්ත නොමැතිව එක් පළාතක පොලීසියකට ස්වකීය බලතල හා බලතලවල විෂය පථය, ඒ පළාතෙන් පිටත යම් ප්‍රදේශයක් තුළ ක්‍රියාත්මක කිරීමට හැකි නොවන පරිදි විය යුතු ය. යම් පළාතකට අයත් පොලිස් හමුදාවක සාමාජිකයන් සතු බලතල හා ඒ බලතලවල විෂය පථය ඒ පළාතෙන් පිටත දුම්රිය ප්‍රදේශවලට ව්‍යාප්ත කිරීම.

**විදේශ කටයුතු**

මෙයට පහත දැක්වෙන විෂයයන් ඇතුළත් වේ:-

(අ) විදේශ කටයුතු; ශ්‍රී ලංකා ආණ්ඩුව වෙනත් යම් විදේශ රටක් සමඟ සම්බන්ධතාවකට යොමු කරන සියලූ කාරණා;

(ආ) රාජ්‍ය තාන්ත්‍රික, කොන්සල් සහ වෙළෙඳ නියෝජනය;

(ඇ) එක්සත් ජාතීන්ගේ සංවිධානය;

(ඈ) ජාත්‍යන්තර සම්මේලනවලට, සමිතිවලට සහ වෙනත් මණ්ඩලවලට සහභාගි වීම සහ ඒවායේ දී එළඹෙන තීරණ ක්‍රියාත්මක කිරීම;

(ඉ) විදේශ රටවල් සමඟ සන්ධානවලට සහ ගිවිසුම්වලට ඇතුළත් වීම සහ විදේශ රටවල් සමඟ වූ සන්ධාන, ගිවිසුම් සහ සම්මුති ක්‍රියාත්මක කිරීම;

(ඊ) යුද්ධය හා සාමය; සහ

(උ) විදේශ අධිකරණ බලය.

**තැපැල් හා විදුලි සංදේශ, ගුවන් විදුලිය සහ රූපවාහිනි**

මෙයට පහත දැක්වෙන විෂයයන් ඇතුළත් වේ:-

(අ) තැපැල් හා විදුලි සංදේශ, දුරකථන, ගුවන්විදුලිය, විකාශන සහ වෙනත් එවැනි සංනිවේදන මාධ්‍ය; සහ

(ආ) ප්‍රදර්ශනය කිරීම සඳහා සිනමා චිත්‍රපට අනුමත කිරීම.

**අධිකරණයට සහ අධිකරණ පද්ධතියට අදාළ වනතාක් දුරට යුක්තිය පසිඳලීම**

මෙයට පහත දැක්වෙන විෂයයන් ඇතුළත් වේ:-

(අ) ශ්‍රේෂ්ඨාධිකරණයේ සංයුතිය, සංවිධානය, අධිකරණ බලය සහ ඒ අධිකරණයට අපහාස කිරීම ද ඇතුළුව) එහි බලතල

හා එහි දී අය කරනු ලබන ගාස්තු; ශ්‍රේෂ්ඨාධිකරණය, අභියාචනාධිකරණය සහ වෙනත් අධිකරණ ඉදිරියෙහි වෘත්තියෙහි යෙදීමට හිමිකම් ලබන තැනැත්තෝ;

(ආ) අභියාචනාධිකරණයේ සංයුතිය, සංවිධානය, අධිකරණ බලය සහ බලතල හා එහි දී අය කරනු ලබන ගාස්තු; සහ

(ඇ) ශ්‍රේෂ්ඨාධිකරණය සහ අභියාචනාධිකරණය හැර අනෙකුත් සියලූ අධිකරණවල අධිකරණ බලය සහ බලතල.

**ජාතික ආදායමට, මූල්‍ය ප්‍රතිපත්තියට සහ විදේශ සම්පත්වලට අදාළ මුදල් පිළිබඳ කටයුතු**

**රේගුව**

මෙයට පහත දැක්වෙන විෂයයන් ඇතුළත් වේ:-

(අ) ශ්‍රී ලංකා ආණ්ඩුවේ රාජ්‍ය ණය;

(ආ) ව්‍යවහාර මුදල්, කාසි සහ වලංගු මුදල්; විදේශ විනිමය;

(ඇ) විදේශ ණය;

(ඈ) ශ්‍රී ලංකා මහ බැංකුව;

(ඉ) ජාතික ඉතිරි කිරීමේ බැංකුව;

(ඊ) ජාතික ලොතරැයි සහ ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් සංවිධානය කරනු ලබන ලොතරැයි;

(උ) බැංකු කටයුතු;

(ඌ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් එවැනි සාධන පත්‍ර ;

(එ) රක්ෂණ කටයුතු;

(ඒ) ව්‍යාපාර වස්තු හුවමාරු මධ්‍යස්ථාන සහ අනාගත භාණ්ඩ වෙළෙඳ පොළ;

(ඔ) ශ්‍රී ලංකා ආණ්ඩුවේ සහ පළාත් සභාවල ගිණුම් විගණනය;

(ඕ) පුද්ගලයන්ගේ, සමාගම්වල සහ සංස්ථාවල ආදායම, ප්‍රාග්ධනය හා ධනය මත බදු;

(ක) ආනයන හා අපනයන බදු සහ සුරා බදු ඇතුළුව රේගු බදු;

(ග) I වැනි ලැයිස්තුවේ නිශ්චිතව දැක්වෙන ප්‍රමාණය හැර පිරිවැටුම් බදු සහ මුද්දර ගාස්තු;

(ච) I වැනි ලැයිස්තුවේ නිශ්චිතව නොදැක්වෙන වෙනත් යම් බද්දක් හෝ ගාස්තුවක්.

**විදේශ වෙළෙඳාම, අන්තර් පළාත් අතර වෙළෙඳාම හා වාණිජ කටයුතු**

මෙයට පහත දැක්වෙන විෂයයන් ඇතුළත් වේ:-

(අ) විදේශ රටවල් සමග වෙළෙඳාම සහ වාණිජ කටයුතු, රේගු ප්‍රත්‍යන්ත හරහා ආනයනය සහ අපනනයනය; රේගු ප්‍රත්‍යන්ත පිළිබඳ අර්ථ කථනය; සහ

(ආ) අන්තර් පළාත් වෙළෙඳාම හා වාණිජ කටයුතු.

**වරායවල් සහ නැව් තොටවල්**

මෙයට පහත දැක්වෙන විෂයයන් ඇතුළත් වේ:-

(අ) පාර්ලිමේන්තුව විසින් පනවන ලද නීති හෝ පවත්නා නීති මගින් හෝ ඒ නීති යටතේ හෝ ප්‍රධාන වරායවල් ලෙස ප්‍රකාශයට පත් කරන වරායවල් සීමා නිර්ණය කිරීම ඇතුළුව, වරායවල් සහ ඒවායේ වරාය අධිකාරිවල සංයුතිය හා බලතල;

(ආ) නිරෝධායනය හා සම්බන්ධ රෝහල් ද ඇතුළුව වරාය නිරෝධායනය; (නාවිකයන්ගේ රෝහල් සහ සාමුද්‍රිකයන්ගේ රෝහල්.)

**ගුවන් ගමනාගමනය සහ ගුවන් තොටුපළවල්**

මෙයට පහත දැක්වෙන විෂයයන් ඇතුළත් වේ:-

ගුවන් සේවා; ගුවන් යානා සහ ගුවන් තරණය; ගගන යාත්‍රාංගන සැපයීම; ගුවන් ගමනාගමනය සහ ගගන යාත්‍රාංගන විධිමත් කිරීම සහ සංවිධානය කිරීම; ගගන යාන්ත්‍රික අධ්‍යාපනය සහ පුහුණුව සැලසීම සහ පළාත් මගින් සහ වෙනත් නියෝජ්‍යායතන මගින් සපයන එවැනි අධ්‍යාපනය සහ පුහුණුව විධිමත් කිරීම.

**ජාතික ප්‍රවාහනය**

මෙයට පහත දැක්වෙන විෂයයන් ඇතුළත් වේ:-

(අ) දුම්රිය සේවය;

(ආ) පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද නීතියක් මගින් හෝ ඒ යටතේ හෝ ජාතික මහා මාර්ග බවට ප්‍රකාශයට පත් කරන ලද මහා මාර්ග; සහ

(ඇ) දුම්රියෙන්, ගොඩින්, මුහුදින් හෝ ගුවනින් හෝ යන්ත්‍රානුසාරයෙන් ධාවනය වන යාත්‍රා වලින් ජාතික ජල මාර්ග ඔස්සේ හෝ මගීන් සහ භාණ්ඩ ගෙන යාම.

**ගංගා සහ ජල මාර්ග; නැව් ගමනාගමනය සහ මුහුදු තරණය, ඓතිහාසික ජලය, දේශීය ජල තීරය, අනන්‍ය ආර්ථික කලාපය සහ මහාද්වීපික තටකය සහ අභ්‍යන්තර ජලය ඇතුළුව සමුද්‍රීය කලාප; I වැනි ලැයිස්තුවේ 18 වැනි විෂයය යටතේ නිශ්චිතව දක්වා ඇති ප්‍රමාණයට හැර රජයේ ඉඩම් සහ අක් වෙරළ.**

මෙයට පහත දැක්වෙන විෂයයන් ඇතුළත් වේ:-

(අ) මහ මුහුදේ දී හෝ ගුවනේ දී සිදු කරනු ලබන මුහුදු කොල්ලකෑම් හෝ ගුවන් කොල්ලකෑම් සහ අපරාධ; ගොඩබිම දී හෝ මහ මුහුදේ දී හෝ ගුවනේ දී හෝ ජාත්‍යන්තර නීතියට විරුද්ධව සිදු කරනු ලබන වැරදි;

(ආ) ජාතික ජල මාර්ග බවට පාර්ලිමේන්තුව විසින් නීතියෙන් ප්‍රකාශයට පත් කරන ලද දේශීය ජලමාර්ගවල යන්ත්‍රානුසාරයෙන් ධාවනය වන යාත්‍රාවලට අදාළව, නැව් ගමනාගමනය හා මුහුදු තරණය; ඒ ජල මාර්ගවල මාර්ග නීති;

(ඇ) බාහිර ජල තීරයේ නැව් ගමනාගමනය හා මුහුදු තරණය ඇතුළුව, සමුද්‍රිය නැව් ගමනාගමනය සහ මුහුදු තරණය; වෙළෙඳ නාවිකයන් සඳහා අධ්‍යාපනය සහ පුහුණුව සැලසීම සහ පළාත් විසින් සහ වෙනත් නියෝජ්‍යායතන විසින් සලසනු ලබන එවැනි අධ්‍යාපනය සහ පුහුණුව විධිමත් කිරීම;

(ඈ) නැව් ගමනාගමනයෙහි සහ ගුවන් යානාවල ආරක්ෂාව සඳහා ප්‍රදීප යාත්‍රා, ධාරාලෝක සහ වෙනත් විධිවිධාන ඇතුළුව ප්‍රාදීපාගාර;

(ඉ) ශ්‍රී ලංකා ආණ්ඩුවේ පාලනය යටතේ, අන්තර් පළාත් ගංගා සහ ගංගා නිම්න විධිමත් කිරීම හා සංවර්ධනය කිරීම; මහජන හිත පිණිස අවස්ථාවෝචිත යයි පාර්ලිමේන්තුව විසින් නීතියෙන් ප්‍රාකාශයට පත් කරනු ලබන ප්‍රාමාණයට අන්තර් පළාත් ගංගා සහ ගංගා නිම්න විධිමත් කිරීම හා සංවර්ධනය කිරීම;

(ඊ) දේශීය ජල තීරයෙන් ඔබ්බෙහි මසුන් ඇල්ලීම හා ධීවර කටයුතු; සහ

(උ) පළාතක් තුළ පිහිටා ඇති ශ්‍රී ලංකා ආණ්ඩුවේ දේපළ සම්බන්ධයෙන් වන විට, පාර්ලිමේන්තුව විසින් නීති මගින් අන්‍යාකාරයෙන් විධිවිධාන සලස්වන තාක් දුරට හැර, ඒ පළාත විසින් සාදන ලද ප්‍රඥප්තිවලට යටත්ව ශ්‍රී ලංකා ආණ්ඩුවේ දේපළ සහ එයින් ලැබෙන ආදායම.

**ඛනිජ ද්‍රව්‍ය හා පතල්**

මෙයට පහත දැක්වෙන විෂයයන් ඇතුළත් වේ:-

(අ) තෙල් බිම් සහ ඛනිජ තෙල් සම්පත් විධිමත් කිරීම හා සංවර්ධනය කිරීම; පෙට්රෝලියම් සහ පෙට්රෝලියම් නිෂ්පාදන; භයානක අන්දමින් ගිනි ගන්නා සුලූ යයි පාර්ලිමේන්තුව විසින් නීති මගින් ප්‍රපකාශයට පත් කරනු ලබන වෙනත් ද්‍රව හා ද්‍රව්‍ය; සහ

(ආ) ශ්‍රී ලංකා ආණ්ඩුවේ පාලනය යටතේ පතල් හා ඛනිජ සම්පත් සංවර්ධනය විධිමත් කිරීම මහජන හිත පිණිස වන්නේ යයි පාර්ලිමේන්තුව විසින් නීති මගින් ප්‍රකාශයට පත් කරනු ලබන ප්‍රමාණයට, පතල් හා ඛණිජ සම්පත් සංවර්ධනය විධිමත් කිරීම.

**ආගමනය හා විගමනය සහ පුරවැසිභාවය**

මෙයට පහත දැක්වෙන විෂයයන් ඇතුළත් වේ:-

(අ) පුරවැසිභාවය, පුරවැසිභාවයට ඇතුළත් කිරීම සහ විදේශිකයෝ;

(ආ) උදර්පණය; සහ

(ඇ) ශ්‍රී ලංකාවට පැමිණීමට ඉඩදීම සහ විගමනය හා ශ්‍රී ලංකාවෙන් පිටමං කිරීම; විදේශ ගමන් බලපත්‍ර හා වීසා බලපත්‍ර .

**ජනාධිපතිවරණය, පාර්ලිමේන්තු මැතිවරණය, පළාත් සභා සඳහා ඡන්ද විමසීම හා පළාත් පාලන ආයතන සඳහා ඡන්ද විමසීම ඇතුළුව, ඡන්ද විමසීම**

මෙයට පහත දැක්වෙන විෂයයන් ඇතුළත් වේ:-

පාර්ලිමේන්තුව සඳහා, පළාත් සභා සඳහා, පළාත් පාලන ආයතන සඳහා සහ ජනාධිපති ධූරය සඳහා ඡන්ද විමසීම්; මැතිවරණ දෙපාර්තමේන්තුව

**ජනලේඛන සහ සංඛ්‍යාලේඛන**

මෙයට පහත දැක්වෙන විෂයයන් ඇතුළත් වේ:-

(අ) ජනලේඛන; සහ

(ආ) මේ ලැයිස්තුවේ ඇතුළත් කවර හෝ කාරණයක කාර්යය සඳහා වූ විමර්ශන, සමීක්ෂණ සහ සංඛ්‍යාලේඛන.

**වෘත්තීය රැකියා සහ පුහුණු කිරීම**

මෙයට පහත දැක්වෙන විෂයයන් ඇතුළත් වේ:-

(අ) ජාතික වැදගත්කමින් යුත් ආයතන බවට පාර්ලිමේන්තුව

විසින් නීතියෙන් ප්‍රකාශයට පත් කරන ලද විශ්ව විද්‍යාල වැනි ආයතන;

(ආ) ජාතික වැදගත්කමින් යුත් ආයතන බවට පාර්ලිමේන්තුව විසින් නීතියෙන් ප්‍රකාශයට පත් කරන ලද්දා වූ ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් සම්පූර්ණයෙන් ම හෝ කොටසක් හෝ පවත්වාගෙන යනු ලබන්නා වූ ද, විද්‍යාත්මක හෝ කාර්මික අධ්‍යාපනය සඳහා වන ආයතන;

(ඇ) (i) පොලිස් නිලධරයන් පුහුණු කිරීම ද ඇතුළුව වෘත්තීය, ශිල්පීය හෝ කාර්මික පුහුණුව; හෝ

(ii) විශේෂ අධ්‍යාපන හෝ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම; හෝ

(iii) අපරාධ විමර්ශනය කිරීම හෝ අනාවරණය කර ගැනීම සඳහා විද්‍යාත්මක හෝ කාර්මික සහාය;

සඳහා වන පළාත් නියෝජ්‍යායතනය හා ආයතන; සහ

(ඈ) උසස් අධ්‍යාපනය හෝ පර්යේෂණ සඳහා වන ආයතනවල සහ විද්‍යාත්මක හා කාර්මික ආයතනවල සම්බන්ධීකරණය සහ ප්‍රමිති නිශ්චය කිරීම.

**ජාතික ලේඛනාගාරය; ජාතික වැදගත්කමකින් යුක්ත බවට පාර්ලිමේන්තුව විසින් පනවන ලද යම් නීතියක් මගින් හෝ යටතේ හෝ ප්‍රකාශයට පත් කරන ලද පුරාවිද්‍යා කටයුතු සහ භූමි හා පුරා වස්තු**

මෙයට පහත දැක්වෙන විෂයයන් ඇතුළත් වේ:-

ජාතික වැදගත්කමකින් යුක්ත බවට පාර්ලිමේන්තුව විසින් පනවන ලද නීතියක් මගින් හෝ ඒ යටතේ හෝ ප්‍රකාශයට පත් කරන ලද පෞරාණික සහ ඓතිහාසික ස්මාරක හා වාර්තා සහ පුරාවිද්‍යාත්මක භූමි සහ නෂ්ටාවශේෂ.

පහත දැක්වෙන විෂයයන් ඇතුළුව I වැනි ලැයිස්තුවේ හෝ III වැනි ලැයිස්තුවේ නිශ්චය කොට දක්වා නොමැති සියලු විෂයයන් හෝ කර්තව්‍යඃ

(අ) ශ්‍රී ලංකාවෙන් බැහැර ස්ථානවලට වන්දනා ගමන්;

(ආ) බැංකු, රක්ෂණ සහ මූල්‍ය සංස්ථා ඇතුළුව එහෙත් සමුපකාර සමිති අත්හැර වෙළෙඳ සංස්ථා සංස්ථාගත කිරීම, විධිමත් කිරීම හා ගණන් බේරා වසා දැමීම;

(ඇ) එක් පළාතකට සීමා නොවූ අරමුණු ඇති එහෙත් විශ්ව විද්‍යාල, ඇතුළත් නොවන වෙළෙඳ හෝ වෙළෙඳ නොවන සංස්ථා සංස්ථාගත කිරීම, විධිමත් කිරීම හා ගණන් බේරා වසා දැමීම;

(ඇ) පේටන්ට් බලපත්‍ර , නව නිර්මාණ සහ මෝස්තර, ප්‍රකාශන අයිතිය, වෙළෙඳ ලකුණු සහ වෙළෙඳ බඩු ලකුණු;

(ඉ) කිරුම් හා මිණුම් පිළිබඳ ප්‍රමිති නියම කිරීම;

(ඊ) ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන හෝ එක් පළාතකින් තව පළාතකට ප්‍රවාහනය කරන භාණ්ඩ සඳහා ප්‍රමිති නියම කිරීම;

(උ) ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් පාලනය කිරීම ජාතියේ හිත පිණිස අවස්ථාවෝචිත යයි පාර්ලිමේන්තුව විසින් නීතියෙන් ප්‍රකාශයට පත් කරන ලද කර්මාන්ත;

(ඌ) පතල්වල ශ්‍රමය සහ කම්කරුවන්ගේ ආරක්ෂාකාරීත්වය විධිමත් කිරීම;

(එ) ශ්‍රී ලංකා ආණ්ඩුවේ නියෝජ්‍යායතන විසින් ලුණු නිෂ්පාදනය කිරීම, සැපයීම හා බෙදා හැරීම, වෙනත් නියෝජ්‍යායතන විසින් කරන ලුණු නිෂ්පාදනය සැපයීම හා බෙදාහැරීම විධිමත් කිරීම;

(ඒ) අපනයනය සඳහා අබිං වගා කිරීම, නිෂ්පාදනය කිරීම හා විකිණීම;

(ඔ) ශ්‍රී ලංකා ආණ්ඩුවේ සේවානියුක්තයන් හා සම්බන්ධ කාර්මික ආරවුල්;

(ඕ) ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් සම්පූර්ණයෙන් ම හෝ කොටසක් මුදල් සපයන ලද්දා වූ ද, ජාතික වැදගත්කමකින් යුත් ආයතන බවට පාර්ලිමේන්තුව විසින් නීතියෙන් ප්‍රකාශයට පත් කරන ලද්දා වූ ද, කෞතුකාගාර සහ යුද්ධ ස්මාරක වැනි ආයතන ;

(ක) ශ්‍රී ලංකාව මැනීම; ශ්‍රී ලංකාවේ භූ විද්‍යාත්මක, උද්භිද විද්‍යාත්මක, සත්ව විද්‍යාත්මක සහ මානව විද්‍යාත්මක සමීක්ෂණ; කාලගුණ විද්‍යා සංවිධාන;

(ග) ජාතික රාජ්‍ය සේවා; ජාතික රාජ්‍ය සේවා කොමිෂන් සභාව;

(ච) විශ්‍රාම වැටුප්, එනම්, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් ගෙවිය යුතු හෝ ඒකාබද්ධ අරමුදලින් ගෙවිය යුතු විශ්‍රාම වැටුප්;

(ජ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ සහ පාර්ලිමේන්තුවේ කථානායකවරයාගේ සහ නියෝජ්‍ය කථානායකවරයාගේ වේතන;

(ට) පාර්ලිමේන්තුව සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ සහ කාරක සභාවල බලතල, වරප්‍රසාද හා පරිහාර, සාක්ෂි දීම හෝ ලියවිලි ඉදිරිපත් කිරීම සඳහා පාර්ලිමේන්තු කාරක

සභා හෝ පාර්ලිමේන්තුව විසින් පත් කරන ලද කොමිෂන් සභා ඉදිරියෙහි පෙනී සිටින ලෙස තැනැත්තන්ට බල කිරීම;

(ඩ) ජනාධිපතිවරයාගේ සහ ආණ්ඩුකාරවරයන්ගේ පඩිනඩි, දීමනා, වරප්‍රසාද සහ නිවාඩු පිට බැහැරව සිටීමේ අයිතිවාසිකම්, ශ්‍රී ලංකා ආණ්ඩුවේ අමාත්‍යවරයන්ගේ වේතන හා දීමනා විගණකාධිපතිවරයාගේ වේතන, දීමනා සහ නිවාඩු හා සම්බන්ධ අයිතිවාසිකම් සහ වෙනත් සේවා කොන්දේසි;

(ණ) අන්තර් පළාත් සංක්‍රමණය; අන්තර් පළාත් නිරෝධායනය;

(ත) මේ ලැයිස්තුවේ ඇතුළත් කවර හෝ කාරණයක් හා සම්බන්ධ නීතිවලට විරුද්ධව සිදුකරනු ලබන වැරදි; සහ

(ද) මේ ලැයිස්තුවේ ඇතුළත් කවර හෝ කාරණයක් හා සම්බන්ධ ගාස්තු, එහෙත් යම් අධිකරණයක දී ගනු ලබන ගාස්තු බැහැර කොට.

## III වැනි ලැයිස්තුව

## (සමගාමී ලැයිස්තුව)

1. සැලසුම් කිරීම

1:1 පළාත්බද මට්ටමේ දී සැලසුම් ක්‍රියාත්මක කිරීමේ ක්‍රම ඇති කිරීම සහ ඇගැයීම;

1:2 ප්‍රගති පාලනය;

1:3 රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයෝජන වැඩසටහන්වල ප්‍රගතිය පසුවිපරම් කිරීම;

1: 4 ආර්ථික කටයුතුවල යෙදී සිටින ආයතනවල සහ ව්‍යවසායවල වැඩ කටයුතු ඇගැයීම;

1:5 සැලසුම් ඉලක්ක සාක්ෂාත් කර ගැනීමෙහි ලා අදාළ දත්ත ඉදිරිපත් කිරීම;

1:6 සැලසුම් ඉලක්ක සාක්ෂාත් කර ගැනීමෙහි ලා අදාළ තොරතුරු බෙදාහැරීම;

1:7 ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන්වලට ප්‍රචාරයක් ලබා දීම;

1:8 මිනිස් බල ක්‍රම සම්පාදනය සහ රැකියා දත්ත බැංකුව;

1:9 පෝෂණ සැලසුම් සහ වැඩසටහන්.

2 සහ 3 අධ්‍යාපනය සහ අධ්‍යාපන සේවා -

I වැනි ලැයිස්තුවේ අංක (3) සහ (4) විෂයවල නිශ්චිතව දක්වා ඇති ප්‍රමාණයට හැර අධ්‍යාපනය.

4 උසස් අධ්‍යාපනය -

4:1 අලුත් විශ්වවිද්‍යාල පිහිටුවා පවත්වාගෙන යාම;

4:2 1985 අංක 07 දරන විශ්වවිද්‍යාල (සංශෝධන) පනත යටතේ උපාධි ප්‍රදානය කරන ආයතන සහ තෘතියික, කාර්මික සහ ප්‍රාග් - විද්‍යාල අධ්‍යාපනය සහ පුහුණුව සඳහා වෙනත් ආයතන පිහිටුවීම.

5. ජාතික නිවාස සහ ඉදිකිරීම් -

නාගරික සංවර්ධන ප්‍රදේශවල ආර්ථික, සමාජමය සහ භෞතික සංවර්ධනය පිළිබඳ ඒකාබද්ධ ක්‍රම සැලසුම් ප්‍රවර්ධනය කිරීම සහ ඒ සැලසුම් ක්‍රියාත්මක කිරීම.

6. දේපළ අත්කර ගැනීම සහ බලකර ලබා ගැනීම.

7. සමාජ සේවා සහ පුනරුත්ථාපනය -

7:1 උන්හිටි තැන් අහිමි වූ තැනැත්තන්ට සහන සැලසීම,

ඔවුන් පුනරුත්ථාපනය කිරීම සහ නැවත පදිංචි කරවීම;

7:2 ගංවතුර, නියඟ, වසංගත හෝ වෙනත් අසාමාන්‍ය හේතු නිසා ඇති වූ ආපදාවල දී සහන සැලසීම සහ ඒවායින් හානියට පත් තැනැත්තන් පුනරුත්ථාපනය කිරීම සහ නැවත පදිංචි කරවීම;

7:3 විනාශ වූ හෝ අලාභ හානියට පත් නගර, ගම්, රජයේ ආයතන සහ දේපළ, කර්මාන්ත, ව්‍යාපාරික ස්ථාන, පූජනීය ස්ථාන සහ වෙනත් දේපළ ප්‍රතිසංස්කරණය කිරීම, යළි ගොඩනැංවීම සහ පුනරුත්ථාපනය කිරීම; පාඩු හෝ අලාභහානි ලැබූ තැනැත්තන්ට හෝ ආයතනවලට වන්දි හෝ සහන ප්‍රදානය කිරීම සහ සිවිල් ජීවිතය ප්‍රතිසංවිධානය කිරීම.

8. කෘෂිකර්මය සහ ගොවිජන සේවා -

8:1 කෘෂිකර්මයට සම්බන්ධ කර්මාන්ත පිහිටුවීම සහ වැඩි දියුණු කිරීම; ගොවිපළවල් පිහිටුවීම සහ නඩත්තු කිරීම සහ පෞද්ගලික තවාන් අධීක්ෂණය කිරීම;

8:2 පස සංරක්ෂණය;

8:3 ශාක පලිබෝධක.

9. සෞඛ්‍යය -

9:1 උපකාරක වෛද්‍ය සේවා පිරිස් පුහුණු කිරීම සඳහා පාසල්;

9:2 පළාතක් ඇතුළත පුද්ගලික වෛද්‍ය පහසුකම් අධීක්ෂණය කිරීම, සාත්තු නිවාස සහ රෝග නිශ්චය කිරීමේ පහසුකම් පාලනය කිරීම;

9:3 ජනගහන පාලනය සහ පවුල් සංවිධානය;

9:4 පළාත්බද වෛද්‍ය මණ්ඩල සංස්ථාපනය කිරීම.

10. උප්පැන්න, විවාහ සහ මරණ ලියාපදිංචි කිරීම.

11. නගර සහ ගම් නැවත නම් කිරීම.

12. පළාත ඇතුළත පෞද්ගලික ලොතරැයි.

13. උත්සව සහ ප්‍රදර්ශන.

14. ආහාර සලාක කිරීම සහ ආහාර තොග පවත්වා ගැනීම.

15. සමුපකාර - සමුපකාර බැංකු.

16. සමීක්ෂණ - පළාත්බද හෝ සමගාමී ලැයිස්තුවේ දක්වා ඇති කාරණා අතුරින් කවර හෝ කාරණාගත කාර්ය සඳහා.

17. වාරිමාර්ග -

17:1 ජලය රැස් කර තැබීම සහ පාලනය කිරීම, ජලාපවහනය සහ වේලි ගංවතුරින් ආරක්ෂාව, ජල සම්පත් සැලසුම් කිරීම ;

17:2 ග්‍රාම සංවර්ධනය, සෞඛ්‍යය, අධ්‍යාපනය, වෘත්තීය සහ කාර්මික පුහුණුව, සමුපකාර වැනි අන්තර් පළාත් ඉඩම් හා වාරිමාර්ග යෝජනා ක්‍රමවලට සලසනු ලබන සේවා සහ වෙනත් පහසුකම්.

18. සමාජ වන විද්‍යාව සහ වන සතුන් සහ කුරුල්ලන් ආරක්ෂා කිරීම.

19. ධීවර කටයුතු -

දේශීය ජල තීරයෙන් ඔබ්බෙහි මසුන් ඇල්ලීම හැර.

20. සත්ව පාලනය -

20:1 පශු සම්පත් සහ පශු නිෂ්පාදන නිපදවීම, සකස් කිරීම, බෙදාහැරීම සහ විකිණීම ;

20:2 විද්‍යාගාර සහ විද්‍යා උපකරණ සැපයීම ඇතුළුව පශු කටයුතු පුහුණු සේවා සහ පර්යේෂණ ;

20:3 සතුන් බෝ කිරීම, රැකබලා ගැනීම සහ සෞඛ්‍යය ;

20:4 තණ බිම් පිහිටුවීම.

21. සේවා නියුක්තිය -

21:1 පළාත්බද මට්ටමේ දී සේවා නියුක්තිය සැලසුම් කිරීම ;

21:2 පළාතට අදාළ විශේෂ සේවා නියුක්ති වැඩසටහන් ;

21:3 පළාතට අදාළ යෞවන සේවා නියුක්ති කටයුතු ප්‍රවර්ධනය කිරීම ;

21:4 පළාතට අදාළ තාක්ෂණික මිනිස්බල සංවර්ධන වැඩ පිළිවෙළවල්.

22. සංචාරක ව්‍යාපාර -

පළාතේ සංචාරක ව්‍යාංපාරය සංවර්ධනය කිරීම සහ පාලනය කිරීම.

23. පහත සඳහන් දේ පිළිබඳ වෙළෙඳාම හා වාණිජ්‍ය, නිෂ්පාදනය, සැපයීම සහ බෙදා හැරීම -

(අ) යම් කර්මාන්තයක් මධ්‍යම ආණ්ඩුව විසින් පාලනය කිරීම මහජන යහපත සඳහා යෝග්‍ය වේ යැයි පාර්ලිමේන්තුව විසින් නීති මගින් ප්‍රකාශ කර ඇති අවස්ථාවක, ඒ කර්මාන්තයේ නිෂ්පාදිත සහ ඒ නිෂ්පාදිත වර්ගයේ ම වූ

ආනයනය කළ බඩු ; සහ

(ආ) ආහාර ද්‍රව්‍ය සහ ගව ආහාර.

24. ප්‍රවෘත්ති පත්‍ර, පොත් හා වාර සඟරා සහ මුද්‍රණාල

25. මේ ලැයිස්තුවේ නිශ්චිතව දක්වා ඇති කාරණා කිසිවක් හා සම්බන්ධ ව්‍යවස්ථාවලට විරුද්ධව සිදු කරනු ලබන වැරදි.

26. යම් අධිකරණයක දී අය කරනු ලබන ගාස්තු හැර, මේ ලැයිස්තුවෙහි සඳහන් කවර හෝ කාරණයක් සම්බන්ධයෙන් වූ ගාස්තු.

27. පුණ්‍ය කටයුතු සහ පුණ්‍යායතන, පුණ්‍ය සහ ආගමික ප්‍රදාන සහ ආගමික ආයතන.

28. මිල පාලනය.

29. මේ ලැයිස්තුවේ හෝ පළාත් සභා ලැයිස්තුවේ දක්වා ඇති යම් කාරණයක කාර්ය සඳහා පරීක්ෂණ සහ සංඛ්‍යා ලේඛන.

30. ආහාර ද්‍රව්‍ය සහ වෙනත් භාණ්ඩවල තත්ත්වය බාල කිරීම.

31. ඖෂධ සහ විෂ වර්ග.

32. පළාත ඇතුළත විදුලිය සැපයීම, ව්‍යාප්ත කිරීම සහ පළාත ඇතුළත විදුලි බලය පාවිච්චි කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ විධිමත් කිරීම.

33. පරිසරය ආරක්ෂා කිරීම.

34. ජාතික වැදගත්කමකින් යුක්ත බවට පාර්ලිමේන්තුව විසින් පනවන ලද නීතියක් මගින් හෝ නීතියක් යටතේ ප්‍රකාශයට පත් කරනු නොලැබ ඇති පුරාවිද්‍යාත්මක භූමි සහ නටබුන්.

35. මනුෂ්‍යයන්ට, සතුන්ට හෝ ශාකවලට, බලපාන ආසාදක හෝ ස්පර්ශක රෝග හෝ පළිබෝධ එක් පළාතකින් තවත් පළාතකට පැතිර යාම වැළැක්වීම.

36. වන්දනා ගමන්.